අටුවාචාර්‍ය බුද්ධදත්ත ස්ථවිරපාදයන් විසින් විරචිත

මධුරත්ථ විලාසිනී නම් වූ

බුද්ධ වංසට්ඨ කථා

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

Vol XII

අර්ථකථාචාර්ය බුද්ධදත්ත ස්ථවිර පාදයන් විසින් විරචිත

මධුරත්ථ විලාසිනී නම් වූ

බුදධ වංසට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 12

අර්ථකථාචාර්ය බුද්ධදත්ත ස්ථවිර පාදයන් විසින් විරචිත

මධුරත්ථ විලාසිනී නම් වූ
බුදුධ වංසට්ඨ කථා
(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය
කීර්ති නාරම්පනාව

අධීක්ෂණය
විජිතනන්ද සරත්චන්ද්‍ර

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

අර්ථකථාචාර්ය බුද්ධදත්ත ස්ථවිර පාදයන් විසින් විරචිත

මධුරත්ථ විලාසිනී නම් වූ
බුදුධ වංසට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2007

දෙවන මුද්‍රණය 2011

ISBN - 978 - 955 - 1604 - 45 - 5

පරිගණක අකුරුකරණය

උපමාලි කුලසේකර - කටුගස්තොට

පිටකවරය

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.-

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය,
බොරලැස්ගමුව.
දුරකථනය: 0112517269

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කතා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් ඊ කුක් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාර යයි බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නීස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයීක භාෂාවකැයි මහාචාර්ය වින්ටනීස් තුමා පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුක් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාල ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්වා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කල යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධ ජන්ම භූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්ත තිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ

ශිෂ්‍ය මිහිඳු මහා රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකය ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍යය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන සිංහල භික්ෂූන් විසින් පාළි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දිය අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙලටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘත්තාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ සාඤ්චිපුර

(කොන්ජිවරම) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධී මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්ම සංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ කෝටනේමලී පුරිගුත් වල පල්ලි යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධ මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පටියන හෝ මයුර රූප පටියන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් ඒ තුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයක් අත්ථසාලිනී අටුවාවක් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙල බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාර්න්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා පියපහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය. "මහා අට්ඨකථාව ශරීරය කොටගෙන **මහාපච්චරිය කුරුන්දි** ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහා ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තවද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි පතිපත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහල වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

විනය පිටකය

	පෙළ	අටුවාව	කතෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාලි 1 ආණා දෙසනා	සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	2 පාචිත්තිය පාළි 2 යථාපරාධ ශාසන	විනය අට්ඨකථා		
ඛන්ධක	3 චුල්ල වග්ග පාළි 3 සංවරාසංවර කථා			
	4 මහාවග්ග පාළි			
පරිවාර	5 පරිවාර පාළි			
	භික්ඛුපාතිමොක්ඛ	කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකංග කථා)			

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්‍ථ දේසනා	අත්‍ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන	සම්මොහ විනොදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	3 නාමරූප පරිච්ඡේද කථා			
3 කථාවත්ථුප්පකරණ	පරමති දේශනා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ	යථාධම්මසාසනා			
5 ධාතුකථාප්පකරණ	නාමරූපපරිච්ඡේද කථා	පරමත්‍ථදීපනී		
6 යමකප්පකරණ		පඤ්චප්පකරණට්ඨකථා		
7 පට්ඨානප්පකරණ				

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 බොහෝ දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
3 සංයුක්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
5 බුද්දක නිකාය				
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 ධම්මපද	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
3 උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
6 විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
7 පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
8 ථේර ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
9 ථෙරී ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
10 ජාතක	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
11 නිද්දේස (චුල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය	6වන ශ.ව.
12 අපදාන (ථේර-ථෙරී)	විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය	7වන ශ.ව.
13 පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනි		බුද්ධදත්ත හිමි	5වන ශ.ව.
15 චරියාපිටක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
	විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා		ධර්මපාල ආචාර්ය	5වන ශ.ව.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා		ඇත්තේ වනරතන	8වන ශ.ව.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධ වංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදා මග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනීය මුන්වහන්සේ විසින් ලියා ඇත.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්තු - ප්‍රේතවත්තු - තෙර තෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකතිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථා චරියය යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරියා වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුලත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙලටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුලත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දන දනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක මුද්‍රණ සභා** නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ ප්ලාම්ස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීමේ මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර් මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළහ. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ වීමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දැක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, අමාත්‍යාංශයේ ලේකම් බී.ඇන්. ජිනසේන මහතාට අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන්

පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ කෘතඥතාවය හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපලම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්තිථිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලංගොඩ සෝභිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවතගම පේමානන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පඬිවෙල සෝරත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පැපිලියානේ සුමිත්ත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුණුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ධම්මොදය හිමිපාණන් වහන්සේ

පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත	එච්.පී.ඇස්. නිශ්ශංක මහතා

පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	අරුණ කේ. ගමගේ මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත	ජේ.එච්.එම්. විමලදාස මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඒ. නිශාන්ත පීරිස් මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	ලසිත් නලන්ත මහතා
පණ්ඩිත	එච්.එල්.එස්. අබේසිංහ මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. පූජ්‍ය අම්පාරේ ධම්මොදය හිමිපාණන් වහන්සේ. (දර්ශනපති)
6. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශ්‍රාස්තවේදී)
7. පණ්ඩිත දයා ගුණසේකර මහතා (සිංහල ශබ්දකෝෂය)
8. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (සිංහල ශබ්දකෝෂය)
9. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
10. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා

පටුන

පිටුව

නිදාන අර්ථ වර්ණනා		01
සුමේධ කථා		64
දීපංකර	බුද්ධවංස වර්ණනා	118
කොණ්ඩඤ්ඤ	බුද්ධවංස වර්ණනා	131
මංගල	බුද්ධවංස වර්ණනා	141
සුමන	බුද්ධවංස වර්ණනා	153
රේවත	බුද්ධවංස වර්ණනා	161
සෝභිත	බුද්ධවංස වර්ණනා	167
අනෝමදස්සී	බුද්ධවංස වර්ණනා	173
පදුම	බුද්ධවංස වර්ණනා	179
නාරද	බුද්ධවංස වර්ණනා	188
පදුමුත්තර	බුද්ධවංස වර්ණනා	193
සුමේධ	බුද්ධවංස වර්ණනා	200
සුජාත	බුද්ධවංස වර්ණනා	206
පියදස්සී	බුද්ධවංස වර්ණනා	212
අත්‍ථදස්සී	බුද්ධවංස වර්ණනා	220
ධම්මදස්සී	බුද්ධවංස වර්ණනා	225
සිද්ධත්ථ	බුද්ධවංස වර්ණනා	229
තිස්ස	බුද්ධවංස වර්ණනා	233
ඵුස්ස	බුද්ධවංස වර්ණනා	238
විපස්සී	බුද්ධවංස වර්ණනා	242
සිඛී	බුද්ධවංස වර්ණනා	249
වෙස්සභූ	බුද්ධවංස වර්ණනා	254
කකුසන්ධ	බුද්ධවංස වර්ණනා	259
කෝණාගමන	බුද්ධවංස වර්ණනා	264
කස්සප	බුද්ධවංස වර්ණනා	269
ගෞතම	බුද්ධවංස වර්ණනා	277
පස්විසි බුදුවරුන්ගේ විශේෂතා		304

සංඥාපනය

සූත්‍ර පිටකයෙහි බුද්දක නිකායෙහිලා ගැනෙන බුද්ධවංසය අටුවාවෙහි හඳුන්වා දී ඇත්තේ "මෙයින් සාරාසංඛ්‍ය කප් ලක්ෂයකින් එපිට උපන් පස්විසි බුදුවරයන් වහන්සේලාගේ උපන් කල්පය ආදී වශයෙන් විස්තර වන පරම්පරා කථාව බුද්ධවංස නම් වෙයි කියායි. ගෞතම තථාගතයන් වහන්සේ බුදුවීමෙන් දෙවන වස ඥාතිසංග්‍රහ සඳහා කපිල වත්ථුවට වැඩ පෙළහර දක්වා සැරියුත් තෙරුන්ගේ ආරාධනය පරිදි රුවන් සක්මනෙහි සිට බුද්ධවංසය දේශනා කළ බව සඳහන්ය. එදා උන්වහන්සේ දෙසූ එම බුද්ධවංසය පසුකාලවල අද දක්නා පරිදි සංවර්ධනය වී බුද්දක නිකායට ඇතුළත් වන්නට ඇතැයි මතයක් පවතී. ඥාති සමාගමයෙහි රැස්වූ භික්ෂු ශ්‍රාවකයන් අතර අනුරුද්ධ උපාලි රහතන් වහන්සේලාද පැමිණ සිටි බව කියවෙතත් ඒ වනවිට උන්වහන්සේලා පැවිදිව නොසිටි බවත් උන්වහන්සේලාගේ පැවිද්ද ඉන් පසුව පිළිගැනෙන හෙයින් උක්ත මතය බැහැර කිරීමට නොහැකිවන. මේ කරුණ අට්ඨකථාචාරීන් වහන්සේගේ අවධානයටද යොමුවූ හෙයින් උන්වහන්සේලා එදින එහිදී පැවිදි වන්නට ඇතැයි සිතා එසේ සඳහන් කරන්නට ඇති බවක් පවසන අතරම විමසා පිළිගන්නා ලෙසද පවසති.

බුද්ධවංසයට ලියන ලද අට්ඨකථාව රචනා කරන ලද්දේ අට්ඨකථාචරිය බුද්ධදත්ත තෙරණුවන් විසිනි. උන්වහන්සේගේ නම ග්‍රන්ථාරම්භ ගාථාවන්හි හෝ ග්‍රන්ථ සමාප්ති ගාථාවන්හි හෝ දක්නට නොලැබේ. නමුත් පසුකලෙක යාකරන්නට ඇතැයි හැඟී යන උපසංහාරයෙහි උන්වහන්සේගේ නම ග්‍රන්ථානාමය සහ ග්‍රන්ථ පරිමාණය ද සඳහන් වෙයි.

> "ආචාර්යවරයන් විසින් ප්‍රකාශකරන ලද බුද්ධදත්ත නම් තෙරණුවෝ මධුරත්ථ විලාසනී නම් අට්ඨකථාව කොට පරපුරෙන් පරපුරට හිතගෙන දෙන මේ පොත තබා නොතිර බව හේතුවෙන් අහෝ අපවත් වූහ.

මෙසේ මේ ග්‍රන්ථය බණවර වශයෙන් සවිස්සෙකි. ග්‍රන්ථ වශයෙන් සයදහස් පන්සියයකට අධිකය. අකුරු වශයෙන් දෙලක්ෂ තුන්දහසකට අධික අකුරු ඇත්තේය."

මෙයින් ග්‍රන්ථ ප්‍රමාණය මෙන්ම කතුවරයා බුද්ධදත්ත තෙරුන් බවත් ග්‍රන්ථනාමය මධුරත්ථවිලාසිනී නම් වන බවත් කියා ඇත. එහෙත් කතුවරයා නාමය වශයෙන් යොදා ඇත්තේ මධුරත්ථපකාසිනී කියායි. "ප්‍රපඤ්ච අර්ථ බැහැරකොට සර්වප්‍රකාරයෙන් මධුරාර්ථයන් ප්‍රකාශිත හෙයින් මධුරත්ථපකාසිනී යනුවෙන් ග්‍රන්ථාවසාන ගාථාවකින් ඒ බව පෙනේ. ග්‍රන්ථාරම්භයෙහි ප්‍රස්තාවනා මුඛයෙන් ලියා ඇති පද්‍ය පන්තියට අනුව මේ අටුවාව තැනීමට උන්වහන්සේට ආරාධනා කරන ලද්දේ ශීලාදි ගුණයෙන් පිරිපුන් බුද්ධසීහ තෙරුන් විසිනි. එහෙයින් එතෙක් පාළි ක්‍රමය පාළි අර්ථකථා අනුසන්ධි වර්ණනා ක්‍රම වශයෙන් පවත්වා ගත් බුද්ධවංස වර්ණනය සිදුකරන බැව් පවසා තිබේ. එහිදී උන්වහන්සේ අවධාරණය කොට ඇති වැදගත් කරුණ නම් මහාවිහාරගත පාළි මාර්ගය ඇසුරුකොට සංකර දෝෂ රහිතව කෙටියෙන් හරවත්ව බුද්ධවංස විවරණය කරන බවයි.

බුද්ධදත්ත ආචාර්යපාදයන් ග්‍රන්ථාවසාන ගාථාවලින් පවසා ඇත්තේ මේ බුද්ධවංශ වර්ණනය සිදුකරන ලද්දේ කාවෙරි පටුන්හි කණ්හදාසයන් කරවූ විහාරයෙහි වසමින් බවයි.

"කාවෙරී නදී දිය වැදීමෙන් පියකරු පොළොඇති නානා නරනාරීන් ගැවසී ගත් කාවෙරි පටුන්හි මුදුවදන් ඇති කණ්හදාසයන් විසින් කරවූ විවිධාකාර ප්‍රාකාර ගොපුර සහිත සොරොව්වලින් හැලෙන දියදහර ඇති දර්ශනීය දුර්ජන සම්බන්ධයෙන් තොර මනරම් විවේකසුව එළවන සුරක්ෂිත විහාරයෙහි ප්‍රාචීන ප්‍රාසාදයෙහි වසන මා විසින් මේ බුද්ධවංශ වර්ණනාව කරන ලදී."

යන විස්තරයෙන් ඒ බව තහවුරු වෙයි. විනයවිනිච්ඡය නිගමන වාක්‍යයෙහි සඳහන් උරගපුරෙන බුද්ධදත්තෙන රචිකොයං විනයවිනිච්ඡයො" යන පාඨයෙන් සහ "උරගපුරනිවාසිතෙන ආචරිය භදන්ත බුද්ධදත්තෙන කතො අභිධම්මාවතාරෝ" යන අභිධම්මාවතාර පාඨයෙන් ද උන්වහන්සේ උරගපුර නිවාසී බව පළවෙයි. මේ උරගපුරය නම් පැරණි චෝළ රාජ්‍යයේ අගනුවරය. එය පිහිටියේ වර්තමාන ත්‍රිචිනාපොළි නගරයට නුදුරු කාවේරී ගංගා දකුණු ඉවුරෙහිය. දැනට

එය උරගයුර් නමින් ප්‍රකටය. ඒ බව මහාචාර්ය ඩී.ආර්. හණ්ඩාර්කර් සහ කනිංහැම්ද පිළිගෙන බව පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ උන්වහන්සේගේ පාළි සාහිත්‍ය නම් ග්‍රන්ථයෙහි සඳහන් කරති. ඒ අනුව බුද්ධවංසට්ඨකථා සංශෝධන විඤ්ඤත්තියෙහි ලා පවසන තිණවෙල්ලි පෙදෙසේ නාගපුරය යන්න පිළිගත නොහැකි බව උන්වහන්සේ වැඩිදුරටත් පවසති.

අට්ඨකථාචරිය බුද්ධදත්ත තෙරුන් වහන්සේ අභිධම්මාවතාර විනයවිනිච්ඡය උත්තර විනිච්ඡය යන ග්‍රන්ථ ද රචනා කළ බව ඒ ග්‍රන්ථයන්හිම සඳහන්ය. අභිධම්මාවතාරය අභිධර්මය හකුළුවා කළ සංග්‍රහ ග්‍රන්ථයකි. විනය විනිච්ඡය සහ උත්තර විනිච්ඡය විනය පිටකය පිළිබඳ සංග්‍රහ ග්‍රන්ථයි. විනය විනිච්ඡයට ටීකාවක් සපයමින් වාචිස්සර තෙර බුද්ධදත්ත පාදයන් ගැන සඳහන්කොට ඇත්තේ ප්‍රාඥයන් විසිනුත් බුද්ධඝෝෂාචාර්යයන් විසිනුත් පසස්නා ලද මහාකවියෙක් වූ ස්ථවිර වංශයට පහනක් වැනිවූ බුද්ධදත්ත නම් ආචාර්යපාදයන් විසින් මේ විනයවිනිච්ඡය කරන ලදි යයිද "මාදිසාපි කවී හොන්ති බුද්ධදත්තෙන දීවංගතෙ ආදි වශයෙන් පශ්චාත්කාලීනයන් විසින්ද වර්ණනා කොට ඇතැයි පවසයි. එසේම බුද්ධදත්ත තෙරුන් ලක්දිව සිට ආපසු සියරට යන ගමනේදී ලංකාවට එමින් සිටි බුද්ධඝෝස හිමියන් හමුව හෙළටුවා පාළියට නඟා ගෙනවුත් දුන්විට ඒවාට සංග්‍රහග්‍රන්ථ ලියන බව පැවසූ බවත් ඒ අනුව විනය විනිච්ඡය ලියූ බව කියැවෙන ශ්‍රැතියක් ගැනද ටීකාකාරයන් සටහන්කොට තිබේ. නමුත් බුද්ධදත්ත ආචාර්යයන්ගේ පොතපතෙහි බුද්ධඝෝස පාදයන්ගේ නම සඳහන් නොවෙයි. කෙසේ නමුත් මේ දෙනම සමකාලීනයන් බවටද මත පළවී තිබේ.

බුද්ධදත්ත තෙරුන් වහන්සේ මහාකවියකු බව පැවසෙන මතය පිළිගත හැකි සාධක උන්වහන්සේ ලියූ බුද්ධවංශ අටුවාවේ සඳහන් වර්ණනා ප්‍රදේශවලින් හමුවෙයි. අර්ථ රසයෙන් මෙන්ම ශබ්ද රසයෙන් පරිපූර්ණ රචනා අටුවාවෙහි මෙන්ම විනයවිනිශ්චයාදියෙහි රචනාවලින් පෙනී යයි. ථෙරවාදීන් අතර සම්මත බුද්ධචරිත නිබන්ධ වශයෙන් ගැනෙන ජාතකට්ඨකථාවත් මධුරත්ථවිලාසිනියත් තුලනාත්මකව බැලීමෙන් ඒවායේ සාම්‍යය වටහාගත හැකිය. සමහර තැන් කරුණු වශයෙන් පමණක් නොව භාෂාව හා රචනයෙන් ද සමානය. බුද්ධවංසය බුද්ධධර්මය හා පාළියේ නිරුක්ති මාර්ගය ද ඉගෙනීම සඳහා බුද්ධදත්ත ආචාර්ය පාදයන්ගේ මේ අටුවා ග්‍රන්ථයෙන් ලැබෙන සහාය අනුස්මරණීයය.

මේ පරිවර්තනයේදී අටුවාවට උපුටා ගෙන ඇති පෙළට අයත් ගාථා පරිවර්තනය නොකළෙමු. එය බුද්ධවංස පාළිය නැවත පෙරළීමක් වන හෙයිනි. ගාථාවලින් තෝරාගත් පදවලට අට්ඨකථා ආචාර්යපාදයන් ලියූ වර්ණනා පමණක් පරිවර්තනය කළෙමු. එම පරිවර්තනයන්ද පදගතව සිදුකළ අතර අමුතු යමක් එකතු කිරීමට අදහස් නොකළ අටුවා පරිවර්තනයට වැඩියමක් නොකළයුතු බැවිනි. බොහෝතැන පාරිභාෂික පද තත්සමව තැබීමට අදහස් කළේ අර්ථහානියක් වෙතැයි සිතූ හෙයිනි. මෙය සර්වතොභද්‍ර නොවන්නේය. ඒ අපගේ අඩුලුහුඬුකම් නිසාය. ඒවා මඟහරවා ගැනීමට වියත් උපදෙස් පතමු.

මෙයට

කීර්ති නාරම්පනාව
171/3, කැලණිමුල්ල,
අංගොඩ.

මධුරත්ථවිලාසිනී නම්
බුද්ධවංශ අර්ථකථාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

අනන්තඤාණ වූ කරුණා නිවාස වූ කෙලෙස්මලට ප්‍රලය වූ සුසමාහිත වූ ලෝකහිත වූ බුදුරජාණන් වහන්සේට, උතුම් වූ සසර සංවර කාරක වූ ධර්මයට, ගුණසාර වූ, කෙලෙස් අංගණ රහිත වූ සංඝ සමූහයාට නමස්කාර කරමි.

ජිනශ්‍රාවකයන් අතර ප්‍රඥාවෙන් ශ්‍රේෂ්ඨ වූ දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ ධර්මරාජ වූ නිරංගණවූ නිවන් පරතෙරට පත් ශාස්තෘන් වහන්සේගෙන් නෑ සමූහයා මැද යමක් විමසූ සේක් ද,

විශුද්ධවංශ ඇති මනා බුද්ධවංශයෙන් පැමිණි කෙලෙස් අවකාශ නැසූ විනායක වූ බුදුකුරු දහම් සපුරන ලද තථාගතයන් වහන්සේ විසින් ඒ බුද්ධවංසය දේශනා කරන ලදි.

(එය) අද දක්වා පාළි ක්‍රමය මෙන්ම පාළි අර්ථයක් කථානුසන්ධියත් නොනසා තථාගත පුත්‍රයන් වහන්සේලා ඇසූ පරිද්දෙන්ම පවත්වාගෙන ආහ.

හැමදා ජනයාට කර්ණාමෘත වූ ශ්‍රද්ධා ප්‍රඥා උපදවන්නා වූ සංවර්ණනා පිළිවෙළින් පවත්නා වූ ඒ බුද්ධවංසයෙහි අර්ථ වර්ණනය මැනවින් සද්ධර්මයෙහි ඇලුණා වූ සීලාදි ගුණයෙන් උතුම් වූ බුද්ධසිහ තෙරුන් විසින් බොහෝකල් අයදනා ලද මම ආරම්භ කරමි.

සදාකල්හි ජනයාගේ කෙලෙස් කිලිටි නසන බුදුසසුන්හි චිරස්ථතිය පිණිස ද මාගේ පුණ්‍යාභිවෘද්ධිය පිණිස ද ජනයාගේ ප්‍රසාදය සඳහා ද මහාවිහාරයෙහි ආ පාළි මාර්ගය ඇසුරු කළ සංකර දොසින් තොර මේ බුද්ධවංශ වර්ණනය සාරවත් ද සංක්ෂිප්ත ද වෙයි.

මෙහි ඇසිය යුතු බුද්ධවංස කථාවට වැඩි යමක් මෙහි නැති හෙයින් බුදුගුණය අඳුනවුන්ගේ පැහැදීමත් මහපව්මග දුරුකිරීමත් වන්නේ ද එහෙයින් මනා එකඟ සිතින් යුතුව වික්ෂේප දුරර අනන්‍ය සිතින් මනාව වර්ණනය කරන බුද්ධවංශ වර්ණනය කන්යොමා මිහිරිකොට අසව්.

අන් සියලු කටයුතු අතහැර මෙලොව පුද්ගලයා විසින් මැනවින් සදාකල්හි බුද්ධියෙන් යුතුව මේ අතිදුර්ලභ මේ කථාව ඇසීමටත් කීමටත් සුදුසු වෙයි.

එහි "**බුද්ධවංස සංවණණනා හෙසසති සාරහුනායි**" කී හෙයින් පළමුව බුද්ධවංස බෙදා දක්විය යුතුය. එහි මේ ව්‍යවස්ථාපනයයි. මෙයින් යට කල්ප ලක්ෂයක් අධික කොට ඇති සාරාසංඛ්‍යයෙක්හි උපන් පස්විසි බුදුවරුන්ගේ උපන් කල්ප ආදි පරිච්ඡේද වශයෙන් පරම්පරා විස්තර කථාව බුද්ධවංසය නමැයි දතයුතු.

ඒ මේ කල්ප පරිච්ඡේදය නාම පරිච්ඡේදය, ගොත්ත පරිච්ඡේදය, ජාති පරිච්ඡේදය, නගර පරිච්ඡේදය, පිතෘ පරිච්ඡේදය, මාතෘ පරිච්ඡේදය, බෝධි පරිච්ඡේදය, ධම්මචක්කප්පවත්තන පරිච්ඡේදය, අභිසමය පරිච්ඡේදය, ශ්‍රාවක සන්නිපාත පරිච්ඡේදය, අග්‍රශ්‍රාවක පරිච්ඡේදය, උපස්ථායක පරිච්ඡේදය, අග්‍රශ්‍රාවිකා පරිච්ඡේදය, පරිවාරභික්ෂු පරිච්ඡේදය, රශ්මි පරිච්ඡේදය, ශරීරප්‍රමාණ පරිච්ඡේදය, බෝධිසත්වාධිකාර පරිච්ඡේදය, ව්‍යාකරණ පරිච්ඡේදය, බෝධිසත්ත්වයන්ගේ ප්‍රධන් පරිච්ඡේදය, ආයු පරිච්ඡේදය, පරිනිර්වාණ පරිච්ඡේදය යි මෙසේ පාළියෙහි ආ දෙවිසි පරිච්ඡේදයකින් පිරිසිඳ දක්වන ලදි. පෙළට නොනගන ලද වාරයන් ද මෙහිලා දක්විය යුතුය. එය අගාරවාස පරිච්ඡේදය, ප්‍රාසාදතුය පරිච්ඡේදය, නාටක ස්ත්‍රී පරිච්ඡේදය, අග්‍රමහේෂි පරිච්ඡේදය, පුත්‍ර පරිච්ඡේදය, යාන පරිච්ඡේදය, අභිනිෂ්ක්‍රමණ පරිච්ඡේදය, ප්‍රධන් පරිච්ඡේදය, උපස්ථායක පරිච්ඡේදය, විහාර පරිච්ඡේදය යි දස ආකාරයෙන් වෙන් කරන ලද්දේ වෙයි.

ඒ සම්බහුල වාරය ද අපි යථාස්ථානයෙහි ඒ ඒ තැන කෙටියෙන් දක්වමින්ම වර්ණනා කරමු.

මෙසේ බෙදා දක්වූ එය වනාහි:-

> මෙය කවරෙකු විසින් දෙසන ලද ද? කොහිදී කවුරුන් සඳහා දෙසන ලද ද? කවර අර්ථයක් සඳහා දෙසන ලද ද? කවදා දෙසන ලද ද? කාගේ වචනයක් ද? කවරකු විසින් ගෙන එන ලද ද? පළමුව මේ සියලු විධි කෙටියෙන් කියා පසුව මම බුද්ධවංස අර්ථ වර්ණනාව කරන්නෙමි.

එහි කෙනායා දෙසිතො යනු; මේ බුද්ධවංසය කවරකු විසින් දෙසන ලද ද? සියලු ධර්මයන්හි අප්‍රතිහතඥාන හැසිරීම් ඇති දසබල චතුර්වෛශාරද්‍ය විශාරද ධර්මරාජ ධර්මස්වාමී තථාගත සර්වඥ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දෙසන ලදි. **කත්‍ර දෙසිතො** යනු; කපිලවස්තු මහා නගරයෙහි න්‍යග්‍රොධාරාම මහා විහාරයෙහි පරම සුන්දර දූකුම්කළු දෙවිමිනිසුන් ඇසට යොමුවූ රුවන් සක්මනෙහි සක්මන් කරමින් තථාගතයන් වහන්සේ විසින දෙසන ලදි. **කසසත්‍රාය ච දෙසිතො** යනු; දෙයාසූ දහසක් ඤාතීන්ට ද නොඑක් කෙළගණන් දෙවියන්ට ද වැඩ පිණිස දෙසන ලදි. **කිමත්‍රාය දෙසිතො** යනු; භාග්‍යවතුන් වහන්සේ වනාහි ප්‍රථම බෝධියෙහි විසිවසක් නේවාසිකව යම් යම් තැනෙක පහසු ඇත්තේ ද ඒ ඒ තන්හි ගොස් විසූහ. කෙසේ ද? පළමු වස **ඉසිපතනයෙහි** ධර්මසක් පවත්වා අටළොස් කෙළක් බඹුන් අමාපැන් පොවා බරණැස සමීපයෙහි ඉසිපතන මිගදායෙහි විසූහ. දෙවන වස රජගහ නුවර සමීපයෙහි **වේළුවන මහා විහාරයෙහි** ය. තෙවන සිවුවන වස් ද එහිමය. පස්වැන්න විසාලාව සමීපයෙහි මහාවන **කූටාගාර ශාලාවෙහි** ය. සවැන්න **මකුල පර්වතයෙහි** ය. සත්වැන්න **තව්තිසා භවනයෙහි** ය. අටවැන්න භගුරට සුංසුමාරගිර අසල **භේසකලා වනයෙහි** ය. නවවැන්න **කෝසම්බියෙහි** ය. දසවැන්න **පාරිලෙය්‍ය** වනළැහැබෙහිය. එකොළොස්-වැන්න **නාලා බමුණු** ගමෙහි ය. දොළොස්වැන්න **වෙරඤ්ජාවෙහි** ය. තෙලෙස්වැන්න **චාලිය පර්වතයෙහි** ය. තුදුස්වැන්න **ජේතවන මහාවිහාරයෙහි** ය. පසළොස්වැන්න **කිඹුල්වත්** මහනුවර ය. සොළොස්වැන්න ආළවක දමනය කොට අසූහාරදහසක් ප්‍රාණීන් අමාපැන් පොවා **අළවිනුවර** ය. සතළොස් වැන්න **රජගහ** නුවරම ය. අටළොස් වැන්න **චාලිය** පර්වතයෙහිය. එසේම එකුන්විසිවැන්න ද එසේමය. විසිවැන්න වනාහි **රජගහ** නුවරම විසූහ.

එහෙයින් කියන ලදි: "භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම බෝධියෙහි විසිවසක් අනිබද්ධවාසව යම් යම් තැන පහසුද ඒ ඒ තැන ගොස් විසූහයි." එතැන් පටන් වනාහි සැවැත් නුවර ඇසුරෙහිම ජේතවන මහාවිහාරයෙහි ද පූර්වාරාමයෙහි ද නිත්‍ය පරිභෝග වසයෙන් විසූ සේක.

යම් කලෙක වනාහි ශාස්තෘන් වහන්සේ බුදුව **බරණැස ඉසිපතන** මිගදායෙහි පළමුවස වැස වස් පවරා **උරුවෙලාවට** වැඩ තෙමසක් වසමින් තුන්බෑ ජටිලයන් දමනය කොට දහසක් භික්ෂූන් පිරිවරන ලදුව දුරුතු මස පසළොස්වක්දා රජගහ නුවරට වැඩ දෙමසක් එහිම විසූහ. එවිට බරණැසින් නික්ම පස්මසක් විය. මුළු හේමන්තය අවසන් විය. උදායි තෙරුන්ගේ පැමිණීමෙන් සත්අට දිනක් ඉක්මිණ. උන්වහන්සේ මැදින් මස සිතූහ. "හේමන්තය ඉක්මිණ. වසන්ත කාලය පැමිණියේය. තථාගතයන් වහන්සේට කපිලපුර වැඩීම කාලයයි" කියායි. උන්වහන්සේ මෙසේ සිතමින් සැටක් පමණ ගාථායෙන් ගමන් වර්ණනා කළහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ උන්වහන්සේගේ වදන් අසා ඦාති සංග්‍රහ කටැටිව අඟුමගධවාසී දසදහසක් ද කිඹුල්වත් වැසි දසදහසක්දයි විසිදහසක් රහතුන් පිරිවරන ලදුව රජගහ නුවරින් නික්ම දවස දවස යොදුනක් වඩිමින් රජගහ නුවරින් සැට යොදුන් කපිල පුරයට දෙමසකින් පැමිණ එහි නැයන් වැන්දවීම පිණිස **යමක ප්‍රාතිහාර්යය** කළ සේක. එකල්හි මෙම බුද්ධවංසය දෙසන ලදි. **කසස වචනං** යනු; ශ්‍රාවක ප්‍රත්‍යෙක බුදුවරුන්ට අසාධාරණ සම්‍යක් සම්බුදුන්ගේ වචනයයි. **කෙන වාහතො** යනු; ආචාර්ය පරම්පරාවෙන් ගෙන එන ලදද? මේ වනාහි **ශාරිපුත්‍ර ස්ථවිරය. හදදජිතිස්ස** කෝසියපුත්‍රය. **සිග්ගව මොග්ගලිපුත්ත සුදත්ත ධම්මික දාසක සොණක** රේවතයයි තෘතීය සංගීති කාලය තෙක් ගෙන එන ලදි. එයින් උඩ ද උන්වහන්සේලාගේම ශිෂ්‍ය අනුශිෂ්‍යයන් විසින් ගෙනෙන ලදි. මෙසේ වනාහි ආචාර්ය පරම්පරාවෙන් අද කාලය දක්වා ගෙනෙන ලදුයි දතයුතු. මෙපමණකින්

කෙනායං දෙසිතො කත්‍ථ කස්සත්‍ථාය ච දෙසිකො
කිමත්‍ථාය කදා කසස වචනං කෙන වාහතොති

මේ ගාථාව කියන ලද අර්ථ ඇත්තේය. මෙසේ ගෙන එන ලද්දෙහි අර්ථ වර්ණනය දැන් සිදුවෙයි. ඒ මේ අර්ථ වර්ණනාව යම් හෙයකින් දූරෙ නිදාන අවිදූරෙ නිදාන සනතිකෙ නිදාන යයි මේ තුන් නිදානය දක්වා

වර්ණනා කළ කල්හි මනාව වර්ණනා කළා නම් වෙයි. යමෙක් එය අසත්ද ඔවුහු ආරම්භයෙහි පටන් දත් හෙයින් සුවිඥාත වෙත්ද එහෙයින් ඒ නිදාන දක්වා වර්ණනා කරන්නෙමු.

එහි මුල පටන් ඒ නිදානයන්ගේ පරිච්ඡේදය පළමුව දත යුතුය. **දිවකුරු** දසබල පාමුල කරන ලද අභිනීහාර ඇති මහසතුන්ගේ **වෙස්සන්තරාත්ම භාවයෙන්** චුතව තුසිත භවනයෙහි උපත යම්තාක් ද ඒ තාක් පැවති කථාව **දූරෙ නිදාන** නම්. තුසිත භවනයෙන් චුතව බෝමැඩ සර්වඥතා ඥානයට පත්වීම යම්තාක් ද ඒතාක් පැවති කතාව **අවිදූරෙ නිදාන** නම්. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල ජේතවනාරාමයෙහි වසන සේක කියා ද රජගහ නුවර අසල කලන්දක නිවාප නම් වේළුවනාරාමයෙහි වාසය කරන සේක කියා ද විසාලාවෙහි මහාවන කූටාගාර ශාලාවෙහි වසන සේක කියා ද මෙසේ බෝමැඩ සර්වඥතාඥානයට පත්වීමෙහි පටන් පරිනිර්වාණය තෙක් මේ අතර භාග්‍යවතුන් වහන්සේ යම් යම් තැනෙක විසූ සේක් ද ඒ ඒ පුවත **සන්තිකෙ නිදාන** නමැයි දතයුතුය. මෙපමණ සංක්ෂේප වශයෙන් දූර අවිදූර සන්තික යන තුන් නිදාන වශයෙන් බාහිර නිදාන වර්ණනය සමාප්ත වෙයි.

දැන් වනාහි;

> ලෝකාධිපති සහම්පති බ්‍රහ්මයා ද ඇදිලිබැඳ "මෙහි අල්පරජස්ක සත්වයෝ සිටිති. ධර්මය දේශනා කරනු මැනවි. මේ ප්‍රජාවට අනුකම්පා කරනු මැනවි" කියා බුදුරජාණන් වහන්සේට ආයාචනා කළේය.

ආදි නයින් පවත්නා **අභ්‍යන්තර නිදානයෙහි** අර්ථ වර්ණනය වෙයි.

එහි එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර අසල කලන්දකනිවාප නම් වේළුවනයෙහි වසන සේක යන ආදී සූත්‍රාන්තවල මෙන් එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කපිලවස්තු නගරය අසල නිග්‍රොධාරාමයෙහි වසන සේක. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේගෙන් බුද්ධවංසය විචාළහයි මේ ආදි නයින් නිදානය නොකියා කුමක් හෙයින් "ලෝකාධිපති සහම්පති බ්‍රහ්මයා ද ඇදිලිබැඳ බුදුරජාණන්

වහන්සේට ආයාචනා කළේයයි ආදි නයින් නිදානය කියන ලද්දේ ද?යි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේගේ සියලු ධර්මදේශනාවලට කාරණ වූ බඹුනුගේ ධර්මදේශනා ආයාචනය දක්වීම පිණිස කියන ලදි.

> කවරදා මේ ධර්මදේශනාව සඳහා බඹහු විසින් ජිනයන් වහන්සේට ආරාධනා කරන ලදද? කවදා කොහිදී කවුරුන් විසින් මේ ගාථාව කියන ලදද?

කියනු ලැබේ. බුදුවූ භාග්‍යවතුන් වහන්සේට අටවන සතියෙහි දහම් දෙසීම පිණිස බඹහු විසින් ආරාධනා කරන ලදි. ආයාචනා කරන ලදි. මේ එහි පිළිවෙළ කථාවයි. කරන ලද අභිනීහාර ඇති මහාපුරුෂයාණෝ මහබිනික්මන් දිනයෙහි විවෘත ප්‍රකට පිළිකුල් සහගත නිදන තරුණ නළඟනන් දැක අතිශයින්ම සංවේගයට පත් හදින් වෙනම තැනක රැඳී සිටි **ඡන්න** අමතා සතුරු රජුන් මරථය කරන **කන්ථක** නම් උතුම් අසු ගෙනෙවයි ගෙන්වාගෙන ඡන්න සමගින් වරතුරඟු පිට නැඟි නුවර දොර අධිගෘහිත දේවතාවා විසින් නුවර දොර විවර කළ කල්හි නුවරින් නික්ම එම රාත්‍රියෙහිම තුන් රජයක් පසුකොට උතුම් සත්වයාණෝ අනෝමා නම් ගංතෙර සිට ඡන්නට මෙසේ කීහ. ඡන්නය, තෙපි මාගේ මේ අන්‍යයන් විසින් නොදරිය හැකි අබරණ ද කන්ථක වරතුරඟු ද ගෙන කපිලපුරයට යව් කියායි. ඡන්න පිටත්කොට කාලසර්ප නීලොත්පල වන් අසිපතින් කෙහෙ සහිත මෞලිය සිඳ අහසට දමා දෙවියන් දුන් පාසිවුරු ගෙන තෙමේම පැවිදිව පිළිවෙළින් චාරිකාවෙහි යෙදෙමින් වාත වේගයෙන් උඩනැගෙන රළබිඳුම් ඇති නො ඇලෙන ගංගා නදිය තරණය කොට මිණිගණරස්දුලින් දිදුලන රජගෙවලින් යුත් රජගහ නුවරට පිවිස එහි ඉසුරුමදමත් ජනයාට නිගාදෙමින් මෙන් උඩඟු ජනයාට ලජ්ජා උපදවමින් මෙන් ද රස්දහරින් නුවර දන හද තමන් වෙත බැඳගන්නාක් මෙන් ද දෙතිස් මහපුරිස් ලකුණින් බබළන රූසිරින් සියලු දනනුවන් කළඹන්නාක් මෙන් ද රූපී ඇවිදිනා පින්පිඬක් මෙන් අහස නොගැටෙන පර්වතයක් මෙන් ද ශාන්ත ඉඳුරන් ඇතිව ශාන්ත මනසින් වියදඬු පමණ දුර බලමින් රජගහ නුවර පිණ්ඩපාතයෙහි හැසිර යැපෙන පමණ අහර ගෙන නුවරින් නික්ම **පණ්ඩව පව්** පසෙක සෙවණ පැන් ඇති මහා බිම්කඩෙක පරම රමණීය විවේක ස්ථානයක හිඳ පස්විකුම් බෙලෙන් මිශ්‍ර බත් වළඳා මන්දාරගිර මෙන් සාර නරසාර **බිම්බිසාර** මගධ මහරජු මහාපුරුෂයන් කරා ගොස් නම්ගොත් විමසා එයින් පුබුදින සිතින් මාගේ

රාජ්‍යයෙන් කොටසක් ගනු මැනවැයි රාජ්‍යයෙන් ආරාධනා කරද්දී මහරජ, මට රාජ්‍යයෙන් කම් නැත. මම රාජ්‍යය අත්හැර ලෝකාභිතාර්ථය සඳහා ප්‍රධන් වීර්යයෙහි යෙදී ලොව කෙලෙස් පහකොට බුදුවන්නෙමි'යි කියා නික්මුණෙමි යි පවසා, එසේ නම් බුදුව හැමට පළමු මාගේ විජිතයට වැඩිය මැනවැයි කී කල්හි මැනවැයි ඔහුට ප්‍රතිඥා දී **ආළාර** වෙත ද, **උද්දක** වෙත ද පැමිණ ඔවුන්ගේ ධර්ම දේශනාවල හරයක් නොදක එතැනින් නික්ම උරුවෙලාවෙහි සමසක් දුෂ්කරක්‍රියා කොටත් නිවන් අවබෝධ කළ නොහැකිව ඔළාරික අහර ගැනීමෙන් සිරුර සැහැල්වූහ.

එකල වනාහි උරුවෙලාවෙහි සේනානි ග්‍රාමයෙහි **සේනානි කෙළෙඹි දූ සුජාතා** දරිය වියපත්ව එක් නුග රුකෙක්හි ප්‍රාර්ථනයක් කළාය. ඉදින් මම සමජාතික කුලගෙයකට ගොස් පළමුගැබ පුතකු ලදිමි නම් බිලියම් කරමි කියායි. ඇගේ එම පැතුම ඉටුවිය. ඕතොමෝ වෙසක් පුන්පොහෝ දින අද බිලියම් කරමියි පාන්දරම අනායාස පරමමධුර පායාසය පිළියෙළ කළාය. බෝසත්හුද එදිනම සිරුරු පිළිදගුම් කොට පිණ්ඩපාත වේලාව අපේක්ෂාවෙන් පාන්දරම ගොස් ඒ නුගරුකමුල හුන්හ. ඉක්බිති ඇගේ කිරිමව පුණ්ණා නම් දස්ස ගසමුල පිරිසිදු කිරීමට ගොස් නැගෙනහිර දිශාව බලා වැඩහුන් සන්ධ්‍යාකාන්ති රැඳි උතුම් රන්ගිරිකුළක් වන් ශරීර ශෝභා ඇති අඳුරුකඳ නසන පියුම්වන පොබයන මෙඝ විවරගත දිව්‍යකරයා බඳු රුක්මුල්හි හුන් මුනිදිවාකරයන් දුටුවාය. උන්වහන්සේගේ සිරුරින් නිකුත් කාන්තියෙන් රන්වන් වූ ඒ වෘක්ෂය ද දැක ඇයට මෙසේ සිත් විය.

අද අපගේ දේවතාවා ගසින් බැස සියතින්ම බලි පිළිගනු කැමතිව සිටුනේය කියාය. ඕ වහා ගොස් සුජාතාවන්ට ඒ බව කීවාය. ඉක්බිති සුජාතා හටගත් සැදහැයෙන් සර්වාලංකාරයෙන් සැරහී ලක්ෂයක් අගනා රන්තලිය පරම මධුර මීකිරිබතින් පුරවා තවත් රන්තලියකින් වසා හිසින් ගෙන නුගරුක බලා ගියාය. යන්නා වූ ඕතොමෝ දුරදීම ඒ මුළුමහත් රුක ශරීරාලෝකයෙන් රන්වන් කරමින් රූපවත් පින්පිඩක් වන් වෘක්ෂ දේවතාවා මෙන් වැඩහුන් ඒ බෝසතුන් දැක සතුටු සොම්නස් සිතින් වෘක්ෂ දේවතාය යන හැඟීමෙන් දුටු තැන් පටන් නැමී නැමී ගොස් හිසින් රන් පාත්‍රය බහා මහසතුන් අත තබා පසඟ පිහිටුවා වැඳ මාගේ මනදොළ පිරුණු පරිද්දෙන් ඔබගේ මනදොළ ද සපිරේවායි කියා ගියාය.

ඉක්බිති බෝසත්හු ද රත්තලිය ගෙන නේරඤ්ජරා ගංතෙරට පැමිණ සුප්‍රතිෂ්ඨිත නම් තොටුපළ අද්දර රත්තලිය තබා ස්නානය කොට ගොඩනැගී එකුන්පනස් පිඩක් කොට ඒ කිරිබත් වළඳා ඉඳින් අද මම බුදුවන්නෙමි නම් මේ රත්තලිය උඩුගං බලා යේවායි දැමූහ. ඒ පාත්‍රය උඩුගං බලා ගොස් කාළ නම් නාරජුගේ භවනයට පිවිස තුන් බුදුවරුන්ගේ තළි ඔසවා ඒ යටින් පිහිටියේය.

මහසත්හු එහිම වන ළැහැබ්හි දිවාවිහාර කොට සවස් කල්හි සොත්‍රිය නම් තණ ගෙනයන්නකු විසින් මහසතුන්ගේ ආකාර දැන දෙන ලද අට තණමිට ගෙන බෝමැඩට නැඟ දකුණු දිශාභාගයෙහි සිටියහ. ඒ ප්‍රදේශය පියුමිපත දියබිඳු මෙන් කම්පා විය. බෝසත්හු මෙතැන මාගේ ගුණ දැරීමට අසමත් යයි පශ්චිම දිශාභාගයට ගියහ. එදිගද එසේම කම්පා විය. නැවත උතුරුදිශා භාගයට ගියහ. එදිගද එසේම කම්පා විය. නැවත පූර්ව දිශාභාගයට ගියහ. එහි පර්යංකය පමණ තැන් නිශ්චල විය. බෝසත්හු මේ කෙලෙසුන් සුන් කරන තැනයි සනිටුහන් කොට ඒ තණ අගින් අල්වා සෙලවූහ. ඒවා තෙලිතුඩකින් වට කළාක් වැනි විය. බෝසත්හු බෝධියට නොපැමිණ මේ පලඟ අත නොහැරිමි යි චතුරංග වීර්‍යාධිෂ්ඨාන කොට පර්යංකගතව බෝකඳට පිට ලා නැගෙනහිර බලා වැඩහුන්හ.

එකෙණෙහිම මුළු ලොව පැහැරගන්නා මාරයා බානු දහසක් මවාගෙන හිමගිරිකුළ වත් එක්සිය පනස් යොදුන් සතුරු ඇතුන් මඩින ගිරිමේඛලා නම් චරවාරණාරූඪව නව යොදුනෙක වූ දුනු කඩු පොරෝ හී සැත් ගත් බලවත් මහබල පිරිවරා හාත්පසින් පර්වතයක් මෙන් වසා පැතිරෙමින් මහසතුරකු මෙන් මහසතුන් වෙත පැමිණියේය. මහපුරිස්නු හිරු අවරට නොයාදීම සුවිසල් මරබල පරදවා සුපිපි දෑසමන් කුසුම් බඳු සිවුර මත පතිත රන්පබළු පැළඳුන් රුචිර දර්ශනීය බෝරුක් දලුයෙන් ප්‍රීතියෙන් පුදද්දී මෙන් පළමු යාමයෙහි පුබ්බේනිවාසානුස්සති ඤාණයද මැදියම දිබ්බචක්ඛු ඤාණය ද පිරිසිදු කොට අලුයම පටිච්චසමුප්පාදයෙහි ඤාණය යොදා වට්ට විවට්ය මෙනෙහි කරන සේක් අරුණෝදයෙහි බුදු වී;

> නැවත නැවත ඉපදීම දුකකි. එබැවින් සංසාර මන්දිරය තනන වඩුවා සොයමින් ඔහු දක්නා නුවණ නොලමින් සසර නොඑක් ජාතිවල ඔබ මොබ ඇවිද්දෙමි. වඩුව, මම ඔබ දිටිමි. නැවත ගෙය තැනිය නොහැකිය. ඔබගේ සියලු පරාළ බිඳින ලදි. කැණිමඬලද කඩාබිඳ දමන ලදි. සිත නිවනට පැමිණියේය. රහත්බව ලදිමි.

යන මේ උදානය පවත්වමින් සතියක් විමුක්ති සුව විඳිමින් ගතකොට අටවන දවස්හි සමවතින් නැගී දෙවියන්ගේ සැක දූන ඔවුන්ගේ සැක නසනු පිණිස අහසට නැග යමාමහ පෙළහර දක්වා ඔවුන්ගේ සැක දුරුකොට පර්යංකයෙන් මඳක් නැගෙනහිර උතුරු දිශාභාගයෙහි සිට මාගේ මේ පර්යංකයෙහි සර්වඥතාඥාන ප්‍රතිවේධ කළෙමි. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඵලය සාක්ෂාත් කළ ස්ථානයයි කියා පර්යංකයත් බෝරුකක් අනිමිස ලෝචනයෙන් බලමින් සතියක් ගතකළහ. ඒ ස්ථානය **අනිමිස චෛත්‍යය** නම් විය. ඉක්බිති පර්යංකයටත් සිටි තැනටත් අතර පෙර පසු දෙසින් දික් රුවන් සක්මනෙක්හි සක්මන් කරමින් සතියක් ගෙවූහ. ඒ ස්ථානය **රුවන් සක්මන්** චෛත්‍යය නම් විය. අනතුරුව පැසුළුදික්හි දේවතාවෝ රුවන් ගෙයක් මැවූහ. එහි පර්යංකයෙන් හිඳ අභිධර්ම පිටකය විශේෂයෙන් මෙහි අනන්තනය සමන්ත පට්ඨානය විමසමින් සතියක් කල්ගෙවූහ. ඒ ස්ථානය **රතනඝර චෛත්‍යය** නම් විය.

මෙසේ බෝධි සමීපයෙහිම සතර සතියක් ගෙවා පස්වන සතියෙහි බෝරුක සමීපයෙහි අජපාල නුගරුක වෙත එළඹියහ. එහිද ධර්මය විමසමින්ම විමුක්තිසුව විඳිමින් සතියක් ගෙවූහ. මෙසේ අනිත් සතිය මුචලින්දයෙහි වැඩහුන් සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් කල්හිම සියලු සක්වළ ගැබ පුරන්නාක් මෙන් මහා වැස්සක් ඇති විය. එය හටගත් කල මුචලින්ද නාරජ මෙසේ සිතීය. "මේ මහවැස්ස ශාස්තෘන් වහන්සේ මාගේ ගෙට පිවිසෙන්ම ඇති විය. උන්වහන්සේට වසන ගෙයක් තිබිය යුතුය" කියයි. ඔහු දෙව්විමනක් වැනි සත්රුවන්මුවා විමනක් මැවීමට සමත් නමුත් "එසේ කිරීම මට මහත්ඵල නොවෙයි. භාග්‍යවතුන් වහන්සේට කායික වතාවත් කරන්නෙමි"යි අතිමහත් ආත්මභාවයක් කොට ශාස්තෘන්වහන්සේ සත්දරන පටකින් වටකොට මත්තෙහි මහපෙනය කොට සිටියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වටරවුම ඇතුළත මහ අවකාශයෙහි සර්වරත්න මණ්ඩපයක් තුළ පලඟක් මත්තෙහි එල්ලෙන නානා සුවඳමල් වියන් ඇති නානා සුවඳ මල්සුවඳ පිරි ගඳකිළියක මෙන් විසූහ. මෙසේ බුදුහු ඒ සතිය එහි වැස ඉන්පසු සතිය රාජායතනයෙහි හුන්හ. එහිදු විමුක්ති සුවයම විඳිදහ. මෙපමණකින් සත්සතිය සම්පූර්ණ විය. මේ අතර භාග්‍යවතුන් වහන්සේ ධ්‍යාන සැපයෙන් ඵල සැපයෙන් ද කල් ගෙවූ සේක.

සත්සති ගෙවීමෙන් උන්වහන්සේට මුව දොවමියි සිත් විය.

සක්දෙවිඳු බෙහෙත් අරළු ගෙනවිත් පිළිගැන්වීය ඉක්බිති ශක්‍රයා උන්වහන්සේට නාලිය දුවටි ද මුවදෝනා දිය ද පිළිගැන්වීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දැහැටි වළඳා අනෝතත්විල දියෙන් මුව දොවා රාජායතන මූලයෙහි හුන් සේක. එවේලෙහි සතර ලෝකපාලයන් පිරිනැමූ අගනා සෙල්මුවා පාත්‍රයෙන් තපස්සු භල්ලිකයන්ගේ අත්සුණු මීපිඬු පිළිගෙන වළඳා ආපසු පැමිණ අප්පල් නුගරුක් මුල හුන්හ. එහි හුන්විටම උන්වහන්සේට තමන් වහන්සේ අවබෝධ කළ ධර්මයෙහි ගැඹුරු බව මෙනෙහි කරත්ම සියලු බුදුවරුන්ට ආවේණික "මා විසින් අවබෝධ කරන ලද මේ ධර්මය ගැඹුරුය. දැකීමට අපහසුය. අවබෝධ කිරීමට අසීරුය. ශාන්තය. ප්‍රණීතය. තර්කයෙන් නොගත හැකිය. සියුම්ය. පණ්ඩිතයන් විසින් දතයුත්තේය" යන අනුන්ට ධර්මදේශනා නොකරන ආකාරයට පත් චිත්ත පරිවිතර්කයක් පහළවිය.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම සිතින් දශබලයන් වහන්සේගේ චිත්ත පරිවිතර්කය දැන "හවත්නි, ලොව ඒකාන්තයෙන් නැසෙයි"යි වදන් පවසමින් දසදහසක් සක්වළ බඹගණ පිරිවරා ශක්‍ර සුයාම සන්තුසිත පරනිර්මිතවසවර්ති ආදීන් අග්‍රායත කොට ගනිමින් අවුත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පෙනී ගියේය. හෙතෙම තමහට සිටීමට පොළව සකසා ගෙන දකුණු දණමඬල බිම ඇන සුදිලෙන නිර්මල නිකැලැල් නෙළුම් කැකුළක් බඳු දසනඛ සමෝධානයෙන් බබළනු ඇඳිලි හිත තබා "භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වා, සුගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වා, අල්පරජස්ක වූ සත්වයෝ සිටිති. ධර්මය නොඇසීමෙන් පිරිහෙති. ධර්මය දැනගන්නෝ වෙති." කියායි.

> පෙර මගධයෙහි කෙලෙස් කිළිටින් යුක්තයන් විසින් සිතන ලද අසුද්ධ ධර්මයක් පහළ විය. අමාදොර විවරකරනු මැනව. නිර්මලයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ධර්මය අසත්වා.
> ශෛල පර්වත මුදුනක සිටියෙක් යම් සේ හාත්පස ජනතාව යම්සේ දක්නේද සමතැස් ඇති සුමේධයාණනි, එවැනි උපමා ඇති ධර්මමය ප්‍රාසාදයට නැග ජාති ජරාවෙන් මැඩුණු ජනතාව දකිනු මැනව
> ශෝතාවතීර්ණ ජනතාවගේ ශෝකය දුරලනු මැනව.
> දිනූ සංග්‍රාම ඇති වීරයාණනි, නැගී සිටිනු මැනව, ණය නැති සාත්තු නායකයාණනි, ලොව හැසිරෙනු මැනව. භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. අවබෝධ කරන්නෝ සිටිති.

ඇයි ඔබවහන්සේ "බුදුව අවබෝධ කරවන්නෙමි, සසර තරණය කොට තරණය කරවන්නෙමි. මිදී මුදවන්නෙමි"ටි

මෙහි අප්‍රසිද්ධ වේශයෙන් ධර්මය සාක්ෂාත් කිරීමෙන් මට කවර ඵලයක් ද? සර්වඥ බවට පත්ව දෙවියන් සහිත ලෝකය එගොඩ කරවන්නෙමි කියා

ප්‍රාර්ථනා කොට සර්වඥ බවට පත්වූහයි කියාද ඔබවහන්සේ ධර්ම දේශනා නොකරත් නම් අන් කවරෙක් ධර්මය දෙසන්නේ ද ලෝකයට අන් කවර සරණක් ද? මාත්‍රාණයක්ද ලෙණයක්ද පරායණයක්දයි මේ ආදී නොයෙක් ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේට ධර්ම දේශනාව පිණිස ආයාචනා කළේය. එහෙයින් කියන ලදි. බුදුවූ භාග්‍යවතුන් වහන්සේට අටවන සතියෙහි ධර්මදේශනය පිණිස බ්‍රහ්මයා විසින් අයදින ලදියි.

දැන් කවදා කොහිදී කවුරුන් විසින් මේ ගාථා ප්‍රකාශ කරන ලදදැයි යන මේ ප්‍රශ්න විසඳීමට අවස්ථාව පැමිණියේය. එහි කවදා කියන ලදද යනු, ප්‍රථම මහාසංගීති අවස්ථාවෙහි කියන ලදි. ප්‍රථම මහාසංගීතිය නම් මෙය සංගීතිකඛන්ධකයෙහි කියන ලද පරිදි දතයුතුය. එහි කවුරුන් විසින් කියන ලදද යනු; බුදුන් පිරිනිවි කල්හි රජගහ නුවර **වෙභාර පර්වත පාර්ශ්වයෙහි සප්තපර්ණී** ගුහා දොරටුයෙහි දිනූ සියලු සතුරන් ඇති අජාතශත්‍රු මගධ මහාරාජයා විසින් ධර්ම සංගීතිය සඳහා කරවන ලද පුන්සඳ මඬල බඳු දර්ශන සාරමණ්ඩයක් වූ මණ්ඩපයෙහි ධර්මාසනගත ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් බ්‍රහ්මා ච ලෝකාධිපති යන මේ ගාථාව කියන ලදැයි දතයුතු මෙපමණකින්

කදායං ධම්මදෙසනත්ථං අජ්ඣභාසථ බ්‍රහමුණා ජිනෝ
කදා කත්ථ ච කෙනායං ගාථා හි සමුදීරිතා ති

යන මේ ගාථාව ද කියන ලද අර්ථ ඇත්තේ වෙයි. මෙසේ මේ සම්බන්ධයෙන් කියන ලද ඒ ගාථාවේ නොදක්වන ලද පද වර්ණනාව කරමි. එහි **බ්‍රහ්මා** යනු; ඒ ඒ ගුණ විශේෂයන්ගෙන් කියන ලද්දේනුයි බ්‍රහ්මා නම්. මේ බ්‍රහ්ම ශබ්දය වනාහි මහාබ්‍රහ්ම, බ්‍රාහ්මණ තථාගත මවුපිය ශ්‍රේෂ්ඨ ආදියෙහි දක්නට ලැබේ. එසේමැයි, සහස්සෝ බ්‍රහ්මා යන ආදියෙහි මහාබ්‍රහ්ම තෙම බ්‍රහ්ම යන්නෙන් අභිප්‍රේතය.

තමෝ නුදෝ බුදධෝ සමනතවකඛු
ලොකනතගූ සබබභවාතිවතතෙනා
අනාසවෝ සබබ දුකඛපපහීනෝ
සචචවහයෝ බ්‍රහෙම උපාසිකෝ මෙහි

මෙහි බ්‍රාහ්මණ යන්නෙහිය. බ්‍රහමාති බෝ භිකඛවෙ තථාගතසෙසතං අධිවාචනං යි මෙහි තථාගතයන් කෙරෙහිය. **බ්‍රහමාති මාතාපිතරෝ පබබාචරියාති වුචචරෙ** යි මෙහි මවුපියන් කෙරෙහිය. බ්‍රහමචකකං පවතතෙහි යි මෙහි ශ්‍රේෂ්ඨාර්ථයෙහි අභිප්‍රේතය. මෙහි වනාහි ප්‍රථමධ්‍යානය ප්‍රණීතව වඩා ප්‍රථමධ්‍යාන භූමියෙහි උපන් කල්පායුෂ්ක මහාබ්‍රහ්මය අභිප්‍රේතය. ච ශබ්දය සම්පිණ්ඩනාර්ථයි. බ්‍රහ්මයා ද අනිකුත් දසදහසක් සක්වළ බ්‍රහ්මයෝ ද යන අර්ථයි. පද පූර්ණ මාත්‍රය හෝ වෙයි. **ලෝකාධිපතී** යනු. මෙහි ලොකො යනු සංස්කාර ලෝකය, සත්ව ලෝකය, අවකාශ ලෝකයයි ලෝක තුනකි. එයින් මෙහි සත්ව ලෝකය අභිප්‍රේතය. එහි ඊශ්වර අධිපතිතුයි ලෝකාධිපතිය. ලෝකයෙහි කොටසක අධිපති වුවත් ලෝකාධිපති නම්. දේවාධිපති නරාධිපති මෙනි. **සහම්පති** යනු. හෙතෙම වනාහි කාශ්‍යප බුද්ධශාසනයෙහි **සහක** නම් තෙර කෙනෙකි. පළමු දෑහැන උපදවා නොපිරිහුණු දෑහැනින් දිවි කෙළවර ප්‍රථමධ්‍යාන භූමියෙහි කල්පායුෂ්ක මහාබ්‍රහ්ම වී උපන්නේය. එහි වනාහි ඔහු සහම්පති බ්‍රහ්මයායි හඳුනති. සහකපතියි කිවයුතු තැන අනුස්වාරාගමය කොට රූසී වශයෙන් සහම්පතියි කියති. **කතඤජලී** යනු; කරන ලද ඇඳිලි ඇත්තේ, ඇඳිලි පුටය හිසෙහි කොට යන අර්ථයි. **අනධිවරං** යනු; අත්‍යන්තයෙන් ශ්‍රේෂ්ඨයා. ඔහුට වඩා ශ්‍රේෂ්ඨයෙක් නැත්තේයි අනධිවරයි. ඉන් අධික ශ්‍රේෂ්ඨයෙක් නැත්තේනුයි හෝ අනධිවරයි. අනුත්තර යන අර්ථයි. ඒ අනධිවරයන්. අයාචථා යනු; ආයාචනා කළේය. ආරාධනා කළේය. දැන් යමක් සඳහා හෙතෙම භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළේද ඒ අර්ථය දක්වීමට "සනතිධ සතතා" ආදිය කියන ලදි.

එහි **සන්ති** යනු; විද්‍යමාන වෙති. ලැබෙති. බුදු ඇසට යොමුවන්නෝ සිටිති යන අර්ථයි. **ඉධ** යනු; දේශය දැක්වීමේ නිපාතයි. එය **කිසිතැනෙක** සසුන සඳහා කියැවේ. මෙසේය - "ඉධෙව භිකඛවෙ සමණෙ ඉධ දුතියෝ සමණෙ ඉධ තතියෝ සමණෙ ඉධ චතුත්ථෝ සමණෙ සුඤඤා පරපපවාදා සමණෙහි අඤඤෙහි යි." කිසි තැනෙක්හි අවකාශයෙහි කියන ලදි.

ඉධෙව තිට්ඨමානස්ස දෙවභූතස්ස මෙ සකෝ
පුනරායු ච මෙ ලද්ධා එවං ජානාහිමාරිස යි.

කිසිතැනෙක පදපූරණියෙහි පමණක් වෙයි කියන ලදි. ඉධාහං භික්ඛවෙ භූතනාවී අසස්ං පවාරිතො යි. කිසි තැනෙක ලෝකය සඳහාය. කියන ලදි ඉධ තථාගතො ලොකෙ උපපජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය කියා යි. මෙහිදී ද ලෝකය සඳහාම කියන ලදැයි දතයුතු. එබැවින් මේ සත්ව ලෝකයෙහි යන අර්ථයි.

සතතා යනු; රූපාදි ස්කන්ධයන්හි ඡන්දරාගයෙන් ඇලුණාහු. විශේෂයෙන් ඇලුණාහු ආසක්ත වූවාහු ලග්න වූවාහු බැඳුණාහු පැමිණියාහු සම්ප්‍රාප්ත වූවාහු. ප්‍රාණීහු කියති රූඩී ශබ්දයෙන් වනාහි විතරාගීන් කෙරෙහි ද මේ ව්‍යවහාරය පවත්නේය. අපපරජකඛජාතිකා යනු; ප්‍රඥාමය ඇසෙහි අල්ප මද රාග දෝස මෝහ රජස් ඇත්තේය. මෙබඳු ස්වභාව ඇති ඔවුහු අපපරකඛජාතික වෙති. අල්ප වූ රාගාදි රජස් ඇත්තේ යමෙක් හට ද ඔවුහු අල්ප රජස්කයෝය. අල්ප රජස්ක ස්වභාව ඇත්තෝ අල්ප රජස්ක ජාතිකයෝය. ඒ අල්පරජස්ක ජාතිකයන්ට, සත්වයන්ට විභක්ත විපරිණාම කොට **දෙසෙහි ධම්මං** කියා මේ හා සම්බන්ධ කොට අර්ථය ගතයුතුය. **දෙසෙහි** යනු; මෙය ආයාචනා වචනයි. දෙසනු මැනව. කියනු මැනව. දක්වනු මැනව යන අර්ථයි. ධම්මං යනු; මෙහි මේ ධම්ම ශබ්දය පර්යාප්ති සමාධි ප්‍රඥා ප්‍රකෘති ස්වභාව ශූන්‍යතා පුණ්‍ය ආපත්ති ඤෙය්‍ය චතුසසත්‍ය ධර්මාදියෙහි දක්නා ලැබේ. එසේමැයි

"ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං -පෙ- වෙදල්ලනති ආදියෙහි **පර්යාප්තියෙහි** දක්නා ලැබේ. එවං ධම්මා තෙ භගවනෙතා අහෙසුං යනාදියෙහි **සමාධියෙහිය.**

යසෙසතෙ චතුරෝ ධම්මා වානරින්ද යථාතව
සවවං ධම්මෙමා ධිතී චාගෝ දිටඨං සො අනීවතතති

ආදියෙහි **ප්‍රඥායෙහිය.** ජාති ධම්මා ජරාධම්මා අථෝ මරණධම්මිනෝ ආදියෙහි **ස්වභාවයෙහිය.** තසමිං බොපනං සමයෙ ධම්මා හොනති ආදියෙහි **ශූන්‍යතාවෙහිය.** ධම්මෙමා සුවිණෙණා සුඛමාවහාති ආදියෙහි **පිනෙහිය.** දෙව අනියතා ධම්මා ආදියෙහි **ආපත්තියෙහිය.**

සබෙබ ධමමා සබබාකාරෙන බුදධසස භගවතො ඤාණපථෙ ආපාථං ආගනති ආදියෙහි **චතුරාර්ය සත්‍ය ධර්මයෙහිය.** මෙහි ද චතුරාර්ය ධර්මයයි දතයුතු. **අනුකමපා** යනු; අනුකම්පාව අනුද්දයාව කරනු මැනව. **ඉමං** යනු; ප්‍රජාව දක්වමින් කීය. **පජං** යනු; ප්‍රජානත්වයෙන් පජා නම්. ඒ ප්‍රජාව-සත්ව වර්ගයා සසර දුකින් මුදවනු මැනව යන අභිප්‍රායයි. සමහරු වනාහි-

භගවාති ලොකාධිපති නරුතතමො
කතඤ්ජලී බ්‍රහමගණෙහි යාචිතො කියා හදාරති. මෙපමණකින් සර්වප්‍රකාරයෙන් මේ ගාථාව කියන ලද අර්ථ ඇත්තේ වෙයි.

ඉක්බිති සහම්පති බඹහුගේ ඒ ආයචනා වචනය අසා අපමණ කල්හි හටගත් කරුණා බල යුත් දසබල වූ පරහිත සෑදීමෙහි නිපුණ ප්‍රඥා ඇති භාග්‍යවතුන් වහන්සේට සත්ත්වයන් විෂයෙහි ඉඩ සලසා දීම් වශයෙන් මහා කරුණාව පහළ විය. භාග්‍යවතුන් වහන්සේගේ කරුණා ඉපදවීම දක්වන සංගීතිකාරකයන් විසින් සංගායනා අවස්ථාවෙහි-

විද්‍යාවෙන් හා චරණයෙන් යුත් තාදිගුණ ඇති
ප්‍රභාසම්පන්න අන්තිම දේහධාරී වූ අප්‍රතිපුද්ගල වූ
තථාගතයන් වහන්සේට සියලු සත්වයන් වෙත
මහාකරුණාව ඇතිවිය.
යන ගාථාව තබන ලදි.

එහි සමපනන විජජාචරණසස යනු; සම්පන්නතාව නම් ත්‍රිවිධය. පූර්ණ, සාමග්‍රී, මධුර, වශයෙනි. එහි-
සමපනනං සාලිකෙදාරං සුවා භුඤජනති කොසිය
පටිවෙදෙමි තෙ බ්‍රහෙම න නං වාරෙතුමුසසහෙ
පරිපුණ්ණ සම්පන්න නම් මෙයයි.

ඉමිනා පාතිමොකඛ සංවරෙන උපෙකො හොති සමුපෙතො සමපනෙනා සමනනාගතො යන මෙය සමංගි සම්පන්න නම්. ඉමිසසා හනෙන මහාපඨවියා හෙටඨිමං තලං සම්පනනං සෙය්‍යථාපි නාම බුදදමධුං අනීලකං එවමසසඤං යන මෙය මධුර සම්පන්න නම්. මෙහි පරිපූර්ණ සම්පන්න බව ද සමංගි සම්පන්න බව ද යෙදේ.

විජජා යනු ප්‍රතිපක්ෂ ධර්ම විදින අර්ථයෙන් ද විදිය යුතු අර්ථයෙන් ද විජජා යි. ඒවා ත්‍රිවිද්‍යා ෂට්විද්‍යා අෂ්ට විද්‍යායි. සෙස්ස භයහෙරව සූත්‍රයෙහි ආ නයින්ම දතයුතු. අෂ්ටවිද්‍යා අම්බට්ඨ සූත්‍රයෙහිය. එහි වනාහි විදර්ශනා ඥානයත් මනෝමය ඍද්ධියත් සමඟ ෂඩ්භිඥා ගෙන අෂ්ටවිද්‍යාව කියන ලදි. **චරණ** යනු සීලසංවරයයි. ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇති බව, බොජුනෙහි පමණ දන්නා බව, නිදි වැරීමෙහි යෙදීම, ශ්‍රද්ධා හිරිඔත්තප්ප, බහුශ්‍රැත බව, අරඹන ලද වෙර ඇති බව, එළඹ සිටි සිහි ඇති බව, ප්‍රඥාසම්පන්නතාව, සතර රූපාවචර ධ්‍යාන යන මේ පසළොස් ධර්මයන් දතයුතුය. මේ පසළොස් ධර්මයන් ම යම්හෙයින් මෙයින් ආර්ය ශ්‍රාවකයා හැසිරෙයි. නිවන දෙසට ගමන් කරයිද එහෙයින් චරණයයි කියන ලදි. මෙසේය. ඉධ මහානාම අරිය සාවකො සීලවා හොති යයි සියල්ල මජ්ඣිම පණ්ණාසකයෙහි කී නයින් දතයුතුය. විජ්ජා ද චරණ ද විජ්ජාචරණයි. සම්පන්න වූ පරිපූර්ණ වූ විජ්ජාචරණ යමෙකුටද හෙතෙම සම්පන්නවිජ්ජාචරණ යි. විජ්ජාචරණයෙන් සම්පන්න සමංගීභූත සමන්නාගත වූයේ විජ්ජාචරණ සම්පන්න නමි. දෙපරිද්දෙන්ම අර්ථය යෝග්‍ය වේමය. ඒ විජ්ජාචරණ සම්පන්න වූවහුට. **තාදිනො** යනු, ඉෂ්ටයෙහිද තාදි අනිෂ්ටයෙහිද තාදි ආදි විසින් මහානිද්දේසයෙහි ආ තාදි ලක්ෂණයෙන්. තාදිනො, ඉෂ්ටානිෂ්ටාදියෙහි විකාර නුවූ එබඳු තැනැත්තහුට යන අර්ථය. **ජුනින්ධරස්ස** යනු; බබළන්නහුට. කල්පාන්තයෙහි උදාවූ හිරුටත් වැඩි ශරීරාලෝක පතුරුවන්නහුට යන අර්ථයි, ප්‍රඥා ප්‍රදීපය දරන්නහුට ද කීමටත් වටනේය. මෙය කියන ලදි-

> ලොව බබළන වස්තු සතරකි. මෙහි පස්වැන්නක් නැත. හිරු දාවල බබළයි. චන්ද්‍රයා රාත්‍රියෙහි බබළයි. ඉක්බිති ගින්න දිවාරාත්‍රි ඒ ඒ තැන බබළයි. බබළන්නවුන් අතර සම්බුදුහු ශ්‍රේෂ්ඨ වෙති. මේ අනුත්තර ආලෝකයයි.

එහෙයින් ශරීර ප්‍රඥා දෙපසින්ම ආලෝක රාශි දරන්නවුන්ට යන අර්ථයි. **අන්තිම දේහධාරිනො** යනු; හැමට පැසුම් දේහධාරීන් හට, පුනර්භවයක් නැත්තවුන්ට යන අර්ථයි. **තථාගතස්ස** යනු; අට කරුණකින් භාග්‍යවතුන් වහන්සේ තථාගතයයි කියනු ලැබේ. කවර අටකින් ද? එසේ ආයේනුයි තථාගතයි. එසේ ගියේනුයි තථාගතයි. තථ ලක්ෂණ දත් හෙයින්

තථාගතයි. තථධර්ම ඇති සැටියෙන් අවබෝධ කළ හෙයින් තථාගතයි. තථදර්ශී හෙයින් තථාගතයි. තථවාදී හෙයින් තථාගතයි. එසේ කළ හෙයින් තථාගතයි. අභිභවනාර්ථයෙන් තථාගතයි.

භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් එසේ ආසේනුයි තථාගත වෙත් ද? යම්සේ යම් අභිනීහාරයකින් දාන පාරමිතාව පුරා සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිෂ්ඨාන, මෙත්තා, උපේක්ඛා, පාරමී පුරා මේ දසපාරමිතා, දස උපපාරමිතා, දස පරමාර්ථ පාරමිතා යන සමතිස් පැරුම් පුරා අවයව පරිත්‍යාග, ජීවිත පරිත්‍යාග, ධන රාජ්‍ය, අඹුදරු පරිත්‍යාග යන මේ පස්මහ පරිත්‍යාග කොට විපස්සි ආදි සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා යම්සේ පැමිණිසේක්ද එසේ අප භාග්‍යවතුන් වහන්සේ ද පැමිණි සේකැයි තථාගත නම් වෙති කීහ.

> ලොව විපස්සි ආදි මුනිවරු බුදුබවට යම් සේ පැමිණියාහු ද එසේ මේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ ද පැමිණියහ. එසේ හෙයින් පසැස් ඇති උන්වහන්සේ තථාගතයයි කියනු ලැබේ.

කෙසේ නම් එසේ ගියේනුයි තථාගත නම් වෙත් ද? යම් සේ විපස්සි ආදි බුදුවරු උපන් කෙණෙහි සමපයින් පොළොවෙහි පිහිටා උතුරු දෙස බලා සත්පිය ඉක්මවමින් ගිය සේක් ද එසේ අප භාග්‍යවතුන් වහන්සේ ද ගිය සේකැයි තථාගත වෙති.
කීහ-

> යම් සේ උපන් මොහොතෙහිම ගවම්පතීහු සම පාදයෙන් පොළොව ස්පර්ශ කළාහු ද එසේම ඒ ගෞතමයන් වහන්සේ සත් පියවරක් ඉක්මවූහ. දෙවියෝ සේසත දරූහ.
> ඒ ගෞතමයාණෝ සත් පියවරක් ගොස් එකෙණෙහි හාත්පස දිශාවන් බැලූහ. පර්වත මුදුනක සිටි සිංහයකු මෙන් අටඟින් යුත් වදන් පැවසූහ.

කෙසෙ නම් තථ ලක්‍ෂණ අවබෝධ කළේනුයි තථාගත වෙත් ද? සියලු රූපාරූප ධර්මයන් ඇති සැටියෙන් ස්වලක්‍ෂණ සාමාන්‍ය ලක්‍ෂණ ද තත් වූ පරිදි නොවෙනස්ව ඤාණගතියෙන් අවබෝධ කළහ. නොවරදවා අවබෝධ කළහ. අනබෝධ කළහයි තථාගත වෙති.

යම් සේ සියලු ධර්මයන්ගේ ස්වලක්ෂණ සාමාන්‍ය ලක්ෂණ තථ්‍යවම අවබෝධ කළාහුද එහෙයින් ශාස්තෘන් වහන්සේ තථාගත වෙති.

තථ ධර්මයන් තත්වූ පරිදි අවබෝධ කළ හෙයින් තථාගත නම් වූහු ද? තථ ධර්ම නම් සතර සත්‍ය ධර්මයෝය. වදාළහ. මහණෙනි, මේ තථ්‍ය වූ අවිතථ වූ වෙනස් නොවන්නා වූ ධර්ම සතරකි. කවර සතරද? මහණෙනි, මේ දුකය යනු මෙය තථ්‍යය. අවිතථය. වෙනස් නොවන්නේ යි විස්තර කළ යුතුය. භාග්‍යවතුන් වහන්සේ ඒවා අවබෝධ කළහ. එසේ ඒවා අවබෝධ කළ හෙයින් තථාගතයයි කියනු ලැබේ. මෙහි ගත ශබ්දය අභිසම්බෝධාර්ථයි.

තථ නම් වූ සත්‍යයන් නායකයන් වහන්සේ අවබෝධ කළ සේක. එහෙයින් තථ නම් වූ සත්‍යය අවබෝධ කළ හෙයින් තථාගත වෙති.

තථ දර්ශිත හෙයින් තථාගත වන්නේ කෙසේද? භාග්‍යවතුන් වහන්සේ අප්‍රමාණ ලෝකධාතුවල අප්‍රමාණ සත්වයන්ගේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මන යන දොරටුවලට යොමුවන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ්වය ධර්ම අරමුණු තථාගතයන් වහන්සේ සර්වාකාරයෙන් දනිති. දකිති. මෙසේ තථදර්ශී බැවින් තථාගත වෙති. නොහොත් ලෝකයෙහි තථ්‍යය කුමක්ද එය ලෝකයට එසේම දක්වති. එයිනුත් භාග්‍යවතුන් වහන්සේ තථාගත වෙති. මෙහි තථදර්ශී අර්ථයෙහි තථාගතයයි පද සම්භවය දතයුතුයි.

යමෙක් තත් ආකාරයෙන් ධර්මයන් දකීද දනීද එහෙයින් තථාදර්ශී සම්බුදුහු තථාගත යයි කියන ලදි.

තත්වූ පරිදි වාදී වූ හෙයින් තථාගත වන්නෙ කෙසේ ද? තථාගතයන් වහන්සේ අභිසම්බෝධියෙහි පටන් පිරිනිවන් පෑමත් අතර පන්සාලිස් වසක් පමණ කාලයෙහි සූත්‍රාදි වශයෙන් යම් නවාංග සංග්‍රහයෙන් දෙසන ලදද තෙපලන ලදද ඒ සියල්ල එකම තුලාවක තුලිත වූවක් මෙන් තත්වූ පරිදිම නොවෙනස් වූයේම වෙයි. එහෙයින් වදාළහ- චුන්ද, යම් රාත්‍රියක තථාගතයන් වහන්සේ අනුත්තර සම්බෝධිය අවබෝධ කරන සේක් ද, යම් රාත්‍රියක අනුපාදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවෙන සේක්ද මෙදාතුර යමක් කියන සේක් නම් තෙපලන සේක් නම් ඒ සියල්ල එසේම වෙයි. අන් ලෙසකින් නොවෙයි. එහෙයින් තථාගත නම් වෙති

කියනු ලැබේ. මෙහි වනාහි ගද අර්ථයෙහි ගත ශබ්දයයි. තථා වාදිකාය තථා ගතො යනු මෙසේය. ආගදනය ආගදයි. වචනය යන අර්ථයි. තථ්‍ය වූ අවිපරීත වූ වදන් උන්වහන්සේට ඇත්තේනුයි. තථාගත නම් වෙති. දකාරයට තකාරාදේශ කොට කියන ලදි.

> යම් හෙයකින් ජිනයන් වහන්සේ තථාවාදී වෙත් ද තථ ධර්මප්‍රකාශක වෙත් ද උන්වහන්සේගේ තථවදන් ඇත්තේ ද එබැවින් බුදුහු තථාගත නම් වෙති.

එසේ කරන ලද හෙයින් කෙසේ තථාගත වෙත්ද? භාග්‍යවතුන් වහන්සේ යම් වචනයක් කියත් ද එයම කයින් කරති. වචනයට කය අනුලෝමය. කයට වචනයද අනුලෝමය. එහෙයින් දෙසන ලදි. මහණෙනි, තථාගතයන් වහන්සේ යම්සේ කියත් ද එසේ කරන්නාහ. යම්සේ කරත්ද එසේ කියන්නාහ. මෙසේ කියන පරිදි කරති. කරන පරිදි කියති. එහෙයින් තථාගත වෙති කියායි. වදන යම්සේ ගියේද කයත් එසේම ගියේය. කය ගියේ යම් සේද වචනයද එසේ ගියේය. එසේ කළ බැවින් තථාගත නම් මෙසේය.

> උන්වහන්සේගේ වචනය ගියේ යම්සේද කයද එසේ ගියේය. ශාස්තෘ සම්බුදුහු තථාවාදිකාවෙන් තථාගත වෙති.

අභිභවනාර්ථයෙන් තථාගත වන්නේ කෙසේද? උඩින් භවාග්‍රය, යටින් අවීචිය හිමි කොට සරසින් අප්‍රමාණ ලෝකධාතුවල සියලු සත්වයන් ශීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන්, විමුක්තියෙන්, විමුක්ති ඥානදර්ශනා-යෙන් අභිභවනය කරති. උන්වහන්සේට සම වූ හෝ ප්‍රමාණ වූයෙක් නැත. එබැවින් අතුල්‍ය අප්‍රමෙය අනුත්තර වෙති. එයින් වදාළහ - මහණෙනි, දෙවියන් සහිත ලෝකය තථාගතයන් වහන්සේ මැඩ පවත්වති. නොමඬන ලද්දාහු වෙති. ඒකාන්තදර්ශී වෙති. වසඟයෙහි පවත්වති. එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

එහි පදසිද්ධිය මෙසේ දතයුතුය. බෙහෙතක් වැනි අංගදනයයි. මේ කවරෙක්ද? දේශනා විලාසය සහ පුණ්‍ය විලාසයයි. එහෙයින් මේ මහානුභාව ඇති වෛද්‍යවරයා දිවබෙහෙතකින් සර්පයන් මෙන් සියලු පරවාදීන් දෙවියන් සහිත ලෝකය මැඩලති. මෙසේ මුළු ලොව මැඩීමෙන්

දේශනා විලාසමය වූද, පුණ්‍යමය වූද පැමිණීම් උන්වහන්සේට ඇත්නුයි දකාරයට තකාරය කොට තථාගත නම් වූහයි දතයුතුය. මෙසේ අභිභවනාර්ථයෙන් තථාගත වෙති.

> තථ්‍ය අවිපරීත වූ වදන් යම් ශාස්තෘ කෙනෙකුන්ට ඇද්ද උන්වහන්සේ එයින් වසයෙහි පවත්වන්නාහු වෙති. ශාස්තෘන් වහන්සේ තථාගත වෙති.

අප්පටිපුග්ගලස්ස යනු; ප්‍රතිපුද්ගලයන් විරහිතයාණන්ට. උන්වහන්සේට මම බුද්ධ වෙමි කියා මෙබඳු ප්‍රතිඥාවක් දීමට සමත් අන් කිසි පුද්ගලයෙක් නැත්තේ නුයි අප්පටිපුග්ගල නමි. ඒ අප්‍රති පුද්ගලයාණන්ට. **උප්පජ්ජි** යනු උපන්නේය. පහළවිය. **කාරුඤ්ඤතා** යනු; කරුණාභාවය කාරුඤ්ඤතාවයි. **සබ්බසත්තෙ** යනු, නිරවශේෂ සත්වයන් ගැනීමේ වචනයයි. සියලු සත්ව නිකායයන් යන අර්ථයි. මෙපමණකින් මේ ගාථාවද කියන ලද අර්ථ ඇත්තෝයි.

බ්‍රහ්මයා විසින් ද අයදින ලද භාග්‍යවතුන් වහන්සේ සත්වයන් කෙරෙහි කරුණා උපදවා ධර්මය දේශනා කරනු කැමතිව මහාබ්‍රහ්මයාට ගාථාවකින් වදාළහ.

> ඔවුන්ට අමාදොර හරින ලදි යමෙක් අසනු කැමැත්තාහුද ශ්‍රද්ධාව මුදත්වා. බ්‍රහ්මය, වෙහෙසකැයි හැඟීමෙන් ප්‍රණීත ප්‍රගුණ ධර්මය මිනිසුන් අතර නොදෙසීමි.

ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම දේශනාවට අවකාශ කරනු ලැබුයෙමි කියා දසනිය එකතුවෙන් බබළන අඤ්ජලිය හිස තබා බුදුන් වැඳ පැදකුණු කොට බඹගණ පිරිවරා ගියේය. ඉක්බිති ශාස්තෘහු ඒ බ්‍රහ්මයාට ප්‍රතිඥා දී මම කවරෙකුට පළමුව දහම් දෙසන්නෙම් දයි සිතන්නාහු ආළාර පණ්ඩිතය. හෙතෙම මේ දහම වහා දුනගනී කියා සිත් උපදවා නැවත බලන්නාහු ඔහු කළුරිය කොට සතියක් බවද, උද්දක අළුයම කළුරිය කළ බවද දුන නැවත මෙකල පස්වග භික්ෂූහු කොහි වෙසෙත්දයි මෙනෙහි කරන සේක් බරණැස මිගදායෙහි යයි දුන ඇසළ පොහෝදින පාන්දර කලින්ම පාසිවුරු ගෙන අටළොස් යොදුන් මගට පිළිපන්නාහු අතරමඟ උපක නම් ආජීවක දුක ඔහුට

තමන් වහන්සේගේ බුදුබව පවසා එදිනම සවස ඉසිපතනයට වැඩි සේක. එහිදීද පංචවර්ගීයයන් හට තමන් වහන්සේගේ බුදුබව ප්‍රකාශ කොට පනවන ලද උතුම් බුද්ධාසනගතව පංචවර්ගීයයන් අමතා ධම්මචකකපවත්තන සූත්‍රාන්තය දේශනා කළ සේක.

උන්වහන්සෙලාගෙන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරහු දේශනානු සාරයෙන් නුවණ මෙහෙයවා සූත්‍රාවසානයෙහි අටළොස් කෙළක් බඹුන් සමග සෝවාන් ඵලයෙහි පිහිටියහ. ශාස්තෘන් වහන්සේ එහිම වස් එළඹ දෙවන දවසේ වප්ප තෙරුන් සෝවාන් පෙලෙහි පිහිටවූහ. මේ අයුරින් ඒ සියලු තෙරුන් සෝවාන් ඵලයෙහි පිහිටුවා නැවත පක්ෂයෙහි පස්වන දින තෙරවරුන් රැස්කරවා අනත්තලක්ඛණ සූත්‍රය දෙසූහ. දේශනා කෙළවර තෙරුන් පස්දෙනම අර්හත්වයෙහි පිහිටියහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ එහිම යස කුලපුතුන්ගේ හේතුසම්පත් දැක ගෙය හැර නික්මුණුවුන් යස, එන්නැයි කැඳවා එම රාත්‍රී කාලයෙහිම සෝවාන් පෙලෙහි ද දෙවන දින රහත් බැව්හිද පිහිටුවා තවත් ඔහුගේ යහළුවන් පනස්හතර දෙනකු එම මහණ පැවිද්දෙන් පැවිදි කරවා රහත්බැව්හි පිහිටවූහ. මෙසේ ලොව රහතන් එක්සැටක් වූ කල්හි බුදුහු වස්වැස පවරා භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක.

මහණෙනි, මේ පොළොවෙහි ආත්මාර්ථයත් පරාර්ථයත් ඉටු කරමින් මිනිසුන්ට ධර්මය දේශනා කරමින් හැසිරෙව්.
ලොවට නිරන්තරයෙන් මාගේ සද්ධර්මය ප්‍රකාශ කරමින් විවේක සෙනසුන්හි වනාන්තරවල පර්වතවල වාසය කරව්.
මහණෙනි, ධර්මදූත සේවාවෙහි යෙදෙමින් යහපත් පැවැත්මෙන් සත්ව ශාන්තිය පිණිස මාගේ ධර්මය පතුරුවා හරිව්.
සියලු අපාය දොරටු වසා දමව්. ආශ්‍රව රහිතව අසමව ස්වර්ගමෝක්ෂ මාර්ගයට දොර විවර කරව්.
දේශනා ප්‍රතිපත්ති කරුණාදි ගුණ නිවාසව ලෝකයාගේ ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් සර්වප්‍රකාරයෙන් අභිවර්ධනය කරව්.
නිතර ආමිස දානයෙන් උපකාර කරන ගිහියන්ට ධර්ම දානයෙන් ප්‍රත්‍යුපකාර කරව්.
සදධර්මය දේශනා කරමින් අර්හත්ධජය ඔසවව්. කෘත කෘත්‍ය ඇතිව පරාර්ථයෙහි හැසිරෙව්.

මෙසේ වදාරා භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් දිශාවන්හි පිටත්කොට

යවා තමන් වහන්සේ උරුවේලාවට වඩනා සේක් අතරමඟ **කප්පාසිය වනළැහැබිහි භද්‍රවර්ගීය** කුමාරවරුන් තිස්දෙන හික්මවූහ. ඔවුන්ගෙන් හැමට බාලයා සෝවාන් විය. හැමට වැඩිමලා අනාගාමී විය. එකෙක්වත් රහත් හෝ පුහුදුන් නොවීය. ඒ සියල්ලන්ම එව මහණ පැවිද්දෙන් පැවිදි කරවා තමන් වහන්සේ උරුවේලාවට වැඩ තුන්දහස් පන්සියයක් පෙළහර දක්වා උරුවෙල් තසුප් ආදි දහසක් පිරිවර ඇති තුන්බෑ ජටිලයන් දමනය කොට එව මහණ පැවිද්දෙන් පැවිදි කොට ගයා හිස හිඳුවා ආදිත්ත පරියාය දේශනාවෙන් රහත් බැව්හි පිහිටුවා භාග්‍යවතුන් වහන්සේ ඒ රහත් දහස පිරිවරා බිම්සර රජුගේ ප්‍රතිඥාව මුදන්නෙමි'යි රජගහ නුවර අසල **ලට්ඨවන** නම් උයනට වැඩි සේක. ඉක්බිති උයන්පල් රජුට දැන්වීය. රජ ශාස්තෘන් වහන්සේ වැඩිසේකැයි අසා දොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතියන් පිරිවරා වලාවිවරගත දිවාකරයා මෙන් වනගැබ වන් මුනිවර දිවාකරයන් කරා ගොස් සත්ලකුණින් හෙබි නිමල විකසිත ජලජ පියුමක් බඳු කොමල දසබල සිරිපා ඔටුනු මිණිරසින් බබළන සිරසින් වැඳ පසෙක පිරිස සමගින් හුන්නේය. එවිට ඒ බමුණු ගැහැවියනට මෙසේ සිත්විය. කිම මහාශ්‍රමණයෝ උරුවෙල් කසුප් වෙත බඹසර හැසිරෙත්ද? නැතහොත් උරුවෙල් කසුප් මහා ශ්‍රමණයන් වෙත හැසිරෙන්නේද? කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ චිත්තපරිවිතර්කය දැන තෙරුන්ට ගාථාවකින් වදාළහ.

> උරුවෙලවාසි කාශ්‍යපයිනි කුමක් දැක ගින්න අත්හැරියෙහි ද?
> අනුශාසකයා කවරෙක් ද? කාශ්‍යපය මේ කරුණු තොපගෙන් අසමි. තොපගේ ගිනි දෙවියන් පිදීම කෙසේ ප්‍රහීණ වීද?

තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය දැන-

> රූප ද ශබ්ද ද එසේම රසයන් ද කාමී ස්ත්‍රීන් ද යන මේ පංචකාම සම්පත් යඥයයි කියනු ලැබේ. උපධි විභයෙහි මෙය කිළිටකැයි දැන එහෙයින් යඥයෙහිද ගිනි පිදීමෙහි ද නොඇලුණෙමියි කියා.

මේ ගාථාව පවසා තම ශ්‍රාවක බව ප්‍රකාශ කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි සිරසින් වැටී "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘන් වහන්සේය. මම ශ්‍රාවක වෙමියි උඩනැගී සක්තල් ගසක් පමණ අහසට සත්වරක් පැන නැගී පෙළහර කොට අහසින් බැස භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එවිට මහජනයා උත්වහන්සේගේ පෙළහර දැක 'අපොයි, බුදුවරු නම් මහානුභාව වෙති. මෙබඳු දැඩි දෘෂ්ටිගත මම රහත්මියි සිතන උරුවෙල කාශ්‍යප ද දෘෂ්ටිජාල

බිඳ තථාගතයන් වහන්සේ විසින් දමනය කරන ලදයි' දශබලයන් වහන්සේගේ ගුණකථා කීහ. එයසා භාග්‍යවතුන් වහන්සේ දන් පමණක් මම මොහු දමනය නොකෙළෙමි. පෙරත් මා විසින් මොහු දමනය කරන ලදයි වදාළහ. ඉක්බිති ඒ මහජනයා නුනස්නෙන් නැගිට බුදුන් වැඳ හිසෙහි ඇඳිලි බැඳ මෙසේ කීහ. ස්වාමීනි, අපි දමනය කළ මොහු දිටිමු. අතීතයෙහි භාග්‍යවතුන් වහන්සේ මොහු කෙසේ දමනය කළසේක්ද? කියායි. මහාජනයා විසින් අස්වන ලද ශාස්තෘන්වහන්සේ භවාන්තරයෙන් වැසී ගිය මහානාරද කාශ්‍යප ජාතකය දෙසා චතුස්සත්‍යය ප්‍රකාශ කළහ. ශාස්තෘන් වහන්සේගේ ධර්ම කථාව අසා බිම්සර රජ එකොළොස් නහුතයක් සමග සෝවාන් ඵලයෙහි පිහිටියේය. එක් නහුතයක් උපාසක බව දක්වූහ. රජ සරණ ගොස් භික්ෂුසංඝයා සමග සෙටදිනට භාග්‍යවතුන් වහන්සේට ආරාධනාකොට තෙවරක් බුදුන් පැදකුණු කොට වැඳ ගියේය. දෙවන දින බුදුහු දෙවිගණ පිරිවැරූ සහසැස් දෙවිරජු මෙන් බඹගණ පිරිවැරූ මහා බ්‍රහ්මයා මෙන් බික්සඟන පිරිවරා රජගහ නුවරට පිවිසියහ. රජ බුදුපාමොක් බික්සඟන දන් පුදා බොජුන් කෙළවර මෙසේ කීය. ස්වාමිනි, මට තෙරුවනින් වෙන්ව සිටිය නොහැකිය. වෙලාවෙහි හෝ ආවේලාවෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එමි. ලට්ඨිවනය නම් ඉතා දුරය. මේ අපගේ වෙළුවනය නම් උයන විවේකකාමීන්ට ඉතා ළඟත් නොවේ. ඉතා දුරත් නොවේ ගමනාගමනයට පහසුය ජනසම්බන්ධ රහිතය. විවේක සැප සහිතය. සෙවණපැන් සහිතය. සිහිල් ගල් තලායෙන් සමලංකෘත රමණීය භූමි භාගයකි. සුවඳ කුසුමින් හා උතුම් වෘක්ෂයෙන් ගැවසී ගත්තේය. රමණීය ප්‍රාසාද හම්මිය. විමාන විහාර අඩ්ඩයෝග මණ්ඩපාදියෙන් යුක්තය. මාගේ මේ උයන භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක්වායි දිලෙන ගිනිඅඟුරු වැනි රත්කෙණ්ඩියෙන් සුවඳ කුසුම් වැනි මිණිවන් දිය ගෙන වේළුවනාරාමය පුදන්නේ දසබලයන් වහන්සේගේ අතෙහි පැන් වැඩිය. ඒ ආරාම පිළිගැන්මෙහි බුද්ධශාසනයාගේ මුල්බැස ගත්තේ යයි ප්‍රීතියට පත්ව නටන්නාක් මෙන් මේ මහා පොළොව කම්පා විය. දඹදිව වේළුවන මහාවිහාරය හැර පොළොව කම්පාකොට පිළිගත් වෙනත් සෙනසුනක් නම් නැත. ඉක්බිති ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමය පිළිගෙන රජුට විහාරදානානුමෝදනාව කළ සේක.

> ලෝකනාථ බුදුවරයන් වහන්සේලා හැර ආවාස දානයෙහි අනුසස් කියන්ට කටවල් දහසකින් යුක්ත වූද අන් කවර නම් පුරුෂයෙක් සමර්ථ වේ ද?

යම් මිනිසෙක් සංඝයාට විහාරයක් දෙයිද ඔහු ආයුෂය ද වර්ණය ද සැපය ද බලය ද ප්‍රඥාත උතුම් ප්‍රතිභානය ද දෙන්නේ යයි කියනු ලැබේ.

ශීතාදී ජීවිත උවදුරු දුරලන නිවාස දෙන තැනැත්තේ ඔහුගේ ආයු පාලනය කරයි. එහෙයින් එය සත්පුරුෂයෝ ආයු දීමකැයි කියති.

අතිඋෂ්ණ අතිශීත නුවූ නිවසක වසන්නාගේ බලවර්ණ ප්‍රතිභා ඇති වෙයි. එබැවින් විහාර පුදන්නා වූ හෙතෙම බලවර්ණ ප්‍රතිභානයම දෙයි.

විහාර පුදන්නා ශීත උෂ්ණ සර්ප අව්වැසි ආදියෙන් හටගන්නා අනේකවිධ දුක් නිවාරණය කරන සැපයම පුද කරන්නෝ වෙයි. ශීත උෂ්ණ අව් වැසි සුලං මැසිමදුරු සර්ප වනසතුන්ගෙන් සිදුවන සියලු උවදුරු නිවාස දෙන්නා වළක්වයි. එහෙයින් ඔහු පරලොව සැප විඳී.

යමෙක් පහන් සිතින් සතුටුව ශීලාදි ගුණ ඇත්තවුන්ට භවභෝග සම්පතට හේතුවන මනරම් විහාර පුදයිද හෙතෙම සියල්ල පුදන්නෙකැයි කියනු ලැබේ.

ලෝභ සහිත මසුරුමල අතහැර ගුණවතුන්ට නිවාස පුදයි නම් ඔහු අනුන් විසින් ඔසවා දමුවාක් මෙන් ගෙනා දෙයක් කඩන්නාක් මෙන් ශෝක රහිතව ස්වර්ගයෙහි උපදී.

උතුම් දකුම්කළු මහාවිහාර මිනිසා කරවන්නෝය.

එහි භික්ෂූන් වාසය කරවන්නේය. ආහාරපාන වාස්තු උත්වහන්සේලාට පහන් සිතින් නිබඳ පුදන්නේය.

එහෙයින් මහරජ, සසර මනහර භෝග සම්පත් බෙහෙවින් අනුභව කොට විහාරදාන ඵලයෙන් පසුව අශෝකී ශාන්තපදය අවබෝධ කරව.

මෙසේ මුනිරජාණෝ නරරාජ බිම්බිසාරට විහාර දානානුමෝදනාව කොට අසුනින් නැගිට බික්සඟන පිරිවරා තමන්වහන්සේගේ පරම දර්ශනීය ශරීරප්‍රභායෙන් රන්දියරින් ඉසින ලද්දාක් මෙන් නගරවන විමානාදිය රන්පැහැ ගන්වමින් අනුපම බුද්ධලීලාවෙන් අනන්ත බුදුසිරින් වේළුවන මහාවිහාරයට පිවිසි සේක.

තථාගතයන් වහන්සේ එහි මනොහිරාම වූ වේළුවන විහාරයෙහි විනෙය ජනයන් බලමින් නානා විහාරයෙන් විසූ සේක.

ඉක්බිති මෙසේ භාග්‍යවතුන් වහන්සේ එහි වසද්දී සුද්ධෝදන මහරජ තම පුත්‍රයා සවසක් දුෂ්කර ක්‍රියා කොට පරමාභි සම්බෝධියට පැමිණ පවත්වන ලද උතුම් දහම් සක් ඇතිව රජගහ නුවරට පැමිණ වේළුවන මහාවිහාරයෙහි වාසය කරතියි අසා එක්තරා ඇමතියකු ඇමතීය. දරුව එන්න, මිනිසුන් දහසක් පිරිවරා රජගහ නුවරට ගොස් මාගේ වචනයෙන් ඔබවහන්සේගේ පිය සුදොවුන් මහරජ දකිනු කැමැත්තේය කිය මපුත් කැඳවාගෙන එවයි කීය. හෙතෙම මැනව දේවයනියි දහසක් පුරුෂයන් පිරිවරා සැටයොදුන් මඟ ගෙවා බණ දෙසන වේලෙහි විහාරයට පිවිසියේය. ඔහු රජුගේ පණිවිඩය තිබේවායි කෙළවර සිට ශාස්තෘ ධර්ම දේශනය අසා සිටිවනම මිනිසුන් දහස සමගින් රහත්ව පැවිද්ද ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, එව් කියා අත දිගුකළහ. ඒ සියල්ලෝ එකෙණෙහිම ඍද්ධිමය පාසිවුරු ධර්ම සියවස් ගත තෙරවරුන් මෙන් ආකල්ප සම්පන්නව බුදුන් පිරිවරා ගත්හ. රජ ගිය තැනැත්තේ නොඑයි, පණිවිඩයකුත් නොඅස්වයි කියා ඒ ක්‍රමයෙන් නවවරෙක ඇමතියන් යැවීය. ඒ නවදහසක් පුරුෂයන්ගෙන් කිසිවෙක් රජුට නොදන්වූහ. පණිවිඩ නොයැවූහ. සියල්ලෝ රහත්ව පැවිදිවූහ. රජ ගියානු මාගේ වචනය නොකරන්නා යයි සිතීය. සියලු රාජ බලය බලන්නේ උදායි දුටුවේය. හෙතෙම වනාහි රජුගේ සර්වාර්ථසාධක ආභ්‍යන්තරික අතිශය විශ්වාස ඇමතියෙක් වෙයි. බෝසතුන් සමග එකදා උපන්නේය. වැලිකෙළියෙහි පටන් යහළුය. රජ ඔහු ඇමතීය. දරුව උදායි, මට මපුත් දකිනු රිසිව නව දහසක් පුරුෂයන් යැවීමි. එක් පුරුෂයෙක්වත් පැමිණ පණිවිඩයක් තරම් හෝ දන්වන්නෙක් නැත. ජීවිතාන්තරාය නොදනිමි. මා ජීවත්වෙද්දී පුතු දකිනු කැමැත්තෙමි. මට පුතු පෙන්විය හැක්කෙහි ද කියායි. දේවයිනි, පැවිදිවන්ට ලැබෙයි නම් හැක්කෙමි'යි කීය. දරුව, ඔබ පැවිදිව හෝ නොපැවිදිව මපුත් දක්වවයි කීය. ඔහු 'මැනවි දේවයිනි' කියා රජුගේ පණිවුඩය ගෙන රජගහ නුවරට ගොස් ශාස්තෘන් වහන්සේගේ බණ අසා දහසක් පුරුෂයන් සමග රහත්ව ඒහි භික්ෂු භාවයෙහි පිහිටා මැදින්මස පසළොස්වක් දින සිතීය. හේමන්තය ගෙවිණ. වසන්ත සමය පැමිණියේය. වනලැහැබ සුපුෂ්පිතය. මඟට බැසිය හැකිය. දසබලයන් වහන්සේට ඥාති සංග්‍රහ කිරීමට සුදුසු කාලයයි සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ-

ස්වාමීනි, ගෙඩි කැමති ගස් අතුවල කොළ හැලී ගිනිදැල් සෙයින් බබළ බබළ මලින් පිරී ඇත. මහාවීරයන් වහන්ස, භගීරථයන්ට

සංග්‍රහ කිරීමට සුදුසු කාලයයි.
අති ශීතලක් නැති. අති උෂ්ණයක් නැත. සාදුක් දුබ්බික් දුකක් ද නැත. තෙත්වන් පොළොව නිල්වන්ය. මහාමුනින්ද්‍රයන් වහන්ස, මේ සුදුසු කාලයයි.

කියා සැටක් පමණ ගාථාවෙන් භාග්‍යවතුන් වහන්සේට **කුලනගරයට** වැඩමවීම පිණිස ගමන් වර්ණනාව වර්ණනා කළේය. එවිට ශාස්තෘන් වහන්සේ උදායි තෙරුන්ට 'කිම උදායි, ගමන් වර්ණනා කරන්නෙහිද'යි විමසූහ. 'ස්වාමීනි, ඔබවහන්සේගේ පිය **සුදොවුන් මහරජ** දකිනු කැමැත්තේය. නෑයන්ට සංග්‍රහ කරනු මැනව.' 'හොඳයි උදායි, ඥාතිසංග්‍රහ කරමි. එසේ නම් භික්ෂු සංඝයාට දන්වන්න. **ගම්කවන්** සපුරන්නාහ.' 'එසේය ස්වාමීනි'යි තෙර භික්ෂූන්ට දන්වීය.

ශාස්තෘන් වහන්සේ අඟුමගධ වැසි කුලපුතුන් දසදහසක් ද කිඹුල්වත් පුරවාසී දසදහසක් දැයි සියලු ක්ෂීණාස්‍රව භික්ෂූන් විසිදහසක් පිරිවරා රජගහ නුවරින් පිටත්ව දවස දවස යොදුන යොදුන වඩිමින් දෙමසකින් කපිලපුරට සම්ප්‍රාප්ත වූහ. ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ පැමිණි කල්හිම අපගේ ඥාති ශ්‍රේෂ්ඨයා දක්නෙමුයි භාග්‍යවතුන් වහන්සේට වසන තැනක් පරීක්ෂා කරන්නාහු **න්‍යග්‍රොධශාක්‍යාරාමය** රමණීය යයි සලකා සියලු පිළිදගුම් විධි කරවා සුවඳමල් අතැතිව පෙරගමන් කොට සර්වාලංකාරයෙන් සැරසුණු ගතින් ගඳ මල් සුණු ආදියෙන් පුදන්නාහු බුදුන් පෙරටු කොට නිග්‍රොධාරාමයට ගියහ. එහි බුදුහු විසිදහසක් රහතුන් පිරිවරා පැනවූ බුද්ධාසනයෙහි වැඩහුන්හ. ශාක්‍යයෝ වනාහි මානජාතිකව මානයෙන් තදව සිටුහත් කුමරා අපට බොහෝ බාලය. අපගේ මලණුවෝය. සහෝදරයාය. බෑනාය. මුණුබුරාය. පුත්‍රයාය කියා සිතා බාල බාල රජ කුමරුන්ට තෙපි වඳිව්. අපි තොපගේ පිටුපසින් වාඩිවෙමුයි කීහ. ඔවුන් මෙසේ හුන්කල්හි බුදුහු ඔවුන්ගේ අදහස් දැන මේ නෑයෝ ඔවුන්ගේ හිස් මහලු බව නිසා නොවඳිති. බුදුරදුන් කෙබඳුදැයි නොදනිති. බුදුන් නම් මෙබඳුය. බුද්ධබලය කෙබඳුදැයි නොදනිති. බුදුන් නම් මෙබඳුය. බුදුබලය මෙබඳුය කියා නොදනිති. දැන් මම අහසෙහි සර්වරත්නමය සක්වළ පුරා පැතුරුණු සක්මනක් මවා සිය ඍද්ධිබලයත් බුද්ධබලයත් දක්වමින් ප්‍රාතිහාර්ය කරමි. එහි සක්මන් කරමින් මහජනයාගේ අදහස් බලා දහමුත් දෙසමි'යි සිතූහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේගේ පරිවිතර්කය දැක්වීම පිණිස සංගීතිකාරකයන් විසින් කියන ලදි.

රජුන් සහිත මනුෂ්‍යයෝ මේ නරොත්තම බුදුරජාණන් වහන්සේ කෙබඳුදැයි නොදනිති. ඍද්ධි බලය ප්‍රඥාබලය කෙබඳුද? ලෝකහිතයන් වහන්සේගේ බුද්ධබලය කෙබඳුද නොදනිති.
රජුන් සහිත මේ මිනිස්සු නරොත්තම බුදුරජාණන් වහන්සේ මෙබඳුය. ඍද්ධිබලය, ප්‍රඥාබලය මෙබඳුය. ලෝකහිතයන් වහන්සේගේ බුද්ධබලය මෙබඳුයයි නොදනිති.
දැන් මම අහස්හි රත්නයෙන් සැරසූ සක්මනක් මවමි. අනුත්තර බුද්ධබලය දක්වමි.

එහි නහෙතෙ **ජානනති** යනු; නහි එතෙ ජානනති යනුයි. නකාරය ප්‍රතිෂෙධාර්ථයෙහිය. හිකාරය කාරණාර්ථයෙහි නිපාතයි. යම් හෙයකින් වනාහි මාගේ ඤාති ආදීහු දෙව්මිනිස්සු මා විසින් ඍද්ධි බලද බුද්ධ බලද ප්‍රකට නොකළ කල්හි බුදුහු මෙබඳුය. බුද්ධ බලය මෙබඳුය කියා නොදනිති. එබැවින් මම මාගේ ඍද්ධිබලයත් බුද්ධබලයත් දක්වන්නෙමි යන අර්ථයි. සදෙවමානුසා යනු; මෙහි දේවා යනු උත්පත්ති දෙවියන් අභිප්‍රේතයි. දෙවියන් සමගින් යනු සදේවාය. ඔවුනු කවරහුද? මිනිස්සුය. දෙවියන් සහිත මිනිස්සු සදේවමානුසා යි. නැතහොත් දේවො යනු සම්මුති දේවය. සුදොවුන් රජ අභිප්‍රේතය. දෙවියන් සමඟ සුදොවුන් රජු සමග යනු සදේවයි. මානුසා යනු; ඤාතිමනුෂ්‍යයෝ ය. සදේවා සුද්ධෝදන රජු සමග මනුෂ්‍යයෝ සදේව මනුස්සායි. රජු සහිත මේ මාගේ ඤාතිමිනිස්සු මාගේ බලය නොදනිත් යන අර්ථය. සෙසු දෙවියෝ ද සංග්‍රහ වෙයි. සියලු දෙවියෝ දෙවන අර්ථයෙන් දේවයි කියනු ලැබේ. දෙවන යනු ධාත්වර්ය යි. ක්‍රීඩාදියයි. නැතහොත් දෙවාච-මානුසාච දේවමානුසායි. දේවමානුසා සහ දේවමානුසෙහි සදේවමානුසා යි. ඔවුනු කවරහුද? ලෝකයා යයි වචනශේෂය දැකිය යුතුය. බුද්ධො යනු චතුස්සත්‍ය ධර්මයන් අවබෝධ කළහ. සාක්ෂාත් කළහය බුද්ධ නමි. කියන ලදි -

දතයුත්ත දනගන්නා ලදි. වැඩිය යුත්ත වඩන ලදි. පහකළ යුත්ත ප්‍රහීණ කරන ලදි. බ්‍රාහ්මණය එබැවින් බුද්ධ නම් වෙමි.

මෙහි වනාහි කර්තෘකාරකයෙහි බුද්ධ ශබ්දය දැක්විය යුතුය. අධිගත විශේෂ ඇති නිසා දෙව්මිනිසුන් විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධ යයි මෙසේ අවබෝධ කළ බැවින් දත් බැවින් බුද්ධ නම් වෙති. මෙහි කර්මකාරකයෙහි බුද්ධශබ්ද සිද්ධිය දැක්විය

යුතුය. අවබෝධය උත්වහන්සේට ඇත්නුයි බුද්ධ නමි. බුද්ධන්ත යන අර්ථයි. ඒ සියල්ල ශබ්දශාස්ත්‍රානුසාරයෙන් දතයුතුය. කීදිසකො යනු; කෙබන්දෙක් කුමකට සමානයෙක් කුමකට සාදෘශයෙක් කුමන වර්ණයෙක් කුමන සටහන් ඇත්තෙක් උසද මිටි ද යන අර්ථයි. නරුත්තමො යනු නරයන්ගේ හෝ නරයන් අතර උත්තම ශ්‍රේෂ්ඨ වූයේ නරුත්තමයි. ඉදධිබලං යනු; මෙහි ඉජ්ඣනය ඍද්ධි නිෂ්පත්ති අර්ථයෙන් ලැබීම් අර්ථයෙන් ඉද්ධි නමි. නැතහොත් ඍද්ධි කරත්. මාගේ සත්ත්වයන්ගේ සමෘද්ධව වෘද්ධව උසස් ගතියට පත්වෙතියි ඉද්ධි නමි. එය දසවැදෑරුම් වෙයි. කියන ලදි - ඍද්ධි දසයකි. දසය කුමක් ද? අධිෂ්ඨාන ඍද්ධි, විකුර්වණ ඍද්ධි, මනොමය ඉද්ධි, ඤාණවිප්ඵාර, සමාධි විප්ඵාර, ඍද්ධි, ආර්ය ඍද්ධි, කර්මවිපාකජ ඍද්ධි, පුණ්‍යවන්තයන්ගේ ඍද්ධි, විජ්ජාමය ඍද්ධි, කියායි. ඒ ඒ තන්හි යහපත් ප්‍රයෝග හේතුවෙන් සද්ධර්ම අර්ථයෙන් ඍද්ධි නමි. ඔවුන්ගේ නානාත්වය මෙයයි. ප්‍රකෘතියෙන් එකෙක් බහුත්වය මෙනෙහි කරයි. සියයක් හෝ දහසක් හෝ මෙනෙහිකොට නුවණින් බොහෝ වෙමි'යි අධිෂ්ඨාන කරයි. මෙසේ බෙදා දක්වන ලද ඍද්ධිය අධිෂ්ඨාන වශයෙන් නිපන් බැවින් අධිෂ්ඨාන ඍද්ධි නමි. එහි මේ අර්ථයයි. අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී ඉදින් සියයක් කැමති නම් සියයක් වෙමි. සියයක් වෙමියි කාමාවචර පරිකර්ම සිත්වලින් පරිකර්ම කොට නැවත අභිඥාපාදක ධ්‍යානයට සමවැද ඉන් නැගී නැවත ආවර්ජනා කොට අධිෂ්ඨාන කරයි. අධිෂ්ඨාන සිතත් සමගම සියයක් වෙයි. සහස්‍රාදියෙහි ද ක්‍රමයයි. එහි පාදකධ්‍යාන සිත නිමිත්තකාරම්මණයි. පරිකර්ම සිත් සතාරම්මණ හෝ සහස්‍රාදියෙහි අන්‍යතර අරමුණු හෝ වෙයි. ඒවා වර්ණ වශයෙනි. ප්‍රඥප්ති වශයෙන් නොවේ. අධිෂ්ඨාන සිත ද සතාරම්මණමය. ඒ වනාහි අර්පණා සිත මෙන් රූපාවචර චතුර්ථධ්‍යානික ගොත්‍රභූ සිතට අනතුරුවම උපදී. එය වනාහි ප්‍රකෘති වර්ණය හැර කුමාර වර්ණය හෝ පෙන්වයි. නාගවර්ණය හෝ දක්වයි. සුපර්ණ වර්ණය හෝ- පෙ- විවිධ සේනාව්‍යූහ දකියි. මෙසේ ආවා වූ ප්‍රකෘති වර්ණය හැර දමන විකාර වශයෙන් පවත්නා බැවින් විකුර්වණ සමෘද්ධි නමි. මෙහි භික්ෂුව මේ ශරීරයෙන් වෙනත් රූපී මනෝමය සියලු අඟපසඟ ඇති විශිෂ්ට ඉන්ද්‍රියන් ඇති වෙනත් කයක් මවයි. මේ ආකාරයෙන් ආ ඍද්ධිය ශරීරාභ්‍යන්තරයෙහි ද අනුන්ගේ මනෝමය ශරීර නිෂ්පත්තිය වශයෙන් පවත්නා බැවින් මනෝමය ඍද්ධි නමි. ඤාණෝත්පත්තියෙන් පෙර හෝ පසු හෝ එකෙණෙහි හෝ වෙයි. ඒ ආත්මභාවයෙන් ලැබිය යුතු අර්හත්

ඤාණානුභාවයෙන් නිපන් විශේෂය ඤාණවිප්ඵාර සෘද්ධි නමි. ආයුෂ්මත් **බක්කුල** තෙරුන්ගේ ද **සංකිච්ච** තෙරුන්ගේ ද ඤාණ විප්ඵාරා සෘද්ධියයි. උන්වහන්සේලාගේ වස්තු මෙහි දැක්විය යුතුය. සමාධියෙන් පෙර හෝ පසු හෝ එකෙණෙහි සමථානුභාවයෙන් නිපන් විශේෂය සමාධි විප්ඵාරා සෘද්ධියයි. ආයුෂ්මත් **ශාරිපුත්‍රයන්** වහන්සේගේ **සඞ්ඝ්‍රව** තෙරුන්ගේ බාණුකොණ්ඩඤ්ඤ තෙරුන්ගේ **සාමාවතී** උපාසිකාවගේ සමාධිවිප්ඵාරා සෘද්ධියයි. උන්වහන්සේලාගේ කථා මෙහි දක්විය යුතුයි. ග්‍රන්ථ විස්තාර දෝෂ මඟහැරීමට මා විසින් විස්තර නොදක්වන ලදි.

ආර්ය සෘද්ධිය කුමක්ද? මෙහි භික්ෂුව පිළිකුලෙහි නොපිළිකුල් සංඥා ඇතිව වාසය කිරීමට ඉඳින් කැමති නම් නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරයි. නොපිළිකුලෙහි පිළිකුල් සංඥා ඇතිව ඉඳින් වාසය කිරීමට කැමති නම් නොපිළිකුලෙහි පිළිකුල් සංඥා ඇතිව වාසය කරයි. සිහි ඇතිව, ප්‍රඥා ඇතිව එහි උපේක්ෂකව වාසය කරයි. මෙය චිත්ත වසිතාප්‍රාප්ත ආර්යයන්ටම ලැබෙන හෙයින් ආර්ය සෘද්ධි නමි. කර්මවිපාකජ සෘද්ධිය කුමක්ද? සියලු පක්ෂීන්ගේ සියලු දෙවියන්ගේ ආදිකල්පික මිනිසුන්ගේ සමහර විනිපාතිකයන්ගේ අහසේ ගමන් ආදිය කම්මවිපාකජ සෘද්ධි නමි. පුඤ්ඤවතො ඉද්ධි කුමක්ද? **සක්චිතිරජ** සිව්රඟසෙන් සමග අහසින් යයි. **ජටිලක** ගෘහපති හට අසූරියන් රන් පර්වතයක් ලැබිණ. මේ පුඤ්ඤවතො ඉද්ධියයි. **සෝෂිත** ගෘහපති සත්තැනෙක මරණ උපක්‍රමයන් කරද්දී බේරීම පුඤ්ඤවතො ඉද්ධියයි. මෙණ්ඩක සිටාණන්ට අටකිරියක් පමණ කුඹුරෙහි සත්රුවන්මුවා බැටළුවන් පහළවීම පිනැතියන්ගේ සෘද්ධියයි. විජ්ජාමය සෘද්ධිය කුමක් ද? විද්‍යාධරයෝ මන්ත්‍ර ජපකොට අහසින් යති. අහසෙහි ඇතුන් දක්වති -පෙ- විවිධ සේනාවාහන දක්වති. මේ ආදි ක්‍රමයෙන් දක්වනුයේ විද්‍යාමය සෘද්ධිය. ඒ ඒ ක්‍රියා කොට නිපන් ක්‍රියා විශේෂ සම්පයෝගජච්චය සෘද්ධි නමි. මේ දස වැදෑරුම් සෘද්ධීන්ගේ බලය සෘද්ධිබල නමි. මාගේ මේ සෘද්ධිබල නොදනිති යන අර්ථයි. **පඤ්ඤාබලං** යනු; ලොවී ලොවුතුරු ගුණවිශේෂ දෙන අර්හත් මාර්ග ප්‍රඥාබලය අභිප්‍රේතයි. එයද නොදනිති. සමරහැ ඔඩ්අසාධාරණ ඥානවලට මෙය විශේෂණයකැයි කියති. **බුද්ධබලං** යනු; මෙහි බුද්ධබල නම් බුද්ධානුභාවයයි. දසබලඤාණය හෝ වෙයි. එහි දසබලඤාණ නම් ඨානාඨාන ඤාණය අතීත අනාගත වර්තමාන කර්ම විපාක දන්නා නුවණ. සර්වත්‍රගාමිණී පටිපදා ඤාණය අනේකධාතු නානාධාතු ලෝක දන්නා නුවණ නානාධිමුත්තික නුවණ, ආසයානු

සයඤ්ඤාණය ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංකිලෙ ස මොදාන උට්ඨානාදියෙහි යථාභූතඤ්ඤාණය පුබ්බේනිවාසානුස්සති ඤාණ, චුතූපපාත ඤාණ, අනාවරණ ඤාණ යන දසයයි. මේ දසවිධ ඤාණයට බුද්ධබල යනු නාමයි. **එදිසං** යනු **ඊදිසං** යනුයි. අයමෙව කියාද පාඨයි. **භන්ද** යනු; ව්‍යවසර්ගාර්ථ නිපාතයකි. **අහං** යනු; තමන්වහන්සේ නිදර්ශිතයි. කුමක් කියන ලද ද? යම් හෙයකින් මේ මාගේ නෑයෝ බුද්ධබලය හෝ බුද්ධ ගුණය නොදනිත්ද හුදෙක් තමන්ගේ හිස්මහලු බව නිසා මාන වශයෙන් සකලලෝක ජ්‍යෙෂ්ඨ වූ මා නොවදිත්ද එහෙයින් මම ඔවුන්ගේ මාන කොඩි ඇති බව බිඳ වැන්දවීම පිණිස බුද්ධබලය දක්වන්නෙමියි කියන ලදි. **දස්සයිස්සාමිය;** දක්වමි. **දස්සෙස්සාමි** කියා හෝ පාඨයි. එම අර්ථසමය. **බුද්ධබලං** යනු; බුද්ධානුභාවයයි. බුද්ධඤාණ විශේෂ හෝ වෙයි. **අනුත්තරං** යනු; නිරුත්තරයි. **චංකමං** යනු; සක්මන් කළයුතු තැනයි. **මාපයිස්සාමි** යනු; මවන්නෙමි. **චංකමනං මාපයාමි** යනුද පාඨයි. එම අර්ථයමැයි. **නභෝ** යනු; ආකාශයෙහි යනුයි. **සබ්බරතනමණ්ඩිතං** යනු; සියලු රතිජනනාර්ථයෙන් රුවනින් මුතුමැණික් වෛඩූර්ය සක් සිලා පබළු රිදී ස්වර්ණ මැසිරිගල් ලොහිතංක යන දසයෙන් යුත් අලංකෘත, ඒ සියලු රත්නයෙන් මණ්ඩිත නමි. සමහරු නභෙරත්තමණ්ඩිතයයි හදාරති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතත්ම දසදහසක් සක්වළවැසි බූමාටු ආදි දෙවියෝ ප්‍රමුදිතව සාධුකාර දුන්හ. ඒ බව ප්‍රකාශ කරන සංගීතිකාරකයන් විසින්-

> බූමාටු මහාරාජික තාවතිංස යාම දෙවියෝ ද තුසිත නිම්මිත පරනිම්මිත දෙවියෝ ද යම් ඒ බ්‍රහ්මකායික දෙවියෝ වෙත් ද සියල්ලෝ සතුටු වූවාහු මහත් සෝෂා කළහ.

ආදි ගාථා තබන ලදැයි දතයුතු. එහි **භුම්මා** යනු; භූම්‍යස්ථයෝය. ප්‍රාසාද පර්වත වන වෘක්ෂාදියෙහි වසන්නෝය. **මහාරාජිකා** යනු; මහාරාජ පාක්ෂිකයෝය. බූමාටු දෙවියන්ගේ ශබ්දය අසා ආකාසස්ථ දෙවියෝ අභ්‍රවලාහක දෙවියෝ එයින් උණ්හවලාහක දෙවියෝ එයින් සීතවලාහක දෙවියෝ එයින් වස්සවලාහක දෙවියෝ එයින් සතරවරම් රජවරු එයින් තව්තිසා වැසි දෙවිරොජ් එයින් යාම දෙවියෝ එයින් තුසිත දෙවියෝ එයින් නිම්මාණරති දෙවියෝ එයින් පරනිම්මිත වසවත්ති දෙවියෝ එයින් බ්‍රහ්මකායිකයෝ එයින් බ්‍රහ්ම පුරෝහිතයෝ එයින් මහාබ්‍රහ්මයා එයින් පරිත්තාභා දෙවියෝ එයින් අප්පමාණාභා දෙවියෝ එයින් ආභස්සර

දෙවියෝ එයින් පරිත්තසුභ දෙවියෝ එයින් සුභකිණ්ණක දෙවියෝ එයින් වෙහප්ඵල දෙවියෝ එයින් අවිහ දෙවියෝ එයින් අතප්පා දෙවියෝ එයින් සුදස්ස දෙවියෝ එයින් සුදස්සී දෙවියෝ එයින් අකනිට්ඨක දෙවියෝ ශබ්ද අසා මහා ශබ්ද කළහ. අසංඥී සත්වයන්ද අරූපාවචර සත්වයන්ද හැර සොතායතනය පැවති තන්හි සියලු දෙව්මිනිස් නාගාදීහු ප්‍රීති වසඟයට පත් හදින් මහත් ශබ්ද කළහ යන අර්ථයි. **ආනන්දිකා** යනු; ප්‍රමුදිත සිත් ඇත්තාහුය. හටගත් ප්‍රීති සොම්නස් ඇත්තාහු යන අර්ථයි. **විපුලං** යනු; මහත්වූ. ඉක්බිති ශාස්තෘන් වහන්සේගේ සිතීමත් සමගම ඔදාතකසිණ සමාපත්තියට සමවැද දසදහසක් සක්වළ ආලෝක වේවායි අධිෂ්ඨාන කළහ. ඒ අදිටන් සිතත් සමගම පොළව පටන් අකනිටා භවනය තෙක් ආලෝක විය. එයින් කියන ලදි-

> ආශ්චර්යමත් ප්‍රාතිහාර්යය දැක එදා දෙව්ලෝ සහිත පෘථුවිය ආලෝකමත් විය. බොහෝවූ ලෝකාන්තරික ද අසංවෘත විය. එදා තියුණු අන්ධකාරය නැතිවිය.

එහි **ඔභාසිතා** යනු; ආලෝකවත් විය. **පථවි** යනු; මෙහි මේ පෘථුවිය **ලක්ඛණපථවි ස සම්භාර පථවි නිම්මිත්ත පථවි සම්මුති පථවි** කියා සිව්වැදෑරුම් වෙයි. එයින් ඇවැත්නි, ආධ්‍යාත්මික පථවිධාතුව කුමක් ද? ආධ්‍යාත්මික ප්‍රත්‍යාත්මික කර්කශ රළු යමක් ආදියෙහි කියන ලද මෙය ලක්ෂණ පථවියයි. යම් භික්ෂුවක් පෘථුවිය සාරයි ද සාරවයි ද ආදියෙහි කියන ලද්දා වූ ද යම් කේශාදි විසි කොටස් අයශ් ලෝහාදිය බාහිර වර්ණාදි සම්භාර සමගින් මෙය සසම්භාර පථවියයි. පථවිකසිණමෙකොා සඤ්ජානාති යන ආදියෙහි නිම්මිත්තපථවියයි. ආරම්මණපථවි කියා ද කියයි. පථවිකසිණ ධ්‍යානලාභී දෙව්ලොව උපන් තැනැත්තා ද පැමිණීම් වශයෙන් පථවිදේවයයි නම් ලබයි. ආපෝ ච දේවා පථවී ච ආදියෙහි මෙය කියන ලදි. මෙය සම්මුති පථවි පඤ්ඤත්තිපථවි නමැයි දත යුතුය. මෙහි වනාහි ස සම්භාර පථවිට අභිප්‍රේතයි. **සදේවකා** යනු; දිව්‍යලෝක සහිත යනුයි. සදේවතා කියාද පාඨයි. සුන්දරතර දිව්‍යලෝක සහිත මනුෂ්‍යලෝකය ආලෝකමත්ව ඇත යන අර්ථයි. **පුථ** යනු; බොහෝයි. **ලෝකස්සරිකා** යනු; මෙය අසුරකාය නිරයවලට නමකි. ඒ වනාහි තුන්සක්වළක් අතර එක් ලෝකාන්තරිකයක් වෙයි.

තුන් ගැල් සකක් එකිනෙක හැපෙන සේ තැබූ විට මැද අවකාශය මෙනි. එක් එක් ලොකාන්තරිකය ප්‍රමාණයෙන් යොදුන් අටදහසක් වෙයි.

සංවුතා යනු; යට නොපිහිටි. **තමොචර යනු;** අන්ධකාරයයි. **තිබ්බො යනු; ඝන බහල යනුයි. විහතො යනු;** නැති විය. **තදා යනු;** එකල්හි භාග්‍යවතුන් වහන්සේ සත්වයන් වෙත කරුණාවෙන් පෙළහර කිරීම පිණිස ආලෝකය පැතිරවූහ. එකල්හි ලෝකාන්තරිකවල පැවති ඝණ අඳුර පහවිය. විනාශ විය යන අර්ථයි. **අංඛජරකය** යනු; අසුරගැසීමට යෝග්‍ය, විස්මය වශයෙන් ඇඟිලි පැහැරීමට යෝග්‍ය යන අර්ථයි. **පාටිහීරං** යනු; **ප්‍රතිපක්ෂ** කරණයෙන් පාටිහීරයි. සත්වයන්ගේ දිට්ඨිමානගත සිත් ඇදගනිනුයි හෝ පාටිහීරයි. නොපහන් සත්වයන්ගේ ප්‍රසාදය නැවත ගෙනස්නුයි හෝ පාටිහීරයි. **පාටිහෙරං** යනු ද පාඨයි. එම අර්ථයමැයි. මෙහි ආලෝක පැතිරවීම් විශේෂයට මේ නාමයකි. **දිසවාන අවෙජරකං පාටිහීරං** යනු; මෙහි දෙව් මිනිස් හා ලෝකාන්තරිකවල උපන් සත්වයෝ ද භාග්‍යවතුන් වහන්සේගේ ඒ ප්‍රාතිහාර්යය දැක පරම ප්‍රීති සොම්නසට පැමිණියහ යන මේ වචනය රැගෙන අර්ථය දැක්විය යුතුය. අණ පරිදි පූර්වයෙන් අපරය හෝ අපරයෙන් පූර්වය හෝ නොගැළපේ. දුන් ආලෝකය නුදෙක් මනුෂ්‍ය දිව්‍ය ලෝකවල පමණක් නොව හැමතැන සංඛාර සත්ව අවකාශ සංඛ්‍යාත ලෝකයෙහි ආලෝකයට දැක්වීමට-

සදෙව ගනධබ්බ මනුසසරකඛසෙ
ආහා උළාරා බහුලා අජායථ
ඉමසමිං ලොකෙ පරසමිං චොභයෙ
අඩොපි උදධං කිරියං ච විජථතනති

යන මේ ගාථාව කියන ලදි. එහි දේවා යනු; සම්මුති දේව උප්පත්ති දේව විසුද්ධි දේව යන සියලු දෙවියෝම මෙහි සංගෘහිතය. **දේවා ච ගන්ධබ්බා ච මනුසසා ච රක්ඛසා ච දෙව ගන්ධබ්බ මනුසසරක්ඛසො යි.** ඔහු කවරෙක් ද? ලෝකයයි. ඒ දෙවියන් ගන්ධර්වයන් මිනිසුන් රකුසන් සහිත ලෝකයෙහි. **ආහා** යනු; ආලෝකයයි. **උළාරා** යනු; මෙහි මෙම උළාර ශබ්දය මධුර ශ්‍රේෂ්ඨ ප්‍රමාණ විපුල ආදියෙහි දක්නා ලැබේ. එසේමැයි. මෙය උළාරානි උළාරානි බාදනීයානි භොජනී යානි බාදනති භුඤජනති ආදියෙහි මධුරයෙහි දැක්වේ. උළාරාය බො පන භවං වචඡායනො පසංසාය සමණං ගොතමං පසංසති යන ආදියෙහි ශ්‍රේෂ්ඨයෙහිය. අතික්කමං දේවානං දේවානුභාවං අපපමාණො උළාරෝ ඔභාසො යන ආදියෙහි විපුලාර්ථයෙහිය. එය මෙහි ශ්‍රේෂ්ඨාර්ථයෙහි දැකිය යුතුය. විපුලා යනු; අප්‍රමාණය. **අජායථ** යනු; උපන්නේය. පහළ විය. පැවැත්තේය. **ඉමසමිං**

ලොකෙ පරසම්ං යනු; මේ මිනිස්ලොව පරසම්ං දෙව්ලොව ද යන අර්ථයි. ආධ්‍යාත්ම බාහිර දෙපක්ෂයෙහි යන්නෙහි මෙන් දතයුතුයි. **අධොප** යනු; අවීචි ආදි නිරයන්හි. **උද්ධං** යනු; භවාග්‍රයෙනුත් උඩ අජටාකාශයෙහිත්. **තිරියංච** යනු; සරසින් දසදහසක් සක්වළ. **විත්ථතං** යනු; සරසින් පැතිරුණු මහත් අපමණ පෙදෙසක ආලෝකය පැතිර පැවැත්තේය යන අර්ථයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දසදහසක් සක්වළ ආලෝකය පතුරුවා අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද ඉන් නැගී ආවර්ජනා කොට අධිෂ්ඨාන සිතින් අහසට පැනනැගී ඒ නෑයන්ගේ හිස්හි පාදූලි ඉසින්නාක් මෙන් මහත් දෙව්මිනිස් පිරිස් මැද යමක ප්‍රාතිහාර්යය දැක්වූ සේක. එය පාළියෙන් මෙසේ දතයුතුය. තථාගතයන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්යයෙහි ඤාණය කුමක්ද? මෙහි තථාගතයන් වහන්සේ ශ්‍රාවකයන්ට අසාධාරණ වූ යමක ප්‍රාතිහාර්යය කරති. උඩුකයින් ගිනිකඳ පවත්වති. යටිකයින් දියකඳ පවත්වති. යටිකඳින් ගිනිකඳ පවත්වති. උඩුකඳින් දියකඳ පවත්වති. පෙරකයින්-පෙ- පසුකයින් දකුණින් වටින් වමැසින් දකුණැසින් දකුණුකන් සිදුරෙන් වම් කන් සිදුරෙන් වම් කන් සිදුරෙන් දකුණු කන් සිදුරෙන් දකුණු නාසා පිටුයෙන් වම් නාසා පුටයෙන් දකුණු නාසා පුටයෙන් දකුණු ආසකුටයෙන් වම් ආසකුටයෙන් දකුණතින් වමතින් වමතින් දකුණතින් දකුණු පසින් වම්පසින් වම්පසින් දකුණු පසින් දකුණු පයින් වම් පයින් වම්පයින් දකුණු පයින් ඇඟිල්ලෙන් ඇඟිල්ල ඇඟිලි අතරින් එක් එක් ලෝමයෙන් ලෝමකූපයෙන් ගිනිකඳ පවත්වති. දියකඳ පවත්වති. නීල, පීත, ලෝහිත, ඕදාත, මඤ්ජෙට්ඨ සහසසර යන රැස් විහිදුවති. භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරති. නිර්මිත බුදුහු සිටිති හෝ හිඳිති. සැතපෙන්නේ හෝ වෙති. නිර්මිත බුදුහු සැතපෙති. භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරති. හිඳිති. සිටුනේ හෝ වෙති. මෙය තථාගතයන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්යයෙහි ඤාණයයි.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ **තේජෝකසිණ** සමාපත්ති වශයෙන් උඩුකයින් ගිනිකඳ පවත්වති. **ආපෝකසිණ** සමාපත්ති වශයෙන් යටිකයින් උදකධාරා පවත්වති. නැවත දියදහරා පැවති තැනින් ගිනිකඳ පවතී. ගිනිකඳ පැවති තැනින් දියදහරා පවත්වති. දක්වන්නට යටිකයින් ගිනිකඳ උඩුකයින් උදකදහරා පවත්වති කියන ලදයි දතයුතු. සෙසු පදවලද මේ ක්‍රමයයි. මෙහි ගිනිකඳ දියදහර හා නොමුසුම විය. දියදහර ගිනිකඳ සමඟ ද එසේය. රස්මිවල දෙවන දෙවන රස්මි පළමු පළමු රස්මි සමග යුගල මෙන් එක් සැණයෙහිම පවතී. දෙසිතක් එකවිට පැවැත්මක් නම්

නැත. බුදුවරුන්ගේ වනාහි භවංග පරිවාසයෙහි ලඝුබව නිසා පස් අයුරකින් විණ්ණවසතාව නිසා මේ රස්මී එක්සැණයෙහි මෙන් පවතිති. ඒ රස්මියෙහි ආවර්ජනා පරිකර්ම අධිෂ්ඨාන වෙනස්මය. නීලරශ්මිය පිණිස බුදුහු නීලකසිණයට සමවදිති. පීතරශ්මි ආදිය සඳහා පීතකසිණාදියට සමවදිති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ යමක ප්‍රාතිහාර්යය කරද්දී සියලු දසදහසක් සක්වළම සරසන කලක් මෙන් විය. එහෙයින් කියන ලදි-

සතතූතමෝ අනධිවරෝ විනායකෝ
සත්ථා අත්‍ථූ දෙව මනුසසපූජිතෝ
මහානුභාවෝ සතපුඤඤ ලකඛණෝ
දසෙසසි අචෙඡරකං පාටිහීරංති

එහි **සතතූතතමෝ** යනු; ශීලාදි ගුණවලින් සියලු සත්වයන් විෂයෙහි උතුම් පවර ශ්‍රේෂ්ඨයයි සතතූතතම යි. **සතතං** යනු විඤඤාණයට ද නමකි. එහෙයින් දසබල චතුර් වෛශාරද්‍ය අසාධාරණ ඤාණ සංඛ්‍යාත විඤඤාණයෙන් ශ්‍රේෂ්ඨ උත්තමයා යි. සතතූතතම වෙයි. සතෙතා උතතමෝ සතතූතතමෝ යනු සමානාධිකරණ වශයෙනි. ඉදින් මෙසේ උතතමසතෙතා යි කිවයුත්ත උතතම ශබ්දය පූර්වයෙන් යොදා කීමෙන් මෙය දොසෙක් නොවේ. අනියමින් බාහුල්‍ය කථනයෙන් නරුතතම පුරිසුතතම නරවර ආදි ශබ්ද මෙන් දතයුතුය. නැතහොත් සතත උතතමං යසස සො සතතූතතමෝ, මෙහිද උතතම ශබ්දයාගේ මුලින් යෙදීම වෙයි. උතතමසතෙතා යි විශේෂණය මුලින් යොදා කීමෙන් චිතතගු පංචගු යන තන්හි මෙනැයි මෙය දොසක් නොවේ. උභය විශේෂණ විසින් හෝ ආහිතගගි ආදි පාඨ මෙන් දතයුතුයි. **විනායකෝ** යනු; බොහෝ වූ විනයන උපායවලින් සත්වයන් හික්මවති. දමනය කරතී විනායක නමි. **සත්‍ථා** යනු; මෙලොව පරලොව අර්ථයන්ගෙන් සුදුසු පරිදි සත්වයන්ට අනුශාසනා කරන්නේ සත්‍ථායි. **අත්‍ථූ** යනු; විය. **දේවමනුස්සපූජිතෝ** යනු; පස්කම් ගුණයෙන් විනෝද වෙති, ක්‍රීඩා කෙරෙතියි දෙවියෝය. මනසෙහි උස්සන්නතාවෙන් මනුෂ්‍යයි. දේවා ච මනුස්සාව දෙවි මිනිසුන් විසින් පුදන ලද්දේ දෙවමනුසසපූජිතෝ යි පුෂ්පාදි පූජාවෙන් ද ප්‍රත්‍ය පූජාවෙන් ද පුදන ලද්දේ බුහුමන් කරන ල්දදේ යන අර්ථයයි. කුමක් නිසා දෙව්මිනිසුන් පමණක් ගන්නා ලදද? කිම? භාග්‍යවතුන් වහන්සේ තිරිසන්ගතයන් විසින් ද ආරවාල අපලාල ධනපාල පාරිලෙය්‍යක ඇතුන් විසින් ද සාතාගිරි ආලවක සූචිලොම ඛරලොම

යක්ෂාදීන් විසින් ද පුදන ලද්දාහු වෙත්මය. උත්කෘෂ්ට සීමා වශයෙන් ද භව්‍ය පුද්ගල වශයෙන් ද මෙය කියන ලදයි දතයුතුය. **මහානුභාවෝ** යනු; මහත් බුද්ධානුභාවයෙන් යුක්ත වූවානුයි. **සතපුඤ්ඤලකඛණෝ** යනු; අනන්ත සක්වළවල සියලු සත්වයෝ එක් එක් පින්කම සියවරක් කරන්නාහ. මෙතෙක් ජනයා විසින් කරන ලද කර්මය බෝසත්හු තමාම තනිව සියගුණයෙන් කොට උපන්හ. එහෙයින් සතපුඤ්ඤලකඛණයයි කියනු ලැබේ. සමහරු වනාහි සියය සියය පින්කම්වලින් නිපන් එක් එක් ලක්ෂණ ඇත්තාහයි කියති. මෙසේ ඇති කළ යම් කිසිවෙක් බුදුවන්නාහයි අර්ථ කථාවල යොදන ලදි. **දසෙසසි** යනු; සියලු දෙව්මිනිස් ආදීන්ට අතිශයින් විස්මය ජනක යමක ප්‍රාතිහාර්යය දැක්වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අහස්හි යමක ප්‍රාතිහාර්යය කොට මහජනයාගේ සිත්හසර බලන්නාහු ඔවුන්ගේ අදහසට අනුකූල ධර්ම කථාවක් සක්මන් කරනු කැමතිව අහස දසදහසක් සක්වළ පැතිරි සර්වරත්නමය සක්මනක් මැවූහ. එයින් කියන ලදි-

> යො යාචිතො දෙවවරෙන චකඛුමා
> අට්ඨං සමෙකඛිත්ව නදා නරුත්තමෝ
> චංකමං තත්ථ මාපයි ලොකනායකෝ
> සුනිට්ඨිතං සබබරතනනිම්මිත නභි

එහි සෝ යනු; ඒ ශාස්තෘන් වහන්සේ. **යාචකෝ** යනු; පළමුවෙන්ම අටවැනි සතියෙහි ධර්මදේශනය සඳහා අයදනා ලද්දේ යන අර්ථයි. දෙවවරෙන යනු; සහම්පති බඹහු විසින්, **චකඛුමා** යනු; මෙහි චකඛූතීති චකඛු සම විසම විභාවනය කරයි යන අර්ථයි. ඒ චක්ඛුස දවිවිධය නැණැස මසැස කියායි. එහි නැණැස පස්වැදෑරුම්ය. බද්ධචකඛු ධම්මචකඛු සමන්තචකඛු දිබබචකඛු පඤ්ඤාචකඛු යනුවෙනි. එයින් බුදධචකඛු නම් ආසයානුසය ඤාණයක් ඉන්ද්‍රියපරොපරියතති ඤාණයක්ය. යමක් බුදධචකඛු නා ලොකං ඔලොකෙති කියා ආයේද එයයි. ධම්මචකඛු නම් යටත් පිරිසෙයින් තුන්මහ තුන් ඵලයයි. යං විරජං විතමලං ධම්ම-ධම්මචකඛු යන තැන ආයේ ද එයයි. සමන්තචකඛු නම් සබබඤ්ඤුත ඤාණයයි. යං තථූපමං ධම්මමයං සුමෙධ පාසාදමාරුය්හ සමන්තචක්ඛුයි ආයේ ද එයයි. දිබබචකඛු නම් ආලෝක වර්ධනයෙන් උපන් අභිඥා සිතෙන් සම්ප්‍රයුක්ත ඤාණයයි. යමක් දිබෙබන චකඛුනා විසුදෙධන යනුවෙන් ආයේද එයයි.

පඤ්ඤාචකඛු නම් චකඛුං උදපාදි ඤාණං උදපාදි යන මෙහි පුබ්බනිවාසාදි ඤාණය පඤ්ඤාචකඛු ආයේය. මංස චකඛු නම් චකඛුං ච පටිච්ච රූපෙච ය මෙහි මංසචකඛු කියන ලදි. එහි යම් මේ අක්ඛිකූපයෙහි ඇසිපිහාටුවලින් පිරිවරන ලද මස් පිඬුවයි. යම් තැනෙක්හි ධාතුසතර වර්ණ, ගන්ධ, රස, ඕජා සමඟම ජීවිත භාව චකඛුපපසාද කායපපසාද යයි තෙලෙස් සම්භාරයෙන් වෙති. විස්තර වශයෙන් සම්භව සමුට්ඨාන සතිසය ජීවිත භාව චකඛුපපසාද කායපපසාද යන කර්ම සතරද යන සතලිස් සම්භාරයෝ වෙති. මේ වනාහි ස සම්භාර චක්ඛුසයි. යම් ඒ ශ්වෙතමණ්ඩලයෙන් සීමාවූ කෘෂ්ණ මණ්ඩලය පිරිවැරූ දෘෂ්ටි මණ්ඩලයෙහි පිවිසි රූප දක්මට සමත් ප්‍රසාද මාත්‍රයක් වේද මෙය ප්‍රසාද චක්ඛුස නමි. මේ සියල්ල ඒකවිධය. අනිත්‍ය වශයෙන් සංඛත වශයෙන් එකාකාරය. සාස්‍රව අනාස්‍රව වශයෙන් ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙවදෑරුම්ය. භූමි වශයෙන් උපාදනනතතික වශයෙන් තෙවැදෑරුම්ය. එකනත පරිතත අපපමාණ අනියත ආරම්මණ වශයෙන් සිව්වැදෑරුම්ය. රූප නිබ්බාන, අරූප සබ්බාරම්මණ නානාරම්මණ වශයෙන් පස්වැදෑරුම්ය. බුද්ධචකඛු ආදි වශයෙන් සවැදෑරුම් වෙයි. මෙසේ කියූ පරිදි මේ ඇස් බුදුරදුන්ට ඇත්තේ යයි භාග්‍යවතුන් වහන්සේ චක්ඛුමායි වෙති. **මාපයි** යනු; මැවූහ. **ලෝකනායකෝ** යනු; ලෝකය ස්වර්ග මෝක්ෂාභිමුඛයට ගෙන යන සේක්නුයි නායක නමි. **සුනිට්ඨිතං** යනු; මනාව නිමවන ලදි. අවසන් කළේය යන අර්ථයි. **සබ්බරතනනිම්මිතං** යනු; දසවිධ රත්නමය. දුන් භාග්‍යවතුන් වහන්සේගේ ත්‍රිවිධ ප්‍රාතිහාර්ය සම්පත්තිය දක්වීම පිණිස -

ඉද්ධි ච ආදෙසනානු සාසනී
තිපාඨිහාරෙ භගවා වහී අනු
චංකමං මාපයි ලොකනායකෝ
සුනිට්ඨිතං සබ්බරතන නිම්මිතයනති

කියන ලදි. එහි **ඉද්ධි** යනු; ඉද්ධිවිධයි. ඍද්ධි ප්‍රාතිහාර්යයි. එනම් එකෙක්ව බොහෝ වෙයි. බොහෝ වී එකෙක් වෙයි ආදි වශයෙන් පැවැතීමයි. **ආදෙසනා** යනු; අනුන්ගේ හිත් හතර දැන කීම ආදේසනා ප්‍රාතිහාර්යයි. එය බුදුවරුන්ගේ ද ශ්‍රාවකයන්ගේ ද නිරන්තර ධර්ම දේශනාවයි. **අනුසාසනී** යනු; අනුසාසනී ප්‍රාතිහාර්යයි. ඒ ඒ අයගේ අදහසට අනුකූල අවවාදය යන අර්ථයි. මෙසේ මේ ත්‍රිවිධ ප්‍රාතිහාර්යයි. එහි ඍද්ධි ප්‍රතිහාර්යයෙන් අනුසාසනී ප්‍රාතිහාර්යය **මහමුගලන්** තෙරුන්ට

ආවේර්ණය. ආදේසනා ප්‍රාතිහාර්යයෙන් අනුශාසනී ප්‍රාතිහාර්යයි. දම්සෙනෙවි සැරියුත් තෙරුන්ට ආවේර්ණය. අනුශාසනී ප්‍රාතිහාර්යය නොහි බුදුවරුන්ගේ නිරන්තර ධර්ම දේශනාවයි. **තිපාටිහීරෙ** යනු; මේ තුන් පෙළහරෙහි යන අර්ථයි. **භගවා** යනු; මේ වනාහි ගුණ විශිෂ්ට සත්වෝත්තම ගරුගාරව නාමයකි. පොරාණයින් විසින් මෙය කියන ලදි-

භගවාති වචනං සෙට්ඨං භගවාති වචනමුත්තමං
ගරුගාරවයුත්තෝ සෝ භගවා තෙන පවුච්චතීති

වසී යනු; මේ තෙවැදෑරුම් ප්‍රාතිහාර්යයෙහි වශීප්‍රාපක ඥාණවශී වූවාහු යන අර්ථයි. වසීහ නම් පසෙකි. ආවජ්ජන සමාපජ්ජන අධිට්ඨාන වුට්ඨාන පච්චවෙක්ඛන වශයෙනි. එහි යම් යම් ධ්‍යානයක් කැමති සේ කැමති පරිදි කැමති තාක් ආවර්ජනා කරයි ද ආවර්ජනයෙහි පසුබෑමක් නැත. වහා ආවර්ජනා කිරීමේ සමර්තතාව **ආවර්ජන වසිතායි.** එසේම යම් යම් ධ්‍යානයක් කැමති පරිදි -පෙ- සමවදී. සමවැදී මෙහි මුළාබවක් නොවෙයි. වහා සමවැදීමෙහි සමර්ථතාව **සමාපජ්ජනවසිතාවයි.** දිගුකලක් තබා ගැනීමට සමර්ථතාව අධිට්ඨානවසිතාවයි. වහා නැගී සිටීමට සමර්ථතාව වුට්ඨානවසිතාව නමි. **පච්චවෙක්ඛණවසිතාව** වනාහි පච්චවෙක්ඛණ ඥානයෝමය. ඒවා ආවර්ජනයට අනතුරුවම උපදී යයි ආවජ්ජනවසියෙහිම කියන ලදි. මේ පස්වසියෙහි ඥාණවසිතාව වසි නම් වෙයි. එහෙයින් තිපාටිහීරෙ භගවා වසී අහූ යි කියන ලදි. දැන් ඒ රුවන් සක්මනෙහි නිර්මාණවිධානය දැක්වීම පිණිස-

දසසහස්සී ලොකධාතුයා සිනෙරුපබ්බතූත්තමෙ
ථ මෙහව දසෙසසි පටිපාටියා චංකමෙ රතනාමයෙති.

ආදි ගාථා කියන ලදි. එහි **දසසහස්සී ලොකධාතුයා** යනු; දසදහසක් සක්වළෙහි. **සිනෙරුපබ්බතූත්තමෙ** යනු; පිළිවෙළින් සිටි සවර්ණසටිමහ මෙන් කොට ඒ මත සක්මන මවා දක්වූහ යන අර්ථයි. **රතනාමයෙ** යනු. රුවන්මුහයි දසදහස්සී **අතිකකමම** යනු; භාග්‍යවතුන් වහන්සේ රුවන් සක්මන මවන්නාහු එක් කෙළවරක් නැගෙනහිර සක්වළ මුවවිට ද එක් කෙළවරක් බටහිර සක්වළ මුවවිට ද ඉක්මවා සිටින සේ මැවූහ. එයින් කිහ.

දසසහසසී අතිකකමම චංකමං මාපයී ජිනො
සබබසොවණණමයා පසෙස චංකමෙ රතනාමයෙකි.

එහි **ජිනො** යනු; කෙලෙස් සතුරන් දිනන බැවින් ජින නමි. සබබ **සොවණණමයා පසෙස** යනු; මෙසේ මැවූ සක්මන දෙපස රන්මුවා පරම රමණීය සීමාබිම විය. මැද මිණිමුවා යන අභිප්‍රායයි. තුලාසංඝාට යනු; ඒ තුලා යුගය නන්රුවන් මුවායයි දතයුතුයි. අනුවගගා යනු; අනුරූප යනුයි. **සොවණණඵලකඛචනා** යනු; රන්පුවරුවලින් අතුරන ලද, තුලා යුගලය මත රන්මුවා පදරයෙන් වසන ලදි යන අර්ථයි. **වෙදිකා සබබ සොවණණ** යනු; වෙදිකාව සම්පූර්ණ රන්මුවාය. යම් මේ සක්මන වට කරන ලද සම්පූර්ණයෙන්ම රුවනින් අසම්මිශ්‍රය යන අර්ථයි. **දුභකො පසෙසසු නිමමිතා** යනු; දෙපස නිර්මිත යනුයි. දකාරය පදසන්ධිකාරකය **මණිමුකතා වාලිකාකිණණ** යනු; මිණිමුතුමුවා වැල්ලෙන් ආකීර්ණය නොහොත් මණයොව මුක්තා ව වාලිකා ව මණිමුත්තාවාලිකා. ඒ මිණිමුතු වැලිවලින් ආකීර්ණ, අතුරන ලද. **නිමමිතා** යනු; මේ ක්‍රමයෙන් නිර්මිත කරන ලදි. **රතනාමයා** යනු; සර්වරත්නමය වංක්‍රමණය යන අර්ථයි. **ඔහාසෙති දිසා සබබා** යනු; සියරැස් ඇත්තහු මෙන්, ඉරමෙන්, **උග්ගතො** යනු; උදාවිය යනුයි. යම් සේ උදාවූ සූර්යයා සියලු දසාදිසා බබළුවයිද එසේ මේ රුවන්මුවා සක්මන බබළුවයි යන අර්ථය, දැන් නිමවන ලද ඒ සක්මනෙහි බුදුරදුන්ගේ පැවැත්ම දක්වීම සඳහා **තසමිං චංකමනෙ ධීරො** යන ගාථාව කීය. එහි ධීරො යනු; සුප්‍රතිෂ්ඨිත පාදකලාදි තෙදිස් මහා පුරිස් ලකුණින් යුක්තය යන අර්ථයි. **දිබබං** යනු; දෙව්ලොව වූ හටගත්.

පාරිචිඡත්තකං යනු; තාවතිංස දෙවියන්ගේ පිණින් කොබෝලිල ගසෙහි හාත්පස යොදුන් සියයක් වූ පරිමණ්ඩල ඇති පරම දර්ශනීය පරසතු රුක උපන්නේය. එය පිපුණු කල මුළු දෙව්නුවර එකම සුරහි සුවඳ පැතිරෙයි. ඒ මල් රේණු වැටුණු නව රන්විමන් පිඤ්ජරිතව පෙනේ. මේ පරසතු ගසේ මල්ද පාරිචිඡත්තක යයි කියනු ලැබේ. **රතනචංකමනෙ චංකිරන්ති** යනු; ඒ රුවන් සක්මනෙහි වගුරුවකි. ඒ කී ආකාර මලින් ඒ සක්මනෙහි සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේට පුදති යන අර්ථයි. **සකො දේවා** යනු; කාමාවචරාදි දෙවියෝයි. එහෙයින් කිහ. **පසෙන්ති තං** දේවසංඝයායි. රුවන් සක්මනෙහි සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ සිය භවන වලද දකිති යන අර්ථයි. **දසසහස්සී** යනු; භූම්‍යර්ථයෙහි ප්‍රථමායි. දස සක්වළෙහි දෙවියෝ දකිති යන අර්ථයි. **පමොදිතා** යනු;

ප්‍රමුදිත වූවාහු. **නිපතන්ති** යනු; රැස්වෙති. **තුට්ඨහට්ඨා** යනු; ප්‍රීති වශයෙන් තුටුපහටු වූවාහු. **පමොදිනා** යනු; දන් කිවයුතු තාවතිංසාදි දෙවියන් සමග සම්බන්ධය දතයුතුය. අන් අයුරකින් පුනරුක්ත දෝෂය නොහැරේ. නැතහොත් ප්‍රමුදිතව ඒ භාග්‍යවතුන් වහන්සේ බලති. තුටු පහටුව ඒ ඒ තැන රැස්වෙති කියා හෝ අර්ථයි. දන් යමෙක් දුටුවාහුද ඔවුහු **රැස්වූහ.** ඔවුන් ස්වරූප වශයෙන් දක්වීමට තාවතිංසාව යාමාව ආදි ගාථාව කියන ලදි. එහි **උදගචිත්තා** යනු; ප්‍රීති සොම්නස් වශයෙන් උද්ගත සිතින් සුමනා යනු; උද්ගත සිත් ඇත්තාහුම සුමනා යනුයි. **ලෝකහිතානුකම්පකං** යනු; ලෝකහිතය ද ලෝකානුකම්පාවද, ලෝකහිතයෙන් අනුකම්පාව හෝ ලෝකහිතානුකම්පක ය. **නභෙ ච අවවුගගත මණ්ඩලං** යනු; මෙහි අහස අභිනවයෙන් උදා වූ පිරිපුන් සියලු උවදුරෙන් මිදුණු සරාකල සඳමඬල මෙන් බුදුසිරිත් බබළන නයනානන්දකර ප්‍රභාපත්තිය යන අර්ථයි. **ආභස්සරා** යනු; උත්කෘෂ්ට පරිච්ඡේද වශයන් කියන ලදි. **පරිත්තාභ අප්පමාණභා ආභස්සරා** කුඩා මධ්‍යම ප්‍රතීත භේදයෙන් ද්විතීය ධ්‍යානයෙන් උපන් සියල්ලෝම ගන්නා ලදුයි දතයුතු. **සුභකිණ්ණ** යනු; මෙහි ද උත්කෘෂ්ට පරිච්ඡේදයෙන්ම කියන ලදි. **පරිත්තසුභ අප්පමාණ සුභ** සුභතිණ්හ පරිතකසුභ භේදයෙන් තෘතීය ධ්‍යානයෙන් උපන් සියල්ලෝම ගන්නා ලදුයි දතයුතුය. **වෙහප්ඵලා** යනු; විපුල ඵල ඇත්තෝ යනුයි. චතුර්ථධ්‍යානයෙන් උපන් ඔවුහු අසඤ්ඤ සත්වයන්ගෙන් එක් තලයක වාසිහුය. යට ප්‍රථමධ්‍යානයෙන් උපන් බ්‍රහ්මකායිකාදීහු දක්වන ලද්දාහ. එහෙයින් මෙහි නොදක්වන ලදි. ඇස් කන් ආදිය නැති බැවින් අසඤ්ඤ සත්වයෝද අරූපීහු ද මෙහි නොදක්වන ලදි. **අකනිට්ඨා ච දේවා** යනු; මෙහිද උත්කෘෂ්ට සීමා වශයෙන්ම කියන ලදි. එහෙයින් **අවිහ අතප්ප සුදස්ස සුදස්සී අකනිට්ඨක සංඛ්‍යාත** සුද්ධාවාස පසම ගන්නා ලදුයි දතයුතුය. **සුසුද්ධසුක්කවත්ථවසනා** යනු; මනාව පිරිසිදු සුදෝසුදු හඳන ලද්දාහු පෙරවන ලද්දාහු යමක්හු විසින් ද ඔවුහු සුසුද්ධ සුක්කවසන නම් වෙති. හඳින ලද පිරිසිදු පඬෙර වස්ත්‍ර යන අර්ථයි. සුසුද්ධ සුක්කවසනායිද පායයි. **පඤ්ජලිකා** යනු; කරන ලද ඇඳිලි ඇත්තාහු, පියුම් කැකුළු සම ඇඳිලි හිසෙහි කොට සිටිති.

මුඤ්චන්ති යනු වගුරුවති. **පුප්ඵං පන** යනු; **කුසුමං පන** යනුයි. පුප්ඵානිවා කියාත් පායයි. වචන විපර්යාස යයි දතයුතුයි. අර්ථය එයමය. **පඤ්චවණ්ණිතං** යනු; පංචවර්ණයි. නිල්, කහ, රතු, සුදු, මදටිය වර්ණ වශයෙන් පංචවර්ණයයි. **චන්දන චුණ්ණාමිස්සිතං** යනු; සඳුන් සුණුවලින්

මිශ්‍රිත වූ. **භමෙන්ති චෙලානි** යනු; වස්ත්‍ර කරකවති. අහෝ ජිනෝ **ලොකහිතානු කම්පකෝ** යනු; අහෝ ලෝකානුකම්පකෝ අහෝ කාරුණිකොයි මේ ආදී තුතිවදන් කියන්නාහු. **මුඤ්චන්ති සුභං භමයන්ති චෙලානි** යනු හා සම්බන්ධයි. දැන් ඔවුන් පැවසූ තුති වදන් දැක්වීම සඳහා-

තුවං සත්‍ථා ච කෙතු ච ධජෝ යුපෝ ච පාණිනං
පරායණෝ පතිට්ඨා ච දීපෝ ච දිපදුත්තමොති

යන ගාථාව කියන ලදි. මෙහි මෙලොව පරලොව හිතාර්ථය පිණිස අනුශාසනා කරත්නුයි **සත්‍ථායි. කෙතු** යනු; කේතුවට බුහුමන් කළයුතුය යන අර්ථයෙන් කොඩියක් වැනිනුයි කේතුයි. **තුවං ධජෝ** ඉන්‍ද්‍රධජය එසවී අර්ථයෙන් දර්ශනීයාර්ථයෙන් ඉන්‍ද්‍රධජය මෙනැයි ධජ නම් වෙයි. නැතහොත් ලෝ යම් කිසිවෙකුගේ කොඩිය දැකීමෙන්ම මේ ධජය අසවලාගේ ධජය හෝ ධජහිමියා සඳහන් වෙයි. එමෙන් භාග්‍යවතුන් වහන්සේ දැකීමෙන්ම ප්‍රඥාව නිර්වාණාධිගමය පැනෙයි. එකුජන ධජයයි කියන ලදි. **යූපෝ ච** යනු; කූටදන්ත සූත්‍රයෙහි කියන ලද දානාදි ආසවක්ඛයඤාණය අවසන් කොට ඇති සියලු යාග පැවැත්වීමට නංවන ලද යූපය ඔබවහන්සේය යන අර්ථයි. **පරායණෝ** යනු; පිළිසරණ යනුයි. **පතිට්ඨා** යනු; යම් සේ මහපොළව සියලු ප්‍රාණීන්ට ආධාර බැවින් පිහිට ද නිශ්‍රය ද එසේ ඔබවහන්සේ ප්‍රතිෂ්ඨාවයි. **දීපෝ ච** යනු; ප්‍රදීපයකි. යම්සේ චතුරංග අන්ධකාරයෙහි සිටින සතුන්ට නංවන ලද ප්‍රදීපය රූප දක්වීම කරන්නේද එසේ අවිදු අඳුරෙහි වෙසෙන සතුන්ට පරමාර්ථ දර්ශනය කරවන ප්‍රදීපය ඔබවහන්සේය යන අර්ථයි නැතහොත් මහමුහුදෙහි බිඳුණු නැවත මිනිසුන්ට සමුද්‍ර ප්‍රදීපය යම්සේ පිහිට වෙයිද එසේ ඔබවහන්සේද සසර සයුරෙහි පිහිටක් නොලබා ගිලෙන ප්‍රාණීන්ට ද්වීපයක් වැනියයි දීපයන අර්ථයි, **දිපදුත්තමෝ** යනු; දෙපා ඇත්තන්ට උතුම් වූයේ දිපදුත්තමයි. මෙහි නිර්ධාරණ ලක්‍ෂණය නැති හෙයින් ඡටා සමාසයාගේ ප්‍රතිෂේධයක් නැත්නුයි. නිර්ධාරණ ලක්‍ෂණ ඡටීයෙහි සමාසං සිද්ධමැයි. සම්මා සම්බුදුනු අපාද දිපාද චතුප්පාද බහුප්පාද රූපී අරූපී සංඥී අසංඥී නෙවසංඥීනාසංඥී සියල්ලන්ම උතුම් වූවාහුමය. කුමක් නිසා මෙහි දිපදුත්තමයයි කියන ලදද? ශ්‍රේෂ්ඨතර වශයෙනි. මෙලොව වනාහි ශ්‍රේෂ්ඨයෙක් උපදින්නේ අපද චතුප්පද බහුප්පදයන් අතර නූපදී. දිපදයන් අතරම උපදී. කිනම් දිපදයන් අතරද? මිනිසුන් අතර සහ දෙවියන් අතරය. මිනිසුන් අතර උපදනේ ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලෝකධාතු

වසයෙහි පැවැත්වීමට සමත් බුදුව උපදී. දෙවියන් අතර උපදනෝ දසසහස්‍රී ලෝකධාතුව වසයෙහි පවත්වන මහාබ්‍රහ්මව උපදී. හෙතෙම එහි කැපකරුව හෝ ආරාජිකව මහාබ්‍රහ්මව උපදී. හෙතෙම එහි කැපකරුව හෝ ආරාජිකව පැමිණෙයි. ඊටත් ශ්‍රේෂ්ඨතර වශයෙන් දිපදුත්තමයි කියන ලදි. දසසහසසිලෝකධාතුයා යනු; දසසහස්‍රී සංඛ්‍යාත ලෝකධාතුවයි. මහිද්ධිකා යනු; මහත් ඍද්ධියෙන් යුක්ත මහානුභාව යන අර්ථයි. පරිවාරෙත්වා යනු; භාග්‍යවතුන් වහන්සේ හාත්පසින් වටකොටගෙන පසන්නා යනු; හටගත් ශ්‍රද්ධා ඇත්තාහු. **නරාසං යනු;** නර පුංගව යනුයි. අහො අච්ඡරියං යනු; මෙහි අන්‍ධයාගේ කඳුනැගීම මෙන් නිතර නොවේනුයි අච්ඡරිය නමි. ආශ්චර්ය යෝග්‍යයයි හෝ අච්ඡරියයි. අහො මෙය විස්මයයි අසුරු ගැසීමට යුක්තය යන අර්ථයි. **අබ්භුතං** යනු; අභූත පූර්වයි. මේ දෙකම විස්මයාවහ පදයි. **ලෝමහංසනං** යනු; ලොම් උඩු අක්කරනා න මෙදිසං භූතපුබ්බං යනු; මා විසින් පෙර වූ මෙවන් පුදුමයක් නොදක්නා ලදැයි පද ගෙන කිවයුතුයි. **අච්ඡරං** යනු; ආශ්චර්යයි. **සකං සකමහි** භවනෙ යනු; තම තමන්ගේ භවනයෙහි. **නිසීදිත්වාන** යනු; හිඳ. දේවතා යනු මේ වචනය දේවතාවන්ට දේව දියණියන්ටද සාධාරණ වචනයකින් දතයුතු. හසන්තිනා යනු; ඒ දෙවියෝ මහහඬින් සිනාසුණහ. **ප්‍රීතිමසඟ** හදින් මඳසිනා නොකොට මහසිනාපාති යන අර්ථයි. **නභෙ** යනු; අහසෙහි ආකාසට්ඨා යනු; අහස් විමානාදියෙහි සිටියාහු, **භූමමඨෙසු** ආදියෙහි ද මේ ක්‍රමයයි. **තිණපඨ නිවාසිනො** යනු; තණඅග්හි ද මාර්ගයන්හි ද වසන්නාහු. පුඤ්ඤවනතා යනු; මහ පිනැත්තෝ. මහිද්ධිකා යනු; මහානුභාව ඇත්තෝ. **සංගීතියො පවතතහති** යනු; දෙව්නළු සංගීත පවත්වති. තථාගතයන් වහන්සේට පුද පිණිස යොදති යන අර්ථයි. **අමබරෙ** යනු; අහසෙහි **අනිලඤ්ජසෙ** යනු; ගුවනෙහි, ආකාශයට අනෙකාර්ථ වශයෙන් අනිලඤ්ජයෙ යි කියන ලදි. පළමුවැන්නටම පර්යායයි.

චම්මාචනදධානි යනු; සම් බඳින ලද, මෙයම පාඨයයි. දෙව්බෙර යන අර්ථයි. **වාදෙනති** යනු; වයත් **සංඛානි** යනු; පුඹුනා සක්. **පණවා** යනු; තනුමධ්‍ය තූර්ය විශේෂයකි. දෙණ්ඩිමා යනු; තිණාව නම් කුඩාබෙර කියැවේ. **වජජයනති** යනු; වයති. **අබ්භුතො වත නො** යනු; ඒකාන්තයෙන් ආශ්චර්යය නොවේද. **උපපජ්ජි** යනු; උපන්නේය. **ලෝමහංසනො** යනු; ලොමුඩැහැගන්වන ධ්‍රුවං යනු; යම් හෙයකින් මේ ශාස්තෘහු උපන්නාහුද එහෙයින් අවශ්‍යයෙන් අර්ථසිද්ධිය ලබන්නෙමුයි යන අභිප්‍රායයි. **ලභාම** යනු; ලබන්නෙමු. **බණෙ** යනු; අෂ්ටක්ෂණ රහිත නවවැනි ක්ෂණයයි යන

අර්ථයි. **නො** යනු; අපගේ **පටිපාදිතො** යනු; ලබන ලද බුද්ධොති **තෙසං සත්‍ථාන** යනු; බුද්ධො යන මෙවදන් අසා ඒ දෙවියන්ට පස්වනක් ප්‍රීතිය පහළවිය යන අර්ථයි. **තාවදෙ** යනු. එකල්හි. **හිංකාරං** යනු; හිංකාර ශබ්දය හිඟි ආදි යම් ශබ්ද පහරන ලද කල්හි කරත් ද එයයි. **සාධුකාර** යනු; සාධුකං ශබ්දද පවත්වති. **උකකුටයි** යනු මහත් ඝෝෂාවද උනනාදයද යන අර්ථයි. **පණ** යනු; දේවාදීන් අභිප්‍රේතයි. සමහරු **පටාකා විවිධා ගගනෙ වතතනති** යයි කියති. ගායනති යනු; බුදුගුණ මුසු ගී ගයති. **සෙලෙනති** යනු; මුවෙන් සෙලිතශබ්ද කරති. **වාදෙනති** යනු; මහත් විපඤ්චිකා මකරමුඛ ආදි වීණා ද තූර්යයන් ද තථාගතයන් හට පුද පිණිස වාදනය කරයි. ප්‍රයෝග කරති. **භුජානි පොයෙනති** යනු; අපොළති. ලිංගවිපර්යාශය දතයුතුය. නවවයනති යනු; අනුන් නටවති. තුමූ ද නටති.

යථා තුයහං **මහාවීර පාදෙසු චකකලකඛණං** යනු; මෙහි යම් අයුරකින් **යම්සේ මහත් වීර්යයෙන් යෙදීමෙන් මහා වීරයාණනි, පාදෙසු චකකලකඛණං** යනු; ඔබගේ දෙපාතලවල අර දහසක් ඇති නොමී සහිත නාභිසහිත සර්වාකාරයෙන් පිරිපුන් චක්‍ර ලක්ෂණය හොඳනේය යන අර්ථයි. **මේ චකක ශබ්දය සමපතති රථාංග ඉරියාපථ දාන රතන ධමම උරචක්‍ර ලක්ෂණාදියෙහි** දක්නට ලැබේ. චතතාරිමානි භිකඛවෙ චකකානියෙහි සමනනාගතානං දෙවමනුසසානං යන ආදියෙහි සමපතතියෙහි දක්නට ලැබේ. චකකංව වහතො පදං යනාදියෙහි රථාංගයෙහිය. චතුචකකං නවදවාරං මෙහි ඉරියවුවෙහිය දදභුඤ්ජව මා ච පමාදො චකකං වතතය සබබපාණිනං මෙහි දානයෙහිය. දිබබං චකකරතනං පාතුභූතං මෙහි රතනචක්‍රයෙහිය. මයා පවතතිතං චකකං යන මෙහි ධර්මචක්‍රයෙහිය. ඉච්ඡා හතසස පොසසස චකකං හමති මත්ථකෙ මෙහි උර චක්‍රයෙහි ප්‍රහාර චක්‍රයෙහි යන අර්ථයි. පාදතලෙසු චකකානි ජාතානි යන මෙහි ලක්ෂණයෙහිය. මෙහි ද ලක්ෂණ චක්‍රය දත යුතුය. **ධජවජිර පටාකා වඩඪමානංකුසාචිනං** යනු; ධජයෙන් වජ්‍රයෙන් පතාකයෙන් වර්ධමානයෙන් අංකුසයෙන් සැරසූ අලංකෘත වූ පිරිවැරූ පාවල චක්‍රලක්ෂණ යන අර්ථයි. චක්‍ර ලක්ෂණ ගත්කල සෙසු ලක්ෂණ ගත්තේම වෙයි. අසීති අනුබ්‍යඤ්ජන ව්‍යාමප්‍රභාද එසේමය. එහෙයින් දෙතිස් මහපුරිස් ලකුණු අසූවක් අනුලකුණු ව්‍යාමප්‍රභායෙන් සමලංකෘත භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය මුළුමනින් සුපිපි පරසතුරුක මෙන් සුපිපි පියුම් වනයක් මෙන් නන් රුවන් විසිතුරු නවරන් තොරණක් මෙන් තරු කිරණින් විසිතුරු අහසක් මෙන් ඔබමොබ දිවෙන දිදුලන සවනක් රස් මුදමින් අතිශයින් ශෝභමානය. දැන් භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය ධර්මකාය සම්පත් දක්වීම පිණිස-

රූපෙ සීලෙ සමාධිම්හි පඤ්ඤායච අසාදිසෝ
විමුකතියා අසමසමෝ ධම්මචකකපපවත්තනෙනි

ආදිය කියන ලදි. එහි **රූපෙ** යනු; මේ රූප ශබ්දයද **ස්කන්ධ භව නිමිත්ත පවවය ශරීර වර්ණ සණ්ඨානාදියෙහි** දැක්වේ. මෙසේ කියන ලදි. යං කිඤ්චි රූපං අතීතානාගත පචචුපපනනය යන මෙහි රූපස්කන්ධයෙහි දැක්වේ. රූපුපපතතියං මගගං භාවෙති මෙහි රූප භවයෙහිය. අජඣතතං රූපසඤ්ඤී බහිදධා රූපානි පසසති මෙහි කසිණ නිමිත්තයෙහිය. සරූපා භික්ඛවෙ උපපජජනති පාපකා අකුසලාධම්මා නො අරූපා මෙහි ප්‍රත්‍යයෙහිය. ආකාසෙ පරිවාරිතෙ රූපනෙතරව සබබං ගච්ඡති මෙහි ශරීරයෙහි ය. චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං මෙහි වර්ණයෙහිය. රූපප්පමාණො රූපප්පසන්නො මෙහි සණ්ඨානයෙහිය. මෙහිද සණ්ඨානයෙහිය. **සීලෙ** යනු; සතර වැදෑරුම් ශීලයෙහි **සමාධිම්හි** යු සමාධියෙහි, **පඤඤාය** යනු ලොවිතුරු ප්‍රඥාවෙහි. අසදිසො යනු; අසදෘශ ආනුපම. **විමුක්තියා** යනු; ඵලවිමුක්තියෙහි අසමසමො යනු; අතීත බුදුවරු අසම වෙති. උන්වහන්සේලා සමග ශීලාදියෙන් සම වෙති. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය ධර්මකාය සම්පත් දක්වන ලදි. දැන් භාග්‍යවතුන් වහන්සේගේ කායබලාදිය දැක්වීමට -

දසනාගබලං කායෙ තුයහං පාකතකං බලං
ඉදධිබලෙන අසමො ධම්මචකකපපවත්තනෙ යි කියන ලදි.

එහි දසනාගබලං යනු; ඡද්දන්ත ඇත්බල දසයකි. කායබල ඤාණබලයයි තථාගතබල දෙපරිදිය. එහි කායබලය ඇත්කුල අනුසාරයෙන් දතයුතුය. කෙසේද?

කාලාවකඤ්ච ගංගෙය්‍යං පණ්ඩරං තම්බ පිංගලං
ගන්ධ මංගල හෙමඤ්ච උපොසථ ඡද්දනතිමෙ දසාති

මේ දස ඇත්කුලය දතයුතුය. **කාලාවකො** යනු; ප්‍රකෘති ඇත්කුලයයි. පුරිසයන් දසදෙනෙකුගේ යං බලයක් වෙයිද එය එක් කාලාවක ඇතකුගේ බලයයි. කාලාවකයන් දසදෙනකුගේ බලය යමක් ද එය එක් ගංගෙය්‍යයකුගේ බලයයි. මේ ක්‍රමයෙන්ම ඡද්දන්තයන් තෙක් පැමිණවිය

යුතුය. ඡද්දන්තයන් දසදෙනෙකුගේ යම් බලයක් වෙයි ද එය එකම **තථාගත බලයයි.** මෙයම නාරායන බලය වජ්‍රබලයයි කියනු ලැබේ. එය පියෙවි ඇත් ගණනින් ඇත්කෙළ දහසක බලයයි. පුරුෂ ගණනින් දසකෙළක් පුරුෂයන්ගේ බලයයි. මේ වනාහි තථාගත කාය බලයයි. **ඤාණ බලය** වනාහි අප්‍රමෙය දසබලඥානය, චතුර්වෛශාරදඥානය අටපිරිස්හි ආත්මපසඥානය චතුර්යොනිපරිච්ඡේදක ඥානය පංචගති පරිච්ඡේදක ඥානය තුදුස් බුද්ධඥානය යන මේ ආදිය ඥානබල නමි. මෙහි වනාහි කායබලය අභිප්‍රේතයි. **කායෙ තුයහං පාකතිකං බලං** යනු; එයද වනාහි ඔබගේ ශරීරයෙහි ප්‍රාකෘතික බලයයි යන අර්ථයි. එහෙයින් **දසනාගබලං** යනු; සදෑත් ඇතුන් දසදෙනකුගේ බලය යන අර්ථයි. දැන් ඤාණබල දක්වන්නාහු විසින්.

ඉදධිබලෙන අසමෝ ධම්මචකකපපවත්තනෙ යනු කියන ලදි. **ඉදධිබලෙන අසමෝ** යනු; විතුර්වණ අධිෂ්ඨානාධි ඍද්ධි බලයෙන් අසමෝ අසදෘශය අනුපමය. **ධම්මචකකපපවත්තනෙ** යනු; දේශනා ඥානයෙහි ද අසමය යන අර්ථයි. දැන් යම් ශාස්තෘවරයාණන් කෙනෙක් මේ ආදි ගුණ සමන්නාගත වෙත්ද උත්වහන්සේ සර්වලොකෙකනායක වෙති. ඒ ශාස්තෘන් වහන්සේ නමස්කාර කරමි කියා තථාගත ප්‍රණාමයෙහි නියෝග දක්වීමට-

එවං සබබගුණොපෙතං සබබංගසමුපාගතං
මහාමුනිං කාරුණිකං ලොකනාථං නමසසථාති කියන ලදි.

එනි එවං යනු; උක්තප්‍රකාර නිදර්ශනයෙහි නිපාතයි. **සබබගුණොපෙතං** යනු; සබෙබා යනු නිරවශේෂවාචීය. **ගුණො** යනු; මේ ගුණ ශබ්දය නොඑක් අර්ථවල දක්නා ලැබේ. මෙය අනුජානාමි භික්ඛවෙ අහතානං වත්ථානං දිගුණං සංඝාටිං යන තැන පටලාර්ථයෙහිය. අවෙචනති කාලං තරයනති රතතියො වයො ගුණ අනුප්පබබං ජහනති මෙහි සමූහාර්ථයෙහිය. සතගුණා දකඛිණා. පාටික්ඛංකිතබබා යන මෙහි ආනිසංසාර්ථයෙහිය. අනතගුණං කයිරමාලා ගුණෙ බහූ යන මෙහි බන්ධනාර්ථයෙහිය. අටඨගුණ සමුපෙතං අභිඤ්ඤා බලමාහරිං මෙහි සම්පත්ති අර්ථයෙහිය. මෙහිද සම්පත්ති අර්ථය දතයුතුය. එබැවින් සියලු ලොවිලොවුතුරා ගුණයෙන් සියලු සම්පතින් උපේතය, සමන්නාගතයයි අර්ථයි. **සබබංගසමුපාගතං** යනු සියලු බුද්ධගුණයෙන් ගුණාංගයෙන්

සමුපාගත සමන්නාගතයි. **මහාමුනිං** යනු; අනෙකුත් පසේබුදු මුනිවරයන්ගෙන් මහත් මුනිවරයාණන් බැවින් මහාමුනියයි කියනු ලැබේ. කාරුණිකං යනු; කරුණා ගුණ යුත් හෙයින් කාරුණික. **ලෝකනාථං** යනු; මුළු ලොවට එකම නායක. සියල් ලෝවැස්සන් විසින් දුකට පත් අපගේ දුක් නසන්නාහයි මෙසේ ආශිංසනය කරනු ලැබේ යන අර්ථයි. දන් පරම නිපත්‍යකාර දසබලයන් වහන්සේගේ අර්හභාවය දක්වනු පිණිස-

අභිවාදනං ථොමනඤ්ච වන්දනං ච පසංසනං
නමසසනඤ්ච පූජං ච සබබං අරහසී තුවනති

ආදි ගාථා කියන ලදි.

එහි **අභිවාදනං** යනු; තමන්වහන්සේට අභිවාදන කරවීම. **ථොමනං** යනු අනභිමුඛයෙහි ස්තුතියයි. **වන්දනං** යනු; ප්‍රණාමනයයි. **පසංසනං** යනු; ඉදියෙහි ප්‍රශංසාවයි. **නමසසනං** යනු; අඤ්ජලිකරණයයි. සිතින් නමස්කාර කිරීම හෝ වෙයි. **පූජනං** යනු; මල් ගඳ විලෙවුන් ආදියෙන් පිදීම. සබබං යනු; මේ සියල්ල කියන ලද ආකාර සත්කාර විශේෂයට ඔබවහන්සේ සුදුසු වෙති. යෝග්‍ය වෙති යන අර්ථයි. **යෙ කෙචි ලොකෙ** වන්දනෙයාා යනු; යමෙක් ලොව වැඳිය යුත්තාහු වන්දනීය වූවාහු වැඳීමට සුදුසු වෙත්ද යෙ යනු; යමෙක් ලොව වන්දනයට සුදුසු වෙත්ද. මෙය පළමු පදයට පර්යංයයි. සබබසෙථොා යනු; ඒ සියල්ලන්ට ශ්‍රේෂ්ඨ උත්තම මහාවීරයන් වහන්ස ඔබම වෙති. ඔබවහන්සේට සමනා කිසිවෙක් නැත යන අර්ථයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යමකප්‍රාතිහාර්යය දක්වා රුවන් සක්මන මවා එහි සක්මන් කරද්දී ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ පන්සියයක් පිරිවර භික්ෂූන් සමග රජගහ නුවර අසල ගිජුකුළු පව්වෙහි වසති. ඉක්බිති තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ බලන්නාහු කපිලපුර අහසෙහි රුවන් සක්මනෙහි සක්මන් කරන්නවුන් දුටහ. එයින් කියන ලදි-

සාරිපුතෙතා මහාපඤ්ඤා සමාධිඣාන කොවිදා
ගිජ්ඣකූටෙ ඨිතොයෙව පසසති ලොකනායකනති

එහි **සාරිපුතතෙතා** යනු; ශාරි බැමිණියගේ පුත්නුයි සාරිපුත්ත

නම්. **මහාපඤ්ඤා** යනු; මහත් සොළොස් ප්‍රඥාවෙන් යුත් හෙයින් මහාප්‍රාඥ. **සමාධිඤ්ඣාන** කොවිදෝ යනු; මෙහි සමාධි යනු සිත එකවිට තබයි. අරමුණෙහි තබයිනුයි සමාධි නම්. එය තෙවැදෑරුම්ය. **සවිතක්ක සවිචාර අවිතක්කවිචාර මත්ත අවිතක්ක අවිචාර** වශයෙනි. **ඣානං** යනු; **පඨමජ්ඣාන දුතියජ්ඣාන තතියජ්ඣාන චතුත්ථජ්ඣාන** යනුයි. මේ ප්‍රථම ධ්‍යානාදියෙන් මෙත්තා ධ්‍යානාදිය ද සංගෘහීත වෙයි. ධ්‍යානයද දෙපරිදිය. ලකඛණූපනිජ්ඣාන ආරම්මණූපනිජ්ඣාන කියායි. එහි අනිත්‍යාදි ලක්ෂණ නැවත නැවත හිතානුයි විදර්ශනා ඥානය ලකඛණූපනිජ්ඣාන නම්. ප්‍රථමධ්‍යානාදිය අරමුණ නැවත නැවත සිතන බැවින් පටිනිජ්ඣාපන බැවින් හෝ ධ්‍යානයයි කියනු ලැබේ. සමාධිවලද ධ්‍යානවලද දක්ෂ වූයේ සමාධිඤ්ඣාන කොවිදෝ නම්. සමාධිධ්‍යානකුසල යන අර්ථයි. **ගිජ්ඣකූටෙ** යනු; එනම් පර්වතයෙහි සිටියාහුම **පසසති** යනු; දුටහ. **සුඵුල්ලසාලරාජංව** යනු; සමවට තදින් නැගුණු විසල් කොමල පලපලු අංකුරයෙන් අලංකෘත ශාඛා ඇති මුලපටන් අගට පිපි සල්රුකක් මෙන් සිල්මුල් ද සමාධිකඳ ද ප්‍රඥා ශාඛා ද අභිඥා කුසුමයන් ද විමුක්ති ඵල ද ඇති දසබල සාලරාජයන් වහන්සේ. **උල්ලොකෙති** යනු; මෙසේ උල්ලෝක පදය සමගින් සම්බන්ධයි. **චන්දංවගගනෙ යථා** යනු; වලා මීදුම් ගුලි දූලි රාහු උවදුරෙන් දුරු තරුගණ පිරිවැරූ සරාකල්හි පිරිපුන් සඳමඬල වැනි සියලු කෙලෙස් ගනඳුරු දුරලන විනොදන කුමුදුවන පුබුදුවන මුනිවර රජනිකරයන් බලයි යන අර්ථයි. **යථා** යනු; නිපාත මාත්‍රයකි. **මජ්ඣනිකංව සුරියං** යනු; මද්දහන් වේලෙහි තියුණු කිරණ මාලා ඇති හිරමඬල මෙන් බබළන. **නරාසභං** යනු; නරවරයාණන් **ජලනතං** යනු; දිදුලන. සරාකල පුන්සඳ වන් සුන්දරතර මුව ශෝභා ඇති ලක්ෂණ අනුව්‍යඤ්ජනයෙන් සමලංකෘත පරම බුදුසිරිත් බබළන උතුම් ශරීරය යන අර්ථයි. **දීපරුකබංව** යනු; එසවූ ප්‍රදීප ව්‍යක්ෂයක් වැනි **කරුණා සුරියංව උගගතං** යනු. අභිනව උදාහිරු වැනි සොම් බැවින් බබළන යන අර්ථයි. සූර්යයාගේ තරුණ බව උදය සඳහා කියනු ලැබේ. සඳෙහි මෙන් අඩුවැඩි නැත්තේය. **බ්‍යාමපපභානුරඤ්ජිතං** යනු; බ්‍යාමප්‍රභායෙන් රැඳුණු. ධීරං පසසති නායකං යනු; ලොව එකම ධීරයාණන් දකී. නායක යන අර්ථයි.

ඉක්බිති ආයුෂ්මත් ධම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ නිල්මේකුළු සමූහයෙන් සිපගන්නා ලද නන් සුවඳ කුසුම්තුරු සුවඳින් සුවඳවත් වූ පරම සුන්දර සිතතුළ වන් ගිජුකුළු පව්වෙහි සිට දසදහසක් සක්වළින් පැමිණි දෙව්බඹගණ පිරිවැරූ අනුත්තර බුදුසිරිත් අනුපම බුදුලීලායෙන්

සම්රුවන්මුවා සක්මනෙහි සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ දැක දැන් මම භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් බුදුගුණ පැවසෙන බුද්ධවංසය දේශනාවට ආයාචනා කරන්නෙමි සිතා තමන් වහන්සේ සමග වසන පන්සියයක් භික්ෂූන් රැස්කරවූහ. එයින් කියන ලදි-

පඤ්චානං භික්ඛුසතානං කතකිච්චාන හාදිනං
ඛීණාසවානං විමලානං ඛණෙන සනනිපාතයීති ආදි

එහි පඤ්චනනං භික්ඛුසතානං යනු; පන්සියයක් භික්ෂූන් උපයෝගාර්ථයෙහි ජටයී පදයි. කතකිච්චානං යනු සතර කටයුත්තෙහි සිවුමගින් පරිඥා ප්‍රහාණ සාක්ෂාත් කිරීම භාවනා වශයෙන් නිමකල සොළොස් කිස ඇත්තවුන්ගේ යනු අර්ථයි. ඛීණා සවානං යනු; ප්‍රහීණ කළ චතුරාශ්‍රව ඇති. විමලානං යනු; පහකළ කෙලෙස්මල ඇති ක්ෂීණාස්‍රව හෙයින් නිර්මල වූ පරම පිරිසිදු චිත්ත සන්තාන ඇත්තවුන්ගේ යනු අර්ථයි ඛණෙන යනු; ක්ෂණයෙන්ම සනනිපාතයි යනු; රැස්කරවීය. දැන් ඒ භික්ෂූන්ගේ රැස්වීමෙහි ගමනෙහි කරුණ දැක්වීම පිණිස-

ලොකපපසාදකං නාම පාටිහීරං නිදසසයි
අමෙහපි තතථ ගනතවාන වන්දිසසාම මයං ජිනං

එථ සබෙබ ගමිසසාම පුවජිසසාම මයං ජිනං
කංඛං විනොදයිසසාම දසසිතවා ලොකනායකංති

කියන ලදි. ලොකපපසාදකං නාම යනු; ලොකයාගේ ප්‍රසාදය ඇතිකරන නිසා ලොකප්‍රසාදක ප්‍රාතිහාර්යයි කියනු ලැබේ. ලොකපපසාදනං නාම යි ද පායයි. එය ලෝකවිවරණ ප්‍රාතිහාර්යය යයිද අර්ථයි. එය උඩින් භවාග්‍රය යටින් අවීචිය යන මෙදෑතුර ඒකාලෝක කොට සියලු සතුන්ට උනුනු දර්ශනය කරවන අධිෂ්ඨාන යයි කියනු ලැබේ. නිදසසය යනු; දැක්වීය යනුයි. අමෙහපි යනු; අපි යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහිගොස් යන අර්ථයි. වන්දිසසාම යනු; අපි භාග්‍යවතුන් වහන්සේගේ පා සිරසින් වඳිමු. මෙහි වනාහි අමෙහ මයං යන දෙපදයෙන් පළමු පදයෙහි ගමන ක්‍රියාවෙන් සම්බන්ධය දතයුතුය. පසුපදයෙන් වන්දන ක්‍රියාවෙහිය. අන් විදියකින් පුනරුත් දොසින් නොමිළේ එථ යනු; ආගචඡථ එව්, කංඛං විනොදයිසසාම යනු; මෙහි ක්ෂීණාස්‍රවයන්ගේ කවර

හෝ සැකයක් නම් නැත. කුමක් නිසා තෙරණුවෝ මෙසේ කීහුද? සත්‍යයෙන්ම ප්‍රථම මාර්ගයෙන්ම සහමුලින් නැසී ගියේය කියන ලදි. කවර නම් ධර්ම දර්ශනයෙන් පහකළ යුතුද? දිට්ඨිගත සම්පයුත්ත චිත්තෝත්පාද සතරය විචිකිච්ඡා සහගත චිත්තෝත්පාදය අපායගාමිනී ලෝභ, දෝස, මෝහ, මාන ඒ හා බැඳුණ කෙලෙස්ය. මෙය විචිකිච්ඡා සංඛ්‍යාත සැකය නොවේ. නමුත් ප්‍රඥප්තියකි. නොදන්ම නමී. තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගෙන් බුද්ධවංසය අසනු කැමැත්තාහ. එය බුදුවරුන්ට විෂය වෙයි. පසේබුදුවරුන්ට හෝ ශ්‍රාවකයන්ට විෂය නොවෙයි. එහෙයින් තෙරනු අවිෂය බැවින් මෙසේ කීහයි දතයුතු. විනොදයිසසාම යනු දුරු කරන්නෙමු. එවිට තෙරුන්ගේ බස් අසා තම තමන්ගේ පාසිවුරු ගෙන මනාව සන්නාහගත ඇතුන් මෙන් සුන් කෙලෙස් ඇති බුන් බව බැඳුම් ඇති අලෙපචඡ සන්තුෂ්ටම ප්‍රවිවේකවඅසංසෘෂ්ටව සීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්ති ඥා දර්ශන සම්පන්න ඒ භික්ෂූහු වහ වහා රැස්වූහ. කියන ලදි-

සාධූති තෙ පටිසුත්වා නිපකා සංවුතින්ද්‍රියා
පතතචීවරමාදාය තරමානා මුපාගමුනති

එහි සාධු යනු; මේ සාධු ශබ්දය ආයාචන සම්පටිච්ඡන සම්පහංසන සුන්දරාදියෙහි දක්නා ලැබේ. මෙය සාධු මෙ භනෙත භගවා සංඛිතෙතන ධම්මං දෙසෙතු ආදියෙහි ආයාචනයෙහි දක්වේ. සාධු භනෙතකි බොතෙ භිකඛූ භගවකො භාසිකං අභිනන්දිත්වා අනුමොදිත්වා ආදියෙහි පිළිගැනීමෙහිය. සාධු සාධු සාරිපුත්ත ආදියෙහි සම්ප්‍රහර්ෂයෙහිය.

සාධු ධම්මරුචි රාජා සාධු පඤඤාණවා නරො
සාධු මිත්තානමද්‍රුහො පාපසස අකරණං සුඛනති

ආදියෙහි සුන්දරත්වයෙහිය. මෙහි පිළිගැනීමෙහිය, එහෙයින් මැනව යහපතැයි තෙරුන්ගේ වචනය අසා පිළිගෙන යන අර්ථයි. නිපකා යනු; පණ්ඩිතයෝ ප්‍රඥාවන්තයෝ. සංවුතින්ද්‍රියා යනු; ඉඳුරන්හි ගෝපිත ද්වාර වූවෝ, ඉන්‍රිය සංවරයෙන් යුක්තයෝ යන අර්ථයි. තරමානා යනු; යුහුසුලු වූවාහු. උපාගමුං යනු; තෙරුන් වෙත එළඹියහ. දැන් ධම්සෙනෙවි තෙරුන්ගේ පවත් දක්වන සංගීතිකාරකයන් විසින් බිණාසවෙහි විමලෙහි ආදි ගාථා කියන ලදි. එහි දනෙතහි යනු; කයින් ද සිතින් ද දමනය වූ

උත්තමෙ දමෙ යනු; අර්හත්වයෙහි. **නිමිත්තාර්ථ භූමය (සත්තමී)** දතයුතුය. **තෙහි භික්ඛූහි** යනු; පන්සියයක් භික්ෂූන් **මහාගණී** යනු; **සීලාදියෙන් ද** සංඛ්‍යා වශයෙන් ද මහාගණයක් ඔහුට ඇත්තේ නුයි මහාගණියි. නානා පද විසින් සීලාදි ගුණයෙන් මහත් වූ ගණය මහාගණයි. ඒ ගණය ඔහුට ඇත්තේ යි මහාගණී වෙයි. **ජලනෙකා දේවො ගගනෙවා** යනු; ඍද්ධි විලාසයෙන් බබළන දෙවියකු මෙන් අහස් තලයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ යන අර්ථයි.

දැන් ඔවුහු මෙසේ වී එළඹියහයි එළඹි අයුරු දැක්වීම පිණිස **උකකාසිතං ච බිපිකංච** ආදිය අරඹන ලදි. එහි **උකකාසිකං ච** යනු; කාරන හඬද බිපිතං ච යනු; කිවිසින හඬ ද **අජඣුපෙකඛිත්වා** යනු; උපේක්ෂකව ඒ දෙක නොකොට යන අර්ථයි. **සුබඛතා** යනු; සුනිර්මල ධුතගුණ ඇත්තාහු. **සපපකිසසා** යනු; නීචවෘත්ති ඇත්තාහු යන අර්ථයි. **සයමභූං** යනු; තමන්ම පරෝපදේශ රහිතව පාරමී පුරා අවබෝධ කරන ලද බුදුබව යන අර්ථයි. අචචුගගතං යනු; අහිනවයෙන් උදාවූ; **චන්දං** වා යනු; සඳ මෙන් අහස බබළන භාග්‍යවතුන් වහන්සේ අහසෙහි සඳ මෙන් දකිති. නිපාත මාත්‍රයකි. විජ්ජුංවා යනු; චිරසථිතික විදුලියමෙසය මෙන් අචිරප්‍රභා ඇත්තේද එබඳුය යන අර්ථයි. ගගනෙ යථා යනු; අහසෙහි යම්සේද, මෙහි ද යථා ශබ්දය නිපාත මාත්‍රමය, මින් පසු ද මෙවැනි තන්හි යථා ශබ්දය නිපාත මාත්‍රයක් බව දතයුතුය.

රහදමිව විපසසනනං යනු; ඉතා ගැඹුරු පළල් මහ ජලාශයක් නොකැළඹුණු අතිශයින් පහන් මහ ජලාශයක් මෙනි. **සලිලං සුඵුල්ලපදුමං** යථා යනු; සුපිපි පියුම් වනයක් වූ විලක් මෙනියන අර්ථයි. **සුඵුල්ලං පදුමං** යථා යනුද පාඨයි. එහි කමනීය බව නිසා සුපිපි කමලවනයක් මෙනැයි යන අර්ථයි. ඉක්බිති ඒ ධම්මසේනාපතීන් ප්‍රමුඛ භික්ෂූහු හිසෙහි ඇදිලි තබා දසබලයන් වහන්සේගේ සක්ලකුණින් බබළන පාදයෙහි වන්දනා කළහ යන අර්ථයි. එහෙයින් අඤජලිං **පගගහෙත්වාන හටඨතුටඨා පමොදිතා** ආදිය කියන ලදි. එහි නිපතනති යනු; වැන්දහ යන අර්ථයි. **චකක ලකඛණො** යනු; චක්‍ර ලක්ෂණය යම් පාදයක ද ඒ පාදය චක්කලකඛණ. ඒ චක්‍රලක්ෂණ යුත්, ජාති වශයෙන් පාදෙයි කියන ලදි. ශාස්තෘන් වහන්සේගේ චක්‍රාලංකෘතතල ඇති පාදයන්හි නමස්කාර කළහ යන අර්ථයි.

දැන් උන්වහන්සේලාගෙන් කිසිතෙර කෙනකුන් නම් වශයෙන්

දක්වන්නාවුන් විසින් **සාරිපුත්තෙතා මහාපඤ්ඤා කොරණ්ඩසමසාදිසො** ආදි ගාථා කියන ලදි. එහි **කොරණ්ඩ සමසංදිසො** යනු; කොරණ්ඩමලකට සමාන පැහැ ඇති, එසේ නම් කොරණ්ඩසමො කියා හෝ කොරණ්ඩසදිසො කියා හෝ කිව යුතුය. කුමක් නිසා දෙවරක් සමසාදිසංයි කියන ලදද? මෙය දොසක් නොවේ. එබඳු කොරණ්ඩ සමබැවින් කොරණ්ඩය හා සමාන බැවින්ම කොරණ්ඩසමසාදිසයි. අධික පදයක් වශයෙන් නොවේ යන අභිප්‍රායයි. **සමාධිඤ්ඣානකුසලො** යනු; මෙහි මේ කුසල ශබ්දය ආරොග්‍ය අනවද්‍ය දක්ෂ සුඛවිපාකාදියෙහි දක්නා ලැබේ. මේ වනාහි කවචිත්‍ර හොතො කුසලං කවචිත්‍ර හොතො අනාමයං ආදියෙහි ආරොග්‍යයෙහිය. කතවො පන භන්තෙ කායසමාචාරො කුසලො යො බො මහාරාජ කායසමාචාරො අනවජ්ජො යනාදියෙහි නිරවද්‍යයෙහිය. කුසලොසිත්‍රං රථසස අංගපච්චංගානං ආදිය දක්ෂතාවෙහිය. කුසලස්ස කම්මස්ස කත්තතා උපචිතතතා ආදියෙහි සැපවිපාකයෙහිය. මෙහි වනාහි දක්ෂතාවෙහි දැකිය යුතුය. **ගඡ්ජති** යනු; නිල් මේකුළක් මෙන් ගර්ජනා කරයි. **ඉද්ධිවිසයෙ** යනු අභිප්‍රායයි **නීලුපලසමසාදිසො** යනු; නිලුපුල් සම වර්ණ ඇත්තේ. යට **කී** පරිදි මෙහිද අර්ථය දතයුතුය. මොගලලානො යනු; මෙසේ ගොත්‍ර විසින් නම් ලද කෝලිතයි. **මහාකස්සපොපීච** යනු; උරුවෙල කස්සප, නදී කස්සප, ගයා කස්සප, කුමාර කස්සප යන කුඩා අනුකුඩා තෙරුන් නිසා මුත්වහන්සේ මහා වෙති. එබැවින් මහාකස්සප යයි කියන ලද්දාහ. **පිඩ** යනු; සමභාවන සමපිණඩන අර්ථයි. **උතතතතකනකසනනිහො** යනු; උණුකළ රන් වැනි ඡවිවර්ණ ඇත්තේ **ධුතගුණො** යනු; මෙහි කෙලෙස් ධුනනය කරන හෙයින් ඒ ධර්මය ධුත නමි. ධුතගුණය නම් ධුත ධර්මයයි. ධුතධර්මය නම් කුමක් ද? අපසිවජතා සනතුටඨතා සලලෙඛතා පවිවෙකතා ඉදමතථිකතා යන මේ ධුතංග චේතනාවට පිරිවර වූ පස්ධර්ම අලෙපවජතාව නිසා යයි කීමෙන් ධුතධම්ම නමි. නැතහොත් කෙලෙස් ධුනනය කරන හෙයින් ඤාණය ධුත නමි. ඒ ධුත ගුණයෙහි. **අගනිකඛිතතො** යනු; අග්‍රයි. ශ්‍රේෂ්ටයි. කෙළවරයි තබන ලදි. එතදගං භිකඛවෙ මම සාවකානං ධුතවාදානං භිකඛූනං යදිදං මහාකස්සපොයි ඨානාන්තරයෙහි තබන ලදි යන අර්ථයි. මේ අගග ශබ්දය ආදි කොටි කොටියාස සෙටඨ ආදියෙහි දක්නා ලැබේ. මෙය අජ්ජතග්ගෙ සම්ම දොවාරික ආවරාමි ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨීනං යන තන්හි ආදියෙහි දක්නා ලැබේ.

කෙනෙව අංගුලග්ගෙන තං අංගුලග්ගං පරාමසෙය්‍ය උච්ඡග්ගං

වෙලගගං ආදියෙහි කෙළවරයි. අනුජානාමි භිකඛවෙ අමබිලගගං වා මධුරගගංවා විහාරගෙගන වා පරිවෙණගෙගනවා භාජෙතුං ආදියෙහි කොටසෙහිය. යාවතා භිකඛවෙ සතතා අපදාවා දිපදා වා -පෙ- තථාගතො තෙසං අගගමකඛායති ආදියෙහි ශ්‍රේෂ්ඨාර්ථයෙනිය. එය මෙහි ශ්‍රේෂ්ඨාර්ථයෙහි දතයුතු. කෙළවරෙහිද වටී. එහෙයින් **අගගනිකඛිතතෙතාය** කියන ලදි. අග්‍රව ශ්‍රේෂ්ඨව කෙළවර තබන ලදි යන අර්ථයි. **ථොමිකො** යනු; දෙව්මිනිසුන් විසින් පසස්නා ලදි. **සතථුවණණිතො** යනු; ශාස්තෘන් වහන්සේ විසින් වර්ණනා කරන ලදි. ස්තුති කරන ලදි. කසස පො භිකඛවෙ චනදූපමො කුලානි උපසමංකමති අපකසෙසව කායං අපකසෙසව චිතතං නිවචනවකො කුලෙසු අපගබෙහා මේ ආදි නොයෙක් සූත්‍රයන්හි වර්ණනා කරන ලදි. ප්‍රශංසා කරන ලදි. උන්වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේට වන්දනා කළහ යන අර්ථයි. දිබබචකඛුකානං යනු; දිව, ඇස යම් කෙනෙකුන්ට වෙයිද ඒ දිවැස් ඇති භික්ෂූන්ට අග්‍රය. ශ්‍රේෂ්ඨය යන අර්ථයි.

කියන ලදි. **එතදගගං භිකඛවෙ මම සාවකානං භිකඛූනං** දිබබචකඛුකානං යදිදං අනුරුදධා යි. අනුරුදධ තෙර භාග්‍යවතුන් වහන්සේගේ සුළුපිය අමිතෝදන නම් ශාක්‍යයාගේ පුත්‍රයාය. මහානාමගේ බාල සොහොයුරාය. මහ පිනැත්තේය. පරම සිවුමැලිය. හෙතෙම තමා සත්වැනිකොට ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි විය. උන්වහන්සේගේ පැවිදිවීමේ ක්‍රමය සංඝභෙදකඛන්ධයෙහි ආයේමය. **අවිදූරෙ වා** යනු; භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහිමය. **ආපන්ති අනාසතතියා** යනු; ඇවතෙහි ද නොඇවතෙහි ද. **කොවිදො සතෙතවඡාය** යනු; ප්‍රතිකර්ම සහිතයෙහි ද ප්‍රතිකර්ම රහිතයෙහි ද යන අර්ථයි. එහි සපපටිකර්ම සවැදෑරුම්ය. අපපටිකමම පාරාජිකා පතතියයි. **ආපතති අනාපතතියා සතිකිචඡාය** කොවිදො කියා ද පාඨයි. එම අර්ථයමැයි. **විනයෙ** යනු; විනය පිටකයෙහි. අගගනිකඛිතෙතා යනු. **එතදගගං භිකඛවෙ මම සාවකානං භිකඛූනං විනයධරානං යදිදං උපාලි** යයි ඒතදග්‍රස්ථානයෙහි තබන ලදි යන අර්ථයි. උපාලි යනු; උපාලි තෙර. **සතථුවණණිකො** යනු; ශාස්තෘන් වහන්සේ විසින් වර්ණිතය. ප්‍රශංසිතය. තෙරුන් වහන්සේ වනාහි තථාගතයන් වහන්සේ වෙතම විනය හදාරා හරුකඵජවත්තු අජ්ජුකවත්තු කුමාරසසපවත්තු යන මේ තුන් වස්තුව සර්වඥතාඥානය සමග සසඳා ප්‍රකාශ කළහ. එහෙයින් තෙරණුවෝ විනයධරයන්ගෙන් අග්‍රවෙති. මේ ආදි නයින් ශාස්තෘන් වහන්සේ විසින් වර්ණිතයයි කියන ලදි.

සුඛුම නිපුණඤපටිවිද්ධා යනු; ප්‍රතිවෙධ කළ සියුම් නිපුණ අර්ථ ඇත්තේ අවබෝධ කළ දැකීමට අපහසු සියුම් අර්ථ ඇත්තේ. **කථිකානං පවරෝ** යනු; ධර්මකථිකයන් ගෙන් ශ්‍රේෂ්ඨ වූයේ. **එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං යදිදං පුණ්ණා මන්තානිපුත්තෝ යි** එතදග්ග පාළියෙහි නංවන ලදි. එහෙයින් **කථිකානං පවරොයි** කියන ලදි. **ගණී** යනු; සමූහ සහිත තෙරුන් ළඟ පැවිදි වූ කුලපුත්‍රයෝ පන්සියයක් වූහ. ඒ සියල්ලෝම දසබලයන් වහන්සේගේ ජාතභූමිකයෝය. උපන් රටවැස්සෝය. ක්‍ෂීණාස්‍රවයෝය. දසකථාවස්තු ලාභීහුය. එහෙයින් **ගණී** යයි කියන ලදි. **ඉසී** යනු; සොයයි කුශල ධර්මයන් ගවේෂණය කරයිනුයි ඉසි නමි. **මන්තානියා පුත්තෝ** යනු; මනතානි නම් බැමිණිය ගේ පුත් පුණ්ණ යනු ඔහුගේ නාමයයි. **විසසු තෝ** යනු; තමාගේ අල්පෙච්ඡතාදි ගුණයෙන් ප්‍රකට වූයේ **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** තෙර වනාහි ශාස්තෘන් වහන්සේ බුදුව දම්සක් පවත්වා පිළිවෙළින් පැමිණ රජගහ නුවර ඇසුරෙහි වාසය කරද්දී කපිලවස්තුවට පැමිණ සිය බෑණ පුණ්ණ තරුණයා මහණකොට බුදුන් වැඳ දන්වා වාසය පිණිස ඡද්දන්ත විලට ගියේය. **පුණ්ණ** වනාහි භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස තෙරුන් සමග පැමිණ මාගේ පැවිදි කිස මුදුන් පමුණුවාම දසබලයන් වහන්සේ වෙත යමි කියා කපිල පුරයෙහිම රැඳුණේය. ඉක්බිති හෙතෙම යොනිසො මනසිකාර කරමින් නොබෝ කලකින්ම රහත්ව බුදුන් වෙත ගියේය. මෙහි අනුරුද්ධ තෙරුන් ද **උපාලි** තෙරුන් ද යන මේ දෙනම බුදුන් කපිලපුරයට වැඩ ඤාතිසමාගමය දවසෙහි පැවිදි වූවන් මෙන් දක්වන ලදි. එය බන්ධක පාළියෙහි හෝ අටුවායෙහි නොදක්වේ. විමසාගත යුතුය. ඉක්බිති ශාස්තෘනු සැරියුත් තෙරුන් ආදි පන්සියයක් භික්ෂූන්ගේ සිත්හසර දැන තමන්ගේ ගුණ කියන්ට පටන්ගත්හ. එහෙයින් කියන ලදි.

එතෙසං චිත්තමඤ්ඤාය ඔපම්මකුසලෝ මුනි
කංඛවෙජ්දෝ මහාවීරෝ කථෙසි අත්තනෝ ගුණන්ති

එහි **ඔපම්මකුසලෝ** යනු; උපමායෙහි **කුසලකඛත්වෙජ්දෝ** යනු; සියලු සතුන්ගේ සැක සිඳලන. දැන් තමන්ගේ යම් ගුණ දක්වූවාහුද ඒවා කීමට-

චතතාරෝ කෙ අසංඛෙය්‍යා කොටිහෙසං නඤ්ඤායති
සතත කායෙ ච ආකාසෙ චකකවාළා චනනතකා
බුදධඤ්ඤාණං අපපමෙය්‍යං න සකකා එතෙ විජානිතුනති

කියන ලදි. **චතතාරෝ** යනු; ගණන සීමාවයි. **එතෙ** යනු; දැන් කිවයුතු අර්ථයන් දක්වයි. **අසංඛෙය්‍යා** යනු; සංඛ්‍යා දක්වීමට නොහැකි බැවින් අසංඛ්‍යයි. ගණන පටය ඉක්මවනු ලද යන අර්ථයි. **කොටි** යනු; ආදි හෝ අන්ත හෝ සීමාවයි. **සෙසං** යනු; යම් සාරාසාංඛ්‍යයක න පඤ්ඤයති යනු; නො පැනේ. දැන් ඒ කී ආකාර සාරාසංඛ්‍යය දක්වීම පිණිස - සතතකායො ආදිය කීහ. **සතතකායො** යනු; සත්ව සමූහය. සත්ව සමූහය අනන්තය. අප්‍රමාණය, පමණ කළ නොහැකිය. ආකාශය ද එසේය. ආකාශයෙහිද අන්තයක් නැත. එසේම සක්වළවල් ද අනන්තමය. බුද්ධඥානය, සර්වඥතාඥානය අප්‍රමෙයය. **නඝකා එතෙ** විඡානිතුං යනු; මේවා යම් හෙයින් අනන්ත ද එහෙයින් දත නොහැකිය. දැන් ශාස්තෘහු සිය ඍද්ධි විකුර්වණයෙහි හටගත් ආශ්චර්ය අද්භූත ඇති දෙව්මිනිස් ආදීන්ට මෙය කවර ආශ්චර්යයක් ද? මීටත් වඩා විශිෂ්ටතර ආශ්චර්ය අද්භූත ඇත්තේය. මාගේ ඒ වචනයට ඇහුම්කන් දෙව් යි ධර්මදේශනය වඩමින් -

කිමෙතං අචඡරියං ලොකෙ යං මෙ ඉදධිවිතුබබණං
අඤ්ඤෙ බහූ අචඡරියා අබභූතා ලොමහංසනාති

ආදිය වදාළහ. එහි **කිං** යනු; ප්‍රතික්ෂෙප වචනයි. **එතං** යනු; මෙය විකුර්වණය සඳහා කියන ලදි. යං යනු; මේ යං ශබ්දය යං තං අපුච්ඡිම්හ අකිතනයි නො අඤ්ඤං තං පුචඡාම තදිංඝ බුදහි ආදිතැන උපයෝග වචනයෙහි දක්නා ලැබේ. අථයානමෙතං භිකඛවෙ අනවකා සො යං එකිසසා ලොකධාතුයා දේව අරහනෙතා සම්මා සම්බුදධා මෙහි කාරණ වචනයෙහිය. යං විපසසි භගවා කපෙප උදපාදි මෙහි භුම්මයෙහිය. යමෙම භනෙත දෙවානං තාවතිංසානං සම්මුඛා පටිගගහිතං ආරොචෙමි තං භනෙත භගවතො ආදියෙහි ප්‍රත්‍යාතම වචනයෙහිය. මෙහි ද ප්‍රත්‍යාතවයෙහි දතයුතුය. මාගේ වෙනත් බොහෝ ආශ්චර්ය අද්භූත ඇත්තේ යයි දක්වති. දැන් ඒ ආශ්චර්ය දක්වමින් -

යදාහං තුසිතෙ කායෙ සනතුසිතො නාමහං තදා
දසසහසසී සමාගම්ම යාචනතිපඤ්ජලී මෙනති

ආදිය කීය. එහි **යදා** යනු; යම් කලෙක අහං යනු; තමා දක්වයි.

තුසිතෙ තායෙ යනු; තුසිත නම් දේවනිකායෙහි, යම් කලෙක මම සමතිස් පැරුම් පුරා පංචමහාපරිත්‍යාග කොට ඥාත්‍යර්ථචර්යා ලෝකාර්ථචර්යා බුද්ධිචර්යාවන්හි කෙළ පැමිණ සතතසතක මහඳන් දී සත්වරක් පොළොව කම්පා කොට වෙසතුරු අත්බැවින් චුතව දෙවන චිත්තවාරයෙහි තුසිත භවනයෙහි උපන්මි. එහි ද සන්තුසිත නම් දෙව්රජ වීමි. **දසසහස්සී සමාගමම** යනු දසදහසක් සක්වළ දෙවියෝ රැස්ව යන අර්ථයි. **යාවන්ති පඤ්ජලීමමං** යනු; මං වෙත පැමිණ නිදුකාණනි, දසපාරමී පුරන ඔබවහන්සේ විසින් ශක්‍රසම්පත් මාර සම්පත් බ්‍රහ්ම සක්විති සම්පත් පතා නොපුරන ලදි. ලෝකය එතෙර කරවනු පිණිස බුද්ධත්වය පතාම පුරන ලදි. නිදුකාණනි, අයදිති. එහෙයින් කියන ලදි-

කාලොයං තෙ මහාවීර උපපජ්ජ මාතුකුච්ඡියං
සදෙවකං තාරයනෙතා බුජ්ඣසසු අමතං පදනති

එහි **කාලො තෙ** යනු; ඔබට කාලයයි. මෙයම හෝ පාඨයි. **උපපජ්ජ** යනු; පිළිසිඳ ගනු මැනව. ඔකකම කියා ද පාඨයි. **සදේවකං** යනු; දෙවියන් සහිත ලෝකය යන අර්ථයි. **තාරයමානා** යනු; මෙහි පාරමී පුරන්නේ ද තරණය කරවීමයි. පාරමී මස්තකප්‍රාප්ත කරන්නේද තරණය කරවීමයි. වෙසතුරු අත්බැවින් චුතව තුසිතපුරයෙහි පිළිසිඳ ගෙන වර්ෂ ලක්ෂ සැටකට අධික වසර සත්පනස් කෙළක් එහි වසන්නේ ද තරණය කරවීමයි. රාහුල භද්‍රයන් උපන්දින ජනන සහාය කොට කපටක අරා නික්මෙනුයේ ද තුන්රජය පසුකොට අනෝමා නම් ගං තෙර පැවිදි වන්නේ ද තරණය කරවීමයි. සවසක් ප්‍රධන් කරන්නේද වෙසක් පොහෝ දිනක බෝමැඩට නැගී මාරබල නසා පළමුයම පෙරවිසීම් සිහිකොට මැදියම දිවැස පිරිසිදු කොට අලුයම දොලොස් අඟින් යුත් පටිචචසමුපපාදය අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කොට සෝවාන්මග ප්‍රතිවේධ කරන්නේද තරණය කරවීමයි. සෝවාන් විලක්ෂණයෙහි ද -පෙ- සකෘදාගාමී මාර්ග ක්ෂණයෙහි සකෘදාගාමී ඵලක්ෂණයෙහි අනාගාමී මාර්ගක්ෂණයෙහි අනාගාමී ඵලක්ෂණයෙහි ද තරණය කරවීමයි. යම්දාක අටළොස් කෙළ ලක්ෂයක් දෙවියන් සහිත පංචවර්ගීයයන් අමාපැන් පෙවීද එදා පටන් තරණය කරවීයයි කියනු ලැබේ. එබැවින් කියන ලදි.

සදේවකං කාරයනෙතා බුජ්ඣසසු අමතං පදං

ඉක්බිති මහසත්හු දෙවියන් විසින් අයදිනු ලබන්නාහු දෙවියන්ට

ප්‍රතිඥා නොකොටම කාල දීප දේස කුල මෑණියන්ගේ ආයුකාල වශයෙන් පස්වැදෑරුම් මහාවිලෝකනය බැලූහ. එහිලා කල්ද නොකල්දැයි පළමුව කල්බැලූහ. වර්ෂ ලක්ෂයකින් උඩ ආයුකාලය කාල නම් නොවෙයි. කුමක් හෙයින්ද? ජරා මරණාදියෙහි අප්‍රකට බැවිනි. බුදුවරුන්ගේ ධර්මදේශනා නම් ත්‍රිලක්ෂණයෙන් මිදුණෝ නොවෙයි. අනිච්චං දුක්ඛං අනත්තායි කීවිට ඔවුන්ටද මේ කුමක් කියන්නේ දැයි නො අදහති. එයින් අවබෝධයක් නොවෙයි. එය නැතිවිට සසුන අනෙර්යානික වෙයි. එබැවින් එය අකාලයයි. අවුරුදු සියයෙන් අඩු ආයු කාලය ද කාලය නොවෙයි. කුමක් නිසාද? එකල සත්වයෝ උත්සන්න කෙලෙස් ඇත්තෝ වෙති. කෙලෙස් උත්සන්නයන්ට දුන් අවවාදය අවවාද ස්ථානයෙහි නොසිටී. එබැවින් එයද අකාලයයි. වර්ෂ ලක්ෂයෙහි පටන් යට වර්ෂ සියයෙහි පටන් උඩ ආයු කාලය කාල නමි. දැන් මිනිස්සු සියවස් ඇත්තෝය. එවිට බෝසත්හු ඉපදිය යුතු කාලයයි දුටහ. ඉක්බිති ද්වීපය බලන්නාහු දඹදිවට බුදුවරු උපදිතියි ද්වීපය දුටහ. ද්වීපය නම් දසදහසක් යොදුන් පරිමාණයයි. කවර නම් පෙදෙසක උපදනාහුදැයි දේශය බලන්නාහු මධ්‍යම දේහය දුටහ. ඉක්බිති කුලය බලන්නාහු බුදුවරු නම් ලෝකසම්මත කුලයෙහි උපදනාහ. මෙකල කැත්කුලය ලෝකසම්මත ය. එහි උපත් සුද්ධෝදන නම් රජ මට පිය වෙයි කියා කුලය දුටහ. ඉක්බිති මෑණියන් බලන්නාහු බුද්ධමාතාව නම් ලොල් සුරාසොඬ නොවෙයි. නොකඩ පන්සිල් ඇත්තිය. මේ මහාමායා දේවිය ද එබඳුය. මෑ මාගේ මෑණි වෙති. ඇගේ ආයු කොපමණ දැයි මෙනෙහි කරන්නාහු දසමසින් මතු සත් දිනැකැයි දුටහ. මේ පස්මහ බැලුම් බලා නිදුස්වරුනි, මේ මට බුදුබව කලැයි දෙවියන්ට ප්‍රතිඥා දී එහි ආයු තාක් වැස ශාක්‍ය රාජ කුලයෙහි මායා දේවිය කුස පිළිසිඳ ගත්හ. එයින් කියන ලදි-

තුසිතා කායා වවිත්වාන යදා ඔකකමි කුවඡියං
දසසහසසී ලෝකධාතු කම්පත්ථ ධරණී තදානි.

එහි ඔකකමිං යනු; බැසගතිමි. පිවිසියෙමි. කුවඡියං යනු; මව්කුසෙහි. දසසහසසී ලෝකධාතු කම්පිත්ථ යනු; ඉක්බිති බෝසත්හු සම්‍යක් ප්‍රඥාවෙන් මවුකුස පිවිසෙන්නාහු එකුන්විසි පටිසන්ධි සිත්වල මෛත්‍රී පූර්වභාග සොමනස් සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික කුසල සිතට අනුරූප මහා විපාක සිතින් ඇසළ පසළොස්වක උතුරුසල නැකතින්ම පිළිසිඳ ගත්හ. එදා සියලු දසසහස්‍රී ලෝකධාතුව කම්පා විය. ප්‍රකම්පාය යන අර්ථයි.

ධරණී යනු; ස්ථාවර ජංගම සියල්ල දරාතුයි ධරණී නමි. පෘථිවියයි. **සමපජා නොව නික්ඛමි** යනු; මෙහි යම්දාක මම සිහි ඇතිව මනා නුවණ ඇතිව ධර්මාසනයකින් බසින ධර්ම කථිකයකු මෙන් හිණකින් බසින පුරුෂයකු මෙන් අත් පා දිග හැර හිටිවනම මවුකුසින් නික්මෙන්නෙම් මවුකුස හටගත් අසූචියක් නොතැවරීම නික්මුණෙමි. **සාධුකාරං** යනු; සාධුකාරයි. **පවත්තතනති** යනු; සාධුකාර දෙති යන අර්ථයි. **පකම්පිසු** යනු; කම්පා විය. මවුකුස පිළිසිඳීමෙහිද නික්මීමෙහිද දසසහස්‍රී ලෝකධාතුව කම්පා විය යන අර්ථයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගර්භාවක්‍රාන්ති ආදියෙහි තමහට සමවූවෙක් නොදක එහි ආශ්චර්ය දක්වනු පිණිස **ඔක්කන්ති මෙ සමො නත්ථි** යන මේ ගාථාව කීහ. එහි **ඔක්කන්ති** යනු; ගර්භාවක්‍රාන්තියෙහි භූම්‍යර්ථයෙහි ප්‍රත්‍යාතම වචනයි. පිළිසිඳ ගැනීමෙහි යන අර්ථයි. මෙ යනු; මා විසින් **සමො** යනු; සමානයෙක් නැත. **පරනිතො** යනු; මෙහි මේ මෑණියන්ගෙන් උපදීනුයි මව ජානියයි කියනු ලැබේ. ඒ ජානියගෙන්. මවගෙන් යන අර්ථයි. **අභිනිකඛමෙ** යනු; මවුකුසින් නික්මීමෙහි. ප්‍රසවයෙහි යන අර්ථයි. **සම්බෝධියං** යනු; මෙහි ප්‍රශස්ත සුන්දර බෝධිය සම්බෝධියයි. මේ බෝධි ශබ්දය වනාහි ඍක්ෂ මාර්ග නිර්වාණ සර්වඥතා ඥාන ආදියෙහි දක්නට ලැබේ. බෝධිරුක්ඛමූලෙ පයමාහි සම්බුද්ධො, යනු ද අන්තරාව බෝධිං අන්තරා ච ගයං කියා ද ආතන්හි ඍක්ෂය බෝධියයි කියැවේ. බෝධි වුච්චති චතූසු මගෙසු ඤාණං යි ආ තන්හි මාර්ගයයි. පච්චාන බෝධිං අමතං අසංඛතං යි ආ තන්හි නිර්වාණයයි. පපෙපාති බොධිං වර භූරිමෙධසොයි ආ තන්හි සර්වඥතාඥානයයි. මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේගේ අර්හත් මාර්ග ඥානය අභිප්‍රේතයි. අන් අය සර්වඥතා ඥානයයි කියති. එම **සම්බෝධියෙහි** මම ශ්‍රේෂ්ඨ වෙමි යන අර්ථයි. කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ සම්බෝධිය අරභයා තමන් පසසන සේක් ද? සර්වගුණදායී හෙයිනි. භාග්‍යවතුන් වහන්සේගේ සම්බෝධිය සර්වගුණදායකය. සියලුම නිරවශේෂ බුදුගුණ දෙයි. අනුන්ගේ එසේ නොවේ. එනුන්ගේ වනාහි අර්හත්ව මාර්ගය අර්හත්ව ඵලයම දෙයි. කිසිවෙකුට ත්‍රිවිද්‍යාව කිසිවෙකුට අභිඥා කිසිවෙකුට සිව්පිළිසිඹියා කිසිවෙකුට ශ්‍රාවකපාරමී ඤාණය පච්චේක බෝධිඤාණය දෙයි. බුදුවරුන්ට වනාහි සියලු ගුණ සම්පත් දෙයි. එහෙයින් බුදුහු සියලු ගුණ දෙන බැවින් සම්බෝධියෙන් මම ශ්‍රේෂ්ඨ වෙමියි තමන් පසසති. එසේම පොළොව කම්පාකොට බුදුවූහ. එබැවින් සම්බෝධියෙන් මම ශ්‍රේෂ්ඨවෙමියි පවසති.

ධම්මචක්කප්පවත්තනෙ යනු; මෙහි ධර්ම චක්‍රප්‍රවර්තනය දෙපරිදි වෙයි. ප්‍රතිවේධ ඥානයත් දේශනා ඥානයත්ය. එහි ප්‍රඥාවෙන් පරිභාවිත තමන් වහන්සේගෙ ආර්යඵල මගඳෙන ඥානය ප්‍රතිවේධ ඥානයයි. කරුණා පරිභාවිත ශ්‍රාවකයන්ට මඟඵල ලබාදෙන ඥානය දේශනා ඥානයයි. පටිවේධඤාණය ලෝකාන්තරය කුසල උපේක්ෂා සහගතය. විතර්ක රහිතය. විචාර රහිතය. දේසනා ඤාණය ලෞකිකය. අව්‍යාකෘතය. මේ දෙකම අන්‍යයන්ට අසාධාරණය. මෙහි වනාහි දේසනා ඤාණය අභිප්‍රේතය. දැන් භාග්‍යවතුන් වහන්සේගේ ගර්භාවක්‍රාන්තියෙහි ද පොළොව කම්පනාදි පුවත් අසා අහෝ අච්ඡරියං ලොකෙ යනුවෙන් දෙවියන් විසින් මේ ගාථාව කියන ලදි.

එහි බුද්ධානං ගුණමහන්තතා යනු; අපොයි, බුදුවරුන්ගේ ගුණමහත් බව, අපොයි බුද්ධ මහානුභාවය යන අර්ථයි. **දසසහස්සී ලෝකධාතු ඡප්පකාරං එකම්පථ** යනු; දසදහසක් සක්වළ මහපොළව ෂඩාකාරයකින් කම්පා විය. සැලිණ. කෙසේද? නැගෙනහිරින් එසවෙයි. බටහිරින් පහත් වෙයි. බටහිරින් උස්වෙයි. නැගෙනහිරින් පහත් වෙයි. උතුරෙන් උස්වෙයි. දකුණින් පහත්වෙයි. දකුණින් උස්වෙයි. උතුරෙන් පහත්වෙයි. මැදින් උස්වෙයි. කෙළවරින් පහත් වෙයි. කෙළවරින් උස්වෙයි. මැදින් ප හත් වෙයි. මෙසේ සයාකාරයකින් අනිල බලයෙන් සැලුණ ජලරල බිඳිමෙන් ගැටුණ නැවක් මෙන් සතර නුහුවක් අධික දෙයොදුන් ලක්‍ෂයක් බොල් පොළොව දරා සිටි ජල කෙළවර කොට සිටි සිත් නැත්තා වූද මේ මහපොළොව සිත් ඇත්තාක් මෙන් ප්‍රීතියෙන් නටන්නාක් මෙන් කම්පා විය යන අර්ථයි, **ඔභාසො ච මහාආසි** යනු; දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා මහත් වූ ආලෝකය විය අර්ථයි. **අවෙජරං ලොමහංසනං** යනු; ආශ්චර්යද ලොමුදැහැ ගැනීමද විය යනු අර්ථයි. දැන් පොළොව කම්පාවීම ආලෝකය පහළවීමාදි ආශ්චර්ය පවතිද්දී භාග්‍යවතුන් වහන්සේගේ තතු දැක්වීමට භගවාව තමහි සමයෙ ආදි ගාථා කීහ. එහි **ලෝක ජෙට්ඨො** යනු; ලෝක ශ්‍රේෂ්ඨයි. **සදේවකං** යනු; සදේවක ලෝකයට සාමී අර්ථයෙහි උපයෝග පදයි දතයුතුය. **දස්සයනෙතා** යනු; ප්‍රාතිහාර්ය දක්වන්නාහු. **චංකමනෙකා ච** යනු; දසදහසක් ලෝකධාතු වසා සිටි ඒ රුවන් සක්මනෙහි සක්මන් කරමින්ම කිහ. **ලෝකනායකො** යනු; ඉක්බිති ශාස්තෘන් ව හන්සේ මනොසීලාතලයක සිංහනාද කරන සිංහයකු මෙන් ගර්ජනා කරමින් වසන මෙසයක් මෙන් අහස්ගඟ ගලා බසින්නාක් මෙන් අටඟින් යුත් ස්වකීය කමණීය බඹගොසින් තන්නය විසිතුරු සිවුසත් මුසු තිලකුණු ගෙන දෙන මිහිරි බණක් දෙසූහ යන අර්ථයි.

අන්තරා න නිවත්තෙති වතුහසෙ චංකමෙ යථා යනු; මෙහි ශාස්තෘන් වහන්සේ විසින් මවන ලද සක්මනෙහි එක් කෙළවරක් නැගෙනහිර සක්වළ මුවවිතෙහිය. එකක් බටහිර සක්වළ මුවවිටෙහිය. මෙසේ පිහිටි රුවන් සක්මනෙහි සක්මන් කරන සේක් දෙකෙළවර පැමිණ හැරෙති. දෙකෙළවරට නොපැමිණ අතරමග වහා නතරවන්නාහ. සතර රියන් සක්මනක සක්මන් කරමින් වහා කෙළවරට පැමිණ හැරෙන්නේ ද එසේ අතර නොනවත්නාහ යන අර්ථයි. කිම භාග්‍යවතුන් වහන්සේ දසදහසක් දික් සක්මන කෙටිකළ සේක් ද? එකෙක් මහත් ආත්ම භාවයක් මැවූ සේක් ද? එසේ නොකළහ. බුදුවරුන්ගේ බුද්ධානුභාවය අචින්තනීයය. අකනිට්ඨ භවනය පටන් අවීචිය තෙක් එකම මිදුලක් විය. සරසින්ද දසදහසක් සක්වළ එකාංගණ විය. දෙවියෝ මිනිසුන් දකිති. සියලු දිව්‍ය මනුෂ්‍යයෝ ප්‍රකෘතියෙන් සක්මන් කරනු දනිත් ද? එසේ සක්මන් කරන බුදුන් දුටහ. භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරමින් දහම් දෙසති. අතර සමවතට සමවදිති. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අපරිමිත කාලයෙහි රැස් කරන ලද කුසල බලයෙන් පර්වත දෙතිසක් මාර ලකුණින් කොඩි අසූවක් අනුලකුණින් විරාජිත උතුම් දේහය සරාකල්හි පුන්සඳ මෙන් මුළුමනින් සුපිපිරි සියක් යොදුන් උසැති පරසතු රුක මෙන් අටළොස් රියක් උස ව්‍යාමප්‍රභා පරික්ෂේපයෙන් සශ්‍රීක ජංගම රන්ගිරක් මෙන් අනූපම බුද්ධ ලීලායෙන් සක්මන් කරන ලද දස සහස්‍රී දෙව්ගණ පිරිවැරූ භාග්‍යවතුන් වහන්සේ දක මේ දසසහස්‍රී සකල ලෝකයා රැස් වූහ. මෙහි මහාධර්ම දේශනාවක් විය යුතුය. බුද්ධවංස දේශනාව වනාහි බහූපකාරය. භාග්‍යවතුන් වහන්සේ විෂයෙහි ප්‍රසාදය එළවන සුලුය. මම දසබලයන් වහන්සේගේ අභිනීහාරයෙහි පටන් බුද්ධ වංසය විමසන්නෙම් නම් මැනවැයි සිතා සිවුර එකාංශ කොට භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ජලජ නිමල අවිකල කමල කැකුළක් බඳු ඇඳිලි හිස තබා භාග්‍යවතුන් වහන්සේ ගෙන් **කිදිසො තෙ මහාවීර** ආදිය විමසූහ. එයින් කියන ලදි-

සාරිපුත්තෙතා මහාපඤ්ඤා සමාධිඤාන කොවිදෝ
පඤ්ඤාය පාරමිප්පත්තෙතා පුච්ඡති ලොකනායකං
කිදිසො තෙ මහාවීර අභිනීහාරෝ නරුත්තම
කමහි කාලෙ කයා ධීර පත්ථිතා බොධි මුත්තමාති ආදියයි.

මෙහි අනුසන්ධිය කුමක් ද? අනුසන්ධි තුනකි. පුච්ඡානුසන්ධිය

අජ්ඣාසයානුසන්ධිය යථානුසන්ධියයි. එහි එවං වුත්තෙ තන්දො ගොපාලකො භගවන්තං එතදවොච කින්නු ඛො භන්තෙ ධරිමං තීරං කින්නු පාරිමං තීරං මෙසේ විමසන්නවුන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් විසඳන ලද සූත්‍ර වංශයෙන් පුච්ඡානසන්ධිය දතයුතුය. අථ ඛො අඤ්ඤතරණීය භික්ඛුනෙ එවං චෙතසෝ පරිවිතක්කෙකා උදපාදි ඉතිකිරභො රූපං, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං, අනත්තා. අනත්තකතානිකම්මානි කථමත්තානං ඵුසිසසනන්ති. අථ ඛො භගවා කසෙස භික්ඛු නො චෙතො පරිවිතක්කමඤ්ඤාය භික්ඛූ ආමන්තෙසි. තං කිංමඤ්ඤථ භික්ඛවෙ ඉධෙකවෙච්චා මොඝපුරිසං අවිද්වා අවිජ්ජාගතො තණ්හාධිපතෙය්‍යෙන චෙතසා සත්ථුසාසනං අතිධාවිතබ්බං මඤ්ඤෙය්‍ය ඉති කිර භො රූපං අනත්තා -පෙ- කථමත්තානං ඵුසිසසනන්ති තං කිංමඤ්ඤථ භික්ඛවෙ රූපං රූපං නිච්චං වා අනිච්චං වා යන තන්හි මෙන් අනුන්ගේ අදහස් දැන භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ සූත්‍ර වශයෙන් අජ්ඣාසායානුසන්ධිය දතයුතුය. එබැවින් පුච්ඡානුසන්ධියයි කියන ලදි.

එහි **පඤ්ඤාය පාරමිපපත්තෙනා** යනු; ශ්‍රාවක පාරමී ඥාණයෙහි මස්තක ප්‍රාප්ත. **පුච්ඡනි** යනු; පිළිසිඹියහ. එහි පුච්ඡා නම් අදිට්ඨජොතනා පුච්ඡා දිට්ඨසංසන්දනා පුච්ඡාවිමතිච්ඡෙදනා පුච්ඡා අනුමති පුච්ඡා කථෙතුකම්‍යතා පුච්ඡායි පස් ආකාරය. එකී තෙරණුවන්ගේ පුච්ඡාව කුමක්ද යත් යම් හෙයකින් මේ බුද්ධවංසය කල්ප ලක්ෂයක් අධික අසංඛ්‍යයෙක්හි රැස්කරන ලද පුණ්‍යසම්භාර ඇති පසේබුදුවරුන්ගේ කල්ප ලක්ෂයක් හා අසංඛ්‍යයෙක් රැස්කරන ලද පුණ්‍යසම්භාර ඇති දෑගසව්වන්ගේ ද කප්ලක්ෂයක් රැස්කළ පුණ්‍යසම්භාර ඇති මහාශ්‍රාවකයන්ගේ හෝ විෂයට අයත් නොවූ සර්වඥ බුදුවරයන් වහන්සේලාටම විෂය වෙයි. එහෙයින් තෙරුන්ගේ අදිට්ඨජොතනා පුච්ඡාව යයි දතයුතු. **කීදිසො** යනු; විමසන අයුරුයි. කවරාකාරද යන අර්ථයි. **තෙ** යනු; ඔබගේ **අභිනීහාරො** යනු. අභිනීහාර නම් බුදුබව සඳහා සිත් බැඳ බුද්ධව්‍යාකරණයක් නොලැබ නොනැගිටීමයි වීර්‍යාධිෂ්ඨාන කොට වැතිර ගැනීමයි. එහෙයින් කියන ලදි. **කීදිසො තෙ මහාවීර අභිනීහාරො නරුත්තම යි. කම්හි කාලෙ** යනු; කවර කල්හිද. පත්ථිතා යනු; කැමතිවන ලද, බලාපොරොත්තු වන ලද. බුදුව අවබොධ කරවමි. මිදී මුදවමි විමසූහ. **බොධි** යනු; අර්හත් මාර්ග ඥානයට ද සර්වඥතාඥානයට ද මෙය නාමයකි. **උත්තම** යනු; ශ්‍රාවක බොධියට ශ්‍රේෂ්ඨ බැවින් උත්තම යි කියන ලදි. දෙක අතර මකාරය පද සන්ධිකාරකයි. දැන් බුද්ධකාරක ධර්ම විමසමින් -

දානං සීලංච නෙකඛම්මං පඤ්ඤා විරියං ච කිදිසං
ඛනති සච්චමධිට්ඨානං මෙතතු පෙකඛා ච කිදිසා
දසපාරමී තයා ධීර කිදිසා ලොකනායක
කථං උපපාරමී පුණණා පරමත්ථපාරමී කථානති යි කීහ.

එහි දාන පාරමිතාවෙහි වනාහි අංග පරිත්‍යාගය පාරමී නම්. බාහිර බඩු පරිත්‍යාගය උපපාරමී නම්. ජීවිත පරිත්‍යාගය පරමාර්ථ පාරමිතා නම්. සෙසු පාරමීවලද මේ ක්‍රමයයි. මෙසේ දසපාරමී දසඋපපාරමී දසපාරමාර්ථපාරමී යැයි සමතිස් පාරමී වෙයි. එහි බෝසතුන්ගේ දාන පාරමිතාව පිරූ ආත්මභාවවල ප්‍රමාණයක් නැත. ඒකාන්තික වශයෙන් සසපණ්ඩිත ජාතකයෙහි-

භික්ෂාව සඳහා පැමිණියකු දැක සිය ජීවිතය පරිත්‍යාග කළෙමි. දානයෙන් මට සම වූවෙක් නැත. මේ මාගේ දාන පාරමිතාවයි.

මෙසේ මෙබඳු ජීවිත පුදන්නාහුගේ දාන පාරමිතාව පරමාර්ථ පාරමිතා නම්. එසේම සීල පාරමිතාව පිරූ ආත්ම භාවවල ප්‍රමාණයක් නැත. ඒකාන්තයෙන් සංඛපාල ජාතකයෙහි-

නුලින් විදින කල්හිද සැනින් කොටන කල්හිද හොජපුත්‍රයන් කෙරෙහි නොකිපියෙමි. මේ මාගේ සීලපාරමිතාවයි.

මෙසේ ආත්ම පරිත්‍යාග කරන්නහුගේ සීලපාරමිතාව පරමාර්ථ පාරමී නම් විය. එසේම මහරජකම හැර නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පිරූ ආත්මභාවවල ගණනක් නැත. ඒකාන්තයෙන් චුල්ලසුතසොම ජාතකයෙහි-

අත්පත් මහාරාජ්‍යය කෙළපිඩක් සේ දැමීමි. හැරදමන මට ඇලීමක් නොවීය. මේ මාගේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවයි.

මෙසේ නොඇල්මෙන් රාජ්‍යය හැරදමා නික්මෙන්නහුගේ නෛෂ්ක්‍රම්‍යය පාරමිතා පරමාර්ථ පාරමී නම් විය. එසේම මහෞෂධ පණ්ඩිත කාලාදියෙහි ප්‍රඥා පාරමිතාව පිරූ ආත්මභාව ප්‍රමාණයක් නැත. සතතුහනතක පණ්ඩිත කාලයෙහි-

ප්‍රඥාව සොයන මග බමුණකු දුකින් මිදුවෙමි. ප්‍රඥාවෙන් මට සමානයෙක් නැත. මේ මාගේ ප්‍රඥා පාරමිතාවයි.

පසුබිම්බිය තුළට පිවිසි සර්පයකු දක්වන්නහුගේ ප්‍රඥා පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. එසේම වීර්ය පාරමිතාදිය පිරූ ආත්මභාව ප්‍රමාණයක් නැත. ඒකාන්තයෙන් මහජනක ජාතකයෙහි-

තෙරක් නොදක්නා දියමැද සියලු මනුෂ්‍යයෝ නැසුණහ. සිතේ වෙනස් බවක් නැත. මේ මාගේ වීර්ය පාරමිතාවයි.

මෙසේ මහමුහුද තරණය කරන්නහුගේ වීර්ය පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. එසේම ක්ෂාන්තිවාදී ජාතකයෙහි-

තියුණු පොරවෙන් මට කොටද්දී සිත් නැත්තකු මෙන් කසීරජුට නොකිපියෙමි. මේ මාගේ ක්ෂාන්ති පාරමිතාවයි.

මෙසේ අචේතන භාවයෙන් මහදුක් ඉවසන්නහුගේ ක්ෂාන්ති පාරමිතාව පරමාර්ථ පාරමී නම් විය. මහාසුතසෝම ජාතකයෙහි-

සත්‍ය වචනය රකිමින් ජීවිත පරිත්‍යාග කොට සියයක් ක්ෂත්‍රියයන් මිදුවෙමි. මේ මාගේ සත්‍ය පාරමිතාවයි.

මෙසේ ජීවිත පරිත්‍යාගයෙන් සත්‍යය රක්නහුගේ සත්‍ය පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. මූගපකඛ ජාතකයෙහි-

මට මවුපියෝ දෙවඟ නොවූහ. මහයසස් මට දෙවඟ නොවීය. බුදුබව මට ප්‍රියය. එහෙයින් ඒකාන්තයෙන් අධිෂ්ඨාන කළෙමි.

මෙසේ ජීවිතයද ඒකාන්ත අධිෂ්ඨාන කරන්නහුගේ අධිෂ්ඨාන පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. එකරාජ ජාතකයෙහි-

කිසිවෙක් මා බිය නොකරවති. මම කිසිවකු බිය නොකරවමි. මෛත්‍රී බලයෙන් උපසතමහතව හැමදා වනයෙහි ඇළෙමි.

මෙසේ ජීවිතය ද නොබලා මෛත්‍රිය වඩන්නහුගේ මෛත්‍රී පාරමිතාව පරමාර්ථ පාරමී නමි. ලෝමහංස ජාතකයෙහි

> මිනී ඇට ගළපා සොහොනෙහි සයනය කරමි. මහාමණ්ඩලයට පැමිණ අපමණ රූප දක්වති.

මෙසේ ගැමිදරුවන් විසින් කෙළගැසීම් ආදියෙන් ද මාලා ගන්ධාදි උපහාරයෙන් ද සුවඳක් උපදවද්දී උපේක්ෂාව නොඉක්මවන්නහුගේ උපේක්ෂා පාරමිතාව පරමාර්ථ පාරමී නම් විය. මේ මෙහි කෙටි අර්ථයයි. විස්තර චරියා පිටකයෙන් ගතයුතුය. දැන් තෙරුන් විසින් විචාරන ලද භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකාශය දක්වන සංගීතිකාරකයන් විසින්-

> **තසස පුටෙඨා ව්‍යාකාසි කරවීකමධුරංගිරෝ**
> **නිබබාපයනෙනෙතා හදයං හාසයනෙතා සදෙවකං**
> **අතීතබුදධානං ජිනානං දෙසිතං**
> **නිකීළිතං බුදධපරමපරාගතං**
> **පුබෙබනිවාසානුගතාය බොධියා**
> **පකාසයි ලොකහිතං සදෙවකෙනි කියන ලදි.**

එහි **තසස පුටෙඨා ව්‍යාකාසි** යනු; ඒ ධම්සෙනෙවි සැරියුත් තෙරුන් විසින් විචාරන ලදුව උත්වහන්සේට ප්‍රකාශ කළ සේක. තමන් වහන්සේගේ අභිනීහාරයෙහි පටන් අභිසම්බෝධිය තෙක් සියලු බුද්ධවංසය දෙසූහ යන අර්ථයි. **කරවීක** මධුරංගිණෙ යනු. කරවීක පක්ෂියාට බඳු මිහිරි හඬ යමක්හට ද හේ මධුරංගිර නමි. කරවීක මධුරස්වර ඇත්තේ යන අර්ථයි. එහි කරවීකයන්ගේ මධුරස්වරතාවයි. කරවීක පක්ෂියා මිහිරි රසැති අඹගෙඩිය මුවතුඩින් ගසා පලරස බී පියාපත් සලා කුජනය කරන කල්හි සිවුපාවෝ මදමත්ව මෙන් ලීලා කිරීමට පටන් ගනිති. ගොදුරෙහි නියැලි සිවුපා සමූහයා ද කටට ගත් තණ ද ඉවතලා ඒ හඬ අසති. කුඩා සතුන් ලුහුබඳිමින් සිටි ව්‍යාලමෘගයෝ එසවූ පය නොතබා චිත්‍රගතව මෙන් සිටිති. මල බැඳුණු මුවෝද මරණභය පසෙකලා සිටිති. අහස පියාඹන පක්ෂීහු පියා විදාගෙන සිටිති. දියෙහි මාළුවෝ ද කන්පටල නොසොල්වා ඒ නද අසමින් සිටිති. කරවීකයෝ මෙවන් මධුරස්වර ඇත්තෝය. **නිබබාපයනෙනෙතා හදයං** යනු; කෙලෙස් ගින්නෙන් තැවුණු සියලු ජන මනස් දහමිකතා අමා දහරින් සිහිලසට පමුණුවමින්. **හාසයනෙනෙතා** යනු; සතුටු කරවමින් **සදෙවකං** යනු; සදෙවක ලෝකය. **අතීතබුද්ධානං** යනු;

අප භාග්‍යවතුන් වහන්සේගේ අභිනීහාරයට පෙර **තණ්හංකර, මේධංකර, සරණංකර, දීපංකර** යන සිවුබුදු කෙනෙක් එකම කල්පයක උපන්හ. ඉන් මෑත භාගයෙහි **කොණ්ඩඤ්ඤ** ආදි බුදුවරුන්දැයි දීපංකරාදි සූවිසි බුදු කෙනෙක් මෙහි අතීත බුදුවරු වෙතැයි අභිප්‍රේතය. ඒ අතීත බුදුවරුන්ගේ **ජිනානං** යනු; එයටම පර්යායි. **දෙසිතං** යනු; කියන ලදි. සූවිසි බුදුවරුන්ගේ සිව්සස් මුසු ධර්ම කථාව. **නිකීළිකං** යනු; උන්වහන්සේලාගේ චරිත, කල්පජාති ගොත්‍ර ආයු බෝධි ශ්‍රාවක ශ්‍රාවිකා සනනිපාත, උපස්ථායක මවුපිය අග්‍ර භාර්යා පරිච්ඡේදාදිය නිකීළික නමි. **බුද්ධපරම්පරාගතං** යනු; දීපංකර දසබලයන් වහන්සේගේ පටන් කසුප් බුදුන් තෙක් පරම්පරාවෙන් ආ දෙසන ලද නිකීළක යන අර්ථයි. **පුබ්බනිවාසා නුගතාය බුද්ධියා** යනු; ජාති එකකුත් ජාති දෙකකුත් යි මෙසේ විභජනය කළ පෙර විසූ ස්කන්ධ සන්තාන සංඛ්‍යාත පෙරවිසීම් අනුගත උපත බුද්ධියෙන්. පුබ්බ නිවාසානුස්සති ඤාණයෙන් යන අර්ථයි. **පකාසයි** යනු; ප්‍රකාශ කළහ. **ලෝකහිතං** යනු; මුළු ලොවට හිත බුදධවංසය. **සදේවකෙ** යනු; සදේවක ලෝකයෙහි යන අර්ථයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කරුණාවෙන් සිහිල් වූ හදින් දෙවියන් සහිත ලෝකයාගේ කන්යොමු කරවමින් **පීතිමොජ්ජ ජනනං** ආදිය වදාළහ. එහි **පීතිපාමොජ්ජනනං** යනු; ප්‍රීතිප්‍රමොදතර ප්‍රීතියට පූර්වභාගයෙහි ප්‍රමෝදයයි. පස්වනක් ප්‍රීතිය උපදවන **සොකසෙල්ල විනොදනං** යනු; ශෝක නැමති හුල් නසන, දුරුකරන. **සබ්බසම්පතති පටිලාභං** යනු; සියලු දෙව්මිනිස් සම්පත් ආදිය මෙයින් ලබනේ නුයි සබබසම්පතති පටිලාභයි. ඒ සම්පත් ලබන බුදධවංස ධර්ම දේශනාව යන අර්ථයි. **චිතති කත්‍වා** යනු; සිතෙහි කොට බුදධානුසසතිය පෙරදැරි කොට යන අර්ථයි. **සුණොථ** යනු; අසව්. අවබෝධ කරව්. මෙ යනු; මාගේ **මදනීචවදනං** යනු; ජාතිමදාදි සියලු මද නිම්මද කරන. **සොකනුදං** යනු; ශෝකය නම් ඤාතිව්‍යසනාදියෙන් ස්පර්ශ කළහුගේ චිතත සන්තාපයයි. එහෙත් අර්ථ වශයෙන් දොම්නසමය. එසේවතුදු ඇතුළත පසුතැවිලි ලක්ෂණයෙන් සිතේ සන්තාපරසයි. අනුගොවන පර්යුපසථානයි. ඒ ශෝක දුරුකෙරේනුයි සොකනුදයි. **සංසාර පරිමොචනං** යනු; සසර බැම්මෙන් මිදීම කරන. **සංසාර සමතිතතමං** යනුද පාඨයි. ඒ සසර ඉක්මවන යන අර්ථයි.

සබබදුකබකබයං යනු; එහි මේ දුකබ ශබ්දය දුකබවේදනා දුකබවත්‍ථු දුකබාරම්මණ දුකබසචච දුකබ පචචුපටඨානාදියෙහ දක්නට ලැබේ. අයං හි

දුකඛපපභාණා යනාදියෙහි දුකඛවේදනාවෙහි දැක්වෙයි. ජාතිපි දුකඛා ජරාපි දුකඛා ආදියෙහි දුකඛ වස්තුවෙහිය. යසමා ච ඛො මහාලි රූපං දුකඛං දුකඛානුපතිතං දුකඛාචකඛනතං ආදියෙහි දුකඛාරමමණයෙහිය. දුකෙඛා පාපසස උචචයො ආදියෙහි දුකඛප්‍රත්‍යයෙහිය. යාවඤ්චිදං භිකඛවෙ න සුකරං අකඛාතෙන පාමුණිතුං යාව දුකඛා නිරයා ආදියෙහි දුකඛප්‍රත්‍යුප ස්ථානයෙහිය. මෙහි වනාහි දුඃඛ වස්තුවෙහිය. දුකඛ ප්‍රත්‍යයෙහි ද දතයුතුයි. එහෙයින් ජාති ආදි සියලු දුක් නැතිකරන යන අර්ථයි. **මගගං** යනු; කුසලාර්ථීන් විසින් සොයනු ලබයි. කෙලෙස් හෝ නසමින් යෙත් නුයි. මාර්ගය යනු බුදධවංස දේශනාවයයි කියනු ලැබේ. ඒ නිවනට මාර්ගය වූ බුදධවංස දේශනාව. **සකකචචං** යනු; මනාව සිත්හිලා යොමු කළ කන් දකීම යන අර්ථයි. **පටිපජජථ** යනු; පිළිපදිව්. අසව් යන අර්ථයි. නොහොත් ප්‍රීති ප්‍රමෝද උපදවන සෙන් හුල් දුරුකරන සියලු සම්පත් ලැබීමට හේතු භූත වූ මේ බුද්ධවංස දේශනාව අසා දන් මද නිවවදතාදි ගුණ විශේෂ ලබා දෙන සියලු දුක් නසාලන බුදුමඟ පිළිපදිව් යයි සියලු දෙව් මිනිසුන්ට බුද්ධත්වය සඳහා උත්සාහය උපදවයි. මෙහි සෙස්ස දක්වන ලද අර්ථ ඇත්තේමය.

මෙතෙකින් මධුරත්ථවිලාසිනී බුදධවංස අර්ථ කථාවෙහි
රචනවංකම කාණ්ඩ වර්ණනාව නිමියේය.

සර්ව ප්‍රකාරයෙන් අභ්‍යන්තර නිදාන අර්ථ වර්ණනය නිමියේය.

දැන්-

කපෙප ච සතසහසස චතුරෝ ච අසංඛියෙ
අමරං නාම නගරං දසසනෙයාං මනොරමංති.

ආදි නයින් පවත්නා බුද්ධවංස වර්ණනයට අවස්ථාව ආයේය. එම බුද්ධවංස වර්ණනය යම්හෙයකින් සූත්‍රනික්ෂේපය විචරකොට කීමෙන් පැහැදිලි වන්නේද එහෙයින් පළමුකොට සූත්‍රනික්ෂෙප විවරණය දතයුතුය. අතතජඣාස පරජඣාස පුචඡාවසික අථඨුපපතතිකයයි සූත්‍ර දේසනා සිවුවැදෑරුම් වෙයි. එහි යම් සූත්‍ර භාග්‍යවතුන් වහන්සේ අනුන් විසින් ආරාධනා නොකරන ලදුව හුදෙක් තමන්වහන්සේගේ අදහස අනුව දේශනා කළ සේක් ද, එනම් ආකංඛෙය්‍ය සුත්ත වත්ථ සූත්‍රාන්තාදිය මෙනි. එහි ආත්මාධ්‍යාශය බහාලූහ. යම් සූත්‍ර පරිපකකා බො රාහුලසස විමුතතිපරිපාචනීයාධමමා යනතූනාහං රාහුලං උතතරිං ආසවානං ඛයෙ විනෙයාාං මෙසේ අනුන්ගේ අදහස ඉවසීම සිත අවබෝධ කරන බව බලා පරාධ්‍යාශ වශයෙන් රාහුලෝවාද සුතත ධමමචකකපපවතතන සූත්‍රාදිය මෙන් දෙසූ සූත්‍රාන්තවල අනුන්ගේ අදහස බහාලූහ. බුදුන් කරා එළඹ ඒ ඒ දෙවිමිනිස්සු ප්‍රශ්න අසති. මෙසේ විමසීමෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේවතා සංයුත්ත බොජ්ඣංග සංයුත්තාදි වශයෙන් යමක් දේශනා කරන ලදද එහි පුචඡාවසික බව බහාලූහ. ධම්මදායාද පුත්තමංසූපමාදි උපන් කරුණක් නිසා යමක් දේශනා කරන ලදද එහි අර්ථොත්පත්තිය බහාලූහ. මෙසේ මේ සතර සූත්‍ර නික්ෂෙපයන්හි මේ බුද්ධවංස දේශනාව පුචඡාවසික නික්ෂෙපයෙහි ඇතුළත් වෙයි. පුච්ඡා වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය තබන ලදි. කවරක්නුගේ ප්‍රශ්න කිරීමක් වශයෙන් ද? ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේය. මේ නිදානයෙහි මෙය කියන ලදි-

සාරිපුතෙතා මහාපඤඤා සමාධිඣාන කොවිදො
පඤඤාය පාරමිපපතෙතා පුචඡනි ලොකනායකං
කිදිසො තෙ මහාවීර අභිනීහාරො නරුතතමාති

ආදියයි. එබැවින් මේ බුද්ධවංස දේසනාව පුචඡාවසික යයි දතයුතු. එහි කපෙප ච සතසහසෙස යනු; මෙහි මේ කපප ශබ්දය වනාහි අභිසද්දහන වොහාර කාල පඤඤතති ඡේදන විකපප ලෙස සමන්තභාව ආයුකපප මහාකපප ආදියෙහි පැනේ. ඔකපපනියමෙතං භොතො ගොතමස්ස යථා

තං අරහතො සම්මා සම්බුද්ධසස ආදියෙහි අභිසද්දහනයෙහි පෙනේ. අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණකපෙපහි ඵලං පරිභුඤ්ජිතුං මේ ආදියෙහි ව්‍යවහාරයෙහිය. යෙන සුදං නිච්චකපපං විරහංති ආදියෙහි කාලයෙහිය. ඉච්චායසමා කපෙපා යනු ද නිග්‍රොධ කපෙපා ඉති තසස නාමං තයා කතං භගවා බ්‍රාහමණසස යි මෙ ආදියෙහි ප්‍රඥප්තියෙහිය. අලංකත කපපිත කෙසමසසු ආදියෙහි ඡෙදනයෙහිය. කපපති දවංගුලකපෙපා ආදියෙහි විකල්පයෙහිය. අජ්ජ කපෙපා නිපජ්ජිතුං ආදියෙහි සවලපයෙහිය. කෙවල කපපං ජේතවනං ඔභාසෙත්වා ආදියෙහි භාත්පස බවෙහිය. තිටයතු භගවා කපපං තිටයතු සුගතො කපපං මෙහි ආයු කල්පයෙහිය. කීදිසො නු බො භනෙත කපෙපා මෙහි මහා කල්පයෙහිය. ආදි ශබ්දයෙන් සතතුකපෙපන වාත භොමයං සාවකෙන සදධිං මනතයමානා නජානිමහ මෙහි සමානතාවෙහිය. කපෙපා නථෙථා හොති කපපකතොකාසො ඡිණෙණහොති මෙහි විනයකල්පයෙහිය. මෙහි වනාහි මහාකල්පයෙහි දතයුතුය. එහෙයින් කපෙප ච සතසහසෙස යනු මහාකල්ප ලක්‍ෂයක යන අර්ථයි. **චතුරො ච අසංඛ්‍යෙ** යනු; සතර අසංඛ්‍යෙයකින් මත්තෙහි යයි වචනශේෂය දතයුතුයි. කල්ප ලක්‍ෂයක් අධික සාරාසංඛ්‍ය කල්පයකින් මත්තෙහි යන අර්ථයි. **අමරං නාම නගරං** යනු; අමරං කියා ද අමරවතී කියා ද ලබන ලද නම් ඇති නගරයක් විය. සමහරු අන් අයුරකින් ද විර්ණනා කරති. ඉන් කම් නැත. ඒ නගර නාමයයි. **දසසනෙයයං** යනු; මනාව බෙදූ විචිත්‍ර සිවුමං සන්ධි දොරටු සිවුරස් සන්ධි ප්‍රාකාරයෙන් වටකරන ලද ප්‍රාසාද මන්දිර භවනාදියෙන් සමලංකෘත හෙයින් දර්ශනීය. **මනොරමං** යනු; සම පිවිතුරු පරම රමණීය භූමිභාග හෙයින් ද ඡායා උදක සම්පන්න බැවින් ද සුලභ අහර පැන් ඇති හෙයින් ද සියලු උපකරණ පිරුණු හෙයින් ද සමෘද්ධියෙන් යුක්ත හෙයින් ද දෙවිමිනිසුන්ගේ සිත් අලවන බැවින් මනරම් **දසහි සදෙදහි අවිවිතතං** යනු; හස්ති ශබ්දයෙන්, අශ්ව ශබ්දයෙන්, රථ ශබ්දයෙන්, සක් ශබ්දයෙන්, බෙර ශබ්දයෙන්, වීණා ශබ්දයෙන්, ගීත ශබ්දයෙන්, කයිතාලම් ශබ්දයෙන්, තාල ශබ්දයෙන් කව බොව යන දස ශබ්දයෙන් නොතොර වූයේය. නිරන්තරව නැටුම් කෙළි සහිත විය යන අර්ථයි. **ආනාපාන සමායුතං** යනු; අහරින් ද සිවුවැදෑරුම් අහරින් ද පානයෙන් ද මනාව පිරණේ නුයි අනනපානසමායුතං යනුයි. මෙයින් සුභික්‍ෂතාව දක්වන ලදි. බොහෝ අහරපැන් සහිතය යන අර්ථයි. දැන් දස ශබ්දය වස්තු විසින් දැක්වීම පිණිස-

හත්ථිසද්දං අස්සසද්දං භෙරිසංඛරථානිච
ඛාදථ පිවථ වෙ ච අනනපානෙන සොසිතනති කියන ලදි.

එහි **හත්ථිසද්දං** යනු; ඇතුන්ගේ කෑඳ්චනාදයෙන් කරණාර්ථයෙහි උපයෝග වචනයයි දතයුතුය. සෙසු පදයන්හිද මේ ක්‍රමයයි. **භෙරිසංඛරථානිච** යනු; බෙර හඬින් ද සක් හඬින් ද රියහඬින් ද යන අර්ථයි. ලිංග විපර්යාසයෙන් කියන ලදි. **ඛාදථ පිවථා** යනු; මේ ආදි ක්‍රමයෙන් පැවති අහර පැන් පිළිබඳ ඝෝෂා කිරීම අභිනාද කිරීම යන අර්ථයි. මෙහි ඒ ශබ්දයන්ගේ එක දේශයක් පමණක් දක්වන ලදි. සියල් නොවේ යයි කියයි. එක දේශයක් නොවී. සියලු දශවිධ ශබ්දම කියන ලදි. කෙසේද? භෙරි ශබ්දයෙන් මුතිංග ශබ්දය සංගෘහිත වෙයි. සඛඛ ශබ්දයෙන් වීණා ගීත කයිතාලම් ශබ්ද සංගෘහිතය. දසයම දක්වන ලදි. මෙසේ එකම ක්‍රමයකින් නගර සම්පත් වර්ණනා කොට නැවත එයම දැක්වීමට-

නගරං සඛඛංගසමපනනං සඛඛකමම මුපාගතං
සතතරතන සමපනනං නානා ජනසමාකුලං
සමිදධං දෙවනගරංච අවාසාං පුඤඤකමමිනනති කියන ලදි.

එහි **සඛඛංගසමපනනං** යනු; ගෝපුර ශාලාදි සියලු නාගරාංගයෙන් යුත්, සියලු සම්පත් උපකරණයෙන් ධනධාන්‍ය තණ දර දිය ආදියෙන් පිරිපුන් යන අර්ථයි. **සඛඛකමමමුපාගතං** යනු; සියලු කර්මාන්තයෙන් යුත්, එක්රැස් වූ කර්මාන්ත ඇති යන අර්ථයි. **සතතරතනසමපනනං** යනු; පිරිපුන් මුතු ආදි සත්රුවන්, සක්විති නිවාසභූමි හෙයින් හස්ති ආදි සත්රුවනින් හෝ පිරිපුන් **නානාජනසමාකුලං** යනු; නානා දේස වේස භාෂා ඇති ජනයා ගැවසීගත්. **සමිදධං** යනු; මිනිස් පරිභොගාර්හ සියලු උපකරණයෙන් සමෘද්ධ පිරුණු. **දේවනගරංච** යනු; දෙව් පුරයක් මෙන් ආලකමන්දාව මෙන් අමරවතිය සමෘද්ධයයි කියන ලද්දේය. **අමොසං පුඤඤකමමානං** යනු; මෙහි පින් කැමැත්තෝ වසන්නුයි ආවාස නම්. ආවාසො යි කිවයුතු තැන ආවාසං යි ලිංගභේද කොට කියන ලදයි දතයුතු. මෙයින් පැනේනුයි පුඤඤ නම්. කුල රූප ඓශ්වර්යය ප්‍රඥා සම්පත් වශයෙන් ප්‍රකට වෙයි යන අර්ථයි. පිනා යේනුයි පුඤඤ නම්. සියලු අකුසල කිලිටි රජස් පා කරන හෙයින් පුඤඤ නම්. කර්මයයි. එය යමෙකුට ඇත්තේ ද ඔවුහු පුඤඤකමමී නො නම් වෙති. ඒ පුණ්‍යකාමීන්ට ආවාස වූ යන අර්ථයි. එහි සුමේධ නම් බ්‍රාහ්මණයෙක් වාසය කරයි. මවු

පසින් ද පියපසින් ද යන දෙපසින් සුජාතය. සුපිරිසිදුය. ජාතිවාදයෙන් අවිඳිතය. හත්වන කුලපරම්පරාව තෙක් නොහෙළන ලද්දේය. සුන්දර රූ ඇත්තේය. දැකුම්කළුයි. පහදිනසුළුය. පරම වර්ණ සෞන්දර්යයෙන් යුක්තය. නිඝණ්ඩු කෙටුභ සහිත අක්ෂරප්‍රභේද සහිත ඉතිහාසය පස්වෙනි කොට ඇති පදත් වියරණ දත් ලෝකායත මහාපුරිස ලක්ෂණයන්හි අනින්දිත හෙතෙම ත්‍රිවේද පාරගත විය. ඔහු දහර කල්හිම මවුපියෝ කළුරිය කළහ. ඉක්බිති ඔහුගේ භාණ්ඩාගාරික ඇමතියා අය පොත් ගෙනවුත් රන් රිදී මිණිමුතු ආදි නන් රුවනින් පිරි ගබඩා හැර කුමාරය, මෙපමණක් ඔබගේ මෑණියන් සතුය. මෙපමණක් පියාණන් සතුය. මෙපමණක් මුතුන් මිමුතුන් සතුයයි සත්වන කුලපරපුර තෙක් ධනය කියා මෙය පරිහරණය කරන්නැයි භාර කළේය. හෙතෙම මැනවැයි පිළිගෙන පින් කරමින් ගිහිගෙයි වාසය කළේය. එහෙයින් කියන ලදි.

නගරෙ අමරවතියා සුමෙධො නාම බ්‍රාහ්මණො
අනෙකකොටි සනනිචයො පහූත ධනධඤ්ඤවා

අජ්ඣායකො මනතධරො තිණණං වෙදානපාරගු
ලකඛණෙ ඉතිහාසෙ ච සධමෙම පාරමිංගතොති

එහි නගරෙ අමරවතියා යනු; අමරවතී නම් නුවර, **සුමෙධො නාම** යනු; මෙහි **මෙධා** යනු ප්‍රඥාව කියනු ලැබේ. ඒ ඔහුගේ ප්‍රඥාව සුන්දරය ප්‍රශස්තනුයි **සුමේධ** කියා ප්‍රකට විය. **බ්‍රාහ්මණො** යනු; බ්‍රහ්ම අණතියි බ්‍රාහ්මණයි. මන්ත්‍ර සජ්ඣායනය කරයි යන අර්ථයි. අක්ෂර චින්තකයෝ වනාහි බඹහුගේ පුත්‍ර බ්‍රාහ්මණයයි කියති. ආර්යයෝ වනාහි පවු බැහැර කළ බැවින් බ්‍රාහ්මණයයි කියති. **අනෙකකෝටි සනනිචයෙං** යනු; කෝටීන්ගේ රැස්කිරීම කෝටි සාකච්චයයි. අනෙක කෝටි රැස්කිරීම් ඇත්තේ යමෙකුට ද හේ අනෙකකෝටිසන්තිචය නම්. නොඑක් ධන කෝටි රාශි ඇති යන අර්ථයි. **පහූතධනධඤ්ඤවා** යනු; භූමිගත ගබඩාගත ධනධාන්‍ය වශයෙන් කියන ලදි. මෙය නිති පරිභෝගයට පත් ධනධාන්‍ය වශයෙන් කියන ලදියයි දතයුතු. **අජ්ඣායකො** යනු; ධ්‍යාන නොකරන්නේ අජ්ඣායක යි. ධ්‍යානභාවනා රහිත යන අර්ථයි. මෙය කියන ලදි. න ඉදානි මෙ ඣායාති න ඉදානි මෙ ඣායනතිති බො වාසෙටඨා අජ්ඣායකාතෙ දුතියං අකඛරං උපනිබබතතනතිතියි. මෙසේ ආදිකල්පික කාලයෙහි ධ්‍යාන විරහිත බමුණන්ට ගර්හාවචන උපන්නේය. දැන් එය

උගනී යයි අජ්ඣායකො මන්ත්‍ර ජපකරත්නුයි මේ අර්ථයෙන් ප්‍රශංසා වචනයෙන් ව්‍යවහාර කරති. මන්ත්‍ර දරත් නුයි මනතධරා. **තිණ්ණං වෙදානං** යනු; ඍග්වේද යජුර්වේද සාමවේදයි. මේ වේද ශබ්දය ඤාණ සෝමනස්ස ග්‍රන්ථයන්හි දක්වේ. එසේම මෙය යං බ්‍රාහ්මණං වෙදගුමදදසාමි අකිඤ්චනං කාම භවෙ අසතකං ආදී තැන ඤාණයෙහි දක්නා ලැබේ. මෙය වෙදජාතා විචරන්ති ලොකෙ ආදියෙහි සොමනසසයෙහි දක්නා ලැබේ. **තිණ්ණං** වෙදානං පාරගු සනිසණ්ඩුකෙටුභානං යන තන්හි ග්‍රන්ථයෙහිය. මෙහිද ග්‍රන්ථයෙහිය. **පාරගු** යනු; ත්‍රිවේදය තොලඟෑ පමණින් පරතෙර ගියේ පාරගු නමි. **ලකඛණෙ** යනු; ස්ත්‍රී ලක්ෂණ පුරුෂ ලක්ෂණ මහාපුරිස ලක්ෂණාදි ලක්ෂණ ශාස්ත්‍රයෙහි. **ඉතිහාසෙ** යනු; ඉතිඉහ ආස යන මෙබඳු වචන ප්‍රතිසංයුකත පුරාණ සංඛ්‍යාත ග්‍රන්ථ විශේෂයෙහි. **සඩමෙම** යනු; බමුණන්ගේ ස්වකීය ධර්මයෙහි ස්වකීය ආචාර්යවාදයෙහි හෝ වේ. **පාරමිං ගතො** යනු; පාරගත දිසාපාමොක් ඇදුරු විය යන අර්ථයි. ඉක්බිති දිනක් දසගුණාරාධිත පණ්ඩිත සුමේධ පණ්ඩිත මතුමහල් තලයෙහි විවේකීව පර්යංකයෙන් හිඳ මෙසේ සිතිය. පුනර්භවයෙහි පිළිසිඳ ගැනීම දුකෙකි. එසේම උපනුපන්තැන ශරීරය බිඳීයාම ද දුකෙකි. මම ද ජාතිස්වභාව ඇත්තෙමි. ජරා ස්වභාව ඇත්තෙමි. ව්‍යාධි ස්වභාව කොට ඇත්තෙමි. මරණ ස්වභාවකොට ඇත්තෙමි. මෙබඳු මා විසින් ජාතියක් නැති ජරාවක් නැති ව්‍යාධියක් නැති මරණයක් නැති සැප ඇති සිහිල් වූ නිවන සෙවීම වටනේය. භවසරණයෙන් අවශ්‍යයෙන් මිදී යන කිසියම් මාර්ගයක් විය යුතුය කියායි. එහෙයින් කියන ලදි-

රහොගතො නිසීදිත්වා එවං චිනෙතසහං තදා
දුකෙඛා පුනබභවො නාම සරීරසස ච භෙදනං

ජාතිධමෙමා ජරාධමෙමා ව්‍යාධිධමෙමා චහං තදා
අජරං අමරං ඛෙමං පරියෙසිසසාමි නිබබුතිං

යනනූනිමං පූතිකායං නානාකුණප පූරිතං
ජඩඩයිත්වාන ගචෙඡය්‍යං අනපෙකෙඛා අනත්ථිකො

අත්ථි හෙහීති සො මගෙගා න සො සකකා න හෙතුයෙ
පරියෙසිසසාමි තං මගගං භවතො පරිමුතතියාති

එහි ගාථා සම්බන්ධයක් නොකී පදවල අර්ථත් දක්වමින්ම යමි. **එහි රහොගතො** යනු; රහසිගතව. **එවං චිනෙතසහං** යනු; මම මෙසේ සිතීමියි සිතූ ආකාරය දක්වයි. **තදා** යනු; ඒ සුමේධ පණ්ඩිත කාලයෙහි. **එවං චිනෙතසහං** යි මෙයින් භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ සමග සුමේධ පණ්ඩිතයන් ඒකාත්ම කරන සේක. එහෙයින් එදා ඒ සුමේධ මම යයි ප්‍රකාශ කරමින් ඒවා චිනෙතසහං තදා යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ උත්තමපුරිස වශයෙන් වදාළහ. **ජාතිධම්මො** යනු; ජාතිය ස්වභාව කොට ඇත්තෙමි. සෙසු පදයන්හිද මේ ක්‍රමයයි. **නිබ්බුතිං** යනු; නිවනයි. **යනනූන** යනු; පරිවිතර්කනයෙහි නිපාතයි. යදිපන අහං ඉදින් වනාහි මම යන අර්ථයි. **නානාකුණප පූරිතං** යනු; මුත්‍ර මළ සැරව ලේ පිත සෙම කෙළ සොටු ආදි නොඑක් කුණප හරිත. **අනෙපෙකෙඛා** යනු; ආලය රහිතව. **අහූ** යනු; අවශ්‍යයෙන් ලැබෙයි. **භෙහිති** යනු; වෙයි. මෙය පරිවිතර්ක වචනයකි. **න සො සකකා න හෙතුයෙ** යනු; එකම මගකින් වනාහි නොවිය හැකිය. ඒ මග වනාහි- **හෙතුයෙ** යනු; හේතුරහිතව නොවේ. හේතුවෙන්ම යන අර්ථයි. **භවතො පරිමුතතියා** යනු; සසර බැම්මෙන් මිදීමට යන අර්ථයි. දැන් තමන් විසින් විතර්කනය කරන ලද අර්ථය සම්පාදනය කිරීම පිණිස යථාපි ආදිය කීහ. යම්සේ වනාහි ලොව දුකට විරුද්ධ වූ සැපයක් ඇත්තේ ද එසේම භවය ඇති කල ඊට විරුද්ධ විභවයක් ද විය යුතුය. යම්සේ උෂ්ණය ඇති කල්හි එය සන්සිඳුවන සීතලක් ද ඇත්තේය. එසේම රාගාදි ගිනි නිවන නිවනක් ද විය යුතුය. යම් සේ වනාහි පවිටු ලාමක ධර්මවලට විරුද්ධ යහපත් නිවරද දෑක්මක් ද ඇත්තේය. එසේම පවිටු පරතිය ඇතිකල්හි සියලු ජාති ක්‍ෂය කිරීමෙන් අජාති සංඛ්‍යාත නිවනක් ද පැවතිය යුතුමය. එහෙයින් කියන ලදි.

යථාපි දුකෙඛ විජඤඤෙත සුඛං නාමපි විජඤඤති
එවං භවෙ විජඤඤමානෙ විභවොපි ඉචඡිතබබකො
යථාපි උණෙහ විජඤඤමානත අපරං විජඤඤති සීතලං
එවං නිවිධගගි විජඤඤෙත නිබබානා ඉචඡිතබබකනති

එහි **යථා** යනු; උපමාර්ථයෙහි නිපාතයි. **සුඛං** යනු; කායික චෛතසික දුක් මනාව සාරාදමානුයි සුඛ නම්. **භවෙ** යනු; උපදවන **විභවො** යනු. නොඋපදවීම. උපත ඇති කල නොඉපදෙන ධර්මයක් ද කැමති විය යුතුය. **නිවිධගගි විජඤඤෙත** යනු; රාගාදි තෙවැදෑරුම් ගිනි ඇති කල්හි යන අර්ථයි. **නිබබානං** යනු; ඒ තෙවැදෑරුම් රාගාදි ගිනි නිවන සමනය

කරන නිවන ද කැමති විය යුතුය. **පාපකෙ** යනු; අකුසල ලාමක කල්‍යාණමපි යනු; කුසලය ද. **එවමපි** යනු; එසේම. **ජාති විජඨමාන** යනු; ජාතිය ඇති කල්හි යන අර්ථයි. ලිංග භේදයත් විභතති ලෝපයත් කොට කියන ලදි. අජාතාපි යනු; ජාතිය ක්‍ෂය කරන අජාති සංඛතික නිවන කැමති විය යුතුය. ඉක්බිති මම අනෙකක් ද සිතුවෙමි. යම් පරිදි අසූචි රාශියක ගිලුණු පුරුෂයෙක් දුරින්ම නෙළුම් මානෙල් පියුම් ගොමු ගැවසීගත් පිරිසිදු විලක් දැක කිනම් මගකින් මෙහි යායුතුදැයි ඒ විල සෙවිය යුතුය. එය නොසෙවීම විලෙහි දෝෂයක් නොවේ. පුරුෂයාගේම දෝෂයකි. එසේ කෙලෙස් කිළුටු සේදීමක් ඇති විටම අමාමහවිල නොසෙවීම ඒ අමාමහ නිවන් විලෙහි දොසක් නොවේ. ඒ පුරුෂයාගේම දෝසයි. එසේම කෙලෙස් මහසොරුන් විසින් ගන්නා ලද පුරුෂයෙක් පලායන මගක් නිබෙද්දීත් ඉදින් ඔහු පැන නොයයි ද එය මාර්ගයෙහි දොසක් නොවේ. ඒ පුරුෂයාගේම දෝසයයි. එමෙන් කෙලෙස් සොරුන් විසින් පිරිවරා ගත් පුරුෂයෙක් නිවන් මහනුවරට යන සුවපත් මහමඟ නොසෙවීම ඒ මාවතෙහි දොසක් නොවේ. ඒ පුරුෂයාගේම දොසයි. යම්සේ ලෙඩින් පෙළෙන මිනිසෙක් ලෙඩට පිළියම් කරන වෙදකු සිටියදී ඉදින් ඒ වෙදා සොයා ඒ රෝගයට පිළියම් නොකරයි නම් එය වෙදාගේ දොසක් නොවේ. ඒ මිනිසාගේම දොසයි. එසේ කෙලෙස් ලෙසින් පෙළෙන යම් මිනිසෙක් කෙලෙස් සංසිඳුවන මග පිළිබඳ දක්‍ෂයකු සිටියදී නොසොයයි නම් එය කෙලෙස් ලෙඩ සංසිඳුවන ඇදුරාගේ දොසෙක් නොවේ. ඔහුගේම දොසයි. එහෙයින් කියන ලදි-

යථා ගුථගතො පුරිසො තළාකං දිසවාන පුරිකං
න ගවෙසතිතංතළාකං නදොසො තළාකසස සො
එවං කිලෙස මලධොවං විජඨමාන අමතනත ලෙ
න හවෙසති තං කළාකං නදොසො අමතනතලෙ

යථා අගීහි පරිරුදෙධා විජතනෙක ගමනමප ථෙ
න ජලායකි සො පුරිසො න දොසො අඤජ්‍යසසසො

එවං කිලෙසපරිරුදෙධා විජඨමානෙ සිවෙ පථෙ
නග වෙසති තංමගගං න දොසො සිවමඤජසෙ

යථා හි බ්‍යාධිතො පුරිසො විජ්ජමානෙ තිකිච්ඡකෙ
න තිකිච්ඡාපෙති තං ව්‍යාධිං නසො දොසො තිකිච්ඡකෙ

එවං කිලෙසව්‍යාධීහි දුකඛතො පතිපීළිතො
නගවෙසති තං ආචරියං න සො දොසො විනායකෙ හි

එහි **ගූථගතො** යනු; ගූථකූපයකට පත් ගූථයෙන් තැවරුන හෝය. **කිලෙසෙම ලධොවං** යනු; කෙලෙස් මල දෙවීමෙහි. භූම්‍යර්ථයෙහි ප්‍රත්‍යාතම වචනයි. **අමතනතලෙ** යනු; අමෘත සංඛ්‍යාත තටාකය හෝ සාමි අර්ථයෙහි භූමම වචනයි දතයුතුය. අනුස්වාරය යොදා කියන ලදි. **පරිරුදෙධා** යනු; හාත්පසින් ආවරණය කළ. **අරීහි** යනු; සතුරන් විසින් **ගමනං පථෙ** යනු; ගමන් මගෙහි ඡන්දස නොනැසීම සඳහා අනුස්මාර ආගමය කොට කියන ලදි. **නපලායති** යනු; ඉදින් පැන නොයයිද **සො පුරිසො** යනු; සොරුන් පිරිවැරූ පුරුෂයා අඤ්ජසසසා මාර්ගයාගේ මගඟස වනාහි:

මගෙගා පඤ්ඨා පථො පජෙජා අඤ්ජසං වටු මායනං
නාවා උතතර සෙතුව කුලෙලාව හිසි සංකමොති

යි බොහෝ නම් වෙයි. එය මෙහි අඤ්ජස නමින් දක්වන ලදි. **සිවෙ** යනු; දියලු උවදුරු අභාවයෙන් සම වූ. **සිවමඤ්ජසෙ** යනු; උවදුරු රහිත මාර්ගයට යන අර්ථයි. **තිකිච්ඡකෙ** යනු; වෙදකු. **න තිකිච්ඡාපෙන** යනු; පිළියම් නොකරවයිද. **න සො දොසො තිකිච්ඡකෙ** යනු; වෙදාගේ දොසක් නැත. ලෙඩාගේම දෝසය යන අර්ථයි. **දුකඛිතො** යනු; හටගත් කායික චෛතසික දුක් ඇත්තේ **ආචරියං** යනු; මොක්ෂමාර්ග ආචාර්යවරයායි. **විනායකෙ** යනු; ආචාර්යවරයාගේ. මම මෙසේ සිතා මත්තෙහි මෙසේත් සිතුවෙමි. යම්සේ සැරසෙන කැමති මිනිසෙක් ගෙලබැඳි කුණපයක් හැරදමා සුවසේ යන්නේ ද එසේ මා විසිනුත් මේ කුණුශරීරය හැර දමා අනපෙක්ෂිතව නිවන් මහනුවරට පිවිසිය යුතුය. යම්සේ ගැහැණු මිනිස්සු මළලන භූමියෙහි මළමුත්‍ර කොට එය ඔඩොක්කුවෙහි හෝ දමාගෙන රෙදිකොණෙන් හෝ වෙළාගෙන නොයන්නාහු ද පිළිකුල් කරමින් බැලීමටවත් නොසිතා අනපේක්ෂිතව හැර දමා යන්නාහු ද එසේ මා විසිනුදු මේ කුණු ශරීරය අනපේක්ෂකවම හැරදමා අමා නිවන් පුරයට පිවිසිය යුතුය. යම්සේ නැවියෙක් දිරූ දිය කාන්දුවන නැව හැර දමා බලාපොරොත්තු නොතබා යෙද්ද එසේ මම ද

මේ වණමුඛ නවයකින් වැගිරෙන සිරුර හැර දමා බලාපොරොත්තු රහිතවම නිවන් පුරයට පිවිසෙමි. යම් සේ කිසි මිනිසෙක් මුතු මැණික් තරම් මිණි ආදි නන් වැදෑරුම් රුවන් ගෙන සොරුන් සමග මග යන්නේ තමාගේ රුවන් නැසෙන බියෙන් සුරක්ෂිත මාර්ගයක් ගන්නේ ද එමෙන් මේ කුණුකයද රුවන් පැහැර ගන්නා සොරෙකු බඳුය. ඉදින් මම මෙහි තණ්හා කරන්නෙම් නම් ආරිය මාර්ග කුශලධර්ම රත්නයෙන් මම නැතිව යයි. එබැවින් මා සිතින් මේ මහසොරකු බඳු කුණු සිරුර හැර දමා නිවන් මහනුවරට පිවිසීම වටනේයි. එහෙයින් කියන ලදි-

යථාපි කුණපං පුරිසෝ කණෙඨ බද්ධං පිරුවජ්ය
මොඤ්චයිත්වාන ගචෙඡය්‍ය සුඛී සෙවී සයං වසී

තථෙවිමං පූතිකායං නානා කුණප සඤ්චයං
ඡඩ්ඩයිත්වාන ගචෙඡය්‍යං අනපෙඛෝ අනත්ථිකෝ

යථා උච්චාරයානමහි කරීසං නරනාරියෝ
ඡංඩ්ඩයිත්වාන ගවඡනති අනපෙකඛා අනත්ථිකා

එවමෙවාහං ඉමං තායං නානා කුණප පුරිකං
ඡඩ්ඩයිත්වාන ගචෙඡය්‍යං වච්චං කත්වා යථා කුටිං

යථාපි ජජ්ජරං නාවං පලුගගං උදකගාහිණිං
සාමි ඡඩ්ඩෙත්වා ගවඡනති අනපෙකඛා අනත්ථිකා

එවමෙවාහං ඉමං කායං නවච්ඡිද්දං ධුවසඝවං
ඡඩ්ඩයිත්වාන ගචඡිසඝං ජිණ්ණ නාවංව සාමිකා

යථාපි පුරිසෝ චොරෙහි ගචඡනෙනා භණ්ඩමාදිය
භණ්ඩචෙඡදභයං දිසවා ඡඩ්ඩයිත්වාන ගවඡති

එවමෙවමයං කායෝ මහාචොරසමෝ විය
පහායිමං ගමිසඝාමි කුසලචෙඡදනා භයාති

එහි යථාපි කුණපං පුරිසෝ යනු; යම්සේ දහර තරුණයෙක් සැරසුනු කැමති මිනිසෙක් ගෙලෙහි එල්ලෙන සර්ප කුණකින් හෝ බලු කුණකින්

හෝ මිනී කුණකින් කලබල වී ලජ්ජා වී පිළිකුලට පත්ව ඒ කුණ ලිහාදමා යන්නේද. **සුබී** යනු; සුවපත්ව. **සෙරී** යනු; කැමති පරිදි වසන. **නානාකුණප සඤ්චයං** යනු; නානාවිධ කුණු රැස්වූ. **නානාකුණප පූරිතං** යනු ද පාඨයකි. **උච්චාරටඨානං** යනු; මෙහි උච්චාර කරති. වර්චස් කරතිනුයි උච්චාර නම්. උච්චාරය ද එම ස්ථානය දයි උච්චාරටඨානයි. නොහොත් උත්ස්‍රාව කෙරේනුයි උසසාසයි. මෙය වර්චසට නාමයකි. එහි තැන උසසාසටඨානයි. ඒ උච්චාර ස්ථානයෙහි, උකකාරටඨානයෙහි යන අර්ථයි. **වච්චං කත්වා යථා කුටිං** යනු; ගැහැණු මිනිස්සු වර්චස් කළ කුටිය මෙන් යන අර්ථයි. **ජජ්ජරං** යනු; දිය පිරෙන. **සාමී** යනු; නැව් හිමියා. **නවච්ඡිද්දං** යනු; ඇස කන ආදි වණමුඛෙහි යනු; සිදුරුවලින් යුත් නිසා නව සිදුරුයි. ධුවසසවං යනු; නිති වැගිරෙන නිරන්තර වැගිරෙන අසූචි යන අර්ථයි. **භාණඩමාදිය** යනු; යම්කිසි රුවන් ආදි බඩු ගෙන **භයං දිසවා** යනු; බඩු පැහැර ගැනීමෙන් බිය දක යන අර්ථයි. **අයං කායෝ** යනු; මෙම පිළිකුල් කටයුතු ජුගුප්සාජනක දේපල රාශියයි කාය නම්. **මහා චොර සමෝ විය** යනු; චක්ඛුරාදියෙන් රූපාදි ප්‍රිය රූපවල ඇලීමාදි වශයෙන් ප්‍රාණඝාත අදත්තාදානාදියෙහි යෙදී සියලු කුසල් පැහැරගනීනුයි මහසොරකු සමානය. එහෙයින් රුවන්බඩු ආදිය ගෙන සොරුන් සමග යන ඒ මිනිසා සොරුන් මඟහැර යයි. එමෙන් මමද මේ මහසොරකු වන් මේ කය හැර තමන්ගේ සුවපත් බව කරන මාර්ගය සෙවීමට යන්නෙමි යන අර්ථ සම්බන්ධය ගතයුතුය. **කුසලාචෙඡදනා භයා** යනු; කුසල් දහම් පැහැර ගැනීමේ බියෙන් යන අර්ථයි.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ නොඑක් උපමායෙන් නෛෂ්ක්‍රම්‍යයට කරුණු සිතන්නාහු නැවත ද සිතූහ. මේ මහාධන රාශිය කැටිකොට මාගේ පිය මීමුත්තු පරලොව යන්නාහු එක කහවනුවකුත් රැගෙන නොගියහ. මා විසින් රැගෙන යාමට කරුණු කළ යුතුයයි ගොස් රජුට දන්වූහ. මහරජ, මම ජාතිජරාදියෙන් පීඩිත හදින් ගිහිගෙන් නික්ම අනගාරික පැවිදි වෙමි. මාගේ කෙළ ලක්ෂ ගණන් ධනය ඇත. එය දේවයන් වහන්සේ පරිහරණය කළ මැනව කියායි. රජ මට ඔබගේ ධනයෙන් කම් නැත. ඔබම කැමැත්තක් කරන්නැයි කීය. ඔහු යහපත දේවයිනියි නුවර බෙර ලවා මහජනයාට දන් දී වස්තුකාම ක්ලේශකාමයන් හැර උතුම් දෙව්පුරය වන් අමර නුවරින් නික්ම තනිවම නන්මුවගණ යුත් හිමවත ධම්මක නම් පර්වතය ඇසුරෙහි ආශ්‍රමයක් කොට එහි පන්සලක් මවා පස්ඉසින් තොර සක්මනක් මවා අටගුණයෙන් යුත්

අභිඥාබල ලැබීමට නවදොසින් යුත් සළුව බැහැරකොට දොළොස් ගුණ ඇති වැහැරි සිවුරු හැඳ පැවිදි විය. මෙසේ පැවිදි වූ හෙතෙම අටදොසින් ගහණ පන්සල අතහැර දසගුණ යුත් රුක්මූලකට පැමිණ සියලු ධාන්‍ය විකෘති හැර පවතතළුල භොජ්ව හිඳිමි සිටීමි සක්මන් වශයෙන්ම ප්‍රධන් වඩන්නේ සතියක් තුළම අෂ්ට සමාපත්ති පංචාභිඥාලාභී වූයේය. එහෙයින් කියන ලදි-

එවාහං චිනතයත්වාන නෙකකොටිසතං ධනං
නාථානාථානං දත්වාන හිමවනතමුපාගමි.

හිමවනතසස අවිදූරෙ ධමමකො නාම පබබතො
අසසමො සුකතො මයහං පණණසාලා සුධාපිතා

චංකමං තත්ථ මාපෙසිං පඤ්චදොසවිවජජනං
අටඨගුණ සමුපෙතං අභිඤ්ඤාබල මාහරිං

සාටකං පජහිං තත්ථ නවදොස මුපාගතං
වාකචීරං නිවාසෙසිං දවාදසගුණ මුපාගතං

අටඨදොස සමාකිණණං පජ හිං පණණසාලකං
උපාගමං රුකඛමූලං ගුණේ දසහුපාගතං

වාපිකං රොපිකං ඣානඤං පජහිං නිරවසෙ සතො
අනෙක ගුණසමපනනං පවතතඵලමාදිනිං

තත්ථපපධානං පදහිං නිසජජට්ඨාන චංකමෙ
අබභනතරමහි සාසනෙ අභිඤ්ඤාබල පාපුණිනහි

එහි එවාහං යනු; මෙසේ මම යට කී පරිදි සිතා යන අර්ථයි. නාථානාථානං යනු; සනාථයන්ට හා අනාථයන්ට අත්‍යයන්ට හා දරිද්‍රයන්ට. පල ඇත්තෝ ගනිත්වායි කොටුගුළු සහිතව දී යනු අර්ථයි. හිමවනතසස අවිදූරෙ යනු; හිමවත් පව්ව නුදුරෙහි සමීපයෙහි. ධමමකො නාම පබබතො යනු; එනම් පව්ව කුමක් නිසා මේ පර්වතය ධමමක නම් වීද? බොහෝ සෙයින් බෝසත්වරු ඍෂි පැවිද්දෙන් පැවිදිව ඒ පර්වතය නිසා අභිඥා උපදවා මහණදම් පිරූහ. එසේ මහණදමට උපකාරක

බැවින් ධම්මක කියාම ප්‍රකට විය. **අසසමො සුකතො මයහං** යනු ආදියෙන් සුමේධ පණ්ඩිතයන් විසින් අසපු පන්සල් සක්මන් ආදිය සියතින් මවන ලද මෙන් කිවද සියතින් නොමවන ලදි. නමුත් ශක්‍රයාගේ පණිවුඩයෙන් විස්කම් දෙවිපුත් විසින් නිමවන ලදි. භාග්‍යවතුන් වහන්සේ එකල සිය පින් තෙදින් පහළ වූ බව සඳහා ශාරිපුත්‍රය, ඒ ධම්මක පර්වතයෙහි-

> අසසමො සුකතො මයහං පණ්ණසාලා සුමාපිතා
> චංකමං තත්‍ථ මාපෙසිං පඤ්ච දොසවිවජ්ජිතං

ආදිය වදාළහ. එහි **පණ්ණසාලා** යනු තණවහල ඇති ශාලාව. **තත්‍ථ** යනු ඒ අසපු පියසෙහි. **පඤ්ච දොස විවජ්ජිකං** යනු; පස් සක්මන් දොසින් තොර සක්මනෙහි පස් දොස කුමක් ද? තදවිසම බව, ඇතුළත ගස් ඇති බව, ගොමුවෙන් වැසුණු බව, බොහෝ සමබාධ සහිත බව, අතිවිශාල බව යන මේ පස්දොසින් තොර බවයි. උඩත් පිරිසෙයින් දිගින් සැටරියන් පළලින් රියන් එකහමාරක් වූ සක්මන කියන ලදි. නොහොත් පස්දොසින් දුරු යනු පඤ්ච නීවරණ දෝෂයෙන් තොර, **අභිඤ්ඤාබල මාහරිං** යනු; මෙසේ මේ අග පෑයෙන් සම්බන්ධය ගතයුතුය. **අට්ඨගුණසෙමු පෙතං** යනු; **එවං සමාහිතො චිතෙන පරිසුදෙධ පරියොදාතේ අනංගණේ විගතූ පකකලෙස මුදුභූතෙ කංකමනියෙ ඨිතෙ අනෙජජපතෙත** යි කී පරිදි අටගුණයෙන් යුත් අභිඥාබල ඉපදවීම් යන අර්ථයි. සමහරු වනාහි අටවැදෑරුම් ශ්‍රමණසුඛයෙන් යුත්යි කියති. ශ්‍රමණසුඛ අටනම් ධනධාන්‍ය පිළිගැනීම් රහිත බව, නිවැරදි පිඩු සෙවීම් බව, සිසිල් පිඩු බුදින බව, රට පෙළා ධන ධාන්‍ය ගැනීමෙන් රාජපුරිෂයන් මෙන් රට නොපෙළන බව, උපකරණ ආශා රහිත බව, සොර උවදුරින් නිර්භය බව, රාජරාජමහා මාත්‍යයන් සමග නොඇලෙන බව, සිවුදිග නිදහස් බව යන මෙකී ශ්‍රමණ සැප අටෙන් උපෙත සමුපෙත අසපුව මැවීමියි ආශ්‍රමය හා සම්බන්ධ කොට කියති. එය පෙළත් සමඟ සම නොවෙයි. සාටකං යනු; වස්ත්‍රයයි. **තත්‍ථ** යනු; ඒ අසපුවෙහි **නවදොස මුපාගතං** යනු; ශාරිපුත්‍රය, එහි වසන්නේ තමන්ගේ හන් පෙරෙවි මාහැඟි වස්ත්‍ර. **පජහිං** යනු අත්හළෙමි. වස්ත්‍රය හැරදමමින්ම එහි නවදොසක් දක අත්හළෙමි යි දක්වයි. තවුස් පැවිදි වූවන්ට වස්ත්‍රයෙහි දොස් නවයක් දක්වන ලදි. නවය කුමක්ද? සළුවෙහි මාහැඟි බව, අනුන් හා බැඳුණු බව, පරිහරණයේදී කිලිටිවන බව, කිලිටි වූ කළ සේදිය යුතු බව, නැවත පාට ගැන්විය යුතු බව, පරිභෝගයෙන් දිරන බව, දිරූ කල මැසීම් අණ්ඩ දැමීම් කළයුතු ය. නැවත සෙවිය යුතු වීමෙන් දුෂ්කර බව තවුස් පැවිද්දට නොගැළපෙන බව, සතුරන්ට සාධාරණ

බව, සතුරන්ට නොගත හැකි පරිදි සුරක්ෂිත කළයුතු බව. පරිහරණයෙන් අලංකාර වන බව, ගෙන හැසිරෙන්නහුගේ මහිච්ඡතා බව යන මේ නව දොසින් යුත් සාටකය හැර දැමීමී. ඉවත් කළෙමි. වස්ත්‍රය බැහැර කරමින් එහි දොස් දක වැහැරී සිවුරු හැඳගතිමි'යි දක්වයි. **චාකචීරං** යනු; මුදුතණ තීරු තීරු කොටගෙන කරන ලද කෙඳිමුවා සිවුරු හැඳීම් පෙරවීම් පිණිස ගතිමි යන අර්ථයි. **ද්වාදස ගුණමුපංගතං** යනු; දොළොස් ආනිසංසයකින් යුතු. මෙහි ගුණ ශබ්දය ආනිසංස අර්ථ ඇත්තේය. සතගුණ ආනිසංසා පාටිකංඛා ආදියෙහි මෙනි. මකාරය පදසන්ධිකාරකයි. වැහැර සිවුරෙහි දොළොස් අනුසස් නම් - මඳ අගය ඇති බව. අනුන් අයත් නොවන බව, සියතින් කළහැකි බව, පරිහරණයෙන් දිරුවද නොමැසිය යුතු බව, සොර බිය නැති බව, පහසුවෙන් සොයාගත හැකි බව, තවුස් බවට සරුප් බව, හැඳීමෙන් සැරසීමක් නොවන බව, චීවර ප්‍රත්‍යයෙහි අල්පේච්ඡ බව, පරිභෝගයෙහි සුවදායක බව, වැහැරි හටගැනීම, සුලභ බව, වැහැරි සිවුර විනාශ වුවත් අනපෙක්ෂ බව යන මේ දොළොස් ගුණයෙන් යුත්.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ ඒ පන්සලෙහි වසන්නාහු පාන්දර නැගිට තම නික්මීමට කරුණු සිතන්නාහු මෙසේ සිතූහ. මම වනාහි නවරත් නූපුරාදිය ගැටෙන හඬමුසු මිහිරි සිනා කියුම් හා ජනරමණීය මහසම්පතින් ශෝභමාන දෙව්විමනක් වැනි ගෙය කෙළපිඩක් මෙන් හැර දමා විවේකකාමීව සියලු ජනයාගේ පවු පාකොට හරින තපෝ වනයට පිවිසියෙමි. මෙහි පන්සලෙහි විසීම වනාහි දෙවැනි ගෘහවාසයක් වැනිය. දැන් මම රුක්මුලෙක වාසය කරමි කියායි. එබැවින් කියන ලදි- **අටයදොස සමාකිණ්ණං පජහිං පණ්ණසාලකං** යි. එහි **අටඨ දොස සමාකිණ්ණං** යනු; අටදොසකින් යුත්. කවර අටකින් ද? මහාරාශියකින් නිපදවිය යුතු බව, තණ පරණ මැටි ආදියෙන් නිතර පිළියම් කළයුතු බව, සෙනසුන නම් මහල්ලාට පැමිණෙයයි අවේලාවෙහි නැගිටුවීමෙන් සිතේ එකඟ බව කැඩෙන බැවින් උටයාපනීය බව ඇත්තේය. ශීත, උෂ්ණ වැළකීමෙන් කය සියුමැලි බවට පැමිණවීම ඇති බව, ගෙට වැදුණහුට කවර හෝ පවක් කළහැකි බැවින් ගර්හා සැගවිය හැකි බව, මෙය මාගේය කියා පරිග්‍රහ ඇති බව, ගෙයක් ඇති බව, දෙවැන්නකු සමග වාසය ඇති උකුණු මකුණු සුනුණු ආදීන්ට සාධාරණ බැවින් බහුසාධාරණතා බව යන මේ ආදීනව අට දක මහසත්හු පන්සල අත්හළහ. **ගුණෙදසහුපාගතං** යනු; ආවරණය ප්‍රතික්ෂේප කොට දසගුණයක් රුක්මුලට පැමිණියෙමි යන අර්ථයි.

කවර දසගුණයකින් ද? මෙහි ළඟට යාම පමණක් ඇති බැවින් මඳ ආරම්භ පමණක් වන බව, නිරවද්‍යතා බහුල බව, නිතර ගහකොළ විකාර දැක්මෙන් අනිත්‍ය සංඥාව ඉපදවිය හැකි බව, සෙනසුන් මසුරුකම නැති බව, පව් කිරීමෙහි ලජ්ජා සහිත බව නිසා පව් කිරීමෙහි රහස්‍යතාවක් නොමැති බව, පරිග්‍රහය නොමැති බව, දෙවියන් සමග එක්ව විසීම, ආවරණ ප්‍රතික්ෂේපය. පරිහරණ සුවය, රුක්මුල් සෙනසුන් ගිය ගිය තැන සුලභ හෙයින් අනපෙක්ෂික බව යන මේ දසගුණය දැක රුක්මුලට ඵළඹියෙමියි කියයි. කීයේද වෙයි.

බුද්ධ ශ්‍රේෂ්ඨයන් විසින් වර්ණනා කරන ලදි. නිශ්‍රය බවද වදාරන ලදි. විවේකකාමීන්ට රුක්මුල් හා සම නිවාසයක් නැත. මහාව්‍රත ඇතිව ගසමුල්හි විවේකව වසන්නා ආවාස මසුරුකම් දුරලයි. දෙවියන් විසින් ආරක්ෂා කරනු ලබයි. රතු නිල් කහ තරුණ මහලු කොළ දක්නාහුගේ නිත්‍යසංඥා දුරු කෙරේ. එබැවින් නුවණැත්තේ භාවනාවෙහි ඇලුණාහුට නිවාස වූ බුද්ධදායාද වූ විවේක සෙනසුන් වූ රුක්මුල් නොඉක්මවන්නෝය.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ පන්සලෙහි දොස් දැක වෘක්ෂමූලානිසංස දකිමින් වසන්නාහු තවදුරටත් සිතූහ. අහර පිණිස යන එන මට අහර සෙවීම දුකකි. මම කිසි පිරික්ෂීමකින් පැමිණ අහර පිණිස මහණ නුවූයෙමි. අහර සෙවීමේ දුක අපමණය. මම පවතනඵලයෙන් යැපෙන්නෙමි නම් යෙහෙකි කියායි. මේ විශේෂාර්ථය දක්වමින්-

වාපිකං රොපිතං ධඤ්ඤං පජහිං නිරවසෙසකෝ
අනෙක ගුණසම්පනනං පවතත ඵලමාදියිනති

ආදිය කීය. එහි වාපිතං යනු; වපුරා නිපත් **රොපිතං** යනු; රෝපණය කොට නිපත්, සශ්‍ය නිෂ්පත්තිය වැපිරීම් සිටුවීම් වශයෙන් දෙයාකාරය. ඒ දෙයාකාරයම තම අලෙපචඡතාවෙන් අතහැර පවතතඵලයෙන් යැපීමි. **පවතත ඵලං** යනු; තෙමේම වැටුණු ගෙඩියයි. **ආදියිං** යනු; අනුභව කළෙමි.

වැටුණු ගෙඩියෙන් සතුටුවන අනුන් සතු ජීවිකාර හිත අහර ලොල්බව ප්‍රහීණ කළ මුනිවරයා සිවුදිගට අයත් වෙයි. රසතණ්හාව ද හැර දමයි. ඔහුගේ ආජීවය පිරිසිදුය. එබැවින් පවතතඵල භෝජනය නොඉක්මවන්නේය.

මෙසේ වසන සුමේධ පණ්ඩිතයෝ නොබෝ කලකින්ම සතියක් තුළ පංචාභිඥා අෂ්ට සමාපත්ති ලැබූහ. මේ කරුණ පවසමින් **තත්‍රපධානං** පදහිං ආදිය කියන ලදි. එහි **තත්‍ර** යනු; ඒ අසපුවෙහි **පධානං** යනු; වීර්යාරම්භ කළෙමි. **නිසජ්ජට්ඨාන චංකමෙ** යනු; හිඳීමෙන් ද සිටීමෙන්ද සක්මනින් ද

සුමේධ පණ්ඩිතයෝ වනාහි සයනය ප්‍රතික්ෂේප කොට හිඳීම් සිටීම් සක්මන් කිරීමෙන්ම රෑදාවල් ගෙවා සතියක් තුළම අභිඥා බලයට පත්වූහ. මෙසේ අභිඥාබල පත්ව සුමේධ තවුසන් සමවත් සුවයෙන් පසුවෙද්දී සර්වජන සංග්‍රහකර මාරබල භයංකර ඥානප්‍රදීපකාර දීපංකර ශාස්තෘන් වහන්සේ ලොව පහළවූහ. කෙටියෙන් උන්වහන්සේගේ මේ පිළිවෙල කථාවයි. මේ දීපංකර මහසත්හු සමතිස් පෙරුම්පුරා වෙසතුරු අත්බැව් සම අත්බැවිහි සිට පොළෝ කම්පා කිරීමාදි මහඳන් දී ආයු කෙළවර තුසිපුර ඉපිද ආයු තෙක් එහි වැස දසදහසක් සක්වළ දෙවියන් රැස්ව 'මහාවීරයාණනි, මේ ඔබට කාලයයි. මවුකුස උපදිනු මැනව. දෙවියන් සහිත මිනිසුන් සසර සයුරින් එතෙර කරමින් අමාපදය අවබෝධ කරනු මැනවැ'යි කී කල උන්වහන්සේ දෙවියන්ගේ බස් අසා පස්මහ බැලුම් බලා එයින් චුතව රම්මවතී නුවර සියලු යස සම්පතින් දිනූ වාසුදේව නරදේව සුදේව නම් රජකුලෙහි සුමේධා දේවිය කුස ඇසළ පුරපසළොස්වක උතුරු සල නකතින් පිළිසිඳගෙන මහ පෙරහරින් උපහාර ලබමින් මහදේවියගේ කුස මිණිකුළක මෙන් කිසි අසූචියෙකින් නොතැවරී දසමසක් වැස මේකුළු විවරගත සරාසඳ මෙන් ඇගේ කුසින් බිහිවූහ.

ඒ දීපංකර කුමරාගේ පිළිසිඳ ගැනීමේ මොහොතෙහි උපන් කෙණෙහි දෙතිස් පෙරනිමිති පෙළහර පහළ විය. සියලු බුදු බෝසත්වරුන් මවුකුස පිළිසිඳීමෙහි නික්මීමෙහි බුදුවීමෙහි දම්සක් පැවැත්වීමෙහි යන මේ සතර තන්හි දෙතිස් පෙළහර පවත්නේමය. එහෙයින් ප්‍රකට නිසා මා විසින් දීපංකර කුමාරොත්පත්තියෙහි දක්වන ලදි-

සොඳුරු ශාන්ති ශිවංකර දිවකුරු කුමරු උපන්කල හාත්පස දසදහසක් සක්වළ කම්පිත ප්‍රකම්පිත විය. දසදහසක් සක්වළ දෙවියෝ එදා එක් සක්වළෙක එක්රැස් වූහ. බෝසත් මහසතුන් උපන් කෙණෙහි පළමුව දෙවියෝ පිළිගත්හ. පසුව මිනිස්සු පිළිගත්හ. කිසිවකු විසිනුත් නොවැයූ සම්බැඳි බෙර දවුල් වීණා නොගැටූ අබරණ එකෙණෙහි හාත්පස

මිහිරි රැලි නැංවිය. හැම තැන බැම් සිඳී ගියේය. සියලු රෝග ඉබේම පහවිය. ජාති අන්ධයෝ රූප දුටහ. බිහිරෝ හාත්පස ශබ්ද ඇසූහ. ජාති මූඩයෝ සිහි ලැබූහ. පිල්ලු පයන් ගමන්කළහ. විදෙස්ගත නැව් සිය තොටවලට වහා පැමිණියේය. අහස්ගත පොළෝගත සියලු රුවන් හාත්පසින් ඉබේම බැබළුණේය. ගෝර නිරාගිනි නිවියේය. නදී දියද නිසල විය. දුකින් නිතොර ලෝකාන්තරිකයෙහිද මහත් විපුල ආලෝකය විය. එදා ශාන්ත රළපෙළ ඇති සාගර ජලය මිහිරි විය. රළුපරළු සුළං නොගැටීය. සියලු ගස් පිපුණු මල් ඇතිවිය. තරු සහිත සඳ අධිකව බැබළිණ. ඉර අධික උණුසුම් නැත්තේ විය. පක්ෂීහු ගසින් අහසින් බැස තුටුපහටුව තුරුයට පොළවෙහි සිටියහ. සතර දිවයින්ගත මහවැසි මිහිරි දිය වැස්සවීය. පහන්සිත් ඇති දෙව්වරු සිය දිව විමන්හි නැටූහ. ගැයූහ. වැයූහ. කොඩිදුමූහ. ඔවුනු ක්‍රීඩා කළහ. එකෙණෙහි දොර මහකවුළු තෙමේම විවරවිය. මහජනයා සා පවස් රහිත වූහ. ලෝකය කිසිසේත් කිසි දුකකට නොපත් විය. නිත්‍ය වෛරී සත්වයෝ පරම මෛත්‍රී සිත ලැබූහ. කවුඩු බකමුහුණෝ එක්ව හැසුරුණහ. බල්ලෝ ඌරන් සමග සෙල්ලම් කළහ. විසඝෝර සත්නු මුගටින් සමග කැමති පරිදි ක්‍රීඩා කළහ. ගෙවලමීයෝ විස්වස් සිතින් බළලුන්ගේ හිසෙහි උකුණන් ගත්හ. බුද්ධාන්තරයකුත් දියත්තක් නොලත් ප්‍රේත ලෝකයෙහි පිපාසා පහවිය. කුදුහු ඍජු ශරීර ඇත්තෝ වූහ. ගොළුවෝ මිහිරිවදන් තෙපලූහ. පහන් සිත් ලත් සත්වයෝ උනුන් ප්‍රියවදන් බිණූහ. සතුටු සිතින් අශ්වයෝ හේෂාරව කළහ. මත්වර ඇතුන් කැක්‍රෙවනාද කළහ. හාත්පස දසදහසක් සක්වළ සුවඳ සඳුන් සුණින් ආකුල විය. කුසුම කුංකුමදුමින් සුවඳවත් විය. විවිධ ධජ පෙළින් ගැවසී ගත්තේය.

එහි දසසහස්‍රී ලෝකධාතුව කම්පාවීම සර්වඥතාඥාන ප්‍රතිලාභයට පෙර නිමිත්තය. දෙවියන්ගේ එක්සත්ව ලෙස ඒකරාශිවීම දම්සක් පවත්වන කල එකපැහැර රැස්ව දහම් පිළිගැනීමට පෙරනිමිත්තකි. පළමුව දෙවියන්ගේ පිළිගැනීම සතර රූපාවචරධ්‍යාන පිළිලැබීමට පෙරනිමිත්තයි. පසුව මිනිසුන්ගේ පිළිගැනීම සතර අරූපාවචරධ්‍යාන ලාභයට පෙරනිමිත්තයි. සම්බැඳි බෙර තෙමේ වාදනයවීම දහම්බෙර ඇස්වීමට පෙරනිමිත්තයි. වීණාභරණාදිය වාදනයවීම අනුපූර්ව විහාරයට පෙරනිමිත්තයි. බන්ධන ඉබේ සිඳියාම අසම්මාන ඡේදයට පෙරනිමිත්තයි. මහජනයාගේ රෝග පහවීම සිවුසස් ලාභයට පෙරනිමිත්තයි. ජාත්‍යන්ධයන් රූප දැකීම දිවැස්

ලැබීමට, බිහිරන් ශබ්ද ඇසීම දිවකන ලැබීමට ජාතිමූඩයන් අනුසසති ඉපිදවීම සතිපට්ඨාන ප්‍රතිලාභයට පිළුන්ගේ පාගමන් චතුරිද්ධිපාද ලාභයට විදෙස්ගත නැව් සුපුටුන් වෙත පැමිණීම සිවුපිළිසිඹියා අධිගමයට රුවන් තෙමේම බැබළීම දහම් බැබළීමට නිරාගිනි නිවීම එකොළොස් කෙලෙස්ගිනි නිවීමට ගංගා ජලගලා නොයාම සිවුවෙසරද ලැබීමට ලෝකාන්තරාවලෝකය අවිදු අඳුර නසා ඥානාලෝකදර්ශනයට සයුරුදිය මිහිර නිවන් රසයෙන් එකරසවීමට සුළං නොහැමීම දෙසැට දිට්ඨගති භේදනයට තුරු සුපිපි බව විමුත්ති කුසුමින් සුපිපි බවට සදෙහි වඩා බැබළීම බහුජන කැමැත්තට ඉර අධික උණුසුම් නොවීම හා නිර්මල බව කායික මානසික සුවයට පක්ෂීන්ගේ පොළෝගමන ඔවා අසා මහජනයාගේ දිව්හිම් සරණාගමනයට සතරමහ දවයින් වැස්ස මහා ධර්ම වර්ෂාවට දෙවියන් සිය භවනවලම ක්‍රීඩා කිරීම බුදුව උදන් අනන බවට දොරකවුළු විවරවීම අටඟිමඟ දොර විවරවීමට සා පීඩා නැතිවීම කායගතාසතියෙන් නිවන් ලැබීමට පිපාස පීඩා නොවීම විමුක්ති සුවයෙන් සුවපත් වීමට වෛරීන්ගේ මෛත්‍රී ලාභය සිවුබඹවිහරණ ලැබීමට දසසහස්‍රී ලෝකධාතුව ධජමාලායෙන් යුතුවීම අරියධජමාලා ඇති බවට පෙරනිමිතිය. සෙසු විශේෂතා සෙසු බුදුගුණ ලැබීමට පෙරනිමිති බව දතයුතුය.

ඉක්බිති දිවකුරු කුමරා මහ සැපතින් සංග්‍රහ ලබමින් ක්‍රමයෙන් සොඳුරු යෞවනයට පැමිණ තුන් ඍතුවට හොබනා තුන්පහයක දෙව්ලෝ සිරිවන් රජසිරි වළඳමින් උයන්කෙළි සඳහා යන අවස්ථාවෙහි ක්‍රමයෙන් ජීර්ණ ව්‍යාධි මතක සංඛ්‍යාත තුන්දේවදූතයන් දැක හටගත් සංවේග ඇත්තේ ආපසු පැමිණ සුදසුන් නුවර එක් සම්පතින් බබළන රම්මවතී නුවරට පිවිසියේය. නැවත සිව්වන වර ඇත්රුවාකැඳවා මෙසේ කීය. දරුව, මම උයන බැලීමට යන්නෙමි. ඇත්යානා සරසව කියායි. ඔහු මැනව දේවයිනියි පිළිතුරු දී ඇතුන් සුවාසූ දහසක් සරසවනේය. ඉක්බිති විස්කම් දෙව්පුත් නන්පැහැ වතින් හැඳින් බෝසතුන් මුතු එබූ කෙයුරාභරණ පළඳවා සුසැදි කනකකටක මකුට කණ්ඩලබර කොට සුවඳ කුසුමින් මාලායෙන් කොණ්ඩය සරසාලීය. දිවකුරු කුමර දෙව්කුමරකු මෙන් සුවාසූදහසක් ඇතුන් පිරිවැරූ උතුම් මඟුලතු අරා මහබලයෙන් පිරිවරා යතිජන සනසන උයනට පිවිස ඇතුපිටින් බැස උයන සැරිසරා පරම සොඳුරු දැකුම් ඇති සියනද සේ සිහිල් සිලාතලයෙහි හිඳ පැවිද්දට සිත ඉපිදවීය. එකෙණෙහිම සඳවැසි ක්ෂීණාස්‍රව මහබඹහු අෂ්ට පරිෂ්කාර ගෙන

මහසතුන් ඇස් හමුයෙහි පහල විය. මහාපුරිස්හු ඔහු දැක මේ කිමැයි විමසා ශ්‍රමණ පරිෂ්කාරයයි අසා අබරණ බඩු මුදා පළඳනා භාණ්ඩාගාරිකයා හට දී මඟුල්කඩුව ගෙන මකුටය සහිත කෙස් සිඳ අනතරිෂ ආකාශයට දැමූහ. එවිට සක්දෙවිරජ රන්සුමුඟින් ඒ කේශමකුටය පිළිගෙන සිනෙරු මුදුනෙහි තුන්යොදුන් පමණැති ඉඳුනිල්මිණිමුව මකුට චෛත්‍ය කළේය.

එවිට මහපුරිස්හු දෙවියන් දුන් අරහත්ධජ කසාවත් දරා සළුසඟළ අහසට දැමූහ. එය බඹහු පිළිගෙන බඹලොව දොළොස් යොදුන් සර්වරත්නමය චෛත්‍යයක් කළේය. පැවිදි වූ දිවකුරු කුමරුන් අනුව පුරිසකෝටියක් පැවිදි වූහ. ඔවුන් පිරිවැරූ මහසත්හු දසමස් ප්‍රධන්වීර්යය කළහ. අනතුරුව වෙසක් පුන්පොහෝ දින එක්තරා නුවරකට පිඬු පිණිස ගියහ. එදා ඒ නුවර දෙවියන්ට බලි පිණිස පැන් නුමුසු කිරිබත් පිසූහ. මිනිස්සු පිරිස් සහිත පිඬු පිණිස පිවිසි බෝසතුන්ට ඒ කිරිබත් පිදූහ. එය කෝටිසංඛ්‍යාත සියලු භික්ෂූන්ට ප්‍රමාණවත් විය. මහසතුන්ගේ පාත්‍රයෙහි දෙවියෝ දිවඔජා බහාලූහ. එය වළඳා එම සල්උයන්හිම දාවල් දවස ගෙවා සවස විවේකයෙන් නැගී පිරිස පිටත්කොට සුනෘඳ නම් ආජීවක දුන් අටතණමිට ගෙන පළොල්රුක් බෝධිය වෙත ගොස් තණ ඇතිරි අතුරා අනූරියන් බෝකඳ පිටුපස කොට පර්යංකයෙන් හිඳ චතුරංග වීර්යය ඉටා බෝමුල වැඩහුන්හ.

ඉක්බිති මාරබල බිඳ රාත්‍රී පෙරයම පෙරවිසීම් සිහිකොට මැදියම දිවැස පිරිසිදු කොට අලුයම අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ප්‍රත්‍යයාකාරය මෙනෙහිකොට ආනාපාන චතුත්ථධ්‍යානයට සමවැද එයින් නැගී පංචස්කන්ධයෙහි බැස උදය ව්‍යය වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් ලකුණු දැක ගෝත්‍රභුඤ්ඤාණය තෙක් විදර්ශනා වඩා අරුණෝදයෙහි ආර්ය මාර්ගයෙන් සියලු බුදුගුණ ප්‍රතිවේධ කොට බුද්ධ සිංහනාද කොට සත් සතියක් බෝධි සමීපයෙහිම කල්ගෙවා බඹහුගේ ධර්මදේශනා ප්‍රතිඥායෙන් සුනෘඳාරාමයෙහි දම්සක් පවත්වා කෙළ සියයක් දෙවිමිනිසුන්ට ධර්මාමෘතය පොවා චාතුර්ද්වීපික මහා මේඝයක් සේ දහම්වැසි වස්වමින් මහජනයාගේ සසරබැමි සිඳමින් ජනපද චාරිකාවෙහි යෙදුණහ. එකල සුමේධ පණ්ඩිත සමවත් සුවයෙන් කල් ගෙවන්නාහු පොළොව කම්පාව නොදුටහ. ඒ නිමිති ද නොදුටුවාහුය. එයින් කියන ලදි-

එවමෙම සිදධිපපතතසස වසීභූතසස සාසනෙ
දීපංකරො නාම ජිනො උපපජජී ලොකනායකො
උපපජජනෙත ච ජායනෙක බුජඣනෙතධමමදෙසනෙ
චතුරො නිමිතෙත නාදදසං ඣානරතිසමපපිතොති

එහි එවං යනු; දැන් කිවයුත්ත දක්වයි. මෙ යනු; මගේ **සිදධිපපතත-සෙස** යනු; පංචාභිඥා සිද්ධිප්‍රාප්ත වූවහුගේ **වසීභූතස්ස** යනු; වසීභූත වූවහුගේ චිත්තවසීභාවයට පත්වූවහුගේ යන අර්ථයි. **සාසනෙ** යනු; වෙනස් මනස් ඇති තවුසන්ගේ සසුනෙහි අනාදර ලක්‍ෂණයෙහි හෙබි වචනයි. දතයුතුය. **ජිනො** යනු; කෙලෙස් සතුරන් දිනුයෙන් ජින නම් **උපපජජනෙත** නම්; පිළිසිඳ ගැනීමෙහි **ජායනෙත** යනු; මව්කුසින් නික්මීමෙහි. **බුජඣනෙත** යනු; අනුනතර සම්මාසම්බොධිය අවබෝධ කිරීමෙහි. **චතුරො නිමිතෙත** යනු; සතර නිමිති. දිවකුරු දසබලයන්ගේ පිළිසිඳීම, උපත, බුදුවීම, දම්සක් දෙසීම යන සතර තැන දසසහස්‍රී ලෝකධාතු කම්පනාදි නිමිති යන අර්ථයි. මෙහි කීය- එහි බොහෝ වූ නිමිති කුමක් නිසා චතුරො නිමිතෙත සතර නිමිති යයි කියන ලදද? අයුක්ති නොවන්නෝද? අයුක්ති නොවේ. මේ බොහෝ වූ නිමිති ස්ථාන හතරක සිදුවූ බැවින් සතර නිමිති යයි කියන ලදි. **නාදදසං** යනු; නොදුටිමි. දැන් ඒ සතර නිමිති නොදැකීමෙහි කරුණ දක්වමින් **ඣානරතිසමපපිතො** යි කීය. ඣානරති යනු සමවත් සුවයට මෙය නමකි. ධ්‍යානසුවයෙහි සමාහිත වූ බැවින් එක්වූ බැවින් ඒ නිමිති නොදිටිමි යන අර්ථයි.

ඉක්බිති එකල දීපංකර දසබලයන් වහන්සේ සාරලක්ෂයක් රහතුන් පිරිවරා පිළිවෙළින් චාරිකා කරනසේක් පරම රමණීය රම්ම නගරයට පැමිණ සුදර්ශන මහාවිහාරයෙහි වසන සේක. මෙම නුවරැ දිවකුරු බුදුහු උතුම් බුදුබවට පැමිණ උතුම් දම්සක් පවත්වා ක්‍රමයෙන් චාරිකා කරන සේක් මෙම නුවරට පැමිණ සුදසුන් මහවෙහෙර වසති අසා ගිතෙල් වෙඬරු ද බෙහෙත් ද ගෙන හීල අනුභව කොට උතුරුසළු සහිතව මල් ගඳදුම් ගත් අතැතිව බුදුන් කරා එළඹ බුදුන් වැඳ පුෂ්පාදියෙන් පුදා සුමධුර බණකතා අසා සෙට දිනට භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට අසුනින් නැගී දසබලයන් පැදකුණු කොට ගියහ. ඔවුනු පසුදින අසදෘශ මහදන් සරහා මඩුවක් තනා විමල කෝමල කිලුපුලින් සෙවිලි කොට සිවුදෑගඳින් පිරිබඩකොට ලදපස්මල් සුවඳ කුසුම් විසුරුවා මඩුවෙහි සිවුකොණ සිසිල් දිය පිරූ සැළි තබ්බවා කෙසෙල්පතින් වසා මණ්ඩපය

මත දෑසමන්මල් සම පරම සුන්දර දූකුම් ඇති සෙල්වියන් බැඳ රන් රිදී මිණි කාරකායෙන් සරසා එහි ගඳදුම් මල්දම් පත්දම් රුවන්දම් එල්වා දුමින් දුර්දිනයක් කොට ඒ මුළුමහත් රම්‍ය වූ රමම නගරය කැන් සහිත කෙසෙල්ද මලින් සැරසූ පූර්ණඝට ද තබා නන්වන් ධජපතාකාදිය ඔසවා මහාවීදිය දෙපස තිරපවුරින් වටකොට දිවකුරු බුදුන් වඩනා මඟ අලංකාර කරන්නාහු දියෙන් බිඳී ගිය තැන් පස් දමා විසම සමකොට මුතුවන් වැලි විසුරුවති. ලදපස්මල් ඉසිති. කැන් සහිත කෙසෙල් පුවක්ගස් පිහිටුවති. එකල සුමේධ තාපස සිය අසපුයෙන් නැගී රමමනුවරවාසී ඒ මිනිසුන්ට ඉහළ අහසින් යන්නේ ඒ තුටුපහටුව මඟ පිරිසිදු කරන සරසන මිනිසුන් දැක කවර කරුණක්දැයි සිතා සියල්ලක් බලා සිටිද්දීම අහසින් බැස පසෙක සිට මිනිසුන්ගෙන් විමසීය. භවත්නි, කාහට මේ මඟ සරහනාහුද? කියායි. එයින් කියන ලදි-

පවවනත දෙසවිසයෙ නිමනෙතඤා තථාගතං
තසස ආගමනං මගගං සොධෙනති තුටඨමානසා

අහං තෙන සමයෙන නිකඛමිඤා සකසසමා
ධුනනෙතා වාකචීරානි ගචඡාමි අමබරෙ තදා

වෙදජාතං ජනං දිසවා තුටඨහටඨං පමොදිතං
ඔරොහිඤාන ගගනා මානුසෙ පුවජී තාවදෙ

තුටඨහටෙඨා පමුදිතො වෙදජාතො මහාජනො
කසස සොධියතී මගෙගා අඤජසං වටුමායනනති

එහි **පවවනත දෙසවිසයෙ** යනු; මධ්‍යම දේශයෙහිම එක් පැත්තක ප්‍රත්‍යනතදේශ නම් වූ. **තසස ආගමනං මගගං** යනු උන්වහන්සේ විසින් පැමිණිය යුතු මාර්ගය යන අර්ථයි. **අහං තෙන සමයෙන** යනු; මම එකල්හි මෙය භූම්‍යර්ථයෙහි කරණ වචනයි. දතයුතුය. **සකසසමා** යනු; තම අසපුවෙන් නික්ම. **ධුනනෙතා** යනු; සලමින්. **තෙන සමයෙන** යනු ද තදා යනු ද මේ දෙක්හි එකාර්ථවන්ය. නිකඛමන ක්‍රියාව ද දෙවැන්න ගමන ක්‍රියාවද සමග සම්බන්ධය කොට දතයුතුය. අන් අයුරින් පුනරුත් දොසින් නොමිලේ **තදා** යනු; එකල. **වෙදජාතං** යනු; හටගත් සොම්නසස. **හටඨතුටඨං පමොදිතං** යනු; මේ තුන්පදය අනෙන්‍යාන්‍ය පර්යාය වචනයි.

අන්‍යොන්‍ය අර්ථ දීපනය කරයි. නැතහොත් සැපයෙන් සතුට, **ප්‍රීතියෙන්** ප්‍රහර්ෂය, ප්‍රමෝදයෙන් ප්‍රමුදිතයයි. **ඔරොහිත්වාන** යනු; බැස. **මානුසෙ** පුචඡි යනු; මිනිසුන් විමසීමි. මෙයම හෝ පාඨයයි. **තාවදෙ** යනු; එදා එකෙණෙහි යන අර්ථයි. දැන් එම අර්ථය දක්වමින් **තුටඨ නටෙඨා පමුදිතො** යනාදිය කියන ලදි. එහි මේ මහජනයා තුටුපහටු ප්‍රමුදිත හදින් මඟ පිරිසිදු කරති. කුමකට සුද්ධ කරත් ද? කවරකු සඳහා පිරිසිදු කරත් ද යනුයි. මෙසේ සොධෙති පදය ගෙන අර්ථය ගතයුතුය. අන් පරිදි නොගැළපේ. සොධියති සුද්ධබව කරවයි. **මගෙඟා අඤ්ජසං වටුමායනං** යනු; මේවා මාර්ග යන්නට පර්යාය වචනයි. මෙසේ සුමේධ තාපසයන් විසින් විමසන ලද මිනිස්සු මෙසේ කීහ. සුමේධ ස්වාමීනි, ඔබ නොදන්නහුද? දීපංකර බුදුහු අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් පවත්වා ජනපද චාරිකාවෙහි යෙදෙන්නාහු ක්‍රමයෙන් අපේ නුවරට පැමිණ සුදසුන් මහවෙහෙර වසති. අපි උන්වහන්සේට ආරාධනා කළෙමු. මේ ඒ භාග්‍යවත් බුදුරදුන් වැඩමවන මාර්ගය පිරිසිදු කරමු කියායි. එයසා සුමේධ තාපසයෝ මෙසේ සිතූහ.

බුද්ධ යන මේ ශබ්දය ද දුර්ලභය. බුදුඋපත ගැන කියනුම කවරේද? එබැවින් මා විසින් ද මේ මිනිසුන් සමග බුදුන් වඩින මග පිරිසිදු කළයුතුය. එතුමා ඒ මිනිසුන්ට මෙසේ කීය. භවත්නි, ඔබලා මේ මඟ භාග්‍යවතුන් වහන්සේට පිරිසිදු කරන්නාහු නම් මටත් ඉඩක් දෙව්. මමත් ඔබලා සමග බුදුන් වඩින මඟ සුද්ධකරමි කියායි. ඉක්බිති ඔවුහු මැනවැයි පිළිගෙන මේ සුමේධ පණ්ඩිතයෝ මහත් ඍද්ධි ඇත්තාහ. මහානුභාව ඇත්තාහයි දැන පිරිසිදු කිරීමට අසීරු දියෙන් බිඳුණු අතිවිසම එක් පෙදෙසක් සලකා මේ කොටස ඔබ සුද්ධකොට සරසනු මැනවැයි දුන්හ. ඉක්බිති ඒ සුමේධ පණ්ඩිතයෝ බුද්ධාරම්මණ ප්‍රීති උපදවා සිතූහ. මේ කොටස ඍද්ධියෙන් පරම දර්ශනීය කිරීමට මම සමත් වෙමි. එසේ කළ කල්හි මට සතුටක් නැත. අද මා කායික වතාවත් කිරීම වටනේයයි පස් දමා ඒ කොටස පුරවති. එතුමන්ගේ ඒ කොටස පිරිසිදු කිරීමට මත්තෙන් විප්‍රකෘතිව තිබියදීම රම්මනුවරු භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, දැන් සුදානම් යයි කල් සැලකළහ. මෙසේ ඔවුන් කල්දන්වූ පසු බුදුහු බඳුවදමල් පැහැති දෙපට සිවුර තිමඬුලු වසා හැඳ ඒ මත රන්පමුදමකින් මල්කලඹක් වටකරන්නෙක් මෙන් විදුලියක් වන් සශ්‍රීක කායබන්ධනය බැඳ රන්ගිරි කුළක් මත ලාරස ඉසින්නාක් මෙන් රන්සෑයක් පබළු දුලකින් වසන්නාක් මෙන් ද රන් ඇඟෑයක් රත්කම්බිලියකින් පළඳවන්නාක් මෙන් ද සරාසඳ,

රත්වලායෙකින් වසන්නාක් මෙන් ද ලාරසින් තෙත් කැලමල සම පැහැති උතුම් රතු පාංශුකුල වීවරය පෙරවා ගඳකිළි දොරෙන් රන්ගුහාවකින් සිංහයකු මෙන් නික්ම ගඳකිළි ඉදිරියෙහි සිටියහ. එවිට සියලු භික්ෂූහු තම පාසිවුරු ගෙන බුදුන් පිරිවැරූහ. පිරිවරාගත් ඒ භික්ෂූහු මෙබඳු වූහ.-

අලෙපවඡ වූහ සනතුෂටයහ. වකතෘහ. වචනක්‍ෂමයහ. ප්‍රවිවිගතයහ. අසංසටඨයහ. වීනීකයහ. පගර්හිතයහ. සියල්ලෝම සීලසම්පන්න වෙති. සමාධියෙහි ධ්‍යානයෙහි දක්‍ෂවූවෝ වෙති. ප්‍රඥාවිමුක්තියෙන් යුක්ත වෙති. චරණයෙන් යුක්ත වූවෝ වෙති. ක්‍ෂීණාස්‍රවයෝය. වසීප්‍රාප්තයහ. ෂඳ්ධිමත්හුය. යසස් ඇත්තෝය. ශාන්ත ඉන්‍ද්‍රිය ඇත්තෝය. දමනයට පත්වූවෝය. පුනර්භවය ක්‍ෂය කළාහුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ වීතරාගව වීතරාගීන් සමග වීතදෝසීව වීතදෝසීන් සමග වීතමෝහීව වීතමෝහීන් සමග ඔවුන් පිරිවරන ලදුව අතිශයින් බැබළි සේක. ඉක්බිති ශාස්තෘන වහන්සේ ෂඩභිඥාලාභී ක්‍ෂීණාස්‍රවයන් හාරලක්ෂයක් පිරිවරා දෙවිගණ පිරිවැරූ ශක්‍රයා මෙන් බඹගණ පිරිවැරූ මහබඹු මෙන් අපමණ කල්හි රැස්කළ පින් බෙලෙන් උපන් අනූපම බුද්ධ ලීලාවෙන් තරුගණ පිරිවැරූ සරාසඳ ගුවන්තලය මෙන් සරසා පිළියෙල කළ ඒ මඟට පිළිපන් සේක.

රන්වන් පැහැයෙන් රන්වන් මඟරුක් රන්වන් පැහැයට සම කරමින් රන්වන් වීරයන්වහන්සේ මඟට පිළිපන්හ.

සුමේධ තාපසයෝ ද ඒ සරසා පිළියෙල කළ මඟින් වඩින දිවකුරු භාග්‍යවතුන් වහන්සේගේ දෙතිස්වර ලකුණින් හෙබි අසූ අනුලකුණින් අනුරඤ්ජිත ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් සඝ්‍රික වූ ඉඳුනිල්මිණි වන් අහසෙහි නන්බඳු විදුලිය මෙන් සවනක් බුදුරස් විහිදුවන රුවින් අගපත් බුදුබඳ ඇස් දල්වා බලා අද මා විසින් දසබලයන් වහන්සේට ජීවිත පරිත්‍යාග කරන්ට වටනේ යයි භාග්‍යවතුන් වහන්සේ මඩ නොමඩින සේක්වා. මිණිපෝරු හෙයක් මඩින්නාක් මෙන් සාර ලක්‍ෂයක් රහතුන් සමග මාගේ පිට මඩිමින් වඩින සේක්වා. එය මට දිගුකල් හිතසුව පිණිස මෙය කියා කෙස් මුදා අඳුන් දිවිසම් ජටාමඬුලු වැහැරි සිවුරු කළමඬෙහි පතුරුවා එහිම මඩ මත හොත්හ. එහෙයින් කියන ලදි-

තෙ මෙ පුටයා බ්‍යාකරිංසු බුදෙධා ලොකෙ අනුත්තරෝ
දීපංකරෝ නාම ජිනෙ උපපජ්ජි ලොකනායකෝ
තසස සොධියත්ත මගෙගා අඤ්ඤජසං වටුමායනං

බුදෙධාති මම සඤ්ඤාන පීති උපපජ්ජි තංවදෙ
බුදෙධා බුදෙධාති කථයනෙතා සොමනසසං පවෙදයිං

තත්ථ ඨත්වා විචිනෙතසිං තුටෙඨා සංවිගගමානසෝ
ඉධ බීජානි රොපිසසං බණෙ වෙ මං උපවවගා

යදි බුදධසස සොධෙථ එකොකාසං දදාථ වෙ
අහං ව සොධයිසසාමි අඤ්ඤජසං වටුමායනං

අදං සු තෙ මමොකාසං සොධෙතුං අඤ්ඤජසං තදා
බුදෙධා බුදෙධාති විනෙතනෙතා මගගං සොධෙමහංනදා

අනිටඨිතෙ මමොකාසෙ දීපංකරෝ මහාමුනි
චතුහි සතසහසෙසහි ඡළභිඤ්ඤෙහි තාදිහි
බීණාසවෙහි විමලෙහි පටිපජ්ජි අඤ්ඤජසං ජිනෝ

පවවුගගමනා වතතනති වජජනති හෙරියෝ බහූ
ආමොදිකා නරමරූ සාධුකාරං පවතතයුං

දෙවා මනුසෙස පසසනති මානුසා පිව දෙවතා
උභොපි තෙ පඤ්ජලිකා අනුයනති තථාගතං

දෙවා දිබෙබහි තූරියෙහි මනුසසා මානුසෙහි ච
උභොපි තෙ වජජයනතා අනුයනති තථාගතං

දිබබං මන්දාරවං පුපඵං පදුමං පාරිචඡත්තකං
දිසෝ දිසං ඔකිරනති ආකාස නභගතා මරූ

චම්පකං සලලං නීපං නාග පුන්න කෙතකං
දිසෝ දිසං උකඛිපනති භූමිතලගතා නරා

කෙසෙ මුඤ්චිත්වහං තත්‍ර චාකචිරං ච චම්මතං
කලලෙ පත්‍ථරිත්වාන අවකුජ්ජා නිපජ්ජහං

අකකම්මත්වාන මං බුද්ධා සහ සසෙසහි ගච්ඡතු
මා නං කලලෙ අක්කමිත්‍ථො හිතාය මෙ භවිසසතීති

එහි **බ්‍යාකරිංසු** යනු; ප්‍රකාශ කළහ. **දීපංකරො 'නාම ජිනො තසස සොධියති පථො කියා ද පාඨයකි. සොමනසසං පවෙදයිං** යනු; සොම්නස අනුභව කළෙමි යන අර්ථයි. **කත්‍ථ ඨත්‍වා** යනු; යම් පෙදෙසක අහසින් බැස්සේ ද එහිම සිට. **සංවිගගමානසො** යනු; ප්‍රීතියෙන් විස්මිත මනස් ඇතිව. **ඉධාපි** යනු; මේ දිවකුරු පින්කෙත්හි බීජානි යනු; කුසල් බීජ. **රොපෙසසං** යනු; රෝපණය කරමි. බණේඩා යනු; අෂ්ට ක්ෂණ රහිත නවවැනි ක්ෂණ සන්නිපාතය. ඒ අත්දුර්ලභ සමය මා විසින් ලබන ලදි. වෙ යනු; නිපාත මාත්‍රයකි. **මා උපවචගා** යනු; එය බැහැර නොවේවා නොඉක්ම යේවා යන අර්ථයි. **දදාථ** යනු; දෙවි. **තෙ** යනු; මා විචාළ මිනිස්සු යමෙක්ද ඔවුහු යන අර්ථයි. **සොධෙමහං නදා** යනු; එකල්හි මම පිරිසිදු කරමි. **අනිටඨතෙ** යනු; පිරිසිදු නොකළ කල්හි අඩාල වූ කල්හි. **බීණංසවෙහි** යනු; මෙහි ආසව සතරකි. කාමාසව, භවාසව, දිට්ඨාසව අවිජ්ජාසවයි. මේ සතර ආසව යමෙකුගේ ක්ෂීණ ද ප්‍රහීණ ද මුලිනුපුටන ලදද සංසිඳුණාහුහ ඉපදීමට අහව්‍ය වූවාහු ද ඥානාග්නියෙන් දවන ලදද ඔවුහු ක්ෂීණාස්‍රව වෙති. ඔවුන් විසින් ක්ෂීණාස්‍රව හෙයින්ම නිර්මල වූවන්. **දෙවා මනුසෙස පසසනති** යනු; මෙහි දෙවියන්ගේ මිනිස් දර්ශනයෙහි කිවයුත්තක් නැත. ස්වභාව දැකීම් වශයෙන් මිනිස්සු යම් සේ මෙහි සිට දකිත්ද එසේ දෙවියෝ ද මිනිසුන් දකිති යන අර්ථයි. **දේවතා** යනු; දෙවියන්. **උභොපි** යනු; දෙව් මිනිස් දෙගොල්ල. **පඤ්ඣලිකා** යනු; කරන ලද ඇදිලි ඇතිව, දුක හිසෙහි තබා යන අර්ථයි. **අනුයනති තථාගතං** යනු; තථාගතයන් පිටුපසින් යති. අනුයෝගය ඇතිවිට සාම්‍යර්ථයෙහි උපයෝග පදය වෙයි යනු ලක්ෂණයි. එයින් කියන ලදි. **අනුයනත තථාගතං යි. වජජයනතා** යනු; දිශාවෙන් දිශාවෙන්. **ආකාසනභගතා** යනු; අහස් සංඛ්‍යාත නභස්හිගත. නොහොත් අහසට ගියාහු. **ස්වර්ගගත. නහො** යනු ස්වර්ගයයි. **මරූ** යනු; දෙවියෝයි. **සල ලං** යනු; හොරගස්වල මල් **නීපං** යනු; මීදෙල්ල මල්, නාමල්, පුවක් දොඹ මල්, වැටකේ මල්. **භූමිනලාගත** යනු; භූමිගත. **කෙසෙ මුඤ්චිත්වහං** යනු; මම කේශයෙහි බැඳි නිල්රන්වන් වක් ජටාව මුදා. විසුරුවා යන අර්ථයි. **තත්‍ර** යනු; මට දුන්

ඉඩෙහි. චමමකං යනු; සම්කඩ. **කලලෙ** යනු; ගොහොරු මඩෙහි. අවකුජෙජාති යනු මුනින්තළා වී. **නිපජජං** යනු; මම වැතිරගතිමි. **මා නං** යනු; මා යනු ප්‍රතිෙඛධාර්ථයෙහිය. නං යනු පදපූරණාර්ථයෙහි නිපාතයි. බුදුහු මඩ නොපාගත්වා යන අර්ථයි. **හිතාය මෙ භවිසසති** යනු; ඒ මඩ නොපැයීම දිගුකල් හිත පිණිස වන්නේය. **සුඛාය මෙ භවිසසති** කියා ද පාඨයි.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ මඩ මත හොත්තානු මෙසේ සිතූහ. ඉදින් මම කැමති වන්නෙමි නම් සියලු කෙලෙස් නසා සංඝ නවකව (අඵත් මහණෙක්ව) මෙම නුවරට පිවිසෙමි. අප්‍රකට වේශයෙන් මගේ කෙලෙස් දවා නිවන් පැමිණීමෙන් වැඩෙක් නැත. මම දීපංකර දසබලයන් වහන්සේ මෙන් උතුම් බුදුබවට පැමිණ මහජනයා දහම් නැවට නංවා සසර සයුරෙන් එතෙර කොට පිරිනිවන් පාන්නෙමි නම් මැනවි. මෙය මට සුදුසුය කියායි. ඉක්බිති අටදහම් ගළපා බුදුබව සඳහා දැඩි අධිෂ්ඨාන කොට වැදහොත්තාහ. එහෙයින් කියන ලදි-

පඨවියං නිපජනනසස එවමෙම ආසි චෙතසො
ඉචඡමානො අහං අජජ කිලෙසෙ ඣාපයෙ මම

කිමෙම අඤඤාතවෙසෙන ධමමං සචඡිකතෙනිධ
සබබඤඤුතං පාපුණාමි නාරෙමි ජනතං බහුං

සංසාරසොතං ඡින්දිත්වා විදධංසෙත්වා තයො භවෙ
ධමමනාවං සමාරුයහ සනතාරෙසසං සදේවකෙ

එහි පඨවියං නිපජනනසස යනු; පොළොවෙහි වැදහොත්. පාඨය මෙයම හෝයි. චෙතසො යනු; චිතත පරිවිතර්කයක් විය යන අර්ථයි. එවං මෙ ආසි චෙතනා යි ද පාඨයි. **ඉචඡමානො** යනු; කැමති වෙමින්. **කිලෙසෙ** යනු; කිලිටි කරති, උපතාපනය කරති නුයි ක්ලේශයෝයි. රාගාදි දසයයි. ඣාපයෙ යනු; දවන්නෙමී. මාගේ කෙලෙස් මම දවන්නෙමි යන අර්ථයි. කිං යනු; ප්‍රතික්ෂේප වචනයි. **අඤඤාත වෙසෙන** යනු; අප්‍රකට වේශයෙන්, නොදන්නා සැඟවුණු මෙහි වනාහි භික්ෂුවක් මෙන් ආස්‍රව නැසීමෙන් කිම? බුදුකුරු දහම් පුරා ප්‍රතිසන්ධි ජාති බොධි ධම්මචකකනයන්හි පොළොව කම්පාකොට බුදුව අවබෝධ කරවන්නෙක් එතෙරව එතෙර කරවන්නෙක් මිදී මුදවන්නෙක් වන්නෙමි යන අදහසයි.

සදෙවකෙ යනු; දෙවියන් සහිත ලෝකයෙහි **ථාමදසසිනා** යනු; තමන්ගේ ථාමබලය දක්නහු විසින් **සනතාරෙසසං** යනු; එතෙර කරවන්නෙමි. **සදෙවකෙ** යනු; දෙවියන් සහිත සත්‍වයන් අතර, දෙවියන් සහිත ලෝකයෙහි හෝ ය. **අධිකාරෙන** යනු; අති විශිෂ්ට කාර්යයෙන්, බුදුන්ට මාගේ ජීවිතය පුදා කලල්මත වැතිරෙන අති විශිෂ්ට කාර්යයෙන් යන අර්ථයි. **සංසාර සොතං** යනු; කර්ම ක්ලේශ වශයෙන් යෝනි ගති විඤ්ඤාණසථිති නව සත්‍වාවාසයන්හි ඔබිනොබ සංසරණය සංසාරයයි. කී පරිදි-

ස්කන්ධයන්ගේ පිළිවෙළ මෙන්ම ධාතු ආයතනයන් නොසිඳ පැවැත්ම සංසාරයයි කියනු ලැබේ.

සංසාරය ද එම සෝතය ද සංසාරසේක නමි. ඒ සංසාරසොතය. නොහොත් සංසාරයාගේ සෝතය සංසාරසොතයි. ඒ සංසාර කාරණය තණ්හා සොතය සිඳ යන අර්ථයි. **තයො භවෙ** යනු; කාම රූප අරූප භවයෙහි භවය උපදවන කර්ම ක්ලේශ තයො භවා යි අභිප්‍රේතයි. ධම්මනාවා යනු; අරි අටඟි මගයි. එය සතර ඕඝයන් තරණය කිරීම් අර්ථයෙන් ධම්මනාවා යි කියනු ලැබේ. **සමාරුයහ** යනු; නැගී **සනතාරෙසසං** යනු; එගොඩ කරවන්නෙමි. යම් හෙයකින් වනාහි බුදුබව පතන්නහුගේ-

මනුසසතතං ලිංගසමපතති හෙතු සත්‍ථාරදසසනං
පබබජ්ජා ගුණසමපතති අධිකාරො ච ඡන්දතා
අථයධම්මසමොධානා අභිනීහාරො සම්ජ්ඣතීති

එහි **මනුසසතතං** යනු; මිනිසත් බැව්හිම සිට බුදුබව පතන්නහුගේ දැකීම සම්බන්ධ වෙයි. නාගජාති ආදියෙහි සිටියවුන්ට නොවෙයි. කුමක් නිසාද යත්- අහෙතුකබව නිසාය. මිනිසත් බැව්හි සිටින්නහුට ද පුරුෂ ලිංගයෙහි සිටියහුගේම පැතීම සඵල වෙයි. ස්ත්‍රියට හෝ පණ්ඩක නපුංසක උභතොබ්‍යංජකයන්ට සඵල නොවෙයි. කුමක් නිසාද යත්- ලක්ෂණ පරිපූර්ණය නොමැති හෙයිනි. මෙය කියන ලදි. "මහණෙනි, ස්ත්‍රියක් අර්හත් සම්‍යක් සම්බුද්ධ වන්නේය යන යමක් ඇද්ද මෙය නොසිදුවන්නකි. ඊට අවකාශ නැත."යි විස්තරයි. එහෙයින් ස්ත්‍රීලිංගයෙහි සිටි මිනිස් ජාතිකයෙකුගේ ද පැතුම ඉටු නොවෙයි. **හේතු** යනු; පිරිමියකු වුව එම අත්බැව්හි රහත්වීමට හේතු ඇත්තකුගේම පැතුම සඵල වෙයි. අනිකකුට නොවෙයි. **සත්‍ථාරදසසනං** යනු; ඉඳින් ජීවමාන බුදුකෙනෙකුගේම හමුවෙහි

පතයි නම් පැතුම සඵල වෙයි. බුදුන් පිරිනිවි පසු චෛත්‍යය ළඟ හෝ බෝරුක්මුලෙක හෝ ප්‍රතිමාවක් වෙත හෝ පසේබුදු බුදුසව්වන් වෙත හෝ පැතුම ඉටු නොවෙයි. කුමක් හෙයින් ද? භව්‍ය අභව්‍යයන් දැන කර්ම විපාක පිරිසිඳ දන්නා නුවණින් පිරිසිඳ දැන ප්‍රකාශ කිරීමට අසමත් බැවින් බුදුන් වෙත කරන පැතුමම ඉටුවෙයි. **පබබජජා** යනු; බුදුන් වෙත පතන්නහුට ද කර්ම ක්‍රියාවාදී තාපසයන් අතර හෝ භික්ෂූන් අතර හෝ පැවිදි වූවහුටම පැතුම සඵල වෙයි. ගිහිබැව්හි සිටියහුට නොවේ. කුමක් නිසාද? පැවිදි වූම බෝසත්හු සම්බෝධිය ප්‍රතිවේධ කරති. ගිහියෝ නොවෙති. එබැවින් ආදියෙහි ප්‍රතිධන් කාලයෙහිද පැවිද්දකු විය යුතුය. **ගුණසම්පනනි** යනු; පඤ්චාභිඥා අෂ්ටසමාපත්තිලාභී පැවිද්දන්ගේම පැතුම සඵල වෙයි. මේ ගුණ සම්පත්වලින් තොරවූවහුගේ පැතුම ඉටු නොවෙයි. කුමක් නිසාද? නිර්ගුණ වූවහුට එය නොවන හෙයිනි. **අධිකාරෝ** යනු; ගුණසම්පන්නව යමකු විසින් සිය ජීවිතය බුදුවරුන්ට පූදන ලද්දේ වේද ඔහුට මේ අධිකාරයෙන් යුක්ත වූවහුටම සමෘද්ධ වේ. සෙස්සන්ට නොවේ. එහිලා මේ ඡන්දමහත්වයට උපමාවයි. ඉදින් මෙසේ වෙයි නම් - යමෙක් එකම ජලාසයක් බවට පත්වේ. මුළු සක්වළ ගැබ තම බාහුබලයෙන් තරණය කොට එගොඩ යාමට සමත් වෙයි නම් ඔහු බුදුබවට පැමිණෙයි. යනුයි. යමෙක් මෙය තමාට දුෂ්කරයයි නොහඟී. මම මෙය තරණය කොට පරතෙරට යන්නෙමියි මහත් කැමැත්තෙන් උත්සාහයෙන් යුක්ත වෙයි. ඔහුගේ ප්‍රාර්ථනය සමෘද්ධ වෙයි. අනිකෙකුට නොවෙයි. සුමේධ පණ්ඩිතයෝ වනාහි මේ අටදහම ගළපා බුදුබව සඳහා දැඩි අධිෂ්ඨානකොට වැදහොත්හ. දීපංකර භාග්‍යවතුන් වහන්සේ පැමිණ සුමේධ පණ්ඩිතයන්ගේ හිස පැත්තෙන් සිට කලල් මත සිටි සුමේධ තාපසයන් දැක මේ තාපසයෝ බුදුබව පතා අධිෂ්ඨාන කොට හොවිති. මොහුගේ ප්‍රාර්ථනය සිද්ධවෙයිදෝ නොවේදෝයි අනාගතංස ඤාණය යොදා සලකන සේක් මෙයින් සිව්අසංඛ්‍යකප් ලක්ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවෙතියි දැන හිටිවනම පිරිස් මැද ප්‍රකාශ කළහ.

මහණෙනි, ඔබලා මේ කලල් මත හෝනා උග්‍ර තපස් ඇති මේ තාපසයා දක්නහුද? කියායි. ස්වාමීනි එසේය. මෙතෙම බුදුබව පිණිස ප්‍රාර්ථනා කොට හොත්තාහ. මොහුගේ ප්‍රාර්ථනය සමෘද්ධ වන්නේය. මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවන්නාහ. එම අත්බැව්හි කපිලවත්තු නම් නුවර නිවාස වෙයි. මහාමායා නම් දේවිය මෑණියෝය. සුද්ධෝදන නම් රජ පියාණෝය. උපතිසස ද කෝලිත ද දෙඅගසව් වෙති. උපස්ථායක ආනන්ද නම් වෙයි. ඛේමා ද උප්පලවණ්ණා ද

අග්‍රශ්‍රාවිකා දෙනම වෙති. මොහු ඤාණ මුහුකුරුවා මහබිනික්මන් නික්ම මහාප්‍රධන් කොට නුගරුක්මුල සුජාතාව දුන් කිරිබත් පිළිගෙන නෙරඤ්ජරා ගංතෙර වළඳා බෝමැඩට නැගී ඇසතු රුක්මුල්හි බුදුවන්නාහ. එයින් කියන ලදි-

දීපංකරෝ ලොකවිදූ ආහුතීනං පටිගහෝ
උසභීසකෙ මං ඨත්වාන ඉදං වචනමබ්‍රවී

පසසථ ඉමං තාපසං ජටිලං උගගතාපනං
අපරිමෙය්‍යෝ ඉතෝ කපෙ බුදෙධා ලොකෙ භවිසසති

අහූ කපිලවහයා රමමා නිකඛමිත්වා තථාගතෝ
පධානං පදහිත්වාන කත්වා දුකඛරකාරිකං

අජපාලරුකඛමූලසමිං නිසීදිත්වා තථාගතෝ
තත්ථ පායාසමගගයහ නෙරඤ්ජරමුපෙහිති

නෙරඤ්ජරාය තිරමහි පායාසං ආදාය සෝ ජිනෝ
පටියතනවරමගෙගන බොධිමූලං හි එහිති

තනෝ පදකඛිණං කත්වා බොධිමණඩං අනුත්තරෝ
අසසත්ථ රුකඛමූලමහි බුජඣිසසති මහායසෝ

ඉමසස ජනිතා මාතා මායා නාම භවිසසති
පිතා සුදෙධාදනෝ නාම අයං හෙසසති ගොතමෝ

අනාසවා වීතරාගා සනතචිතතා සමාහිතා
කොලිතෝ උපතිසෙසා ච අගගා හෙසසනති සාවකා

ආනන්දෝ නාමුපට්ඨාකෝ උපට්ඨිසසති තං ජිනං
ඛෙමා උපපලවණණා ච අගගා හෙසසනති සාවිකා

අනාසවා වීතරාගා සනතචිතතා සමාහිතා
බොධි තසස භගවතෝ අසසත්ථොති පවුච්චති

චිතෙතාච හත්ථාළවකෝ අගගා හෙසසනතුපට්ඨකා
උතතරා නන්දමාතා ච අගගා හෙසසනතුපට්ඨිකාති

එහි ලෝකවිදූ යනු; සර්වප්‍රකාරයෙන් දන්නා ලද ලෝක ඇති බැවින් ලෝකවිදූයි. භාග්‍යවතුන් වහන්සේ ස්වභාව වශයෙන් සමුදය වශයෙන් නිරෝධ වශයෙන් නිරෝධ උපාය වශයෙන් සර්වප්‍රකාරයෙන් ලෝකය වටහා ගත්හ. දැනගත්හ. අවබෝධ කළහ. එහෙයින් ලෝකවිදූ යයි කියනු ලැබේ. කී අයුරු-

සුමේධ වූ ලෝකාන්ත ගත විසූ බඹසර ඇති කෙලෙස් සංසිඳවූ භාග්‍යවතුන් වහන්සේ ලෝකාන්තය දැන මේ ලෝකයත් පරලෝකයත් නොකැමති වෙති. එහෙයින් ඒකාන්තයෙන් ලෝකවිදූ වන සේක.

තවද ලෝක තුනකි. සංස්කාර ලෝක, සත්ව ලෝක, අවකාශ ලෝක යනුවෙනි. එහි සංස්කාර ලෝකය නම් ප්‍රත්‍යයෙන් උපන් පෘථිවි ආදි ධර්මයි. සත්වලෝක නම් සංඥී අසංඥී නේවසංඥී නාසංඥීහුය. අවකාශලෝක නම් සත්වයන්ගේ නිවාසස්ථානයි. මේ තුන් ලෝකය ද භාග්‍යවතුන් වහන්සේ යථා ස්වභාවයෙන් දන්නා සේක. එහෙයින් ලෝක විදූයයි කියනු ලැබේ. ආහුනීනං පටිගහණෝ යනු; දන් පිළිගැනීමට සුදුසු හෙයින් දක්ෂණීය බැවින් ආහුනීනං පටිගහණෝ නම්. උසසීසකෙ මං යඤ්ඤාන යනු; මාගේ හිස සමීපයෙහි සිට. ඉදං දූන් කිවයුතු වචනය වදාළහ යන අර්ථයි. ජටිලං යනු; ජටා ඔහුට ඇත්තේ නුයි ජටිලයි. ඒ ජටිලයා. උගගතාපනං යනු; උග්‍ර තපස්. අහුනී යනු; අහනි, අථ යන අර්ථයි. මෙයම හෝ පාඨයි. කපිලවහයා යනු; කපිල නම්, රමණා යනු; රමණීයතාවෙන්. පධානං යනු; වීර්යයි. මහිති යනු; එළඹෙති. සෙසු ගාථාවන්හි අර්ථ පැහැදිලිය. ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ මාගේ ප්‍රාර්ථනය සමෘද්ධ වන්නේයයි හටගත් සොම්නස් ඇත්තෝ වූහ. මහජනයා දිවකුරු බුදුරදුන්ගේ බස් අසා සුමේධ තාපසයෝ වනාහි බුද්ධබීජංකුරයකැයි තුටු පහටු වූහ. මෙසේ ද සිතූහ. යම් සේ ගඟින් එගොඩවන මිනිසෙක් ඍජු තොටින් එගොඩවිය නොහැක්කේ යට තොටකින් එගොඩ වන්නේද එමෙන් අපි දිවකුරු දසබල සසුනෙහි මඟපල නොලබන්න මෙන් නම් අනාගතයෙහි යම්දාක ඔබ බුදුවන සේක්ද එකල ඔබවහන්සේ තුමුවෙහි මඟපල පසක් කිරීමට සමත් වෙමිවායි පැතූහ. දිවකුරු දසබලයාණෝ ද බෝසත් මහසතුන් පසසා මල් අටමිටකින් පුදා පැදකුණු කොට වැඩි සේක. සාර ලක්ෂයක් රහත්හුද බෝසතුන් මලින් ගඳින් පුදා පැදකුණු කොට වැඩියහ. දෙවියන් සහිත මිනිස්සු ද වැඳ පුදා පැදකුණු කොට ගියහ.

ඉක්බිති සකලලෝක අතිදීපංකර දීපංකර බුදුහු සත්ලක්ෂයක් රහතන් පිරිවරා රම්මනගර වැසියන්ගේ පුදසත්කාර ලබමින් දෙවියන්ගේ අභිනන්දන සහිතව සන්ධ්‍යා කාන්ති වළඳන ලද උතුම් රන්ගිරිකුළක් මෙන් මල්සුවඳ සුවඳසුණු සුවඳින් සුගන්ධවත් ධජපතාකා නංවන ලද සුවඳ බැඳි හඳින් බඹරගණ ගුමුගුමු නද ගන්වන ලද දුමින් අඳුරු වූ දෙවිපුරයක් මෙන් හොබනා අතිරමණීය රම්මනුවරට පිවිස පනවන ලද මාහැඟි බුද්ධාසනයෙහි යුගඳුරු මුදුනෙහි සරාකල රුචිර සඳ මෙන්ද ගනඳුරු දුරලන කමලවන පුබුදු කරන දිවාකරයා මෙන් බුද්ධදිවාකරයාණෝ වැඩහුන් සේක. බික්සඟන ද පිළිවෙලින් තම තමන්ට පැමිණි ආසනවල හුන්හ. රඹගම් නුවරවැසි උපාසකවරු ශ්‍රද්ධාදිගුණ අසදෘශ සැප නිදාන වූ දානය බුදුපාමොක් බික්සඟනට පුදකළහ.

ඉක්බිති බෝසතාණෝ දසබල ව්‍යාකරණය අසා බුදුබව අත්පත් වූවක් මෙන් හඟිමින් ප්‍රමුදිත හදින් සියල්ලන් නික්මගිය පසු සයනයෙන් නැගිට පාරමී පරීක්ෂා කරමියි මල්රැස මත පර්යංකයෙන් හිඳගත්හ. බෝසතුන් මෙසේ හුන් කල්හි සියලු දසදහසක් සක්වළ දෙවියෝ සාධුකාර දී ආර්ය සුමේධ තාපසයෙනි, පෙර බෝසතුන් පාරමී පරීක්ෂා කරමියි පර්යංකයෙන් හුන් කල්හි යම් පෙරනිමිති පහළවිණි නම් ඒ සියල්ලම අද පහළ විය. නිසැකයෙන් ඔබ බුදුවන්නානුය. මෙය අපි දනිමු. යමෙකුට මේ නිමිති පහළ වෙයිද ඔහු ඒකාන්තයෙන් ම බුදු වෙති. එහෙයින් ඔබ තම වීර්යය දැඩිකොට ගනු මැනවැයි බෝසතුන් නන් ආකාර ස්තුතියෙන් ස්තුති කළහ. එහෙයින් කියන ලදි.

ඉදං සුත්වාන වචනං අසමසස මහෙසිනො
ආමොදිකා නරමරූ බුදධබීජංකුරො අයං

උකකුටඨිසදදා වතතනති අතථොයෙනති හසතනිව
කතඤඣලී නමසසනති දසසහසසී සදෙවකා

යදිමසස ලොකනාථසස විරජඣිසසාම සාසනං
අනාගතමහි අදධානා හෙසසා සමමුඛා ඉමං

යථා මනුසසා නදිං තරනතා පටිකිත්‍ථං විරජඣිය
හෙටඨා තිත්‍ථෙ ගහෙත්වාන උතතරනති මහානදිං

එවමෙව මයං සබ්බෙ යදි මුඤ්චාමිමං ජීනං
අනාගතමහි අදධානා හෙසසාම සම්මුඛා ඉමං

දීපංකරෝ ලොකවිදූ ආහුතීනං පටිගගහෝ
මම කම්මං පතිතෙජ්ඣා දකඛිණං පදමුදධිරි

යෙ තජ්ඣාසුං ජිනපුතතා පදකඛිණාමකංසු මං
දෙවා මනුසසා අසුරාච අභිවාදෙජ්ඣාන පකකමුං

දසසනං මෙ අතකකනෙත සසංසෙ ලොකනායකෙ
සයනා උටඨිහිජ්ඣාන පලලංකමාභුජිං තදා

සුබෙන සුබිතෙ හොමි පාමොජෙජන පමොදිතෙ
පීතියා ච අභිසසනෙතා පලලංකං ආභුජිං තදා

පලලංකෙන නිසීදිජ්ඣා එවං චිනෙතසහං තදා
වසීභූතෙ අහං ඣානෙ අභිඤ්ඤාපාරමිං ගතෙ

සහසසියම්හි ලොකම්හි ඉසයෙ නජ්ජී මෙ සමා
අස මෙ ඉදධිධමෙමසු අලභිං ඊදිසං සුඛං

පලලංකාභුජනෙ මයහං දසසහසසාධිවාසිනෙ
මහානාදං පවතෙතසු ධුවං බුදෙධා භවිසසසි

යා පුබෙබ බොධිසතතානං පලලංකවරමංභුජෙ
නිමිතතානි පදිසසනති තානි අජජ පදිසස රෙ

සීතං ව්‍යපගතං හොති උණහඤ්ච උපසම්මති
තානි අජජ පදිසසනති ධුවං බුදෙධා භවිසසසි

දසසහසසී ලොකධාතු නිසසදදා හොති නිරාකුලා
තානි අජජ පදිසසනති ධුවං බුදෙධා භවිසසති

මහාවාතා න වායනති න සඤ්ඤති සවනතියෝ
තානි අජජ පදිසසනති ධුවං බුදෙධා භවිසසසි

ථලජා දකජා පුපඵං සබෙබ පුපඵනති තාවදෙ
තෙපජජ පුපඵිතා සබෙබ ධුවං බුදෙධා භවිසසසි

ලතා වා යදි වා රුකඛා ඵලහාරා හොනති තාවදෙ
තෙ පජජඵලිතා සබෙබ ධුවං බුදෙධා භවිසසසි

ආකාසටඨා ච භුමමටඨා රතනා ජොතනති තාවදෙ
තෙ පජජ රතනා ජොතනති ධුවං බුදෙධා භවිසසසි

මානුසකා ච දිබබා ච තුරියා වජජනති තාවදෙ
තෙ පජජුහො අභිරවනති ධුවං බුදෙධා භවිසසසි

විචිතතපුපඵා ගගනා අභිවසසනති තාවදෙ
තෙපි අජජ පදිසසනති ධුවං බුදෙධා භවිසසසි

මහාසමුදෙදා ආහුජති දසසහසසී පකමපති
තෙ පජජුහො අභිරවනති ධුවං බුදෙධා භවිසසසි

නිරයෙසු දසසහසසීසු අගගී නිබබනති තාවදෙ
තෙපජජ නිබබුතා අගගි ධුවං බුදෙධා භවිසසසි

විමලො හොති සුරියො සබබා දිසසනති තාරකා
තෙපි අජජ පදිසසනති ධුවං බුදෙධා භවිසසසි

අනොවටෙඨන උදකෙන මහියා උබභිජජී තාවදෙ
තමපජජුබභිජජතෙ මහියා ධුවං බුදෙධා භවිසසසි

තාරගණා විරොචනති නකඛතතා ගගන මණඩලෙ
විසාඛා චනදිමයුතතා ධුවං බුදෙධා භවිසසසි

ඛිලාසයා දරීසයා නිකඛමනති සකාසයා
තෙපජජ ආසයා ඡුදධා ධුවං බුදෙධා භවිසසසි

න හොති අරති සතතානං සනතුටඨා හොනති තාවදෙ
තෙපජජ සබෙබ සනතුටඨා ධුවං බුදෙධා භවිසසසි

රොගා තදුපසම්මනති ජීසවජා ච විනසසති
තෙපජජ විගතා සබෙබ ධුවං බුදෙධා භවිසසසි

රාගො තදා තනු හොති දොසො මොහො විනසසති
තෙපජජ විගතා සබෙබ ධුවං බුදෙධා භවිසසසි

භයං තදා න භවති අජජපෙතං පදිසසති
තෙන ලිංගෙන ජානාම ධුවං බුදෙධා භවිසසසි

රජෝ නුදධංසති උදධං අජජපෙතං පදිසසති
තෙන ලිංගෙන ජානාම ධුවං බුදෙධා භවිසසසි

අනිටඨගන්ධා පතතමති දිබබගන්ධා පවායති
සොපජජ වායති ගබෙබා ධුවං බුදෙධා භවිසසසි

සබෙබ දෙවා පදිසසනති ඨපයිත්වා අරූපිනො
තෙපජජ සබෙබ දිසසනති ධුවං බුදෙධා භවිසසසි

යාවතා නිරයා නාම සබෙබ දිසසනති තාවදෙ
තෙපජජ සබෙබ දිසසනති ධුවං බුදෙධා භවිසසසි

කුඩඩා කවාටා සෙලා ච න ගොනතාවරණ තදා
ආකාසභූතා තෙපජජ ධුවං බුදෙධා භවිසසසි

චුති ච උපපතතිච බණෙ තසමිං න විජජති
තානි අජජ පදිසසනති ධුවං බුදෙධා භවිසසතී

දළහං පගගණහ විරියං මා නිවතති අභිකකම
මයමෙපතං පජානාම ධුවං බුදෙධා භවිසසතීති

එහි ඉදං සුත්වාන වචනං යනු; මේ දීපංකර භාග්‍යවතුන් වහන්සේගේ බෝසතුන්ට ප්‍රකාශ කළ වදන් අසා. අසමසස යනු; සම සදෘශ කෙනෙකු නැති බැවින් අසමයන්ට කී පරිදි-

මට ආචාර්යවරයෙක් නැත්තේය. මට සමානයෙක් ද විද්‍යමාන නොවේ. දෙවියන් සහිත ලෝකයෙහි ප්‍රතිපුද්ගලයෙක් නැත්තේය යනුයි.

මහෙසිනො යනු; මහත්වූ ශීල සමාධි ප්‍රඥා ස්කන්ධයන් සොයයි. ගවේෂණය කරයි යනු මහෙසීයි. ඒ මහර්ෂීන්ගේ නරමරූ යනු; මිනිස්සු ද දෙවියෝ ද, මේ වනාහි උත්කෘෂ්ට නිර්දේශයි. සියලු දසදහසක් ලෝකධාතුවෙහි නාග යක්ෂ ආදීනුද ප්‍රමෝද වූහ. බුද්ධබීජංකුරෝ අයං යනු; මේ වනාහි බුද්ධාංකුරයෝ උපත්හයි ප්‍රමෝද වූහ යන අර්ථයි. **උකකුටීසදද්‍දා** යනු; මහත්නාද පවතී. **අපෙඵායෙනති** යනු; අත්වලින් බානුවලට ගසති. දසසහස්සී යනු; දසසහස්‍රී ලෝකධාතුව. **සදෙවකා** යනු; දෙවියන් සමග දසදහසක් ලෝකධාතුව නමස්කාර කරති යන අර්ථය. **යදිමසස** යනු; යදි ඉමසසයි. මෙයම පාඨයි. **විරජඣිසසාම** යනු; ඉදින් නොපැමිණෙන්නමෝ නම්, **අනාගතමහි අදධානෙ** යනු; අනාගත කාලයෙහි. **හෙසසාම** යනු; වන්නෙමු. **සම්මුඛා ඉමං** යනු; මුන්වහන්සේ හමුව. සාමාර්ථයෙහි උපයෝග වචනයි. **නදිං තරනතා** යනු; ගඟ තරණය කරන්නාහු. නදිතරනතා යනු ද පාඨයි. **පටිනිඤ්ඤං** යනු; ප්‍රතිමුඛ තීර්ථය. විරජභවය යනු; විරජඣියාති වරදවා. **යදි මුඤ්චවාම** යනු; ඉදින් මේ භාග්‍යවතුන් වහන්සේ මඟහැර කළයුතු කිස නොනිමවූවෝ වෙමු නම් යන අර්ථයි. **මම කමමං පකිනෙතඤ්ඤා** යනු; මාගේ භාවිතාර්ථ ප්‍රකාශ කොට. **දකඛිණං පදං මුඳධරිං** යනු දකුණු පය එසවූහ. **කතපදකඛිණො යි ද** පාඨයි. **ජිනපුතතා** යනු; දීපංකර ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවකයෙක්. **දෙවාමනුසසා අසුරා ච අභිවාදෙතවාන පකකමුං** යනු; දෙවාදි මේ සියල්ලෝම මට තෙවරක් පැදකුණුකොට පුෂ්පාදියෙන් පූජාකොට මනාව පසඟ පිහිටුවා වැඳ ආපසු හැරී නැවත නැවත බලමින් මිහිරි අර්ථව්‍යඤ්ජනයෙන් යුත් නානා ප්‍රකාර ස්තුතියෙන් වර්ණනා කරමින් ගියහ. **නරා නාගාචගඣබබා අභිවාදෙතවාන පකකමුං** යනු ද පාඨයි. **දසසනං මෙ අතිකකනෙත** යනු; භාග්‍යවතුන් වහන්සේ මාගේ දර්ශන විෂය ඉක්මවූ කල්හි. **ජහිතෙ දසසනූපචාරෙ** කියා ද පාඨයි. **සසංසෙ** යනු; සංඝයා සමඟින් යනුයි. **සයනා උටඨහිතවාන** යනු; හොත් තැනින් කලලින් නැගී. **පලලංකං ආභුජිත්වා** යනු; කළ පර්යංක ඇතිව මල්ගොඩෙහි වාඩිවීම් යන අර්ථයි. හටෙඨා හටෙඨන චිතෙතන ආසනා උටඨහිං තදා යි ද පාඨයි. එය ප්‍රකට අර්ථ ඇත්තේමය. **පීති යා ච අභිසසනෙනා** යනු; ප්‍රීතියෙන් පිනාගියේ. **වසී භූතො** යනු; වසීභාවයට පැමිණියේ. **ඣානෙ** යනු; රූපාවචර අරූපාවචරධ්‍යානයන්හි. **සහසසියමහි** යනු; දසසහස්‍රියෙහි. **ලොකමහි** යනු; ලොකධාතුවෙහි. **මෙ සමො** යනු; මා වැන්නෙක්.

අවිශෙෂයෙන් මෙ සමො නිත්‍ථි යි කියා දූන් එයම නියමයෙන් අසමො ඉදධිධමෙමසු යයි කීය. එහි **ඉදධිධමෙමසු** යනු පස් ඍදධියෙහි යන අර්ථයි. **අලහිං** යනු; ලැබුවෙමි. **ඊදිසං සුඛං** යනු; මෙබඳු සොම්නසක්.

ඉක්බිති සුමේධ තාපසයාණන් දසබලයන් වහන්සේගේ ප්‍රකාශය අසා බුදුබව අත්පත් වූවාක් මෙන් හඟනාහු ප්‍රමුදිත හදින් දසදහසක් ලෝධාහි සුදධාවාස මහබඹුහු අතීත බුදුවරුන් දකීමෙන් බෝසත්වරුන්ගේ නියත විවරණයෙහි උපදනා ප්‍රාතිහාර්ය දකීමෙන් තථාගත වදනෙහි නොවෙනස් බව ප්‍රකාශ කරන්නාහු මා සතුටු කරවමින් මේ ගාථා කීහයි දක්වමින් පලලංකාභුජනෙ මයහං යන ආදිය කීහ.

එහි **පලලංකාභුජනෙ මයහං** යනු; මාගේ පර්යංක වැළඳ ගැනීමෙහි. මෙයම හෝ පාඨයි. **දසසහසසධිවාසිනො** යනු; දසසහස්‍රිවාසී බ්‍රහ්මයෝ. යා පුබෙබ යනු; යම් පෙර. විහතති ලොපය කොට කියනලදයි දතයුතුය. **පලලංකවරමාභුජෙ** යනු; පර්යංකය වැළඳගැන්මෙහි. **නිමිතතානි පදිසසනත** යනු; නිමිති ප්‍රදර්ශනය විය යන අර්ථයි. අතීත පදය කිවයුතු තැන වර්තමාන පදය කියන ලදි. කිව ද අතීත වශයෙන් අර්ථය ගත යුතුය. **තානි අජජ පදිසරෙ** යනු; පෙර ද නියත බෝසතුන්ගේ පලඟ බැඳීමෙහි යම් නිමිති පහළ වීද ඒ නිමිති අදද දක්නට ලැබේ. එබැවින් ඔබ නිසැකවම බුදුවන්නහුය යන අර්ථයි. එම නිමිති උපන්නේ නොවේ. ඊට සමාන බැවින් ඒවා අදද දක්නට ලැබේ යි කී බව දතයුතුය. **සීතං** යනු; සීතත්වයයි. බ්‍යපගතං යනු; පහවිය. **තානි** යනු සීත පහවීම උෂ්ණ සමනය යන අර්ථයි. **නිසසදදා** යනු; අශබ්ද, අනිර්ඝොස, **නිරාකුලා** යනු; අනාකුල. මෙයම හෝ පාඨයි. **නසසදනති** යනු; ගලා නොබසී. නොපෙරළයි. **සවනතියෝ** යනු; ගංගාවෝ. තානි යනු; නොහැමීම් ගලා නොබැසීම්. **ථලජා** යනු; පෘථිවිතලයෙහි පර්වත වෘක්ෂාදියෙහි හටගත්, **අකජා** යනු; උදක පුෂ්පයි. **පුෂඵනති** යනු; පෙර බෝසතුන්ට පිපුණේය. අතීතාර්ථයෙහි වර්තමාන පදයයි දතයුතුය. **තෙපජජ පුපඵවතාන** යනු; ඒ මල් අදද පිපී ඇත යන අර්ථයි. **ඵලහාරා** යනු; ඵලධර වූ. **තෙපජජ** යනු; ඒවා ද අද. පුලලිංග වශයෙන් තෙපි යි කියන ලදි. ලතා ච රුක්ඛා ච යි කී හෙයිනි. **ඵලිතා** යනු; හටගත් ඵල ඇති. **ආකාසථා ච භූමමටථා ච** යනු; අහස්ගත වූ ද පොළෝගත වූ ද. **රතනාදිනි** යනු; මුතු ආදි රත්න. **ජොතනති** යනු; බබළති. **මානුසකා** යනු; මිනිසුන් සන්තක වූයේ මානුසකයි. **දිබබා** යනු; දෙවියන් සතුවූයේ දිබබායි. **තුරියා** යනු; ආතත, විතත, විතතාත, සුසිර, ඝන යයි තූර්ය පසකි. ආතත නම් සම්බැඳි බෙර ආදියෙහි එක්තලයක්

ඇති තූර්යයකි. විතත නම් තලදෙකක් ඇති මුළුමනින්ම වසන ලද මහවීණාදියයි. සුසිර නම් වස්දඬු ආදියයි. ඝන නම් කයිතාලම් ආදියයි. **වජ්ජනති** යනු; යට කී අයුරින් වාදනය කළහ. අතීතාර්ථයෙන වර්තමාන ක්‍රියාපදයයි. මතු මෙවැනි වචනද මෙබඳුය. **අභිරමනති** යනු; එහි දක්‍ෂයන් විසින් මුදන ලදුව මනාතාල ඇති මනාව වාදනය කරන ලදුව නාද කරයි. මනාව හඬ නංවයි යන අර්ථයි. **අභිවසසනති** යනු අභිවසසිංසු යනුයි. වැටුණහ යන අර්ථයි. **කෙපි** යනු; ඒ විසිතුරු මල්වැටෙනු පෙනේ. දෙව්බඹගණ විසින් වගුරුවනු ලබන යන අදහසයි. **ආභුජති** යනු; වැළඳ ගනී. **තෙපජ්ජුභො** යනු; අද ඒ මහාසමුද්‍ර දසදහසක් ලොව යන දෙක. **අභිරවනති** යනු; අභිනාද කරති. **නිරයෙස දසසහසසා** යනු; නොයෙක් දසදහස්. **නිබ්බනති** යනු; ශාන්තියට පැමිණෙති යන අර්ථයි. **තාරකාන** යනු; නක්‍ෂත්‍ර. **තෙපි අජ්ජ පදිසසනති** යනු; සූර්යයාගේ නිර්මල භාවයෙන් අද දාවල්හිද තාරකා දක්නා ලැබේ. **අනොවටෙඨන** යනු; නොවස්නා ලද. භූම්‍යර්ථයෙහි කරණ වචනයි දතයුතුයි. නොහොත් අනෙවටෙඨ යනු අනභිවටෙඨපි යනුයි. නා යනු නිපාතමාත්‍රයි. සුත්‍රාන දූතවචනං ආදියෙහි මෙනි. **තමපජ්ජුබභිජ්ජතෙ** යනු; ඒ ජලය ද අද උඩට බිඳගෙන නැගී සිටී යන අර්ථයි.

මහියා යනු; පොළවෙහි නිසසකක පදයි. **තාරගණා** යනු; ග්‍රහ නක්‍ෂත්‍ර ආදි සියලු තරු සමූහය. **නකඛතනං** යනු; නැකැත් තරු ද. **ගගනමණ්ඩලෙ** යනු; සියලු ගගන මණ්ඩලය බබළයි යන අර්ථයි. **බිලාසයා** යනු; බිල්හි වසන සර්ප මුගටි කිඹුල් ගොයි ආදීහුය. **දරිසයා** යනු; ඣරාසයා යි. මෙයම හෝ පාඨයි. පර්වත විවරයි. **සකාසයා** යනු; තමන්ගේ වාසස්ථානයෙන් තදාසයා යනු ද පාඨයි. එහි එකල බිලයෙන් නික්ම යන අර්ථයි. **නිකඛමනති** යනු; නිකඛමිංසු යාමුයි. **ජුද්ධා** යනු සුජුදධං යනුයි. මනාව උදුරන ලද යන අර්ථයි. **අරති** යනු; උත්කණ්ඨාවයි. **සනතුට්ඨා** යනු; පරම සතුටින් සතුටු වූවාහු. **විනසසනති** යනු; පහවෙත්. **රාගො** යනු; කාමරාගය. **තදා තනූ** යනු; පහත් මට්ටමක වෙයි. මෙයින් අවසන් බවක් නොදක්වයි. **විහතා** යනු; විනාශ කළ. **තදා** යනු; පෙර බෝසතුන්ගේ පර්යංක බැඳීමෙහි යන අර්ථයි. න හවති යනු; නොවෙයි. **අජ්ජපෙතං** යනු; අද ඔබගේ පර්යංකයෙන් සිටීමෙහි ද යන අර්ථයි. මේ භය නොවෙයි. **තෙන ලිංගෙන ජානාම** යනු; ඒ තරුණීන් අපි හැමදෙනම දනිමු. ඔබ බුදුවන්නහුය යන යමක් ඇද්ද එයයි යන අර්ථයි. **අනුදධං සති** යනු; උඩ නොයයි. නොවෙයි. නොසිදුවෙයි. **අනිටයගන්ධො** යනු; දුගඳයි. පකකමති යනු; වෙන්ව යයි. **පවායති** යනු; හැමීය. **සොපජ්ජ** යනු; අද ඒ දිවසුවද ද

පදිසසනති යනු; දිටිමු. **තෙපඡජා** යනු; අද ඒ සියලු දෙවියෝ. **යාවතා** යනු; පරිවෙඡදාර්ථයෙහි නිපාතයි. යම්තාක් ද යන අර්ථයි. **කුඩඩා** යනු; ප්‍රාකාර. **න හොනතාවරණ** යනු; ආවරණකර නොවීය. **තදා** යනු; පෙර. ආකාසභූතා යනු; ඒ ප්‍රාකාර කවාට පර්වත ආවරණ කිරීමට හරස් කිරීමට නොහැකිව අජටාකාශ විය යන අර්ථයි. **චුති** යනු; මරණයයි. **උපපතත** යනු; පිළිසිඳගැන්ම හටගැන්ම. **බණෙ** යනු; පෙර බෝසතුන්ගේ පලඟබැඳීම් ක්‍ෂණයෙහි. **න විජජති** යනු; නොවීය. **තානිපජජ** යනු; අද ඒවාද මරණ උපත් ආදිය යන අර්ථයි. **මා නිවතති** යනු; ආපසු නොයව. **අභිකකම** යනු; පරාක්‍රමවත් වන්නමෙහි සෙස්ස කියන ලදමැයි.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ දිවකුරු බුදුන්ගේ ද දෙවියන්ගේ ද වදන් අසා වඩාත් උත්සාහවත්ව සිතූහ. බුදුවරු නම් හිස් වදන් නැත්තෝය. බුදුවරුන්ගේ කතාවෙහි වෙනසක් නැත. අහසට දැමූ ගලක් වැටීම උපන්නහුගේ මරණය උදිත සූර්යයාගේ නැගීම ගුහාවෙන් නික්මුණු සිංහයාගේ සිංහනාද කිරීම ගැබ්බර ගැහැනියකගේ වැදීම මෙන් ඒකාන්තය. අවශ්‍යයෙන්ම සිදුවෙයි. එමෙන් බුදුවදන් ඒකාන්තය. නොසිස්ය. ඒකාන්තයෙන් මම බුදුවෙමි කියායි. එයින් කියන ලදි.

බුදධසස වචනං සුතවා දසසහසසීන භූමයං
තුටඨ හටෙඨා පමුදිතො එවං චිනෙතසහං තදා

අදෙවඡඤඩවචනා බුදධා අමොඝවචනා ජිනා
විතථං නතථි බුදධානං ධුවං බුදෙධා භවාමහං

යථා ඛිතතං නහෙ ලෙඛඩු ධුවං පත ති භූමියං
තථෙව බුදධසෙටඨානං වචනං ධුව සසසතං
විථකං නතථි බුදධානං ධුවං බුදෙධා භවාමහං

යථාපි සබබසතතානං මරණං ධුව සසසතං
තථෙව බුදධසෙටඨානං වචනං ධුව සසසතං
විතථං නතථි බුදධානං ධුවං බුදෙධා භවාමහං

යථා රතතිකබයෙ පතෙත සුරියුගගමනං ධුවං
තථෙව බුදධසෙටඨානං වචනං ධුව සසසතං
විතථං නතථි බුදධානං ධුවං බුදෙධා භවාමහං

යථා නිකඛනත සයනසස සීහසස නදනං ධුවං
තථෙව බුදධසෙථඨානං වචනංධුව සසසතං
විතථං නත්‍ථි බුදධානං ධුවං බුදෙධා භවාමහං

යථා ආපනනසතතානං භාරමොරොපනංධුවං
තථෙව බුදධසෙථඨානං වචනං ධුව සසසතං
විතථං නත්‍ථි බුදධානං ධුවං බුදෙධා භවාමහං

එහි බුදධසස වචනං **සුත්‍වා දසසහසසී** ච්‍ඡුභයං යනු; දිවකුරු සම්බුදු රදුන්ගේද දසදහසක් සක්වළ දෙවියන්ගේද වචනය අසා. **උභයං** යනු; දෙගොල්ලන්ගේ. සාම්‍යර්ථයෙහි ප්‍රථමා විභක්තියයි. දෙක යනු හෝ වෙයි. **එවං චිනෙතසහං** යනු; මම මෙසේ සිතිමි. **අදෙවජඣවචනා** යනු; දෙයාකාරව පවත්නා වදන් නැත්තෝය. ඒකාන්ත වචන ඇත්තෝය යන අර්ථයි. අවජ්ජදවචනා යනු ද පායයි. අමොඝවචනා යනු; සත්‍ය වචන ඇත්තෝය. **විකථං** යනු; අසත්‍ය වචන නැත යන අර්ථයි. ධුවං බුදෙධා **භවාමහං** යනු; ඒකාන්තයෙන්ම බුදුවෙමි යි නියත වශයෙන් අවශ්‍යයෙන් වීම් වශයෙන් වර්තමාන පදය කරන ලදුයි දතයුතුයි. **සුරියසසුගගමනං** යනු; සූර්යයාගේ උදාවීමයි. මෙයම හෝ පායයි. **ධුවසසතං** යනු; ඒකානික භාවී ද ශාස්වත ද වෙයි. **නිකඛනතසයනසස** යනු; සයනයෙන් **නික්මුණහුගේ. ආපනනසතතානං** යනු; ගැබ්බර ඇතියවුන්ගේ, ගර්භිනීන්ගේ යන අර්ථයි. **භාරමොරොපනං** යනු; බර බහාලීම ගැබ්බහාලීම යන අර්ථයි. මකාරය පදසන්ධිකාරකයි. මෙහි සෙස්ස ද ප්‍රකටමය. ඒ මම ඒකාන්තයෙන් මම බුදුවෙමියි මෙසේ කළ සනිටුහන් ඇතිව බුදුකාරක ධර්ම සෙවීමට බුදුකාරක කොහිද? උඩ යට දිසා විදිසාව ලදුයි සියලු ධර්ම ධාතුව පරීක්ෂා කරන්නාහු පෙර බෝසතුන් විසින් සෙවුනා ලද ඇසුරු කරන ලද පළමු දාන පාරමිතාව දැක මෙසේ තමහට අවවාද කළහ.

සුමේධ පණ්ඩිතයෙනි, ඔබ මෙවක් පටන් ප්‍රථම දාන පාරමිතාව පුරන්නෙහිය. යම්සේ යටිකුරු කළ දියකළය වතුර ඉතිරී නොකොටම වගුරුවමුද? ආපසු නොගනීද එසේ ධනය හෝ පිරිවර හෝ අඹුදරුවන් හෝ අඟපසඟ හෝ නොබලා හැම සැපත් යදියනට කැමති කැමති දේය ඉතිරී නොකොට දෙන්නාහු බෝමුල හිඳ බුදුවන්නේයයි පළමු දාන පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළහ. එයින් කියන ලදි- '

හඤ්ඤ බුදධකරෙ ධමෙම විචිනාමි ඉතොචිතො
උදධං අධො දසදිසා යාවතා ධම්මධාතුයා

විචිනනෙනා නදාදදකබිං පඨමං දානපාරමිං
පුබබකෙහි මහෙසීහි අනුචිණණං මහාපථං

ඉමං තඨං පඨමං තාව දළහං කත්වා සමාදිය
දානපාරමිතං ගචඡ යදි බොධිං පතතුමිචඡසි

යථාපි කුමෙභා සම්පුණෙණා පසස කසසචි අධොකතො
වමතෙ උදකං නිසෙසසං න තත්ථ පරිරකඛති

තථෙව යාචකෙ දිසවා හීනමුකකටඨ මජඣිමෙ
දදාහි දානං නිසෙසසං කුමෙභ විය අධොකතං

එහි හඤ්ඤ යනු; ව්‍යවසර්ගාර්ථයෙහි නිපාතයි. බුදධකරෙ ධමෙම යනු; බුද්ධත්වය සිදුකරන ධර්ම. බුදධත්වකාරක ධර්ම නම් දානපාරමිතාදි දසධර්මයි. **විචිනාමි** යනු; සොයන්නෙමි. පරීක්ෂා කරන්නෙමි යන අර්ථයි. ඉතො චිතො යනු; මෙයින් මෙයම හෝ පාඨයි. ඒ ඒ තන්හි සොයමි යන අර්ථයි. උදධං යනු; දෙව්ලොව. **අධො** යනු; මිනිස් ලොව. **දසදිසා** යනු; දස දිසාවෙහි. ඒ බුද්ධකාරක ධර්ම දෙව්ලොව මනුලොව සරස දිසා විදිසාවල කොතැනක ද යන අදහසයි. **යාවතා ධම්මධාතුයා** යනු; මෙහි යානො යනු සීමා වචනයයි. ධම්මධාතුයා යනු; **සභාවධම්මසස** පවතතනී යයි වචන ශේෂය දතයුතුය. කුමක් කියන ලදද? ස්වභාව ධර්මයන්ගේ නාම රූප අරූප ධර්මයන්ගේ පැවැත්ම යම් පමණ ද එපමණ තන්හි සොයන්නෙමි යන අර්ථයයි. **විචිනනෙනා** යනු; විමසන්නේ පරීක්ෂා කරන්නේ. පුබබතෙහි යනු; පුරාණ බෝසතුන් විසින්. **අනුචිණණං** යනු; පුරුදු කළ ඇසුර කළ. **සමාදිය** යනු; සමාදන්වීම කරව. මා විසින් අද පටන් මේ දාන පාරමිතාව පිරිය යුතුය යන අර්ථයි. **දානපාරමිතං ගචඡ** යනු; දානපාරමිතාවට යව. පූර්ව යන අර්ථයි. **යදි බොධිං පතතු මිචඡස** යනු; ඉදින් බෝමුලට පැමිණ අනුත්තර සම්බෝධියට පැමිණීමට කැමැත්තෙහි නම්. **යසස කසසමි** යනු; දියෙහි හෝ කිරෙහි හෝ යම් කිසිවක. සම්පූර්ණ ශබ්දයෝගය ඇතිවිට ශබ්ද විද්‍යාඥයෝ සම්බන්ධ විභත්තිය කැමති වෙති. කරණාර්ථයෙහි සම්බන්ධ විභත්තිය හෝ ය. යෙන කෙනචි යම් කිසිවකු විසින් යන අර්ථයි. අධොකතො යනු; මුව

යටට හරවන ලද්දේ. **න තෂ්ඨී රිරකබති** යනු; නොරැඳෙයි. **වමතෙ** ව යනු; නිරවශේෂව දිය වැහිරෙයි යන අර්ථයි. **හීන මුකකටඨමජඣිමෙ** යනු; පහත් මැදහත් උසස්. මකාරය පදසන්ධිකාරකයි. **කුමෙහා විය. අධොකතො** යනු; කට යටට හැරවූ. වෙත පත් යදියන් දැක සුමේධය, ඔබ තමහට නොතබා සියලු ධන පරිත්‍යාගයෙන් දාන පාරමිතාව අංග පරිත්‍යාගයෙන් උපපාරමිතාව ජීවිත පරිත්‍යාගයෙන් පරමාර්ථ පාරමිතාව පුරවයි මෙසේ තෙමේ තමහට අවවාද කළේය.

ඉක්බිති බුදධකාරක ධර්ම මෙපමණක්ව නොවිය හැකියයි මත්තෙහි ද පරීක්ෂා කළ උන්වහන්සේ දෙවැනි සීල පාරමිතාව දැක මෙසේ සිතූහ. සුමේධ පණ්ඩිතයෙනි, ඔබ මෙවක් පටන් සීල පාරමිතාව පුරන්නෙහිය. යම්සේ සෙමෙර මුවා ජීවිතය ද නොබලා සිය වලග රක්නා මෙන් ද මෙසේ ඔබ ද මෙතැන් පටන් ජීවිතය ද නොබලා සීලයම රකිමින් බුදුවෙමියි දෙවැනි ශීල පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළහ. එහෙයින් කියන ලදි-

නහෙතො එතතකායෙව බුදධධමමා භවිසසරෙ
අඤඤෙපි විචිනිසසාමි යෙධමමා බොධිපාචනා

විචිනෙනතා තදාදදකඛිං දුතියං සීලපාරමිං
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං භවං දුතියං තාව දළහං කත්වා සමාදිය
සීලපාරමිතං ගචඡ යදි බොධිං පතතුමිචඡසි

තථාපි චමරි වාළං කිසමිඤචි පාතිලගිතං
උසෙති මරණං තත්ථ න විකොපෙති වාළධිං

තථෙව චතුසු භූමිසු සීලානි පරිපූරය
පරිරකඛ සබබදාසීලං චමරි විය වාළධිනති

එහි **නහතෙ** යනු; මෙපමණක්ම නොවේ. **බොධිපාචනා** යනු; මාර්ගය මෝරවන. සර්වඥතාඥානය මෝරවන හෝ. **දුතියං සීලපාරමිං** යනු; සීලය නම් සියලු කුසල් දහම්වලට පිහිටයි. සීලයෙහි පිහිටා කුසල් දහමින් නොපිරිහෙයි. සියලු ලොවී ලොවුතුරා ගුණ ලබයි. එහෙයින්

සීලපාරමිතාව පිරිය යුතුය. දෙවැනි සීලපාරමිතාව දුටුවේය යන අර්ථයි. ආසෙවිත නිසෙවිතං යනු; ඇසුරු කළ මෙන්ම බහුලද කළ. **චමරී** යනු; චමරී මුවාය. **කිසම්ඤ්චි** යනු; යම්කිසි ගස්වැල් කටු ආදි කිසිවක. **පතිවිලගහිතං** යනු; පැටලුණු. **තඤ්ච** යනු; යම් තැනෙක පැටලුණේද එහිම සිට මරණයට පත්වෙයි. **නා විකොපෙති** යනු; නොසිඳියි. **වාලධිං** යනු; වලග කඩාගෙන නොයයි. එහිම මරණයට පත්වෙයි යන අර්ථයි. **චතුසු** භූමිසු සීලං යනු; සතර ස්ථානයෙක්හි බෙදන ලද සීලය. පාතිමොක්ඛ සංවර ඉන්ද්‍රිය සංවර ආජීවපාරිසුදධි පච්චය සනනිසසිත වශයෙන් යන අර්ථයි. භූමි වශයෙන් වනාහි භූමි දෙකෙක්හි සීමාවෙයි. එය ද කුසල්මය. **පරිපූරය** යනු; කඩ සිදුරු කබර ආදිය රහිත සපුරව. **සබබදා** යනු; හැමකල්හි. චමරී විය යනු; සෙමරකු මෙන්. මෙහි සෙස්ස ද පැහැදිලිමය.

ඉක්බිති බුදුකුරු දහම් මෙපමණක් නොවෙතැයි මත්තෙහි ද සලකන උන්වහ්නසේට තෙවැනි නෙකඛම්ම පාරමිතාව දැක මෙසේ සිතිණ. සුමේධ පණ්ඩිතයෙනි, ඔබ මෙතැන් පටන් නෙකඛම්ම පාරමිතාව පිරිය යුතුය. යම් සේ බොහෝකල් බන්ධනාගාරයෙහි වසන මිනිසෙක් එයට සෙනෙහෙ නොකරයි ද එසේම කලකිරී නොවසනු කැමති වෙයිද එමෙන් ඔබ ද සියලු භවයන් බන්ධනාගාර කොට සිතන්න. සියලු භාවයෙන් කලකිරී මිදෙනු කැමතිව නෙෂක්‍රම්‍යයටම අභිමුඛ වන්න. මෙසේ බුදුවන්නෙහියයි තෙවන නෙකඛම්ම පාරමිතාව දැඩිකොට ඉටාගත්හ. එහෙයින් කියන ලදි-

න හෙතෙ එතතකා යෙව බුදධධම්මා හවිසසරෙ
අඤ්ඤෑපි විචිනිසසාමි යෙ ධම්මා බොධිපාචනා

විචිනනෙතා තදාදදකඛිං තතියං නෙකඛම්ම පාරමිං
පුබබකෙ හි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං ත්වං තතියං තාව දළහං කත්වා සමාදිය
නෙකඛම්මපාරමිං ගචඡ යදි බොධිං පතත මිවඡසි

යථා අඤ්ඤෙ පුරිසො චිර වුත්ථා දුබදදිතො
න තත්ථ රාගං අභිජනෙති මුතතිං යෙව ගවෙසති

තථෙව ත්වං සබ්බභවෙ පසස අන්ධභූතෙ විය
නෙක්ඛම්මාභිමුඛො හොහි භවතො පරිමුත්තියා'නි

එහි **අන්ධභූතෙ** යනු; බන්ධනාගාරයෙහි. **වීර වුත්තො** යනු; බොහෝ කල් විසූ. **දුබ්දිතො දුක්ඛින්** පීඩිත. **තත්‍ර** යනු; අන්ධභූතයෙහි. රාගං යනු; සෙනහය. **න ජනෙති** යනු; නොඋපදවති. මේ සිරගෙය හැරදමාම මම වෙන තැනක යෙමියි මෙසේ එහි ඇල්මක් නොඋපදවයි. කුමක් කරයිද? **මුත්තිං යෙව ගවෙස නි** යනු; මුක්තියම මෝක්ෂයම සොයයි යන අදහසයි. **නෙක්ඛම්මාභිමුඛො** යනු; නික්මීමටම අභිමුඛ වෙව. **භවතො** යනු; සියලු භවයෙන්. පරිමුත්තියා යනු; මිදීම පිණිස, **නෙක්ඛම්මාභිමුඛො හුත්වා සමෙබාධිං පාපුණිසසති** කියා ද පාඨයි. මෙහි සෙස්ස ද පැහැදිළිමය.

ඉක්බිති බුද්ධකාරක ධර්ම මෙපමණක්ම නොවිය යුතුයයි සලකන උන්වහන්සේට සතරවන ප්‍රඥා පාරමිතාව දැක මෙසේ සිතිණ. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් සිට ප්‍රඥා පාරමිතාව පුරන්නෙහිය. පහත් මැදහත් උසස් සියලු පණ්ඩිතයන් වෙත කිසිවකු අත නොහැර ගොස් ප්‍රශ්න අසන්න. ය මිසේ පිණ්ඩපාතික භික්ෂුව හීනාදිභේද ඇති කුලයන්හි කිසිවක් අතනොහැර පිළිවෙලින් පිණ්ඩපාතයෙහි හැසිරෙන්නේ වහා යැපීම් ප්‍රමාණය ලබන්නේ ද එසේ ඔබ ද සියලු පණ්ඩිතයන් වෙත ගොස් අසන්නාහු බුදුවන්නාහයි සතරවන ප්‍රඥා පාරමිතාව දැඩිව අධිෂ්ඨාන කළහ. එහෙයින් කියන ලදි-

නහෙතෙ එත්තකානෙව බුද්ධධම්මා භවිසසරෙ
අඤ්ඤෙපි විචිනිසසාමි යෙ ධම්මා බොධිපාචනා

විචිනනෙකා තදාදකඛිං චතුත්ථං පඤ්ඤාපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං ත්වං චතුත්ථං තාව දළහං කත්වා සමාදිය
පඤ්ඤාය පාරමිං ගචඡ යදි බොධිං පත්තු මිච්ඡසි

යථා හි භික්ඛු භික්ඛනෙතා හීනමුක්කටඨ මජ්ඣිමං
කුලානි න විවජ්ජනෙකා එවං ලභති යාපනං

තථෙව තවං සබබකාලං පරිපුචඡනෙතා බුධං ජනං
පඤඤාය පාරමිං ගනතවා සමෙබාධි පාපුණිසසසිති

එහි භිකඛනෙතා යනු; පිඬු පිණිස හැසිරෙන්නේ. හීනමුකකටථ-මජඣිමෙ යනු; හීන උත්කෘෂ්ට මධ්‍යම කුල යන අර්ථයි. ලිංග විපර්‍යාසය කරන ලදි. න විචඡනෙතා යනු; අත නොහරින්නේ. ගෙපිළිවෙල හැර හැසිරීම විවර්ජනය නමි. එසේ නොකොට යන අර්ථයි. යාපනං යනු; යැපීම් මාත්‍රය. පණ රැඳවීම් ආහාර ලබයි යන අර්ථයි. පරිපුචඡනෙතා යනු; ස්වාමීනි, කුසලය කුමක්ද? අකුසලය කුමක්ද? සාවද්‍යය කුමක්ද? නිරවද්‍යය කුමක්ද? ආදි ක්‍රමයෙන් ඒ ඒ තැන ප්‍රකට පණ්ඩිත ජනයා වෙත එළඹ විමසන්නේ යන අර්ථයි. බුධං ජනං යනු; පණ්ඩිත ජනයා. බුධෙ ජනෙ යනුද පාඨයි. පඤඤාය පාරමී යනුයෙහි පඤඤා පාරමිතං ගනතවා යිද පාඨයි. මෙහිද සෙස්ස ප්‍රකටය.

ඉක්බිති බුදුකුරු දහම් මෙවිතරක්ම නොවිය යුතුයයි විමසන උන්වහන්සේට පස්වන විරිය පාරමිතාව දැක මෙසේ සිතිණ. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් පටන් විරිය පාරමිතාව පුරන්නෙහිය. යම් සේ මෘගරාජ සිංහයා සියලු ඉරියව්හි දැඩි වීර්‍යය ඇත්තේ වෙයිද එසේ ඔබ ද සියලු භවයන්හි සියලු ඉරියව්වල නොපසුබට වීර්‍යය ඇතිවම බුදුවන්නෙහි යයි පස්වන විරිය පාරමිතාව දැඩිකොට ඉටා ගත්තේය. එහෙයින් කියන ලදි-

නහෙතෙ එතතකා යෙව බුදධධමමා හවිසසරෙ
අඤඤෙපි විචිනිසසාමි යෙ ධමමා බොධිපාචනා

විචිනනෙතා තදාදකඛිං පඤචමං විරියපාරමිං
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං තවං පඤචමං තාව දළහං කතවා සමාදිය
විරිය පාරමිතං ගචඡ යදි බොධි සඤචිචඡසි

යථාපි සීහො මිගරාජා නිසජජටඨාන චංකමෙ
අලීනවිරියො හොති පගගහිතමනො සදා

තථෙව තවං සබබභවෙ පගගණහ විරියං දළහං
විරිය පාරමිතං ගනතවා සබෙබාධිං පාපුණිසසසිති

එහි **අලීනවිරියෝ** යනු; පසුබට නොවූ වීර්යයයි. **සබබභවෙ** යනු; උපනුපත් භවයෙහි. සියලු භවයන්හි යන අර්ථයි. **ආරද්ධවිරියෝ හුත්වා සමෙබාධිං පාපුණිසසසී** කියා ද පාඨයි. මෙහිද සෙස්ස ප්‍රකටමය.

ඉක්බිති බුදුකුරු දහම් මෙපමණක් නොවෙතැයි මත්තෙහි විමසන උන්වහන්සේට සවන බන්ති පාරමිතාව දක මෙසේ සිත්විය. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් සිට ක්‍ෂාන්ති පාරමිතාව පුරව. සම්මානයෙහිද අවමානයෙහි ද ඉවසන්නෙක්ම වන්න. යම්සේ පොළොවෙහි පිරිසිදු දේත් දමයි. අපිරිසිදු දේත් දමයි. එයින් පොළව ස්නේහත් නොකරයි. වයිරත් නොකරයි. ඉවසයි. පිළිගනියි. දරාසිටින්නේමය. එසේ ඔබ ද සියලු සම්මාන අවමානවල ක්‍ෂමා ඇතියෙක්වම බුදුවන්නෙහි යයි ක්‍ෂාන්ති පාරමිතාව දැඩිව ඉටාගත්තේය. එයින් කියන ලදි-

නහෙතෙ එතතකා යෙව බුදධධමමා හවිසසරෙ
අඤඤෙපි විචිනිසසාමි යෙධමමා බොධිපාචනා

විචිනනෙතං තදාදදකඛිං ඡටඨමං ඛනතිපාරමිං
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං ත්වං ඡටඨමං තාව දළහං කත්වා සමාදිය
තත්ථ අදෙවඡඣමනසො සමෙබාධිං පාපුණිසසයි

යථාපි පථවී නාම සුචිම්පි අසුචිම්පිච
සබබං සහති නිකෙඛපං න කරොති පටිඝං තයා

තථෙව කිම්පි සබෙබසං සම්මානනාවමානනකඛමො
ඛනති පාරමිතං ගනත්වා සමෙබාධිං පාපුණිසසසීති

එහි **අදෙවඡඣමනසො** යනු; ඒකාන්ත මනස් ඇත්තේ. **සුචිම්පි** යනු; සඳුන් කොකුම් ගඳමල් ආදි පිරිසිදු දෙය ද **අසුචිම්පි** යනු; සර්ප බලු මිනිස් කුණප මළමුත්‍ර කෙළ සොටු ආදි අපිරිසිදු දෙයද. **සහති** යනු; ක්‍ෂමා කරයි. ඉවසයි. **නිකෙඛපං** යනු; දමන ලද්ද. **පටිඝං** යනු; ක්‍රෝධයයි. **තයා** යනු; ඒ වෘත්තියෙන් ඒ ඉවසීමෙන්. පටිඝං දයා යනු ද පාඨයි. එහි අර්ථය ඒ බහාලීමෙන් තරහක් අනුකූලතාවක් නොකරයි යනුයි. **සම්මානනාව මානනකඛමො** යනු; ඔබ ද සියලුම සම්මානනාවමානන

ඉවසන්නෙක් වෙව යන අර්ථයි. තථෙවත්‍වමපි සබ්බදාවෙ සම්මානන විමානකඛමො කියාද පායයි. ඛන්ති පාරමී පිරීම් වශයෙන් ගොස් යන අර්ථයි. මෙහි සෙස්ස ද ප්‍රකටය. මින් පසු මෙපමණකුදු නොකියා යම් යම් තැනෙක විශේෂයක් වෙයි නම් එය එයම කියා පායාන්තර දක්වා යන්නෙමු.

ඉක්බිති බුද්ධකාරක ධර්ම මෙපමණක්ම නොවෙතැයි මත්තෙහි සලකන උන්වහන්සේට සත්‍ය පාරමිතාව දැක මෙසේ සිතිණ. සුමේධ පණ්ඩිතයෙනි, ඔබ මෙතැන් සිට සත්‍ය පාරමිතාව පුරන්නෙහිය. හිසට හෙණ වැටෙද්දී වුව ධනාදිය සඳහා ඡන්දාදි වශයෙන් දැන දැන බොරු නොකියව. ඔෂධී තරුව සියලු ඍතුවල සිය ගමන්මඟ වෙනස් කොට අන්මඟක නොගොස් තම මඟෙහිම යන්නා සේ ඔබ ද සත්‍යය හැර මුසාවාදයක් නම් නොකියමින්ම බුදුවන්නෙහි යයි සත්වන සත්‍යය පාරමිතාව දැඩි සේ අධිෂ්ඨාන කළහ. එයින් කියන ලදී.

නහෙකෙ එතකා යෙව -පෙ-
විචිනනෙකා තදාදදකඛිං සතතමං සවවපාරමිං
පුබබතෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං තවං සතතමං තාව දළහං කත්වා සමාදිය
තත්‍ථ අදෙවඡන්‍දවවනො සමෙබාධිං පාපුණිසසසි

යථාපි ඔසධී නාම තුලාභූතා සදෙවකෙ
සමයෙ උතුමසෙස වා නෙවොකනමති වීථිතො

තථෙව තවමපි සවෙවසු මා වොකකමහි වීථිතො
සවවපාරමිතං ගනත්වා සමෙබාධිං පාපුණිසසසීති

එහි තත්‍ථ යනු; සත්‍ය පාරමිතාවෙහි. අදෙවඡන්‍ද වවනො යනු; නොවෙනස් වදන් ඇත්තේ. ඔසධී නාම යනු; ඔසධී තාරකාව. ඖෂධ ගැනීමෙහි ඔෂධී තරු උදාව බලා ඖෂධ ගනිති. එහෙයින් ඔසධීකාරකායි කියන ලදි. තුලාභූතා යනු; ප්‍රමාණභූතව. සදෙවකෙ යනු; දෙවියන් සහිත ලෝකයට. සමයෙ යනු; වර්ෂා සමයෙහි. උතුවසෙස යනු; හේමන්ත ගිම්හ ඍතුවල සමසෙ උතුවටෙට කියා ද පාඨයි. එහි සමයෙ යනු

ගිම්හයෙහි. **උතුවසෝ** යනු; හේමන්තයෙහි සහ වස්සානයෙහි යන අර්ථයි. **නෙවොකකමෙකි විථිතො** යනු; ඒ ඒ ඍතුවෙහි තමන්ගේ ගමන් මාර්ගයෙන් ඉඩක් නොවෙයි. වෙනස් නොවෙයි. යම් යම් පල දෙන ඖෂධ ඇද්ද ඒ ඒ පල දීමෙන් සමසක් නැගෙනහිරට යයි. සමසක් බටහිර දෙසට යයි. නැතහොත් **ඔසධීනාම** යනු; ඖෂධයි. ඉඟුරු තිප්පිලි ගම්මිරිස් ආදියයි. **නෙවොකකමනි** යනු; වෙන්ම තමන්ගේ පල නොදී නොනවතී. විථිකො යනු; ගමන් මඟින්. පිත නසන දෙය පිත නසාමැයි. වාතය නසන දෙය වාතය නසත්වායි. සෙම නසන දෙය සෙම නසන්නේමය යන අර්ථයි. මෙහි සෙස්ස ප්‍රකටය.

ඉක්බිති බුද්ධකාරක ධර්ම මෙපමණක් නොවෙතැයි ඉදිරියටත් සිතන උන්වහන්සේට අටවන අධිෂ්ඨාන පාරමිතාව දැක මෙසේ අදහස් විය. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් සිට අධිෂ්ඨාන පාරමිතාව ද පිරිය යුතුය. යමක් ඉටන්නෙහිද එහි නිශ්චල විය යුතුය. යම් සේ පර්වතය හැම දිසාවෙන් සුළං හමද්දීත් කම්පා නොවෙයි ද නො සැලෙයි ද තම ස්ථානයෙහිම සිටීද එමෙන් ඔබ ද තම අධිෂ්ඨානයෙහි නිශ්චල වෙමින්ම බුදුවන්නෙහිය. අටවන අධිෂ්ඨාන පාරමිතාව දැඩිව ඉටාගත්හ. එයින් කියන ලදි-

නහෙතෙ එතතකා යෙව -පෙ-
විචිතනෙතාදදකඛිං අටඨමං අධිටඨානපාරමිං
පුබබකෙහි මහෙසීහි අසෙවිත නිසෙවිතං

ඉමං තවං අටඨමං තාව දළං කතවා සමාදිය
තතථ තවං අචලො සුතවා සමෙබාධිං පාපුණිසසසි

යථාපි පබබතො සෙලො අචලො සුපපටඨිතො
න කමපති භුසවාතෙහි සතටඨානොව නිටඨති

තතතව තවමපි සබබදා අචලො භව
අධිටඨානපාරමිං ගනතවා සමෙබාධිං පාපුණිසසසීති

එහි **සෙලො** යනු; සෙල්මුවා. **අචලො** යනු; නිසල සුපපතිටඨිතො යනු; අචලත්වයෙන් මනාව පිහිටි. යථාපි පබබතො අචලො නිබාකො

යනු ද පාඨයි. **භූසමා** තෙහි යනු; බල වත් වාතයෙන්. **සකටඨානෙ** යෙව යනු; තම ස්ථානයෙහිම, සිටි ස්ථානයෙහිම යන අර්ථයි. මෙහි සෙස්ස පැහැදිළිය.

අනතුරුව බුදධකර්ම මෙපමණක් නොවිය හැක්කේ යයි වැඩිදුරටත් විමසන උත්වහන්සේට නවවන මෙතතා පාරමිතාව දක මෙසේ සිත් විය. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් පටන් මෙතතා පාරමිතාව පුරව. හිතයන් කෙරෙහිද අහිතයන් කෙරෙහිද එකම යන ඇත්තෙක් වන්න. යම් සේ ජලය පාපී ජනයාට ද කල්‍යාණ ජනයාට ද සිහිල් බව සමානව පතුරුවයිද එමෙන් ඔබද සියලු සතුන් කෙරෙහි මෙත්සිතින් එක්සිත්ව බුදුබව ලබන්නෙහියයි නමවන මෙතතා පාරමිතාව දඩිව අධිෂ්ඨාන කළහ. එහෙයින් කියන ලදි-

නහෙතෙ එතතකා යෙව -පෙ-

විචිනනෙතා තදාදදකබිං නවමං මෙතතා පාරමිං
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං තවං නවමං තාව දළහං කත්වා සමාදිය
මෙතතාය අසමෝ හොහි යදි බොධිං පතතු මිවජසි

යථාපි උදකං නාම කල්‍යාණෙ පාපකෙ ජනෙ
සමං එරති සීතෙන පවාහෙති රජෝ චලං

තථෙව තවමපි අහිතහිතෙ සමං මෙතතායභාවය
මෙතතා පාරමිතං ගනත්වා සමෙබාධිං පාපුණිසසසිති

එහි අසමෝ හොහි යනු; මෛත්‍රී භාවනාවෙන් අසමානයෙක් වන්න. තත්‍ථ තවං සමසොම හොහි යනු ද පාඨයි. එය ප්‍රකට අර්ථ ඇත්තේය. **සමයං** යනු; තුල්‍යයි. එරති යනු; ස්පර්ශ කරයි. **පවාහෙති** යනු; පිරිසිදු කරයි. රජෝ යනු; ආගන්තුක රජස්මී. මලං යනු; ශරීරයෙන් නැගුණ බහදිය කුණු ආදියයි. රජමලං යි ද පාඨයි. එම අර්ථයමැයි. **අහිත හිත** යනු; අහිතයන් ද හිතයන් ද මිතුරන් ද සතුරන්ද යන අර්ථයි. මෙතතාය භවය යනු; මෛත්‍රිය දියුණු කරව. වඩව මෙහි සෙස්ස ප්‍රකටය.

අනතුරුව බුද්ධකාරක ධර්ම මෙතුවක් නො වෙතැයි මතු ද පරීක්ෂා කරන උන්වහන්සේට දසවැනි උපෙක්ෂා පාරමිතාව දැක මෙසේ සිත් විය. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් පටන් උපෙක්ෂා පාරමිතාව පුරන්න. සැපයෙහි ද දුකෙහි ද මධ්‍යස්ථයෙක් වන්න. යම්සේ පොළොව සුචි දේත් අසූචි දේත් දමන කල මධ්‍යස්ථව ගියද එමෙන් ඔබ ද සුවදුක් දෙක්හි මධ්‍යසථ වෙමින් බුදුබව ලබන්නෙමැයි දස උපෙක්ෂා පාරමිතාව දැඩිව ඉටුවූහ. එහෙයින් කියන ලදි-

නහෙතෙ එතතකායෙව -පෙ-

විචිනනෙකා තදාදදකබිං දසමං උපෙකඛාපාරමිං
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං

ඉමං කං දසමං තාව දළහං කත්වා සමාදිය
තුලාභූතො දළෙහා හුත්වා සමෙබාධිං පාපුණිසසසි

යථාපි පථවී නාම නිකඛිතතං අසුචිං සුචිං
උපෙකඛති උභොපෙතෙ කොපානුනය වජජිතා

තථෙව ත්වමපි සුබදුකෙඛ තුලාභූතො සදා භව
උපෙකඛා පාරමිං ගනත්වා සමෙබාධිං පාපුණිසසසීති

එහි **තුලාභූතො** යනු; මධ්‍යසථ භාවයෙන් සිටියේ තුලාදණ්ඩ මෙනි. තුලිකව සමව සිටී. පහත් නොවෙයි. ඉහළ ද නොයයි. එමෙන් ඔබ ද සුවදුක්හි තරාදියක් වෙන්වී බුදුබවට පැමිණෙන්න. කොපානුනය වජජිතා යනු; වෛරය හෝ අනුරාග නැතිව. දයාකොප විවජජිතා යි ද පාඨයි. එයම අර්ථයි. සෙස්ස ක්‍ෂාන්ති පාරමිතාවෙහි කීනයින් දතයුතු.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ මේ දසපාරමී ධර්ම විමසා අනතුරුව සිතූහ. මෙලොව බෝසතුන් විසින් පිරිය යුතු බෝධිය මුහුකුරුවන බුදුධකාරක ධර්ම මෙපමණක්මය. මෙයින් වැඩි නැත. මේ බුදුධකාරක ධර්ම උඩ අහසෙහි නැත. යට පොළෙවෙහිත් නැත. නැගෙනහිර ආදි දිශාවලත් නැත. මාගේ හදවත් අතරම පිහිටියේය. එය සිය හදවතෙහි පිහිටි බව දැක ඒ සියල්ල දැඩිකොට ඉටා යළියළිත් මෙනෙහි කරන්නාහු

අනුලොම් පිළිලොම් වශයෙන් මෙනෙහි කළහ. අගින් ගෙන මුලට පැමිණවූහ. මුලින් ගෙන අගට පැමිණවූහ. මැදින් ගෙන දෙපසින් අවසන් කරති. දෙපසින් ගෙන මැදින් අවසන් කරති. බාහිර වස්තු පරිත්‍යාගය පාරමිතා නම්. අංග පරිත්‍යාගය උපපාරමිතා නම්. ජීවිත පරිත්‍යාගය පරමත්ථ පාරමිතා නම්. දසපාරමී දස උපපාරමී දසපරමත්ථ පාරමී යුගල කාලයක් වෙන්කරන්නාක් මෙන් මෙනෙහි කළහ. දසපාරමී මෙනෙහි කරන උන්වහන්සේගේ ධර්ම තේජසින් නහුත සතරකින් හා දෙලක්‍ෂයක් යොදුනින් බහල විපුල මේ මහපොළොව ඇතකු විසින් මඩනා ලද නලකලාපයක් මෙන් ද ඉපිළෙන උක් යන්ත්‍රයක් මෙන් ද මහාරාව නංවමින් කම්පා විය. ප්‍රකම්පා විය. වෙවුලා ගියේය. කුඹල් සකක් මෙන්ද තෙල් යන්ත්‍රයක් මෙන්ද පරිභ්‍රමණය විය. එහෙයින් කියන ලදි.

එතනකා යෙව තෙ ලොකෙ යෙධම්මා බොධිපාචනා
තකුදධං නත්ථි අඤ්ඤත්‍ර දළහං තත්ථ පතිමටඨහ.

ඉමෙ ධම්මෙ සම්මසතො සභාවසරස ලකඛණෙ
ධම්මතෙජෙන වසුධා දසසහසසී පකම්පථ

චලති රවති පුථුවී උච්ඡුයනතංව පීළිතං
තෙලයනෙත යථා චකකං එවං කම්පති මෙදිනී

එහි එතනකා යෙව යනු; දක්වන ලද දස පාරමිතාවල නොඅඩු නොවැඩි බව දක්වීම පිණිස කියන ලදි. **තකුදධ** යනු; ඒ දස පාරමිතාවට වැඩි. **නත්ථි අඤ්ඤත්‍ර** යනු; අඤ්ඤත්‍ර ලක්‍ෂණ ශබ්දශාස්ත්‍රයෙන් ගතයුතුය. ඒ දස පාරමිතාවෙන් අන්‍ය බුදුකාරක ධර්මයක් නැතැයි යන අර්ථයි. **තත්ථ** යනු; ඒ දසපාරමිතාවල. **පතිටඨහ** යනු; සිටුව. පුරමින් සිටුව යන අර්ථයි. **ඉමෙ ධම්මෙ** යනු; පාරමී ධර්මයන්හි. **සම්මසකො** යනු; පරීක්‍ෂා කරන්නහුගේ අනාදරාර්ථයෙහි සම්බන්ධ පදයි දතයුතුයි. **සභාව සරස ලකඛණෙ** යනු; ස්වභාව සංඛ්‍යාත සරස ලක්‍ෂණ වශයෙන් මෙනෙහි කරන්නහුගේ යන අර්ථයි. **ධම්මතෙජෙන** යනු; පාරමී පරිචය ඤාණ තේජසින්. **වසුධා** යනු; වසු යයි රුවන් කියනු ලැබේ. එය දරානුයි පිහිටානුයි හෝ වසුධා නම්. පොළවයි. **පකම්පථ** යනු; කම්පා විය. සුමේධ පණ්ඩිතයන් පාරමිතා පරීක්‍ෂා කරද්දී උන්වහන්සේගේ ඥානතේජසින් දසසහස්‍රී ලෝකධාතුව ප්‍රකම්පා විය යන අර්ථයි. **චලති** යනු; චක්‍රාකාරව

කම්පා විය. **රථකි** යනු; නාදවෙයි. කෑගසයි. උච්ඡුයනතංව **පිළිතං** යනු; තෙරපන ලද උක් යන්ත්‍රයක් මෙන්. **ගුළයනතංව පිළිතං** යනුද පැයයි. එම අර්ථය මැයි. **තෙලයනෙත** යනු; තෙල්මඩින යන්ත්‍රයෙහි. යථා චකකං යනු; චක්‍රයන්ගේ මහාචක්‍ර යන්ත්‍රයක් මෙන්. එවං යනු; තෙල්මඩින චක්‍රයක් කරකැවෙන්නාක් මෙන් කැරකෙයි. කම්පා වෙයි. එසේ මේ පොළොව කම්පා වෙයි යන අර්ථයි. මෙහි සෙස්ස පැහැදිළිය.

මෙසේ පොළොව කම්පා වෙද්දී රටම නුවරවැසි මිනිස්සු භාග්‍යවතුන් වහන්සේ වළඳවන්නාහු සිටිය නොහැකිව කල්පාන්ත වාතයෙන් පහරන ලද මහසල්ගසක් මෙන් මුසපත්ව වැටුණහ. කළ ආදි කුඹල්බඩු පෙරළෙමින් එකිනෙක හැපෙමින් සුණුවිසුණු විය. මහජනයා බියෙන් තැතිගෙන ශාස්තෘන් වහන්සේ කරා ගොස් කිමෙක්ද භාග්‍යවතුන් වහන්ස, මෙය නානාවර්තයක්ද? භූත යක්ෂ දේවතාවන් අතර කිසියම් ආවර්තයක්ද? අපි මෙය නොදනිමු. එහෙත් මේ සියලු මහජනයා උපදාතය. කිමෙක්ද මේ ලෝකයට අයහපතක් වෙයිද. යහපතක් වෙයිද? අපට මීට කාරණා වදාළ මැනවැයි කීහ.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ බස් අසා ඔබලා බිය නොවව්. නොසිතව්. මේ හේතුවෙන් ඔබලාට බියක් නැත. සුමේධ පණ්ඩිත අනාගතයෙහි ගෞතම නම් බුදුවන්නේ යයි අද මා විසින් යමක් පවසන ලදද හෙතෙම දැන් පාරමිතා මෙනෙහි කරයි. මෙනෙහි කරන ඔහුගේ ධර්ම තේජසින් සියලු දසදහස් ලෝදා එකවර කම්පා වෙයි. නාදකරයි. එහෙයින් කියන ලදි.

යාවතා පරිසා ආසි බුදධසස පරිවෙසනෙ
පවෙධමානා සාතත්‍ථ මුවජිතා සෙති භූමියං

සටා නෙ කසහසසානි කුමහීනඤව සතා බහු
සඤචුණණා මථිකා තත්‍ථ අඤඤමඤඤං පසටථිකා

උබබිගගා තසිතා සීතා හනතා බ්‍යධිතමානසා
මහාජනා සමාගමම දීපංකරමුපාගමුං

කිං භවිසසති ලොකසස කලයාණමථ පාපකං
සබබා උපදදුතො ලොකො තං විනොදෙහි චකඛුම

තෙසං තදා සඤඤපෙසි දීපංකරෝ මහාමුනි
විසඝට්ඨා හොථ මාභාථ ඉමසම්ං පයවිකමපනෙ

යමහං අජජ ව්‍යාකාසිං බුදෙධා ලොකෙ භවිසසති
එසෝ සම්මසතිධම්මං පුබබකං ජිනසෙවිතං

තසස සම්මසතෝ ධම්මං බුදධභූමිං අසෙසතෝ
තෙනායං කම්පිතා පුථුවි දසසහසසී සදෙවතෙහි

එහි යාවතා යනු; යම්තාක්. ආසි යනු; විය. සාතදා පරිසා ආස කියා ද පාඨයි. එහි යම් පිරිසක් සිටියේ වීද යන අර්ථයි. පවෙධමානා යනු; කම්පාවන්නාසු. සා යනු; ඒ පිරිසයි. තහඨ යනු; ඒ වළඳවන තන්හි. සෙති යනු; සයනය කළහ. සමා යනු; කළවල. සම්බන්ධාර්ථයෙහි ප්‍රථමායි. නොඑක් දහස් ගණන් කළ යන අර්ථයි. සංචුණණා මථිතා යනු; කුඩුවූයේද මථනය වූයේද. මථිත සංචූර්ණ වූ යන අර්ථයි. ඤඤමඤඤං පසටථිතා යනු; එකිනෙක ගැටුණාහු. උබබිගගා යනු; ත්‍රාසයට පත් හදඇත්තාහු. තසිතා යනු; හටගත් ත්‍රාස ඇත්තාහු. භීතා යනු; භයහීත වූවාහු. හනනා යනු; භ්‍රාන්ත සිතැත්තාහු, විභ්‍රානත සිත් ඇත්තාහු යන අර්ථයි. මේ සියල්ල පර්යාය වචනයි. සමාගමම යනු; එක්රැස්ව. මෙයම හෝ පාඨයි. උපදදුතො යනු; උපහත වූ, රෝගී වූ. තං විනොදෙහි යනු; ඒ උවදුරු බිය පහකරනු මැනව. නසනු මැනව යන අර්ථයි. චකඛුම යනු; පසැසින් චක්ෂුර්මත් වූ තෙසං තදා යනු; ඒ ජනයා එදා. උපයොගාර්ථ සම්බන්ධ විභතතිපදයි. සඤඤපෙසි යනු; ඇඟවීය. අවබෝධ කරවීය. විසඝට්ඨා. විස්වස් සිත් ඇත්තාහු. මා භාථ යනු; බිය නොවව්. යමහං යනු; මම යම් සුමේධ පණ්ඩිතයකු. ධම්මං යනු; පාරමී ධර්ම. පුබබකං යනු; පෞරාණික ජිනසෙවිතං යනු; ජිනයන් විසින් බෝසත් කල සෙවුනා ලද යන අර්ථයි. බුදධභූමිං යනු; බුදධපාරමී කෙන යනු; ඒ සම්මර්ශන හේතුවෙන් කම්පිතා යනු; සැලුණු. සදෙවකෙ යනු; සදෙවක ලෝකයෙහි.

ඉක්බිති මහජනයා තථාගත වචනය අසා තුටුපහටුව මල්ගඳ විලවුන් ආදිය ගෙන රමම නුවරින් නික්ම බෝසතුන් වෙත එළඹ මාලාදියෙන් පුදා වැඳ පැදකුණු කොට රමම නුවරටම පිවිසියහ. අනතුරුව බෝසත්හු දසපාරමී මෙනෙහි කොට දැඩිව ඉටා හුනස්නෙන් නැගිටියහ. එයින් කියන ලදි.

බුද්ධසස වචනං සුත්වා මනො නිබ්බායි තාවදෙ
සබ්බමං උපසංකම්ම පුනසි මං අභිවන්දයුං

සමාදියිත්වා බුද්ධගුණං දළහං කත්වාන මානසං
දීපංකරං නමසසිත්වා ආසනා උට්ඨහිං තදානි

එහි මනො නිබ්බායි යනු; මහජනයාගේ පොළොව කම්පාවෙන් උද්වේගයට පත් සිත් එහි හේතු ඇසීමෙන් නිවී ගියේය. ශාන්තියට පත්විය යන අර්ථයි. ජනො නිබ්බායි කියා ද පාඨයි. එය පැහැදිලිමය. සමාදියිත්වා යනු; මනාව ගෙනා සමාදන්ව යන අර්ථයි. බුද්ධගුණං යනු; පාරමිතායි. සෙස්ස ප්‍රකටය.

ඉක්බිති අසුනින් නැගිටින සියලු සතුන් වෙත දයා ඇති බෝසතුන් සියලු දසදහසක් සක්වළ දෙවියෝ එක්රැස්ව දිවගඳමල් ආදියෙන් පුදා ආර්ය සුමේධ තාපසයෙනි, ඔබ අද දිවතුරු බුදුපාමුල මහා ප්‍රාර්ථනාවක් පතන ලදි. ඔබගේ ඒ පැතුම අනතරාය රහිතව ඉටුවේවා. එහිලා ඔබට බියක් හෝ තැති ගැනීමක් නොවේවා. ඔබ සිරුරෙහි යම්තම් රෝගයක් හෝ නොම උපදීවා. වහා පැරුම් පුරා සම්මා සම්බෝධිය ප්‍රතිවේධ කරන සේක්වා. මල්ගන්නා, ගෙඩිගන්නා ගස්වැල් කලට මල් පිපෙන්නා සේ ගෙඩි හටගන්නා සේ ඔබවහන්සේ ද ඒ සමය ඉක්මවා වහා සම්බෝධිය සාක්ෂාත් කරන සේක්වා ආදි තුති මඟුල් පැවසූහ. මෙසේ ස්තුති කොට බෝසතුන් වැඳ තම තමන්ගේ දෙව්මැදුරුවලටම ගියහ. දෙවියන් විසින් ස්තුති කරන ලද බෝසතාණෝ මම දසපාරමී පුරා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මතු බුදුවෙමියි වීර්යය දැඩිකොට ඉටා අහසට නැග ඉසිගණ ඇති හිමවතකටම ගියහ. එහෙයින් කියන ලදි.

දිබ්බං මානසුකං පුපඵං දෙවා මානුසකා උභො
සමොකිරාති පුපෙඵහි වුට්ඨහනනසස ආසනා

වෙදයනති ච තෙ සොතීං දෙවා මානුසකා උභො
මහනතං පත්ථිතං තුයහං තං ලහසසු යථිච්ඡිතං

සබ්බීතියො විවජ්ජනතු සොකො රොගො විනසසතු
මා තෙ භවත්වනතරායො ඵුස බ්‍රූපං බොධිමුත්තමං

යථාපි සමයෙ සමපතෙත පුපඵනති පුපඵිනො දුමා
තථෙව ත්වං මහාවීර බුදධඤාණෙන පුපඵසි

යථා යෙ කෙචි සමබුදධා පූරයුං දසපාරමී
තථෙව ත්වං මහාවීර පූරය දසපාරමී

යථා යෙ කෙචි සමබුදධා බොධිමණඩමහි බුජඣරෙ
තථෙව ත්වං මහාවීර බුජඣසසු ජිනබොධියං

යථා යෙ කෙචි සමබුදධා ධමමචකකං පවතතයුං
තථෙව ත්වං මහාවීර ධමමචකකං පවතතය

පුණණමාසෙ යථා චනදො පරිසුදෙධා විරොචති
තථෙව ත්වං පුණණමනො විරොච දසසහසසියං

රාහුමුතෙතා යථා සුරියො තාපෙන අතිරොචති
තථෙව ලොකා මුචචිතවා විරොච සිරියා තුවං

යථා යා කාචි නදියො ඔසරනති මහොදධිං
එවං සදෙවකා ලොකා ඔසරනතු තවනතිකෙ

තෙහි චුතපපසතථො සො දසධමෙම සමාදිය
තෙ ධමෙම පරිපූරෙනෙත ජවනං පාවිසී තදා

එහි දිබබං යනු; මදාරා පරසතු. දෙවියෝ දිව කුසුම් මිනිස්සු මිනිසුන්ගේ කුසුම් ගෙන යන අර්ථයි. **සමො කිරනකි** යනු; මා මත විසිරවූහ යන අර්ථයි. වුටඨහනතසස යනු; නැගිටින්නහුට. **වෙදයනත** යනු; නිවෙදනය කළහ. දූන්වුව. **සොභතීං** යනු; සුවපත් බව. දූන් දූන්වූ අයුරු දක්වීමට - මහනතං පතථිතං තුයහං යනු ආදිය කියන ලදි. සුමේධ පණ්ඩිතයෙනි, ඔබ විසින් මහත් කරුණක් ප්‍රාර්ථනා කරන ලදි. පැතූ අයුරින් ලබනු මැනව යන අර්ථයි. **සබබීතියො** යනු එතීති ඊති සබබං ඊතියො උපදුවයි. **විමජජනතු** යනු; නොවේවා. **සොකො රොගො විනසසත** යනු; ශෝකකිරීම් සංඛ්‍යාත ශෝක ද රිදීම් සංඛ්‍යාත රෝග ද විනාශ වේවා. තෙ යනු; ඔබගේ මා **භවඤනතරායො** යනු; අනතුරු නොවේවා.

ඵුස යනු; සාක්ෂාත් කළ මැනව. පැමිණෙනු මැනව. බොධිං යනු අර්හත්ව මාර්ගඥානයයි. සර්වඥතාඥානය ද වටනේය. **උත්තමං** යනු; ශ්‍රේෂ්ඨ. සමයෙ යනු; ඒ ඒ ගස පිපෙන කාලය පැමිණි කල්හි යන අර්ථයි. **පුපඵීනො** යනු; පිපෙන්නා වූ. **බුදධඤාණෙහි** යනු අටළොස් බුදුනුවණින්. **පුඵපසි** යනු; පිපේවා. **පූරයුං** යනු; පිරවූහ. පුරය යනු; සපුරාලනු මැනව. **බුජඣරෙ** යනු; අවබෝධ කළහ. **ජිනබොධියං** යනු; ජිනබොධියං යනු; ජිනයන්ගේ බුදුවරයන් වහන්සේලාගේ බෝධියෙහි, සර්වඥ බෝධි මූලයෙහි. **පුණණමාසෙ** යනු; පූර්ණමාසයෙහි. **පුණණමතෙත** යනු; පරිපූර්ණ මනදොල. **රාහුමුතෙතා** යනු; රාහු වලාකුළු දුවිලිවලින් මිදුණු. **තාපෙන** යනු; ප්‍රතාපයෙන් ආලෝකයෙන්. **ලොකා මුචචිත්‍ථා** යනු; ලෝකධර්මයන් ගෙන් නො තැවරී යන අර්ථයි. **සිරියා** යනු; බුද්ධශ්‍රීයෙන් ඔසරනති යනු; මහා සමුද්‍රයට පිවිසෙති. **ඔසරනතු** යනු; එළඹෙන සේක්වා. **කචනතිකෙ** යනු; ඔබ වෙත. තෙහි යනු; දෙවියන් විසින්. **ථුතපපසත්‍ථො** යනු; ස්තුති කරන ලද්දේද පසසන ලද්දේද. ස්තුති ආදියෙන් හෝ දීපංකරාදි බුදුවරයින් වහන්සේ විසින් පසසන ලද. දසධම්මෙ පර්වත මහාවනයට පිවිසියේය යන අර්ථය. මෙහි සෙස්ස මනාව ප්‍රකටමය.

මධුරත්ථවිලාසිනියෙහි බුදධවංස කථාවෙහි

සුමේධ කථාව නිමියේය.

මෙම නුවර වැසි උපාසකවරු බුදුපාමොක් බික්ඛඟනට මහදන් දී වළඳා පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේට මල්ගඳ ආදියෙන් පුදා වැඳ දානානුමෝදනා අසනු පිණිස වාඩිවූහ. එවිට ශාස්තෘන් වහන්සේ ඔවුන්ට පරම මධුර හෘදයංගම අනුමෝදනාවක් කළ සේක.

දානය නම් සැප ආදියට පරම නිදානයයි දන්නා ලදි. දෙව්ලොවට හිණයි. පිහිටයයි කියනු ලැබේ. දානය මිනිසුන්ට ආරක්ෂාවයි. දානය එකම නෑයාය. දුකට පත් සතුටන් එකම ගමනයි. දුක් තරණය කිරීම් අර්ථයෙන් දානය නැවක් යයි දක්වන ලදි. භයෙන් ආරක්ෂා කරන හෙයින් දානය නගරයකැයි වර්ණනා කරන ලදි. ළංවීමට අපහසු හෙයින් දානය සර්පයෙකැයි කියන ලදි. දානය ලෝහකිලිටි සමඟ නොතැවරෙන හෙයින් පියුමකි. ලොව මිනිසාට දානය මෙන් අවශ්‍ය දෙයක් නැත. එබැවින් ක්‍රියාත්මක අදහසින් එය පිළිපදිමි. දානය ස්වර්ග ලෝකයට නිදානයයි. එබැවින් මෙලොව කවර නම් නැණවතෙක් හිතකාමීව දන් නොදෙයිද? දානයෙන් හටගන්නා දෙව්සැප අසා කවරනම් මිනිසෙක් සැප ගෙන දෙන සිත තොස්වන දන් නොදෙන්නේද? දනට පිළිපන්නහු විසින් අප්සරාවන් පිරිවරා සුරනන්දන වූ නඳුනුයන්හි බොහෝ කල් වාසය කරනු ලැබේ. දන්දෙන්නා උදාර ප්‍රීතියෙක් විඳී. ලොව ගෞරවයට පාත්‍ර වෙයි. දෙන්නා අනන්ත ප්‍රසිද්ධියට පත්වෙයි. දෙන්නා විශ්වසනීයයෙක් ද වන්නේය. ඔහු දන් දී භෝග සමෘද්ධියටත් දීර්ඝායුෂයටත් පැමිණෙයි. දෙවියන් සමඟ දෙව්ලොව මිහිරි රූප ශබ්ද ද මත් මොනර නදින් පිරි විමානවල සිට විඳී. සොර සතුරු රජ ජල ගිනිවලට දානය අසාධාරණය. එබැවින් ශ්‍රාවකඥාණභූමිය පවෙචකබුදුභූමිය බුදුභූමිය පතා දන් දෙයි.

මේ ආදි විසින් දානානුමෝදනා කොට දානානිසංස පවසා අනතුරුව සීලකථා දෙසූහ. මේ සීලය නම් මෙලොව පරලොව සැපතට මුලයි.

ශීලය සැපවලට පරම නිදානයයි. ශීලයෙන් සංවර පුද්ගලයා දෙව්ලොව යයි. සසරගත සත්වයාව ශීලය ත්‍රාණ ලෙණ පරායණය වෙයි. ජනයාට ශීලය වැනි අවශ්‍යයෙක් මෙලොව හෝ පරලොව වෙන කොයින්ද? ගුණයනට පරම ප්‍රතිෂ්ඨාව ශීලයයි. ස්ථාවර ජංගම සියල්ලට

මහපොළව මෙනි. ශීලයම යහපතයි. ශීලයම ලොව අනුත්තරයි. ශීලයෙන්ම ආර්ය වෘත්තියෙහි හැසිරෙන්නේ යයි කියනු ලැබේ.

ශීලාලංකාරයට සම අලංකාරයක් නැත. සිල්සුවඳට සමාන සුවඳක් නැත. කෙලෙස්මල සේදීමට ශීලය සමාන දෙයක් නැත. ශීලය සමාන දාහ සංසිඳුවන්නක් නැත. ශීලය වැනි කීර්ති උපදවන්නක් නැත. ශීලය වැනි දෙව්ලොවට නගින ගින්නක් නැත. නිවන් නුවරට වැදීමට ශීලයට සමාන දොරටුවක් නැත. කී පරිදි-

සිල් අබරණින් සැරසුණ යතිවරුන් මෙන් මිණිමුතුවලින් සැරසුණ රජවරු ශෝභමාන නොවෙති. සිල්සුවඳ වැනි සුවඳක් කොහි නම් ඇත්තේද? එය යටිසුළඟෙහි මෙන්ම උඩු සුළඟෙහිද එකසේ හමයි. මල්සුවඳ සඳුන් තුවරලා හෝ දෑසමන් උඩුසුළඟට හමායයි. සත්පුරුෂ සුවඳ නම් උඩුසුළඟට යයි. සත්පුරුෂයා හැම දිශාවෙහිම හමායයි. සඳුන් තුවරලා හෝ උපුල් ඉද්ද යන මේ සුවඳ අතුරෙන් සිල්සුවඳම අනුත්තරය. ගංගා යමුනා හෝ සරභූ සරස්වතී හෝ අචිරවතී මහී හෝ මහාගංගා ජලය මෙලොව මිනිසුන්ගේ කෙලෙස් මල සෝදාහැරීමට සමත් නොවෙයි. සිල් ජලයම ඒ මල සෝදා හරී. ඒ ජලවාෂ්ප මුසු සුළඟ හෝ සුදු සඳුන් හෝ මුතුහර හෝ මැණික් හෝ සඳකිරණ හෝ සත්වයන්ගේ කෙලෙස් දාහ සමනය නොකරයි. අත්‍යන්ත සිසිල් වූ මේ ආර්ය ශීලයම මේ දාහ සන්සිඳුවයි. අතතානුවාදාදි බිය හැමදා නැති කරයි. හැමකල සිල්වතාගේ ශීලය කීර්තියත් සිසිලත් ඇති කරයි. ස්වර්ගාරෝහණ හිණක් ශීලය හැර වෙන කොයින්ද? නිවන්පුර පිවිසෙන වෙන දොරටුවක් කොයින්ද? ගුණයන්ට මුල්වූ දොස බලසාතයක් වූ ශීලයෙහි අනුත්තර අනුසස් මෙසේ දනිව්.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ශීලානිශංස දක්වා මේ ශීලය නිසා ස්වර්ගය ලැබෙයයි දක්වීම පිණිස ස්වර්ග කථාව දෙසූහ. මේ ස්වර්ගය නම් ඉෂ්ටය කාන්තය. මනාපය. ඒකාන්තයෙන් සැපය. එහි නිරන්තරවම ක්‍රීඩා සම්පත් ලැබෙයි. චාතුර්මහාරාජික දෙවියෝ අනූලක්ෂයක් අවුරුදු දෙව්සැප දෙව්සම්පත් ලබති. තාවතිංසයෝ වසර තුන්කෝටි හැට ලක්ෂයක් වෙයි. මෙසේ සඟගුණ මුසු බණකථා වදාළහ. මෙසේ ස්වර්ග කථාවෙන් පොළඹවා නැවත මේ ස්වර්ගයද අනිත්‍යය අස්ථිරය. මෙහිද ආලය නොකළ යුතුයයි කාමයන්ගේ ආදීනව පහත් බව සකිළිටි බව ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද ප්‍රකාශකොට නිවන කෙළවර කොට ඇති

ධර්මකථා වදාළහ. මෙසේ ඒ මහජනයාට දහම් දෙසා **කිසිවෙකු** සරණයෙහි ද **කිසිවෙකු** ශීලයෙහි ද **කිසිවෙකු** සෝවාන් ඵලයෙහි ද කිසිවෙකු සකෘදාගාමී ඵලයෙහි ද **කිසිවෙකු** අනාගාමී ඵලයෙහි ද **කිසිවෙකු** සතර ඵලයෙහි කිසිවෙකු ත්‍රිවිද්‍යාවෙහි කිසිවෙකු ෂඩභිඥාවෙහි කිසිවෙකු අටසමවත්හි පිහිටුවා අසුනින් නැගිට රමමනුවරින් නික්ම සුදසුන් වෙහෙරටම පිවිසි සේක. එහෙයින් කියන ලදි-

එදින ඔවුනු සංඝයා සහිත ලෝක නායකයන් වහන්සේ වළඳවා ඒ දීපංකර ශාස්තෘන් වහන්සේ සරණ ගියහ. කිසිවෙකු සරණාගමනයෙහිද කිසිවෙකු පන්සල්හිද කිසිවෙකු දසශීලයෙහිද තථාගතයන් වහන්සේ පිහිටවූහ. කිසිවෙකුට උතුම් සතරශ්‍රමණ පල ද කිසිවෙකුට අසම පිළිසිඹියා දහම් ද දුන් සේක. නරාසයන් වහන්සේ කිසිවෙකුට අට සමවත් දුන්හ. කිසිවෙකුට ත්‍රිවිද්‍යාව ද ෂඩභිඥා ද දුන්හ. ඒ මහාමුනීන්ද්‍රයන් වහන්සේ එහිදී මහජනකායට අවවාද කළ සේක. එයින් ලෝකනායකයාණන්ගේ සසුන පැතිර ගියේය. මහාහනු උසභකබන්ධ දීපංකර සර්වඥයන් වහන්සේ බොහෝ දෙන සසරින් එතෙර කළහ. දුගතියෙන් මිදූහ. ඒ මහමුනිවරයාණෝ අවබෝධ කරවිය යුතු ජනයා දැක යොදුන් ලක්ෂයක් වුව සැණින් වැඩමවා අවබෝධ කරවූ සේක.

එහි තෙ යනු; ඒ රමම නුවරවැසි උපාසකවරු. **සරණං** යනු; මෙහි සරණය සරණ ගමනය ද සරණයන්නහු ද දතයුතුය. හැසිරෙයි. නසයි. වනසයිනුයි සරණයි. ඒ කුමක් ද? රතනත්‍රයයි. එය සරණ ගියවුන්ගේ ඒ සරණගමනයෙන් භය සන්ත්‍රාසය දුක දුගතිය පරික්ලේශය නසයි වනසයි යනු සරණ යයි කියනු ලැබේ.

යමෙක් බුදුන් සරණ ගියාහු වෙත් ද ඔවුනු දුගතියට නොයති. මිනිස් සිරුර හැර දෙව්ලොව සපුරාලති. දහම් සරණ ගියාහු ද සඟුන් සරණ ගියාහු ද -පෙ- දෙව්ලොව සපුරති.

සරණාගමනය නම් තෙරුවන පිහිටකොට පවත්නා සිත් ඉපදවීමයි. සරණ යන්නහු නම් ඒ සිතින් යුත් පුද්ගලයායි. මෙසේ වනාහි **සරණ** සරණාගමන සරණාගත යන මේ තෙකරුණ දතයුතුය. **තසස** යනු; ඒ දිවකුරු බුදුන්. කර්මාර්ථ සම්බන්ධ විභත්ති යයි දතයුතු. **උපගඤ්ඡුං සරණං කත්‍ථ** යනු ද පාඨයි. **සත්‍ථුනො** යනු; ශාස්තෘන් වහන්සේ

සරණාගමනෙ කඤ්ච් යනු; කිසි පුද්ගලයන් සරණගමනයෙහි පිහිටවූහ යන අර්ථයි. වර්තමාන කාලයෙන් දැක්වුව ද අතීතකාල වශයෙන් අර්ථ ගතයුතුය. සෙසු තන්හි ද මේ ක්‍රමයයි. කසසච් සරණාගමනෙ යනු ද පාඨයි. මෙයම අර්ථයයි. **කඤ්ච් පඤ්චසු සීලෙසු** යනු; කිසි පුද්ගලයකු පස්විරති ශීලයෙහි පිහිටවූහ යන අර්ථයි. **සීලෙ දසච්ඩෙ පරං** යනු; තවත් පුද්ගලයකු දසවිධ සීලයෙහි පිහිටවූහ යන අර්ථයි. කසසච් කුසලෙ දසානීපි **කියාත්** පාඨයි. කිසි පුද්ගලයකු දසකුසල ධර්මයෙහි යනු එහි අර්ථයයි. **කසසච් දෙති සාමඤ්ඤං** යනු; මෙහි පරමාර්ථ වශයෙන් සාමඤ්ඤං යනු මාර්ගය කියනු ලැබේ. කී පරිදි- කතමඤ්ඤං යනු මාර්ගය කියනු ලැබේ. කී පරිදි - කතමඤ්ච භික්ඛවෙ සාමඤ්ඤං. අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො සෙය්‍යථීදං, සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධීති. ඉදං වුච්චති භික්ඛවෙ සාමඤ්ඤනති. **චතුරෝ ඵලමූනතමෙ** යනු; උතුම් සතරඵල යන අර්ථයි. මකාරය පදසැටි කාරකයි. ලිංග විපර්යාස වශයෙන් කියන ලදි. කිසිවෙකුට හේතුසම්පත් වශයෙන් සතරමඟ සතර ශ්‍රමණඵල දුන්හ යන අර්ථයි. **කසසච් අසමෙ ධම්මෙ** යනු; කිසිවෙකුට අසමාන සිවුපිළිසිඹියා දහම් දුන්හ. **කසසච් වර සමාපත්තියො** යනු; කිසිවෙකුට වනාහි නීවරණ දුරුකිරීමට ප්‍රධාන වූ අටසමවත් දුන්හ. තිසෙසා කසසම් විජ්ජායො යනු; කිසි පුද්ගලයෙකුට උපනිශ්‍රය වශයෙන් දිවැස, පෙර විසූ කඳ පිළිවෙල දන්නා නුවණ හා ආශ්‍රව ක්ෂය කිරීමේ නුවණ යන ත්‍රිවිද්‍යාව. **ඡළභිඤ්ඤා පවෙචජති** යනු; කිසිවෙකුට ෂඩභිඥා දුන්හ. **තෙන** යොගෙන යනු; ඒ ක්‍රමයෙන් ඒ අනුක්‍රමයෙන්. **ජනකායං** යනු; ජනසමූහය. **ඔවදති** යනු; අවවාද කළහ. කාලවිපර්යාස කොට කියන ලදැයි දතයුතුය. මින් මතු ද මෙවැනි වචනවල අතීත කාල වශයෙන්ම අර්ථය ගතයුතුය. **තෙන විසාරිතං ආසි** යනු; ඒ දීපංකර භාග්‍යවතුන් වහන්සේගේ අවවාදයෙන් අනුශාසනයෙන් විසතෘත විය. පැතිරිණ. සසුන විශාල විය. **මහාහන** යනු; මහාපුරුෂයන්ගේ වනාහි පිරිපුන් දෙහනු දොළොස්වක සඳ හා සමාන වෙයි. මහත් හනු යමෙකුට ද හේ මහාහනු නමි. සිහහනු යි කියන ලදි. **උසභකබඳෙඩා** යනු; වෘෂභයකුගේ මෙන් කඳ යමෙකුට ඇත්තේ ද හේ **උසභකබඳඩි**. මනාව වැඩුණු රන් වැනි සුන්දර රුසිරු කඳක් ඇත්තේ. සම්වට සොඳුරු සිරුරු ඇත්තේ යන අර්ථයි. **දීපංකර සනාමකො** යනු; දීපංකර නම් ඇති. **බහූජනෙ තාරයති** යනු; බොහෝ බුදුවෙනෙය්‍ය ජනයන් තරණය කරවූහ. පරිමොචෙති යනු මිදවූහ. **දුගගතිං** යනු; දුගතියෙන්. අපාදානයෙහි කර්මපදයි. තරණය මුදවන ආකාරය දැක්වීමට දුන් බොධනෙය්‍ය ප්‍රජාව. මෙයම හෝ පාඨයි. දිසවා යනු; බුදුඇසින් හෝ සමතැසින් දක. **සතසහසෙසපි යොජනෙ** යනු; නොයෙක්

ලක්ෂගණන් යොදුන්හි සිටි. මේ දසසහස්සී ලෝකධාතුව සඳහාම කියන ලදයි දතයුතුයි.

දීපංකර ශාස්තෘන් වහන්සේ බුද්ධත්වයට පත්ව බෝමුල සත්සත් ගෙවා අටවන සතියෙහි මහබඹහුගේ ධර්මදේශනා ප්‍රතිඥාවෙන් සුනන්දාරාමයෙහි දම්සක් පවත්වා සියකෝටියක් දෙවිමිනිසුන්ට දහම් අමා පෙවූහ. මෙය පළමු ධර්මාවබෝධ කිරීම විය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ සමවතතකඛඬ නම් සිය පුතණුවන්ගේ ඤාණ මේරීම දැන ඒ පුතු ප්‍රමුඛ කොට රාහුලොවාද සමාන දහම් දෙසා නවකෙළක් දෙවිමිනිසුන්ට අමා පැන් පෙවූහ. මේ දෙවන ධර්මාභිසමයයි. නැවත අමරවති නුවරදොර මහාසිරිස රුක්මුල යමාමහ පෙළහර කොට මහජනයා සසර බැම්මෙන් මුදා දෙව්ගණ පිරිවරා අතිරේක දිවාකරා ලෝකයක් මෙන් දෙව්භවන වූ තවතිසා භවනයෙහි පරසතු රුක්මුල්හි පරමසීතල පඬුඇඹුල් සලසුන්හි හිඳ සියලු දෙව්ගණ හට ප්‍රීති සංජනනය කරවන සිය මෑණි සුමේධා දේවිය ප්‍රමුඛ කොට සර්වප්‍රකාරයෙන් ලෝ දත් විසුද්ධිදේව වූ දෙවියන්ට දෙවි වූ දීපංකර බුදුහු සප්තප්‍රකරණ අභිධර්ම පිටකය දෙසා නවකෙළ ලක්ෂයක් දෙවියන්ට දහම් අමා පෙවූහ. මේ තෙවන ධර්මාභිසමය විය. එයින් කියන ලදි-

පඨමාභිසමයෙ බුදධො කොටිසතමබොධයි
දුතියාභිසමයෙනාථො නවුතිකොටිමබොධයී

යදා ච දෙවභවනමහි බුදෙධා ධමමමදෙසයි
නවුති කොටිසහසසානං තාතියාභිසමයො අහූ

දිවකුරු බුදුන්ගේ ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ඉන් සුනන්දාරාමයෙහි ප්‍රථම සන්නිපාතය කෙළලක්ෂයක් විය. එයින් කියන ලදි-

සනනිපාතා තයො ආයුං දීපංකරසස සත්ථුනො
කොටිසතසහසසානං පඨමො ආසි සමාගමො

පසුකලෙක දසබලයන් වහන්සේ සාරදහසක් සඟුන් පිරිවරා ගම්නියම්ගම් රාජධානි පිළිවෙලින් අනුග්‍රහයෙහි යෙදෙන්නාහු චාරිකාවෙහි යෙදෙමින් එක් පෙදෙසක මහජනයා විසින් කරන ලද සත්කාර ඇති ලෝකප්‍රකට නොමිනිසුන් අරක්ගත් අතිභයානක එල්බෙන වලාකුළු

සිපගන්නා විවිධ සුවඳමල් පිරිගසින් සුවඳවත් මුදුන් ඇති නන්මුවගණන් හැසිරෙන නාරදකූට නම් පරමරමණීය පර්වතයට වැඩිසේක. ඒ පර්වතය වනාහි නරද නම් යක්‍ෂයකු විසින් අධිගෘහිත විය. ඒ යක්‍ෂයාට අවුරුදු පතා මහජනයා මිනිස්බලි එළවති.

ඉක්බිති දීපංකර භාග්‍යවතුන් වහන්සේ ඒ මහජනයාගේ හේතුසම්පත් දැක එතැනින් හිඤ්ඡුසංඝයා සිවුදිගට පිටත්කොට තනිව අසහායව බලවත් කරුණාව පිරි හදින් ඒ යකු හික්මවීමට නාරද පර්වතයට නැංගහ. ඉක්බිති ඒ මිනීකන තම යහපත නොදත් පරවධයෙහි දක්‍ෂ යක්‍ෂයා මතුබැවින් නොඉවසමින් වෛරපිරි මනසින් දසබලයන් බියකොට පලවාහරිනු කැමතිව ඒ පර්වතය සෙල්වීය. පර්වතය ඔහු සොලවද්දී බුදු අනුහසින් ඔහුගේ හිසමත වැටෙන්නාක් මෙන් විය. ඉන් බියවූ හෙතෙම දැන් මොහු ගින්නෙන් දවමියි අතිබිහිසුණු මහගිනිකඳක් ඇති කළේය. ඒ ගිනිකඳ උඩු සුළඟට හැරී තමහටම දුක් ඉපදවීය. බුදුරදුන්ගේ සිවුරෙහි අංශුමාත්‍රයක්වත් දවීමට අසමත් විය. යක්‍ෂයා ශ්‍රමණයා දැවුණේයයි බලන්නේ සරාකල සුපිරිසිදු සියලු දනමන අලවන සඳමඬල වන් සිහිල් ජලතලගත පියුම් කෙමියෙක්හි හුන්නාක් වැනි තථාගතයන් වහන්සේ දැක සිතීය. පුදුමයි, මේ ශ්‍රමණතෙම මහානුභාවය. මොහුට මා කරන යම් යම් අනර්ථයක් වෙයිද එය මා මතම වැටෙයි. මේ ශ්‍රමණයා හැර මට වෙනත් පිළිසරණක් පිහිටක් නැත. පොළොවෙහි ගැසුණාහු පොළව නිසාම නැගිටිති. මම මේ ශ්‍රමණයන්ගේම සරණ යමි කියායි.

ඉක්බිති මෙසේ සිතා භාග්‍යවතුන් වහන්සේගේ සක්ලකුණින් හෙබි පාමුල සිරසින් වැටී ස්වාමීනි, වරද මා ඉක්මවීයයි කියා බුදුන් සරණ ගියේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුට පිළිවෙල කතාව වදාළහ. දේශනා කෙළවර ඔහු යකුන් දසදහසක් සමග සෝවාන් පෙලෙහි පිහිටියේය. එදා මුළු දඹදිව් වැසි මිනිස්සු ඔහුට බිලි පිණිස එකෙකි ගමින් එක් එක් මිනිසෙකු ගෙන ආහ. වෙනත් බොහෝ තලසහල් උඳු මුං මෑ ආදිය ද ගිතෙල් වෙඬරු තෙල් මී පැණි ආදිය ද ගෙනාහ. එවිට ඒ යක්ෂයා එදින ගෙන ආ තල සහල් ආදි සියල්ල ඔවුන්ටම දී බිලියම් පිණිස ගෙනා මිනිසුන් දසබලයන් වහන්සේටම භාර කළේය.

භාග්‍යවතුන් වහන්සේ ඒ මිනිසුන් ඒහි හිඤ්ඡු පැවිද්දෙන් පැවිදිකොට සතියක් තුළම රහත් කරවා නවම්පුන් පොහෝදා කෙළසියක් හිඤ්ඡූන්

මැදපත්ව සතරඟ සන්නිපාතයෙහි පාමොක් උදෙසූහ. සතරඟ නම් සියල්ලෝ ඒහිභික්ෂුහුම වෙති. සියල්ලෝ ෂඩභිඥා වෙති. සියල්ලෝ නොඅමතා ආවාහු වෙති. පසළොස්වක පෙහෙවස් දිනයද වෙයි යන මේ අංග සතරයි. මේ දෙවන සන්නිපාතයයි. එයින් කියන ලදි-

පුන නාරදකූටමහි පවිවෙකගතෙ ජිනෙ
ඛීණාසවා විතමලා සමිංසු සතකොටියෝ

එහි පවිවෙකගතෙ යනු; ගණයා හැර ගිය කල්හි. සමිංසු යනු; රැස්වූහ. යම්දිනක දීපංකර ලෝක නායකයාණෝ සුදසුන් නම් පවිවෙහි වස් එළඹි සේක් ද එකල දඹදිව් වැසි මිනිස්සු අවුරුදු පතා ගිරගඟ සමජජ නම් උත්සවයක් කරති. ඒ උත්සවයෙහි රැස්වූ මිනිස්සු බුදුන් දැක බණ අසා එහි පැහැද පැවිදි වූහ. මහා පවාරණ දින බුදුහු ඔවුන්ගේ අදහසට අනුරූප විවසුන් කතා දෙසූහ. ඒ සියල්ලෝ එයසා සංස්කාර මෙනෙහිකොට විදර්ශනානු පිළිවෙලින් මාර්ග අනුපිළිවෙලින් රහත් වූහ. බුදුහු නවකෙළ දහසක් සමග පවාරණ කළහ. මෙය තෙවන සනනිපාතයයි. එයින් කියන ලදි-

යමහිකාලෙ මහාවීරෝ සුදසසනසිලුවචයෙ
නවුතිකොටිසහසෙසහ පවාරෙසි මහාමුනි

අහං තෙන සමයෙන ජටිලෝ උගගනාපනෝ
අනතළිකඛමහි චරණෙ පඤඤාහිඤඤාසු පාරගූ

මේ ගාථා අත්ථසාලිනී ධම්මසංගණී අටුවාවෙහි නිදානකථා දීපංකර බුද්ධවංසයෙහි ලියන ලදි. මේ බුද්ධවංසයෙහි එය නොමැති බවම යුක්තිතරය. කුමක් නිසාද යත්- යට සුමේධ කථාවෙහි කියන ලද හෙයිනි. දිවකුරු භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසද්දී දසදහසකට ද විසිදහසකට ද ධර්මාවබෝධය වූයේමය. එකෙකුට දෙදෙනෙකුට තිදෙනෙකුට සතර දෙනෙකුට ආදි වශයෙන් අවබෝධ වීමෙහි නිමක් නැත. එබැවින් දිවකුරු බුදු සමය විස්තෘත ද බොහෝදෙනා අත පත්වීම ද විය. එයින් කියන ලදි-

දසවීස සහසසානං ධම්මාභිසමයෝ අහු
එකදවිනනං අභිසමයං ගණනාතෝ අසංඛ්‍යාති

එහි **දසවීසසහසසානං** යනු; දසදහසකට විසිදහසකට ද. **ධම්මාභිසමයෝ** යනු; චතුරාර්යසත්‍ය ධර්ම ප්‍රතිවේධය. **එතදවිනනං** යනු; එකෙකුට දෙන්නකුට තුන්දෙනෙකුට සිව්දෙනෙකුට දසයකට ආදි වශයෙන් අසංඛ්‍යය යන අර්ථයි. මෙසේ අසංඛ්‍ය ප්‍රතිවේධය නිසා විස්තෘත මහත්වයට පත් බව ද බොහෝ පණ්ඩිත දෙවිමිනිසුන් විසින් නෛර්යාණික බැවින් දන්නා ලද්දේ ද අධිශීලශික්ෂාදියෙන් සමෘද්ධිමත් ද සති සමාධි ආදියෙන් පරිපූර්ණ වූයේ ද විය. එයින් කියන ලදි-

විත්‍ථාරිකං බාහුජඤ්ඤං ඉදධං ඵීතං අහූ තදා
දීපංකරස්ස භගවතෝ සාසනං සුචි සොධිතනති

එහි **සුචිසොධිතං** යනු; මනාව භාග්‍යවතුන් වහන්සේ විසින් සුද්ධ කරන ලද, පිරිසිදු කරන ලද, දීපංකර සර්වඥයන් වහන්සේගේ හැමකල ෂඩභිඥා මහර්ධිමත් සාරලක්ෂයක් භික්ෂූන් පිරිවරන ලදහ. එකල යම් සේඛයෝ කළුරිය කරත් ද ඔවුහු ගර්භිත වෙති. සියල්ලෝ රහත්වම පිරිනිවෙති යනු අදහසයි. එයින් ඒ බුදුරදුන්ගේ ශාසනය සුපුෂ්පිතව සමෘද්ධව ක්ෂීණාස්‍රව භික්ෂූන්ගෙන් ඉතාමත් ශෝභාසම්පන්න විය. එයින් කියන ලදි.

චතතාරිසතසහසසානි ඡළභිඤ්ඤා මහිද්ධිකා
දීපංකරං ලොකනාථං පරිවාරෙනති සබබදා

යෙ කෙචි තෙන සමයෙන ජහාති මානුසං භවං
අපපතතමානසා සෙඛා ගරහිතාව භවනති තෙ

සුපුපඵිතං පාවචනං අරහනෙතහි තාදිහි
බිණාසවෙහි විමලෙහි උපසොභති සබබදානි

එහි **චතතාරිසක සහසසානි** යනු; ගණනින් දක්වන ලදි. මෙසේ දක්වන ලද මේ භික්ෂූහු යයි දැක්වීම පිණිස **ඡළභිඤ්ඤා මහිද්ධිකා** යයි කියන ලදයි මෙසේ අර්ථය ගතයුතුයි. නොහොත් **ඡළභිඤ්ඤානං මහිද්ධිකානං** යි සංඛාර්ථයෙහි ප්‍රථමායයි දතයුතුයි. **සබබදා** යනු; හැමකල්හි භාග්‍යවතුන් වහන්සේ පිරිවරති. භාග්‍යවතුන් වහන්සේ අතහැර කිසිතැන නොයති යන අදහසයි. **තෙන සමයෙන** යනු; එසමයෙහි. මේ සමය ශබ්දය වනාහි සමවාය ආදි අර්ථ නවයෙක්හි දක්නා ලැබේ. කී පරිදි-

එක්තැන්වීම ඇසිල්ල කාලය සමූහය හේතු දෘෂ්ටි ප්‍රතිලාභ ප්‍රහාණ ප්‍රතිවේධ යන අර්ථවල දක්නා ලැබේ.

මෙහි එය කාලාර්ථයෙහි දැකිය යුතුය. ඒ කාලයෙහි යන අර්ථයි. **මානුසං භවං** යනු; මිනිස් බව. **අපපත්තමානසා** යනු; නොපැමිණි අනධිගත මනස් ඇත්තේ යමකු විසින් ද ඔවුහු අපපත්තමානසා යි. **මානසං** යනු; රාගයට ද සිතට ද අර්හත්වයට ද අධිවචනයි කී පරිදි- **අනන්තලිකඛවරෝ පාසෝ යමායං චරති මානසෝ** යි. මෙහි රාගය මානස යි කියන ලදි. චිත්තං මනෝ මානසං හදයං පණ්ඩරං යි මෙහි සිතයි. අපපත්තමානසෝ සෙඛෝ කාලං කයිරා ජනෙසුනා යි මෙහි අර්හත්වයයි. මෙහිද අර්හත්වය මැයි අදහසයි. එබැවින් නොපත් රහත්පල ඇත්තේ යන අර්ථයි. **සෙඛා** යනු; කවර අර්ථයෙන් සේඛද? සේඛධර්ම ලැබීම් අර්ථයෙන් සේඛයෝයි. මෙය කියන ලදි. ස්වාමීනි, කොපමණකින් සේඛ නම් වෙයිද? මහණෙනි, මෙසස්නෙහි භික්ෂුනම සෙඛ සම්මාදිට්ඨියෙන් යුක්ත වෙයිද -පෙ- සෙඛ සම්මාසමාධියෙන් යුක්ත වෙයිද මෙපමණකින් මහණෙනි, භික්ෂුනම සෙඛ නම් වෙයි. තවද භික්මෙත්නුයි සෙඛයි. මෙය කියන ලදි. **සිකඛතීති** බොහිකබූ තසමා සෙඛොති වුවචති. කිඤ්ච සිකඛති, අධිසීලමපි සිකඛති අධිචිත්තමපි අධිපඤ්ඤමපි සිකඛති සිකඛති සිකඛතීති බොහිකබූ තසමං සෙඛොති වුවචතීති **සුපුඤ්ඤතං** යනු; මනාව විකසිත වූ. **පාවචනං** යනු; ප්‍රවචනයම පාවචනයි සාසනය යන අර්ථයි. **උපසොභති** යනු; අභිරාජක වෙයි. අතිශයින් බබළයි. **සබබදා** යනු; හැමකල්හි උපසොභති සදෙවකෙ යනු ද පාඨයි.

ඒ දිවකුරු භාග්‍යවතුන් වහන්සේගේ රමම නම් නගරයයි. සුදේව නම් රජ පියාණෝය. මව සුමේධා නම්. සුමංගල නිස්ස දෙනම අගසව්වෝය. උපස්ථායක සාගත නම්. නන්දා සුනන්දා දෙනම අග්‍ර ශ්‍රාවිකාවෝය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය පුලිල රුකයි. අසූරියන් උසය. ආයු වසර ලක්ෂයකි. මේ උපන් නගරාදිය දැක්වීමෙහි ප්‍රයෝජනය කුමක්ද? කියනු ලැබේ. ඉදින් යමෙකුගේ ජාතනගරය නොදනීද මව නොදනිද පියා නොදනී නම් මේ දෙවියෙක් ද ශක්‍රයෙක් ද යකෙක් ද මාරයෙක් ද බ්‍රහ්මයෙක් ද අන් දෙවියන්ටත් මෙවැනි ප්‍රාතිහාර්ය ආශ්චර්ය මෙබඳු යයි හඟනානු ඇතුම්කන් දිය යුතුයයි නොසිතති. එයින් ධර්මාවබෝධය නොවන්නේය. අභිසමය නැතිවිට බුදෙධාත්පාදය නිරර්ථක වෙයි. නෛර්යාණික නොවෙයි. එබැවින් සියලු බුදුවරුන්ගේ ජාතනගරාදි පරිච්ඡේදය දැක්විය යුතුය. එයින් කියන ලදි-

නගරං රම්මවතී නාම සුදෙවෝ නාම බතතියෝ
සුමෙධා නාම ජනිතා දීපංකරසස සත්ථුනෝ

සුමංගලෝ ච තිසෙසා ච අහෙසුං අගගසාවකා
සාගතෝ නාමුපටඨාකෝ දීපංකරසස සත්ථුනෝ

නන්දා චෙව සුනන්දාව අහෙසුං අගගසාවිකා
බෝධි තසස භගවතෝ පිපඵලීති පවුච්චති

අසීති හත්ථුබෙබධෝ දීපංකරෝ මහාමුනි
සොහති දීපරුකෙඛාව සාලරාජාව ඵුල්ලිතෝ

සතසහසසවසසානි ආයු තසස මහෙසිනෝ
තාවතා තිටඨමානෝ සෝ තාරෙසි ජානතංබහුං

ජොතයිත්වාන සදධම්මං සනතාරෙත්වා මහාජනං
ජලිත්වා අග්ගිකඛන්ධොව නිබ්බුතෝ සෝ සසාවකෝ

සා ච ඉදධි සෝ ච යසෝ තානි ච පාදෙසු චකතරතනානි
සබබං සමාතරහිතං තනු රිතනා සබබසංඛාරාති

එහි **සුදෙවෝ නාම බතතියෝ** යනු; සුදේව නම් ක්‍ෂත්‍රිය රජ උන්වහන්සේගේ පියා විය යන අර්ථයි. **ජනිනා** යනු; මෑණියෝය. පිපඵලී යනු; **පුලිල වෘක්‍ෂය** බෝධියයි. **අසීතිහත්ථුබෙබධෝ** යනු; අසූරියන් උස්වූවෝය. **දීපරුකෙඛාව** යනු; දැල්වුණ ප්‍රදීපමාලාවෙන් ගැවසී ගත් පහන් ගසක් මෙන් ආරෝහපරිණාහ සම්පන්න දෙතිසක් වර ලකුණින් අනූ ලකුණින් අලංකාර ශරීර ඇති පැතිරෙන රස්දැල් සමූහයෙන් තරු රැසින් බබළන අහස්තලය මෙන් භාග්‍යවතුන් ව හන්සේ ජීවමාන කාලයෙහි- **සොහති** යනු; බැබළිසේක. **සාලරාජාවසොහිතෝ** යනු; පිපුණ මුලපටන් අගතෙක් පිපි සල්රුකක් මෙන් මුලසිට අගට පිපි සියක් යොදුන් උස පරසතුරුක මෙන් ද අසූරියන් උස භාග්‍යවතුන් වහන්සේ අතිශයින් ශෝභමාන වෙති. **සතසහසසවසසානි** යනු; වර්ෂ ලක්ෂයක් උන්වහන්සේගේ ආයුෂය යන අර්ථයි. **තාවතා තිටඨමානෝ** යනු; එතෙක් කල් සිටිනාහු. **ජනතං** යනු; ජන සමූහය. **සනතාරෙත්වා මහාජනං** යනු; මහජනයා තරණය කරවා. **සනතාරෙත්වා සදෙවකං** යනු ද පාඨයි. සදෙවක

ලෝකය යනු එහි අර්ථයි. **යා ච ඉදධි** යනු; ඒ **සම්පත, ඒ ආනුභාවය. යසො** යනු; පරිවාරය. **සබබංසමතත රහිතං** යනු; කී ආකාර සම්පත් අතුරුදහන් විය. පහවිය යන අර්ථයි. **නනු රිතතා සබබසංඛාරා** යනු; සියලු සංඛතධර්ම ඒකාන්තයෙන් හිස්ය. තුච්ඡය. නිති සාර රහිතය යන අර්ථයි. මෙහි වනාහි නගරාදි පරිච්ඡේදය පාලියෙහි ආයේමය. සමාහුලවාරය නොසඳහනි. එය ගෙනහැර දක්විය යුතුය. ඒ මෙසේය. පුතත පරිච්ඡේද, හරියා පරිච්ඡේද, පාසා පරිච්ඡේද, සරාවාස පරිච්ඡේද, විහාර පරිච්ඡේද, උපටියාක පරිච්ඡේද යනුයි. මේවා දක්වීමෙහි හේතු ද යට දක්වන ලදි. ඒ දිවකුරු කුමරුට හාර්යාවෝ ලක්ෂයක් වූහ. ඔවුන්ගෙන් අගමෙහෙසිය පදුමා නමි. ඔහුගේ පුත්‍රයා උසභකඛඬ නමි. එයින් කියන ලදි-

හරියා පදුමා නාම විබුදධපදුමානනා
අතුජෝ උසභකඛඬෝ දීපංකරසස සත්ථුනෝ
හංසෝ කොඤචා මයූරාඛ්‍යා පාසාදාපිතයොමතා
දසවසසසහසසානි අගාරං ආවසී කිර

හත්ථියානෙන නිකඛනෙතා නඤාරාමෙ ජිනෝ වසී
නඤොනාමසසුලටඨාකෝ ලොකනඤකරෝ කිර.

සියලු බුදුවරයන් වහන්සේලාගේ වෙනස්කම් පසෙක් වෙයි. ආයු ප්‍රමාණ වෙනස, කුල වෙනස, ප්‍රධන් වෙනස, රස්මී වෙනස යනුවෙනි. එහි ආයු වෙනස නම් සමහරු දීර්ඝායුෂ්ක වෙති. සමහරු අල්පායුෂ්ක වෙති. දිවකුරු භාග්‍යවතුන් වහන්සේගේ වර්ෂ ලක්ෂයක් ආයු ප්‍රමාණ විය. අප භාග්‍යවතුන් වහන්සේගේ වර්ෂ සියයකි. ප්‍රමාණ වෙනස නම් සමහරු උසය. සමහරු මිටිය. දිවකුරු බුදුහු අසූරියන් පමණ වූහ. අප බුදුහු අටළොස් රියන් පමණි. කුල වෙනස නම් සමහරු කැත් කුලයෙහි උපදිති. සමහරු බ්‍රාහ්මණ කුලයෙහිය. දීපංකරාදි බුදුවරු කැත් කුලෙහි උපන්හ. කකුසඳ කෝනාගමනාදි බුදුවරු බමුණු කුලයෙහිය. ප්‍රධන් වෙනස නම් සමහරුන්ගේ ප්‍රධන් වැඩීම ටිකය. කසුප් බුදුන්ගේ මෙනි. සමහරුන්ගේ දිගුකලකි. අප බුදුරදුන්ගේ මෙනි. රසමී වෙනස නම් මංගල බුදුරදුන්ගේ රස්මිය දසසහස්‍රී ලෝකධාතුවෙහි පැතිර සිටියේය. අප බුදුරදුන්ගේ බඹයක් පමණකි. එහි රස්මී වෙනස අදහස හා බැඳී පවතී. යමෙක් යම් පමණ කැමති වෙත් ද උන්වහන්සේගේ ශරීරප්‍රභාව එපමණ පවතී. මංගල බුදුරදුන්ට

දසසහස්‍රී ලෝකධාතුවෙහි පැතිරේවායි අදහස විය. ප්‍රතිවේධ කළ ගුණයන්හි කිසි කෙනකුන්ගේ වෙනසක් නැත. සෑම බුදුකෙනකුන් හටම අවිජහිතස්ථාන සතරකි. බෝධිපර්යංකය අවිජහිත ස්ථානයකි. එකම තැන පිහිටයි. ධර්මචක්‍ර ප්‍රවර්තනය ඉසිපතන මිගදායෙහිය. එය අවිජහිත ස්ථානයකි. දෙවොරොහණයෙහි සකස්පුර දොර පළමු පා තැබීම අවිජරහිතම වෙයි. දෙවිරම් ගඳකිළියෙහි ඇඳ පා පිහිටි තැන් සතර අවිජහිත වෙයි. විහාරය ද අවිජහිතය. එය කුඩා හෝ ලොකු හෝ වෙයි.

තවද අප භාග්‍යවතුන් ව හන්සේගේ වනාහි සහජාත පරිච්ඡේදයද නකඛතතපරිච්ඡේදය ද විශේෂ වෙයි. අපගේ සර්වඥ බෝසතුන් සමග රහල්මව, අනඳ තෙර, ඡන්න, කඨක, නිදන් සැළි, බෝධිවෘක්ෂය, කාළුදායී යන මේ සත් සහජාතයෝය. මහසත්නු වනාහි උතුරුසල නකතින්ම මවුකුස පිළිසිඳ ගත්හ. මහබිනික්මන් නික්මුණහ. ධම්සක් පැවැත්වූහ. යමක ප්‍රාතිහාර්යය කළහ. විසා නැකතින් උපන්හ. බුදුවූහ. පිරිනිවියහ. මාඝ නැකතින් උන්වහන්සේගේ ශ්‍රාවක සන්නිපාතය ද ආයුසංස්කාර අත්හැරීම ද සිදුවිය. අස්විද නැකතින් දේවොරෝහණය දැයි මෙතේ දැ ගෙනහැර දැක්විය යුතුය. මේ සමබහුලවාර පරිච්ඡේදයයි. සෙසු ගාථා ප්‍රකටය.

මෙසේ දීපංකර භාග්‍යවතුන් වහන්සේ සියලු බුදුකිස නිමවා අනුක්‍රමයෙන් අනුපාදිසෙස නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක. දීපංකර සර්වඥයන් වහන්සේ යම් කල්පයෙක පහළ වූ සේක්ද එම කප තණ්හංකර මේධංකර සරණංකර නම් තවත් තුන් බුදුකෙනෙක් වූහ. උන්වහන්සේලා වෙත බෝසතුන්ගේ විවරණයක් නැත. එහෙයින් උන්වහන්සේලා මෙහි නොදක්වන ලදහ. අටුවාවෙහි වනාහි ඒ කල්පයෙහි මුලපටන් උපන් බුදුවරයන් වහන්සේලා දැක්වීමට මෙය කියන ලදි-

තණහංකරෝ මෙධංකරෝ අථොපි සරණංකරෝ
දීපංකරොච සම්බුදෙධා කොණඩඤ්ඤා දිපදුත්තමෝ

මංගලෝ ච සුමනෝ ච රෙවතෝ සොභිතෝ මුනි
අනොමදසසී පදුමෝ නාරදෝ පදුමුත්තරෝ

සුමේධො ච සුජාතොච පියදසසි මහයසො
අත්‍ථ දසසී ධම්මදසසී සිද්ධත්‍ථො ලොකනායකො

තිසෙසා ඵුසෙසා ච සම්බුදෙධා විපසසී සිඛි වෙසසභූ
කතුසන්‍ධො කොනාගමනො කසසපොචාපි නායකො

එතෙ අහෙසුං සම්බුදධා විතරාගා සමාහිතා
සතරංසීව උපපනනා මහාතම විනොදනා
ජලිත්‍වා අගගකඛන්‍ධාච නිබ්බුතා තෙ සසාවකාති

මෙපමණකින් ඉතා සංක්‍ෂෙප ද විස්තාර ද නොවූ
මධුරත්‍ථ විලාසිනී බුද්ධවංස අර්ථකථාවෙහි

දීපංකර බුදුවංස වර්ණනාව නිමියේය.

ප්‍රථම බුදුවංසය නිමියේය.

දිවකුරු බුදුන් පිරිනිවි කල උන්වහන්සේගේ සසුන වර්ෂ ලක්ෂයක් පැවැත්තේය. අනතුරුව බුද්ධානුබුද්ධ ශ්‍රාවකයන්ගේ නැතිව යාමෙන් උන්වහන්සේගේ සසුන ද අතුරුදහන් විය. උන්වහන්සේගේ අපරභාගයෙහි එක් අසංඛ්‍යයක් ගෙවී එක් කපක කොණ්ඩඤ්ඤ නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ සොළසාසංඛ්‍ය කප් ලක්ෂයක් පාරමී පුරා බෝධිඥානය මෝරවා වෙස්සන්තරාත්ම භාවය වැනි අත්බැව්හි සිට එයින් සැව තුසිපුර ඉපිද එහි ආයුතාක් වැස දෙවියන්ට ප්‍රතිඥා දී තුසීපුරෙන් චුතව රමවතී නුවර සුනන්‍ද නම් රජකුලයෙහි සුජාතා නම් දේවියගේ කුස පිළිසිඳ ගත්හ. උන්වහන්සේගේ පිළිසිඳ ගැන්මෙහි දීපංකර බුද්ධවංසයෙහි කී නියා දෙතිස් පෙළහර ඇතිවිය. දෙවියන් විසින් කරන ලද ආරක්ෂා ඇතිව දසමස් ඇවෑමෙන් මවුකුසින් නික්ම සත්වෝත්තමයෝ උතුරු දිශාභිමුඛව සත්පියවරින් ගොස් සියලු දික් බලා සීහනාද කළහ. මම ලොවට අග්‍ර වෙමි. මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි. මේ මාගේ අන්තිම ජාතියයි. දැන් පුනර්භවයක් නැත්තේය කියායි.

ඉක්බිති කුමාරයාට නම් තබන දිනයෙහි නම් කරන්නාහු කොණ්ඩඤ්ඤ යි නම් තැබූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි වූහ. උන්වහන්සේට රාම සුරාම සුභ නම් රමණීය ප්‍රාසාද තුනක් විය. එහි නැටුම් ගැයුම් වැයුම්හි දක්ෂ තූන්ලක්ෂයක් නළු ගැහැණුන්ගේ උවටැන් හැමදා විය. උන්වහන්සේගේ අගමෙහෙසිය රුචිදේවී නම් වූවාය. පුත්‍රයා විජිතසේන නම් විය. උන්වහන්සේ දසදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. ජීර්ණ ව්‍යාධි මෘත ප්‍රව්‍රජිතයන් දැක ආජඤ්ඤ රථයකින් ගොස් පැවිදි වූ දසමසක් ප්‍රධන් වීර්යය කළහ. පැවිදිවන කොණ්ඩඤ්ඤ කුමරුන් අනුව දසකෙළක් දෙන පැවිදිවූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරන ලදුව දසමසක් ප්‍රධන් වඩා වෙසක් පොහෝදින සුනන්‍දගම සමව එක්වූ සන පියොවුරුබර යසෝධරා නම් සිටු දියණිය දුන් පරම මධුර මීකිරිබත් වළඳා පලපල්ලව අංකුරයෙන් සමලංකෘත සාල වනයෙහි දිවාවිහාර කොට සවස් කාලයෙහි ගණයා හැර සුනන්‍ද ආජීවකයා දුන් අටතණමිට ගෙන සල්කලණ රුක තෙවරක් පැදකුණු කොට පෙරදිග බලා බෝරුක පිටුපසින් කොට අටපනස් රියන් තණ ඇතිරි අතුරා පර්යංකය වැළඳ චතුරංග වීර්යාධිෂ්ඨාන කොට මරබල පරදා රෑ පළමු යම පෙරවිසීම් සිහිකරන නුවණ පිරිසිදු කොට මැදියම දිවැස පිරිසිදු කොට අලුයම ප්‍රත්‍යයාකාරය මෙනෙහි කොට ආනාපාන චතුර්ථධ්‍යානයෙන් නැගී ස්කන්ධයන්හි පිවිස උදයව්‍යය වශයෙන් සම ප්‍රඥාවෙන් ලක්ෂණ දැක

ගෝත්‍රභූඤ්ඤාණය තෙක් විදසුන් වඩා සතරමඟ නුවණත් සතරඵල නුවණත් සතර පිළිසිඹියා සතරයෝනි හිමි කොටැති ඤාණය පංචගති පරිච්ඡේදක ඤාණය ෂඩ් අසාධාරණ ඤාණ යන සියල්ල බුද්ධඥානයෙන් ප්‍රතිවේධ කොට සපිරි සංකල්ප ඇතිව බෝමුල වැඩහිඳිමින්ම-

නැවත නැවත ඉපදීම දුකෙකි. මේ ආත්මභාවය නමැති ගෙය තනන වඩු සොයමින් නොදැක සසර නොඑක් ජාතිවල සැරිසැරීමි. වඩුව, ඔබ දිටිමි. නැවත ගෙය නැනිය නොහැකිය. ඔබගේ සියලු පරාළ බිඳ දමන ලදි. කැණිමඬලද සුණුවිසුණු කරන ලදි. තෘෂ්ණාක්ෂය අවබෝධ කළෙමි. සිත නිවනට පිවිසියේය. ජලයෙන් ගින්නෙන් නැසූ යගුළියක මෙන් අනුපූර්ව ලෙසින් උපශාන්ත වූවහුගේ ගතිය නොදන්නා ලැබේ. මෙසේ මනාව මිදුණු කාමබන්ධන නමැති සැඩපහරින් තරණය වූවන්ගේ ගතිය පැනවීමක් නැත.

මෙසේ උදන් අනා සත්සතියක් බෝමුලම ගෙවා පලසමවත් සුවෙන් ගෙවා අටවන සතියෙහි බ්‍රහ්මාරාධනයෙන් කාහට පළමුව දහම් දෙසන්නෙමිදැයි සලකන සේක් තමන්වහන්සේ සමග පැවිදි වූ දසකෙළක් භික්ෂූන් දුටහ. මේ කුලපුත්නු රැස්කළ කුසල්මුල් ඇතිව පැවිදි වූ මා අනුව පැවිදිවූහ. මා සමඟ ප්‍රධන් වැඩූහ. මට උවටැන් කළහ. හැමට පළමු ඔවුන්ට දහම් දෙසමියි මෙසේ සලකා දැන් ඔවුහු කොයි වෙසෙත්දැයි බලනසේක් මෙයින් අටළොස් යොදුනකින් එපිට අමරවතී නුවර දේව වනයෙහි වසති දැන ඔවුන්ට බණ දෙසන්නට යමියි පාසිවුරු ගෙන යම්සේ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික් කරන්නේ ද දික්කළ අතක් වක් කරන්නේද එමෙන් බෝමුලින් අතුරුදන්ව දේවවනයෙහි පහළ වූහ. ඒ අවස්ථාවෙහි එම දසකෙළක් භික්ෂූහු අමරවතී නුවර ළඟ දේවවනයෙහි වසති. ඒ භික්ෂූහු වඩින භාග්‍යවතුන් වහන්සේ දුරදීම දක පහන් සිතින් පෙරගමන් කොට භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු පිළිගෙන බුද්ධාසනය පනවා ශාස්තෘ ගෞරව දක්වා භාග්‍යවතුන් වහන්සේට වැඳ පිරිවරා පසෙක වාඩිවූහ. එහි බුදධාසනයෙහි මුනිගණ පිරිවරා වැඩහුන් කොණ්ඩඤ්ඤ දසබලයන් වහන්සේ දෙව්ගණ පිරිවැරූ දහස්නුවන් ඇති ශක්‍රයා මෙන් විමලගගනතලගත තරු පිරිවැරූ සරාකල සඳ මෙන් ද බැබළි සේක. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔවුන්ට සියලු බුදුවරයන් වහන්සේලා විසින් නිසෙවිත අනුත්තර වූ ත්‍රිපරිවෘත්ත වූ දොළොස් ආකාර ඇති ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්ත දෙසා දසකෙළක් භික්ෂූන් ප්‍රමුඛ කෙළ ලක්ෂයක් දෙවිමිනිසුන්ට දහම් අමා පෙවූහ. එයින් කියන ලදි-

දීපංකරස්ස අපරෙන කොණ්ඩඤ්ඤා නාම නායකෝ
අනන්තතේජෝ අමිතයසෝ අපපමෙය්‍යෝ දුරාසදෝ

ධරණූපමෝ ධම්මෙන සීලෙන සාගරූපමෝ
සමාධිනා මෙරුසමෝ ඤාණෙන ගගනූපමෝ

ඉන්ද්‍රියබලබොජ්ඣංගමග්ග සච්චපකාසනං
පකාසෙසි සදා බුද්ධෝ හිතාය සබ්බපාණිනං

ධම්මචක්කං පවත්තෙන්තෙ කොණ්ඩඤ්ඤ ලෝකනායකෙ
කෝටිසතසහස්සානං පඨමාභිසමයෝ අහූති

එහි **දීපංකරස්ස අපරෙන** යනු; දිවකුරු බුදුන්ට පසුව යන අර්ථයි. **කොණ්ඩඤ්ඤ නාම** යනු; සිය ගොත්‍ර වශයෙන් ලබන ලද නම් ඇති. නායකෝ යනු; විනායතියි. **අනන්තතේජෝ** යනු; සිය සිල්ගුණ පින් තෙදින් අපමණ තෙද ඇති. යටින් අවීචිය උඩින් භවාග්‍රය සරසින් අපමණ ලෝකධාතු මේ අතර එක පුද්ගලයෙකු හෝ උන්වහන්සේගේ මුව බලා සිටීමට සමතෙක් නම් නැත්තේය. එහෙයින් අනන්තතේජොයි කියන ලදි. **අමිතයසෝ** යනු; අපමණ පිරිවර ඇත්තේ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ වසර ලක්ෂයක් පිරිනිවන් කාලය තෙක් මේ අතර භික්ෂු පිරිසෙහි භික්ෂූන්ගේ ගණන සීමාවක් නම් නොවීය. එහෙයින් අමිතයසයි කියනු ලැබේ. අපමණ ගුණ කීයද අමිතයසොයි කියැවේ. **අපපමෙය්‍යෝ** යනු; කී පරිදි-

බුදු කෙනෙක් හෝ බුදු කෙනෙකුන්ගේ ගුණ අනිකක් නොකියා කල්පයක් වර්ණනා කරත් මුත් ඉතා දික් කාලාන්තරයක් වූ කල්පය ගෙවෙයි. තථාගත ගුණ නොගෙවෙයි.

එහෙයින් අපමණ ගුණාගුණ ඇතියෙන් අපපමෙය්‍යයි කියැවේ. **දුරාසදෝ** යනු; වෙත පැමිණීම දුෂ්කරය. ළංවී ගැටී එළඹිය නොහැක්කේය යන අදහසින් දුරාසදනම් වෙති. අභිභවනය කිරීම දුෂ්කරය යන අර්ථයි **ධරණූපමෝ** යනු; ධරණිය සමයි. **ධම්මෙනාති** යනු; ක්ෂාන්තියෙන් යොදුන් දෙලක්ෂයක් අධික සතර නුහුවක් බොල් මහපොළව මෙනි. ප්‍රකෘති ව්‍යාතයෙන් මෙනි. ලාභ අලාභ ඉෂ්ට අනිෂ්ට ආදියෙන් කම්පා නොවන හෙයින් ධරණූපමයයි කියැවේ. **සීලෙන සාගරූපමෝ** යනු; සීල සංවරයෙන්

වෙරළ නොඉක්මවීම වශයෙන් සයුර බඳුය. මහාසමුදෙදා හික්බවෙ යීතධමෙමා වෙලං තාතිවත්තති යයි කියන ලදි. **සමාධිනා මෙරුසමෝ** යනු; සමාධියට සතුරු වූ ධර්මයන්ගෙන් ජනිත කම්පා රහිත උතුම් මහමෙර බඳුය යන අර්ථයි. මෙරගිරි බඳු තිරසර සිරුරු ඇත්තේනුයිහෝය. **ඤාණෙන ගගනූපමෝ** යනු; මෙහි භාග්‍යවතුන් වහන්සේගේ ඤාණ අනන්ත බැවින් අනන්ත ආකාශයට උපමා කොට ඇත. අනන්ත සතරකැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදි. කී පරිදි-

සත්වජාති ද අහස ද සක්වළවල් ද අනන්තය. බුද්ධඤාණය ද අපමණ වෙයි. මේවා දුනගත නොහැකිය.

එහෙයින් අනන්ත බුද්ධඤාණයට අනන්ත අහස උපමා කරන ලදි. **ඉන්‍ද්‍රිය බලබොජඣංගමගඟ සචවපකාසනං** යනු; මේ ඉන්‍ද්‍රිය බල බොජඣංග මගඟ සචචයන් ග්‍රහණයෙන් සතිපටඨාන සම්මපපධාන ඉදධිපාදද ගන්නා ලදි. එහෙයින් ඉන්‍ද්‍රියාදි සතරසංක්ෂෙප විසින් සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් ප්‍රකාශක ධර්මයක් දෙසූහ යන අර්ථයි. **හිතාය** යනු; හිත පිණිස. **ධම්මචකකපපවත්තනෙ** යනු; දේශනා ඤාණය පවත්වද්දී.

ඉන් මෑත භාගයෙහි මහාමංගල සමාගමයෙහි දසදහසක් සක්වළ දෙවියෝ සියුම් ආත්මභාව මවාගෙන මේ සක්වළ රැස්වූහ. එහි එක් දිව්‍ය පුත්‍රයෙක් කොණ්ඩඤඤ දසබලයන් වහන්සේගෙන් පැනයක් විමසීය. ඔහුට භාග්‍යවතුන් වහන්සේ මංගල කරුණු දෙසූහ. එහිදී අනූකෙළ දහසක් රහත් වූහ. සෝවාන් වූවන්ගේ ගණන නිම් නැත. එහෙයින් කියන ලදි-

තතො පරමපි දෙසෙනෙතා නරමරූනං සමාගමෙ
නවුතිකොටිසහසසානං දුතියාභිසමයො අහූති

එහි **තතොපරමපි** යනු; ඉන් මෑත භාගයෙහි **දෙසෙනෙත** යනු; බුදුන් දහම් දෙසන කල්හි. **නරමරූනං** යනු; නරයන්ට මෙන්ම අමරයන්ට ද, යම්දාක භාග්‍යවතුන් වහන්සේ අහස තීර්ථකයන්ගේ මදමාන මර්දනයට යමාමහ පෙළහර කරමින් දහම් දෙසත් ද එකල අසූකෙළ දහසක් රහත් වූහ. තුන්පෙලෙහි පිහිටියවුන්ගේ ගණන හිම් නැත. එයින් කියන ලදි-

තිසටියෙ ආභිමද්දනෙතා යදා ධම්මමදෙසයි
අසීතිකොටි සහසසානං ධම්මාභිසමයො අහූති

කොණ්ඩඤ්ඤ ශාස්තෘන් වහන්සේ බුදුබවට පත්ව පළමු වස සඳවතී නුවර ළඟ වඳරාමයෙහි විසූහ. එහි සුචින්ධර නම් මහසල් බමුණාගේ පුත් වන්දමානව නම් කීර්තිධර බමුණු පුත් සුභද්ද නම් තරුණයා ද කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේ වෙතින් බණ අසා පහන් සිතින් තරුණයන් දසදහසක් සමග උන්වහන්සේ වෙත පැවිදිව රහත් විය. ඉක්බිති කොණ්ඩඤ්ඤ බුදුහු පොසොන් පුරපසළොස්වක දින සුභද්ද තෙරුන් ප්‍රමුඛ කෙළ ලක්ෂයක් පිරිවරා පාමොක් උදෙසූහ. එය පළමු සන්නිපාතයයි. ඉන් මෙපිට කොණ්ඩඤ්ඤ බුදුපුත් විජිත තෙරුන් රහත් වූ කල උන්වහන්සේ ප්‍රමුඛ කෙළලක්ෂයක් මැද භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය දෙවන සනනිපාතයයි. පසුකලෙක දසබලයන් වහන්සේ ජනපද චාරිකා කරන සේක් අනූකෙළක් පිරිවර ඇති උදේන නම් රජු පැවිදි කරවූහ. ඒ පිරිස සමඟ ඔහු ප්‍රධානකොට ඇති අනූ කෙළක් සමඟ සමග භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන සන්නිපාතයයි එයින් කියන ලදි-

සනනිපාතා තයො ආසුං කොණ්ඩඤ්ඤසස මහෙසිනො
බීණාසවානං විමලානං සනතචිතතාන තාදිනො

කොටි සතසහසසානං පඨමො ආසි සමාගමො
දුතියො කොටි සහසසානං තතියො නවුතිකොටියොති

එකල් අප බෝසතාණෝ විජිතාවී නම් සක්විති රජව චන්දවති නුවර වසන්නාහ. උන්වහන්සේ වනාහි නොයෙක් උතුම් මිනිසුන් පිරිවරා සයුර හිමිකොට මේරුයුගඳුරු සහිත අපමණ රුවන් දරන මහපොළව අදණ්ඩනයෙන් අශස්ත්‍රයෙන් දැහැමෙන් සෙමෙන් පාලනය කරන්නාහ. එකල්හි කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේ කෙළ ලක්ෂයක් රහතන් පිරිවරා ජනපද චාරිකාවෙහි යෙදෙන සේක් පිළිවෙලින් චන්දවති නුවරට වැඩි සේක.

ඒ විජිතාවී රජ බුදුහු අපගේ නුවරට වැඩිසේකැයි අසා පෙරගමන් කොට වසන තැන් නිලකොට බික්සඟුන් සහිතව සෙට දිනට ආරාධනා

කොට පසුදා මනාව දන් සරහා කෙළ ලක්ෂයක් පමණ බුද්ධ ප්‍රමුඛ බික්සඟනට මහදන් පිදිය. බෝසත්හු බුදුන් වළඳවා අනුමෝදනාවසානයෙහි ස්වාමීනි, තෙමසක් මහාජන අනුග්‍රහ කරමින් මෙහිම වසනසේක්වායි අයැද තෙමස නිතොර බුදුපාමොක් මහසඟනට අසදෘශ මහදන් පිදූහ.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ බෝසතුන්ට මතු ගෝතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශකොට දම් දෙසූහ. උන්වහන්සේ බණ අසා රාජ්‍යය පුදා මහණව තුන්පිටකය ඉගෙන අටසමවත් පසහිඥා උපදවා නොපිරිහුණු දහැනින් බඹලොව උපන්හ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන විජිතාවී නාම ඛත්තියෝ
සමුද්දමනතසනෙතන ඉසසරියං වතතයාමහං

කොටිසතසහසසානං විමලානං මහෙසිනං
සහ ලොකගගනාථෙන පරමනෙතන කපපයිං

සොපිමං බුදෙධා ව්‍යාකාසි කොණඩඤඤෙඤ ලොකනායකෝ
අපරිමෙයෙය ඉතොකපෙප බුදෙධා ලොකෙ භවිසසති

පධානං පදහිතවාන කතවා දුකකරකාරියං
අසසත්ථමූලෙ සමබුදෙධා බුජඣිසසති මහායසෝ

ඉමසස ජනිතා මාතා මායා නාම භවිසසති
පිතා සුදෙධාදනෝ නාම අයං හෙසසති ගොතමෝ

කොලිතෝ උපතිසෙසෝ ච අගග හෙසසනති සාවකා
ආනනෙදා නාමුපටඨාකෝ උපටඨිසසති තං ජිනං

බෙමා උපපලවණණා ච අගගා හෙසසනති සාවිකා
බොධි තසස භගවතෝ අසසත්ථොති පවුචචති

ඉදං සුතවාන වචනං අසමසස මහෙසිනෝ
ආමොදිතා නරමරූ බුදධබිජංකුරෝ අයං

උකකුට්ඨිසද්දා වත්තන්ති අපෙථායෙන්ති හසන්තිව
කත්ඤ්ජලී නමස්සන්ති දස්සහස්සී සදෙවකා

යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධාන්හා භෙස්සාම සම්මුඛා ඉමං

තස්සාහං වචනං සුත්වා හීයෝ චිත්තං පසාදයං
තමෙව අත්ථං සාධෙන්තෝ මහාරජ්ජං ජිනෙ අදං
මහාරජ්ජං වජ්ජිත්වාන පබ්බජිං තස්ස සන්තිකෙ

සුත්තන්තං විනයඤ්චාපි නවංගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොහයිං ජිනසාසනං

තත්ථප්පමත්තෙන විහරන්තෝ නිසජ්ජට්ඨාන චංකමෙ
අභිඤ්ඤාසු පාරමිං ගන්ත්වා බ්‍රහ්මලොකමගච්ඡහන්ති

එහි අහං තෙන සමයෙන යනු; මම එකල. විජිතාවී නාම යනු; එනම් ඇති සක්විති රජවීමි. සමුද්දං අන්තමන්තෙන යනු; මෙහි සක්වළගල සීමා මර්යාදා කොට සිටි මුහුද කෙළවර කොට ඉසුරු බව පැවැත්වීමි යන අර්ථයි. මෙ පමණකින් පැහැදිලි නොවෙයි.

සක්විති රජ වනාහි සක්රුවනෙහි අනුහසින් සිනේරුව වම්පස කොට මුහුද මතින් අටදහස් යොදුන් පමණ පූර්වවිදේහයට යයි. රජ එහිදී පරපණ නොනැසිය යුතුය. නුදුන් දේ නොගත යුතුය. කාමයන්හි මිසහසර නොකළ යුතුය. බොරු නොකිව යුතුය. මත්පැන් නොපිව යුතුය. වැළඳූ පරිදි බුදිය යුතුය යි ඔවා දෙයි. මෙසේ අවවාද දුන් පසු සත්රුවන අහසට නැඟ නැගෙනහිර මුහුදට වදී. යම් යම් අයුරින් එය මුහුද කිමිදෙයිද ඒ ඒ පරිද්දෙන් රළපැහැරීම සංක්ෂිප්තව පහත බස්නා සාගරජලය යොදුනක් පමණ පහත්ව මුහුද තුළ දෙපස වෙරළුමිණි බිත්ති මෙන් පරමදර්ශනීයව සිටී. මෙසේ නැගෙනහිර සාගරාන්තය තෙක් ගොස් චක්රරත්නය ආපසු එයි. හැරෙද්දීම පිරිස ඉදිරියෙන් සිටිති. සක්විති රජ මධ්‍යයෙහි වෙයි. සත්රුවන කෙළවරෙහිය. ඒ ජලයද ජලානකයෙන් වෙන්වීම නොඉවසීමෙන් මෙන් නිම්වළලු කෙළවර හැපෙන්නාක් මෙන් වෙරළටම ළඟාවෙයි. මෙසේ සක්විති රජ මුහුද කෙළවර කොට ඇති

නැගෙනහිර දිශාවෙහි පූර්වවිදේහය ජයගෙන දකුණුමුහුදු කෙළවර කොටැති ජම්බුද්වීපය දිනනු කැමතිව සක්රුවන දක්වූ මගින් දකුණු මුහුදු බලා යයි. ඒ දසදහස් යොදුන් දඹදිව දිනා දකුණු මුහුදින් ගොඩවී සත්දහස් යොදුන් දඹදිව දිනා දකුණු මුහුදින් ගොඩවී සත්දහස් යොදුන් පමණ අපරගෝයානය දිනනු පිණිස යට කී නයින් ගොස් එයද සයුර හිමිකොට දිගත පැසුළු සයුරින්ද ගොඩවී අටදහස් යොදුන් පමණ උතුරුකුරු දිවයින දිනීමට එහෙයින්ම ගොස් සයුරු හිමිකොට එයද දිනා උතුරු මුහුදින් නැගෙයි. මෙපමණකින් සක්විති රජු විසින් සයුර හිමි ඉසුරු ලබන ලද්දේ වෙයි.

කොටිසතසහසසානං යනු; කෙළ ලක්ෂයකි. **විමලානං** යනු; ක්ෂීණාස්රවයන්ගේ. **සහලොකගගනාරෙන** යනු; දසබලයන් වහන්සේ සමග කෝටිලක්ෂයකගේ යන අර්ථයි. **පරමනෙනන** යනු; ප්රණීත අහරින්. තපයිං යනු; සැතැප්වීමි. **අපපමෙයෝ ඉතෝ කපෙප** යනු; මෙතැන් පටන් කප් ලක්ෂයක් අධික තැන් අසංඛ්යයක් ගෙවා එක් භද්රකල්පයක යන අර්ථයි. පධානං යනු; වීර්යයි. **තමෙව අත්ථං සාධෙනෙතා** යනු; ඒ බුද්ධකාරක ධර්මාර්ථ වූ දානපාරමිතාව පුරන්නේ සිද්ධ කරන්නේ නිෂ්පාදනය කරන්නේ යන අර්ථයි. **මහාරජජං** යනු; සක්විති රජය. **ජිනෙ** යනු; භාග්යවතුන් වහන්සේ කෙරෙහි. සම්පදානාර්ථයෙහි සත්තමීයි දතයුතුයි. අදං යනු; දුනිමි. මෙසේ අර්ථ සිදධ කරමින්. මෙයින් සම්බන්ධය දතයුතුයි. සමහරු මහාරජජං ජිනෙ දදං යයි කියති. චජ්ජවාන යනු; දී. **සුකකනතං** යනු; සූත්ර පිටකය. විනයං යනු; විනය පිටකය. නවංගං යනු; සුත්ත ගෙයාදි නවංගය සොභයිං ජිනසාසනං යනු; ආගම අධිගම ලෞකික ලෞකිකයෙන් අලංකාර කළේය. තත්ථ යනු; ඒ භාග්යවතුන් වහන්සේගේ සසුනෙහි. අපපමනෙතා යනු; සිහි ඇතිව බ්රහ්මලෝකමගඤ්ඡහං යනු; මම බඹලොව ගියෙමි.

මේ කොණ්ඩඤ්ඤ බුදුරදුන්ගේ නගරය රම්මවතී නම් විය. සුනන්ද නම් ක්ෂත්රියයා පියාය. සුජාතා නම් දේවිය මවය. භද්ර සුභද්ර දෙනම අගසව්වෝය. උපස්ථායක අනුරුද්ධ නම්. තිසසා ද උපතිසසා ද අග්ර ශ්රාවිකාවෝය. සල්කලණ රුක බෝධියයි. අටඅසූරියන් උසය. ආයුප්රමාණය වසර ලක්ෂයකි. උන්වහන්සේගේ දේවිය රුචි නම් වූවාය. උන්වහන්සේගේ පුත්රයා ජිනසේන නම්. උපස්ථායක රජ චන්ද නම්. චන්දාරාමයෙහි විසූ සේක. එයින් කියන ලදි-

නගරං රම්මවතී නාම සුනන්දෝ නාම බන්ධියෝ
සුජාතා නාම ජනිකා කොණ්ඩඤ්ඤස්ස මහෙසිනෝ

භද්දා වෙව සුභද්දා ච අහෙසුං අග්ගසාවිකා
අනුරුද්ධා නාමුපට්ඨාකෝ කොණ්ඩඤ්ඤස්ස මහෙසිනෝ

තිසසා ච උපතිසසා ච අහෙසුං අග්ගසාවිකා
සාලකල්‍යාණිකෝ බොධි- කොණ්ඩඤ්ඤස්ස මහෙසිනෝ

අට්ඨාසීති හත්ථානි අච්චුග්ගතෝ සෝ මහාමුනි
සොභති උළුරාජාව සුරියෝ මජ්ඣන්තිකෙ යථා

වසසසතසහසසානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානෝ සෝ තාරෙසි ජනතං බහුං

බීණාසවෙහි විමලෙහි විචිකකං ආසි මෙදිනී
යථාහි ගගනං උළුහි එවං සෝ උපසොභථ

තෙපි නාගා අපපමෙය්‍යා අසංඛොබභා දුරාසදා
විජ්ජුපාතංව දසෙසත්වා නිබ්බුතා තෙ මහායසා

සා ච අතුලියා ජිනසස ඉද්ධි ඤාණපරිභාවිතෝ ච සමාධි
සබබා සමනතරහිතං නනු රිකතා සබබසංඛාරාති

එහි **සාලකල්‍යාණිකෝ** යනු; සල්කලණ ගසයි. එය බුද්ධ කාලයෙහි සක්විති කාලයෙහි ද හටගනී. වෙනත් කාලයෙහි නැත. එය එක් දිනයෙන්ම නැගී සිටී. **බීණාසවෙහි විමලෙහි විචිකකා ආසි මෙදිනී** යනු; මේ පොළොව රහතන් වහන්සේලාගෙන් එකම කසාවතින් බබළමින් විචිත්‍ර පරම දර්ශනීය විය. **යථාහි** යනු; උපමාර්ථයෙහි නිපාතයි. **උළූහි** යනු; නැකැත් තරුවලින්. තරු රැසින් ගුවන්කුස මෙන් රහතුන් නිසා විසිතුරු වූ මේ පොළෝතලය ශෝභමාන විය යන අර්ථයි. **අසංඛොබභා** යනු; අටලෝ දහමින් නොකැළඹී අවිකාරව. **විජ්ජුපාතංව දසෙසත්වා** යනු; විදුලිය ගැසීමෙන් මෙන් දක්වා. **විජ්ජුපපාතං** යනු ද පාඨයි. කොණ්ඩඤ්ඤ බුද්ධ කාලයෙහි පිරිනිවෙන භික්ෂූහු සත්තලක් පමණ අහසට නැගී නිල්වලා විවරගත විදුලියක් මෙන්

හාත්පස බබුළුවා තේජෝ ධාතුවට සමවැද උපාදාන රහිත ගිනි මෙන් නිවීගියහ. පිරිනිවියහ. එහෙයින් විජ්ජුපාතංව දසෙසතියි කියන ලදි. අතුලියා යනු; අතුල්‍ය වූවාහු. අසංඛ වූවාහු. ඤාණපරිභාවිතො යනු; නුවණින් වැඩුනේ. සෙසුගාථා පෙර කී නයින් පැහැදිලිය.

කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ මනරම් සදරම්හි පිරිනිවි සේක. උන්වහන්සේගේ චෛත්‍යය සත්යොදුන් කොට තනවන ලද්දේය. ඒ ශාස්තෘන් වහන්සේගේ ධාතු නොවිසුරුණෝය. ඒකඝනවම රන්පිළිමයක් මෙන් පැවැත්තේය.

කොණ්ඩඤ්ඤ බුදුධවංශ වර්ණනාව නිමියේය.

දෙවන බුදුධවංසය සමාප්තය.

කොණ්ඩඤ්ඤ ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ සසුන ලක්ෂයක් අවුරුදු පැවැත්තේය. බුද්ධ අනුබුද්ධ ශ්‍රාවකයන්ගේ අතුරුදන් වීමෙන් උන්වහන්සේගේ සසුන අතුරුදහන් විය කොණ්ඩඤ්ඤ බුදුන්ට පසුකාලයෙහි එක් අසංඛ්‍ය කපක් ගෙවී එකම කපක සතර බුදු කෙනෙක් උපන්හ. **මංගල සුමන රේවත සෝභිත** කියායි. එහි මංගල ලෝකනායකයාණෝ කප්ලක්ෂයක් අධික සොළසාසංඛ්‍යයක් පාරමී පුරා තුසිපුර ඉපිද එහි ආයුතාක් සිට පස්පෙරනිමිති උපන්කල බුද්ධ කෝලාහල නම් කෝලාහලයක් ඇතිවිය. එකල්හි දසදහසක් සක්වළ දෙවියෝ රැස්ව

මහාවීරයාණනි, මේ ඔබට කාලයයි. මව්කුස උපත මැනව.
දෙවියන් සහිත ලෝකයා එතෙර කරවමින් අමා
පදය අවබෝධ කරනු මැනව කියා ආයාචනා කරති.

මෙසේ අයදනා ලදුව පස්මහ බැලුම් ඇතිව තුසිපුරෙන් සැව හැමනුවරින් උතුරු උතුරු නුවර අනුත්තර උතුරු නම් නිරිඳුකුල උතුරු නම් මෙහෙසි කුස පිළිසිඳ ගත්හ. එකල නන් පෙළහර පහළවිය. ඒවා දීපංකර බුද්ධවංසයෙහි කී නියායෙන් දතයුතු. සකලලෝක මංගල මහසතුන් උත්තරා මෙහෙසි කුස පිළිසිඳ ගැනීමෙහි පටන් දිවා රෑ ශරීරාලෝකය අසූරියන් පමණ තැන් පැතිර සඳ එළියෙන්, ඉරු එළියෙන් නොමැඩිය හැකි සේ සිටියේය. ඕතොමෝ ද අන් ආලෝකයක් නැතිව ශරීරාලෝකයෙන්ම අඳුරු දුරු කොට අටසැටක් කිරිමවුන් විසින් උවටැන් කරන ලද්දී වාසය කළාය. දෙවි රැකවරණ ලද ඕතොමෝ දසමස් ගෙවීමෙන් උතුරමධුර උයන්හි මංගල මහපුරිස් ප්‍රසූත කළාය. ඒ මහපුරුෂයාණෝ උපන් කෙණෙහිම සියලු දික් බලා උතුර දිශාභිමුඛව සත් පියවරින් ගොස් අභීතනාද කළහ. එකෙණෙහි සියලු දසදහසක් ලෝවාසි දෙවියෝ දෘශ්‍යමාන සිරුරින් දිවමල් ආදියෙන් සැරහී එහි සිට මඟුල් තුති වදන් පැවැත්වූහ. පෙළහර ද කී පරිදිමය. උන්වහන්සේට නම් තබන දිනයෙහි ලකුණු කියන්නෝ සියලු මඟුල් සම්පත් හටගත්තේ යයි මංගල කුමාර කියාම නම් කළහ.

උන්වහන්සේට යස වා සුචිමා සිරිමා නම් තුන් පහයක් විය. යසවතී දේවිය ප්‍රමුඛ තිස්දහසක් නළඟනෝ වූහ. මහසත්හු එහි නවදහසක් හවුරුදු දෙවිසැප බඳු සැපවිඳිමින් යසවතී අගමෙහෙසිය කුස සීලව නම් පුතු ලැබ සතර නිමිති දැක සැරසූ පඩෙර නම් චරතුරඟ නැඟී මහබිනික්මන්

නික්ම පැවිදිවූහ. පැවිදිවන උන්වහන්සේ අනුව තෙකෙළක් මිනිස්සු පැවිදි වූහ. ඔවුන් පිරිවැරූ මහපුරුෂයාණෝ අටමසක් වීර්යයෙහි යෙදී ඉක්බිති වෙසක් පසළොස්වක් දින උතතරගම උතතර සිටුහුගේ දූ උත්තරා දුන් දිවඔජා බහාලූ මී කිරිබත් වළඳා සල්වෙනෙහි දිවාවිහාර ගෙවා උත්තර ආජීවක දුන් අට තණමිට ගෙන මතැත් ගමනින් නාබෝධිය පැදකුණු කොට ගිනිකොණ සිට අටපනස් රියන් තණ ඇතිරි අතුරා එහි පර්යංකය වැළඳ චතුරංගසමන්නාගත වීර්යය ඉටා සබල මාරබල විධමා පුබෙබනිවාස දිබබචකඛු ඤාණ ලබා ප්‍රත්‍යයාකාර මෙනෙහි කිරීම් කොට ස්කන්ධයන්හි අනිත්‍යාදීන් පිවිස අනුක්‍රමයෙන් අභිසම්බෝධියට පැමිණ අනේකජාති සංසාරං -පෙ- යි උදන් ඇනූහ.

මංගල සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශරීර ප්‍රභාව වනාහි වෙනත් බුදුවරයන් වහන්සේලාගේ ශරීර ප්‍රභාවට වඩා අධිකතර විය. අන් බුදුවරයන්ගේ වනාහි අසූ රියන් පමණ හෝ බඹයක් පමණ හෝ ශරීරප්‍රභාව වෙයි. උන්වහන්සේගේ එසේ නොවෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරාලෝකය නිබඳ දසදහසක් ලෝකධාතුවෙහි පැතුරුනේ විය. අනූ ලක්ෂයක් අවුරුදු ආයු විය. එතෙක් කල් සඳ හිරු තරුවල ආලෝකය හෝ රෑ දාවල් සීමා හෝ නොපෙනිණ. දවල් ඉරු එළියෙන් මෙන් සත්වයෝ නිතර බුද්ධාලෝකයෙන් සියලු වැඩ කරමින් විසූහ. සවස පිපෙන මලින් උදය නාද කරන කුරුලන් නිසා ලෝකය රෑ දාවල් සීමා දත්ත. කිම අන් බුදුවරුන්ට මේ අනුභව නැත්තේ ද? නැත්තේ නොවේ. උන්වහන්සේලා ද කැමති නම් දසදහස් ලෝකධාතුව හෝ ඊට වැඩිය ආලෝකය පතුරුවන්නාහ. මංගල භාග්‍යවතුන් වහන්සේගේ පෙරපැතුම් වශයෙන් අන්‍යයන්ගේ ව්‍යාමප්‍රභාව මෙන් ශරීරප්‍රභාව නිබඳව දසදහස් ලෝකධාතුවෙහි පැතිර සිටියේය.

උන්වහන්සේ බෝසත් කල වෙසතුරු අත්බැව සමාන අත්බැවක අඹුදරුවන් සමග වංකගිරි සම පර්වතයක විසූහ. ඉක්බිති එක සකලජන හිංසක මහබල ඇති මිනිකන බරදාඨික නම් යකෙක් විය. මහාපුරුෂයන්ගේ දාන අදහස් දැන බමුණු වෙසින් පැමිණ මහසතුන්ගෙන් දෙදරුවන් ඉල්වීය. මහපුරිස්හු බමුණාට දෙදරුවන් දෙමියි තුටුපහටුව දියහිම් පොළොව කම්පාකොට දෙදරුවන් දුන්හ. ඉක්බිති යක්‍ෂයා උන්වහන්සේ බලා සිටියදීම බමුණු වෙස හැර දමා ගිනිදැල් බඳු පිඟුවන් ඇස් ඇති විසම විරූප වකුටු දළ ඇති බුන් විරූපී නාසා ඇති තඹරළු දික් කෙහෙ ඇති නවදැලි

තල්කඳක් වැනි සිරුරු ඇති යක්වෙස් ඇත්තේ ඒ දරුවන් නෙළුම් අල මිටියක් සේ ගෙන කෑවේය. මහසතාණන්ට යක්‍ෂයා දෙස බලා කට විවර කළවිටම ගිනිදැල් මෙන් උණු ලේ ධාරා වැගිරෙනු මුඛය දැකීමෙනුත් මද දොම්නසක් වත් නොහටගත්තේය. මා විසින් මනා දනක් දෙනලදයි සිතන උන්වහන්සේට මහත් සතුටු සොම්නසක් ඇති විය. උන්වහන්සේ මේ කුසල විපාකයෙන් අනාගතයෙහි මේ අයුරින්ම රැස් නික්මේවායි පැතුහ. උන්වහන්සේගේ ඒ පැතුම නිසා බුදුවූ උන්වහන්සේගේ සිරුරින් රස් නික්ම මෙතෙක් තැන් පැතිරුණේය. තවද උන්වහන්සේගේ පෙර චරිතයක් ඇත. උන්වහන්සේ බෝසත් කල එක් බුදුකෙනකුන්ගේ චෛත්‍යයක් දැක මම මෙයට ජීවිත පරිත්‍යාග කළයුතුයයි දඬුවැට පහනක් වෙළන පරිද්දෙන් මුළු සිරුර වෙළා රියනක් පමණ ලක්‍ෂයක් අගනා රත් බඳුනක් සුවඳ ගිතෙලින් පුරවා එහි දහසක් වැටි දල්වා එය හිස තබාගෙන මුළු සිරුර දල්වා සෑය පැදකුණු කරමින් මුළු රැය පහන් කළහ. මෙසේ අරුණෝදය දක්වා වෑයම් කරන උන්වහන්සේගේ ලෝමකූපයක් වත් රත් නොවිය. පියුම් ගැබකට පිවිසි කලක් මෙන් විය. මේ ධර්මය නම් තමන් රක්නවුත් රක්නේමය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

ධර්මය ඒකාන්තයෙන් ධර්මචාරියා ආරක්ෂා කරයි. ප්‍රගුණ කළ ධර්මය සුව ගෙනදෙයි. ආචීර්ණ ධර්මයෙහි ආනිශංසය මෙයයි. ධර්මචාරී තෙම දුගතියට නොයයි.

මේ කර්මයෙහි විපාකයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙන් ආලෝකය දසසහස්‍රී ලෝකධාතුවෙහි පැතිර සිටියේය. එයින් කියන ලදි.

කොණ්ඩඤ්ඤසස අපරෙන මංගලෝ නාම නායකෝ
තමං ලොකෙ නිහනත්වාන ධමෙමාකකමහිධාරයි

අතුලාසි පභා තසස ජිනෙහඤ්ඤහි උතතරිං
චඤසුරියපභං හනත්වා දසසහසසිං විරොචතිති

එහි තමං යනු; ලෝකාන්ධකාරය සහ හෘදයතමසයි. නිහනත්වා යනු; මැඩ. ධමෙමාකකං යනු; මේ උකකාශබදය රන්කරුවාගේ කෝවය ආදි නොඑක් අර්ථවල දක්වෙයි. කී අයුරු - සණ්ඩාසෙන ජාතරූපං ගහෙත්වා උකකාමුඛෙ පකඛිපති ආ තැන ලෝකුරුවන්ගේ කෝවය උකකායි

දතයුතුය. උකකං බන්ධෙය්‍ය උකකං බන්ධිත්වා උකකාමුඛං ආලිමෙපය්‍ය යි තැන කඹුරන්නේ අඟුරුවළයි. කම්මාරානං යථා උකකං ඇතුළත දැවෙයි. පිටත නොවෙයි. යන තැන කඹුරන්ගේ උදුනයි. එවං විපාකෝ උකකාපාතෝ භවිස්සති යි ආ තැන වාතවෙගය උකකායි දතයුතු. උකකාසු ධාරියමානාසු යන තැන පන්දම් උකකයි දතයුතු. මෙහි ද පන්දම් උකකා නමින් අදහස් කරන ලදි. එහෙයින් මෙහි ධර්මමය ප්‍රදීපය දැරූහ. අවිදූ අඳුරෙන් වැසූහ. අවිදූ අඳුරෙන් මැඩුණු ලෝකයට ධර්මමය ප්‍රදීපය දැරූහ යන අර්ථයි. **අතුලාසි** යනු; අතුල්‍යය විය. අතුල්‍යාසි යන්නම හෝ පාඨයි. අන් බුදුවරුන් හා අසම වූහ ය න අර්ථයි. **ජිනෙ හඤ්ඤන්ති** යනු; අන් ජිනයන් වහන්සේලා හා. **හනත්වා** යනු; සඳහිරුගේ ආලෝකය නසා **දසසහසසී විරොචති** යනු; සඳහිරු ආලෝකයෙන් තොරව බුද්ධාලෝකයෙන්ම දසසහස්‍රය බබළයි යන අර්ථයි.

මංගල බුදුහු බුදුව බෝමුලම සත්සති ගෙවා බඹහුගේ ධර්මාරාධනය පිළිගෙන කාහට මම මේ දහම පළමුව දෙසන්නෙමිදයි සලකන සේක් තමන් වහන්සේ සමග පැවිදි වූ හේතුසම්පන්න තුන්කෙළක් භික්ෂූන් දුටහ. මේ කුලපුත්‍රයෝ පැවිදි වූ මා අනුව පැවිද්ද ගත් හේතු සම්පන්නයෝය. වෙසක් පුන්පොහෝදින විවේකකාමීව පිටත්කොට හරින ලද්දාහු සිරිවඩ්ඪන නුවර ළඟ සිරිවනගහණයෙහි වසන්නාහ. එහි ගොස් ඔවුන්ට දහම් දෙසීම මැනවැයි සිතා තමන් වහන්සේගේ පාසිවුරු ගෙන හසරජකු මෙන් අහසට නැග සිරිවන ගහණයෙහි එළඹ සිටියහ. ඒ භික්ෂූහු බුදුන් වැඳ අතවැසි වත් සපයා බුදුන් පිරිවරා හුන්හ. බුදුහු උන්වහන්සේලාට හැම බුදුවරුන් සෙවුනා ලද දම්සක් පැවතුම් සුතුර දෙසූහ. එවිට ඒ තිස්කෝටිය රහත් වූහ. ලක්ෂකෝටියක් දෙවි මිනිසුන්ට ධර්මාවබෝධ විය. එහෙයින් කියන ලදි-

සොපි බුදෙධා පකාසෙසි චතුරෝ සචචවරුතතමෙ
තෙ තෙ සචචරසං පීත්වා විනොදෙනති මහාතචං

පත්‍වාන බොධිමතුලං පඨමෙ ධම්මදෙසනෙ
කොටිසතසහසසානං පඨමාභිසමයො අහූනි

එහි **චතුරෝ සචචවරුතතමෙ** යනු; සතර සත්‍යයයි. උතුම් භාග්‍යවතුන් වහන්සේ උතුම් යන අර්ථයි. චතතාරො සචචවරුතතමො

යනු ද පාඨයි. එහි සතර සත්‍යයවර නම් උතතම යන අර්ථයි. ඒ දිව්‍යමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් හික්මවන ලදහ. **සවවරසං** යනු; චතුසසත්‍ය ප්‍රතිවෙධාමෘතරසය. **පීතවා විනොදෙනත මහාතත්‍වං** යනු; ඒ ඒ මගින් පහකළ යුතු මොහඳුර දුරලති. නසාලති යන අර්ථයි. **පත්‍වාන** යනු; ප්‍රතිවෙධ කොට බොධිං යනු;

මගෙග ඵලෙ ච නිබබානෙ රුකෙඛ පණණතතියං තථා
සබබඤඤුතෙ ච ඤාණසමිං බොධිසදෙදා පනාගතො

එසේමැයි. බොධිවුචචති චතුසු මගෙගසු ඤාණං ආදියෙහි මාර්ගයෙහි ආයේය. උපසමාය අභිඤඤාය සමෙබාධාය නිබබානාය සවෙතතති යන මෙහි ඵලයෙහිය. පත්‍වාන බොධිං අමතං අසංඛතං මෙහි නිර්වාණයෙහිය. අනතරාව බොධිං අනතරා ච ගයං මෙහි ඇසතු වෘක්ෂයෙහිය. බොධිරාජකුමාරෝ භගවතෝ පාදෙ වන්දි යන මෙහි ප්‍රඥනතියෙහිය. පපෙපාහි බොධිං වරභූරිමෙධසො මෙහි සර්වඥතා ඥානයෙහිය. මෙහි ද සර්වඥතාඥානයෙහි යයි දතයුතුය. අර්හත් මාර්ග ඥානයෙහි ද සුදුසුය. **අතුලං** යනු; ප්‍රමාණාතීත, අප්‍රමාණ යන අර්ථයි. සම්බෝධියට පැමිණ ධර්මදේශනා කරන භාග්‍යවතුන් වහන්සේගේ පළමු ධර්ම දේශනාවෙහි යයි අරුත් ගතයුතුය.

යම් දිනක වනාහි චිතත නම් නුවර සමීපයෙහි වසමින් සපුරුක් මුල ගණ්ඩබ්බ මූල අප බුදුරදුන් මෙන් තීර්ථකයන් ගේ මදමාන මඩින යමක ප්‍රාතිහාර්යය කොට සුරාසුර යුවතිරති දනවන සුන්දර නවරන් රිදීමුවා භවන සැදි තව්තිසා භවනයෙහි පඹඇඹුල් සලසුන්හි වැඩහිඳ විජම් දෙසූහු ද එදා කෙළලක්‍ෂයක් දෙවියන්ට ධර්මාවබෝධ විය. මේ දෙවන අභිසමයයි. යම්දාක සුනඳ නම් සක්විති රජ සුරහි නුවර සපිරූ සක්විතිවත් ඇත්තේ සක්රුවන ලැබීද එය මංගල බුදුන් ලොව පහළ වූ කල සැලෙනු දැක සුනඳ රජ නොසතුටුව බමුණන් විමසීය. මාගේ කුසල බලයෙන් ජනිත මේ සක්රුවන කුමක් හෙයින් සැලිණිද කියායි. ඔවුහු ඒ රජුට සැලුණ හේතු පැවසූහ. සක්විති රජුගේ ආයු ගෙවීමෙන් හෝ පැවිදිවීමෙන් හෝ බුදුකෙනකුන් පහළවීමෙන් හෝ සක්රුවන තැනින් සැලේයයි කියා මහරජ, ඔබගේ ආයු ගෙවීමක් නැත. ඔබ ඉතා දික් ආයු ඇත්තාහ. මංගල බුදුහු ලොව උපන්හ. එයින් ඔබගේ සක්රුවන සැලිණ කියායි. එයසා සුනඳ සක්විති රජ පිරිවර ජනයා සහිතව සක්රුවන වැඳ

ආයාචනා කළේය. යම්තාක් මම ඔබගේ අනුහසින් මංගල දසබලයන් වහන්සේට උවටැන් කරන්නෙම් ද ඔබ එතෙක් අතුරුදන් නොවුව මැනව කියායි. එවිට සක්රුවන නිසි තැනම පිහිටියේය. එවිට හටගත් සොම්නස් ඇති සුනඳ සක්විති රජ සතිස් යොදුන් පිරිමඬුලු ඇති පිරිස් පිරිවරා සකලලෝකමංගල දසබලයාණන් වෙත ගොස් ශ්‍රාවක සංඝයා සහිත ශාස්තෘන් වහන්සේ මහදනින් සතප්වා කෙළ ලක්ෂයක් රහතුන්ට කසීසළු පුදා තථාගතයන් වහන්සේට සියලු පිරිකර පුදා මුළුලොව විස්මය කරවන බුදුපුද කොට මංගල ලෝකනායකයාණන් වෙත එළඹ දසනඛසමොධානයෙන් බබළන විමල කමල කැකුළු වත් අඤ්ජලි හිස තබා වැඳ බණ ඇසීමට පසෙක හිඳගත්තේය. ඔහුගේ පුත් අනුරාජකුමාර ද හිඳගත්තේය.

එකල්හි සුනඳ සක්විති රජු ප්‍රධාන ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙල කථාව වදාළ සේක. සුනඳ රජ සහපිරිවරින් පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ පෙර සිරිත් බලන්නාහු සෘද්ධිමය පා සිවුරු සම්පත් දැක සක්දෑලින් සුසැදි දකුණත දිගුකොට මහණෙනි, එව්හි වදාළහ. එකෙණෙහි සියල්ලෝ දෑගුල් කෙස් ඇති පාසිවුරුධර සියවස්ගත තෙරවරුන් මෙන් ආකල්ප සම්පන්නව බුදුන් පිරිවරා ගත්හ. මේ තෙවන අභිසමය විය. එයින් කියන ලදි-

සුරිඳදෙව භවනෙ බුදෙධා ධම්මමදෙසයි
නවකොටි සහසසානං දුතියාභිසමයො අහු

යදා සුනඳො චකකවතති සමබුදධමුපසංකමි
තදා අහනි සමබුදෙධා ධම්මහෙරිං වරුතතමං

සුනඳසසානුචරා ජනතා තදාසුං නවුතිකොටියො
සබෙබව තෙ නිරවසෙසා අහෙසුං එහි භිකඛුකානි

එහි සුරිඳ දෙවභවනෙ යනු; නැවත ශක්‍ර භවනයෙහි යන අර්ථයි. ධම්මං යනු අභිධර්මයි. අහනි යනු; තැළෑහ. වරුතතමං යනු; ශ්‍රේෂ්ඨ භාග්‍යවත් උතුමාණෝ. ධර්මහෙරිය යන අර්ථයි. අනචරා යනු; බැඳී හැසිරෙන සේවකයෝ ආසුං යනු; වූහ. තදාසි නවුති කොටියො කියාත් පාඨයි. උන්වහන්සේගේ ජනතාව වූහ. ජනතාව කොපමණද නව කෝටියකි යන අර්ථයි.

ඉක්බිති මංගල ලෝකනාථයාණෝ මේබල නුවර වසන්නාහු දසදහසක් තරුණයන් පිරිවැරූ සුදේවද ධම්මසේන ද ඒ බුදුන් වෙත ඒහි භික්ෂු පැවිද්දෙන් පැවිදි වූහ. මැදින් පුන් පොහෝ දින පිරිවර සහිත දෑගසව්වන් රහත් වූ කල භාග්‍යවතුන් වහන්සේ කෙළ ලක්ෂයක් භික්ෂූන් මධ්‍යයෙහි පාමොක් දෙසූහ. මේ දෙවන සන්නිපාතය විය. සුනඳ සක්විති සමාගමයෙහි අනූකෝටිලක්ෂයක් භික්ෂූන් මැද පාමොක් උදෙසූහ. මෙය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සන්නිපාතා තයෝ ආසුං මංගලස්ස මහෙසිනෝ
කොටිසතසහස්සානං පඨමෝ ආසි සමාගමෝ

දුතියෝ කොටිසහස්සානං තතියෝ නවුතිකොටියෝ
බීණාසවානං විමලානං තදා ආසි සමාගමෝ

එකල අප බෝසත්හු සුරුචි බමුණුගම සුරුචි බමුණුව නිඝණ්ඩු කේටුභ සහිත ත්‍රිවේද පාරගත ඉතිහාසය පස්වනු කොට ඇති අක්ෂරභෙද සහිත පද දත් වියරණ දත් ලෝකායන මහාපුරුෂ ලක්ෂණයන්හි අද්විතීය වූ. හෙතෙම බුදුන් කරා එළඹ බණ අසා පැහැද සරණ පිහිටා හෙට මාගේ දානය පිළිගනු මැනවැයි සංඝයා සහිත භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළේය. බමුණ, කෙතෙක් භික්ෂූන් දෑයි උන්වහන්සේ විසින් විමසන ලද හෙතෙම ස්වාමීනි, ශ්‍රාවක පිරිස කොපමණදැයි විචාළේය. එවිට ප්‍රථම සන්නිපාතය සිදුවූයේ විය. එහෙයින් කෙළ ලක්ෂයකැයි වදාළහ. එසේ නම් ස්වාමීනි, සියලු භික්ෂූන් සමග මාගේ දානය පිළිගනු මැනවැයි ආරාධනා කළේය. ශාස්තෘන් වහන්සේ පිළිගත්හ. බමුණ සෙටට බුදුරදුන්ට ආරාධනා කොට ගෙට යන්නේ මෙසේ සිතිය. මම මෙතෙක් භික්ෂූන්ට කැඳබත් දීමට සමත් වෙමි. හිඳිනා තැන් කෙසේද කියායි. ඔහුගේ එම සිතුවිල්ල අසූසාර දහසක් යොදුන් මෙරමත ඇති දහසක් නුවන් ඇති සක්දෙව්රජුගේ පඬුඇඹුල්සල අසුන උණුසුම් විය. සක්දෙව් රජ අසුනෙහි උණුසුම් බව දැක කවරෙක් නම් මා මෙතනින් පහකරනු කැමැත්තේදැයි සිතන්නේ දිවැසින් මිනිස් ලොව බලා මහාපුරුෂයන් දැක මේ මහාපුරුෂයාණෝ බුද්ධප්‍රමුඛ භික්ෂුසංඝයාට ආරාධනා කොට හිඳිනා තැන් සිතති. මා ද එහි ගොස් පින් කොටසක් ගැනීම වටනේ යයි වඩු වෙසක් මවාගෙන වෑ පොරෝ ගත් අතැතිව මහසතුන් ඉදිරියෙහි පෙනී සිටියේය. හෙතෙම කාගේ හෝ බැළ සඳහා වඩුවැඩක් ඇද්දැයි විමසීය. මා දන්නා යම් යම් ශිල්පයකැයි නැත. යමෙක් යමෙක් යමක් යමක්

කැමති වෙයි ද මණ්ඩපයක් හෝ ප්‍රාසාදයක් හෝ වෙන කිසියම් නිවාසයක් හෝ කැමති වෙයිද ඔහුගේ ඒ එ කටයුත්ත කිරීමට සමත් වෙමියි කිය. එසේ නම් මාගේ වැඩක් තිබේ. ආර්යය කුමක්ද? හෙට දිනට කෙළලක්ෂයක් භික්ෂූන්ට ආරාධනා කළෙමි. උන්වහන්සේලාට හිදිනා මඩුවක් කරව. මට වැටුප් දිය හැකිනම් කරන්නෙමියි කිය. හැකිවෙමියි කිය. එසේ නම් කරන්නෙමියි කියා එක් ප්‍රදේශයක් බැලීය. ඒ දොළොස් යොදුන් ප්‍රමාණ ප්‍රදේශය කසිණමණ්ඩලයක් මෙන් සමතල පරමරම විය. නැවත හෙතෙම මෙපමණ තැන දකුම්කළු සත්රුවන්මුවා මඩුවක් නැගේවායි සිතා බැලීය. එවිට දිවමඩුවක් බඳුව පොළෝතලය බිඳගෙන මඩුවක් නැගී ගියේය. එහි රන්මුවා ටැම්වල රිදීමුවා සටක විය. රිදීමුවා ටැම්වල රුවන්මුවා මිණිටැම්වල පබළුමුවා පබළුමුවා ටැම්වල මිණිමුවා සත් රුවන්මුවා ටැම්වල සත්රුවන්මුවා සටක විය. මණ්ඩපය ඇතුළත කිකිණිදැල් එල්බේවායි බැලීය. බැලූ විගසින් කිකිණිදැල් එල්බිණ. එයින් සුළඟේ සැලෙනවිට පසඟතුරුවලින් මෙන් පරම මනරම් මිහිරිනද විහිදෙයි. දිව සංගීත පවත්නා කලෙක මෙන් විය. අතරතුර දිවගඳදම් දිවමල්දම් දිවපත්දම් දිවරුවන්දම් එල්බේවායි සිතීය. සිතනු සමගම එල්බිණ. කෙළලක්ෂයක් පමණ සඟනට ආසන කැප ඇතිරි පසතුරුණු ආධාරක පොළව පළාගෙන නැගේවායි සිතීය. එකෙණෙහිම පැනනැගිණ. කොණෙහි කොණෙහි එකිනෙක දියසැළි නැගේවායි සිතීය. එකෙණෙහිම පරම සිහිල් මිහිරි සුපිරිසිදු කැප සුවඳ පැන් පිරි කෙසෙල් වැසූ මුව ඇති සැළි පහළ විය. ඒ දහසක් නුවන් ඇති ශක්‍රයා මෙතෙක් දෑ මවා බමුණානන් වෙත ගොස් ආර්යය, එන්න. ඔබේ මඩුව බලා මාගේ බැළය දුන මැනවැයි කිය. බෝසත්හු ගොස් ඒ මඩුව බැලූහ. බලද්දීම උන්වහන්සේගේ සකල ශරීරය පස්වනක් ප්‍රීතියෙන් පිනා ගියේය.

මණ්ඩප බලන උන්වහන්සේට මෙසේ සිතිණ. මෙය මිනිසෙකු විසින් කරන ලද්දක් නම් නොවේ. මාගේ අදහස මාගේ දණ දන ඒකාන්තයෙන් සක්දෙව් රජුගේ භවන උණු වන්නට ඇත. එනිසා සක්දෙවිඳු මේ මණ්ඩපය කළේ වන කියායි. මෙවැනි මඩුවක එක් දිනක් දන්දීම මට නොසෑහෙයි. සතියක් දෙමියි සිතීය. බාහිර දානය කෙතෙක් වුවත් බෝසත්වරුන්ගේ හදවත සතුටු කිරීමට අසමත් වෙයි. සැරසූ හිස සිඳ දීමෙන් බෝසත්වරුන් ත්‍යාගය නිසා සතුටක් උපදී. අප බෝසතුන්ට සිවි ජාතකයෙහි දිනපතා කහවනු පන්ලක්ෂයක් වියදම් කොට සතර දොරටුවෙහිද නගර මධ්‍යයෙහි ද දන් දෙන්නාහු නමුත් ඒ දානය ත්‍යාග

සන්තුෂ්ටිය ඉපදවීමට අපොහොසත් විය. යම්දාක වනාහි බමුණු වෙසින් පැමිනි සක්දෙව්රජ ඇස් ඉල්වූයේද එදින ලොවට එකම ඇසක් වූ උන්වහන්සේ ඇස් උපුටා දුන් සේක්ද? දෙන්නාවූම උන්වහන්සේට ප්‍රීතිය උපන්නේය. කෙසගක් පමණ හෝ සිතේ වෙනසක් නොවීය. මෙසේ බෝසත්වරුන්ට දානයෙහි සැහීමක් නම් නැත. එහෙයින් ඒ මහා පුරුෂයාණෝ ද මා විසින් කෙළලක්ෂයක් භික්ෂූන්ට දන්දීම වටනේයයි සිතා ඒ මණ්ඩපයෙහි වඩා හිඳුවා සතියක් ගවපාන නම් දනක් දුන්හ. ගවපාන යනු මහසැළිවල කිරි පුරවා ළිප තබා ඝන වනතුරු පැසවා කිරිවලට සහල් ටික ටික දමා සහල් පිස පැසවූ මීඝකුරු කුඩු ගිතෙලින් සකස් කළ භෝජනයයි කියැවේ. මෙයම චතුමධුර භෝජනයයි කියනු ලැබේ. මිනිසුන්ට පමණක් වැළඳවිය නොහැකි විය. දෙවියෝ ද මුසුව වැළඳවූහ. දොළොස් යොදුන් පමණ වූ ඒ ස්ථානය ඒ භික්ෂූන්ට ප්‍රමාණවත් නොවීය. ඒ භික්ෂූහු තමන්ගේ ආනුභාවයෙන් වැඩහුන්හ. අවසන් දින සියලු භික්ෂූන්ගේ පාත්‍ර සෝදවා බෙහෙත් පිණිස ගිතෙල් වෙඩරු මීපැණි ආදිය පුරවා තුන්සිවුරු සමග පිදූහ. එහිදී හැමට බාල භික්ෂුව ලබන ලද සිවුරුපිළිය ලක්ෂයක් වටනේ විය. ශාස්තෘන් වහන්සේ අනුමෝදනා කරන සේක් මෙ තෙම මෙවන් මහදනක් පිදීය. කවරෙක් නම් වන්නේදෝයි බලන සේක් මතු දෙයාසංඛ්‍ය කප්ලක්ෂයකින් ගොතම නම් බුදුවරයා යයි දක මහසතුන් අමතා ඔබ මෙතෙක් කල් ගෙවා ගොතම නම් බුදුවන්නාහයි ප්‍රකාශ කළ සේක. එවිට මහපුරිස්නු භාග්‍යවතුන් වහන්සේගේ විවරණ අසා ප්‍රමුදිත සිතින් මම බුදු වන්නෙමි. මට ගිහිගෙයි විසීමෙන් කම් නැත. පැවිදි වෙමියි සිතා ඒසා සම්පත් කෙළපිඩක් සේ හැර දමා බුදුන් වෙත පැවිදි වූ බුදුවදන් ඉගෙන අභිඥා ද අටසමවත් ද උපදවා නොපිරිහුණු දැහැනින් ආයු තාක් සිට බඹලොව උපන්හ. එයින් කියන ලදි.

අහං තෙන සමයෙන සුරුචි නාම බ්‍රාහමණෝ
අජඣායකෝ මනතධරෝ තිණණං වෙදානපාරගූ

තමහං උපසංකමම සරණං ගනත්වාන සත්ථු නෝ
සම්බුදධ පමුඛං සංඝං ගන්ධමාලෙන පූජයිං
පූජෙත්වා ගන්ධමාලෙන ගවපානෙන තපයිං

සොපි බුදෙධා වියාකාසි මංගලෝ දිපදුනතමෝ
අපරිමෙය්‍යෝ ඉතෝ කපෙප අයං බුදෙධා භවිසසති
පධානං පදහිත්වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං

අටඨගාථා විසථාරෙතබබා ගාථා අට විස්තර කළ යුතුය.

තසසාපි වචනං සුතවා හීයො චිතතං පසාදයිං
උතතරිං වත මධිටඨාසිං දසපාරමී පුරිසා

තදා පිතිමනුබුහනෙතා සමෙබාධිවර පතතියා
බුදෙධ දතවාන මං ගෙහං පබබජිං තසස සතතිකෙ

සුතතනතං විනයඤචාපි නවංගං සතථුසාසනං
සබබං පරියාපුණිතවාන සොහයිං ජිනසාසනං

තතථපපමතතෙතා විහරනෙත බ්‍රහ්මං භාවෙථ භාවනං
අභිඤඤාසු පාරමිං ගනතවා බ්‍රහ්ම ලොකමගඤඡහං

එහි ගන්ධමාලෙන යනු; ගඳින් මෙන්ම මලින් ද. **ගවපානෙන** යනු; මෙය කියන ලද්දේමය. සමහරු ඝතපාන කියාත් කියති. තපපයිං යනු; සැතැප්වීමි. උතතරිං වත මධිටඨාසිං යනු; වඩාත් ඒකාන්තයෙන් අධිෂ්ඨාන කළෙමි. දසපාරමී පූරියා යනු; දසපාරමිතා පූරණය පිණිස. **පිතිං** යනු; හදසතුට. අනුබ්‍රෑහෙනෙතා යනු; වඩන්නේ. **සබෙබා විවරපතතියා** යනු; බුදධත්ව ප්‍රාප්තිය පිණිස. බුදෙධා දතවාන යනු; බුදුන්ට පුදා. මං ගෙහං යනු මාගේ ගෘහය. සියලු සැපත් පිවුපසය පිණිස භාග්‍යවත් බුදුන්ට පුදා යන අර්ථයි. තසස යනු; ඒ බුදුසසුනෙහි. බ්‍රහ්මං යනු; බ්‍රහ්මවිහාර භාවනා වඩා.

මංගල භාග්‍යවතුන් වහන්සේගේ නගරය **උතතර** නම් විය. උන්වහන්සේගේ පියා **උතතර** නම් ක්ෂත්‍රිය රජ විය. මව ද **උතතරා** නම් වූවාය. සුදේව ධම්මසෙන දෙනම අගසව්වෝය. උපස්ථායක **පාලිත** නම්. සීවලා අසෝකා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. නාරුක බෝධියයි. ශරීරය අටඅසූ රියන් විය. ආයුෂ අවුරුදු අනූ දහසකි. යසවතී නම් භාර්යාව වූවාය. සීලව නම් පුත්‍රයාය. අස් යානයෙන් නික්මියහ. උතතරාරාමයෙහි විසූහ. උපස්ථායක උතතර නම්. වසර අනූදහසක් ගෙවා පිරිනිවි කල්හි එකපැහැර දසදහසක් සක්වළ ඒකාන්ධකාර විය. සකල සක්වළ මිනිසුන්ගේ මහත් ඇඬීම් වැලපීම් විය. එයින් කියන ලදි-

නගරං උතතරං නාම උතතරො නාම ඛතතියො
උතතරානාම ජනිකා මංගලසෙ මහෙසිනො

සුදෙවො ධම්මසෙනො ච අහෙසුං අගගසාවකා
පාලිතො නාමුපටඨංකො මංගලසස මහෙසිනො

සීවලා ච අසොකා ච අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතො නාගරුක්ඛොති වුච්චති

අට්ඨාසීති රතනානි අච්චුගගතො මහාමුනි
තතො නිදධාවතිරංසි අනෙක සතසහසසියො

නවුතිවසසසහසසානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං

යථාපි සාගරෙ ඌමී න සක්කා තෙ ගණෙ තුයෙ
තථෙව සාවකා තසෙස න සක්කා තෙ ගණෙතු යෙ

යංච අජ්ඣාසි සම්බුදෙධා මංගලො ලොක නායකො
න තසස සාසනෙ අත්ථි සංකිලෙස මරණං තදා

ධම්මොකකං ධාරයිත්වාන සතතාරෙච්චා මහාජනං
ජලිත්වා ධූමකෙතුව නිබ්බුතො සො මහායසො

සංඛාරානං සභාවතං දසසයිත්වා සදෙවකෙ
ජලිත්වං අග්ගික්ඛොව සුරියො අත්ථංගතො යථාති

එහි **තතො** යනු; ඒ මංගල බුදුබදින් නිදාගවති යනු; දිවෙති. වචන විපර්යායසයයි. **රංසි** යනු; රශ්මීහු. අනෙක සතසහසසියො යනු; නොඑක් ලක්ෂගණන්. **ඌමී** යනු; විවිහු. තරංගයෝ. ගණෙතුයෙ යනු; ගිනිමට, සංඛ්‍යා කිරීමට. සාගරයෙහි තරංග මෙපමණ යයි ගණන් කිරීමට නොහැක්කා සේ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ මෙපමණයයි ගණන් කිරීමට නොහැකිය. එහෙයින් ගණන සීමා ඉක්මවිය යන අර්ථයි. **යාව** යනු; යම්තාක් කල්. **සංකිලෙසමරණං තදා** යනු; කෙලෙසුන් සහිත වූයේ සංකිලෙසයි. කෙලෙස් සහිතයන්ගේ මරණය සංකිලෙස මරණයි. එය නැත. එකල ඒ බුදුසසුනෙහි සියලු ශ්‍රාවකයෝ රහත්වම පිරිනිවියහ. පුහුදුන්ව හෝ සෝවාන් වූවන්ව නොමළහ යන අර්ථයි. සමෙමාහමරණං

තදායි සමහරු හදාරති. **ධමෙමාකකං** යනු; ධර්මප්‍රදීපයයි. **ධූමකෙත** යනු; ගින්න කියැවේ. මෙහි ප්‍රදීපයයි දතයුතුය. පහනක් මෙන් දිලී නිවියේය යන අර්ථයි. **මහායසො** යනු; මහපිරිවර ඇත්තාහු. සමහරු නිබ්බුතො සො සාවකො යි කියති. **සංඛාරානං** යනු; සංඛත ධර්මයන්ගේ ප්‍රත්‍යය සහිත ධර්මයන්ගේ. **සභාවකං** යනු; අනිත්‍යාදි සාමාන්‍ය ලක්ෂණ. **සුරියො අත්ථංගතො යථා** යනු; යම් සේ දහසක් කිරණ ඇති දිනකර සකලාන්ධකාර නසා මුළු ලොව බබුළුවා දිලිසී අස්තයට යයි ද මෙසේ මංගල දිවාකරයාණෝ ද විනෙකමලවන පුබුදුවන දිවාකර බඳුව ආධ්‍යාත්මික බාහිර ලෝකාන්ධකාර දුරුකොට සිය සිරුරු ආලෝකයෙන් දිලී අසතංගත වූහ යන අර්ථයි. සෙසු ගාථා හැමතන්හිම පැහැදිලිමය.

මංගල බුද්ධවංස වර්ණනාව නිමියේයි.

තෙවන බුද්ධවංසය සමාප්තයි.

මෙසේ එක්වරම දසසහස්‍රී ලෝකධාතුව ඒකාන්ධකාර කොට ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීමෙන් පසු කාලයෙහි අනූදහස් ආයු ඇති මිනිසුන් අනුක්‍රමයෙන් පිරිහී දසමස වූ කල අන්තර කල්ප ඉක්ම ගිය කල්හි අසංඛ්‍යායුෂ්කව නැවත පිරිහී අනූදහස් වූ පසු සුමන නම් බෝසත්නු පැරැම් පුරා තුසිපුර ඉපිද ඉන් සැව මේබල නුවර සුදතත නම් රජකුල සිරිමා නම් මෙහෙසි කුස පිළිසිඳ ගත්හ. පෙළහර පෙර කී පරිදිය. උන්වහන්සේ කෙමෙන් විය පැමිණ නාරිවඩඪන සොමවඩඪන ඉදධිවඩඪන නමැති තුන්පහයෙහි තෙසැට දහසක් නළඟනන් විසින් උපහාර ලබමින් සුරයුවතීන් පිරිවරන ලද සුරකුමරකු මෙන් දහස්වසක් විෂයරස විඳිමින් වටංසිකා නම් දේවිය අනූපම නම් නිරුපම පුතු වැදූ කල සතර නිමිති දූක ඇත් යානයෙන් නික්ම පැවිදි වූහ. පැවිදි වන උන්වහන්සේ අනුව තිස්කෙළක් පැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා දසමසක් ප්‍රධන්හි හැසිර වෙසක් පොහෝදින අනෝම නිගමයෙහි අනූපම සිටුදූ අනුපමා විසින් පිදූ දිවඕජා බහාලූ කිරිබත් වළඳා සල්වෙනෙහි දිවාවිහාර ගෙවා අනුපම ආජීවකයන් දුන් අට තණමිට ගෙන නාගබෝධිය වෙත පැමිණ පැදකුණු කොට අටතණ මිට තිස්රියන් කොට අතුට එහි පලක් බැඳ වැඩහුන්හ. අනතුරුව මරබල නසා සර්වඥතාඥානය ලබා අනෙකජාති සංසාරං -පෙ- යි උදන් ඇනූහ. එයින් කියන ලදි-

මංගලසස අපරෙන සුමනො නාම නායකො
සබබධමෙමහි අසමො සබබසතතානමුනතමොති

එහි **මංගලසස අපරෙන** යනු; මංගල බුදුන්ට පසුකල **සබබ ධමෙමහි අසමො** යනු; සියලු ශීල සමාධි ප්‍රඥා ධර්මයන්හි. **අසමො** අසමවූ.

සුමන භාග්‍යවතුන් වහන්සේ බෝධි සමීපයෙහිම සත්සතිය ගෙවා දහම් දෙසීම පිණිස බඹ අයැදුම පිළිගෙන මම කාට පළමු දහම් දෙසන්නෙමිදැයි සිතන්නාහු තමන් සමඟ පැවිදි වූ තිස්කෙළ ද සුළුමෑණි පුත් බාලසහෝදර සරණ කුමරුන් ද පුරෝහිත පුත් භාමිත තරුණයාද හේතුසම්පන්න බැව් දූන මොවුන්ට පළමු බණ දෙසමියි සිතා හස් රජකු මෙන් අහසින් ගොස් මේබලා උයන්හි බැස උයන්පලු යවා සිය බාල සොයුරු සරණ කුමරු ද පුරෝහිත පුත් භාමිත කුමරු ද කැඳවා ඔවුන්ගේ පිරිවර සතිස් කෙළක් ද තමන්ගේ සහ පැවිද්දන් තිස් කෙළක් ද තවත් බොහෝ කෙළඟනන් දෙවිමිනිසුන්ද දමසක් පැවැත්වීමෙන් දහම් අමාපැන් පෙවූහ. එයින් කියන ලදි-

සොපි තදා අමතහෙරිං අහනී මෙඛලෙ පුරෙ
ධම්මසංඛසමායුතතං නවංගං ජිනසාසනනති

එහි අමතහෙරිං යනු; අමෘතාධිගමයට නිර්වාණාධිගමයට බෙරය. අහනි යනු; වාදනය කළහ. ධර්මය දෙසූහ යන අර්ථයි. ඒ මේ අමාබෙරය නම් නිවන අවසන් කොට ඇති නවාංග බුදධ වචනයයි. එහෙයින් ධම්ම සබබසමායුතතං නවාංගං ජිනසාසනංයි කියන ලදි. ධම්මසංඛසමායුත්තං යනු; චතුසසක්‍ය ධර්මකථා සංඛ්‍යාත නවාංගයෙන් යුත්.

සුමන ලෝකනායකයාණෝ අභිසම්බෝධියට පැමිණ ප්‍රතිඥානුරූපව පිළිපදනානු මහජනයාට භවබන්ධනයෙන් මිදීම පිණිස කුසල් රුවන් කෙලෙස් සොරුන්ගෙන් රැකගැනීම පිණිස සිල්මහපවුර සමාධි දියාගල පිරිවැරූ විදර්ශනා ඥාන දොරටුව සිහිනුවණ නම් දඩි කවුළුව සමාපත්ති මණ්ඩපාදියෙන් සුසැදි බෝධිපාක්ෂික ජනකාය ගැවසි චරඅමා නුවර මැවූහ. එයින් කියන ලදි-

නිජජිනිත්‍ථා කිලෙසෙ සො පත්‍ථා සමෙබාධිමුත්තමං
මාපෙසි නගරං සත්‍ථා සදධම්මපුරවරුත්තමනති

එහි නිජජිනිත්‍ථා යනු; දිනා, මැඩලා. ක්ලේශ අභිසංස්කාර දේවපුත්‍ර මාරයන් නසා යන අර්ථයි. සොයනු. සුමන බුදුහු. ජිනිත්‍ථා කිලෙසෙහි කියා ද පාඨයි. එහි හිකාරය පදපූරණමාත්‍ර නිපාතයකි. පාත්‍ථා යනු; පතෙනායි ද පාඨයි. නගරං යනු; නිවන් පුරයයි. සදධම්මපුරවරුත්තමං යනු; සද්ධර්ම නමැති පුරවරයන්හි උතුම් ශ්‍රේෂ්ඨ ප්‍රධාන වූ නැතහොත් සද්ධර්මය උතුම් පුරයන්හි උතුම් වූයේ සද්ධම්ම පුරවරුත්තයි. පළමුවැන්නෙහි අර්ථ විකල්පයෙහි නගරං යනු; එයටම පර්යාය වෙයි දත යුතුය. ප්‍රතිවේධ කළ ධර්ම ස්වභාව ඇති සේඛ අසේඛ ආර්ය පුද්ගලයන්ගේ පිහිටීමට ගෝචර නිවාසනස්ථානය යන අර්ථයෙන් නිවන නගරයයි කියැවේ. ඒ උතුම් සදහම් නුවර ඒ ශාස්තෘන් වහන්සේ අචිවජ්ඣන අකුටිල ඍජු පුළුල් විස්තාර සතිපට්ඨානමය මහවීදිය මැවූහ. එයින් කියන ලදි-

නිරනතරං අකුටිලං උජුං විපුල විත්‍ථතං
මාපෙසි සො මහාවීථිං සතිපට්ඨානවරුත්තමනති

එහි **නිරනතරං** යනු; කුසල ජවන සඤ්චරණයෙන් අතරක් නැති බැවින් නිරන්තර. **අකුටිලං** යනු; වංකබව ඇති කරවන දොසින් තොර හෙයින් අකුටිල. **උජුං** යනු; අවංක නිසාම ඍජු. මෙය පළමු පදයෙහි අර්ථයම දීපනය කරන වචනයකි. **විපුලවත්ථතං** යනු; දිගින් ද පුළුලින් ද යුතු වූයේ පුථුලවිත්ථතයි. පුථුලවිත්ථතභාවයයි. ලෞකික ලෝකෝත්තර සතිපට්ඨාන වශයෙන් දැකිය යුතුය. **මහාවීථිං** යනු; මහා මාර්ගයයි. **සතිපට්ඨානවරුත්තමං** යනු; සතිපට්ඨානය ද එය උතුම් දේවල උතුම් වූයේ නුයි ද සතිපට්ඨානවරුත්තමයි. නැතහොත් උතුම් සතිපට්ඨානමය උත්තම වීථිය යන අර්ථයි. දැන් - ඒ නිවන් මහනුවර ඒ සතිපට්ඨාන මහා වීථියෙහි සතර ශ්‍රාමණ්‍ය ඵල සිවුපිළිසිඹියා ෂඩභිඥා අටසමවත් යන මේ මාහැඟි රුවන් දෙපස ධර්මාසන විසිරවූහ. එයින් කියන ලදි-

එලෙවතතාරි සාමඤ්ඤානි චතසෙසා පටිසමභිදා
ඡළභිඤ්ඤාථයසමාපතති පසාරෙසි තසස වීථියනති

දැන් භාග්‍යවතුන් වහන්සේ මේ රුවන්බඩු යම් අප්‍රමාදී සිහිමත් හිරිඔතප් වීර්යාදියෙන් යුත් නුවණැත්තෝ වෙත් ද ඔවුහු ලබා ගනිති යයි ඒ රුවන් ලැබගන්නා උපාය දක්වන්නාහු-

යෙ අපපමතතා අබිලා හිරිවිරියෙනුපාගතා
තෙ තෙ ඉමෙ ගුණවරෙ ආදියනතියථාසුඛං යි කීහ.

එහි **යෙ** යනු; අනියම් උද්දේසකි. **අපපමතතා** යනු; ප්‍රමාදයට විරුද්ධ සිහියෙන් වෙන්වීමේ නොවීමේ ලක්ෂණයෙන් යුක්තයෝයි. **අබිලා** යනු; වෙතොබිල පසින් රහිතයෝ. **හිරිවිරියෙනුපාගතා** යනු; කාය දුශ්චරිතාදියෙන් ලජ්ජිත වේ නුයි හිරි නම්. මෙය ලජ්ජාවට නාමයකි. වීර්යයාගේ බව වීර්යයයි. එය උත්සාහ ලක්ෂණ කොට ඇත්තේය. එම හිරි වීර්යවලින් යුක්ත වූ සහිත වූ භව්‍ය පුද්ගලයෝ. **තෙ** යනු; මෙය පළමු අනියම උදෙදසයෙහි නියම උදෙදසසයි. නැවත **තෙ** යනු; කී ආකාර ගුණරුවන් විශේෂ ඇති ඒ පුද්ගලයෝ. **ආදියනති**; ලබති. සාක්ෂාත් කරති යන අර්ථයි. සියල්ල වනාහි සුමන බුදුහු දහම්බෙරය වයා දහම්නුවර මවා මෙකී නයින් පළමුවම කෙළලක්ෂයකට අවබෝධ කරවූහ. එයින් කියන ලදි-

එවමෙතෙන යොගෙන උදධරනෙතා මහාජනං
බොධෙසි පයමං සත්ථා කොටිසතසහසසියොති

එහි උදධරනෙතා යනු; සසර සයුරෙන් අරිමහ නැවෙන් එගොඩ කරන්නේ. කොටිසතසහසසියො යනු; කෝටි ලක්ෂයක් යන අර්ථයි. විපර්යාස වශයෙන් දක්වන ලදි. යම්දා වනාහි සුමන ලෝකනායකයාණෝ සුනඤවති නුවර අඹරුක් මුල්හි තීර්ථක මදමාන මර්දනය කරන යමක ප්‍රාතිහාර්යය කොට කෙළදහසක් සත්වයන් දහම්අමා පෙවූ සේක්ද මෙය දෙවන අභිසමය විය. එයින් කියන ලදි-

යමහි කාලෙ මහාවීරො ඔවදි තිත්ථියෙ ගණෙ
කොටි සහසසාභිසමිංසු දුතියෙ ධම්මදෙසනෙති

එහි තිත්ථියගණෙ යනු; තීර්ථක වූවන්ගේ සමූහයෙහි තීර්ථකයන්ගේ සමූහයෙහි කියාද තිත්ථියෙ අභිමදදනෙතා බුදෙධා ධම්මම දෙසයි ද සමහරු කියති, යම්දාක දසදහසක් සක්වළ දේවතාවෝ මේ සක්වළට රැස්ව මිනිස්සු ද නිරෝධය පිළිබඳ කථාවක් ඉපදවූහ. නිරෝධයට කෙසේ සමවදිත් ද? කෙසේ නිරෝධයට සමවන්නාහු වෙත්ද? කෙසේ නිරෝධයෙන් නැඟිසිටිත් දැයි මෙසේ සමාපජ්ජන අධිට්ඨාන උට්ඨාන ආදියෙහි විනිශ්චය කිරීමට නොහැකි වූවාහු මිනිසුන් සමග කාමාවචර සදෙව්ලෙව්හි දෙවියෝ ද නව බඹලොව බඹහු ද ව්‍යාකුලව දෙපක්ෂයක් වූහ. ඉක්බිති නර සුන්දර අරින්දම රජු සමඟ සවස් වේලෙහි ලෝකනාථ වූ සුමන දසබලයන් වහන්සේ වෙත ගියහ. ගොස් අරින්දම රජ භාග්‍යවතුන් වහන්සේගෙන් නිරෝධ ප්‍රශ්නය විචාළේය. භාග්‍යවතුන් වහන්සේගේ නිරෝධ පැන විසඳුමෙන් අනූ කෙළදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධ විය. මෙය තෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

යදා දෙවා මනුසසා ච සමගගා එකමානසා
නිරොධපඤහං පුචඡිංසු සංසයඤචාපි මානසො

තදාපි ධම්මං දෙසෙනෙත නිරොධ පරිදීපනං
නවුතිකොටි සහසසානං ධම්මාභිසමයො අහූති

ඒ සුමන භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සන්නිපාත තුනෙක් විය. එහි පළමු සන්නිපාතයෙහි මේඛල නුවර ඇසුරෙහි වස්වැස පළමු

පවාරණයෙහි එහි භික්ෂුභාවයෙන් පැවිදි වූ කෙළලක්ෂයක් රහතුන් සමග භාග්‍යවතුන් වහන්සේ නිවාරණ කළසේක. මෙය පළමු සන්නිපාතය විය. ඉක්බිති පසු කාලයෙහි සංඛසස පුරයට නුදුරුව අරින්දම රජුගේ පින් බෙලෙන් නිපන් යොදුනක් පමණ රන් පර්වතයක වැඩහිඳ සරාකල රැසිරැරස් ඇති යුගඳුරු මුදුනෙහි දිවාකරයා මෙන් මුනිදිවාකරයාණෝ අරින්දම රජු පිරිවරා ආ අනූකෙළ දහසක් පුරුෂයන් දමනය කොට සියල්ලන් ඒහිභික්ෂු පැවිද්දෙන් පැවිදි කොට එදිනම රහත් වූවන් පිරිවරා සතරඟින් යුත් රැස්වීමෙහි පාමොක් උදෙසූහ. මෙය දෙවන සන්නිපාතය විය. එකල්හි සක්දෙව්රජ බුදුන් දැකීම පිණිස ආයේය. සුමන භාග්‍යවතුන් වහන්සේ එදින රහතුන් අසූකෙළ දහසක් පිරිවරා පාමොක් උදෙසූහ. මේ තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං සුමනසස මහෙසිනෝ
ඛීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

වසසං වුතථසස භගවතෝ අභිසුතෙථ පවාරණෙ
කොටිසතසහසෙසහි පවාරෙසි තථාගතෝ

තතොපරං සනනිපාතෙ විමලෙ කඤඣනපබබතෙ
නවුති කොටිසහසසානං දුතියෝ ආසි සමාගමෝ

යදා සකෙකා දෙවරාජා බුදධදසසනුපාගමි
අසීති කොටිසහසසානං තතියෙං ආසි සමාගමොති

එහි **අභිසුතෙථ පවාරණෙ** යනු; ලිංගවිපර්යාශය දතයුතුයි. පවාරණය ප්‍රකාශ කළ කල්හි යන අර්ථයි. **තතො පරං** යනු; එයින් මෑත භාගයෙහි. **කඤඣනපබබතෙ** යනු; රන්මුවා පර්වතයෙහි. **බුදධදසසනුපාගමි** යනු; බුදුන් දැකීමට පැමිණියේය. එකල වනාහි අප බෝසත්හු මහර්ධිමත් මහානුභාව ඇති අතුලනම් තාරජාණ කෙනෙක් වූහ. ඔහු ලොව බුදුන් උපන් බව අසා නෑගණ පිරිවරා සිය භවනයෙන් නික්ම කෙළ ලක්ෂයක් භික්ෂූන් පිරිවැරූ සුමන භාග්‍යවතුන් වහන්සේට දිව්‍යතූර්යයෙන් උපහාර කරවා මහදන් දී එක්එක් සළුසඟළ පූදා සරණ පිහිටියහ. ඒ ශාස්තෘන් වහන්සේ ද ඔහු මතු බුදුවන්නාහයි ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන නාගරාජා මහිදධිකො
අතුලො නාම නාමෙන උසසනතකුසල සඤචයො

තදාහං නාගභවනා නිකඛමිතවා සඤානිහි
නාගානං දිබබතුරියෙහි සසංඝ ජිනමුපටඨහිං

කොටිසතසහසසානං අනනපානෙන කපපයිං
පවෙචකදුසසයුගං දතවා සරණං තමුපාගමිං

සොසි මං බුදෙධා වයාකාසි සුමනො ලොකනායකො
අපරිමෙයය ඉතො කපෙප අයං බුදෙධා භවසසති
පධානං පදහිතවාන -පෙ- හෙසසාම සමමුඛා ඉමං

කොණ්ඩඤ්ඤ බුද්ධවංසයෙහි ආ පරිද්දෙන් මෙසේ ගාථා අට විස්තර කළ යුතුය.

තසසාපි වචනං සුතවා හීයො චිතතං පසාදයිං
උතතරිං චතමධිටඨාසිං දසපාරමී පූරියාති

ඒ සුමන භාග්‍යවතුන් වහන්සේගේ නගරය මේඛල නම් විය. පියා සුදතත නම්. මව සිරිමා නම්. සරණ භාවිතතත දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක උදේන නම්. සොණා උපසොණා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. බොධිය නාග වෘක්ෂයයි. ශරීරය අනූරියන් උසය. ආයු ප්‍රමාණය අවුරුදු අනූදහසක් විය. උන්වහන්සේගේ දේවිය වටංසකා නම්. පුත්‍රයා අනුපම නම් විය. ඇත්යානයෙන් නික්මුණහ. උපස්ථායක අංග රජය. අංග රාමයෙහි විසූ සේක. එයින් කියන ලදි-

නගරං මෙඛලං නාම සුදතෙතා නාම ඛතතියො
සිරිමා නාම ජනිකා සුමනසස මහෙසිනො

නවවසසසහසසානි අගාරමජෙඣ සො වසි
චතෙදා සුවතෙදා වටංසොච තයො පාසාදමුතතමං

තෙසටඨිසහසසානි නාරියො සමලංකතා
වටංසකා නාම නාරි අනුපමො නාම අතුජො

නිමිත්තෙන චතුරෝ දිසවා හත්ථියානෙන නිකඛමී
අනූනදසමාසානි පධානං පදහී ජිනෝ

බ්‍රහමුණා යාචිතෝ සනෙතා සුමනෝ ලොකනායකෝ
වතති වකකං මහාවීරෝ මෙඛලෙ පුරවරුත්තමෙ

සරණෝ භාවිතතෙතා ච අහෙසුං අගගසාවකා
උදෙනත නාමුපටඨානෝ සුමනසස මහෙසිනෝ

සොණාච උපසොණා ච අහෙසුං අගගසාවිකා
සොපි බුදෙධා අමිතයසෝ නාගමූලෙ අබුජඣ ථ

චරුණෝ ච සරණෙ ච අහෙසුං අගගුපටඨතා
චාලා ච උපචාලා ච අහෙසුං අගගුපටඨිකා

උචචතතනෙන සෝ බුදෙධා නවුතිහත්ථ සමුගගතෝ
කඤඤවනගසියසංකාසෙ දසසහසසී විරොචති

නවුතිවසසසහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානොසෝ තාරෙසි ජනතංබහුං

කාරණියෙ කාරයිත්වා බොධනියෙ ච බොධයී
පරිනිබබායි සම්බුදෙධා උලුරාජාව අත්ථමී

තෙ ච බීණාසවා භිකඛූ සෝ ච බුදෙධා අසාදිසෝ
අතුලං පහං දසසයිත්වා නිබබුතා තෙ මහායසා

තඤඤව ඤාණං අතුලියං තානි ච අතුලියානි රතනානි
සබබං සමතතනතරහිතං නනු රිතතා සබබසංඛාරා

සුමනෝ යසධරෝ බුදෙධා අංගාරාමමහි නිබබුතෝ
තත්ථෙව තසස ජිනථූ පෝ චතුයොජනමුගග තොති

එහි **කඤ්චනගඝිය සංකාසෝ** යනු; නන්රුවනින් විසිතුරු රන්මුවා ඇඟෑයක් සමාන රූපශෝභා ඇත්තේ. **දසසහසසී විරොචති** යනු; උන්වහන්සේගේ ප්‍රභායෙන් දසසහස්‍රී ලෝකධාතුව බබළයි. විරාජිත වෙයි යන අර්ථයි. **තාරණීයෙ** යනු; තරණය කරවිය යුත්තන්. සියලු බුද්ධ වෙනෙය්‍යයන් යන අර්ථයි. **උලුරාජාව** යනු; චන්ද්‍රයා මෙන්. **අත්ථමී** යනු; අස්තංගත වූහ. අත්ථං ගතෝ යි සමහරු කියති. **අසාදිසෝ** යනු; අසමාන. මහායසා යනු; මහත් කිතුගොස ඇත්තාහු. **තංච ඤාණං** යනු; ඒ සර්වඥතා ඥානය. **අතුලං** යනු; අතුල්‍ය, අසමාන, සෙස්ස පැහැදිලිමය.

සුමන බුදධවංස වර්ණනය නිමි.

සතරවන බුදධවංසය සමාප්තයි.

සුමන භාග්‍යවතුන් වහන්සේට පසු කාලයෙහි උන්වහන්සේගේ සසුන ද අතුරුදහන් වූ පසු අනූදහසක් අවුරුදු ආයු වූ මිනිස්සු ක්‍රමයෙන් පිරිහී දසහැවිරිදිව නැවත ක්‍රමයෙන් වැඩී අසංඛ්‍යායුෂ්කව නැවත පිරිහෙන්නාහු හැටදහස් අවුරුදු ආයු ඇත්තෝ වූහ. එකල රේවත නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේ ද පැරුම් පුරා නන් රුවනින් බබළන තුසිත භවනයෙහි ඉපිද ඉන් සැව සකලධනධාන්‍යවත් සුබඤ්ඤවතී නුවර සකලාලංකාර සමලංකෘත අපමණ පිවිතුරු පිරිවර පිරි සිරිසැපතින් නිරවුල් සකල සමෘද්ධියෙන් විසල් විපුල නම් රජකුල සියලු දනනුවන් බඹරකැල ගැවසි සුපිපි නෙතුපුලින් සශ්‍රීක සුසිනිඳු මුවකමලාකර ශෝභා ඇති. රුසිරු මනෝහර ගුණගණයෙන් සුවිසල් විපුලා නම් අගමෙහෙසි කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් සිකුකළු පව්වෙන් බස්නා රනහස් රජකු මෙන් මවුකුසින් බිහිවූහ.

උන්වහන්සේ පිළිසිඳ ගැනීමෙහි බිහිවීමෙහි ප්‍රාතිහාර්යය පෙර කී පරිද්දෙන් සිදුවිය. සුදසසන රතනගසි ආවෙල නම් තුන් පහයක් විය. සුදසසනා දේවිය ප්‍රමුඛ තෙතිස් දහසක් ස්ත්‍රීහු ප්‍රත්‍යුපසථාන කළහ. ඔවුන් විසින් පිරිවරන ලද උන්වහන්සේ සුරයුවතීන් පිරිවර කළ දෙව්කුමරකු මෙන් සඳහසක් හවුරුදු විෂයරස විඳිමින් ගිහිගෙයි විසූහ. සුදසසනා දේවියට වරුණ නම් පුතු උපන් කල්හි උන්වහන්සේ සතර නිමිති දැක නන්පැහැ උතුම්සළු හැඳ මුතුහර මිණිකොඩාල් පැළඳ උතුම් කෙයුර මකුට කටක ධරව පරම සුවඳ කුසුමින් සැරසී පරමරූසිරු රස් සමූහයෙන් යුත් සරාකල සඳ මෙන් තරු පිරිවැරූ චන්‍දයා මෙන් දෙව්ගණ පිරිවැරූ ශක්‍රයා මෙන් බඹගණ පිරිවැරූ හාරිත මහබඹු මෙන් මහත් සිවුරගයෙන් පිරිවරා ආජන්‍යරථයෙන් මහබිනික්මන් කොට සියලු අබරණ මුදා භාණ්ඩාගාරිකයා අතට දී ජලජ අමල අවිකල නිල්මහනෙල් පෙතිවන් සියුම් මුවහත් ඇති තියුණු කඩුවෙන් මෞලිය සහිත කෙස් කපා අහසට දැමූහ. සක්දෙව්රජ එය රන්කරඬුවෙන් පිළිගෙන තව්තිසා භවනයට ගෙන ගොස් සිනෙරු මුදුනෙහි සත්රුවන්මුවා සෑයක් කළේය. මහපුරිස්හු දෙවියන් දුන් කසාවත් හැඳ පැවිදිවූහ. උන්වහන්සේ අනුව කෙළක් පුරුෂයෝ පැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා සත්වසක් ප්‍රධන් වඩා වෙසක් පුන් පොහෝදින සාධුදේවී නම් එක් සිටු දියණියක පිදූ මී කිරිබත් වළඳා සල්වෙනෙහි දිවාවිහාර කොට සවස්හි වරුණින්ධර ආජීවකයන් දෙන ලද අටතණමිට ගෙන මතැත් ගමනින් තාරුක් බෝධිය පැදකුණු කොට තෙපනස් රියන් කොට තණ අතුරා චතුරංගවීර්යය ඉටා මාර බල

නසා සර්වඥතාඥානය ප්‍රතිවේධ කොට අනේකජාති සංසාරං -පෙ- යි උදන් ඇතුහ. එයින් කීය.

සුමනසස අපරෙන රෙවතො නාම නායකො
අනුපමො අසදිසො අතුලො උතතමො ජිනො

රේවත ශාස්තෘන් වහන්සේ බෝධිසමීපයෙහිම සත්සති ගෙවා ධර්මදේශනය පිණිස බ්‍රහ්මායාචනය පිළිගෙන මම කාහට පළමුව දහම් දෙසන්නෙමිදැයි බලනසේක් තමන් වහන්සේ සමග පැවිදි වූ කෝටියක් භික්ෂූන් ද හේතුසම්පත් ඇති වෙනත් දෙවි මිනිසුන් ද දක අහසින් අවුත් වරුණ රාමයෙහි බැස ඔවුන් පිරිවරා බොහෝ පෙළහර දක්වමින් ගැඹුරු නිපුණ අනිකකු විසින් නොපැවැත්විය හැකි තිපරිවටට අනුතතර ධර්මචක්‍රය පවත්වා කෙළක් භික්ෂූන් අර්හත්වයෙහි පිහිටවූ සේක. තුන් පලයෙහි පිහිටියවුන්ගේ ගණන හිමි නැත. එයින් කියන ලදි-

සොපි ධමමං පකාසෙති බ්‍රහමුණා අභියාචිකො
බන්ධාතුවවත්ථානං අපපවතතං භවාභවෙති

එහි බන්ධාතුවවත්ථානං යනු; පංච ස්කන්ධයන්ගේ අටළොස් ධාතූන්ගේ නාම රූප ව්‍යවස්ථාපනාදි වශයෙන් බෙදා දක්වීම, ස්වභාව ලක්ෂණ සාමාන්‍ය ලක්ෂණාදි වශයෙන් රූපාරූප ධර්මයන්ගේ විමසීම බන්ධාතුවවත්ථාන නමි. පරිමර්දන අසහන වශයෙන් රූපය පෙනපිඩක් බඳුය. කැඩීබිඳී යන බැවින් දියබුබුළක් මෙනැයිද වෙදනාව මොහොතක රමණීය භාවයෙන් මිරිඟුවක් මෙනැයි ද සංඥාව විපුලමහනයෙන් කෙසෙල්කඳක් මෙන් සංස්කාර අසාර හෙයින් මායා වංචනික බැවින් විඤ්ඤාණය මායාවක් මෙනැයි ද මේ ආදි ක්‍රමයෙන් අනිචචානුපසසනාදි වශයෙන් ද ස්කන්ධධාතු විමසීම දතයුතුය. අපපවතතං භවාභවෙ යනුඳු මෙහි භව යනු වෘද්ධියයි. අභව යනු හානියයි. භව යනු සාශ්වත දෘෂ්ටියයි. අභව යනු උච්ඡේද දෘෂ්ටියයි. භව යනු කුඩා බවයි. අභව යනු මහත් බවයි. භව යනු කාම භවයයි. අභව යනු රූප අරූප බවයි. මේ ක්‍රමයෙන් භව අභවයන්ගේ අර්ථය දතයුතුයි. ඒ භව අභවයන්ගේ නොපැවැත්මට හේතුභූත වූ ධර්මය දේශනා කළහ යන අර්ථයි. නැතහොත් මෙයින් සිදුවේ නුයි භවයි. තුන් භවයෙහි උත්පත්ති නිමිත්ත වූ කර්මාදිය භවයයි. අභව නම් දෙලොව තණ්හාව ප්‍රහීණ කරන පැවැත්ම නැති කරන ධර්මය දෙසූහ යන අර්ථයි. ඒ රේවත බුදුන්ගේ අභිසමය තුනෙක් විය. පළමුවැන්නෙහි ගණන සීමාව ඉක්මිණ. එයින් කියන ලදි-

තසසාභිසමයා තීනි අහෙසුං ධම්මදෙසනෙ
ගණනාය න වත්තබ්බා පඨමාභිසමයො අහූනි

එහි **තීනි** යනු; තයො යනුයි. ලිංගවිපර්යාසය කරන ලදි. මෙය ප්‍රථම අභිසමය විය. ඉක්බිති පසුකලෙක උතුම් නගරයක් වූ උත්තර නුවර සකල සතුරන් දමනය කරවන අරිඳම නම් රජෙක් විය. හෙතෙම බුදුන් සිය නුවරට වැඩි බව අසා තෙ කෙළෙක් දෙන පිරිවරා භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කොට සෙටට ආරාධනා කොට බුදුපාමොක් සඟනට සතියක් මහදන් පවත්වා තුන්ගව්වක් පුළුල් පහන් පූජාවක් පුදා බුදුන් වෙත ගොස් හුන්නේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට සිතට අනුරූප විසිතුරු නය ඇති දහමක් දෙසූහ. එහිදී කෙළ ලක්ෂයක් දෙවිමිනිසුන්ට දෙවන ධර්මාවබෝධ විය. එයින් කියන ලදි-

යදා අරිඳමං රාජං විනෙසි රෙවතො මුනි
තදා කොටි සහසසානං දුතියාභිසමයො අහූනි

මෙය දෙවන අභිසමයයි. පසුකල රේවත ශාස්තෘහු උත්තර නියම්ගම අසල වසන්නාහු සතියක් නිරොධ සමවතට සමවැද හුන්හ. එකල උත්තර නිගමවාසීහු කැඳ බත් අවුළු බෙහෙත් පැන් ගෙනවුත් බික්සඟනට මහදන් දී ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ කොහිදැයි භික්ෂූන් විමසූහ. එවිට භික්ෂූහු ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ නිරොධ සමවතට සමවන් සේකැයි ඔවුන්ට කීහ. ඉක්බිති ඒ සතිය ගෙවුන පසු නිරොධ සමවතින් නැගී සිය අනුපම සිරින් වොරදනා සරාකල හිරුවන් බුදුන් දැක නිරොධ සමවතෙහි ගුණ අනුසස් විචාළහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට නිරොධ සමාපත්තියෙහි ගුණ අනුසස් දෙසූහ. එකල කෙළසියක් දෙවිමිනිස්සු රහත්බැවිහි පිහිටියහ. මේ තෙවන අභිසමය විය. එයින් කියන ලදි-

සත්තාහං පටිසල්ලානා වුට්ඨහිත්වා නරාසභො
කොටිසතං නරමරූනං විනෙසි උත්තමෙ ඵලෙති

සුධඤ්ඤවතී නුවර පළමු පාමොක් උදෙසීමෙහි ඒහිභික්ඛු පැවිදි ලත් ගණන හිමි නැති රහතුන්ගේ පළමු සන්නිපාතය විය. මේබල නුවර එහිභික්ඛු පැවිදි ලත් කෙළ ලක්ෂයක් රහතුන්ගේ දෙවන සන්නිපාතය විය. රේවත භාග්‍යවතුන් වහන්සේගේ ධර්මචක්‍රානුවර්තක අග්‍රශ්‍රාවක

ප්‍රාඥයනට අග්‍රවරුන තෙරණුවෝ ගිලන් වූහ. ගිලන්බව විමසීමට උන්වහන්සේ වෙත පත් මහජනයාට තිලකුණු දක්වන දහම් දෙසා කෙළලක්ෂයක් පුද්ගලයන් ඒහිභික්ඛු පැවිද්දෙන් පැවිදිකොට අර්හත්වයෙහි පිහිටුවා සිවුපිරිස් සන්නිපාතයෙහි පාමොක් දෙසූහ. මෙය තෙවන සන්නිපාතයයි. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං රෙවතසස මහෙසිනෝ
ඛීණාසවානං විමලානං සුවිමුතතානා තාදිනං

අතිකකනතා ගණනපථං පඨමං යෙ සමාගතා
කොටිසතසහසසානං දුතියෝ ආසිසමාගමෝ

යොපි පඤඤාය අසමෝ තසස චකකානුවතතකෝ
සෝ තදා ව්‍යාධිකෝ ආසි පතෙතා ජීවිත සංසයං

තසස ගිලානිපුචඡාය යෙතදා උපගතාමුනි
කොටිසතසහසසා අරහනෙනාතතියෝ අසි සමාගමොනි

එහි චකකානුවතතකෝ යනු; ධර්මචක්‍රානුවර්තක. පතෙතා ජීවිතසංසයං යනු; මෙහි ජීවිතයෙහි සංසය ජීවිත සංසයයි. ජීවිතක්ෂයට පත්වෙයිද නොවෙයිදැයි මෙසේ ජීවිත සංසයට පැමිණියේ. ව්‍යාධි බලවත් භාවයෙන් මැරෙයි ද නොමැරෙයිදැයි ජීවිතයෙහි සැකයට පැමිණියේ යන අර්ථයි. යෙ තදා උපගතා මුනි යනු; මෙසේ දීර්ඝව ඇති විට භික්ෂූන් කෙරෙහි වෙයි. හුස්වය ඇතිවිට වරුණ තෙරුන් කෙරෙහි වෙයි.

එකල අප බෝසත්හු රමමවතී නුවර අතිදේව නම් බ්‍රාහමණව බමුණු දහමෙහි පාරප්‍රාප්තව රෙවත බුදුන් දැක බණ අසා සරණ පිහිටා සිලෝදහසකින් දසබලයන් වහන්සේ පසසා දහසක් අගනා උතුරුසළුවෙන් භාග්‍යවතුන් වහන්සේ පිදූහ. ඒ බුදුහු ඔහුට දෙයාසංඛ්‍ය කප් ලඝ්‍යකින් මත්තෙහි ගෝතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන අතිදෙවො නාම බ්‍රාහමණෙ
උපගනත්වා රෙවතං බුදධං සරණං තසස ගචඡහං

තසස සීලං සමාධිඤඤව පඤඤාගුණමනුත්තමං
ථොමයිත්වා යතා ථාමං උතතරියමදාසහං

සොපි මං බුදෙධා ව්‍යාකාසි රෙවතො ලොකනායකො
අපරිමෙය්‍යෙ ඉතො කපෙප අයං බුදෙධා භවිසසති
පබානං පදහිත්වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං
ගාථා අට විස්තර කළ යුතුය.

තසසාපි වචනං සුත්වා හියො චිතතං පසාදයිං
උතතරිං වතමධිටඨාසිං දසපාරමී පූරියා

තදා පි මං බුදධධමමං සරිත්වා අනුබ්‍රූහයිං
ආහරිසසාමි තං ධමමං යං මයහං අභිපත්ථිතනති

එහි **සරණං කසස** ගචඡහං යනු; උන්වහන්සේ සරණ ගියෙමි. කර්මාර්ථයෙහි සම්බන්ධ පදයි. **පඤඤාගුණං** යනු; ප්‍රඥාසම්පත්තියයි. **අනුතතමං** යනු; ශ්‍රේෂ්ඨ. **පඤඤා විමුතතිගුණමනුතතමං** යි ද පාඨයි. එය පහැදිලිමය. **පොමයි ත්වා** යනු; ස්තුති කොට, වර්ණනා කොට. යථාථාමං යනු; බලපමණින්. **උතතරියං** යනු; උතතරාසංගයයි. **අදාසහං** යනු; අදාසිං අහං යනුයි. මම දිනිමි. බුදධධමමං යනු; බුදධකාරක ධර්මයි. පාරමී ධර්ම යන අර්ථයි. **සරිත්වා** යනු; අනුස්මරණය කොට. **අනුබ්‍රූහයිං** යනු; අභිවර්ධනය කළෙමි. **ආහරිසසාමි** යනු; ගෙන එන්නෙමි. **තං ධමමං** යනු; බුද්ධත්වය. **යං මයහං අභිපත්ථිතං** යනු; මා විසින් යමක් පතන ලදද ඒ බුද්ධත්වය ගෙනඑන්නෙමි යන අර්ථයි.

ඒ රේවත භාග්‍යවතුන් වහන්සේගේ නගරය සුධඤඤවති නම් විය. විපුල නම් කැත්තෙම පියාය. මව විපුලා නම්. වරුණ බ්‍රහමදෙව දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. සම්භව උපස්ථායකය. භද්‍රා සුභද්‍රා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. නා රුක බෝධියයි. ශරීරය අසූරියන් උස් විය. ආයුහ අවුරුදු සැට දහසකි. සුදසසනා අගමෙහෙසියයි. වරුණ නම් පුත්‍රයාය. ආජඤඤ රථයෙන් අභිනික්මන් කළහ.

උන්වහන්සේගේ දේහයෙහි හටගත් අනුත්තර ප්‍රභා ජාලය එකල රැදාවල් නිතර යොදුනක් පැතිරෙයි. සියලු සතුන්ට අනුකම්පා ඇති මහාවීර ඒ ජිනයන් වහන්සේ මාගේ සියලු ධාතූහු විසිරෙත්වායි අධිෂ්ඨාන කළ සේක. යොදුනක් පමණ මහා නගරයෙහි මහාසාර නම් උයන්හි නරසාරයන් විසින් පුදන ලද රේවත බුදුහු පිරිනිවි සේක. එයින් කියන ලදි-

නගරං සුධඤඤවතී නාම විපුලෝ නාම බතතියෝ
විපුලා නාම ජනිකා රෙවතසස මහෙසිනෝ

වරුණෙ බ්‍රහමදෙවොව අහෙසුං අගගසාවකා
සමභවෝ නාමුපටඨාකෝ රෙවතසස මහෙසිනෝ

භදදා චෙව සුභදදාව අහෙසුං අගගසාවිකා
සෝ පි බුදෙධා අසමසමෝ නාගමූලෙ අවුජඣථ

උචචතතනෙන සොබුදෙධා අසීතිහත්ථමුගගතෝ
ඔභාසෙති දිසා සබබා ඉන්දකෙතුව උගගතෝ

තසස සරීරෙ නිබබතතං පභාමාලා අනුතතරං
දිවා වා යදි වා රතතිං සමනතා එරති යොජනං

සටඨීවසසසහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානෝ සෝ තාරෙසි ජනකංබහුං

දසසයිතවා බුදධබලං අමනං ලොකෙ පකාසයං
නිබබායි අනුපාදානෝ යථගගුපාදාන සංඛයා

සෝ ච කායෝ රතන නිභෝ සෝ ච ධමෙමා අසාදිසෝ
සබබං සමනතරහිකං නනු රිතතා සබබ සංඛාරාති

එහි ඔභාසෙති යනු; ප්‍රකාශ කරවයි. උගගතෝ යනු; උස්වගියේ. පභාමාලා යනු; ප්‍රභාතරංගයි. යථගගි යනු; ගිනි මෙන් උපාදාන සංඛයා යනු; ඉන්ධන ක්‍ෂයවීමෙන්. සෝ ච කායෝ **රතන කිභෝ** යනු; ඒ භාග්‍යවතුන් වහන්සේගේ කය රත්වන් පාටය. **තඤඤවකායං රතනනිභං** යි ද පාඨයි. ලිංග විපර්යාසයෙන් දක්වන ලදි. එහි අර්ථය ද එයමැයි. සෙසු ගාථාවල හැම තන්හිම ප්‍රකටම ය.

රේවත බුදධවංස වර්ණනාව නිමියේය.

පස්වන බුදධවංසය සමාප්තයි.

උන්වහන්සේට මෑත භාගයෙහි උන්වහන්සේගේ සසුන ද අතුරුදහන් වූ පසු සෝභිත නම් බෝසත්හු සාරාසංඛ්‍ය කප්ලක්ෂයක් පැරැම් පුරා තුසිපුර ඉපිද ආයු තාක් වැස දේවායාචනයෙන් තුසිපුරෙන් චුතව සුධම්ම නුවර සුධම්ම රජුගේ සුධම්මා බිසෝකුස පිළිසිඳ ගත්හ. උන්වහන්සේ දසමස් ඇවෑමෙන් සුධම්ම උයන්හි මේසපටලයකින් පුන්සඳ මෙ න් බිහිවූහ. උන්වහන්සේගේ පිළිසිඳ ගැනීමෙහි උපතෙහි පෙළහර කී අයුරුමැයි. දසදහසක් අවුරුදු ගිහිගෙයි වැස සැත්තෑ දහසක් නළඟනන්ට නායක අගමෙහෙසි මඛිලා දේවිය කුස සිහ නම් කුමරු උපන් කල්හි සතර නිමිති දක සංවේගයට පැමිණ මාලිගයෙහිදීම පැවිදිව එහිම ආනාපාන සති සමාධිය වඩා සතරදහැන් ලබා සතියක් එහිම ප්‍රධන් වැඩූහ. ඉක්බිති මඛිලා දේවිය පිදූ පරම මිහිරි මීකිරිබත් වළඳා අබිනික්මනට සිත් ඉපදවූහ. මේ සරසා පිළියෙල කළ පහය මහපොළොවට බසීවා. මේ ස්ත්‍රීහු ද මා බෝමුල්හි හුන් පසු නොකියා තුමූම පහයෙන් නික්මෙත්වා කියායි. සිතත් සමගම උන්වහන්සේගේ සුධම්ම රජමාලිගය එතැනින් උඩ නැගී සුනිල් අඳුන් බඳු අහසට නැග්ගේය. එය ගුවන්තල බබුළුවමින් රන්රස දහරා සම සොඳුරු රස්දහරා යුත් දිවාකරයා මෙන් ද සරාසමයෙහි සඳමඬල මෙන් ද ඒ සුවඳ කුසුමදාමයෙන් සරසන ලද ප්‍රාසාදය බබළමින් වාතයෙන් කම්පිතව කුසලජන වාදික පසඟතුරු ගොස මෙන් මිහිරි රමණීය කමනීය නද දෙන දැලි එල්බෙන කිකිණිදැලින් ද ශෝභමාන විය.

දුර පටන් ඇසෙන මිහිරි සරින් සත් සවන් ඇද ගනිමින් ගෙවල් සිවුරැස් සතරමං සන්ධි වීරීන්හි සිටි මිනිසුන්ගේ අල්ලාප සල්ලාපයට බඳුන් වෙමින් දුර අහසෙහි පොළඹවමින් මෙන් තුරුසා නානා රත්න කාන්ති ධාරායෙන් බබුළුවන වර්ණයෙන් ජනනුවන් අදිනු ලබන්නාක් මෙන් පින් අනුභස් කියාපාන්නාක් මෙන් අහසට පිළිපන්නෝය. නාටිකාංගනාවෝ ද පසඟතුරු ද මිහිරි සරින් ගායනා කළහ. රැව් දුන්නේය. සිවුරඟ සෙනඟද අලංකාර කායාභරණ කාන්තියෙන් හටගත් බැබළීමෙන් නන් පැහැ සුවඳ සළුබරණින් ශෝභමාන උතුම් දිව්‍ය සේනාවක් මෙන් සොඳුරු දසුනින් පොළවෙහි මෙන් ගුවනින් පහය පිරිවරා ගියහ. එතැනින් ගොස් ප්‍රාසාදය අටඅසූ රියන් උස් සෘජු මහත් වට කඳමල් පඳු කැකුළින් සුසැදි නාරුක මැදිකොට බැස බිම පිහිටියේය. නළුගෑණු ද කිසිවෙකුත් නොකියාම ඒ පහයෙන් බැස ගියහ. අනේකගුණ සෝභිත සෝභිත මහාපුරුෂයාණෝ මහජනයා විසින් පිරිවරන ලද්දාහුම රෑ තුන්යම ත්‍රිවිද්‍යාව ඉපදවූහ. උන්වහන්සේගේ බලසේනා ධර්මතා විසින් ආ පරිදිම ගියහ.

ප්‍රාසාදය එහිම සිටියේය. සෝභිත බුදුහු බුදුව ධර්මාරාධනය ප්‍රතිඥා කොට කාහට පළමු දහම් දෙසන්නෙමිදැයි බලන්නාහු සිය සුළුමව පුත් බාලසොහොයුරු අසම කුමාර සුනෙත්තකුමාර ද දැක මේ හේතුසම්පත් ඇති දෙකුමරහු ගැඹුරු නිපුණ දහම අවබෝධ කිරීමට සමත් වෙති. මම මොවුන්ට පළමු දහම් දෙසන්නෙමි නම් මැනවැයි අහසින් වැඩ සුධම්ම උයන්හි බැස උයන්පල්ලා ලවා දෙකුමරුන් කැඳවා පරිවාරය සමග ඔවුන් පිරිවරා මහජනකාය මධ්‍යයෙහි ධර්මචක්‍රප්‍රවර්තනය කළ සේක. එයින් කියන ලදි-

රෙවතසස අපරෙන සොභිතො නාම නායකො
සමාහිතො සනතචිතෙතා අසමො අපපටිපුගගලො

සො ජිනො සකගෙහමහි මානසං විනිවටටයි
පහාන කෙවලං බොධිං ධමමචකකං පවතතයිං

යාව හෙටඨා, අවීචිකො භවගගා චාපි උදධකො
එතථනතරෙ එක පරිසා අහොසිධමම දෙසනෙ

තාය පරිසාය සමබුදධා ධමමචකකං පවතතයි
ගණනාය න චතතබෙබා පඨමාභිසමයො අහූනි

එහි සකගෙහමහි යනු; සිය භවනයෙහිම තමන්ගේ ප්‍රාසාද තලයෙහිම යන අර්ථයි. මානසං විනිවටටයි යනු; සිත පරිවර්තනය කළේය. සිය ගෙයි සිට සත් දිනක් තුළම පුහුදුන් බවෙන් සිත පෙරළා බුදධත්වයට පැමිණියේය යන අර්ථයි. භවගගා යනු; අකනිටඨ බවනින්. හෙටඨා යනු; යටින්. තාය පරිසාය යනු; ඒ පිරිස් මැද ගණනාය න චතතබෙබා යනු; ගණන් සීමා ඉක්මවිය යන අර්ථයි. පඨමාභි සමයො යනු; ප්‍රථම ධර්මාභිසමය. අහූ යනු; ගණනින් නොකිව හැකි පිරිස් වූහ යන අර්ථයි. පඨමෙ අභිසමිංසු යෙව කියා ද පාඨයි. උන්වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනයෙහි යම් ජනයෝ අවබෝධ කළාහුද ඔවුහු ගණනින් නොදැක්විය හැක්කාහ යන අර්ථයි.

පසුකලෙක සුදසුන් නුවර දොර චිත්‍ර පාටලී රුක්මුල යමක ප්‍රාතිහාර්යය කොට නවරත්මිණිමුවා භවන වූ තව්තිසා භවනයෙහි පරසතු

රුක්මුල පඬුඇඹුල් සලසුනෙහි වැඩහිඳ අබිදම් දෙසූහ. දේසනා කෙළවර අනූකෙළ දහසකට ධර්මාවබෝධ විය. මේ දෙවන ධර්මාභි සමයයි. එයින් කියන ලදි.

තතො පරමපි දෙසෙනෙතා නරමරූනං සමාගමෙ
නවුති කොටිසහසසානං දුතියාභිසමයො අහූති

ඉන් මෑත භාගයෙහි සුදසුන් නුවර ජයසේන නම් රජකුමර යොදුනක් පමණ විහාරයක් කරවා අසෝක සල් සපු නා දොඹ මූනමල් අඹ කොස් පියා සාල කුඹුක් මීඅඹ කනේරු ආදි වරතුරින් නිරන්තර උයනක් රෝපණය කොට බුදුපාමොක් බික්සඟනට පිදීය. භාග්‍යවතුන් වහන්සේ දානානුමෝදනා කොට ත්‍යාගය වර්ණනා කොට දහම් දෙසූහ. එකල කෙළදහසක් සතරවර්ගයාට ධර්මාවබෝධය විය. මෙය තෙවන අභිසමය විය. එහෙයින් කියන ලදි-

පුනාපරං රාජපුතෙතා ජයසෙනො නාම ඛතතියො
ආරාමං රොපයිත්වාන බුදෙධ නීය්‍යාදයී තදා

තසස යාගං පකිතෙතනෙතා ධම්මං දෙසයි චක්ඛුමා
තදා කොටිසහසසානං ධම්මාභිසමයො අහූති

නැවත උගත නම් රජ සුනඤවති නුවර සුනඤ නම් විහාරය කරවා බුදුපාමොක් සඟනට පිදීය. එම දානයෙහි ඒහිභික්ෂුභාවයෙන් පැවිදි වූ රහතුන් කෙළසියයක සන්නිපාතයකි. සෝභිත බුදුහු උන්වහන්සේලා මැද පාමොක් දෙසූහ. මෙය ප්‍රථම සන්නිපාතයයි. තවද මෙබලා නුවර ධම්මගණාරාම නම් උතුම් ආරාම විහාරයක් කරවා බුදුපාමොක් සඟනට පුදා සියලු පිරිකර සහිත දානයක් පිදීය. එකල එම සමාගමයෙහි එහිභික්ෂුත්වයෙන් මහණ වූ අනූකෙළක් රහතුන්ගේ ඍද්ධිමෙහි පාමොක් දෙසූහ. මෙය දෙවන සන්නිපාතයයි. භාග්‍යවතුන් වහන්සේ ශක්‍රපුරයෙහි වස් වැස පවරාණයට යම් දිනක දෙවිගණ පිරිවරා බට සේක් ද එදා අසූකෙළක් රහතුන් සමග සිවුවනක් පිරිස් ඍද්ධිමෙහි පවාරණය කළසේක. මේ තෙවන සන්නිපාතයයි. එයින් කියන ලදි-

සතනිපාතා තයො ආසුං සොභිතසස මහෙසිනො
ඛීණාසවානං විමලානං සතතවිතතාන තාදිනං

උගගතො නාම සො රාජා දානං දෙති නරුත්තමෙ
තමහි දානෙ සමාගඤ්ජං අරහනතා සතකොටියො

පුනාපරං පුරගණෙ දෙති දානං නරුත්තමෙ
තදා නවුතිකොටිනං දුතියො ආසි සමාගමො

දෙවලොකෙ වසිත්වාන යදා ඔරොහති ජිනො
තදා අසීති කොටිනං තතියො ආසි සමාගමොති

එකල අපබෝසතාණෝ උතුම් සුජාත නම් බමුණුව සෝභිත භාග්‍යවතුන් වහන්සේගේ බණ අසා සරණයෙහි පිහිටා බුදුපාමොක් සඟනට මහදන් පිදූහ. සෝභිත බුදුහුද මතු ගෞතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. එහෙයින් කියන ලදි.

අහං තෙන සමයෙන සුජාතො නාම බ්‍රාහමණො
තදා සසාවකං බුදධං අනනපානෙන තපපයිං

සො පි බුදෙධා වියාතාසි සොභිතො ලොකනායකො
අපරිමෙය්‍ය ඉතො කපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ- හෙසසාමි සම්මුඛා ඉමං

තසසාපි වචනං සුත්වා හටෙඨා සංවිගගමානසො
තමෙවත්තමනුපපතතියා උගගං ධිතිමකාසහනති

එහි තමෙවත්තමනුපපතතියා යනු; ඒ බුද්ධත්වයට පැමිණීම පිණිස ඒ සොභිත බුදුරදුන්ගේ මෙතෙම අනාගතයෙහි ගොතම නම් බුදුවන්නේය යන වචනය අසා බුදුවරයන් වහන්සේලා නොවෙනස් වචන ඇත්තාහයි බුද්ධත්ව ප්‍රාප්තිය අර්ථකොට යන තේරුමයි. උගගතං යනු; තීව්‍ර, සොර ධිතිං යනු; වීර්යයයි. අකාසහං යනු; මම කළෙමි.

ඒ සෝභිත භාග්‍යවතුන් වහන්සේගේ නගරය සුධම්ම නම් විය. සුධම්ම නම් රජ පියාණෝය. සුධම්මා දේවිය මෑණියෝය. අසම සුනෙත්ත දෙනම අගසව්වෝය. උපස්ථායක අනෝම නම්. නකුලා සුජාතා දෙනම

අග්‍රශ්‍රාවිකාවෝය. බෝධිය නාරුකයි. ශරීරය අටපනස් රියන් උසය. ආයු ප්‍රමාන වසර අනූදහසකි. මහාදේවිය මබිලා නමී. සීහ කුමර පුත්‍රයාය. නාටක ස්ත්‍රීහු සැත්තෑ දහසකි. නවදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. ප්‍රාසාදයෙන්ම අභිනික්මන් කළහ. ජයසෙන නම් රජ උපස්ථායක විය. සෝතාරාමයෙහි විසූ සේක. එයින් කියන ලදි-

සුධම්මං නාම නගරං සුධම්මෝ නාම බතතියෝ
සුධම්මා නාම ජනිතා සොභිතසස මහෙසිනෝ

අසමෝ ච සුනෙතෙතා ච අහෙසුං අගගසාවකා
අනොමෝ නාමුපටඨාකෝ සොභිතසස මහෙසිනෝ

නකුලා ච සුජාතා ච අහෙසුං අගගසාවිකා
බුජඣමානෝ ච සෝ බුදෙධා නාගමූලෙ අබුජඣථ

අටඨපණණාසරතනං අවචුගගතෝ මහාමුනි
ඔභාසෙති දිසාසබබා සතරංසීව උගගතෝ

යථා සුඵුල්ලං පවනං නානාගනධෙහි ධූපිතං
තථෙව තසස පාවචනං සීලගනධෙහි ධූපිතං

යථා පි සාගරෝ නාම දුසසනෙන අතපපියෝ
තථෙව තසස පාවචනං සවණෙන අතපපියං

නවුති වසසසහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානෝ සෝ තාරෙසි ජනතං බහුං

ඔවාදං අනුසිටඨිං ච දතවාන සෙසකෙ ජනෙ
හුතාසනොව තාපෙතවා නිබබුතෝ සෝ සසාවකෝ

සෝ ච බුදෙධා අසමසමෝ තෙ ච සාවකා බලපපතතා
සබබං සමනතරහිතං නනු රිතතා සබබසංඛාරාති

එහි **සතරංසීව** යනු; සූර්යයා මෙන්, සියලු දිශාවන් බබුළුවයි යන අර්ථයි. පවනං යනු; මහවනය. ධූපිතං යනු; සුවඳවත් කළ, සුගන්ධිත.

අතපපියො යනු; අතෘප්තිකර, අතෘප්තිය දනවන. **තාවදෙ** යනු; එකල එපමණ කල් යන අර්ථයි. **තාරෙසි** යනු; තරණය කළේය. ඔවාදං යනු; වරක් කීමයි. **අනුසිටයීං** යනු; නැවත නැවත කීම අනුශාසනා නම්. **සෙසකෙ** ජනෙ යනු; සත්‍යාවබෝධයට නොපත් සෙසු ජනයාට. සම්බන්ධාර්ථයෙහි සතතමී පදයයි. **සුතාසනොව තාපෙසුං** යනු; ගින්න මෙන් දිලී. මෙයම හෝ පාඨයි. උපාදාන ක්‍ෂයවීමෙන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවියහ යන අර්ථයි. සෙසු ගාථාවන්හි සියලු තැන් ප්‍රකටය.

සෝභිත බුද්ධවංස වර්ණනාව නිමියේය.

සවන බුද්ධවංසය සමාප්තයි.

සෝභිත භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි පසු එක් අසංඛ්‍යයක් බුදෙධාත්පාද රහිත විය. අසංඛ්‍යය ගෙවීමෙන් එක් කල්පයක අනෝමදස්සී පදුම නාරද නම් තුන්බුදු කෙනෙක් උපන්හ. උන්වහන්සේලාගෙන් අනෝමදස්සී බුදුහු සෝළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පැරැම් පුරා තුසීපුර ඉපිද දේවතායාචනයෙන් සැව වැඳුවති නම් රාජධානියෙහි යසවා නම් රජකුලයෙහි උස්වූ සොඳුරු පියොවුරු ඇති යසෝධරා නම් අගමෙහෙසි කුස පිළිසිඳ ගත්හ. අනෝමදසසි කුමරු යසොධරා දේවිය කුසවන් තැන් පටන් උන්වහන්සේගේ පුණ්‍යප්‍රභාවෙන් අසූරියන් තැන් ආලෝකය පැතිර සිටියේය. සඳහිරු එළියෙන් ද මැඩලිය නොහැකි විය. දසමස් ඇවෑමෙන් ඕ සුනඳ උයන්හිදී බෝසතුන් වැදුවාය. පෙළහර පෙර කී නියායෙනි. නම් තබන දින උපතෙහි අහසින් සත්රුවන් වැටුණු හෙයින් අලාමක රුවන් ඉපදීමට හේතුවූ හෙයින් උන්වහන්සේට අනෝමදසසි කියා නම් තැබූහ. කෙමෙන් වැඩුණු උන්වහන්සේ දිව්‍යමය කම්සැපතින් උවටැන් ලබන්නාක් මෙන් දසදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. උන්වහන්සේට සිරි උපසිරි සිරිවඩ්ඩ යයි තුන් පහයක් විය. සිරිමා බිසොව ප්‍රමුඛ තෙවිසිදහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. සිරිමා දේවිය උපවාන නම් පුතු බිහිකළ පසු සතර නිමිති දැක සිවිකා යානයෙන් මහබිනික්මන් කොට පැවිදිවූහ. උන්වහන්සේ අනුව තුන්කෙළක් ජනයා පැවිදිවූහ. මහපුරිස්හු ඔවුන් පිරිවරා දසමසක් ප්‍රධන් වැඩූහ. ඉක්බිති වෙසක් පුන්පොහෝ දින අනුපම බමුණුගම පිඬු සිගා වැඩ අනුපම සිටුදියණිය පිදූ මීකිරිබත් වළඳා සල්වෙනෙහි දාවල් දවස් ගෙවා අනෝම ආජීවක දුන් අට තණමිට ගෙන අර්ජුනවෘක්ෂ බෝධිය පැදකුණු කොට අටනිස් රියන් පුළුල් තණ ඇතිරි අතුරා චතුරංග වීර්යය ඉටා පලක් බැඳ බල සහිත මරු පරදවා තුන්යමිහි ත්‍රිවිද්‍යා උපදවා අනෙකජාති සංසාරං -පෙ- යි උදන් ඇනූහ. එයින් කියන ලදි-

සොභිතසස අපරෙන සම්බුදෙධා දිපදුත්තමෝ
අනොමදසසි අමිතයසෝ තෙජසසී දුරකිතත මෝ

සෝ ජෙත්වා බන්ධනං සබබං විදධං සෙත්‍ථාතයෝ හවෙ
අනිවත්තීගමනං මගගං දෙසෙසි දෙවමානුසෙ

සාගරොව අසංඛොබෙබා පබබතොව දුරාසදෝ
ආකාසොව අනනෙතා සෝ සාලරාජාව පුලලිතෝ

දසසනෙනපි තං බුද්ධං නොසිතා හොනති පාණිනො
ව්‍යාහරනතංගිරං සුත්වා අමතං පාපුණනති තෙති

එහි අනොමදසසි යනු; අනුපම දර්ශන ඇත්තේ, අපමණ දර්ශන දත්තේ. අමිතයසො යනු; අපමණ පිරිවර අපමණ කීර්ති ඇත්තේ. **තෙජසස** යනු; සීල සමාධි ප්‍රඥා තෙදින් යුක්තවූයේ. **දුරතිකතමො** යනු; යටපත් නොකළ හැක්කේ වෙනත් දෙවියකු මරෙකු කිසිවෙකු විසිනුත් නොමැඩිය හැක්කේ යන අර්ථයි. **සො ජෙත්වා බන්ධනං සබබං** යනු; සියලු දශවිධ සංයොජන සිඳ **විද්ධංසෙත්වං තයො ආවෙ** යනු; ත්‍රිභවගාමී කර්ම කර්මක්ෂයකර ඥානයෙන් නසා, අභාව කොට යන අර්ථයි. අනිවතති ගමනං මගගං යනු; නිවෘත්ති ප්‍රවෘත්තියට පටහැණි නිවන අනිවතති යයි කියැවේ. ඒ අනිවතතියට මෙයින් යේ නුයි අනිවතතිගමනයි. ඒ අනිවතති ගමන මාර්ග වූ අරිඅටඟිමඟ දෙසූහ යන අර්ථයි. දසෙසයි යනුත් පාඨයි. අර්ථය එයමැයි. **දෙවමානුසෙ** යනු; දෙවිමිනිසුන්ට. ඡටඨී අර්ථයෙහි කර්ම පදයි. **අසබෙබා** යනු; කළඔන්නට සොලවන්නාට අසමත් වූයේ **අකෙඛාභියයි.** යම්සේ සුවාසුදහස් යොදුන් ගැඹුරු නොඑක් යොදුන් දහස් භූතාවාස සමුදා නොකැළඹිය හැක්කේ ද එසේ නොකැළඹිය හැක්කේ යන අර්ථයයි. **අකාසොව අනනෙතා** යනු; යම් සේ අහසෙහි අන්තයක් නැත්තේ ද අනනත අප්‍රමාණ අසාර වේද එමෙන් භාග්‍යවතුන් වහන්සේ ද බුදුගුණවලින් අනනත අප්‍රමාණ අපාර වෙති. **සො** යනු; ඒ භාග්‍යවතුන් වහන්සේ, **සාලරාජාව ඵුලිතෙතා** යනු; සර්ව ලක්‍ෂණ අනු ලක්‍ෂණයෙන් සමලංකෘත ශරීර බැවින් සුපිපි සල්රුකක් මෙන් සෝභමානය යන අර්ථයි. **දසසනෙන පි තං** බුදධං යනු; ඒ බුදුන්ගේ දර්ශනයෙන් ද යන අර්ථයි. ශබ්දවේදීහු මෙබඳු තන්හිද සම්බන්ධ විභතති. යොදති **තොසිකා** යනු; සතුටු කරන ලද්දාහු, පිනවන ලද්දාහු. **ව්‍යාහරනකං** යනු; ප්‍රකාශ කරන්නාහුගේ. සම්බන්ධාර්ථයෙහි කර්ම පදයි. **අමතං** යනු; නිවනයි. **පාපුණනති** යනු; අවබෝධ කරති. **තෙ** යනු; යමෙක් උන්වහන්සේගේ වචනය ධර්මය අසත් ද ඔවුහු නිවනට පැමිණෙති යන අර්ථයි.

භාග්‍යවතුන් වහන්සේ බෝමුල සත්සති ගෙවා බඹහු විසින් අයදනා ලදුව ධර්ම දේශනාව සඳහා බුදුඇසින් බලන සේක් තමන් සමග පැවිදි වූ හේතුසම්පන්න තෙකෙළක් දෙන දැක ඔවුහු දැන් කොයි වසත්දයි සලකන්නාහු සුභාවතී නුවර සුදසුන් උයන්හි වසතී දැන අහසින් වැඩ සුදසුන් උයනට බට සේක. උන්වහන්සේ ඔවුන් පිරිවරා දෙව්මිනිසුන්

සහිත පිරිස්හි දම්සක් පැවැත්වූහ. එහිදී කෙළසියයකට පළමු ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

ධම්මාභිසමයෝ තසස ඉදෙධා ථිතෝ තදා අහු
කොටිසතානි අභිසම්ංසු පයමෙ ධම්ම දෙසනෙහි

එහි ථිතෝ යනු; බහුජන වශයෙන් පැතිර ගියේය. කොටිසතාන යනු; කෝටි සියයකි. කොටිසතයොයි ද පාඨයි. සියක් කෝටිය යන අර්ථයි. ඉක්බිති පසු කාලයක ඕසබී නුවර දොර පියාගස මුල යමක ප්‍රාතිහාර්යය කොට දෙව්පුර ශක්‍රභවනයෙහි පඬු ඇඹුල් සලසුනෙහි හිඳ අභිධර්ම වර්ෂා වැස්වූහ. එකල අසූකෙළක් දෙවියෝ ධර්මාවබෝධ කළහ. එයින් කියන ලදි.

තතෝ පරං අභිසමයෙ වසසනෙත ධම්මවුටඨියෝ
අසීතිකොටියෝ අභිසම්ංසු දුතියෙ ධම්ම දෙසෙනහි

එහි වසසනෙත යනු; බුදධමහාමේඝය වසින කල්හි. ධම්මවුටඨියෝ යනු; උන්වහන්සේගේ ධර්මකථාවම වැස්සයි. ඉන්පසු කලෙක මංගල ප්‍රශ්න නිර්දේශයෙහි අටසැත්තෑ කෙළක් ධර්මාවබෝධ කළහ. එයින් කියන ලදි-

තතෝ පරමපි වසසනෙත තපපයනෙත ච පාණිනං
අටඨසතතනි කොටීනං තතියාභිසමයෝ අහුනි

එහි වසසනෙත යනු; දහම්කතා දියදහරා වසින කල්හි. කපපයනෙත යනු; ධර්මාමනක වර්ෂාවෙන් සතප්වන කල්හි, භාග්‍යවතුන් වහන්සේ සතප්වද්දී යන අර්ථයි. අනොමදසසී භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සන්නිපාත තුනෙක් විය. එහි සොරෙය්‍ය නුවර ඉසිදතත රජුට දහම් දෙසන කල පැහැද ඒහිභික්ෂු භාවයෙන් පැවිදි වූ අටලක්ෂයක් රහතුන් මැද පාමොක් දෙසූහ. මෙය ප්‍රථම සනනිපාතයයි. රාධවතී නුවර මධුරින්ධර රජුට දහම් දෙසද්දී ඒහිභික්ෂු භාවයෙන් පැවිදිවූ සත්ලක්ෂයක් රහතන් මැද පාමොක් දෙසූහ. මෙය දෙවන සනනිපාතයයි. නැවත සොරෙය්‍ය නුවරම සොරෙය්‍ය රජු සමග ඒහිභික්ෂුත්වයෙන් පැවිදිවූ සලක්ෂයක් රහතුන් මැද පාමොක් දෙසූහ. මේ තෙවන සන්නිපාතයයි. එයින් කියන ලදි-

සනනිපාතා තයො ආසුං තසසාපි ච මහෙසිනො
අභිඤඤා බලපතඨානං පුපඵිතානං විමුතතියා

අටඨසතසහසසානං සනනිපාතො තදා අහු
පහීණ මද මොහානං සනත චිතතාන තාදිනං

සතතසතසහසසානං දුතියො ආසිසමාගමො
අනංගණානං විරජානං උපසනතාන තාදිනං

ඡනනං සතසහසසාකං තතියො ආසි සමාගමො
අභිඤඤාබලපපතතානං නිබබුතානං තපසසිනනති

එහි තසසා පි ච මහෙසිනො යනු; ඒ අනොමදසසි බුදුන්ගේ, තසසාපි දිපදුකත මපපයිද ද පාඨයි. ලක්‍ෂණ ශබ්දශාස්ත්‍රයෙන් ගතයුතුය. අභිඤඤාබලපතතානං යනු; අභිඥාවන්ගේ බලයට පත්වූවන්ගේ, චිණණ වසිතාවෙන් වහා සමවැදීමෙන් අභිඥාවන්හි ස්ථිරභාවයට පත්වූවන්ගේ යන අර්ථයි. පුපඵිතානං යනු; සර්වප්‍රකාරයෙන් සුපිපි බැවින් අතිශයින් යොහොග්‍රප්‍රාප්තකයින්ගේ. විමුතතියා යනු; අර්හත්ඵල විමුක්තියෙන්. අනංගණානං යනු; මෙහි මේ අංගන ශබ්දය කිසිතැනෙක කෙලෙස්හි වැටේ. තත්‍ථ කතමානි තීනි අංගණානි රාගො අංගණං දොසො අංගණං මොහො අංගණං, කී පාපානං ඛො ආවුසො අකුසලානං ඉචඡාවචරානං අධිවචනං යදිදං අංගණනති යි ද කී තන්හි මෙනි. කිසිතැනෙක කිසියම් කිළටෙක්හි යෙදේ. තසෙසව රජසස වා අංගණසස වා පහාණාය වායමති යන තැන මෙනි. කිසිතැනක එබඳු භූමිභාගයක යෙදේ. චෙතියංගණ බොධියංගණ රාජාංගණ මෙනි. මෙහි වනාහි ක්ලේශයන්හි දතයුතුයි. එහෙයින් නික්ලේශීන්ගේ යන අර්ථයි. විරජානං යනු; එයටම පර්‍යාය පදයකි. තපසසිනං යනු; ක්ලේශක්‍ෂය කර ආර්‍යමාර්ග සංඛ්‍යාත තපස් යමෙකුට ඇත්තේ ද ඔවුහු තපස් ඇත්තෝ ය. ඒ තපස්වීන්ගේ. ක්‍ෂීණාස්‍රවයන්ගේ යන අර්ථයි.

එකල අප බෝසතාණෝ එක් මහෙසාඛ්‍ය යක්‍ෂ සේනාධිපතියෙක් වූහ. මහත් ඍද්ධි මහානුභාව ඇත්තේ නොඑක් කෙළලක්‍ෂගණන් යකුන්ට අධිපති විය. ඔහු බුදුහු ලොව උපන්හයි අසා පැමිණ පරම සොඳුරු දසුන් ඇති සත්රුවන්මුවා සුන්දරතර සඳමඬල වැනි මණ්ඩපයක් මවා එහි

සතියක් බුදුපාමොක් සඟනට දන් පිදීය. බුදුහු භුකතානුමෝදනා වේලෙහි ඔහුට අනාගතයෙහි කප්ලක්ෂයක් අධික එක් අසංඛ්‍යයක් ගෙවීමෙන් ගොතම නම් බුදුවන්නාහයි ප්‍රකාශ කළ සේක. එහෙයින් කියන ලදි-

අහං තෙන සමයෙන යකෙඛා ආසිමහිදධිකෝ
නෙකානං යකඛකොටීනං වසවතතී මහිසසණෙ

තදාපි තං බුදධවරං උපගනතවා මහෙසිනං
අනනපානෙන තපෙපසිං සසංඝං ලොකනායකං

සොපි ම තදා වයාකාසි විසුදධනයනෝ මුනි
අපරිමෙයයෙ ඉතෝ කපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිතවාන -පෙ- හෙසසාම සමමුඛා ඉමං
තසසාපි වචනං සුතවා හටෙඨා සංවිගමානසෝ
උතතරිං වත මධිටඨාසිං දසපාරමීපුරියාති

එහි උතතරිං වතමධිමඨාසිං යනු; පාරමී පිරීම පිණිස වඩාත් දැඩිකරව උත්සාහ කළෙමි යන අර්ථයි. ඒ අනොමදසසි භාග්‍යවතුන් වහන්සේගේ නගරය චඤවතී නම් විය. යසවා නම් රජ පියාණෝය. යසෝධරා නම් මෑණියෝය. නිසභ අනෝම දෙනම අගසව්වෝය. උපස්ථායක වරුණ නම්. සුඳරී සුමනා දෙනම අග්‍රාශ්‍රාවිකාවෝය. බෝධිය අර්ජුන වෘක්ෂයයි. ශරීරය අටපනස් රියන් උසය. ආයුෂ වසර ලක්ෂයකි. අගමෙහෙසිය සිරිමා නම්. පුත්‍රයා උපවාරණ නම්. දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. සිවිකා යානයෙන් අභිනික්මන් කළහ. සිවිකා යානයෙන් ගමන සොභිත බුදධවංස වර්ණනයෙහි ප්‍රාසාද ගමනයෙහි කී පරිද්දෙන්ම දතයුතුය. ධම්මක නම් රජ උපස්ථායකයා යි. ධම්මාරාමයෙහි භාග්‍යවතුන් වනහන්සේ විසූ සේක. එයින් කියන ලදි-

නගරං චඤවතී නාම යසවා නාම ඛතතියෝ
මාතා යසොධරා නාම අනොමදසසිසස සතථුනෝ

නිසභෝ ච අනොමොච අහෙසුං අගගසාවකා
වරුණෝ නාමුපටඨාකෝ අනොමදසසිසස සතථුනෝ

සුඤ්ඤී ච සුමනා ච අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතො අජ්ඣොති පවුචචති

අටඨපඤ්ඤාසරතනං අචවුගගතො මහාමුනි
පභා නිදධාවති තසස සතරංසීව උගගතො

වසස සතසහසසානි ආයු විජති තාවදෙ
තාවතා තිටඨමානො සො තාරෙසි ජනතං බහුං

සුපුපවීතං පාවචනං අරහනෙතහි තාදිහි
විතරාගෙහි විමලෙහි සොභිතථ ජිනසාසනං

සොම සතථා අමිතයසො යුගානි තානි අතුලියානි
සබබං සමනතරහිතං නනු රිතතා සබබසංඛාරාති

එහි පභා නිදධාවත යනු; උන්වහන්සේගේ ශරීරයෙන් ආලොකය නික්මෙයි. උන්වහන්සේගේ ශරීරප්‍රභාව නිබඳ දොළොස් යොදුන් පමණ තැන පැතිර සිටී. යුගානිතානි යනු; අනුශ්‍රාවකාදි යුග යුග්මකයෝ. සබබං සමනතරහිතං යනු; කියන ලද ආකාර සියල්ලම් අනිත්‍යමුඛයට පිවිසෙති යන අර්ථයි. නනු රිතතකමෙව සංඛාරා යනු ද පාඨයි. එහි සියලු සංස්කාර ඒකාන්තයෙන් හිස් කුවජාශීය යන අර්ථයි. මකාරය පදසන්ධිකාරකයි. සෙසු ගාථාවල හැමතන්හි ප්‍රකටය.

මේ අනෝමදසසි භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සාරිපුත්ත මොගගලලාන යන මේ අග්‍රශ්‍රාවක දෙනම අග්‍රශ්‍රාවක භාවය සඳහා ප්‍රාර්ථනා කළහ. මේ තෙරවරුන්ගේ කථා ද මෙහි කිවයුතුය. මා විසින් විස්තාර බියෙන් උපුටා නොදක්වන ලදි.

අනෝමදසසි බුදධවංස වර්ණනාව නිමියේය.

සත්වන බුදධවංසය සමාප්තයි.

අනෝමදසසි භාග්‍යවතුන් වහන්සේගේ පසුකාලයෙහි අවුරුදු ලක්‍ෂයක් ආයු ඇති මිනිස්සු පිළිවෙලින් දසවස් ආයුෂව නැවත කෙමෙන් වැඩී අසංඛ්‍යායාෂ්කව නැවත පිරිහෙන්නාහු ලක්‍ෂයක් අවුරුදු ආයු ඇත්තෝ වූහ. එකල පදුම නම් බුදුහු ලොව උපන්හ. උන්වහන්සේ පාරමී පුරා තුසිත භවනයෙහි ඉපිද එතැනින් චුතව චම්පානුවර අසම නම් රජකුල රූපාදියෙන් අසම අසමා නම් අගමෙහෙසි කුස පිළිසිඳ ගත්හ. උන්වහන්සේ දසමස් ගෙවීමෙන් චම්පක උයන්හි මවුකුසින් නික්මුණහ. කුමරු උපන් කල්හි අහසින් මුළු දඹදිව මුහුද හිම් කොට පියුම් වැස්සක් වැස්සේය. එහෙයින් උන්වහන්සේට නම් තබන දිනයෙහි නම් තබන්නේද නෑයෝ ද මහාපදුමකුමාර කියාම නම් කළහ. උන්වහන්සේ දසදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. උතතර වසුතතර යසුතතර නාම තුන්පහයක් විය. උතතරා දේවිය ප්‍රමුඛ තෙතිස් දහසක් ස්ත්‍රීහු පරිවාරය වූහ. ඉක්බිති මහසත්හු උතතර මහදේවිය රමම කුමරු බිහිකළ කල්හි සතර නිමිති දැක අජෙඤඤ රථයෙන් මහබිනික්මන් කළහ. පැවිදිවන උන්වහන්සේ අනුව කෙළක් පුරුෂයෝ පැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා අටමසක් ප්‍රධන් වීර්යය කොට වෙසක් පුන්පොහෝ දින ධඤඤවති නුවර සුබඤඤ සිටුනුගේ ධඤඤවති නම් දියණිය පිදූ මීකිරිබත් වළඳා මීඅඹ උයන්හි දිවාවිහාර කොට සවස තිපථක ආජීවක දුන් අටතණමිට ගෙන කොටිල බෝධිය වෙත පැමිණ අටනිස් වියන් පුළුලැති තණ ඇතිරි අතුරා පලක් බැඳ චතුරංග වීර්යාධිෂ්ඨාන කොට මරබල නසා තුන්යමිහි ත්‍රිවිද්‍යා පසක් කොට අනේකජාති ආදීන් උදන් අනා බෝධි සමීපයෙහිම සත්සති ගෙවා බඹ ඇරයුම පිළිගෙන ධර්මදේශනයට බඳුන්වන පුද්ගලයන් විමසන සේක් තමන් සමග පැවිදි වූ කෝටියක් පමණ භික්‍ෂූන් දැක එකෙණෙහිම අහසින් ධඤඤවති නුවර අසල ධනඤඤයි උයන්හි බැස ඔවුන් පිරිවරා ඔවුන් මැද දහම්සක පැවැත්වූහ. එකල සියක්කෝටියකට ධර්මවබෝධය විය. එයින් කියන ලදි-

අනොමදසසිසස අපරෙන සමබුදෙධා දිපදුතතමෝ
පදුමෝ නාම භවෙන අසමෝ අපපටිපුගගලෝ

තසසාපි අසමං සීලං සමාධිපි අනනතකෝ
අසංඛෙය්‍යං ඤාණවරං විමුතතීපි අනුපමං

තසසාපි අතුල තෙජසස ධමමචකකපපවතතනතෝ
අභිසමයා තයෝ ආසුං මහාතමපවාහනනති

එහි අසමං සීලං යනු; අන් ශීලයෙන් අසම උත්තම ශ්‍රේෂ්ඨ යන අර්ථයි. සමාධිපි අනන්තකො යනු; සමාධි ද අප්‍රමෙයය. එහි අනන්ත බව ලෝකවිවරණ යමක ප්‍රාතිහාර්යාදියෙහි දතයුතුය. ඤාණවරං යනු; උතුම් සර්වඥතාඥානයයි. අසාධාරණඤාණ හෝ වෙයි. විමුතතිපි යනු; භාග්‍යවතුන් වහන්සේගේ අර්හත්ඵල විමුත්තියයි. අනුපමා යනු; උපමා රහිතය. අතුතෙජසස යනු; අතුල ඤාණතේජස් ඇත්තවුන්ගේ. අතුලතෙජා යනු ද පාඨයි. උන්වහන්සේගේ අභිසමය තුන. මෙහි උත්තර පදය හා සම්බන්ධය ගතයුතුය. මහාතම පවාහනා යනු; මහා මොහ විනාසක යන අර්ථයයි.

පසුකලෙක පදුම භාග්‍යවතුන් වහන්සේ සිය බාල සොහොයුරු සාල කුමරු ද උපසාල කුමරු ද සපිරිවර ඤාතිසමාගමයෙහි පැවිදි කරවා ඔවුන්ට ධර්ම දේශනා කරද්දී අනූ කෙළකට දහම් අමා පෙවූහ. යම් විටක රමම තෙරුන්ට දහම් දෙසූ සේක්ද එකල්හි අසූකෝටියක් තෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

පඨමාභිසමයෙ බුදෙධා කොටිසතමබොධයී
දුතියාභිසමයෙ යෙ ධිරො නවුතිකොටිමබොධයී

යදා ච පදුමො බුදෙධා ඔවදි සකමනුජං
තදා අසීති කොටීනං තතියාභිසමයො අහූති

යම්දාක මනාව වැඩූ ජීවිත ඇති භාවිතාත රජ බුදුපියුම් මුහුණැති පදුම බුදුන් වෙත කෙළලක්‍ෂයක් දෙන පිරිවරා ඒහිභික්‍ෂු භාවයෙන් පැවිදි වූයේද ඒ සමාගමයෙහි භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. මෙය ප්‍රථම සන්නිපාතයයි.

පසුකලෙක මහාපදුම මුනිවරයාණෝ උසභගමනින් උසභවති නුවර සමීපයෙහි වස්විසූහ. නුවරු බුදුන් දකිනු රිසිව වෙත ගියහ. බුදුහු ඔවුන්ට බණ දෙසූහ. එහිද බොහෝ පහන්සිත් ඇති මිනිස්සු පැවිදි වූහ. දසබලයාණෝ ඔවුන් ද වෙනත් තුන් ලක්‍ෂයක් භික්‍ෂූන් සමග විසුද්ධි පවාරණයෙන් පවාරණය කළ සේක. එය දෙවන සමාගමය විය. යමෙක් එහි පැවිදි වූවාහු ද ඔවුහු කඨිනානිසංස අසා පෑලවියෙහි පස්මසක් පස් ආනිසංසයක් දෙන කඨින සිවුරක් පිදූහ. ඉක්බිති භික්‍ෂූහු ඒ කඨිනසිවුර

ඇතිරීම සඳහා මහාප්‍රාඥ ධර්මසේනාධිපති අග්‍රශ්‍රාවක සාලතෙරුන්ට ආයාචනා කොට කඨිනසිවුර උන්වහන්සේට දුන්හ. තෙරුන්ට කඨින සිවුර පිළියෙල කරද්දී මැසීමෙහි භික්ෂූහු සහාය වූහ. පදුම සම්බුදුරජාණන් වහන්සේ ඉදිකටු මලෙහි තුල් අමුණා දුන් සේක. සිවුර නිමවූ පසු භාග්‍යවතුන් වහන්සේ තුන්ලක්ෂයක් භික්ෂූන් සමග චාරිකාවෙහි වැඩිසේක. පසුකලෙක සිංහවික්‍රාන්ත ගමන් ඇති පුරුෂ සිංහයකු මෙන් බුදුසිංහයන් වහන්සේ ගොසිංග සල්වනය බඳු පරමසුවඳ කුසුමින් ඵලයෙන් බරව නැමීගත් සාවෙළෙප ඇති නිවල නෙළුම් මානෙල් ආදියෙන් සමලංකෘත සිහිල් මීබිඳු වැහෙන පිරුණු දියවිලින් යුත් මුවසෙමෙර සිංහඩාඹු ඇත් අස් ගව මී ආදි විවිධ මිගගණ හැසිරෙන සුවඳමල් ගඳින් බැඳි හඳින් බඹර මීමැසි යුවතින්ගේ යංචරණයෙන් හාත්පස ගුමුගුමු නද ගැන්වූ පලරෙසෙන් මත් හදින් අවියත් මිහිරි හඬින් යුත් කොවුලගහන්ගේ ගායනා ඇති පරමරමණීය යොගානුකූල ජනයාගෙන් තොර මහවනයෙහි වස් එළඹි සේක. එහි වසන පිරිවර සහිත දශබල තථාගත බුදුසිරිත් විරාජමාන ධර්මරාජයන් වහන්සේ දැක උන්වහන්සේගේ බණ අසා පැහැද මනුෂ්‍යයෝ ඒහිභික්ෂු පැවිද්දෙන් පැවිදි වූහ. එකල්හි භික්ෂූන් දෙලක්ෂයක් පිරිවරා පවාරණය කළසේක. එය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං පදුමසස මහෙසිනෝ
කොටි සතසහසසානං පඨමෝ ආසි සමාගමෝ

කඨිනත්ථාරසමයෙ උපපනෙන කඨිනචීවරෙ
ධම්මසෙනාපතිත්ථාය භික්ඛු සිබ්බිංසු චීවරෙ

තදා තෙ විමලා භික්ඛු ඡළභිඤ්ඤා මහිද්ධිකා
තිනි සතසහසානි සම්මිංසු අපරාජිතා

පුනාපරං සො නරාසභෝ පවනෝ වාසං උපාගමි
තදා සමාගමෝ ආසි දවිනනං සතසහසසිනනති

එහි කඨිනත්ථාරසමයෙ යනු; කඨින චීවර අතුරන සමයෙහි. ධම්මසෙනාපතිත්ථාය යනු; ධම්මසෙනාපති සාල තෙරුන් සඳහා. අපරාජිතා යනු; නොපැරදුණාහු. විහතති ලෝපය දතයුතුයි. සෙං යනු; ඒ පදුම බුදුහු. පවනෙ යනු; මහාවනයෙහි. වාසං යනු; වසසාවාසයයි. උපාගත

යනු; උපාගමියි. පැමිණියහ. **දවිනනං සතසහසසි නං** යනු; දවිනතං සතසහසසානං යන්නයි. **තදා ආසිසමාගමෝ** කියා ද පාඨයි. එය ඇත්තම් සුන්දර වෙයි.

තථාගතයන් වහන්සේ ඒ වනළැහැබෙහි සතියක් නිරෝධ සමාපත්තියෙන් වැඩසිටිනු, එකල සිංහයෙක්ව සිටි බෝසත්තුමා දැක පහන් සිතින් වැඳ පැදකුණු කොට හටගත් සතුටු සොම්නසින් තෙවරක් සිංහනාද කොට සතියක් බුදධාලම්බන ප්‍රීතිය අත නොහැර සතුටු සුවයෙන්ම ගොදුරු පිණිස නොගොස් දිවි පූජාකොට ඇසුරෙහි සිටියේය. ශාස්තෘන් වහන්සේ සතිය ඇවෑමෙන් නිරොධ සමවතින් නැගී සිංහයා බලා හිඤ්ඡු සංඝයා කෙරෙහි ද ඔහුගේ ප්‍රසාදය වේවායි සංඝයා පැමිණෙත්වායි සිතූ සේක. එවිටම හිඤ්ඡු සංඝයා පැමිණියහ. සිංහයා සංඝයා කෙරෙහි සිත පැහැදවීය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔහුගේ සිත බලා. අනාගතයෙහි ගොතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි.

අහං තෙන සමයෙන සීහෝ ආසිං මිගාධිපු
පවිවෙක මනුබ්‍රූහනතං පවනෙ අදදසං ජිනං

වන්දිත්වා සිරසා පාදෙ කත්වාන තං පදකඛිණං
නිකඛනතුං අභිනාදිත්වා සතතාහං ජිනමුපටඨහං

සතතාහං වරසමා පනතියා චුටඨහිත්වා තථාගතෝ
මනසා චිනතයිත්වාන කොටිහිකඛු සමානයි

තදාපි සෝ මහාවීරෝ තෙසං මජඣෙ වියාකරි
අපරිමෙයෙ ඉතෝ කපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං
තසසාපි වචනං සුත්වා භීයෝ චිතතං පසාදයිං
උතතරිං වතමධිටඨාසිං දසපාරමී පුරියාති

එහි **පවිවෙකමනුබ්‍රූහනතං** යනු; නිරොධ සමවතට සමවත් යන අර්ථයි. **පදකඛිණං** යනු; තෙවරක් පැදකුණු කොට. **අභිනාදිත්වා** යනු;

තෙවරක් සිංහනාද කොට. **උපටඨහං** යනු; උපස්ථාන කළෙමි. මෙයම හෝ පාඨයි. **වරසමාපතතියා** යනු; නිරොධ සමාපත්තියෙන් නැගී. **මනසා චිනතයිතවාන** යනු; සියලු භික්ෂූහු මෙහි එත්වායි මනසින්ම සිතා. සමානයි යනු; කැඳවූහ.

ඒ පදුම භාග්‍යවතුන් වහන්සේගේ නගරය චම්පක නමි. අසම නම් රජ පියාණෝය. මෑණියෝ අසමා නමි. සාල උපසාල දෙනම අගසව්වෝය. උපස්ථායක වරුණ නමි. රාධා සුරාධා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. මහාසොණ වෘක්ෂය බොධියයි. ශරීරය අටපනස් රියන් උසය. ආයුෂ වර්ෂ ලක්ෂයක් විය. රූපාදි ගුණයෙන් අනුත්තර උත්තරා නම් අගමෙහෙසියයි. අතිරම්‍ය රම්ම නම් කුමරා පුත්‍රයා විය. එහෙයින් කියන ලදි-

චම්පකං නාම නගරං අසමෝ නාම ඛත්තියෝ
අසමා නාම ජනිකා පදුමස්ස මහෙසිනෝ

සාලෝ ච උපසාලෝච අහෙසුං අග්ගසාවකා
වරුණෝ නාමුපට්ඨාකෝ පදුමස්ස මහෙසිනෝ

රාධා චෙව සුරාධා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතෝ මහාසොණෙති වුච්චති

අට්ඨපණ්ණාස රතනං අච්චුග්ගතෝ මහාමුනි
පභා නිද්ධාවතී තස්ස අසමා සබ්බතෝ දිසා

චන්දපභා සුරියපභා රතනග්ගි මණිපභා
සබ්බාපි තා හතා හොන්ති පත්වා ජිනපභුත්තමං

වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවකා තිට්ඨමානෝ සෝ තාරෙසි ජනතං බහුං

පරිපක්කමානසෙ සත්තෙ බොධයිත්වා අසෙසතෝ
සෙසඤ්ඤඤ්ඤ අනුසාසිත්වා නිබ්බුතෝ සෝ සසාවකෝ

උරගොව තචං ජිණ්ණං වදධං පතතව පාදපෝ
ජහිත්වා සබබසංඛාරෙ නිබබුතොසෝ යථා සිඛී‍ති

එහි **රතනගගිමණිපපභා** යනු; රත්න ප්‍රභාව ද අගනි ප්‍රභාව ද මාණික්‍ය ප්‍රභාව ද වෙයි. හතා යනු; මැඩලන ලදි. **ජිනපභුතතමං** යනු; ජිනයන් වහන්සේගේ ශරීරප්‍රභාව උත්තමත්වයට පත්ව මැඩලීය යන අර්ථයි. **පරිපකකමානසෙ** යනු; මුහුකුරා ගිය ඉඳුරන් ඇති විනෙය සත්වයන්. වදධං පතතං යනු; පුරාණ පත්‍ර. **පාදපොව** යනු; වෘක්‍ෂයක් මෙන්. **සබබසංඛාරෙ** යනු; සියලු ආධ්‍යාත්මික බාහිර සංස්කාරයන් හැරදමා. සබබ සංඛාරාං යනු ද පාඨයි. එම අර්ථයමැයි. යථා සිඛී යනු; ගින්න මෙන් උපාදාන රහිතව නිවනට සුගතියට ගියේය. මෙහි සෙසු ගාථා යට කී නය ඇති හෙයින් ප්‍රකටමය.

පදුම බුද්ධවර්ණනාව නිමියේය.

අටවන බුද්ධවංසය සමාප්තයි.

පදුම සර්වඥයන් වහන්සේ පිරිනිවි කල උන්වහන්සේගේ සසුන ද අතුරුදහන් වූ පසු වසර ලක්‍ෂයක් ආයු ඇති මිනිස්සු අනුක්‍රමයෙන් පිරිහී දසවස් ආයු වූහ. නැවත වැඩී අසංඛ්‍යායුෂ්කව පිරිහී අනූලක්‍ෂයක් අවුරුදු ආයු ඇත්තෝ වූහ. එකල දසබලධාරී ත්‍රිවිද්‍යා ඇති චතුර්වෛශාරද්‍ය විශාරද විමුත්තිසාර දෙන්නා වූ නාරද නම් නරසත්වෝත්තම ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේ සාරාසංඛ්‍ය කල්ප්ලක්ෂයක් පැරුම් පුරා තුසිත භවනයෙහි ඉපිද එතැනින් චුතව ධඤ්ඤවතී නුවර ස්වකීය වීර්යයෙන් දිනන ලද වාසුදේවයන් බඳු සුදේව නම් රාජකුලයෙහි අගමෙහෙසි නිරුපම අනොම දේවිය කුස පිළිසිඳ ගත්හ. දසමස් ඇවෑමෙන් ධනඤ්ජය උයන්හි මවුකුසින් බිහිවූහ. නම් තබන දින නම් කිරීම කරන කල්හි සියලු දඹදිව් වැසියන්ට පරිභෝගයට ප්‍රමාණවත් අනුරූප ආභරණ අහසින් කල්පවෘක්ෂාදියෙන් පතිත විය. එහෙයින් උන්වහන්සේට මිනිසුන්ට සුදුසු ආභරණ දුන්හයි නාරද යයි නම් කළහ. උන්වහන්සේ නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. විජිත විජිකාවි ජිතාභිරාමයයි තුන් ඍතුවට යෝග්‍ය තුන්පහයක් විය. නාරද කුමාරයා හට කුල සීල ආචාර රූප සම්පන්න මනෝකුල වූ විජිතසේනා නම් අතිශයින් පින්වත් කැත් කුමරිය අගමෙහෙසි කළහ. කුමරිය ප්‍රධාන විසිදහසක් අධික ස්ත්‍රීහු ලක්‍ෂයක් වූහ.

ඒ විජිතසේනා දේවියට සකල ලෝකනද කර නන්දුත්තර කුමරු උපන් කල්හි සතර නිමිති දැක සිවුරඟසෙන් පිරිවරා නන්පැහැ වතින් සැරසූ සිරුරු ඇතිව පැළඳගත් මුතුහර මිණිකොඩොල් ඇතිව උතුම් කේයූර මකුට කටකධාරීව පරම සුගන්ධවත් ගඳමලින් සැරසී පයින්ම උයනට ගොස් සියලු අබරණ මුදා භාණ්ඩාගාරික අතට දී තමන්ම නිමල නිල්මහනෙල් පත් සමාන සියුම් මුවහත් කඩුවෙන් මෞලිය සහිත කෙස් කපා අහසට දැමූහ. සක්දෙව් රජ එය රත්කරඬුවෙන් පිළිගෙන තව්තිසා භවනයට ගෙන ගොස් සිනෙරු මුදුනෙහි තුන්යොදුන් උස සත්රුවන්මුවා සෑයක් කළේය. මහපුරිස්හු දෙවියන් දුන් කසාවත් හැඳ එම උයන්හිම පැවිදි වූහ. උන්වහන්සේ අනුව දහස්ගණන් පුරුෂයෝ පැවිදි වූහ. උන්වහන්සේ එහිම සතියක් ප්‍රධන් වීර්යය කොට වෙස් පුන්පොහෝ දින විජිතසේනා අගමෙහෙසිය දුන් කිරිබත් වළඳා එම උයන්හිම දිවාවිහාර කොට සුදසසන උයන්පල්ලා දුන් අටතණමිට ගෙන මහාසොණ බෝධිය පැදකුණු කොට අටපනස් රියන් තණඇතිරි අතුරා වැඩහිඳ මරබල නසා තුන්යම්හි ත්‍රිවිද්‍යා උපදවා සර්වඥතාඥානය ප්‍රතිවේධ කොට අනේකජාති සංසාරං -පෙ- යන උදන් අනා ධනඤ්ජය උයන්හි තමන් වහන්සේ සමග

පැවිදි වූ ලක්‍ෂයක් භික්‍ෂූන් පිරිවරා එහි දම්සක් පැවැත්වූ සේක. එකල්හි කෙළලක්‍ෂයකට ධර්මාවබෝධ විය. එයින් කියන ලදි-

පදුමස්‍ස අපරෙන සම්බුදෙධා දිපදුත්තමෝ
නාරදෝ නාම නාමෙන අසමෝ අප්පටිපුග්ගලෝ

සෝ බුදෙධා චකකවත්තිස්‍ස ජෙටඨෝ දයිතඔරසෝ
ආමුත්තමාලාභරණෙ උය්‍යානං උපසංකමි

තස්‍සාසි රුකෙඛා යසවිපුලෝ අභිරූපෝ බ්‍රහා සුචි
තමජ්ඣපත්තා උපනිසීදි මහාසොණස්‍ස හෙටඨතෝ

තස්‍ස ඤාණවරූපපජ්ජි අනන්තං වජිරූපමං
තෙන විචිනි සංඛාරෙ උකකුජ්ජමවකුජ්ජකං

තස්‍ස සබ්බකිලෙසානි අසෙසමභිවාහයි
පාපුණි කෙවලං බොධිං බුදධඤාණෙව චුද්දස

පාපුණිත්වාන සම්බොධිං ධම්මචකකං පවත්තයි
කොටිසතසහස්සානං පඨමාභිසමයෝ අහූනි

එහි **චකකවත්තිස්‍ස** යනු; සක්විති රජුගේ. **ජෙටඨෝ** යනු; පළමු උපන්නහු. **දයිතඔරසෝ** යනු; දයිත යනු ද ඔරස පුත්‍රයායි. දයිතව උරෙහි ගෙන නැලවූ පුත්‍රයායි. **ආමුත්තමාලාභරණෙ** යනු; පැළඳගත් මුතුහර බාහුවළලු අත්වළලු වොටුනු කොඩොල්මාලා ඇත්තේ. උය්‍යානං යනු; නුවරින් පිටත ධනඤ්ජය නම් උයනට ගියේය. **තස්‍සාසි රුකෙඛා** යනු; ඒ උයනෙහි එක් **රත්තසොණ** නම් වෘක්‍ෂයෙක් විය. එය අනූරියන් උසය. සමවට කඳය. නොඑක් විට ශාඛායෙන් යුක්තය. නිල්ගණබහුල පත්‍ර ඇත්තේය. ගණසෙවණ සහිතය. දේවතාධිගෘහිතය. විහඟ ගණ සේවනයෙන් තොරය. පොළෝතලයට තිලකයක් බඳුය. තරුරාජ්‍යය කරවන්නාක් මෙන් පරම රමණීය දැකුම් ඇත්තේය. රතු කුසුමින් සමලංකෘත සකල ශාඛායෙන් දෙව්මිනිසුන්ම නයන රසායන වූයේය. **යසවිපුලෝ** යනු; මහයසස් ඇත්තේ. මුළු ලොව ප්‍රකට වූයේ තම සම්පතින් හැමතැන ප්‍රකටව පැතිර ගියේය යන අර්ථයි. සමහරු **තස්‍සාසි විපුලෝ රුකෙඛා** යි

හදාරති. **බ්‍රහා** යනු; මහත් දෙවියන්ගේ පරසතු ගස මෙනි යන අර්ථයි. **තමජඣපපත්‍ථා** යනු; ඒ සෝණ රුක වෙත පැමිණ, අධිප්‍රාප්තව, එළඹ යන අර්ථයි. **හෙටයතො** යනු; ඒ ගස යට. **ඤාණවරූපපජ්ජි** යනු; උතුම් ඥානය පහළවිය. **අනනතං** යනු; අප්‍රමාණ වූ, අප්‍රමෙය වූ **වජිරූපමං** යනු; වජ්‍ර සමාන. **තික්ඛණ අනිචචානුපසසනාව** ආදිකොට ඇති විදර්ශනාඥානයට මෙය නාමයකි. **තෙන විචිනි සංඛාරෙ** යනු; ඒ විදර්ශනාඥානයෙන් රූපාදි සංස්කාර පරීක්ෂා කළහ. **උකකුජජමවකුජජකං** යනු; සංස්කාරයන්ගේ ඇතිවීම නැතිවීම පරීක්ෂා කළහ යන අර්ථයි. එහෙයින් ප්‍රත්‍යයාකාරය මෙනෙහිකොට ආනාපාන චතුර්ථධ්‍යානයෙන් නැගී පංචස්කන්ධයෙහි බැස ඇතිවීම් නැතිවීම් වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් ලක්ෂණ දැක ගෝත්‍රභූඤ්ඤාණය තෙක් විදසුන් වඩා ආර්ය මාර්ග පිළිවෙලින් සියලු බුදුගුණ ලැබූහ යන අර්ථයි. **තපථ** යනු; **සොණරුක්ඛි**. **සබබකිලෙසාන** යනු; සකල ක්ලේශයන්, ලිංග විපර්යාස කොට කියන ලදි. සමහරු තපථ සබබකිලෙසෙ කියා හදාරති. **අසෙසං** යනු; නිරවශේෂ කොට. **අභිවාහය** යනු; මාර්ග ප්‍රමාණයෙන් ද ක්ලේශප්‍රමාණයෙන් ද සකලකලේශයන් පාකළහ. විනාශයට පත්කළහ යන අර්ථයි. **බෝධි** යනු; අරහත්ව මාර්ගඥානයයි.

බුද්ධඤ්ඤාණෙ ච චුදදස යනු; තුදුස් බුදු නුවණ. ඒවා කුමක් ද? මඟපල නුවණ අටය. අසාධාරණ ඤාණ සයය යන මේ තුදුස බුදුඤාණ නමි. ච ශබ්දය සම්පිණ්ඩනාර්ථයෙහිය. එහෙයින් තවත් පටිසම්භිදා සතරය වෛශාරද්‍යඥාන සතරය සතර යොනි පංචගති පිරිසිඳ දන්නා නුවණ දසබලඤාණ යන සියලු බුදුගුණවලට පැමිණියහ යන අර්ථයි. මෙසේ බුදුබවට පැමිණ බ්‍රහ්මායාචනය පිළිගෙන ධනඤ්ජය උයන්හි තමන් වහන්සේ සමඟ මහණ වූ ලක්ෂයක් භික්ෂූන් ඉදිරියෙහි දම්සක් පැවැත්වූහ. එකල කෙළලක්ෂයක් දෙනාට ප්‍රථම ධර්මාවබෝධය විය. එකල මහාදොණ නුවර දොණ නම් මහත් ඍද්ධි මහානුභාව ඇති නාරජ ගඟවිල්හි වසයි. මහජනයා විසින් සත්කාර ගරුකාර මානන පූජා කරන ලද්දේ විය. හෙතෙම යම් දේශයක දනව්වැසි මිනිස්සු ඔහුට බිලියම් නොකරත්ද ඔවුන්ගේ දේශය නියතින් හෝ අධික වර්ෂාවෙන් හෝ බොරළු වැස්සෙන් හෝ වනසයි. එකල්හි තිරදර්ශී නාරද ශාස්තෘන් වහන්සේ දොණ නාග දමනයෙහි බොහෝ ප්‍රාණීන්ගේ හේතුසම්පත් දක මහත් බික්සඟන පිරිවරා ඔහුගේ නිවෙසන ස්ථානයට වැඩි සේක. ඒ දක මිනිස්සු මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්ස, මෙහි සොරවිෂ ඇති උග්‍රතේජස් ඇති මහත් ඍද්ධි මහානුභාව ඇති නාරජෙක් වසයි. ඔහු මිනිසුන් පෙළයි. නොයා යුතුය කියායි. භාග්‍යවතුන් වහන්සේ නොඇසුණාක් මෙන් වැඩියහ. වැඩමවා

ඒ නාරජුට සත්කාර සඳහා සකසන ලද අතිසුවඳැති මල් ඇතිරියෙහි වැඩහුන්හ. මහජනයා විනාහි නාරද මුනිරජුන් ගේ ද දොණ නාරජුගේද යුද්ධය බලම්හයි රැස්වූහ. එවිට සර්ප නාගයා එසේ වැඩහුන් බුදධනාගයාණන් දක මකුබව නොයිවසමින් දෘෂ්‍යමාන කයින් පෙනී දුමන්නට විය. දසබලයාණෝ ද දුමන්නට වූහ. නැවත නාගරාජයා දුල්වී ගියේය. මුනිරාජයාණෝ ද දුල්වී ගියහ. එවිට ඒ නාගරාජයා දසබල ශරීරයෙන් නිකුත් දුම්ජාලාවෙන් අතිශයින් පීඩිත සිරුරින් දුක් නොඉවසිය හැකිව විෂ වේගයෙන් ඔහු මරමියි විෂ විහිදවීය. විෂ වේගයෙන් මුළු දඹදිවම වැනෙසයි. එබඳු ඒ විෂ දසබල ශරීරයෙහි එක් ලෝමයක් සොල්වන්නට වත් අසමත් විය. එවිට නාගරාජයා ශ්‍රමණයාගේ තත්වය කුමක්දැයි බලන්නේ සරාහිරු මෙන් සඳ මෙන් පිරිපුන්ව සවනක් රසින් බබළන පහන් වදනින් සවනින් යුත් භාග්‍යවතුන් වහන්සේ දැක පුදුමයි, මේ මහා ශ්‍රමණ මහාර්ධිමත්ය. මම තම බල නොදැන වරදවා ගතිමි කියා සරණ සෙවීය. භාග්‍යවතුන් වහන්සේම සරණ ගියේය. එවිට නාරද මුනිරාජයාණෝ ඒ නාරජු දමනය කොට එහි රැස්වූ මහජනයාගේ සිත් පැහැදවීම පිණිස යමක ප්‍රාතිහාර්යය කළ සේක. එදින නවකෙළක් ප්‍රාණීහු අර්හත්වයෙහි පිහිටියහ. ඒ දෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

මහාදොණං නාගරාජං විනයනෙත මහාමුනි
පාටිහෙරං තදාකාසි දසසයනෙතා සදෙවකෙ

තදා දෙවමනුසසානං තමහි ධම්මපපකාසනා
නවුති කොටිසහසසානි තරිංසු සබබසංසයනති

එහි **පාටිහෙරං තදාකාස** යනු; යමක ප්‍රාතිහාර්ය කළහ යන අර්ථයි. පාඨය එයම හෝ වෙයි. **තදා දෙවමනුසසා** වා කියා ද පායයි. තස්ථ දෙවමනුසසානං යනු; සම්බන්ධාර්ථයෙහි ප්‍රථමා විභතතියයි. එහෙයින් දෙවියන්ගේ මිනිසුන්ගේ අනූකෙළක් දහස් යන අර්ථයි. **තරිංසු** යනු; ඉක්මවූහ. ස්වකීය පුත්‍ර නන්දතතර කුමරහට අවවාද දුන් අවස්ථාවෙහි අසූකෙළ දහසකට ධර්මාවබෝධ විය. මේ තෙවැන්නයි. එයින් කියන ලදි-

යමහි මහාවීරෝ ඔවදි සකමත්‍රජං
අසීති කොටිසහසසානං තතියාභිසමයෝ අහූති

යම්කලෙක ථූලලකොටීත නුවර හදදසාල විජිතමිතත බමුණු යහළුවන් දෙදෙන අමාවිල සොයන්නාහු පිරිස්හි වැඩහුන් අතිශයින් සාරදායක වූ නාරද සම්මා සම්බුදුන් දුටහ. ඔවුහු බුදුසිරුරෙහි දෙතිස් මහපුරිස් ලකුණු දැක මේ ලොව කෙලෙසුන් නැසූ සම්මා සම්බුදුන් යයි නිෂ්ටාවට පැමිණ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හටගත් ශ්‍රද්ධා ඇතිව පිරිවර සහිතව භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූහ. ඔවුන් පැවිදිව රහත් වූ පසු භාග්‍යවතුන් වහන්සේ කෙළලක්ෂයක් භික්ෂූන් මැද පාමොක් දෙසූහ. මේ ප්‍රථම සන්නිපාතයයි. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං නාරදසස මහෙසිනො
කොටිසතසහසසානං පඨමො ආසි සමාගමොති

යම්කලෙක නාරද සම්මා සම්බුදුහු ඥාති සමාගමයෙහි ස්වකීය පළමු පැතුමෙහි පටන් බුදුවංසය දෙසූ සේක් ද එකල අනූකෙළ දහසක් භික්ෂූන්ගේ දෙවන සමාගමය විය. එයින් කියන ලදි-

යදා බුදෙධා බුදධගුණං සනිදානං පකාසයි
නවුති කොටිසහසසානි සමිංසු විමලා තදානි

එහි විමලා යනු; පහවූ මල ඇත්තෝ, ක්ෂීණාස්‍රවයෝ යන අර්ථයි. යම්කලෙක දොණ නාගරාජදමනයෙහි පැහැදුණු වෙරෝචන නම් නාරජ ගංගා නදියෙහි තෙගවු පමණ සත්රුවන් මඩුවක් මවා සපිරිවරින් සිය දානයෙහි අග්‍රඵල දැක්වීම පිණිස ආරාධනාකොට නාග නඵනිළියන් ද විවිධ වේශාලංකාරධර තාලාවචරයන් ද රැස්කොට මහාසත්කාරයෙන් සපිරිවර භාග්‍යවතුන් වහන්සේට මහදන් පිදීය. වළඳා අන්තයෙහි බුදුහු මහා ගඟ හෙන්නාක් මෙන් අනුමෝදනා කළහ. එකල භූතතානුමෝදනා අසා පැහැද එහිභික්ෂු පැවිද්දෙන් පැවිදිවූ අසූලක්ෂයක් භික්ෂූන් මැද භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන රැස්වීම විය. එහෙයින් කියන ලදි-

යදා වෙරොචනො නාගො දානං දදාති සත්ථුනො
තදා සමිංසු ජිනපුතතා අසීතිසතසහසසියොති

එහි අසීතිසතසහසසියො යනු; ලක්ෂ අසූවකි. එකල බෝසත්හු තවුස් පැවිදිව හිමවත පසෙක අසපුවක් තනා පසහිඳා අටසමවත්හි

විඤ්ඤාවසීව වසති. එකල එතුමන්ට අනුකම්පාවෙන් නාරද බුදුහු රහතන් අසූකෙළක් ද දසදහසක් අනාගාමී ඵලයට පත් උපාසකයන් ද පිරිවරා ඒ අසපුවට වැඩියහ. තාපස තෙම බුදුන් දැක ප්‍රමුදිත සිතින් සපිරිවර බුදුන්ට වාසය පිණිස අසපුවක් මවා මුළුරුය බුදුගුණ කියා බණ අසා දෙවන දින උතුරුකුරු දිවයිනට ගොස් අහර ගෙනවුත් සපිරිවර බුදුන්ට මහ දන් පිදීය. මෙසේ සතියක් මහ දන් දී හිමවතින් අනගි රත්සඳුන් ගෙනවුත් එයින් බුදුන් පිදිය. එවිට දසබලයන් වහන්සේ දෙවිමිනිසුන් පිරිවරා බණ දෙසා එතුමන්ට මොහු මතු ගොතම නම් බුදුවන්නාහයි ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන ජටිලෝ උගතාපනෝ
අනතලිකබචරෝ ආසිං පඤ්චාභිඤ්ඤාසු පාරගූ

තදාපහං අසමසමං සසංඝං සපරිජජනං
අනනපානෙන තපෙපත්වා වන්දනොනාභිපූජයිං

සොපි මං බුදෙධා ව්‍යාකාසි නාරදෝ ලොකනායකෝ
අපරිමෙය්‍යෙ ඉතොකපෙප බුදෙධා ලොකෙ භවිසසති

පධානං පදහිත්වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං
තසසපි වචනං සුත්වා භීයෝ භවෙත්ව මානසං
අධිටඨහිං වතං උගගං දසපාරමී පූරියානි

එහි තදාපහං යනු; එකල්හි ද මම, අසමසමං යනු; අසම නම් අතීත අනාගත බුදුවරු වෙති. ඒ අසමයන් වහන්සේලා සමග සමවූයේ තුලනය වූයේ අසමසම යි. නැතහොත් අසමා විසමා, සමා අවිසමා ඒ අසමසමයන් හා සමවූයේ අසමසමසමෝ යයි කිවයුතු නැන එක් සම ශබ්දයක් ලොප්කොට කියන ලදැයි දතයුතු. අසමාවිසමසම යන අර්ථයයි. සපරිජජනං යනු; උපාසක ජනයා සහිත. සොපි මං තදා නරමරූනං මජෙඣ ව්‍යාකාසි චකඛුමා යි ද පාඨයි. එය පැහැදිලි අරුත්ම ඇත්තේය. භීයෝ භාවෙත්ව මානසං යනු; මත්තෙහිද දියුණුකොට සිත සතුටු කොට. අධිටඨාසිං වතං උගගං යනු; උග්‍ර ව්‍රත ඉටාගනිමි. උතතරිං වතං අධිටඨාසිං දසපාරමී පූරයා කියාත් පාඨයි.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය ධඤ්ඤවතී නම් විය. සුදේව නම් ක්ෂත්‍රියරජ පියාණෝය. මෑණියෝ අනෝමා නම්. භද්දසාල ජිතමිත දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක වාසෙටඨ නම්. උත්තරා එගුනී දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. මහාසොණ චෘක්ෂය බෝධියයි. ශරීරය අට අසූරියන් උසය. උන්වහන්සේගේ ශරීරප්‍රභාව නිතර යොදුනක් පැතිරෙයි. අනූලක්ෂයක් අවුරුදු ආයු විය. අගමෙහෙසිය විජිතසේනා නම්. පුත්‍රයා නඤ්ඤුත්තර කුමාර නම් විය. විජිත, විජිතාවී විජිකාභිරාම නම් තුන්පහයක් විය. නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. උන්වහන්සේ පාගමනින්ම මහබිනික්මන් කළහ. එයින් කියන ලදි-

නගරං ධඤ්ඤවතී නාම සුදෙවො නාම බතතියො
අනොමා නාම ජනිකා නාරදසස මහෙසිනො

භද්දසාලො ජිතමිතතා අහෙසුං අගගසාවකා
වාසෙටඨා නාමුපටඨාකො නාරදසස මහෙසිනො

උතතරා එගුනී චෙව අහෙසුං අගගසාවකා
බොධි තසස භගවතො මහාසොණෙති වුචචති

අටඨාසීති රතනානි අවචුගගතො මහාමුනි
කඤ්චනගඝියසංකාසො දසසහසසී විරොචාහි

තසස ව්‍යාමපපභා කායා නිදධාවති දිසොදිසං
නිරනතරං දිවාරතතිං යොජනං එරතෙ තදා

න කෙවි තෙන සමයෙන සමනතා යොජනෙ ජනා
උකකාපදීපෙ ජාලෙනති බුදධරංසෙන ඔසටා

නවුතිවසසසහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානොසො තාරෙසි ජනතං බහුං

යතා උළුහි ගගනං විචිතතං උපසොභති
තථෙව සාසනං තසස අරහනෙතහිසොභිති

සොපිබුදෙධා අසමසමෝ තෙපි බිණාසවා අතුලතෙජා
සබබං සමනතරහිතං නනු රිතතා සබබසංඛාරා

සංසාරසොතං තරණාය සෙසකෙ පටිපනනකෙ
ධමමසෙතුං දළහං කතවා නිබබුතො සො නරාසභොති

එහි **කඤඤනගඝිය සංකාසො** යනු; විවිධ රත්නයෙන් විචිත්‍ර රන්මුවා ඇඟෑයක් බඳු රූපශෝභා ඇත්තේ **දසසහසසී විරොචති** යනු; උන්වහන්සේගේ ප්‍රභායෙන් දසදහසක් ලෝකධාතුවම බබළයි. බැබළිණ යන අර්ථයි. එම අර්ථයම ප්‍රකාශ කරමින් භාග්‍යවතුන් වහන්සේ **තසස වයාමපපභාකායා නිදධාවති දිසොදිසං** යි වදාළහ. **එහි වයාමපපභා** යනු; ව්‍යාමපපභාව මෙනැයි යනු ව්‍යාමපපභායි. අප භාග්‍යවතුන් වහන්සේගේ ව්‍යාමප්‍රභාව මෙනැයි යන අර්ථයි. **න කෙචි** යනු; මෙහි නකාරය ප්‍රතිෂෙධාර්ථයි. මෙහි උතතරාර්ථ උජජාලෙනති ශබ්දය සමග සම්බන්ධය දතයුතුයි. **උකකා** යනු; දඬුවැට පහන්ය. උල්කා හෝ ප්‍රදීප හෝ කිසිම කෙනෙක් **න උජජාලෙනති** නොදල්වති. කුමක් නිසාද යත්? බුද්ධශරීරා ලෝකයෙන් ආලෝක වන හෙයිනි. **බුදධරංසෙන** යනු; බුදුරැස්වලින්. **ඔතථටා** යනු; පැතුරුණු, එළඹ සිටි. **උළුහි** යනු; තාරකාවලින් යම් සේ තරුවලින් අහස විචිත්‍රව හොබනේ ද එසේ උන්වහන්සේගේ සසුන රහතුන්ගෙන් විචිත්‍රව හොබනේය. **සංසාරසොතංතරණය** යනු; සසර සයුර තරණය පිණිස. සෙ සකෙ පටිපනනකෙ යනු; රහතුන් හැර කලණ පුහුදුනක් සමග සෙසු සෙබ පුඟුලන් යන අර්ථයි. **ධමමසෙතුං** යනු; මාර්යා සේතුවයි. සෙසු පුඟුලන් සසරින් එතෙර කිරීමට දහම් හෙය තබා කළ සියලුකිස ඇතිව පිරිනිවියහ යන අර්ථයි. සෙස්ස යට කී හෙයින් සියලු අර්ථ ප්‍රකටය.

නාරදබුදධ වර්ණනාව නිමියේය.

නවවන බුදධවංසය සමාප්තයි.

නාරද බුදුන්ගේ ශාසනය අනූපන්දහසක් අවුරුදු පැවත අතුරුදහන් විය. ඒ කල්පය ද විනාශ විය. ඉන්පසු අසංඛ්‍ය කල්පයක් බුදුවරු ලොව නූපන්හ. බුද්ධශූන්‍ය බුද්ධාලෝකයෙන් ලොව තොරවිය. එයින් අසංඛ්‍ය කල්පයක් ගතවූ කෙලෙස්බර ඇති මෙර සේ සාර වූ සසර රහිත වූ සත්වසාර වූ සකලලෝකෝත්තර වූ පදුමුත්තර නම් බුදුහු ලොව පහළ වූ. උන්වහන්සේ ද පාරමී පුරා තුසිපුර ඉපිද එයින් චුතව හංසවතී නුවර සකල ජන ආනන්දකර නන්දන නම් රජුගේ අගමෙහෙසි උත්තමකුල ජනිත සුජාතා දේවිය කුස පිළිසිඳ ගත්හ. දෙවියන් විසින් කරන ලද ආරක්ෂා ඇති ඕතොමෝ දසමස් ඇවෑමෙන් හංසවතී උයන්හි පියුමතුරා කුමරු ප්‍රසූත කළාය. උන්වහන්සේගේ පිළිසිඳීමෙහි උපතෙහි යට කී ආකාර පෙළහර සිදුවිය. උන්වහන්සේගේ උපතෙහි පියුම්වැසි වැස්සේය. එයින් උන්වහන්සේ නම්ගන්වන දින නෑයෝ පදුමුත්තර කියා නම් කළහ. උන්වහන්සේ දසදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ.

නරවාහන යසවාහන වසවත්ති නම් තුන් ඍතුවට යෝග්‍ය තුන්පහයක් විය. වසුදත්තා දේවිය ප්‍රමුඛ එක්ලක්ෂ විසිදහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. වසුදත්තා දේවියට සියලු ගුණයෙන් උතුම් උත්තර කුමරු උපන් කල සතර නිමිති දැක මහබිනික්මන් කරමියි සිතූහ. සිතූ කෙණෙහිම වසවතති නම් පහය කුඹල් සකක් මෙන් අහසට නැග දෙව්විමනක් මෙන් පුන්සඳ මෙන් අහසින් ගොස් බෝරුක මැදිකොට සෝභිත බුද්ධ වර්ණනාවෙහි ආ ප්‍රාසාදය මෙන් බිමට බැස්සේය. මහපුරිස්හු ඒ පහයෙන් බැස වෙසක් පුන් පොහෝ දින උදේනි නිගමයෙහි රුචිනන්දා සිටු දියණිය දුන් මීකිරිබත වළඳා සල්උයන්හි දිවාවිහාර කොට සවස්හි සුමිත්තාජීවකයක් දුන් අටතණමිට ගෙන සලල බෝධිය වෙත ගොස් පැදකුණු කොට අටතිස් රියන් පුළුලැති තණඇති අතුරා පලක් බැඳ චතුරංග වීර්‍යාධිෂ්ඨානයෙන් මරුසහිත මරබල නසා පෙරයම පෙරවිසීම් සිහිකොට දෙවන යාමයෙහි දිවැස පිරිසිදු කොට තෙවන යාමයෙහි ප්‍රත්‍යයාකාරය මෙනෙහිකොට ආනාපාන චතුර්ථධ්‍යානයෙන් නැගී පස්කඳෙහි වැද උදයව්‍යය වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් ලකුණු දැක ගෝත්‍රභූ ඤාණය තෙක් වඩා ආර්යමාර්ගයෙන් සියලු බුදුගුණ ප්‍රතිවේධ කොට සියලු බුදුවරුන්ට ආ වෙණික අනේකජාති සංසාරං -පෙ- යන උදන් ඇනූහ. එකල දසදහසක් සක්වළගැබ අලංකාර කරන්නාක් මෙන් පියුම් වැසි වැස්සේය. එයින් කියන ලදි-

නාරදසස අපරෙන සම්බුදෙධා දිපදුත්තමෝ
පදුමුත්තරෝ නාම ජිනෝ අකෙඩාබෙහා සාගරූපවෝ

මණ්ඩකපෙපා ච සෝ ආසි යමහි බුදෙධා අජායථ
උසසනනකුසලා ජනතා තමහි කපෙප අජායථාති

එහි සාගරූපමෝ යනු; සයුර මෙන් ගැඹුරු බව ඇති. මණ්ඩකපෙපාව සෝ ආසි යනු; මෙහි යම් කපක බුදුවරු දෙනමක් උපදින් ද මෙය මණ්ඩකපප නම්. කල්පය දෙපරිදිය. ශූන්‍ය කල්පය අශූන්‍ය කල්පය කියායි. එහි ශූන්‍ය කල්පයෙහි බුදු, පසේබුදු සක්විත්තෝ නූපදිති. එහෙයින් ගුණවත් පුද්ගලයන්ගේ ශූන්‍ය බැවින් ශූන්‍ය කල්පයයි කියනු ලැබේ. අශූන්‍ය කල්පය සාරකල්ප වරකල්ප මණ්ඩකල්ප සාරමණ්ඩ කල්ප භද්‍රකල්පයයි පස් ආකාර වෙයි. එහි ගුණශූන්‍ය ගුණසාර රහිත කල්පයෙහි ගුණසාර උපදවන ගුණසාරදනවන එක් සම්මා සම්බුදු කෙනකුන්ගේ පහළවීමෙන් සාරකපප නම් වෙයි. යම් කල්පයක ලෝකනායකයන් වහන්සේලා දෙනමක් උපදින්ද එය මණ්ඩකල්ප නමැයි කියනු ලැබේ. යම් කපක තුන්බුදු කෙනෙක් උපදින් ද උන්වහන්සේලාගෙන් පළමුවැන්නා දෙවැන්නාට ප්‍රකාශ කරයි. දෙවැන්නා තුන්වැන්නාටයි. එහි මිනිස්සු සතුටු සිතින් තමන් පැතූ පැතුම් වශයෙන් වළක්වති. එහෙයින් වර කල්පයයි කියනු ලැබේ. යම් කල්පයක සිවුබුදු කෙනෙක් උපදින්ද එය පෙරකල්පයට වඩා විශිෂ්ටතර හෙයින් සාරමණ්ඩ කල්පයයි කියනු ලැබේ. යම් කල්පයක පස්බුදු කෙනෙක් උපදින් ද එය භද්‍රකල්පයයි කියනු ලැබේ. එය අතිදුර්ලභය. ඒ කප බොහෝසෙයින් සත්වයෝ කලණ සැප බහුල වෙති. බෙහෙවින් ත්‍රිහේතුකයෝ ක්ලේශක්ෂය කරති. දුහේතුකයෝ සුගතිගාමී වෙති. අහේතුකයෝ හේතු ලබති. එහෙයින් ඒ කල්පය භද්‍රකල්පයයි කියනු ලැබේ. එහෙයින් අසුඤඤකපෙපා පඤචවිධොයි කියන ලදි. යම් කපක පියුමතුරා බුදුහු උපන්සේක්ද එය සාරකල්ප වුවද ගුණ සම්පත්තියෙන් මණ්ඩකල්පයක් හා සම බැවින් මණ්ඩ කල්පයයි කියන ලදි. වා ශබ්දය උපමාර්ථයෙහි දතයුතුය. උසසනනකුසලා යනු; රැස්කළ පින් ඇත්තෝ. ජනතා යනු; ජන සමූහය.

පුරිෂෝත්තම පියුමතුරා භාග්‍යවතුන් වහන්සේ සතියක් බෝපළඟෙහි හිඳ පොළවෙහි පා තබමියි දකුණු පය දිගුකළහ. එවිට පොළව පළාගෙන නිකැලැල් නිර්මල කොමල කේශර කර්ණිකා ඇති ජලජ නිර්මල අවිකල විපුල පත් ඇති අජලජ වූ ජලජ පියුම් නැගී

සිටියේය. ඒවාහි ප්‍රධාන පෙති අනූරියන් පමණය. කෙසුරු තිස්රියන් පමණය. කර්ණිකාව දසරියන් පමණය. එකිනෙකෙහි නවකළයක් පමණ රේණු විය. ශාස්තෘන් වහනසේ උසින් අටපනස් රියන් වූහ. උන්වහන්සේගේ දෙනෙතු අතර අටළෝස් රියන්ය. නළල පස්රියනය. අත්පා එකොළොස් රියන්ය. උන්වහන්සේගේ එකොළොස්රියන් පාදයෙන් දසරියන් කෙමිය දක්වෙනවිට නවකළයක් පමණ රේණු නැගී අටපනස් රියන් ශරීර ප්‍රදේශය උඩට නැගී මනෝසීල සුණු මෙන් වී වැටෙයි. ඒ හේතුවෙන් ශාස්තෘන් වහන්සේ පදුමුත්තර නමින් ප්‍රකට වූහයි සංයුත්ත භාණකයෝ කියති. ඉක්බිති සව්ලෙව්උතුරු පියුමතුරා බුදුහු බ්‍රාහ්මායාචනය පිළිගෙන දම්දෙසීමට යෝග්‍ය සත්වයන් බලන්නාහු මිථිලා නුවර දේවල සුජාත නම් හේතුසම්පන්න රජ කුමරුවන් දෙදෙන දැක එකෙණෙහිම අහසින් වැඩ මිථිලා උයන්හි බැස උයන්පල්ලා ලවා දෙකුමරුන් කැඳවූහ. ඔවුහුද අපගේ නැන්දණිය පුත් පදුමුත්තර කුමරා පැවිදිව සම්බෝධියට පැමිණ අපේ නුවරට පැමිණියේය. අපි දැන් එතුමන් වෙත යමුයි පියුමතුරා බුදුන් වෙත ගොස් පිරිවරා හුන්හ. ඔවුන් පිරිවැරූ දසබලයන් වහන්සේ තරුගණ පිරිවැරූ සඳ මෙන් බබළමින් එහි දම්සක් පැවැත්වූහ. එදා කෙළ ලක්ෂයක් ප්‍රාණීන්ට ධර්මාවබෝධ විය. එයින් කියන ලදි-

පදුමුත්තරස්ස භගවතෝ පඨමෙ ධම්ම දෙසනෙ
කොටිසතසහසසානං ධම්මාභිසමයෝ අහූති

ඉන් මෑත භාගයෙහි සරදතාපස සමාගමයෙහි මහජනයා නිරය සන්තාපයෙන් තවා ධර්මදේශනා කරන සේක් සතිස් ලක්ෂ ගණන් සත්ව වර්ගයාට දහම් අමා පෙවූහ. එය දෙවැනි ධර්මසමාගමය විය. එයින් කියන ලදි-

තතෝ පරම්පි වසසනෙත තපපයනෙත ච පාණිනෝ
සතතතිංස සතසහසසානං දුතියාභිසමයෝ අහූති

යම්කලෙක වනාහි ආනන්ද මහරජ විසිදහසක් පුරුෂයන් සහ විස්සක් ඇමතියන් ද සමග පියුමතුරා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මිථිලා නුවර දී පෙනී සිටියේය. පියුමතුරා බුදුහු ඔවුන් ඒහිභික්ඛු පැවිද්දෙන් පැවිදිකරවා උන්වහන්සේලා පිරිවරා වැඩ පියාණන්ට සංග්‍රහ කරනු කැමතිව හංසවතී නුවර වාසය කරන සේක. එහි උන්වහන්සේ අප භාග්‍යවතුන් වහන්සේ කපිලපුරයෙහි මෙන් අහස්හි සක්මන් කරමින්

බුද්ධවංසය දෙසූ සේක. එකල පනස්ලක්ෂයක් දෙනාට ධර්මාවබෝධ විය. එයින් කියන ලදි-

යමහි කාලෙමහාවීරෝ ආනන්දං උපසංකමි
පිතුසනතිකමුපගනත්වා අහනී අමතදුන්දුභිං
ආහතෙ අමතහෙරිමහි වසසනෙත ධමමවුටඨියා
පඤඤාසසතසහසසානං තනියාභිසමයෝ අහූනි

එහි ආනන්දං උපසංකමි යනු; ආනන්ද නම් පියරජු සඳහා කියන ලදි. අහන යනු; වාදනය කළහ. අහතෙ යනු; වැයූ කල්හි. අමතහෙරිමහ යනු; අමාබෙරයෙහි. ලිංගවිපර්යාසයයි. ආසෙවිතෙ යනු ද පාඨයි. ඇසුරු කළ එහි යන අර්ථයි. වසසනෙත ධමමවුටඨියා යනු; ධර්ම වර්ෂාව වසිද්දී යන අර්ථයි. දැන් අවබෝධ කරන උපාය දක්වමින්-

ඔවාදකෝ විඤඤාපකෝ තාරකෝ සබබපාණිනං
දෙසනාකුසලෝ බුදෙධා තාරෙසි ජනතං බහුනති ය කීය.

එහි ඔවාදකෝ යනු; සරණ සීලධුතංග සමාදාන ගුණ ආනිසංස දක්වීමෙන් අවවාද කරත්නුයි ඔවාදකයි. විඤඤාපකෝ යනු; චතුසසත්‍ය අවබෝධ කරවතිනුයි විඤඤාපක නම්. අවබෝධ කරවන්නහු. තාරකෝ යනු; චතුරෝඝ තරණය කරවන්නේ. යම්කලෙක ශාස්තෘන් වහන්සේ මිථිල නුවර මිථිල උයන්හි කෙළලක්ෂයක් භික්ෂූන් මැද නවම් පුන්පොහෝ දින පුන්සඳවන් මුහුණින් පාමොක් දෙසූ සේක. එය ප්‍රථම රැස්වීම විය. එහෙයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං පදුමුතතරසස සත්ථුනෝ
කොටිසතසහසසානං පඨමෝ ආසි සමාගමොති

යම්දා භාග්‍යවතුන් වහන්සේ වේහාර කඳුමුදුන්හි වස් වැස කන්ද බැලීමට ආ මහජනයාට දහම් දෙසා අනුකෙළක් එහිභික්ෂුභාවයෙන් පැවිදි කරවා උන්වහන්සේලා පිරිවරා පාමොක් දෙසූ සේක් ද එය දෙවන සනනිපාතය විය. එයින් කියන ලදි-

යදා බුදෙධා අසමසමෝ වසී වෙහාර පබබතෙ
නවුති කොටිසහසසානං දුතියෝ ආසි සමාගමොති

නැවත භාග්‍යවත් ගුණවත් ලෝකනාථයන් වහන්සේ මහජනයා සසර බැම්මෙන් මුදවමින් ජනපද චාරිකාවෙහි හැසිරෙන කල අසූකෙළක් භික්ෂූන්ගේ සමාගමයක් විය. එයින් කියන ලදි-

පුන චාරිකං පකකනෙත ගාමනිගමරටඨතො
අසීතිකොටිසහසසානං තනියො ආසි සමාගමොති

එහි ගාමනගමරටඨතො යනු; ගාමනිගමරයෙහි යනුයි. මෙයම හෝ පාඨයි. ඒ ගම්නියම්ගම් රටවලින් නික්ම පැවිදිවූවන්ගේ යන අර්ථයි. එකල අප බෝසත්හු නොඑක් කෙළගණන් ධන ඇති ජටික නම් මහරැටිව බුදුපාමොක් සඟනට සවිවර මහදන් පිදූහ. උන්වහන්සේද බෝසතුන්ට මතු කල්ප ලක්ෂයකින් ගොතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන ජටිකො නාම රටඨිකො
සමබුදධපමුඛං සංඝං සහතතං දුසසමදාසහං

සොපි මං තදා ව්‍යාකාසි සංඝමජෙඣ නිසීදිය
සතසහසෙස ඉතො කපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිතවාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං

තසසාපි වචනං සුතවා උතතරිං වතමධිටඨහිං
අකාසිවුගගං දළහංධිතිං දසපාරමිපූරියානි

එහි සම්බුදධපමුඛං සංඝං යනු; බුද්ධ ප්‍රමුඛ සංඝයාට. සාමි අර්ථයෙහි කර්ම වචනයි. සහතතං දුසසමදාසහං යනු; සිවුරු සහිත බත් දුනිමි යන අර්ථයි. උගගං දළහං යනු; අතිදෘඪ. ධිතිං යනු; වීර්යය කළෙමි යන අර්ථයි. පියුමතුරා බුදුන් දවස තීර්ථකයෝ නම් නුවූහ. සියලු දිව්‍ය මනුෂ්‍යයෝ බුදුසරණම ගියහ. එයින් කියන ලදි-

ව්‍යාහතා තිත්ථියා සබෙබ විමනා දුමමනා තදා
න තෙසං කෙචි පරිවරනති රටඨතො නිවත්තනති තෙ

සබෙබ තත්ථ සමාගනතවා උපගඤඡුං බුදධසනතිකෙ
තුවං නාථො මහාවීර සරණං හොතු චකඛුම

අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං
සම්පතෙත තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨහි

එවං නිරාකුලං ආසි සුඤ්ඤකං තිත්ථියෙහි තං
විචිතතං අහෙනෙතහි වසීභූතෙහි තාදිහිති

එහි ව්‍යාහකා යනු; පහවූ මාන දර්ප ඇත්තෝ. **තිත්ථියා** යනු; මෙහි තිත්ථ දතයුතුය. තිත්ථකර දතයුතුය. තිත්ථිය දත යුතුය. එහි ශාස්වතාදි දෘෂ්ටි වශයෙන් මෙහි තරණය කෙවරත් නුයි තිත්ථ නම්. ලබ්ධියයි. එම ලබ්ධියෙහි උත්පාදකයා තිත්ථකර නම්. එහි වූවෝ තිත්ථිය නම්. පියුමතුරා බුදුන් දවස තීර්ථකයෝ නොවූහ. යමෙක් සිටියාහුද? ඔවුහු මෙබඳු වූහයි දක්වීමට ව්‍යාහතා තිත්ථියා ආදිය කියන ලදයි දතයුතුය. **විමනා** යනු; විරූප මනස් ඇත්තෝ. **දුම්මනා** යනු එයටම පර්යායයි. **න තෙසං කෙචි පරිවරනති** යනු; ඒ අන්‍ය තීර්ථකයින්ට කිසිම පුරුෂ කෙනෙක් සංග්‍රහ නොකරති. භික්ෂා නොදෙති. සත්කාර නොකරති. ගරුකාර නොකරති. පූජා නොකරති. අසුනින් නොනැගෙති. ඇදිලි බැඳීම් නොකරති යන අර්ථයි. **රථාරථතො** යනු; සිය රටින්ද **නිවෙසනහනති** යනු; බැහැර කරති. පිටමං කරති. ඔවුන්ට නිවාස නොදෙ කියන අර්ථයි. **තෙ** යනු; ඒ තීර්ථකයෝ. **උපගඤ්ඡුං බුදධසනතිකෙ** යනු; මෙසේ රටවැසි මිනිසුන් විසින් නෙරපන ලද සියලු අන්‍ය තීර්ථකයෝ රැස්ව පියුමතුරා දසබලයන් වහන්සේම සරණ ගියහ. ඔබවහන්සේ අපගේ ශාස්තෘන් වහන්සේය. නාථයාණොය. ගතිපරායණයයි. පිහිටයි. මෙසේ කියා සරණ ගියහ යන අර්ථයි. අනුකම්පා කෙරේනුයි අනුකම්පක නම්. කරුණාවෙන් හැසිරේනුයි කාරුණික නම්. **සම්පතෙත** යනු; රැස්ව සරණගත වූ තීර්ථකයන්. **පඤ්චසීලෙ පතිට්ඨහ** යනු; පන්සල්හි පිහිටුවිය යන අර්ථයි. **නිරාකුලං** යනු; **අනාකුල**, අන්‍ය ලබ්ධිකයන්ගෙන් අසම්මිශ්‍රය යන අර්ථයි. **සුඤ්ඤකං** යනු; ශූන්‍යය. හිස්ය. ඒ තීර්ථකයන්ගෙනි. තං යනු; ඒ භාග්‍යවතුන් වහන්සේ ශාසනය යන වචනශේෂය දතයුතුය. **විචිතතං** යනු; විචිත්‍ර විචිත්‍ර වූ. වසීභූතෙහි යනු; වසීභාවප්‍රාප්ත වචන්ගෙන්.

ඒ පියුමතුරා භාග්‍යවතුන් වහන්සේගේ නගරය හංසවතී නම් විය. ආනන්ද නම් ක්ෂත්‍රිය පියාණොය. මව සුජාතා නම් දේවියයි. දෙවල සුජාත දෙනම අගසව්වෝය. උපස්ථායක සුමන නම්. අමිතා අසමා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. සලල රුක බෝධියයි. සිරුර අටපනස් රියන් උසය. උන්වහන්සේගේ ශරීර ප්‍රභාව හාත්පස යොදුනක් ගත්තේය. ආයුෂ වර්ෂ ලක්ෂයකි. අගමෙහෙසිය වාසුදත්තා නම්. පුත්‍රයා උත්තර නම් විය.

පදුමුත්තර නම් භාග්‍යවතුන් වහන්සේ පරම අභිරාම නන්දාරාමයෙහි පිරිනිවි සේක. උන්වහන්සේගේ ධාතු නොවිසරිණ. සියලු දඹදිව් වැසි මිනිස්සු රැස්ව දොළොස් යොදුන් උස සත්රුවන්මුවා චෛත්‍යයක් කරවූහ. එයින් කියන ලදි-

නගරං හංසවතී නාම ආනන්දොනාම බතතියෝ
සුජාතා නාම ජනිකා පදුමුතතරසස මහෙසිනෝ

දෙවලෝ ච සුජාතෝ ච අහෙසුං අගගසාවකා
සුමනෝ නාමුපටඨාකෝ පදුමුතතරසස සත්ථුනෝ

අමිතා අසමා චෙව අහෙසුං අගගසාවිකා
බොධිතසස භගවතෝ සලලරුකෙඛාති වුචචති

අටඨපණණාසරතනං අවවුගගතෝ මහාමුනි
කඤචනගඝිය සංකාසෝ දවතතිංසවරලකඛණෝ

කුඩඩා කථාථා හිතතීච රුකඛා නගසිලුචචයා
න තසසාවරණං අතථී සමනතා දවාදසයෙජනෝ

වසසසතසහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානෝ සෝ තාරෙසි ජනතං බහුං

සනතාරෙතවා බහුජනං ඡින්දිතවා සබබසංසයං
ජලිතවා අගගිකඛනෙධාව නිබබුතෝ සොසසාවකොති

එහි නගසිලුචචයා යනු; නගසංඛ්‍යාත පර්වත. ආවරණං යනු; වැස්මක්, මුවහකිරීමක්. දවාදසයොජනෙ යනු; හාත්පස දොළොස් යොදුන් තැන භාග්‍යවතුන් වහන්සේගේ ශරීරාලෝකය දිවා රාත්‍රී පැතිර සිටී යන අර්ථයි. සෙසු ගාථාවල හැමතන්හි ප්‍රකටය. මෙතැන්පටන් පාරමී පිරීමාදියෙහි නැවත නැවත ආ අරුත් හකුළුවා විශේෂ අර්ථ පමණක් දක්වමින් යමි. ඉදින් කී දේම පුන කියන්නෙම් ද එවිට කවදා නම් මේ අර්ථවර්ණනය නිමවන්නේ ද?

පදුමුත්තර බුදධවංස වර්ණනාව නිමියේය.

දසවන බුදධවංසය සමාප්තය.

පියුමතුරා බුදුන් පරිනිවියද උන්වහන්සේගේ සසුන ද අතුරුදන් වූ පසු සැත්තෑකප් ලක්ෂයක් (බුදුවරු නූපන්හ) බුද්ධශූන්‍ය විය. මෙතැන් පටන් තිස්කප් ලක්‍ෂයකින් මතු එක් කපෙක සුමේධ සුජාත නම් බුදුවරු දෙනමක් උපන්හ. එහි ප්‍රඥාධිගත සුමේධ නම් බෝසතාණෝ පැරුම් පුරා තුසී පුර ඉපිද එයින් චුතව සුදසසන නුවර සුදතත නම් රජුගේ අගමෙහෙසි සුදතතා නම් දේවිය කුස පිළිසිඳ දසමස් ගෙවීමෙන් සුදසුන් උයන වලා විවරගත තරුණ හිරු මෙන් මවුකුසින් බිහිවූහ. උන්වහන්සේ අවුරුදු නවදහසක් ගිහිගෙයි විසූහ. උන්වහන්සේට සුචන්‍දක කොඤ්ඤ සිරිවඩඪ නම් ප්‍රාසාදත්‍රයක් විය. සුමනා මහාදේවිය ප්‍රමුඛ හතලිස් අටදහසක් ස්ත්‍රීහු වූහ. සතර නිමිති දැක සුමනා දේවියට පුනබබසුමිනත නම් පුතු උපන් කල්හි ඇත්යානයෙන් මහබිනික්මන් නික්ම පැවිදි වූහ. සිය කෝටියක් මිනිස්සු අනුව පැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා අටමසක් ප්‍රධන් වීර්යය කොට වෙසක් පුන්පොහෝ දින නකුල නිගමයෙහි නකුල සිටුදියණිය දුන් මීකිරිබත් වළඳා සල්උයන්හි දිවාවිහාර කොට සිරිවඩඪ ආජීවක දුන් අටතණමිට ගෙන මිදෙල්ල බෝමුල විසිරියන් පුළුලැති තණඇතිරි අතුරා මරබල නසා අභිසම්බෝධියට පැමිණ අනේකජාති ආදි ක්‍රමයෙන් උදන් අනා බෝධි සමීපයෙහි සත් සති ගෙවා අටවන සතියෙහි බඹහුගේ ධර්මායාචනය පිළිගෙන භව්‍ය පුද්ගලයන් බලන සේක් සිය බාල සොහොයුරු සරණ කුමරු ද සචචකාල කුමරු ද තමන් සමග මහණ වූ භික්‍ෂූන් කෙළසියය ද සිවුසස් අවබෝධයට සමත් බැව් දැන අහසින් වැඩ සුදසුන් නුවර ළඟ සුදසුන් උයන්හි බැස උයන්පල්ලා ලවා සිය සොහොයුරන් කැඳවා පිරිස් සහිත ඔවුන් මැද දම්සක් පැවැත්වූහ. එකල කෙළලක්ෂයකට ධර්මාවබෝධ විය. මේ ප්‍රථම අභිසමය වෙයි. එයින් කියන ලදි-

පදුමුතතරසස සුමෙධො නාම නායකො
දුරාසදෝ උගගතෙජෝ සබබලොකුතතමෝ මුනි

පසනන නෙතෙතා සුමුඛො බ්‍රහා උජු පතාපවා
හිතෙසී සබබසතතානං බහූ මොචෙසි බන්‍ධනා

යදා බුදෙධා පාපුණිත්‍වා කෙවලං බොධිමුතතමං
සුදසසනමහි නගරෙ ධම්මචකකං පවතතයි

තසසාභිසමයාතීනි අහෙසුං ධම්මදෙසනෝ
කොටිසතසහසසානං පඨමාභිසමයෝ අහූති

එහි **උගතතෙජො** යනු; උග්‍රතේජස් ඇත්තේ. **පසන්නා නෙතෙතා** යනු; මනාපහන් නුවන් ඇත්තේ. සෝදා ඔපදමා තිබූ මිණිගුළියක් වැනි නුවන් වෙයි. එහෙයින් එබඳු නුවන් ඇත්තේ වෙයි කියන ලදි. මුදු සිනිඳු නිල් පහන් සියුම් පිහාටුයෙන් වටවූ අතිශයින් ඇස් ඇත්තේ යන අර්ථයි. **සුපසන්න පසැස් ඇත්තේයි** යනු ද වටී. **සුමුඛො** යනු; පිරිපුන් සරාසඳ වන් මුහුණු ඇත්තේ. **බහ්‍රා** යනු; අසූඅට රියන් පමණ සිරුරැති බැවින් බොහෝ මහත් වූයේ. අන්‍යයන්ට අසාධාරණ ශරීර ප්‍රමාණ ඇත්තේ යන අර්ථයි. **උජූ** යනු; ඍජ්මර්ජුගාත්‍ර ඇත්තේ. සෘජුවම උස්වූ ශරීර ඇත්තේ. දෙවිනුවරක නැගූ රන්තොරණක වන් උතුම් ශරීර ඇත්තේ යන අර්ථයි. **පතාපවා** යනු; බබළන ශරීර ඇත්තේ. **හිතෙසී** යනු සිත සොයන. **අභිසමයා තිණ** යනු; අභිසමය තුනෙකි. ලිංග විපර්යාසයකි.

යම්දාක භාග්‍යවතුන් වහන්සේ කුම්භකර්ණයාට බඳු ආනුභාව ඇති මිනිසුන් කන, දෘශ්‍යමාන ශරීරයෙන් වන සංචාරය නවතා වන මුඛයෙහි මහමඟ සිටිනා කුම්භකර්ණ නම් යකු පාන්දර මහාකරුණා සමාපත්තියට සමවැද ඉන් නැගී ලොව බලන කල දැක තනිව අසහායව ඒ යක්‍ෂයාගේ භවනයට වැඩ ඇතුළට පිවිස පැනවූ සිරියහනෙහි වැඩහුන් සේක් ද එවිට ඒ යක්‍ෂයා මකුඛව දරාගත නොහැකිව දණ්ඩෙන් ගැසූ සෝරවිෂ ඇති සර්පයකු මෙන් කිපී දසබලයන් වහන්සේට හිංසා කරනු කැමතිව තම ආත්මභාවය සෝරතර කොට හිස පර්වතයක් මෙන් කොට ඇස් හිරුමඬල මෙන් කොට නඟුලිස් බඳු දික්මහත් තියුණු දළ මවා එල්බෙන කළු මහත් විසම උදරයක් ඇතිව තල්කඳක් සා බාහු ඇති බුන් විරූප වක් නාසා ඇති පර්වත කුහරයක් බඳු මහ රතු කටක් ඇති මහත් පිඟුවන් රළු පරුෂ කෙහෙ ඇති අතිබිහිසුණු දැකුම් ඇතිව අවුත් සුමේධ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිට දුවිත් දිලියෙමින් පාෂාණ පර්වත අග්නිජ්වාලා ජල මඩ අළු ආයුධ අඟුරු වැලි බඳු නව ආකාර මහවැසි වස්වා භාග්‍යවතුන් වහන්සේගේ රෝමාග්‍රයක් හෝ සෙලවිය නොහැකිව භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න අසා මරමී සිතා ආළවකයා මෙන් ප්‍රශ්න ඇසීය. එවිට භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න විසඳීමෙන් යක්‍ෂයා හික්මවූ සේක. **ඉක්බිති** දෙවන දින රටවැසි මිනිස්සු ගැල්පිරූ බත් රජකුමරකු සහිතව ගෙනවුත් යක්‍ෂයාට දුන්හ. එවිට යක්‍ෂයා රජකුමරු බුදුන්ට පිදීය. වනදොර සිටි මිනිස්සු බුදුන් වෙත පැමිණියහ. එදින ඒ සමාගමයෙහි දසබලයන් වහන්සේ යක්‍ෂයා හට චිත්තානුකූල ධර්මයක් දේශනා කරන සේක. අනූ කෙළක් ප්‍රාණීන්ට ධර්මචක්‍ෂුස ඉපදවූ සේක. එය දෙවන ධර්මාභිසමය විය. එයින් කියන ලදි-

පුනාපරං කුමහකණ්ණං යකඛං සො දමයී ජිනො
නවුතිකොටිසහසසානං දුතියාභිසමයො අහූති

යම්කලෙක උපකාරී නුවර සිරිනන්දන උයන්හි සිවුසස් දෙසූ සේක්ද එකල අසූකෝටි දහසකට තෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

පුනාපරං අමිතයසො චතුසචචං පකාසයි
අසීතිකොටිසහසසානං ධම්මාභිසමයො අහූති

සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ ද ශ්‍රාවක සන්නිපාත තුනෙක් විය. පළමු රැස්වීමෙහි කෙළසියයක් රහත්හු වූහ. නැවත දේවකුට පර්වතයෙහි කථිනය ඇතුරු කල්හි දෙවන සමාගමයෙහි අනූකෙළකි. භාග්‍යවතුන් වහන්සේ චාරිකා කරන සේක් තෙවන සමාගමයෙහි අසූකෝටියක් වූහ. එයින් කියන ලදි-

සනනිපාතා තයො ආසුං සුමෙධසස මහෙසිනො
බීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

සුදසසනං නගරවරං උපගඤජි ජිනො යදා
තදා බීණාසවා භිකඛු සමිංසු සතකොටියො

පුනාපරං දෙවකුටෙ භිකඛූනං කථිනතථතෙ
තදා නවුතිකොටීනං දුතියො ආසි සමාගමො

පුනාපරං දසබලො යදා චරති චාරිකං
තදා අසීතිකොටීනං තතියො ආසි සමාගමොති

අප බෝසත්හු සියලුදෙනාට උතුම් උත්තර නම් මාණවකව නිදන්කොට තුබූ අසූකෙළක් ධනය වියදම් කොට බුදුපාමොක් බික්ඛුගනට මහදන් පුදා උන්වහන්සේගේ බණ අසා සරණයෙහි පිහිටා නික්ම පැවිදි වූහ. ඒ ශාස්තෘන් වහන්සේ වළඳා කෙළවර ඔබට බණ දෙසන සේක් අනාගතයෙහි ගොතම නමින් බුදුවන්නාහයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන උත්තරෝ නාම මාණවෝ
අසීති කොටියෝ මයහං ඝරෙ සන්නිචිතං ධනං

කෙවලං සබ්බං දත්වාන සසංඝෙ ලෝකනායකෙ
සරණං තස්ස උපාගඤ්ඡිං පබ්බජ්ජං චාභිරොපයිං

සොපි මං තදා ව්‍යාකාසි කරොනෙතා අනුමොදනං
තිංසකපසහස්සමහි අයං බුදෙධා භවිස්සති
පධානං පදහිත්වාන -පෙ-

විවරණ ගාථා විස්තර කළයුතුය.

තස්සාපි වචනං සුත්වා හීයෝ චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමී පූරියා

සුත්තන්තං විනයඤ්චාපි නවංගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොහයිං ජිනසාසනං

තත්ථපපමත්තෙතා විහරන්තෙතා නිසජ්ජට්ඨානචංකමෙ
අභිඤ්ඤාසු පාරමිං පත්වා බ්‍රහ්මලොකමගඤ්ඡහන්ති

එහි **සන්නිචිතං** යනු; නිධන් වශයෙන් රැස් කළ. **කෙවලං** යනු; සියල්ල යන අර්ථයි. **සබ්බං** යනු; නිරවශේෂව දී **සසංඝෙ** යනු; සංඝයා සහිත උන්වහන්සේට. **උපගඤ්ඡිං** යනු; උන්වහන්සේ වෙත ගියෙමි. කර්මාර්ථයෙහි සම්බන්ධ වචනයි. අභිරොචයිං යනු; පැවිදි වූයෙමි. **තිංසකපප සහසසමහි** යනු; තිස්කපක් ගියකල්හි යන අර්ථයි.

ඒ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ නුවර සුදසන නම් විය. සුදත්ත නම් රජ පියාය. මව සුදත්තා නම්. සරණ සබ්බකාම දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක සාගර නම්. රාමා සුරාමා දෙදෙන අග්‍රශ්‍රාවිකාවෝය. මහමිදෙල්ල ගස බෝධියයි. ශරීරය අටඅසූරියන් උස්විය. ආයුෂ අවුරුදු අනූදහසකි. නවදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. අගමෙහෙසිය සුමනා නම්. පුත්‍රයා පුනබ්බසුමිත්ත නම්. ඇත්යානයෙන් අභිනික්මන් කළහ. සෙස්ස ගාථාවල දැක්වේ. එයින් කියන ලදි-

සුදසසනං නාම නගරං සුදතෙතා නාම ඛතතියො
සුදතතා නාම ජනිකා සුමෙධසස මහෙසිනො

සරණො සබබකාමො ච අහෙසුං අගගසාවකා
සාගරො නාමුපට්ඨාකො සුමෙධසස මහෙසිනො

රාමා මෙව සුරාමාච අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතො මහානිපොති වුචචති

අට්ඨාසීති රතනානි අචචුගගතො මහාමුනි
පභාසෙති දිසා සබබා චන්දො කාරගණෙ යථා

චකකවතතිමණි නාම යථා තපති යොජනං
තථෙව තසස රතනං සමනතා එරති යොජනං

නවුතිවසස සහසසානි ආයු විජජති තාවදෙ
තාවතා නිට්ඨමානො සො තාරෙසි ජනකං බහුං

තෙවිජජ ඡළභිඤ්ඤාහි බලපපතෙතහි තාදිහි
සමාකුලමිදං ආසි අරහනෙතහි සාධුහි

තෙපි සබෙබ අමිතයසා විපපමුතතා නිරූපධි
ඤාණලොකං දසසයිත්වා නිබබුතා තෙ මහායසාති

එහි **චන්දො තාරගණෙ යථා** යනු; යම්සේ අහසෙහි පිරිපුන් සඳ තරුගණ බබුළුවයි ද, ප්‍රකට කරයි ද එමෙන් සියලු දිශාවන් බබුළුවයි යන අර්ථයි. සමහරු චන්දො පණ්ණරසො යථා යි ද හදාරති. එය පැහැදිලි අරුත් ඇත්තේය. **චකකවතතිමණිනාම** යනු; යම් සේ චනාහි සක්විති රජුගේ මිණිරුවන සිව්රියන් දිගින් යුත් ගැල්නැබ මෙන් පිරුණු නැබ ඇතිව අසූහාරදහසක් මිණි පිරිවරන තරුගණ පිරිවැරූ සරත් සමයෙහි පිරිපුන් සඳමඬලෙහි සිරිසෝභාව කැඳවන්නාක් මෙන් විපුල පර්වතයෙන් මිණිරුවන පරම රමණීය දර්ශනයෙන් එන්නේ ද එසේ එන මිණිරුවනෙහි ආලෝකය හාත්පස යොදුනක් පමණ අවකාශයෙහි ආලෝකය පැතිරෙයි. එමෙන් මේ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙන් ආලෝකරත්නය

හාත්පස යොදුනක් තැන පැතිරෙයි යන අර්ථයි. **තෙවිජජඡළභිඤ්ඤහ** යනු; ත්‍රිවිද්‍යාධාරීන් ෂඩභිඥාලාබීන් විසින් යන අර්ථයි. **බලපපතෙතහ** යනු; ඍද්ධිබලයට පැමිණියවුන්. **තාදිහි** යනු; තාදිබවට පත්වූවන්. **සමාකුලං** යනු; සංකීර්ණ වූ, එකම කසාවතින් බබළන. **ඉදං** යනු; සසුන සඳහා කියන ලදි. මිහිතලය හෝය. **අමිතයසා** යනු අපමණ පිරිවර ඇති, අසම කිත් යසස් ඇති. **නිරුපධි** යනු; සතර උපධි රහිත ගාථාවල සෙසු සියල්ල ප්‍රකටය.

සුමේධ බුදධවංස වර්ණනාව නිමියේය.

එකොළොස්වන බුදධවංසය සමාප්තයි.

ඉක්බිති උන්වහන්සේට පසුකල එම මණ්ඩකල්පයෙහිම පිළිවෙලින් අප්‍රමාණ ආයු ඇති සත්වයන් අනුක්‍රමයෙන් පිරිහී අනූදහසක් අවුරුදු ආයු වූ කල්හි මනාරූප කායෙන් පිරිසිදු වූ සුජාත නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූහ. උන්වහන්සේ පැරැම් පුරා තුසිපුර ඉපිද ඉන් සැව සුමංගල නුවර උගත නම් රජුගේ ප්‍රභාවති නම් මෙහෙසිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහිවූහ. නම් ගන්වන දින නම් කරනුයේ මුළු දඹදිව හැම සත්නට සැප ගෙනදෙමින් උපන්නේ යයි සුජාත කියාම නම් කළහ. උන්වහන්සේ නවදහසක් වස් ගිහිගෙයි විසූහ. සිරි උපසිරි නන්ද යයි තුන් පහයක් විය. සිරිනන්දා දේවිය ප්‍රමුඛ තෙවිසිදහසක් ස්ත්‍රීනු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක සිරිනන්දා දේවිය උපසේන නම් පුතු වැදූ කල හංසවහ නම් වරතුරඟු නැග මහබිනික්මන් නික්ම පැවිදි වූහ. උන්වහන්සේ අනුව කෙළක් දෙන පැවිදි වූහ. ඉක්බිති උන්වහන්සේ ඔවුන් පිරිවරා නවමසක් ප්‍රධන් කොට වෙසක් පුන් පොහෝ දින සිරිනන්දන නුවර සිරිනන්දන සිටුදියණිය පිදූ පරමමධුර මීකිරිබත් වළඳා සල්වනයෙහි දිවාවිහාර කොට සවස සුනන්දා ජීවක දුන් අටතණමිට ගෙන නුණබෝධිය කරා පැමිණ තෙතිස් රියන් පුළුලැති තණ ඇතිරි අතුරා හිරු තිබියදීම මරු සහිත මරබල සිඳ සම්මා සම්බෝධිය අවබෝධ කොට සියලු බුදුවරුන්ට ආවේණික උදන් අනා බෝමැඩ සමීපයෙහිම සත්සති ගෙවා බ්‍රහ්මයා විසින් අයදනා ලදුව සිය බාල සොහොයුරු සුදසුන් කුමරු සහ පුරෝහිත පුත් දේව කුමරු ද සිවුසස් අවබෝධ කිරීමට සමත්බව දැන අහසින් වැඩ සුමංගල නුවර ළඟ සුමංගල උයන්හි බැස උයන්පාලක ලවා සිය සොහොයුරු සමග පුරෝහිත පුතු ද කැඳවා සපිරිවර ඔවුන් මැද වැඩහිඳ දම්සක් දෙසූහ. එහි අසූකෝටියකට ධර්මාවබෝධ විය. මෙය ප්‍රථම ධර්මාභිසමයයි. යම්දාක භාග්‍යවතුන් වහන්සේ සුදසුන් උයන් දොර මහාසාල මූලයෙහි යමක ප්‍රාතිහාර්යය කොට තව්තිසා දෙව්ලොව වස් විසූ සේක් ද එකල සත්තිස් දහසකට ධර්මාවබෝධ විය. මේ දෙවන අභිසමයයි. යම්කලෙක සුජාත දසබලයන් වහන්සේ පියාණන් වෙත වැඩි සේක් ද එකල සැටලක්ෂයකට ධර්මාවබෝධ විය. මේ තෙවන අභිසමය විය. එයින් කියන ලදි.

තත්‍රේව මණ්ඩකපමහි සුජාතෝ නාම නායකෝ
සීහහනු උසභක්ඛන්ධෝ අපපමෙය්‍යෝ දුරාසදෝ

චන්දෝව විමලෝ බුද්ධෝ සතරංසීව පතාපවා
එවං සොභති සම්බුද්ධෝ ජලනෙතා සිරියා සදා

පාපුණිත්වාන සම්බුදෙධා කෙවලං බොධිමුත්තමං
සුමංගලමහි නගරෙ ධම්මචක්කං පවත්තයි

දෙසෙනෙත පවරං ධම්මං සුජාතෙ ලොකනායකෙ
අසීතිකොටි අභිසමිංසු පඨමෙ ධම්මදෙසනෙ

යදා සුජාතො අමිතයසො දෙවෙ වසසං උපාගමි
සතතතිංසසහසසානං දුතියාභිසමයො අහු

යදා සුජාතො අසමසමො උපගඤ්ඡි පිතුසනතිකං
සටඨිසතසහසසානං තතියාභිසමයො අහූති

එහි **තත්‍රෙව මණ්ඩකපපමහි** යනු; යම් මණ්ඩල කල්පයක සුමේධ භාග්‍යවතුන් වහන්සේ උපන්සේක් ද එම කල්පයෙහි සුජාත භාග්‍යවතුන් වහන්සේ උපන්හ යන අර්ථයි. **සීහහනු** යනු; උන්වහන්සේට සිංහයාට බඳු හනු ඇත්තේනුයි සීහහනු නමි. සිංහයාගේ වනාහි යටි හනුවම පිරුණේ වෙයි. යටි හනුව නොවෙයි. ඒ මහාපුරුෂයන්ගේ වනාහි සිංහයාගේ යටි හනුව මෙන් දෙකම පිරුණේය. දොළොස්වක සඳමෙන් වෙයි. **උසභකඛන්ධො** යනු; ඍෂභයාගේ මෙන් සමවට කඳ ඇත්තේ. මනාව වැඩුණු රන් ආලේප කළාක් වැනි කඳ ඇත්තේ යන අර්ථයි. **සතරංසීව** යනු; හිරු මෙන්. **සිරියා** යනු; බුදුසිරින්. බෝධිමුත්තමං යනු; උතුම් සම්බෝධියයි.

සුබම්මවතී නුවර සුධම්ම උයනට ආ මිනිසුන්ට බණ දෙසා සැටලක්ෂයක් එහිහික්ෂුභාවයෙන් පැවිදි කරවා ඔවුන් මැද පාමොක් දෙසූහ. එය ප්‍රථම සමාගමය විය. ඉන්පසු දේවෝරෝහණයෙහි භාග්‍යවතුන් වහන්සේගේ පනස් ලක්ෂයක දෙවන සන්නිපාතය විය. නැවත සුදස්සන කුමරා බුදුන් වෙත බණ අසා පැවිදිවූයේ යයි අසා අපිද මහණවෙමුයි පැමිණි සාරලක්ෂයක් පුරුෂයන් ගෙන සුදසසන තෙර සුජාත බුදුන් වෙත ගියේය. බුදුහු ඔවුන්ට දම්දෙසා ඒහි භික්ඛු පැවිද්දෙන් පැවිදි කරවා සිවුපිරිස් සමාගමයෙහි පාමොක් දෙසූහ. ඒ තෙවන සන්නිපාතයයි. එයින් කියන ලදි-

සතනිපාතාතයො ආසුං සුජාතසස මහෙසිනො
බීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

අභිඤ්ඤාබලපපතතානං අපපතතානං භවාභවෙ
සටඨීසතසහසසානි පඨමං සනනිපතිංසු තෙ

පුනාපරං සනනිපාතෙ තිදිවොරොහණෙ ජිනො
පඤ්ඤාස සතසහසසානං දුතියො ආසි සමාගමො

උපසංඛමනෙතා නරවසභං තසස සො අගගසාවකො
චතුහි සතසහසෙසහි සම්බුදධං උපසංකමීති

එහි අපපතතානං යනු; සසරට නොපැමිණියවුන් යන අර්ථයි. අපපවතතා භවාභවෙ යනු ද පාඨයි. එම අර්ථයමැයි. **තිදිවොරොහණෙ** යනු; සවර්ග දෙකකයෙන් කර්තෘ කාරකයෙහි යයි දත යුතුය. කාරක විපර්යාසයෙන් කියන ලදි. නැතහොත් **තිදිවො රොහණෙ** යනු; දෙව්ලොවින් බැසීමෙහි. **ජිනෙ** යනු; ජිනයන්ගේ සම්බන්ධාර්ථ සප්තමියයි.

එකල අප බෝසතාණෝ සක්විති රජව බුදුහු ලොව උපන්හයි අසා බුදුන් කරා ගොස් බණ අසා බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට සත් රත්න සමග සිවුමහ දිවයන්හි දිවයින් වැස්සෝ රටෙහි අය ගෙන ආරාමික කටයුතු සිදුකොට බුදුපාමොක් සඟනට නිති මහදන් දුන්හ. ඒ ශාස්තෘන් වහන්සේද අනාගතයෙහි ගොතම නම් බුදුවන්නේය කියා උන්වහන්සේට ප්‍රකාශ කළහ. එයින් කියන ලදි.

අහං තෙන සමයෙන චතුදීපමහි ඉසසරො
අනතළිකඛචරො ආසිං චකකවතති මහබබලො

චතුදීපෙ මහාරජජං රතනෙ සතත උතතමෙ
බුදෙධ නීයාදියිත්වාන පබබජිං තසස සනතිකෙ

ආරාමිකා ජානපදා උටඨානං පතිපිණ්ඩිය
උපනෙනති භිකඛුසංඝසස පචචයං සයනාසනං

සොපි මං තදා ව්‍යාකාසි දසසහසසිමහි ඉසසරො
තිංසකපපසහසසමහි අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමනති

තසසාපි වචනං සුත්වා භීයෝ භාසං ජනෙසභං
අධිට්ඨිහිං වනං උගගං දස පාරමිපූරියා

සුතතනතං විනයඤ්චාපි නවංගං සත්ථුසාසනං
සබබං පරියායුපණිත්වාන සොභයිං ජිනසාසනං

තත්ථපපමතෙතා විහරනෙතා බ්‍රහමං භාවෙත්ථ භාවනං
අභිඤ්ඤාසු පාරමිං ගනත්වා බ්‍රහමලොකමගඤ්ඡහනති

එහි චතුදීපමහි යනු; පිරිවර දිවයින් සහිත සතරමහ දිවයින් යන අර්ථයි. අනතළිකඛචරෝ යනු; සක්රුවන පෙරටුකොට අහස්හි හැසිරෙන්නේ. රතනෙ සතත යනු; හස්ති රත්නය ආදි සත් රත්න. උතතමෙ යනු; උතුම් වූ, නොහොත් උතුම් බුදුන් කෙරෙහි යන අර්ථයි කියා දතයුතුය. උටඨානං යනු; රටෙහි උපදින දේ අය යන අර්ථයි. පතිපිණ්ඩිය යනු; රැස්කොට, එකතුකොට. පචචයං යනු; චීවරාදි ප්‍රත්‍යය. දසසහසසිමහ ඉසසරෝ යනු; දසසහස්‍රී ලෝකධාතුවෙහි ඊශ්වර, මෙය ජාතික්ෂෙත්‍රය සඳහා කියන ලදියයි දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ අනන්ත ලෝකධාතුවල ඊශ්වර වෙති. තිංසකපප සහසසමහි යනු; මෙතැන් පටන් තිස් කප් ලක්‍ෂයකින් යන අර්ථයි.

ඒ සුජාත නම් භාග්‍යවතුන් වහන්සේගේ නගරය සුමංගල නම් විය. පියා උගගත නම් රජ ය. මව පභාවතී නම්. සුදස්සන දේව දෙනම අගසව්වෝය. උපස්ථායක නාරද නම්. නාගා නාගසමාලා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. මහහුණ ගස බෝධියයි. එය මද සිදුරු ඇති ඝන කද ඇති පරම රමණීය වෙරළුමිණි පැහැති නිර්මල පත්‍රයෙන් ගැවසී ගත් මහත් ශාඛා ඇතිව මොනරපිල් කළඹක් මෙන් බැබළියේය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ සිරුර පනස්රියන් උසය. අනූදහසක් අවුරුදු ආයු විය. අගමෙහෙසිය සිරිනඳා නම් විය. පුත්‍රයා උපසේන නම්. අස්යානයෙන් අබිනික්මන් කළහ. උන්වහන්සේ චන්දවතී නුවර සිලාරාමයෙහි පිරිනිවි සේක. එයින් කියන ලදි-

සුමංගලං නාම නගරං උගගතො නාම ඛත්තියෝ
මාතා පභාවතී නාම සුජාතසස මහෙසිනො

සුදසසනො ච දෙවොච අහෙසුං අගගසාවකා
නාරදෝ නාමුපට්ඨාකො සුජාතසස මහෙසිනො

නාගා ච නාගසමාලා ච අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතො මහාවෙජ්ඣති වුචචති

සො ච රුකෙඛා ජාතරුචිරො අචඡිදෙදා හොති පතතකො
උජූ වංසො බ්‍රහා හොති දසසනෙයයා මනොරමො

එකකඛන්ධො පවඩඩිත්වා තතො සාඛා හිජජති
යථා සුබදෙධා මොරහත්ථා එවං සොහති සොදුමො

න තසස කණටකා හොනති නාපි ඡිදදං මහා අහූ
විත්ථිණණ සාඛො අවිරලො සඤඡායො මනොරමො

පඤඤාසරතනො ආසි උචචතතනෙන සො ජිනො
සබබාකාරවරූපෙතො සබබගුණමුපාගතො

තසසපපභා අසමසමා නිදධාවති සමනතකො
අපපමාණො අතුලියො ඔපමෙමහි අනූපමො

නවුතිවසසසහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානො සො තාරෙසි ජනකං බහුං

යථාපි සාගරෙ ඌමී ගගනෙ තාරකා යථා
එවං තදා පාවචනං අරහනෙතහි චිතතනං

සො ච බුදෙධා අසමසමො ගුණානිව තානි අතුලියානි
සබබං සමනතරහිතං නනුරිතතා සබබසංඛාරාති

එහි අචඡිදෙදා යනු; අල්ප ඡිද්‍ර ඇත්තේ. අනුදරා තඤඤා ආදියෙහි මෙන් දතයුතුය. සමහරු ඡිදදං හොති පරිතතකං කියා හදාරති. පතතකො යනු; බොහෝ පත්‍ර ඇත්තේ මරාමිණි පැහැයෙන් සම්පන්න යන අර්ථයි. උජූ යනු; අවංක නොනැමී. වංස යනු; හුණ යි. බ්‍රහා යනු; හාත්පසින් මහත්. එකකඛන්ධො යනු; එකම ගසය. දෙවැන්නක් නැත යන අර්ථයි. පවඩඩිත්වා යනු; වැඩී. තතො සාඛා පහිජජති යනු; ඒ හුණගසින් පසක්ව ශාඛා බෙදී නික්මිණ. තතො සාඛා පහිජජථ කියාද පාඨයි. සුබදෙධා යනු

මනාව පිල්බැඳෙන ආකාරයෙන් බැඳුණු. මොරහපට යනු; අවු වැළකීම පිණිස කරන ලද බැඳුණු මොනර පිල්කළඹියයි කියනු ලැබේ. **න තසස කණටකා හොනති** යනු; ඒ හුණ වෘක්ෂයෙහි කටු නොවීය. **අවිරලො** යනු; අවිරලව අතු ගැවසී ගත්තේය. **සඳවඡායො** යනු; ගනසෙවණ විය. අවිරජ ශාඛා බැවින් සඳුවඡායො යි කියන ලදි. **සබබාකාරවරූපෙතො** යනු; හැම අයුරින්ම උතුම් බැවින් යුක්තය. **සබබගුණමුපාගතො** යනු; අනතුරු පදයට පර්යාය පදයක් පමණකි. අපපමාණයි. **අතුලියො** යනු; අසමාන වූයේ කිසිවකුටත් අසම වූයේ යන අර්ථයි. **ඔපමෙමහි** යනු; උපමා කටයුතු දේවලින්. **අනුපමො** යනු; උපමා රහිත වූයේ. මෙයට ද සමානයයි කීමට නොහැකි හෙයින් අනුපමය යන අර්ථයි. **ගුණානිව තනනි** යනු; ගුණ ද ඒ සර්වඥතාඥානාදි ගුණාදිය ද යන අර්ථයි. ලිංග විපර්යාසයෙන් කියන ලදි. සෙස්ස හැමතන්හි ප්‍රකටමය.

සුජාත බුදධවංස වර්ණනය නිමියේය.

දොළොස්වන බුදධවංසය සමාප්තයි.

සුජාත බුදුරදුන්ට පසු භාගයෙහි මෙයින් කප් සියයක් අධික දහසක් කපින් මතු එක් කල්පයෙක පියදසසී අත්‍රදසසී ධම්මදසසී යයි තුන් බුදු කෙනෙක් පහළ වූහ. එහිදී පියදස්සී නම් ශාස්තෘන් වහන්සේ පැරැම් පුරා තුසිපුර ඉපිද ඉන් චුතව සුධඤ්ඤවති නුවර සුදසසන රජුගේ සඳවත් ඇති චන්ද නම් දේවියගේ කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් වරුණ උයන්හි මවුකුසින් බිහිවූහ. උන්වහන්සේට නම් තබන දිනයෙහි ලොවට ප්‍රිය පෙළහර වෙසෙස් දක්වූ හෙයින් පියදස්සී කියාම නම් තැබූහ. උන්වහන්සේ අවුරුදු නවදහසක් ගිහිගෙයි විසූහ. උන්වහන්සේට සුනිම්මල විමලා ගිරිබුහා නම් තුන් පහයක් විය. විමලා මහාදේවිය ප්‍රමුඛ තෙතිස් දහසක් ස්ත්‍රීහු උටවැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක විමලාදේවිය කඤ්චන නම් පුතු ප්‍රසූත කළ පසු ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් නික්ම පැවිදි වූහ. කෙළක් පුරුෂයෝ උන්වහන්සේ අනුව පැවිදි වූහ. ඒ මහා පුරුෂයාණෝ ඔවුන් පිරිවරා සමසක් ප්‍රධන් කොට වෙසක් පුන් පොහෝ දින වරුණ බමුණුගම වසභ බමුණාගේ දියණිය විසින් පිදූ මීකිරිබත් වළඳා සල්වෙනෙහි දිවාවිහාර කොට සුජාත ආජීවක දුන් අටතණමිට ගෙන කුඹුක් බෝධිය වෙත පැමිණ තෙපනස්රියන් තණ ඇතිරි අතුරා පර්යංකය වැළඳ සර්වඥතාඥානය ප්‍රතිවේධ කොට උදන් අනා එහිම සත්සති ගෙවා තමන් වහන්සේ අනුව පැවිදිවූවන්ගේ සිවුසස් අවබෝධයට සමර්ථතා දන අහසින් වැඩ උසභවතී නුවර ළඟ උස භවන උයන්හි බැස කෙළක් භික්ෂූන් පිරිවරා දම්සක් දෙසූ සේක. කෙළ ලක්ෂයක් දෙනාට එදා ධර්මාවබෝධ විය. මේ ප්‍රථම අභිසමයයි.

නැවත සුභවතී නම් නුවරට නුදුරු සුදසසන පර්වතයෙහි සුදර්ශන නම් දේවරාජයෙක් වාසය කරයි. ඔහු මිථ්‍යාදෘෂ්ටිකය. සියලු දඹදිව් වැසි මිනිස්සු ඔහුට අවුරුදු පතා ලක්ෂයක් අගනා බලි පුදකරති. ඒ සුදස්සන දෙව්රජ නරරජු සමඟ එකම අසුනෙහි හිඳ බලි පිළිගනී. එකල පියදස්සී භාග්‍යවතුන් වහන්සේ ඒ සුදස්සන දිව්‍යරාජයාගේ දෘෂ්ටිගතිය දුරුකරන්නෙමියි ඒ දිව්‍යරාජයා යක්ෂ සමාගමයට ගියකල්හි ඔහුගේ භවනයට වැද සිරියහනට නැගී සවනක් රස් පතුරුවමින් යුගඳුරු පර්වතයෙහි සරාහිරු මෙන් හුන් සේක. සුදසසන යක්රජුගේ පිරිවර පරිචාරිකා දෙවඟනෝ මල්ගඳ විලවුන් ආදියෙන් දසබලයන් වහන්සේට පූජාකොට පිරිවරා සිටියහ. සුදසසන දෙව්රජ ද යක්ෂ සමාගමයෙන් එන්නේ සිය භවනයෙන් සවනක් රස් විහිදෙනු දැක මෙසේ සිතීය. වෙනදා මාගේ භවනයෙහි මෙවැනි නානා රශ්මි ජාලාවෙන් බබළන අසිරියක්

නොදිටිමි. කවර නම් දෙවියෙක් හෝ මිනිසෙක් පිවිසියේ දෝ යි කියා බලන්නේ උදාගිරිකුළු මුදුන්හි සරාකල හිරු මෙන් සවනක් රස්දලින් බබළමින් හුන් භාග්‍යවතුන් වහන්සේ දැක මේ මුඩුමහණ තෙම මාගේ පිරිවර ජනයා පිරිවරා වරාසනයෙහි හිඳිනේ යයි ක්‍රෝධයෙන් මැඩුණු සිතින් දැන් මොහුට මාගේ බල පෙන්වමි සිතා ඒ මුළුමහත් පර්වතය එකම ගිනිජාලාවක් කළේය. මේ ගිනිජාලාවෙන් මුඩුමහණ හළුවන්නට ඇතැයි බලන්නේ නොඑක් රැස්දල් සමූහයෙන් බබළන සිරුරු ඇති පහන්පැහැ මුවශෝභා ඇති පැහැපත් ඡවිශෝභා යුත් දිදුලන දසබලයන් වහන්සේ දැක මේ මහණ අග්නිදාහය ඉවසයි. දැන් මම මේ මහණ සැඩදිය පහරෙහි ගිල්වා මරමියි ඉතා ගැඹුරු දියපහරක් විමානයට අභිමුඛ කොට පැවැත්වීය. ඒ විමානය සැඩපහරින් පිරුණු කල වැඩහුන් භාග්‍යවතුන් වහන්සේගේ සිවුරෙහි අංශු මාත්‍රයක්වත් සිරුරෙහි රෝම මාත්‍රයක් වත් නොතෙමිණ. ඉක්බිති සුදසසන දෙව්රජ මෙයින් ශ්‍රමණ ආස්වාස රහිතව මිය යන්නට ඇතැයි සිතා දිය වළකා බලන්නේ නිල්මේඝකුළු විවරගත සරාකල සඳ මෙන් නානා රස්දලින් බබළන සියපිරිස් පිරිවරා හුන් භාග්‍යවතුන් වහන්සේ දක මකුබව දරාගත නොහී දැන් මොහු මරමියි නවවිධ ආයුධ වර්ෂාවක් වැස්සවීය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ආනුභාවයෙන් සියලු ආයුධ නන් වැදෑරුම් පරම රුචිර දූකුම් ඇති සුවඳ මල්මාලා බවට පත්ව භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැටී ගියේය.

එවිට ඒ අසිරිය දැක සුදසසන දෙව්රජ පරම කුපිත මනසින් භාග්‍යවතුන් වහන්සේ දෑතින් දෙපයින් ගෙන සිය භවනයෙන් ඇද දමනු රිසිව ඔසවා මුහුදු ඉක්මවා සක්වළගලට ගොස් කිම මහණ, ජීවත් වෙයිද මළේදැයි බලන්නේ එම අසුනෙහිම හිඳිනු දැක පුදුමයි, මේ ශ්‍රමණ මහානුභාවය. මම මේ මහණ මෙතැනින් නෙරපීමට අසමත් වෙමි. ඉදින් කිසිවකු මා දූනගතහොත් මට අපමණ අපකීර්තියකි. කිසිවකුත් දූනගැනීමට පෙර ඔහු එලවා දමන්නෙමියි සිතීය. එවිට භාග්‍යවතුන් වහන්සේ සිත්හසර දූන සියලු දෙවිමිනිසුන්ට පෙනෙන පරිදි අධිෂ්ඨාන කළ සේක. එදින මුළු දඹදිව සියයක් රජවරු ඔහුට උපහාර පිණිස රැස්වූහ. ඒ නරරජවරු භාග්‍යවතුන් වහන්සේගෙන සිරිපා වැඳගෙන සිටි සුදසසන දෙව්රජු දැක අපගේ දෙව්රජ පියදස්සී ශාස්තෘන් වහන්සේගේ සිරිපා මෙහෙවර කරයි. අපොයි බුදුවරු නම් ආශ්චර්ය වෙති. බුදුගුණ විශිෂ්ටයයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහන් සිතින් සියල්ලෝම බුදුන්ට නමස්කාර කරමින්

හිසෙහි ඇඳිලි බඳිමින් සිටියහ. එහිදී පියදස්සී භාග්‍යවතුන් වහන්සේ ඒ සුදස්සන දිවාරාජයා ප්‍රමුඛ කොට ධර්මදේශනා කළසේක. එදින අනූකෙළ දහසක් දිව්‍යමනුෂ්‍යයෝ ධර්මාවබෝධ කළහ. එය දෙවන ධර්මාභිසමය විය.

නවයොදුන් පමණ කුමුද නුවර දෙව්දත් මෙන් බුදුන්ට පසමිතුරු සෝණ නම් තෙර මහාපදුම නම් කුමරු සමග කුමන්ත්‍රණය කොට ඔහුගේ පියා මරවා නැවත පියදස්සී බුදුන් නැසීම පිණිස නානාප්‍රකාර ප්‍රයෝග කොටත් සාතනය කළ නොහැකිව හෙතෙම දොණමුඛ නම් ඇතු බලන ඇත්ගොවු කැඳවා ඔහු පොළඹවා ඒ කරුණ කීය. යම් විටක මේ පියදස්සී ශ්‍රමණයා මෙනුවරට පිඬු පිණිස පිවිසෙයිද එවිට දොණමුඛ ඇත්රජු මෙහෙයවා පියදස්සී ශ්‍රමණ මරවමියි කීය. ඉක්බිති ඒ ඇත්ගොවු තෙම හිතා හිත විමසීම් රහිතව රාජපාක්ෂිකව මේ ශ්‍රමණයා මා තනතුරෙනුත් පහකරන්නේ යයි දැන මැනවැයි එකඟව දෙවන දින තථාගතයන් වහන්සේ නුවරට පිවිසෙන වේලාව බලා පිඬුවූ කුම්භස්ථල සහිත සුජාත මස්තක ඇති දුනු වැනි දික් සොඩතල ඇති පුළුල් මෘදු කන් ඇති පිඟුවන් නුවන් යුත් සොඳුරුකඳ අසුන් ඇති අනුවූත ඝන කෙණ්ඩා ඇති දණ අතර සැඟවුණු ගුයහ ඇති හීවැනි සොඳුරු දළ ඇති මනා වලග යුත් සොඳුරු වලගමුල් ඇති සියලු හස්ති ලක්ෂණ සම්පන්න නිල් වලාවක් මෙන් සුන්දර දසුන් ඇති සිංහ ක්‍රාන්තත ලීලෝපෙත ගමන් ඇති ජංගම පර්වතයක් බඳු සත්තැන් බිම පිහිටි සත් අයුරින් විශේෂත්වයට පත් සර්වප්‍රකාරයෙන් මදවැහෙන විභ්‍රමණ මාරයා වැනි ඇතු ළඟට ගොස් පිඬු අහර අඳුන් බූප ආලේපාදි විශේෂයෙන් වඩාත් මත්ත ප්‍රමත්ත කොට සතුරු ඇතුන් මඬින ඓරාවණ වාණරයා වැනි සතුරන් නසාලන ඇතු මුනිවාරණයන් මරණු පිණිස පිටත්කොට හැරියේය.

ඉක්බිති ඒ ඇත්රජ මිදූ කෙණෙහිම ඇත් මිහි අස් ස්ත්‍රී පුරුෂයන් නසා ලේ තැවරුණු හිරුවැනි රතුසිරුරු ඇතිව බඩවැල් ජාලයෙන් වැසුණු ඇසින් ගැල්කවුළු කුටාගාර දොරටු තොරණ ආදිය බිඳ කාක උකුසු ගිජුලිහිණි ආදීන් විසින් වටේ හැසිරෙනු ලබන්නේ මළ මිහි නර කුරංගාදීන්ගේ අඟපසඟ කඩා දමා මිනී කන යකකු මෙන් කටින් සිසුගණ පිරිවරා දුරින් වඩින බුදුන් දැක අභය සරණ ගුරුළකුට බඳු වේගයෙන් බුදුන් ඉදිරියට දිවගියේය. එවිට පුරවැසි ජනයා භය සන්ත්‍රාසය පිරුණු හදින් ප්‍රාසාද ප්‍රාකාර ගොඩැලි ගස්වලට නැග තථාගතයන් වහන්සේ

ඉදිරියට පනිනු දැක හා හා කියා කෑගැසූහ. සමහර උපාසකයෝ නන් අයුරින් ඔහු වැළැක්වීමට පටන් ගත්හ. එවිට ඒ බුද්ධනාගයාණෝ එන්නා වූ හස්තිනාගයා බලා කරුණාව පැතිරීමෙන් සිසිල් වූ හදින් ඔහුට මෛත්‍රිය පැතිරවූ සේක. ඉක්බිති ඒ හස්තිනාගයා මෙත් පැතිරවීමෙන් මොළොක් වූ සිත් සතන් ඇතිව තමාගේ දොෂාපරාධය දැන ලජ්ජාවෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිටිය නොහැකිව පොළොවට පිවිසෙන්නාක් මෙන් හිසින් භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැටුණේය. මෙසේ වැටුණා වූ ඒ හස්තියා අඳුරු ගොඩක් බඳු සිරුරු ඇත්තේ සැදෑ කාන්තිය රැඳි රන්ගිරිකුළක් ළඟට වන් නිල්මේඝයි ගොඩක් මෙන් බැබළී ගියේය. එවිට මෙසේ මුනිරාජ පාදමූලයෙහි වැටීසිටි ඇත්රජු දැක නුවර වැස්සෝ ප්‍රීතිහරිත හදින් සාධුකාර සිංහනාද ද මහත් ඝෝෂාද පැවැත්වූහ. සුවඳ මල්මාලා සඳුන් සුවඳසුණු අලංකාරාදියෙන් උත්වහන්සේට නානාප්‍රකාරයෙන් පුද කළහ. හාත්පස පිළිසිසැරීම් පැවැත්වූහ. අහස දෙව්බෙර නාදවිය. එවිට භාග්‍යවතුන් වහන්සේ අඳුරු ගිරිකුළක් මෙන් පාමුල හොත් ඇත්රජු බලා අංකුස ධජාල සංඛචක්‍රාදියෙන් අලංකෘත අත්තලයෙන් ඇතුගේ කුඹ පිරිමැද ඔහුගේ සිතට අනුකූල ධර්ම දේශනයකින් ඔහුට අනුශාසනා කළ සේක.

ගජවර වදතො සුණොහි වාචං මම හිතමත්ථයුතඤ්ච භාසිහි,
තව වධනිරතං පදූටඨභාවං අපනය සනතමුපෙහි චාරුදනති

ලොභෙන දොසෙන ච මොහතො වා යො පාණිනො හිංසති චාරණින්ද,
සො පාණඝාතී සුචිරමපි කාලං දුකඛං සුඝොරං නරකෙ'නුභොහි

මාකාසි මාතංග පුනෙවරූපං කම්මං පමාදෙන මදෙන වාපි,
අවීචියං දුකඛමසයහකපපං පපෙපාහි පාණං අතිපාතයනෙතා

දුකඛං සුඝොරං නරකෙ'නුභොත්වා මනුසසලොකං යදි යාහි භීයො,
අපපායුකො හොහි විරූපරූපො විහිංසකො දුකඛවිසෙසභාගී

යථා ච පාණා පරමං පියා තෙ මහාජනෙ කුඤ්ජර මඤ්ඤනාග,
තථා පරසසාපි පියාහි ඤත්වා පණාතිපාතො පරිවජජනීයො

දොසෙ ච හිංසානිරතෙ විදිත්වා පාණාතිපාතා විරතෙ ගුණෙ ච,
පාණාතිපාතං පරිවජජයිත්ව සගෙග සුඛං ඉවජය තවං පරත්ථ

පාණාතිපාතා විරතො සුදනෙතා පියො මනාපො භවනීධ ලොකෙ,
කායසස භෙදා ච පරං පනසස සගගාධිවාසං කථයනති බුදධා

දුකඛාගමං නිවජති කොචි ලොකෙ සබෙබාපි ජාතො සුඛමෙසතෙව,
තසමා මහානාග විහාය හිංසං භාවෙහි මෙතතං කරුණං ච කාලෙනි

හසතිරාජය, කියන්නා වූ මාගේ වචනය අසව. හිතවත් අර්ථවත් අය ඇසුරු කරව. වධයෙහි නිරත තොපගේ දුෂ්ට බව අත්හරුව. සුන්දර දළ ඇත්ත, ශාන්ත වෙව. ලොභයෙන් දවේෂයෙන් හෝ මෝහයෙන් වාරතාඥය යමෙක් ප්‍රාණීන්ට හිංසා කරයි ද ඒ ප්‍රාණඝාතියා බොහෝකල් නිරයෙහි ගොරතර දුක් විඳි
හස්තිය, ප්‍රමාදයෙන් හෝ මදයෙන් නැවත මෙවැනි කර්ම නොකරව. ප්‍රාණඝාත කරන්නා නොඉවසිය හැකි දුක් දෙන අවීචියට පැමිණෙයි. අපායෙහි ගොරබිරම් දුක්විඳ නැවත මිනිස්ලොව පැමිණියද බෙහෙවින් අල්පායුෂ්ක වෙයි. විරූප දේහ ඇත්තේ වෙයි. විහිංසකයා දුක් විශේෂයට භාජනය වෙයි.
කුඤ්ජරරජය, යම් සේ තොපට ජීවිතය පරම ප්‍රියද එසේම අනුන්ටත් ප්‍රිය බව සිතා ප්‍රාණඝාතය දුරු කටයුතුය.
හිංසාවෙහි නිරතවීමේ දොස් ද ප්‍රාණඝාතයෙන් වැළකීමෙහි ගුණද දැන ප්‍රාණඝාතය අතහැර තෝ පරලොව සගසැප කැමති වෙව. ප්‍රාණඝාතයෙන් වැළකි සුදාන්තයා මෙලොව ප්‍රිය ද මනාප ද වෙයි. කය බිඳී පරලොව සුගතියට යතැයිද බුදුවරු පවසති.
ලොව කිසිවෙක් දුක කැමති නොවෙති. උපන් සියල්ලෝ සැපම සොයති. එබැවින් මහා හස්තිය, හිංසාව අතහැර සුදුසු අවස්ථාවෙහි මෛත්‍රිය හා කරුණාව වඩව.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුශාසනා කරනු ලබන්නේ ඇනා සිහි ලැබ පරම විනීත විනය ආචාර සම්පන්න ශිෂ්‍යයකු මෙන් විය. මෙසේ පිය පියදසසී භාග්‍යවතුන් වහන්සේ අප භාග්‍යවතුන් වහන්සේ ධනපාල ඇතු මෙන් දොණමුඛ ඇතු දමනය කොට ඒ මහාජන සමාගමයෙහි ධර්මදේශනා කළ සේක. එකල්හි අසූ කෙළලක්ෂයක් ජනයාට ධර්මාවබෝධය විය. මේ තෙවන සමාගමයයි. එයින් කියන ලදී.

සුජාතසස අපරෙන සයමභූ ලොකනායකො
දුරාසදො අසමසමො පියදසසී මහායසො

සොපි බුදෙධා අමිතයසෝ ආදිවෙචාව විරොචති
නිහතත්ථාන කමං සබබං ධම්මවකකං පවත්තයි

තසසාපි අතුතෙජසස අහෙසුං අභිසමයෝ තයෝ
කොටිසතසහසසානං පඨමාභිසමයෝ අහූ

සුදසසනෝ දෙවරාජා මීවජා දිටඨිමරොවයි
තසස දිටඨිං විනොදෙත්වා සත්ථා ධම්මමදෙසයි

ජනසනනිපාතෝ අතුලෝ මහාසනනිපති තදා
නවුති කොටිසහසසානං ධම්මාභිසමයෝ අහූ

යදා දොණමුඛං හත්ථිං විනොසි නරසාරථී
අසීති කොටිසහසසානං ධම්මාභිසමයෝ අහූති

සුමංගල නුවර පාලි නම් රාජපුත්‍රයා ද පුරෝහිත පුත්‍ර සබඳසසි කුමාරයා ද යහළුවෝ වූහ. ඔවුහු පියදසසී සම්මා සම්බුදුන් චාරිකා කරද්දී තම නුවරට වැඩි බව අසා කෙළලක්ෂයක් පිරිවරින් පෙරගමන් කොට උන්වහන්සේගේ බණ අසා මහදන් පුදා සත්වන දින භාග්‍යවතුන් වහන්සේගේ භූතතානුමෝදනාවසානයෙහි කෙළලක්ෂයක් සමග පැවිදිව රහත් වූහ. භාග්‍යවතුන්ගේ උන්වහන්සේලා මැද පාමොක් දෙසූහ. එය ප්‍රථම සන්නිපාතයයි. පසු කල සුදස්සන දේවරාජ සමාගමයෙහි අනූකෙළක් රහත් වූහ. උන්වහන්සේලා පිරිවරා ශාස්තෘන් වහන්සේ පාමොක් දෙසූහ. මෙය දෙවන රැස්වීම විය. නැවත දෝණමුඛ දමනයෙහි අසූකෙළක් මහණව රහත්වූහ. භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේලා මැද පාමොක් දෙසූහ. මෙය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි.

සනනිපාතා තයෝ ආසුං තසසපි පියදසසිනෝ
කොටිසතසහසසානං පඨමෝ ආසි සමාගමෝ

තතොපරං නවුතිකොටි සම්ඉංසු එකකෝ මුනි
තතියෙ සනනිපාතම්හි අසීතිකොටියෝ අහූති

එකල අප බෝසතාණෝ ඉතිහාසය පස්වන කොටැනි ත්‍රිවේදයෙහි පාරගත බමුණු තරුණයෙක්ව ශාස්තෘන් වහන්සේගේ බණ අසා කෙළලක්ෂයක් පරිත්‍යාගයෙන් පරම රමණීය සංසාරාමයක් කරවා තිසරණ පන්සිල්හි පිහිටියහ. එවිට ශාස්තෘන් වහන්සේ මෙයින් අටළොස් කප්

සියයකින් මතු ගොතම නම් බුදුවන්නේය කියා උන්වහන්සේට ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන තසසපො නාමමාණවො
අජඣායකො මනතධරො තිනනං වෙදානපාරගූ

තසස ධමමං සුණිතවාන පසාදං ජනයිං අහං
කොටිසතසහසසහි සංසාරාමං අමාපයිං

තසස දතවාන ආරාමං හටෙඨා සංවිගගමානසො
සරණෙ පංඤසීලෙව දළහං කතවා සමාදියිං

සොපි මං තදා වයාකාසි සංඝමජෙඣ නිසීදිය
අටඨාරසෙ කපපසතෙ අයං බුදෙධා භවිසසති

පධානං පදහිතවාන -පෙ- හෙසසාම සමුබා ඉමං

තසසාපි වචනං සුතවා හීයො චිතතං පසාදයිං
උතතරිං වත මධිටඨාසිං දසපාරමිපූරියාති

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය සුධඤඤවතී නම් විය. සුදතත නම් රජ පියාණෝය. සුචන්ද්‍ර නම් දේවිය මෑණියෝය. පාලිත සබබදසසී දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක සෝභිත නම්. සුජාතා ධම්මදින්නා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. කකුධ වෘක්ෂය බෝධියයි. ශරීරය අසූරියන් උසය. ආයු අවුරුදු නවදහසකි. අගමෙහෙසිය විමලා නම් වූවාය. පුත්‍රයා කඤඤවනාවෙල නම්. උන්වහනසේ ආජඤඤ රථයෙන් මහබිනික්මන් කළහ. එයින් කියන ලදි-

සුබඤඤං නාම නගරං සුදෙතතා නාම ඛතතියො
සුචන්ද්‍ර නාම ජනිකා පියදසසිසස සත්ථුනො

පාලිතො සබබදසසී ච අහෙසුං අගගසාවකා
සොභිතො නාමුපටඨාකො පියදසසිසස සත්ථුනො

සුජාතා ධම්මදිනනා ච අහෙසුං අගගසාවිකා
බොධිතසස භගවතො කකුධොති පවුචචති

සොපි බුදෙධා අමිතයසෝ දවතනිංසවර ලක්ඛණෝ
අසීතිහත්ථමුබෙබධෝ සාලරාජාව දිසති

අගගිවන්දසුරියානං නත්ථි තාදිසිකා පභා
යථා ආසුං පභා තසස අසමසස මහෙසිනෝ

තසසාපි දෙවදෙවසස ආයු තාවතකා අහු
නවුතිවසසසහසසානි ලොකෙ අථඛාසි චකඛුමා

සොපි බුදෙධා අසමසමෝ යුගනිපි තානි අතුලියානි
සබබං සමනතරහිතං නනු රිතතා සබබසංඛාරාති

එහි **සරණෙ පඤ්චසීලෙ** යනු; තිසරණය ද පඤ්චසීලය ද යන අර්ථයි. අථඛාරසෙ කපපසතෙ යනු; මෙයින් කල්ප අටසියයක් අධික කල්ප ලක්ෂයක් ඇවෑමෙන් යන අර්ථයි. **සාලරාජාව** යනු මුළුමනින් පිපීගිය පරම රමණීය දැකුම්කළු සමවට කඳ ඇති සල්ගසක් මෙන් දක්නා ලැබේ. **යුගානිපිතානි** යනු; අග්‍රශ්‍රාවක යුගලාදි යුගලයන්, සෙසු ගාථාවල සියලු අර්ථ ප්‍රකටමය.

පියදසසී බුදධවංස වර්ණනාව නිමියේය.

තෙළෙස්වන බුදධවංසය සමාප්තයි.

පියදස්සී බුදුන් පිරිනිවි කල්හි උන්වහන්සේගේ සසුන ද අතුරුදහන් වූ පසු පිරිහී වැඩි අපරිමිතායුෂ්ක මිනිසුන් වර්ෂ ලක්‍ෂයක් ආයු වූ කල පරමාර්ථදර්ශී අත්‍ථදස්සී නම් ශාස්තෘන් වහන්සේ ලොව උපන් සේක. උන්වහන්සේ පැරැමි පුරා තුසිපුර ඉපිද ඉන් චුතව පරම ශෝභන ශෝභන නම් නුවර සාගර නම් රජුගේ අගබිසෝ සුදස්සන දේවිය කුස පිළිසිඳ දසමස් ගැබ් වැස සුවිඤඤන උයන්හි මවුකුසින් බිහිවූහ. මහාපුරුෂයන් උපන් කෙණෙහි බොහෝකල් සැඟව ගිය කුලපරම්පරාගත මහනිධන්හි ධනහිමිත්‍ව ලැබූ හෙයින් උන්වහන්සේ නම් ගන්වන දිනයෙහි අත්‍ථදස්සී කියා නම් කළහ. උන්වහන්සේ දසදහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. අමරගිරි සුරගිරි ගිරිවාහන නම් පරම සිත් ගන්නා තුන්පහයක් උන්වහන්සේට විය. උන්වහන්සේ සතර නිමිති දැක විසාඛා දේවිය සේලකුමාර නම් පුතු වැදූ කල්හි සුදස්සන නම් අස්රජු නැගී මහබිනික්මන් නික්ම පැවිදි වූහ. උන්වහන්සේ අනුව නවකෙළක් පුරුෂයෝ මහණ වූහ. ඒ මහපුරිස්නු ඔවුන් පිරිවරා අටමසක් ප්‍රධන්කොට වෙසක් පුන්පොහෝදින සම්පූර්ණ ශරීරය ප්‍රදර්ශනය කරමින් සිටි සුචින්දර නම් නාගිනියට පිදීම පිණිස මහජනයා විසින් ගෙනඑන ලද රත්පාත්‍රය සහිත වූ මීකිරිබත් පුදන ලදුව එය වළඳා සියගණන් තරුණතරුයෙන් සමලංකෘත තරුණසාල වනයෙහි දාවල් දවස ගෙවා සවස ධම්මරුචි නම් නාගයා විසින් දෙන ලද අටතණමට ගෙන සපුබෝධිය වෙත පැමිණ තෙපනස් රියන් පුළුලැති කුස ඇතිරි අතුරා පර්යංකය වැළඳ සම්බෝධියට පැමිණ සියලු බුදුවරයන් වහන්සේලාට ආවේර්ණ උදන් අනා බෝරුක අසලම සත්සති ගෙවා බඹහුගේ ධර්මායාචනය පිළිගෙන තමන්වහන්සේ සමග පැවිදි වූ නවකෙළක් භික්‍ෂූන් සමග ආර්ය ධර්මාවබෝධයට සමතැන් දැක අහසින් ගොස් අනෝම නුවර ළඟ අනෝම උයන්හි බැස දම්සක් පැවැත්වූහ. එදින කෙළලක්‍ෂයක් දෙනාට පළමු ධර්මාවබෝධය විය. නැවත ලෝනා භාග්‍යවතුන් වහන්සේ දෙව්ලෝ චාරිකාවෙහි හැසිර එහි දම්දෙසද්දී කෙළ ලක්‍ෂයක් දෙනාට ධර්මාවබෝධ විය. යම්කලෙක අත්‍ථදස්සී භාග්‍යවතුන් වහන්සේ අප භාග්‍යවතුන් වහන්සේ කපිලපුරයට මෙන් සෝභන නගරයට වැඩ දහම් දෙසූ සේක්ද එකල්හි කෙළ ලක්‍ෂයක් දෙනාට ධර්මාභිසමය විය. මෙය තෙවන අභිසමයයි එයින් කියන ලදි-

තත්‍රෙව මණ්ඩකපමහි අත්‍ථදසසී මහායසො
මහාතමං නිහනත්‍වාන පතෙතා සමෙබාධිමුත්තමං

බ්‍රහ්මුණා යාචිතෝ සනෙතා ධම්මචක්කං පවත්තයි
අමතෙන තපපයී ලොකං දසසහස්සී සදෙවකං

තසසාපි ලොකනාථස්ස අහෙසුං අභිසමයෝ තයෝ
කොටිසතසහසසානං පඨමාභිසමයෝ අහූ

යදා බුදෙධා අත්‍රදසසි චරති දෙවචාරිකං
කොටිසතසහසසානං දුතියාභිසමයෝ අහූ

පුනාපරං යදා බුදෙධා දෙසෙති පිතුසනතිකෙ
කොටිසතසහසසානං තතියාභිසමයෝ අහූති

එහි **තත්‍රෙව** යනු; එම කල්පයෙහිම යන අර්ථයි. මෙහි වනාහි වරකල්පය මණ්ඩකල්පයයි අභිප්‍රේතයි. යම් කල්පයක තුන් බුදුකෙනෙක් උපදිත් ද ඒ කල්පය වරකල්පයයි යට පියුමතුරා බුද්ධවංස වර්ණනාවෙහි කියන ලදි. එබැවින් වරකල්පය මෙහි මණ්ඩ කල්පයයි කියන ලදි. **නිහනත්‍ථා** යනු; නසා. පාඨය මෙයම හෝ වෙයි. **සමාවිකා** යනු; සමාන වූයේ. **අමතෙන** යනු; මාර්ගඵලාවබොධ නමැති අමා පානයෙන්. **තපපය** යනු; තර්පනය කළහ. පිනවූහ යන අර්ථයි. **දසසහස්සී** යනු දසසහස්‍රී ලෝකධාතුව. **දේවචාරිකං** යනු; දෙවියන් හික්මවීම පිණිස දිව්‍යලෝක චාරිකාව යන අර්ථයි.

සුචන්‍දක නුවර සනත රාජපුත්‍රයා ද උපසනත පුරෝහිත පුත්‍රයා ද ත්‍රිවේදයෙහි සකල සමයාන්තරයෙහි සාරයක් නොදක නුවර සතර දොරටුවෙහි පණ්ඩිත විශාරද මිනිසුන් සතරදෙනෙකු පැවැත්වූහ. ඔබලා යම් පණ්ඩිත මහණකු හෝ බමුණකු දක්නාහු හෝ අසන්නාහු නම් ඒ බව අපට දැනුම් දෙවු කියායි. එකල අත්‍රදස්සී ලෝක නායකයාණෝ සුචන්‍දක නගරයට වැඩියහ. එවිට ඔවුන් නවත්වා සිටි පුරුෂයෝ ගොස් ඔවුන්ට දසබලයන් වහන්සේගේ එහි පැමිණීම දැනුම් දුන්හ. එවිට ඒ සනක අපසනක දෙදෙන තථාගත ආගමනය අසා තුටුපහටුව දහසක් පිරිවරා අසමබල ඇති දසබලයන් වහන්සේට පෙරගමන් කොට වැඳ ආරාධනා කොට සතියක් බුදුපාමොක් සඟනට අසම මහදන් දී සත්වන දින සියලු නුවරවැසි මිනිසුන් සමග බණ ඇසූහ. එදින අථානුලක්ඛයක් ඒහිභික්ඛු පැවිද්දෙන් පැවිදිව රහත් වූහ. ඒ පිරිසෙහි භාග්‍යවතුන් වහන්සේ පාමොක්

දෙසූහ. එය ප්‍රථම සන්නිපාතය විය. යම්දාක භාග්‍යවතුන් වහන්සේ සිය පුත් සේල තෙරුන්ට දහම් දෙසමින් අටාසූදහසක් පමදවා එහිහික්ෂූ ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි කරවා රහත්කොට පාමොක් දෙසූ සේක් ද එය දෙවැනි සන්නිපාතය විය. නැවත මහාමංගල සමාගමයෙහි නවම් පුන්පොහෝ දින දෙවිමිනිසුන්ට දම්දෙසා අටසැත්තෑ දහසක් රහත් කරවා පාමොක් දෙසූහ. එය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයො ආසුං තසසාපිච මහෙසිනො
ඛීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

අටඨනවුතිසහසසානං පඨමො ආසි සමාගමො
අටඨාසීතිසහසසානං දුතියො ආසි සමාගමො

අටඨසතතතිසහසසනාං තතියො ආසි සමාගමො
අනුපාදා විමුතතානං විමලානං මහෙසිනනති

එකල අප බෝසතාණෝ චම්පක නුවර සුසීම නම් ලෝකසම්මත මහාසාර බ්‍රාහ්මණයෙක් විය. උන්වහන්සේ සියලු සම්පත් දීන අනාථ දුගී මගී ආදීන්ට දන් දී හිමවත සමීපයට ගොස් තවුස් පැවිද්දෙන් පැවිදිව පඤ්ඤාභිඥා අෂ්ට සමාපත්ති උපදවා මහත් ඍද්ධි මහානුභාව ඇතිව මහජනයාට කුශලාකුශල ධර්මයන්ගේ නිරවද්‍ය සාවද්‍ය බව දක්වා බුදෙධාත්පාදය බලාපොරොත්තු වෙමින් සිටියේය. එවිට පසුකලෙක අසඨදසසී ලෝකනායකයාණෝ ලොව ඉපිද සුදස්සන මහාවිහාරයෙහි අටපිරිස් මැද ධර්මාමෘත වර්ෂයාව වස්වන කල්හි උන්වහන්සේගේ බණ අසා දෙව්ලොවට ගොස් දිව්‍යමය මදාරා පරසතු මල් ගෙනවුත් සිය ආනුභාවය දක්වමින් දෘෂ්‍යමාන ශරීරයෙන් සතර දිශාවෙහි චාතුර්ද්වීපික මහා මේඝයක් මෙන් පුෂ්පවර්ෂා වස්වා හාත්පස පුෂ්පමය මණ්ඩපයක් පුෂ්පමය ඇඟෑ තොරණ හේමජාලාදිය පුෂ්පමයව කොට මදාරා මල් කූඩයකින් දසබලයන් වහන්සේට පූජා කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේ එතුමාට අනාගතයෙහි ගෝතම නම් බුදුවන්නේය කියා ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන ජටිලො උගගතාපනො
සුසීමො නාම නාමෙන මහියා සෙටඨ සම්මතො

දිබබං මන්දාරවං පුපඵං පදුමං පාරිචඡත්තකං
දෙවලොකහිතො ආහරිත්වා සම්බුදධමභිපූජයිං

සොපි මං තදා සොකායි අත්‍යදසසි මහාමුනි
අටයාරදෙ කපපසතෙ අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං

තසසාපි වචනං සුත්වා හටෙයා සංවිගගමානසො
උතතරිං වතටඨිටයාසිං දසපාරමිපූරියාති

එහි ජටිලො යනු; ඔහුට ජටා ඇත්තේනුයි ජටිල නමි. මහියා සෙටඨසමමතො යනු; සකල ලෝකයා විසින් ශ්‍රේෂ්ඨය. උත්තමය ප්‍රවරය කියා මෙසේ සම්මත වූයේ සම්භාවිත වූයේ යන අර්ථයි.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය සෝභන නම් විය. සාගර නම් රජ පියාණෝය. මෑණියෝ සුදසසනා නමි. සනත උපසනත දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක අභය නමි. ධම්මා සුධම්මා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. සපු රුක බෝධියයි. ශරීරය අසූරියන් උසය. ශරීර ප්‍රභාව හැමදා හාත්පස යොදුනක් පමණ පැතිර පැවැත්තේය. ආයුෂ වර්ෂ ලක්‍ෂයකි. අගමෙහෙසිය විසාඛා නමි. සෙල නම් පුත්‍රයාය. අස් යානයෙන් මහබිනික්මන් කළහ. එහෙයින් කියන ලදි-

සොභනං නාම නගරං සාගරො නාම ඛනතියො
සුදසසනා නාම ජනිකා අත්‍යදසසිසස සත්ථුනො
-පෙ-
සොපි බුදෙධා අසමසමො අසීති රතනුගගතො
සොභති සාලරාජාව උඵරාජාව පූජිතො

තසස පාකතිකා රංසි අනෙකසතකොටියො
උදධං අධො දසදිසා එරනති යොජනං සදා

සොපි බුදෙධා නරවසභො සබබසතතුතතමොමුනි
වසසසත සහසසානි ලොකෙ අටයාසි චකඛුමා

අතුලං දසෙසත්වා ඔභාසං විරොචෙත්වා සදෙවකෙ
සොපි අනිචචකං පතෙතා යථගගුපාදානසංඛයාති

එහි උළුරාජාම පූජිතො යනු; සරාකල පිරිපුන් නිර්මල මණ්ඩල ඇති තරුරජු මෙනි යන අර්ථයි. පාකතිකා යනු; ප්‍රකෘති වශයෙන් උපදින. අධිෂ්ඨාන වශයෙන් නොවේ. භාග්‍යවතුන් වහන්සේ යම්විටක කැමති සේක් ද එවිට නොඑක් කෙළලක්ෂයක් සක්වළ පතුරුවන සේක. රංසි යනු; රශ්මීහු. උපාදානසංඛ්‍යා යනු; උපාදාන ක්ෂය වීමෙන් ඉන්ධන ක්ෂය වීමෙන් ගින්න මෙනි. ඒ භාග්‍යවතුන් වහන්සේ ද සතර උපාදාන ක්ෂය කිරීමෙන් අනුපාදිසෙස නිර්වාණ ධාතුවෙන් අනුපම නුවර අනෝමා රාමයෙහි පිරිනිවි සේක. උන්වහන්සේගේ ධාතු අධිෂ්ඨාන වශයෙන් විසුරුණේය. මෙහි සෙසු ගාථාර්ථ ප්‍රකටය.

අසෝදසසි බුදධවංස වර්ණනාව නිමියේය.

තුදුස්වන බුදධවංසය සමාප්තයි.

අපරදසසී භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි අන්තර කල්පය ද ගතවූ පසු අපරිමිත ආයු ඇති සත්වයන් පිරිහී වසර ලක්‍ෂයක් ආයු වූ කල්හි ලෝකාලොකතර ලෝකමල නසාලන ලොවට එකම නායක වූ ධම්මදස්සී නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ද පාරමී පුරා තුසිතපුර ඉපිද ඉන් සැව සරණ නුවර සියලු දෙනාට සරණ සරණ නම් රජුගේ අගමෙහෙසි සුනන්දා දේවිය කුස පිළිසිඳ ගත්හ. උන්වහන්සේ දසමස් ඇවෑමෙන් සරණ උයන්හිදී වැසිකල මෙකුළු විවරගත පුන්සඳ මෙන් මවුකුසින් බිහිවූහ. මහාපුරුෂයාණෝ මවුකුසින් බිහිවත්ම අධිකරණ ව්‍යවහාර පුස්තකයන්හි අධාර්මික ව්‍යවහාර තෙමේම අතුරුදහන් විය. ධාර්මික ව්‍යවහාර පමණක්ම ශේෂ විය. එහෙයින් උන්වහන්සේට නම් තබන දිනයෙහි ධම්මදස්සී කියා නම් කළහ. උන්වහන්සේ අවුරුදු අටදහසක් ගිහිගෙයි විසූහ. අරජ විරජ සුදස්සන නම් තුන්පහයක් එතුමන්ට විය. විවිකොලි දේවිය ප්‍රමුඛ දහසකට අධික ස්ත්‍රීහු වූහ. උන්වහන්සේ සතර නිමිති දැක විවිකොලි දේවිය පුඤ්ඤවඩ්ඪන නම් පුත්‍රයා ප්‍රසූත කළ කල්හි දෙව්සැප විඳින අතිසුකුමාර දෙව්කුමරකු මෙන් මැදියම් රැයෙහි පිබිද සිරියහන් හි හිඳ නිදිගත් ගැහැණුන්ගේ විප්‍රකාර දැක හටගත් සංවේග ඇතිව අබිනික්මනට සිතූහ. සිතූ කෙණෙහිම උන්වහන්සේගේ සුදර්ශන ප්‍රාසාදය අහසට නැග සිවුරගසෙන් පිරිවරා දෙවැනි දිවාකරයකු මෙන් දෙව්විමනක් මෙන් ගොස් රත්කරවිරුක් බෝධිය සමීපයෙහි බැසි සිටියේය. මහාපුරුෂයාණෝ බඹහු විසින් එළවන ලද කසාවත් ගෙන පැවිදිව පහයෙන් බැස නුවුරෙහි සිටියහ. පහය නැවත අහසින් ගොස් බෝරුක මැදිකොට පොළවෙහි පිහිටියේය. පිරිවර ස්ත්‍රීහු ද පහයෙන් බැස අඩගව්වක් පමණ ගොස් සිටියහ. එහිදී ස්ත්‍රීන් ද ඔවුන්ගේ සේවිකාවන් ද හැර සියලු මිනිස්සු උන්වහන්සේ අනුව මහණ වූහ. කෙළ ලක්‍ෂයක් භික්‍ෂූහු වූහ. ඉක්බිති ධම්මදස්සී බෝසත්හු සතියක් ප්‍රධන් කොට විවිකොලි දේවිය දුන් මීකිරිබත් වළඳා ඩෙබර වෙනෙහි දිවාවිහාර කොට සවස සිරිවඩ්ඪ නම් ගවපාලක දුන් අටතණමිට ගෙන බිම්බිජාල බෝධිය වෙත පැමිණ තෙපනස් රියන් පුළුල් තණඇතිරි අතුරා එහි සර්වඥතා ඥානය ප්‍රතිවේධ කොට උදන් අනා සත්සති ගෙවා බ්‍රහ්මායාචනයෙන් තමන් වහන්සේ සමග පැවිදි වූ කෙළ ලක්‍ෂයක් භික්‍ෂූන්ගේ ධර්මාවබෝධ සමර්ථතාව දැන අටළොස් යොදුන් මග එක් දවසින්ම ගෙවා ඉසිපතනයට වැඩ එහිදී ඒ භික්‍ෂූන් පිරිවරා ධම්සක් පැවැත්වූ සේක. එදින කෙළ ලක්‍ෂයකට ප්‍රථම ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

තත්‍රේව මණ්ඩකපමහි ධම්මදසසී මහායසො
තමන්ධකාරං විධමිත්වා අතිරොචති සාදෙවකෙ

තසසාපි අකුලතෙජසස ධම්මචකකපවත්තනෙ
කොටිසතසහසසානං පඨමාභිසමයො අහූති

එහි තමන්ධකාරං යනු; තමස් සංඛ්‍යාත මොහාන්ධකාරය යන අර්ථයි. යම්කලෙක නගරනම් නුවර සඤ්ජය නම් රජ කාමයන්හි ආදීනවද නෛෂ්ක්‍රම්‍යය ක්‍ෂෙම බවද දැන ඍෂි පැවිද්දෙන් පැවිදිවිය. එකල නවකෙළක් ඔහු අනුව පැවිදි වූහ. ඔවුහු සියල්ලෝම පංචාභිඥා අෂ්ටසමාපත්තිලාභීහු වූහ. ඉක්බිති ධම්මදසසී ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ උපනිශ්‍රය සම්පත් දැක අහසින් වැඩ සඤ්ජය තාපසයාගේ ආශ්‍රමයට ගොස් අහසෙහි සිට ඒ තාපසවරුන්ගේ අදහස් පරිදි බණ දෙසා ධර්මචක්‍ෂුස ඉපදවූහ. ඒ දෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

යදා බුදෙධා ධම්මදසසි විනෙසි සඤ්ජයං ඉසිං
තදා නවුතිකොටීනං දුතියාභිසමයො අහූති

යම්කලෙක සක්දෙවිඳු දසබලයන් වහන්සේගේ බණ අසනු රිසිව උන්වහන්සේ වෙත ගියේද එකල අසූකෙළකට තෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි.

යදා සකෙකා උපගඤ්ඡි සහපරිසො විනායකං
තදා අසීතිකොටීනං තතියාභිසමයො අහූති

යම්කලෙක සරණ නුවර සුළුමෑණියන්ගේ පුත් සොහොයුරු පදුම කුමරු ද ථුස්සදේව කුමරු ද සපිරිවරින් මහණ කළ සේක් ද ඒ ඇතුළුවස පැවිදි වූ කෙළ ලක්ෂයක් භික්‍ෂූන් මැද විසුද්ධි පවාරණයෙන් පවාරණය කළ සේක. ඒ ප්‍රථම සන්නිපාතය විය. නැවත භාග්‍යවතුන් වහන්සේගේ දෙව්ලොවින් බැසීමෙහි සියකෙළකගේ දෙවන සන්නිපාතය විය. යම් විටක සුදසසනාරාමයෙහි තෙළෙස් ධුතාංගයන්ගේ ගුණානිසංස ප්‍රකාශකොට හාරිත නම් මහාශ්‍රාවකයන් වහන්සේ එතදග්‍ර ස්ථානයෙහි තුබූ සේක් ද එකල අසූ කෙළක් මැද භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

තසසාපි දෙවදෙවසස සනනිපාතා තයෝ ආසුං
බීණාසවානං විමලානං සනතචිතතානං තාදිනං

යදා බුදෙධා ධම්මදසසී සරණෙ වසසං උපාගමී
තදා කොටි සහසසානං පඨමෝ ආසි සමාගමෝ

පුනාපරං යදා බුදෙධා දෙවතෝ එති මානුසං
තදාපි සතකොටීනං දුතියෝ ආසි සමාගමෝ

පුනාපරං යදා බුදෙධා පකාසෙසි ධුතෙගුණෙ
තදා අසීතිකොටීනං තතියෝ ආසි සමාගමොති

එකල අප බෝසත්හු සක්දෙව්රජව දෙදෙව්ලොව දෙවියන් පිරිවරා අවුත් දිව්‍යමය ගඳින් මලින් දිව්‍ය තූර්යයෙන් ද තථාගතයන් වහන්සේට පිදීය. ඒ ශාස්තෘන් වහන්සේ ඔහුට මතු ගෞතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන සකෙකා ආසිං පුරින්දදෝ
දිබබගන්ධෙන මාලෙන කුරියෙන අභිපූජයිං

සොපි මං තදා ව්‍යාකාසි දෙවමජෙඣ නිසීදිය
අටඨාරසෙ කපපසතෙ අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්‍වාන -පෙ- හෙසසාම සම්මුඛා ඉමං

තසසාපි වචනං සුත්වා හීයො චිතතං පසාදයිං
උතතරං වතමධිටඨාසිං දසපාරමී පූරියානි

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය සරණ නම් විය. සරණ නම් රජ පියාණෝය. මෑණියෝ සුනන්දා නම්. පදුම ඵුසසදේව දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක සුනෙතත නම්. බෙමා සබබනාමා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. බිම්බිජාලරුක බෝධියයි. උන්වහන්සේගේ සිරුර අසූරියන් උසය. ආයුෂ වර්ෂ ලක්‍ෂයකි. අගමෙහෙසිය විචිකොලි නමි. පුඤඤවදධන නම් පුත්‍රයාය. ප්‍රාසාදයෙන් අබිනික්මන් කළහ.

එයින් කියන ලදි-

සරණං නාම නගරං සරණෝ නාම බතතියෝ
සුනඳා නාම ජනිකා ධමමදසසිසස සතථුනෝ

පදුමෝ උසසදෙවොව අහෙසුං අගගසාවකා
සුනෙතෙතා නාමුපටඨාකෝ ධමමදසසිසස සතථුනෝ

බෙමා සබබනාමා ච අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතෝ බිමබිජාලොති වුචචති

සොපිබුදෙධා අසමසමෝ අසීතිහතථමුගගතෝ
අකිරොචති තෙජෙන දසසහසසමහි ධාතුයා

සුඵුලලසාලරාජාව විජඣුව ගගනෙ යථා
මජඣනතිකෙ ච සුරියෝ එවං සෝ උපසොභථ

තසසාපි අතුලතෙජසස සමකං ආසි ජීවිතං
වසසසතසහසසානි ලොකෙ අටඨාසි වකඛුමා

ඔභාසං දසසයිතවාන විමලං කතවාන සාසනං
රවිවඬඩොව ගගනෙ නිබබුතෝ සෝ සසාවකොති

එහි බිමබිජාලෝ යනු; රත්කරව් රුකයි. දසසහසසිමහි ධාතුයා යනු; දසසහස්‍රී ලෝකධාතුවෙහි. විජඣුව යනු; විදුලිය මෙන්. උපසොභථ යනු; යම්සේ අහසෙහි විදුලිය ද මධ්‍යාහ්නයෙහි සූර්යයා බබළන්නේ ද එසේ ඒ භාග්‍යවතුන් වහන්සේ ශෝභමාන වූහ යන අර්ථයි. සමකං යනු; උන්වහන්සේගේ ආයුෂ සියලු නරසත්වයන් හා සමානම විය යන අර්ථයි. චවි යනු; චුත විය. චඬෙඩාව යනු; අහසින් සඳ මෙන් චුත විය යන අර්ථයි. ධමමදසසි භාග්‍යවතුන් වහන්සේ සාලවති නුවර කේසාරාමයෙහි පිරිනිවි සේක. මෙහි ගාථාවල සෙස්ස ප්‍රකටමය.

ධමමදසසි බුදධවංස වර්ණනාව නිමියේය.

පසළොස්වන බුදධවංසය සමාප්තයි.

ධම්මදසසි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ සසුන ද අතුරුදන් වූ පසු ඒ කල්පයද ගතවූ පසු කල්ප එක්දහස් සත්සිය සයකින් එක් කල්පයක ලෝකාර්ථවර පරමාර්ථාධිගත සිද්ධාර්ථ නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූහ. එයින් කියන ලදි-

ධම්මදසසිසස අපරෙන සිදධත්ථො ලොකනායකො
නිහනිත්වා තමං සබබං සුරියොවබහුගගනො තදාති

සිද්ධාර්ථ බෝසතාණෝ ද පැරැමී පුරා තුසිත භවනයෙහි ඉපිද එයින් චුතව වේහාර නගරයෙහි උදේන රජුගේ අගමෙහෙසි සුඵසසා දේවිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් විරිය උයන්හි මුවකුසින් බිහිවූහ. මහසතුන් උපන් කල්හි සියල්ලන්ගේ පටන් ගත් කර්මාන්ත ද ප්‍රාර්ථනා කළ කටයුතු ද සම්පූර්ණ විය. එබැවින් උන්වහන්සේට ඤාතීහු සිද්ධාර්ථ කියා නම් කළහ. උන්වහන්සේ හවුරුදු දසදහසක් ගිහිගෙයි විසූහ. උන්වහන්සේට කෝකා උප්පල පදුම යයි තුන් පහයක් විය. සොමනස්ස දේවිය ප්‍රධාන අටසාළිස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක සොමනස්ස දේවියට අනුපම කුමරු උපන් කල්හි ඇසළ පුන්පොහෝ දින රන්සිවිගෙයකින් නික්ම විරිය උයන්හි පැවිදි වූහ. කෙළලක්ෂයක් මිනිස්සු උන්වහන්සේ අනුව මහණවූහ. මහාපුරුෂයාණෝ ඔවුන් සමග දසමසක් ප්‍රධන් කොට වෙසක් පුන්පොහෝ දින අසදිස බමුණුගම සුනෙත්තා නම් බ්‍රාහ්මණ කන්‍යාව පිදූ මීකිරිබත් වළඳා ඩෙබර වෙනෙහි දිවාවිහාර කොට සවස වරුණ යවපල්ලු දුන් අටතණමිට ගෙන කිනිහිරි බෝධිය වෙත පැමිණ සතලිස් රියන් පුළුලැති තණඇතිරි අතුරා පර්යංකය වැළඳ සර්වඥතාඥාන ලැබ උදන් අනා එහි සත්සති ගෙවා තමන් වහන්සේ සමග පැවිදි වූ කෙළලක්ෂයක් භික්ෂූන්ගේ සිවුසස් අවබෝධයට සමර්ථතා දැක අහසින් ගොස් ගයා මිගදායෙහි බැස ධම්සක් දෙසූ සේක. එදින කෙළලක්ෂයක් දෙනාට ප්‍රථම ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

සොපි පත්‍වාන සමෙබාධිං සනතා රෙත්‍වා සදෙවකං
අභිවසසි ධම්මවෙසෙන නිබබාපෙනෙතා සදෙවකං

තසසාපි අතුලතෙජසස අහෙසුං අභිසමයාතයො
කොටි සතසහසසානං පඨමාභිසමයො අහති

එහි සදේවකං යනු: සදේවක ලෝකය. ධම්මමෙසෙන යනු: ධර්මකථා නමැති මේඝ වර්ෂාවෙන්. නැවත හීමරථ නුවර හීමරථ නම් රජු විසින්

ආරාධනා කරන ලදුව නුවරමැද තැනූ සභාගාරයෙහි වැඩහිඳ කරවීක නාදය මෙන් මිහිරි කනට සුව පරමමධුර පණ්ඩිතයන්ගේ සිත්ගන්නා අමා අභිෂෙකයක් බඳු බඹගොසින් දසදිගුන් පුරවමින් දහම් අමා බෙරය ගැසූහ. එදින නවකෙළක් දෙනාට දෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

පුනාපරං භීමරථේ යදා අහනි දුභූහිං
තදා නවුතිකොටීනං දුතියාභිසමයෝ අහූති

යම්කලෙක වෙහාර නගරයෙහි ඥාති සමාගමයෙහි බුද්ධවංස දේශනාව කළ සේක්ද එකල අනූකෙළක් දෙනාට ධර්මඤ්ඤස පහළ විය. එය තෙවන අභිසමයයි. එයින් කියන ලදි-

යදා බුදධෝ ධම්මං දෙසෙසි වෙභාරෙ සෝ පරිසුතතමෝ
තදා නවුති කොටීනං තතියාභිසමයෝ අහූති

සොඳුරු දසුන් ඇති අමර නුවර සමබහුල සුමිතත නම් දෙසොහොවුරෝ රාජ්‍යය කරවූහ. එවිට සිද්ධාර්ථ ශාස්තෘන් වහන්සේ ඒ රජුන්ගේ චේතුසම්පත් දක අහසින් වැඩ අමර නගරය මැද බැස සක්ලකුණින් සැදි පතුලින් පොළව මඩින්නාක් මෙන් පාදචෛත්‍ය දක්වා අමර උයන්හි වැඩ පරමරමණීය වූ තමන්වහන්සේගේ කරුණාවෙන් සිසිල් වූ සිලාතලයෙහි වැඩහුන්හ. එවිට දෙබෑරජවරු භාග්‍යවතුන් වහන්සේගේ පාදචෛත්‍ය දක පියවර අනුව ගොස් සිදුහත් බුදුන් නැමද බුදුන් පිරිවරා හුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අධ්‍යාශයානුරූප දහම් දෙසූහ. ඔවුහු බණ අසා හටගත් ශ්‍රද්ධා ඇතිව පැවිදිව රහත්වූහ. ඒ කෙළ සියයක් රහතුන් මැද භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං තසම්මිපි දිපදුතතමෙ
ඛීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

කොටිසතානං නවුතීනං අසීතියාව කොටිනං
එතෙ ආසුං තයෝ ඨානා විමලානං සමාගමෙති

එහි නවුතීනං අසීතියාපි ච කොටීනං යනු; කෝටි අනූවක් ද කෝටි අසූවක් ද රැස්වූහ යන අර්ථයි. **එතෙ ආසුං තයෝ ඨානා** යනු; මේ

තුන් සන්නිපාතය විය යන අර්ථයි. ඨානාතෙතානි තීනි අහෙසුං කියා ද පාඨයි.

එකල අප බෝසත්හු සූරසේන නගරයෙහි මංගල නම් බමුණුව වේද වේදාංගයන්හි පරතෙරපත්ව නොඑක් කෙළඟණන් ධනසමූහය දීන අනාථයන්ට දන් දී විවේකී වනු කැමතිව තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යාන අභිඥා උපදවා වසන්නාහු සිද්ධාර්ථ නම් භාග්‍යවතුන් වහන්සේ ලොව උපන්හයි අසා උන්වහන්සේ වෙත ගොස් බණ අසා යම් දඹගසකින් මේ දඹදිව ප්‍රකට ද ඒ දඹගස කරා ගොස් එයින් ගෙඩි ගෙනවුත් අනූකෝටියක් භික්ෂු පිරිවර ඇති සිද්ධාර්ථ සර්වඥයන් වහන්සේ සූරසේන විහාරයෙහි වඩා හිඳුවා දඹපලින් සැතැප්වූහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ පල වළඳා මෙයින් සිවුඅනූ කපකින් මතු ගෝතම නම් බුදු වන්නේ යයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන මංගලෝ නාම. තාපසෝ
උගතෙජෝ දුපසහෝ අභිඤ්ඤා බලසමාහිතෝ

ජම්බුතෝ ඵලමානෙත්වා සිද්ධත්ථස්ස අදාසහං
පටිගහෙත්වා සම්බුද්ධෝ ඉදං වචනමබ්‍රවී

පසසථ ඉමං තාපසං ජටිලං උගතාපනං
චතුනවුතෙ ඉතොකපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ-
උතතරිං වතමයිටඨාසිං දසපාරමී පූරියාති

එහි දුපසහෝ යනු; දුරාසදයි. පාඨය මෙය හෝ වෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය වේහාර නම් විය. උදේන නම් රජ පියාණෝය. ජයසේන යනු ද ඔහුටම නම්. මෑණියෝ සුඵස්සා නම්. සම්බල සුමිත්ත දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක රේවත නම්. සීවලා සුරමා දෙනම අගශ්‍රාවිකාවෝය. කිනිහිරිරුක බෝධියයි. ශරීරය හැටරියන් උසය. ආයු වසර ලක්ෂයකි. සෝමනස්ස නම් අගමෙහෙසී වූවාය. පුත්‍රයා අනුපම නම්. රන්සිවිගෙයින් අභිනික්මන් කළහ. එයින් කියන ලදි-

වෙහාරං නාම නගරං උදෙනෝ නාම බතතියෝ
සුඵසසා නාම ජනිකා සිද්ධත්ථස්ස මහෙසිනෝ

සම්බලොච සුමිතෙතා ච අහෙසුං අගගසාවකා
රෙවතො නාමුපටඨාකො සිද්ධත්ථසස මහෙසිනො

සීවලාච සුරාමාච අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතො කණිකාරොති වුච්චති

සොපි බුදෙධා සටඨීරතනං අහොසි නහමුගගතො
කඤ්චන ගසියසංඛාසො දසසහසසී විරොචති

සොපිබුදෙධා අසමසමො අතුලො අපපටිපුගගලො
වසසසතසහසසානි ලොකෙ අටඨාසි චකඛුම

විපුලං පභා දසසයිත්වා පුපඵා පෙත්වාන සාවකෙ
විලාසෙත්වා සමාපත්‍යා නිබ්බුතො සො සසාවකොත

එහි **සටඨීරතනං** යනු; සැට රියනක් පමණ අහසට උස්ව සිටියහ යන අර්ථයි. **කඤ්චනගසියසංකොසො** යනු; නන් රුවනින් විසිතුරු කනකමය ඇඟයක් මෙන් දර්ශන ඇත්තේ යන අර්ථයි. **විපුලං** යනු; මහත් ආලෝකය. **පුපඵාපෙත්වා** යනු; ධ්‍යාන අභිඥා මාර්ගඵල සම්පත් නමැති මලින් පිපුණු පරම සෞභාග්‍යයට පත්වූවන් කොට යන අර්ථයි. **විලාසයිත්වා** යනු; විලාසවත් කොට, ප්‍රබෝධවත් කොට. **සමාපතනියා** යනු; ලෞකික ලෝකෝත්තර සමාපත්තිවලින් ද අභිඥාවලින්. නිබ්බුතො යනු; පිරිනිවනින් නිවුණු. සිද්ධාර්ථ ශාස්තෘන් වහන්සේ ද කඤ්චන වෙළු නගරයෙහි අනෝම උයන්හි පිරිනිවි සේක. එහිම උන් වහන්සේගේ සිවුයොදුන් උස රුවන්මුවා චෛත්‍යය කරවූහ. සෙසු ගාථාවල අරුත් හැමතන්හි ප්‍රකටය.

සිද්ධත්ථ බුදධවංස වර්ණනාව නිමියේය.

සොළොස්වන බුදධවංසය සමාප්තයි.

ඒ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට පසුව එක් කල්පයක් බුදුශූන්‍ය විය. මෙයින් දෙයාතුකපින් මතු තිස්ස, ඵුස්ස යයි එකම කල්පයෙහි බුදුවරු දෙනමක් උපන්හ. එහි තිස්ස නම් මහාපුරුෂයාණෝ පැරුම් පුරා තුසිපුර ඉපිද ඉන් සැව ඛේම නුවර සචචසන්ධ නම් රජුගේ අගමෙහෙසි පියුම් පෙති වන් නුවන් ඇති පදුම නම් දේවිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් අනෝම උයන්හි මවුකුසින් බිහි වූහ. සත්දහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. උන්වහන්සේට ගුහසෙල නාරිය නිසහ නම් තුන්පහයක් විය. සුභද්දා දේවිය ප්‍රමුඛ තෙතිස් දහසක් ස්ත්‍රීහු වූහ. උන්වහන්සේ සතර නිමිති දක සුභද්දා දේවියට පුතු ආනන්ද කුමරු උපන්කල සෝණුත්තර නම් අනුත්තර තුරංගාරූඪව මහබිනික්මන් කොට පැවිදි වූහ. මිනිස්සු කෙළක් උන්වහන්සේ අනුව පැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා අටමසක් ප්‍රධන් වඩා වෙසක් පුන්පොහෝදින වීර නියම්ගම්හි වීර සිටුදියණියන් පිදූ මිකිරිබත් වළඳා සල්ලවනයෙහි දිවාවිහාර කොට සවස් කල විජිතසංගාම යවපාලක දුන් අටතණමට ගෙන පියාබෝධිය වෙත ගොස් සතළිස් රියන් පුළුලැති තණඇතිරි අතුරා පර්යංකය වැළඳ මරබල පරදා සර්වඥතාඥාන ප්‍රතිවේධ කොට උදන් අනා බෝධි සමීපයෙහිම සත්සති ගෙවා හංසවතී නුවර බ්‍රහ්මදේව උදයන යන හේතුසම්පත් ඇති දෙරජකුමරුන් දක අහසින් වැඩ හංසවතී නුවර මිගදායෙහි බැස උයන්පල් ලවා රජකුමරුන් කැඳවා පිරිවර සහිත ඔවුන්ට අවිසාරී ව්‍යාපී මධුර බ්‍රහ්මස්වරයෙන් දසදහස්‍රී ලෝකධාතුවට ද හඟවමින් දම්සක් පැවැත්වූහ. එකල්හි සියකෝටියක් දෙනාට ධර්මාවබෝධ විය. ඒ ප්‍රථමාභිසමයයි. එයින් කියන ලදි-

සිද්ධත්ථස්ස අපරෙන අසමෝ අපපටිපුගගලෝ
අනනතසීලෝ අමිත යසෝ තිසෙසා ලොකගගනායකෝ

තමධෙකාරං විධමිත්වා ඔභාසෙත්වා සදෙවකෙ
අනුකමපකෝ මහාවීරෝ ලොකෙ උපපජජි චකඛුමා

තසසාපි අතුලා ඉදධි අතුලං සීලං සමාධි ච
සබබත්ථ පාරමිං ගන්ත්වා ධමමචකකං පවත්තයි

සෝ බුදෙධා දසසහසසිමහි විඤඤාපෙති ගිරං සුචිං
කොටිසතානි අභිසමිංසු පයමෙධමම දෙසනෝ

එහි **සබබත්‍ථ** යනු; සියලු ධර්මයන්හි පාරයට ගොස්. **දසසහසසිමහ** යනු; දසසහස්‍රියෙහි. ඉක්බිති පසුකලෙක තිසස ශාස්තෘන් වහන්සේ සමග මහණ වූ භික්ෂූන්ගෙන් කෝටියක් මහාපුරුෂයාණන්ගේ ගණවාසය අතහැර බෝමුලට වඩින සමයෙහි වෙනත් තන්හි ගියාහු තිස්ස සම්මා සම්බුදුහු ධම්සක් පැවැත්වූහයි අසා යසවතී මිගදායට පැමිණ දසබලයන් වහන්සේට වැඳ උන්වහන්සේ පිරිවරා හුන්හ. භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේලාට දම් දෙසූහ. එකල අනූකෝටියකට දෙවන ධර්මාවබෝධය විය. නැවත මහාමංගල සමාගමයෙහි මංගල දේශනා කෙළවර හැටකෝටියකට තෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

දුතියෝ නවුතිකොටීනං තතියෝ සටඨීකොටියෝ
බන්ධනාතෝ පමොචෙසි සමපතෙත නරමරුතදාති

එහි **දුතියෝ නවුතිකොටීනං** යනු; දෙවන අභිසමය අනූකෙළක් ප්‍රාණීන්ට විය යන අර්ථයි. **බන්ධනාතෝ** යනු; බන්ධනයෙන්, දස සංයෝජනයෙන් මුදාලූහ යන අර්ථයි. දැන් මුදන ලද සත්වයන් ස්වරූපයෙන් දක්වමින් නරුමරු යි කීය. **නරමරු** යනු; මිනිසුන් දෙවියන්, යසවතී නුවර වනාහි ඇතුළුවස පැවිදිව රහත් වූ ලක්ෂයක් පිරිවර ඒ ප්‍රථම සන්නිපාතය විය. මවුපිය දෙපසින් සුජාත වූ සුජාතා නම් රජුගේ නාරිවාහන නම් කුමරු භාග්‍යවතුන් වහන්සේ නාරිවාහන නුවරට වැඩිකල්හි සපිරිවරින් පෙරගමන්කොට බික්සඟන සහිත දසබලයන් වහන්සේට ආරාධනාකොට සතියක් අසදෘශ දන් පූදා සිය රාජ්‍යය පුතුට පවරා සපිරිවරින් සකල ලෝකාධිපති තිසස භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහිභික්ෂු පැවිද්දෙන් පැවිදි විය. එතුමාගේ එම පැවිද්ද සියලු දිසාවන්හි ප්‍රකට විය. එහෙයින් ඒ ඒ දිසාවෙන් අවුත් මහජනයා නාරිවාහන කුමරු අනුව මහණ වූහ. එකල ගථාගතයන් වහන්සේ අනූලක්ෂයක් භික්ෂූන් මැද පාමොක් දෙසූහ. එය දෙවන සන්නිපාතයයි. නැවත ඛේමවතී නුවර ඤාතිසමාගමයෙහි බුද්ධවංස ධර්මකථාව අසා අසූලක්ෂයක් උන්වහන්සේ වෙත පැවිදිව රහත්වූහ. උන්වහන්සේලා පිරිවරා සුගතයන් වහන්සේ පාමොක් උදෙසූහ. එය තෙවන සනනිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආසුං තිසෙස ලොකගගනායකෙ
ඛීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

බීණාසවසතසහසසානං පඨමෝ ආසි සමාගමෝ
නවුතිසතසහසසානං දුතියෝ ආසි සමාගමෝ

අසීතිසතසහසසානං තතියෝ ආසි සමාගමෝ
බීණාසවානං විමලානං පුපඵිතානං විමුතතියාති

එකල බෝසතාණෝ යසවතී නම් නුවර සුජාත නම් රජව නොඑක් කෙළ ගණන් ධනරාශියෙන් අනුරාගයට පත් සමෘද්ධිමත් වූ යසවතී නම් ජනපදය දිරාපත් පරඬැලක් සේ අතහැර ජාති ආදියෙහි කලකිරි සිතින් නික්ම තවුස් පැවිද්දෙන් පැවිදිව මහත් ඍද්ධි මහත් ආනුභාව ඇතිව බුදුන් ලොව උපන් බව අසා පස්වනක් ප්‍රීතියෙන් පිනාගිය සිරුරු ඇත්තේ පහවූ ඊර්ෂ්‍යා ඇති තිසස භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ මෙසේ සිතූහ. මම දැන් මදාරා පරසතු ඈ දිවකුසුමින් බුදුන් පුදමියි කියායි. ඉක්බිති මෙසේ සිතා ඍද්ධියෙන් ස්වර්ගලෝකයට ගොස් චිත්‍රලතා වනයට පිවිස පියුම් පරසතු මදාරාදි දිවකුසුමින් රුවන්මුවා ගවුවක් පමණැති කරඬුවක් පුරාගෙන අහසින් අවුත් දිවකුසුමින් භාග්‍යවතුන් වහන්සේ පිදූහ. එක් මිණිදඬු ඇති රන්මුවා කෙමි ඇති පියුම්රාමිණිමුවා කොළ ඇති සුවඳ කෙසුරු ඇති කුඩයක් බඳු පද්ම ඡත්‍රයක් භාග්‍යවතුන් වහන්සේගේ සිරසට දරමින් සිවුපිරිස් මැද සිටියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙයින් දෙයානූවන කපින් මතු ගෝතම නම් බුදුවන්නේ යයි උන්වහන්සේට ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන සුජාතෝ නාම ඛතතියෝ
මහාභොගං ජඩඩයිතවා පබබජිං ඉසිපබබජං

මයි පබබජිතෙ සනෙත උපපජජි ලොකනායකෝ
බුදෙධානි සදදං සුතවාන පීති මෙ උපපජජථ

දිබබං මනදාරවං පුපඵං පදුමං පාරිචඡතතකං
උභෝ හතථෙ පගගයහ ඨිතමානෝ උපාගමිං

චාතුවණණ පරිවුතං තිසසං ලොකගගනායකං
තමහං පුපඵං භෙතවාන මතථකෙ ධාරයිං අහං

සොපි මං තදා වාහාසි ජනමජෙඣ නිසීදිය
දෙවනවුතෙ ඉතොකපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ- හෙසසාමි සම්මුඛං ඉමං

තසසාපි වචනං සුත්වා භීයෝ චිත්තං පසාදයිං
උත්තරිං චතමධිට්ඨාසිං දසපාරමිපූරියාති

එහි මයි **පබබජිතෙ** යනු; මා පැවිදිබවට පත්කල්හි. **මම පබබජිතං** සනතං කියා ද පොත්වල ලියති. එය ප්‍රමාද ලේඛයකැයි දතයුතුය. **උපජජථ** යනු; උපන්නේය. **උභො හතෙථහි** යනු දෙඅතින්. **පගගයහ** යනු; ගෙන. **ධුනමා නො** යනු; වැහැරි සලමින්. **චාතුවණණා පරිවුතං** යනු; සිවුපිරිස පිරිවරන ලද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති ශ්‍රමණයන් පිරිවරන ලද යන අර්ථයි. **චතුවණණෙහි පරිවුතං** කියාත් සමහරු කියති. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය ඛෙම නම් විය. ජනසන්ධ නම් ක්ෂත්‍රිය පියාණෝය. මෑණියෝ පදුමා නමි. බ්‍රහ්මදේව උදය දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක සමහ නමි. ථුස්සා සුදත්තා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. පියා ගස බෝධියයි. සිරුර සැටරියන් උසය. ආයු වර්ෂ ලක්ෂයකි. උත්වහන්සේගේ අගමෙහෙසිය සුභද්දා නමි. පුත්‍රයා ආනන්ද නමි. අස් යානයෙන් අභිනික්මන් කළහ. එයින් කියන ලදි-

ඛෙමකං නාම නගරං ජනසන්ධො නාම ඛත්තියො
පදුමා නාම ජනිකා තිසසසසව මහෙසිනො

බ්‍රහ්මදෙවො ච උදයො ච අහෙසුං අගගසාවකා
සමහො නාමපටඨාකො තිසසසස ච මහෙසිනො

ථුසසා චෙව සුදත්තා ච අහෙසුං අගගසාවිකා
බොධිතසස භගවතො අසන රුක්ඛොති වුච්චති

සො බුදධො සට්ඨිරතනො අහු උච්චත්තනතො ජිනො
අනුපමො අසදිසො හිමවා විය දිසසති

තසසාපි අතුලාතෙජසස ආයු ආසි අනුත්තරො
වසසසතසහසසානි ලොකෙ අට්ඨාසි චක්ඛුමා

උත්තමං පවරං සෙට්ඨං අනුභොත්වා මහායසං
ජලිත්වා අග්ගික්ඛන්ධොව නිබ්බුතො සො සසාවකො

වලාහකොම අනිලෙන සුරියෙන විය උසසාබො
අන්ධකාරොව දීපෙන නිබ්බුතො සො සසාවකොති

එහි උවචතනෙන යනු; උස්බැවින් හිමවාදිය දිසසති යනු; හිමවත් පර්වතය මෙන් දක්නා ලැබේ. හිමවාව පදිසසති යනුම හෝ පාඨයි. යම් සේ යොදුන් සියයක් උස හිමාලය පර්වතය ඈත සිටියවුන්ට ද උස් බැවින් ද සෞම්‍ය බැවින් ද අතිරමණීයව දක්නා ලැබේද එමෙන් භාග්‍යවතුන් වහන්සේ ද දක්නා ලැබේ යන අර්ථයි. අනුනතරෝ යනු; අතිදීර්ඝ නුවූයේ ද අතිහ්‍රස්ව නුවූයේ ද වෙයි. ආයු වර්ෂ ලක්‍ෂයකි යන අර්ථයි. උතතමං පවරං සෙටඨං යනු; අන්‍යොන්‍ය පර්යාය වචනයි. උසසාවෝ යනු; හිමබින්දු යි; වලාකුළු හිමබිඳු අන්ධකාර සුළං සූර්ය ප්‍රදීපයෙන් මෙන් ශ්‍රාවකයන් සහිත ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක යන අර්ථයි. තිසස භාග්‍යවතුන් වහන්සේ සුනන්දවතී නුවර සුනන්දාරාමයෙහි පිරිනිවි සේක. මෙහි ගාථාවල සෙස්ස පැහැදිලිමය.

තිසස බුදධවංස වර්ණනාව නිමියේය.

සතළොස්වන බුදධවංසය සමාප්තයි.

උන්වහන්සේට පසුව අනුක්‍රමයෙන් හානියට පත්ව නැවත වැඩී අපරිමිත ආයු ඇත්තෝව ක්‍රමයෙන් පිරිහී අනූදහසක් අවුරුදු ආයු වූ කල්හි එම කපම ඵුස්ස නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූහ. උන්වහන්සේ පැරැමි පුරා තුසිපුර ඉපිද ඉන් චුතව කසිනුවර ජයසේන රජුගේ අගමෙහෙසි සිරිමා දේවිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් සිරිමා උයන්හි මවුකුසින් බිහිවූහ. උන්වහන්සේ සඳහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. උන්වහන්සේට ගරුළපකඛ හංස සුවණ්ණ හාරා නම් තුන් පහයක් විය. කිසාගෝතමී ප්‍රමුඛ තිස්දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක කිසාගෝතමිය අනුපම නම් පුතු වැදූ කල්හි සරසන ලද ඇත්කඳ මත නැගී මහබිනික්මන් නික්ම පැවිදිවූහ. කෙළක් දෙන උන්වහන්සේ අනුව පැවිදි වූහ. උන්වහන්සේලා පිරිවරා සමසක් ප්‍රධන් වඩා ඉක්බිති ගණයා කෙරෙන් වෙන්ව එකලාව එකචර්යාව වඩමින් සතියක් වැස වෙසක් පුන්පොහෝ දින එක්තරා නුවරක එක්තරා සිටුවරයකුගේ සිරිවඩ්ඩා නම් දියණියක පිදූ මීකිරිබත් වළඳා ඇටිටේරිය වනයෙහි දිවාවිහාර ගෙවා සවස් වේලෙහි සිරිවඩ්ඩ නම් තාපසයන් දුන් අටතණමිට ගෙන නෙල්ලිබෝධිය වෙත පැමිණ අටතිස් රියන් තණඇතිරි අතුරා බුදුබවට පත්ව උදන් අනා සත්සති ගෙවා තමන්වහන්සේ සමග මහණ වූ කෙළක් භික්ෂූන්ගේ ධර්මාවබෝධයට සමත්බැව් දන අහසින් අවුත් සංකස්ස නුවර ඉසිපතන මිගදායෙහි බැස උන්වහන්සේලා මැද දම්සක් පැවැත්වූහ. එදා කෙළලක්ෂයක් දෙනාට ප්‍රථම ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

තත්‍රෝව මණ්ඩකපපමහි අහු සත්ථා අනුත්තරෝ
අනුපමෝ අසදිසෝ ඵුසෙසා ලොකගගනායකෝ

සොපි සබ්බං තමං හනත්වා විජටෙත්වා මහාජටං
සදේවකං තපපයනෙතා අභිවසසි අමතමබුනා

ධම්මවකකං පවතෙතනෙත ඵුසෙස නකඛතතමංගලෙ
කොටිසතසහසසානං පඨමාභිසමයෝ අහූති

එහි තත්‍රෝව මණ්ඩපපමහි යනු; යම්කපක බුදුවරු දෙනමක් උපදිත්ද ඒ කප මණ්ඩකප්පයයි යට කියන ලද්දේමය. විජටෙත්වා යනු; විසඳා. මහජටං යනු; මෙහි ජටා යනු මෙය තෘෂ්ණාවට නාමයකි. එය රූපාදි අරමුණුවල උඩු යටි වශයෙන් නැවත නැවත උපදින බැවින් ගෙතෙන

අර්ථයෙන් නූල් පන්දුවක් දැල්පූපයක් බඳු අවුල් ජාලයක් මෙනැයි ජටා යි කියන ලදි. එය මහාජටාවයි. **සදේවකං** යනු; දෙවියන් සහිත ලෝකයයි. **අභිවසසි** යනු; වැස්සවිය. **අමතමබුනා** යනු; අමෘත සංඛ්‍යාත ධර්මකථා ජලයෙන් සත්වයින් වැස්සවීය යන අර්ථයි. යම් කලෙක්හි බරණැස් නුවර සිරිවඩ්ඪ නමැත්තේ මහසම්පත් අතහැර තවුස් පැවිද්දෙන් පැවිදි වූයේද ඔහු සමග පැවිදි වූ තාපසයෝ අනූලක්ෂයක් වූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට දම් දෙසූහ. එකල අනූ ලක්ෂයකට දෙවන ධර්මාභිසමය විය. යම්දාක සිය පුත් අනුපම කුමරුට දහම් දෙසූසේක් ද එකල අසූ ලක්ෂයකට තෙවන ධර්මාභිසමය විය. එයින් කියන ලදි-

නවුති සතසහසසානං දුතියාභිසමයො අහු
අසිතිසතසහසසානං තතියාභිසමයො අහුනි

එයින් මෑත භාගයෙහි කණ්ණකුජ්ජ නගරයෙහි සුරකඛිත රාජපුත්‍රයාද පුරෝහිත පුත්‍ර ධම්මසේන කුමාරයා ද ඵුස්ස සම්මා සම්බුදුන් තමන්ගේ නුවරට පැමිණි කල්හි හැටලක්ෂයක් පුරුෂයන් සමග පෙරගමන් කොට වැඳ ආරාධනාකොට සතියක් මහදන් දී දසබලයන් වහන්සේගේ දහම්කතා අසා රහත් වූහ. ඒ සැටලක්ෂයක් භික්ෂූන් මැද භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය ප්‍රථම සමාගමය විය. නැවත කාසි නගරයෙහි ජයසේන රජුගේ සැටක් පමණ නෑ සමාගමයෙහි බුද්ධවංසය දෙසූහ. එයසා පනස් ලක්ෂයක් දෙනා එහිහික්බු පැවිද්දෙන් පැවිදිව රහත් වූහ. උන්වහන්සේලා මැදට වන් භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය දෙවන සමාගමය විය. නැවත මහාමංගල සමාගමයෙහි මංගලකථා අසා සතලිස් ලක්ෂයක් මහණව රහත්වූහ. උන්වහන්සේලා මැදට වන් සුගතයන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන සමාගමය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයො ආසුං ඵුසසසසපි මහෙසිනො
ඛීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

සටඨිසතසහසසානං පඨමො ආසි සමාගමො
පඤඤස සතසහසසානං දුතියො ආසි සමාගමො

චතතාරිසතසහසසානං තතියො ආසි සමාගමො
අනුපාදා විමුතතානං මොචඡනතපටිසන්ධිනංනි

එකල බෝසතාණෝ අරිමඳ තුවර විජිතාවී නම් රජව උන්වහන්සේගේ බණ අසා පැහැද උන්වහන්සේට මහදන් පූදා මහාරාජ්‍යය අතහැර භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදිවා තුන්පිටකය ඉගෙන ත්‍රිපිටකධාරීව මහජනයාට ධර්මදේශනා කළහ. සීල පාරමිතාව ද පිරූහ. ඒ බුදුරජාණෝ ද උන්වහන්සේට බුදුවන්නේ යයි ප්‍රකාශ කළහ. එයින් කියන ලදි.

අහං තෙන සමයෙන විජිතාවී නාම ඛත්තියෝ
ඡඩ්ඩයිත්වා මහාරජ්ජං පබ්බජිං තසස සන්තිකෙ

සොපිබුදෙධා වියාකාසි ඵුසෙසා ලොකගගනායකෙ
ඉතො දවානවුතෙ කපෙප අයං බුදෙධා භවිසසති

පධානං පදහිත්වාන -පෙ- දසපාරමිපූරියා
සුතතනතං විනයඤ්ඤවාපි නවංගං සත්ථුසාසනං
සබබං පරියාපුණිත්වාන සොහයිං ජිනසාසනං

තත්‍ථපපමතෙතා විහරනෙතා බ්‍රහමං භාවෙත්ව භාවනං
අභිඤ්ඤාසු පාරමිං ගනත්වා බ්‍රහමලොකම ගඤ්ඡහනති

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය කාසි නම් විය. ජයසේන නම් රජ පියාණෝය. මව සිරිමා නම්. සුරකඛිත ධම්මසේන දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක සභිය නම්. සාලා උපසාලා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. නෙල්ලිගස බෝධියයි. ශරීරය අටපනස් රියන් උස් විය. ආයුෂ අවුරුදු අනූ දහසකි. අගමෙහෙසිය කිසාගෝතමී නම්. උන්වහන්සේගේ පුත්‍රයා අනූපම නම්. ඇත්යානයෙන් අභිනික්මන් කළහ. එයින් කියන ලදි-

කාසිකං නාම නගරං ජයසේනො නාම ඛත්තියෝ
සිරිමා නාම ජනිකා ඵුසසසසව මහෙසිනො -පෙ-

බොධිතසස භගවතො ආමණෙඩාති පවුවචති
අටඨපඤ්ඤාසරතනං සොපි අවවුගගතො මුනි

සොහති සතරංසීව උළුරාජාව පූජිතෝ
නවුති වසසසහසසානි ආයු විජජති තාවදෙ

තාවතා තිටඨමානෝ සො තාරෙසි ජනකංබහුං
ඔවදිතවා බහූසකෙක සනතාරෙතවා බහූ ජනෙ
සො සතථා අතුලයසො නිබබුතොව සසාවකොති

එහි ආමණෙඩා යනු; නෙල්ලි ගසයි. ඔවදිතවා යනු; අවවාද දී, අනුශාසහා කොට යන අර්ථයි. සොපි සතථා අතුලයසො යනු; ඒ ශාස්තෘන් වහන්සේ ද අපමණ යසස් ඇත්තාහු යන අර්ථයි. සො ජහිතවා අමිතයසො කියා ද පාඨයි. එහි උන්වහන්සේ සියලු උක්තප්‍රකාර විශේෂ අතහැර යන අර්ථයි. ඵුස්ස භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙහි සේතාරාමයෙහි පිරිනිවි සේක. උන්වහන්සේගේ ධාතු විසුරුණෝ විය. හැමතන්හි සෙසු ගාථාවල අරුත් පැහැදිලිමය.

ඵුසස බුදධවංස වර්ණනාව නිමියේය.

අටළොස්වන බුදධවංසය සමාප්තය.

ඵුසස බුදුරජාණන් වහන්සේගෙන් පසුකල අන්තරකල්ප සහිත ඒ කල්පය ගතවූ කල්හි මෙයින් ඒකානූවන කප සියලු විකල්ප දත් පරහිත නිරත සංකල්ප ඇති සර්වාර්ථයන් විශේෂයෙන් දක්නා විපස්සී නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූහ. උන්වහන්සේ පැරැම්පුරා නන්රුවන් කාන්ති සමූහයෙන් දීප්තිමත් කරන ලද භවනයන් ඇති තුසිත භවනයෙහි ඉපිද ඉන් සැව බන්ධුමතී නම් අගමෙහෙසි කුස පිළිසිඳ ගත්හ. උන්වහන්සේ දසමස් ඇවෑමෙන් ඛේම මිගදායෙහි මේ වලාරොදින් පුන්සඳ සේ මවුකුසින් බිහිවූහ. උන්වහන්සේට නම්තබන දින ලක්ෂණ පාඨකයෝ ද නැයෝ ද දිවා රෑ අතරතුර මොහොතකුදු අන්ධකාරයක් නොමැතිව පිරිසිදුව දක්නේය. විවෘත ඇසින් දක්නේයයි විපස්සී කියා නම් කළහ. විමස විමසා දක්නේ යයි විපස්සී නමැයිද කියති. උන්වහන්සේ අටවස් දහසක් ගිහිගෙයි විසූහ. නන්ද සුනන්ද සිරිමා නම් තුන්පහයක් විය. සුදස්සනා දේවිය ප්රමුඛ එක්ලක්ෂ විසිදහසක් ස්ත්රීහු වූහ. සුතනු ය නු ද සුදස්සනා යි කියනු ලැබේ. උන්වහන්සේ අටවස දහසක් ඉක්මීමෙන් සතර නිමිති දක සුතනු දේවියට සමවතතකබන්ධ නම් පුතු උපන් කල්හි ආජඤ්ඤ රථයෙන් මහබිනික්මන් නික්ම පැවිදි වූහ. උන්වහන්සේ අනූව අසූහාර දහසක් පුරුෂයෝ මහණ වූහ. ඒ මහාපුරුෂයාණෝ ඔවුන් පිරිවරා අටමසක් ප්රධන් වඩා වෙසක් පුන්පොහෝදින සුදසසන සිටුදියණිය දුන් මීකිරිබත් වළඳා කුසුමින් සමලංකෘත සාලවනයෙහි දිවාවිහාර ගෙවා සුජාත නම් යවපාලක දුන් අටතණමිට ගෙන සමලංකෘත පළොල් බෝධිය දක දකුණු දිගින් බෝධිය කරා ගියහ. ඒ පළොල් බෝධියෙහි සමවටකඳ ඇත්තේය. එදින පනස් රියන්ව උඩ නැගුණේය. ශාඛාව පනස් රියන්ය. උසින් රියන් සියයක් විය. එදිනම ඒ පළොල් රුක කර්නිකබද්ධ වූවාක් මෙන් සුවඳමලින් මුල පටන් හැමලෙසින් ගැවසී ගත්තේය. දිවසුවඳ හමයි. එකල්හි මේ රුක පමණක් නොවීය. දසදහසක් සක්වළ අභ්යන්තරයෙහි ධජමාලායෙන් ආකුල විය. ඒ ඒ තැන මාලාගුළ විසිරී නන් සුවඳ කුසුමින් විසිරී පොළෝතලය සුවඳ දුමින් අඳුරු විය. එම රුක වෙත එළඹ තෙපනස් රියන් පුළුදෙනි තණ ඇතිරි අතුරා සතරතින් යුත් වෙර ඉටා බුදුබව ලබනතුරු නොනැගිටිමි යන ප්රතිඥා කොට වැඩහුන්හ. එසේ වැඩහිඳ මරු සහිත මරබල නසා මාර්ග පිළිවෙලින් සතරමාර්ග ඥාන ද මාර්ගයට අනතුරුව සතර ඵලඥාන ද සිවුපිළිසිඹියා චතුයොනි පරිවෙඡදක ඤාණය පංචගති පරිවෙඡදක ඤාණ චතුවෙසාරජ්ජ ඤාණ ෂඩ් අසාධාරණ ද සියලුම බුදුගුණ ද අත්පත් කොට පිරුණු සංකල්ප ඇත්තාහු බෝපලඟෙහිම වැඩහිඳ

නොඑක් ජාතිවල සැරිසැරීම් -පෙ- තෘෂ්ණාක්ෂය
සාක්ෂාත් කළෙමි. යගුළියෙහි පහරන ලද දිලෙන ගින්න
අනුපිළිවෙලින් නිවීමට පත්කල්හි ගතිය නොදත හැක්කාක් මෙන්
මනාව මිදුණු කාමබන්ධන ඕසයන් තරණය කළ අචල සුවයට
පත්වූවන් ගේ ප්‍රඥාහේතු ගති නොදත හැක්කේ යයි මෙසේ උදන්
අනා බෝ සමීපයෙහිම සත්සති ගෙවා බඹඇරයුම පිළිගෙන සිය සුළුමැණි
පුත් බණ්ඩ කුමරුගේ ද පුරෝහිත පුත් තිස්ස කුමරුගේ ද හේතුසම්පත්
දක අහසින් වැඩ බෙම මිගදායෙහි බැස උයන්පාලක ලවා ඒ දෙදෙන
කැඳවා පිරිවර සහිත ඔවුන් මැද දම්සක් පැවැත්වූහ. එකල අපමණ
දෙවිමිනිසුන් ධර්මාවබෝධ විය. එයින් කියන ලදි-

ඵුසසසස ච අපරෙන සම්බුදෙධා දිපදුත්තමෝ
විපසසී නාම නාමෙන ලොකෙ උපපජජි චකඛුමා

අවිජජං සබබං පදාලෙත්වා පතෙතා සමෙබාධිමුත්තමං
ධම්මවකකං පවතෙතතුං පකකාමි බන්ධුමතිංපුරං

ධම්මවකකං පවතෙතත්වා උහො බොධෙසි නායකෝ
ගණනාය න වත්තබෙබා පඨමාභිසමයෝ අහූති

එහි පදාළෙත්වා යනු; බිඳ. අවිදු අඳුර බිඳ යන අර්ථයි. **වතෙතත්වා** චකකමාරාමෙ **කියා** ද පාඨයි. එහි **ආරාමෙ** යනු බෙම මිගදායෙහි යන අර්ථයි. **උභො භොධෙසි** යනු; තමන් වහන්සේගේ කනිටු සොහොයුරු බණ්ඩ කුමරුට ද තිස්ස පුරෝහිත පුත්‍රයාට ද යන දෙදෙනාට අවබෝධ කරවූහ. **ගණනාය න වත්තබෙබා** යනු; අවබෝධ දෙවියන්ගේ වශයෙන් ගණන් **සීමාවක්** නැත යන අර්ථයි. ඉන්පසු කල බණ්ඩ රාජපුත්‍රයා සහ තිස්ස පුරෝහිත පුත්‍රයා ද අනුව පැවිදි වූ සුවාසූ දහසකට දහම් අමා පෙවූහ. එය දෙවන ධර්මාභිසමයයි. එයින් කියන ලදි-

පුනාපරං අමිතයසෝ තතිය සචචං පකාසයි
චතුරාසීතිසහසසානං දුතියාභිසමයෝ අහූති

එහි තතිය යනු; බෙම මිගදායෙහි යන අර්ථයි. සුවාසූ දහසක් බුදුන් අනුව පැවිදිවූහ යනු මෙහි මේ සුවාසූ දහසක් පුරුෂයෝ වනාහි විපස්සී කුමරුගේ උපස්ථායකයෝමය. ඔවුහු උදෑසනම විපස්සී කුමරුට උවටැන්

පිණිස ගොස් කුමරු නොදැක උදය අහරට ගොස් උදය අහර නිමවා පැමිණියාහු කුමාරයා කොහිදැයි විමසා උයන්බිමට ගියේ යයි අසා එහිදී ඔහු හමුවෙමුයි ගියාහු ආපසු එන එතුමාගේ රියදුරු දැක කුමරා පැවිදිවී යයි ඔහුගෙන් අසා ඇසූ තැනම සියලු අබරණ මුදා කඩපිලෙන් කසාවත් ගෙන්වා ගෙන කෙස් රැවුළු කපා මහණවූහ. පැවිදිව ඔවුහු ගොස් මහාපුරුෂයාණන් පිරිවැරූහ. විපස්සී බෝසතාණෝ ප්‍රධන්හි හැසිරෙන්නාහු ආකීර්ණව වසමි. මෙය නම් මට නොගැළපෙයි. මොවුහු ගිහිව මා පිරිවරා හැසිරුණු පරිද්දෙන් දැනුදු මා පිරිවරා හැසිරෙති. මේ සමූහයෙන් නම් කිමිදැයි ගණසංගනිතාවෙහි උකටලීව අදම යමියි සිතා නැවත අද අවේලාවය. අද මා ගියොත් මේ සියල්ලෝම දැනගනිති. හෙට යමියි සිතූහ. එදිනද උරුවෙලා ගම වැනි එක්ගමක ගම්වැස්සෝ සෙටදිනට පිරිස් සමග මහාපුරුෂයාණන්ට ආරාධනා කළහ. ඔවුහු ඒ සුවාසූදහසටද මහාපුරුෂයාණන්ට ද කිරිබත්ම පිළියෙල කළහ. ඉක්බිති විපස්සී මහපුරිස්හු දෙවන දින වෙසක් පුන්පොහෝ දින එගම ඒ පැවිදි ජනයා සමග බත්කිස කොට වසන තැනටම ගියහ. එහිදී ඒ පැවිද්දෝ මහසතුන්ට වත් දක්වා තම තමන්ගේ රාත්‍රිස්ථාන දිවාස්ථානවලට ගියහ. බෝසතාණෝ ද පන්සලට වැද හුන්නාහු මෙසේ සිතූහ. මේ නික්මීමට වේලාවයි. නික්ම පන්සල් දොර වසා බෝමැඩ බලා ගියහ. ඒ පැවිද්දෝ සවස බෝසතුන්ට උවටැන් සඳහා පැමිණ පන්සල පිරිවරා සිටියාහු බොහෝ වේලා ගතවිය. සොයාබලවි කියා පන්සල විවෘත කොට උන්වහන්සේ නොදැක කොහේනම් ගියාහුදැයි ලුහුබැඳීම් නොකළහ. ගණවාසයෙහි කලකිරී තනිව විසීමට සිතුවනැයි බුදුවූ පසුව උන්වහන්සේ දකිමුයි දඹදිව තුළම චාරිකාවට පිටත්වූහ. ඉක්බිති ඔවුහු විපස්සී මහසත්හු බුදුව දම්සක් පැවැත්වූහයි අසා ඒ සියලු පැවිද්දෝ අනුක්‍රමයෙන් බන්ධුමති රාජධානියෙහි ඛේම මිගදායට රැස්වූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට දම් දෙසූහ. එකල්හි සුවාසූදහසක් භික්ෂූන්ට ධර්මාවබෝධ විය. එය තෙවන අභිසමය වූයේය. එයින් කියන ලදි-

චතුරාසීතිසහසසානි සම්බුදධං අනුපබබජුං
තෙසමාරාමපපතතානං ධමමං දෙසෙසි චකඛුමා

සබබාකාරෙන භාසතො සුත්වා උපනසාදිනො
තෙපිධමමවරං ගනත්වා තතියාභිසම යො අහූනි

එහි **චතුරාසීතිසහසසානි සම්බුදධං අනුපබබජුං** යනු: අනු ශබ්දයෙන් සම්බුද්ධං කියා කර්ම විභක්තිය යොදන ලදැයි දතයුතුයි. සම්බුද්ධයන්

වහන්සේට පසුව පැවිදි වූහ යන අර්ථයි. ලක්ෂණ ශබ්දශාස්ත්‍රයෙන් ගතයුතුය. එහි ආරාම පතතානං කියා ද පාඨයි. භාසතො යනු; කියන්නහුගේ. උපනිසාදිනො යනු; ගොස් සසඳා බලා ධර්ම දානය දෙන්නහුගේ යන අර්ථයි. තෙපි යනු; විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වූ සුවාසූ දහසක් පමණ ඒ පැවිද්දෝ ගනත්වා යනු; උන්වහන්සේගේ ධර්මය දැන, මෙසේ උන්වහන්සේලාට තෙවන ධර්මාභිසමය විය. බෙම මිගදායෙහි විපස්සී සම්මා සම්බුදුරදුන් ද දැඟසව්වන් ද අනුව පැවිදි වූ අටසැට ලක්‍ෂයක් භික්ෂූන් මැද වැඩහුන් විපස්සී භාග්‍යවතුන් වහන්සේ-

ඉවසීම නම් ක්‍ෂාන්තිය උතුම් තපසයි. බුදුවරු නිවන උතුම් බව පවසති. පැවිද්දා අනුන් නොපෙළයි. අනුන් නොවෙහෙසන්නා ශ්‍රමණ නම් වෙයි.
සියලු පව් නොකිරීම කුසල් රැස්කිරීම සිය සිත පිවිතුරු කිරීම යන මෙය බුද්ධානුශාසනයයි.
උපවාද නොකිරීම, හිංසා නොකිරීම, ප්‍රාතිමොක්‍ෂ සංවරය, අහරෙහි පමණ දැනීම ප්‍රාන්ත සෙනසුන්හි ඇලීම, සමවත්හි යෙදීම යන මෙය බුද්ධානුශාසනයයි.

මේ පාමොක් දෙසූහ. මේ වනාහි සියලු බුදුවරයන් වහන්සේලාගේ පාමොක් දෙසීමේ ගාථායි බව දතයුතුය. එය ප්‍රථම සන්නිපාතය විය. නැවත යමක ප්‍රාතිහාර්යය දක පැවිදි වූ ලක්‍ෂයක් භික්ෂූන්ගේ සන්නිපාතය විය. යම්කලෙක විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සුළුමෑණි පුතුන් වූ තුන්බෑයෝ ප්‍රත්‍යන්තය සන්සිඳුවා බුදෙධාපස්ථානයට වර ලැබ සිය නුවරට වැඩමවා උවටැන් කරන්නාහු උන්වහන්සේගේ බණ අසා මහණ වූවාහුද ඔවුන් අසූ දහසක් මැද වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ බෙම මිගදායෙහි දී පාමොක් දෙසූහ. එය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයො ආසුං විපසසිසස මහෙසිනො
ඛීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

අටයසටඨිසතසහසසානං පඨමො ආසි සමාගමො
භිකඛුසත සහසසානං දුතියො ආසි සමාගමො

අසීති භිකඛුසහසසානං තතියො ආසි සමාගමො
තසථ භිකඛුගණමජෙඣ සම්බුදෙධා අතිරොචතිති

එහි අටඨසටයී භික්ඛු සතසහසසානං යනු; අටසැට දහසක් අධික ලක්ෂයක් භික්ෂූන්ගේ යන අර්ථයි. **තත්‍ථ** යනු; එහි බෙම මිගදායෙහි. **භික්ඛුගණමජෙඣ** යනු; භික්ෂුගණයා මැද. **තසස භික්ඛුගණමජෙඣ** කියාත් පාඨයි. ඒ භික්ෂුගනයා මැද යන අර්ථයි.

එකල අප මහ බෝසත්හු මහර්ධිමත් මහානුභාව ඇති අතුල නම් නාරජව නොඑක් කෙළගණන් නාපිරිවර ඇත්තේ පිරිවර සහිත අසම සිල්බල ඇති කරුණාවෙන් සිහිල් සිත් ඇති දසබලයන් වහන්සේට සත්කාර කරනු වස් සඳමඬල වන් රුවන්මුවා දර්ශනීය සාරමණ්ඩයක් වූ මණ්ඩපයක් කරවා එහි වඩාහිඳුවා සතියක් දෙව්සැපතට අනුරූප මහදන් පුදා සත්රුවනින් සැරසූ මාහැඟි රන්මුවා නන් මිණිරස්දහරින් බබළන පුටුවක් භාග්‍යවතුන් වහන්සේට පිදීය. එකල්හි ඔහුට පියඳානානුමෝදනා වශයෙන් මෙතෙම මෙයින් එකානූවන කප්හි බුදුවන්නේ යයි ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන නාගරාජා මහිද්ධිකො
අතුලො නාම නාමෙන පුඤ්ඤවනෙතා ජුතින්ධරො

නෙකානං නාගකොටීනං පරිවාරෙත්වා නහං තදා
වජෙජනෙතා දිබ්බතූරියෙහි ලොකජෙට්ඨං උපාගමිං

උපසංකමිත්වා සම්බුද්ධං විපසසංලොකනායකං
මණිමුතතරතන ඛචිතං සබ්බාභරණභූසිතං

නිමනෙතත්වා ධම්මරාජසස සොණුණ්හීයමදාසහං
සොපි මං බුදෙධා ව්‍යාකාසි සංසමජෙඣ නිසීදිය

එකනවුතෙ ඉතො කපෙප අයං බුදෙධා භවිසසති
අහූ කපිලවහයෙ රමෙම නිකබමිත්වා තථාගතො

පධානං පදහිත්වාන කත්වා දුකකරකාරිකං
නෙරඤජරානදීතීරෙ පායාසං අසිති ජිනො

පටියතතවරමගෙගන බොධිමූලං උපෙහිති
තතො පදකකිණං කත්වා බොධිමණ්ඩං අනුතතරං
අසසත්ථමූලෙ සමෙබාධිං බුජ්ඣිසසති මහායසො

ඉමසස ජනිකා මාතා මායා නාම භවිසසති
පිතා සුදෙධාදනො නාම අයං හෙසසති ගොත මො

අනාසවා විතරාගා සනතචිතතා සමාහිතා
කොලිතො උපතිසෙසාච අගගා හෙසසනති සාවකා

ආනනෙදා නාම නාමෙන උපටඨිසසති තං ජිනං
බෙමා උපපලවණණා ච අගගා හෙසසනති සාවිකා

අනාසවා විතරාගා සනත චිතතා සමාහිතා
බොධි තසස භගවතො අසසතථොති පවුචචති

තසසාහං වචනං සුතවා භියො චිතතං පසාදයිං
උතතරිං වත මධිටඨාසිං දසපාරමිපූරියා‍නි

එහි **පුඤඤවනෙතා** යනු; පින් ඇත්තේ. රැස්කරන ලද පුණ්‍යසම්භාර ඇත්තේ යන අර්ථයි. **ජුතිඣරො** යනු; ප්‍රභායුක්ත වූයේ. **නෙකානං නාගකොටීනං** යනු; නොඑක් කෝළඟණන් නාගයන් කරණාර්ථයෙහි සම්බන්ධ වචනයි දත යුතුය. **පරිවාරෙසවාන** යනු; භාග්‍යවතුන් වහන්සේ පිරිවරා. **අතතානං** යනු; තමන් දක්වයි. **වජෙජනෙතා** යනු; වාදනය කරමින්, නාද කරමින්. **මණිමුතත රතනඛචිතං** යනු; මිණිමුතු ආදි විවිධ රත්නයෙන් සැරසූ යන අර්ථයි. **සබබාභරණභූසිතං** යනු; පියාභරණ වූ රුවන්මුවා පබළුරූපාදියෙන් සරසන ලද යන අර්ථයි. **සුවණණපීඨං** යනු; රන්මුවා පුටුව. **අදාසහං** යනු; මම දුනිමි.

ඒ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ නගරය බන්ධුමතී නම් විය. බන්ධුමා රජ පියාණෝය. බන්ධුමතී නම් මෑණියෝය. බණ්ඩ, තිස්ස දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක අසෝක නමි. චන්දා චන්දමිත්තා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. පළොල් රුක බෝධියයි. ශරීරය අසූරියන් උස් විය. **ශරීරාලෝකය** සදා සත් යොදනෙක පැතිර සිටියේය. ආයු අවුරුදු **අසූලක්ෂයකි.** උන්වහන්සේ ගේ භාර්යාව සුතනු නමි. පුත්‍රයා සමවතතකඛන්ධ නමි. ආජන්‍ය රථයෙන් මහබිනික්මන් කළහ. එයින් කියන ලදි-

නගරං බන්ධුමතී නාම බන්ධුමා නාම බතනියො
මාතා බන්ධුමතී නාම විපසසිසස මහෙසිනො

බණෙඩා ච තිසසනාමෝ ච අහෙසුං අගගසාවකා
අසොකෝ නාමුපටඨාකෝ විපසසිසස මහෙසිනෝ

චන්දා ච චන්දමිතතා අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතෝ පාටලීති පවුචචති

අසීති හත්ථුබෙබධෝ විපසසී ලොකනායකෝ
පභා නිදධාවති කසස සමනතා සතතයොජනෝ

අසීතිවසසසහසසායානි ආයු බුදධසස තාවදෙ
තාවතා තිටඨමා නෝ සෝ තාරෙසි ජනතං බහුං

බහූ දෙවෙ මනුසෙසව බන්ධනා පරිමොචයි
මගගාමගගංච ආචිකඛ අවසෙස පුථුජජනෙ

ආලොකං දසසයිත්වාන දෙසෙත්වා අමතං පදං
ජලිත්වා අගගිකඛන්ධොව නිබබුතෝ සෝ සසාවකෝ

ඉදධිවරං පුඤ්ඤවරං ලකඛණං ච කුසුමිතං
සබබං සමනතරහිතං නනු රිතතා සබබසංඛාරාති

එහි බන්ධනා යනු; කාමසංයෝජනාදි බැම්මෙන් මිදූහ. විකාසයට පැමිණවීය යන අර්ථයි. මගගාමගගඤ්ඤව ආචිකඛි යනු; අමෘතාධිගමය සඳහා මාර්ගය මෙයයි. උච්ඡේද ශාස්වත දෘෂ්ටි රහිත මධ්‍යම ප්‍රතිපදාව මාර්ගයයි. කය වෙහෙස කිරීමාදි මෙය මාර්ගය නොවෙයි කියා සෙසු පුහුදුන නම් කීහ යන අර්ථයි. ආලොකං දසසයිත්වාන යනු; මාර්ගඥානා ලෝකය දක්වා. ලක්ඛණඤ්ඤව කුසුමිතං යනු; චක්‍ර ලක්ෂණාදියෙන් සුපිපි සැරසුණු භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය ය අර්ථයි. ගාථාවල සෙසු සියලු අර්ථ ප්‍රකටමය.

විපස්සි බුදධවංස වර්ණනාව නිමියේය.

එකුන්විසිවන බුදධවංසය සමාප්තයි.

විපස්සී භාග්‍යවතුන් වහන්සේට පසුභාගයෙහි ඒ කල්පය අතුරුදන් වීමෙන් පසු එකුන්විසි කල්පයක බුදුවරු ලොව පහළ නුවූහ. එහි වනාහි සිබී භාග්‍යවතුන් වහන්සේ පැරැම් පුරා තුසීපුර ඉපිද ඉන් සැව අරුණවතී නුවර පරම ගුණ යුත් අරුණවත රජුගේ අගමෙහෙසි පරම රූසිරු රන් පැහැ ඇති පභාවතී දේවිය කුස පිළිසිඳ දසමස් ගෙවා නිපක උයන්හි මවුකුසින් බිහිවූහ. නිමිති කියන්නා උන්වහන්සේට නම් තබන්නානු සිබාවක් මෙන් උන්හීසය උඩනැඟි හෙයින් සිබී යයි නම් කළහ. උන්වහන්සේ සත්දහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. සුචන්‍දකසිරි සිරියස නාරිවසභ නම් තුන්පහයක් විය. සබබකාමා දේවිය ප්‍රමුඛ සූවිසිදහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක සබබකාමා දේවියගේ ගුණගණයෙන් ආතුල අතුල නම් පුතු උපන් කල්හි ඇත්යානයෙන් උතුම් ඇත්කඳ මත නැඟී මහබිනික්මන් නික්ම පැවිදි වූහ. සැත්තෑලක්ෂයක් දෙනා උන්වහන්සේ අනුව පැවිදි වූහ. ඔවුන් පිරිවැරූ උන්වහන්සේ අටමසක් ප්‍රධන්හි හැසිර වෙසක් පුන්පොහෝදින ගණ සංගණිකායෙන් මෙන්ම සුදසසන නියමිගම්හි පියදස්සී සිටුහුගේ දියණිය දුන් මීකිරිබත් වළඳා තරුණකිණිහිරිවෙනෙහි දිවාවිහාර ගෙවා අනෝමදස්සී නම් තවුසන් දුන් අටතණමිට ගෙන පුණ්ඩරීක බෝධිය වෙත එළඹියහ. ඒ පුණ්ඩරීක බෝධියෙහි දී පාඨලී බෝධිය ප්‍රමාණයම විය. එදිනම එය පනස්රියන් කඳ ඇතිව නැගියේය. එහි ශාඛා ද පනස්රියන් පමණමය. එය දිවසුවඳැති මලින් ගැවසී ගත්තේය. මලින් පමණක්ම නොව පල සහිත ද විය. එහි එක් පැත්තකින් තරුණ ගෙඩිය. එක් පැත්තකින් මැදිවියේ ගෙඩිය. එක පැත්තකින් වඩා නොපැසුණු ගෙඩිය. එක පැත්තකින් පැසුණු දිවඕජා මෙන් සුරස වර්ණ ගන්ධ රස සම්පන්න ගෙඩි තැන තැන එල්ලෙයි. එපරිද්දෙන් දසදහසක් සක්වළ මල් හටගන්නා ගස් මලින් පල හටගන්නා ගස් පලින් යුක්ත විය.

උන්වහන්සේ එහි සූවිසි රියන් තණ ඇතිරි අතුරා පර්යංකය වැළඳ චතුරංග වීර්යාධිෂ්ඨානයෙන් වැඩහුන්හ. මෙසේ වැඩහිඳ සතිස් යොදුන්හි පැතිරි මරුසහිත මරබල නසා සම්බෝධියට පත්ව අනෙකජාති සංසාරං යි උදන් අනා බෝ සමීපයෙහිම සත්සති ගෙවා බඹ අයුදුම පිළිගෙන තමන් වහන්සේ සමග පැවිදි වූ සැත්තෑලක්ෂයක් භික්ෂූන්ගේ හේතු සම්පත් දැක අහසින් වැඩ මිගාචිර උයන්හි බැස ඒ භික්ෂු සමූහයා විසින් පිරිවරන ලද්දාහු ඔවුන් මධ්‍යයෙහි දම්සක් පැවැත්වූහ. එකල් කෙළලක්ෂයක් දෙනාට ධර්මාවබෝධ විය. එයින් කියන ලදි-

විපස්සිස්ස අපරෙන සම්බුද්ධා දිපදුත්තමෝ
සිඛිවහයෝ ආසිජිනෝ අසමෝ අපපටිපුග්ගලෝ

මාරසෙනං පභිඳිත්වා පත්වා සම්බෝධිමුත්තමං
ධම්මචක්කං පවත්තෙසි අනුකම්පාය පාණිනං

ධම්මචක්කං පවත්තෙත්ත සිඛිම්හි ජිනපුංගවෙ
කොටිසතසහස්සානං ධම්මාභිසමයෝ අහූනි

නැවත ද අරුණවතී රාජධානිය සමීපයෙහිම අභිභූ රාජපුත්‍රයාට ද සම්භව රාජපුත්‍රයාට ද යන පිරිවර සහිත දෙදෙනාට දහම් දෙසා නවකෙළ දහසකට දහම් අමා පෙවූහ. එය දෙවන ධර්මාභිසමය විය. එයින් කියන ලදි-

අපරම්පි ධම්මං දෙසෙන්ත ගණසෙට්ඨ න රුත්තමෙ
නවුතිකොටිසහස්සානං දුතියාභිසමයෝ අහූනි

යම්කලෙක සුරියවතී නුවර දොර සපු රුක් මුල තීර්ථකයන්ගේ මද මාන බිඳීම පිණිස සියලු ජනයාගේ මෝක්ෂාර්ථය සඳහා ද යමක ප්‍රාතිහාර්යය කරමින් භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන කල්හි අසූ කෙළදහසකට තෙවන ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

යමකපාටිහීරඤ්ච දස්සයන්ත සදෙවකෙ
අසීතිකොටිසහස්සානං තතියාභිසමයෝ අහූනි

අභිඥා සමභව රාජපුත්‍රයන් සමග පැවිදි වූ ලක්ෂයක් රහතුන් මධ්‍යයෙහි භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය ප්‍රථම සන්නිපාතය විය. අරුණවතී නුවර ඤාති සමාගමයෙහි පැවිදි වූ අසූදහසක් භික්ෂූන් මැද පාමොක් දෙසූහ. එය දෙවන රැස්වීම විය. ධනඤ්ජය නුවර ධනපාලක ගෘහපති භික්මවන සමයෙහි පැවිදි වූ සැත්තෑදහසක් භික්ෂූන් මැද භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන රැස්වීම විය. එයින් කියන ලදි.

සන්නිපාතා තයෝ ආසුං සිඛිස්සාපි මහෙසිනෝ
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං

භික්ඛු සතසහසසානං පඨමෝ ආසි සමාගමෝ
අසීති භික්ඛුසහසසානං දුතියෝ ආසි සමාගමෝ

සතතභික්ඛුසහසසානං තතියෝ ආසි සමාගමෝ
අනූපලිත්තෝ පදුමංචව තොයමහී සමපවඩ්ඪතනති

එහි අනූපලිත්තෝ යනු; ජලයෙහි හටගත්, ජලයෙහි වැඩුණු පියුමක් මෙන් ඒ භික්ෂු සන්නිපාතය ද ලොව හටගත් නමුත් ලෝකධර්මයන් සමග නොඇලුණාහ යන අර්ථයි. එකල්හි බෝසතාණෝ කිසිතැනක නොඇලුණාහු පරිභුත්ත තුවර අරිඳම නම් රජව සිබී ශාස්තෘන් වහන්සේ පරිභුත්ත නුවරට වැඩිකල්හි සපිරිවරින් රාජභවනයෙන් පෙරගමන් කොට පාදපද්ම යුගලයෙහි පිරිස් සහිතව සිරසින් නැමද දසබලයන් වහන්සේට ආරාධනා කොට සතියක් ඓශ්වර්ය කුල සම්පත් ශ්‍රද්ධාවට අනුරූප මහදන් දී සළු ගබඩා හැර බුදුපාමොක් බික්සඟනට මහඟු සළු පිදූහ. තමන්ගේ බල රූප ලක්ෂණ ජව සම්පන්න රන්දැල් මාලාදියෙන් සරහන ලද නවරත් සොඳුරු දළකොපු චාමර යුග්මයෙන් බබළන මහත් මෘදු කන් ඇති සඳරේඛා මෙන් බබළන මුවශෝභා යුත් එරවණ ඇතු මෙන් සතුරන් වළකන වරඇතු ද පුදා ඇත් ප්‍රමාණයෙන් කැපබඩු ද පූජා කළහ. ඒ ශාස්තෘන් වහන්සේ ද මෙයින් එක්තිස්වන කප්හි බුදුවන්නේ යයි උන්වහන්සේට විවරණ දුන්හ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන අරිඳමෝ නාම ඛත්තියෝ
සම්බුද්ධපමුඛං සංඝං අන්නපානෙන කපයිං

බහූ දුසසවරං දත්වා දුසසකොටිං අනපපකං
අලංකතං හත්ථියානං සම්බුද්ධසස අදාසහං

හත්ථියානං නිම්මිණිත්වා කපියං උපනාමයිං
පූරයිං මානසං මයහං නිවවං දළහමුපට්ඨිතං

සොපි මං බුදෙධා ව්‍යාකාසි සිබී ලොකගගනායකෝ
එකංනිංසෙ ඉතෝ කපෙප අයං බුදෙධා භවිසසති
අහූ කපිලවහයෙ -පෙ-

තස්සාහං වචනං සුත්වා භීයෝ චිත්තං පසාදයිං
උත්තරිං වත්තමධිට්ඨාසිං දසපාරමිපූරියා

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය අරුණවතී නම් විය. අරුණවා නම් රජ පියාණෝය. පභාවතී නම් දේවිය මෑණියෝය. අභිභූ සමභව දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක බෙමංකර නම්. මබිලා පදුමා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. පුණ්ඩරීක රුක බෝධියයි. උන්වහන්සේගේ ශරීරය සැත්තැරියන් උසය. ශරීර ප්‍රභාව නිතර තුන්යොදුනක් පැතිර සිටියේය. ආයුෂ වසර සැත්තෑ දහසකි. අගමෙහෙසිය සබබකාමා නම්. අතුල නම් උන්වහන්සේගේ පුත්‍රයාය. එයින් කියන ලදි-

නගරං අරුණවතී නාම අරුණවා නාම ඛත්තියෝ
පභාවතී නාම ජනිකා සිබිසස ච මහෙසිනෝ

අභිභූ සමභවෝ නාම අහෙසුං අගගසාවකා
බෙමංකරෝ නාමුපට්ඨාකෝ සිබිසස ච මහෙසිනෝ

මබිලා ච පදුමා චෙති අහෙසුං අගගසාවිකා
බොධිතසස භගවතෝ පුණ්ඩරීකොති වුච්චති

සිරිවඩ්ඪා ච නන්දොච අහෙසුං අගුපට්ඨිකා
චිත්තා චෙව සුගුත්තා ච අහෙසුං අගුපට්ඨිකා

උච්චත්තනෙන සෝ බුද්ධා සත්තති හත්ථමුග්ගතෝ
කඤ්චනගඝිය සංකාසෝ දවත්තිංස වරලක්ඛණෝ

තසස ව්‍යාමප්පභා කායා රත්තින්දිවමත්තන්දිතා
දිසෝ දිසං නිච්ඡරති තීණියොජනසෝ පභා

සත්තතිවසසසහසසානි ආයු තසස මහෙසිනෝ
තාවතා ත්ථිමානෝ සෝ තාරෙසි ජනකං බහුං

ධම්මමෙසං පවසෙත්වා තෙමයිත්වා සදෙවකං
බෙමන්තං පාපයිත්වාන නිබ්බුතෝ සෝ සසාවකෝ

අනුව්‍යඤ්ජනසම්පන්නං දවත්තිංසවර ලක්ඛණං
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසංඛාරාති

එහි **නිම්මිණිත්වා** යනු; ඒ ඇතාගේ ප්‍රමාණයෙන් තුලනය කොට. **කපපියං** යනු; භික්ෂූන්ට යම බඩුවක් ගැනීමට කැපද එය කැපබඩු නමි. **පූරයිං මානසං මයහං** යනු; මාගේ සිත දාන ප්‍රීතියෙන් පිරුවෙමි. මට ප්‍රීතිය ඉපදවීමට සමර්ථ ද කළෙමි යන අර්ථයි. **නිචචං දළහමුපටයීතං** යනු; නිති දන් දෙමියි දාන වශයෙන් සිත දැඩිව එළඹ සිටියේය යන අර්ථයි. **පුණඩරීක** රුකෙඛා යනු; ඇටඹ රුකයි. **තීනි යොජනසෝ පභා** යනු; තුන්යොදුනක් ආලෝකය විහිදෙයි යන අර්ථයි. **ධමමමෙඝං** යනු; ධර්ම වර්ෂාවයි. දහම්වස්වන බුදධමෙඝය. **තෙමයිත්වා** යනු; දහම්කතා ජලයෙන් තෙමා, ඉස යන අර්ථයි. **සදෙවකෝ** යනු; දෙවියන් සහිත සත්වයන්. **ඛෙමනතං** යනු; ක්ෂෙමය ඒ නිවන. **අනව්‍යඤජනසමපපනනං** යනු; තුඹවන් නිය උස් නිය සිනිඳු නිය වට ඇඟිලි බව ආදි අසූවක් අනු ලකුණින් යුත් මහාපුරුෂ ලක්ෂණ සැදි භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය යන අර්ථයි. සිබී සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සීලවති නුවර අසසාරාමයෙහි පිරිනිවි සේක.

ගිනිසිළුවක් මෙන් තපසින් ලොව දිලී මේසාගමනයෙහි මොනරකු මෙන් නද කොට සිබී මහර්ෂීහු ඉන්ධන හීනවීමෙන් ගිනිසිළුවක් මෙන් ඒ සුගතයන් වහන්සේ ශාන්තිගත වූ සේක.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධාතු එකසතව පිහිටියේය. නොවිසුරුණේය. මුළු දඹදිව්වැසි මිනිස්සු තුන් යොදුන් උස සත්රුවන් මුවා හිමගිරවන් සුන්දර ස්තූපයක් කළහ. මෙහි සෙසු ගාථාර්ථ ප්‍රකටය.

සිබී බුදධවංස වර්ණනාව නිමියේය.

විසිවන බුදධවංසය සමාප්තයි.

සිබී බුදුරදුන්ගෙන් පසු කල උන්වහන්සේගේ ශාසනය අතුරුදන් වූ පසු සැත්තෑදහසක් අවුරුදු ආයු ඇති මිනිස්සු කෙමෙන් පිරිහී දශවර්ෂායුෂ්ක වූහ. නැවත වැඩි අපමණ ආයු ඇත්තෝව කෙමෙන් පිරිහී අවුරුදු සැටදහසක් ආයු ඇත්තෝ වූහ. එකල දිනූ අදහස් ඇති ලොව දිනූ සර්වඥ වෙසසහු නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේ පැරැම් පුරා තුසිපුර ඉපිද ඉන් සැව අනුපම නුවර මනා ප්‍රීතියට පත් සුපපතිත නම් රජුගේ අගමෙහෙසි සිල්වත් යසවතී දේවිය කුස පිළිසිඳ ගත්හ. දසමස් ඇවෑමෙන් අනුපම උයන්හි මව්කුසින් බිහිවූහ. උපදිද්දීම ජනයා සතුටුකොට ඍෂභනාද කළහ. එහෙයින් වසභනාද හේතුවෙන් උන්වහන්සේට නම් තබන දින වෙස්සභු කියා නම් කළහ. උන්වහන්සේ සඳහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. සුචි සුරුචි රතිවඩ්ඪන නම් තුන්පහයක් විය. සුචිතතා දේවිය ප්‍රමුඛ තිස්දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක සුචිතතා දේවියට සුපපබුද්ධ කුමරු උපන් කල රන්සිවිගෙයින් උයන දකීමට ගොස් දෙවියන් දුන් කසාවත් ගෙන පැවිදි වූහ. සැත්තෑදහසක් උන්වහන්සේ අනුව පැවිදි වූහ. ඉක්බිති ඔවුන් පිරිවරා උන්වහන්සේ සමසක් ප්‍රධන් වඩා වෙසක් පුන්පොහෝදින සුචිතත නියම්ගම දෘශ්‍යමානකයින් සිරිවඩ්ඪනාව විසින් දෙන ලද මිකිරිබත් වළඳා සල්වෙනෙහි දිවාවිහාර කොට සවස නරිඳ නාරජු දුන් අටතණමිට ගෙන සල් බෝධිය වෙත දකුණුදෙසින් පැමිණියහ. ඒ සල් බෝධියෙහි ද පළොල් බෝධියෙහි ප්‍රමාණයම විය. එසේම මල් පැල සිරිසම්පත් දතයුතුය. උන්වහන්සේ සල්රුක වෙත පැමිණ සතළිස් රියන් පුළුලැති තණ ඇතිරි අතුරා පර්යංකය වැළඳ පහවූ නීවරණ ඇති සියලු මත අවුරන්නා වූ අනාවරණ ඥානය ලැබ උදන් අනා එහිම සත්සති ගෙවා සිය බාල සොහොයුරු සොණ කුමරුගේ ද උත්තර කුමරුගේද හේතු සම්පත් දැක අහසින් වැඩ අනුපම නගර සම්පයෙහි අරුණ උයන්හි බැස උද්‍යාන පාලක ලවා කුමාරවරුන් කැඳවා ඔවුන්ගේ පිරිවර මැද දම්සක් පැවැත්වූහ. එකල්හි අසූකෙළ දහසකට ප්‍රථම ධර්මාවබෝධය විය. නැවත ජනපද චාරිකාවෙහි වඩින සේක් භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ තන්හි දහම් දෙසන්නාහු සැත්තෑකෙළ දහසකට ධර්මාවබෝධ කළහ. ඒ දෙවන ධර්මාවබෝධයයි. අනුපම නුවරදීම මිස දිටුදුල් බිඳින්නාහු තොටුවන්ගේ මානඩජ හෙළන්නාහු මානමද කියෙන්නාහු ධර්මධ්වජය ඔසවන්නාහු අනූ යොදනෙක පැතිරි මිනිස් පිරිස්හි අපරිමිත දෙව්පිරිස්හි යමක ප්‍රාතිහාර්යය කොට දෙවිමිනිසුන් පහදවා සැටකෝටියක් ධර්මාමෘතයෙන් සැතැප්වූහ. එය තෙවන අභිසමය විය. එයින් කියන ලදී.

තත්‍රේව මණ්ඩකපමහි අසමෝ අපපටිපුග්ගලෝ
වෙසසභූනාම නාමෙන ලොකෙ උපපජ්ජි නායකෝ

ආදිතතනති ච රාගගි තණහානං විජිතං තදා
නාගොව බන්ධනං ජෙත්වා පතෙතා සමෙබාධිමුත්තමං

ධම්මවකකං පවතෙතනෙත වෙසසභූලොකනායකෝ
අසීති කොටිසහසසානං පඨමාභිසමයෝ අහූ

පකකනෙතචාරිකං රථෙඨ ලොකසෙථෙඨ නරාසභෙ
සතතතිකොටිසහසසානං දුතියාභිසමයෝ අහූ

මහාදිටඨිං විනොදෙනෙතා පාටිහීරං කරොති සෝ
සමාගතා නරමරූ දසසහස්‍රී සදෙවකෙ

මහඅවජ්ජරියං දිසවා අබභූතං ලොමහංසනං
දෙවා චෙව මනුසසා ච බුජ්ඣරෙ සටඨිකොටියෝ

එහි ආදිතතං යනු; මේ සියලු තුන්ලොව ඇවිලගන්නා ලදි. රාගගග යනු; රාගයෙන්. විජිතය රට තණහා වසයෙහි පවත්නා තැනැයි මෙසේ දූන යන අර්ථයි. නාගොව බන්ධනං ජෙත්වා යනු; පූතිලතා බැම්ම සිද ඇතෙකු මෙන් සම්බෝධියට පැමිණියේ අවබෝධ කරන ලද්දේ. දසසහස්‍රී යනු; දසසහස්‍රියෙහි. සදෙවකෙ යනු; දෙවියන් සහිත ලොව. බුජ්ඣරෙ යනු; අවබෝධ කළහ.

සොණ උත්තර නම් දෑසව්වන්ගේ සමාගමයෙහි පැවිදි වූ අසූදහසක් රහතන් මැද නවම් පුන් පොහෝදින පාමොක් දෙසූහ. එය ප්‍රථම සන්නිපාතය විය. යම්කලෙක මුළු ලොව දිනූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ සමග පැවිදි වූ සැත්තෑ දහසක් පමණ භික්ෂූහු ගණාවාසයෙන් බැහැර කළ කල්හි පිටත්වූවාහු ද උන්වහන්සේ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේගේ ධම්මචක්ක පුවත අසා සෝරෙය්‍ය නම් නුවරට අවුත් භාග්‍යවතුන් වහන්සේ දුටුවාහුද උන්වහන්සේලාට දහම් දෙසා ඒ සියලු දෙන එහිභික්ෂු භාවයෙන් පැවිදි කරවා සිවු පිරිසෙහි පාමොක් දෙසූහ. එය දෙවන සන්නිපාතය විය. යම්දිනක නාරිවාහන නම් නුවර උපසනක නම් රජපුත්‍රයා රජකම් කළේද ඔහුට අනුකම්පා පිණිස භාග්‍යවතුන්

වහන්සේ එහි වැඩි සේක. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ ආගමනය අසා පිරිවර සහිතව පෙරගමන් කොට ආරාධනා කොට මහදන් පුදා උන්වහන්සේගේ බණ අසා පහන් සිතින් පැවිදි විය. ඒ සැටදහසක් පමණ පිරිස ඔහු අනුව පැවිදි වූහ. ඔවුහු එතුමන් සමග රහත්වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරන ලද්දේ භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එය තෙවන සන්නිපාතය විය. එයින් කියන ලදි-

සනනිපාතා තයෝ ආයුං වෙසසභුසස මහෙසිනෝ
බීණාසවානං විමලානං සනතචිතතාන තාදිනං

අසීතිහිකඛු සහසසානං පඨමෝ ආසි සමාගමෝ
සතතතිංස සහසසානං දුතියෝ ආසිසමාගමෝ

සටඨීහිකඛු සහසසානං තතියෝ ආසි සමාගමෝ
ජරාදිභයානීතානං ධරසානං මනෙසිනොති

එකල බෝසතාණෝ සරභවතී නුවර පරම ප්‍රියදර්ශන සුදස්සන නම් රජව වෙස්සභූ ලෝකනායකයාණෝ සරභ නගරයට වැඩිකල්හි උන්වහන්සේගේ බණ අසා පහන් හදින් දසනබසමොධානයෙන් බබළන ජලජ නිමල අවිකල මානෙල් කැකුළක් වන් ඇදිලිය හිස තබා බුදුපාමොක් සඟනට මහා චීවරදානයක් දී එහිම භාග්‍යවතුන් වහන්සේගේ වාසය පිණිස ගඳකිළියක් කොට එය වටකොට විහාර දහසක් කරවා සියලු සම්පත් බුද්ධශාසනයට පුදකොට උන්වහන්සේ වෙත මහණව ආචාර ගුණසම්පන්නව තෙළෙස් ධුතගුණයෙහි නිරතව බෝධිසම්භාර පර්යේෂණය සඳහා ඇඳුණේ බුද්ධ ශාසනාභිරතව විසූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ද අනාගතයෙහි මෙයින් එක්තිස්වන කප්හි ගොතම නම් බුදුවන්නේයි උන්වහන්සේට ප්‍රකාශ කළහ. එයින් කියන ලදි-

තසස බුදධසෙ අසමසස වකකං වතතිකමුතතමං
සුතවා පණිතං ධමමං පබබජජමහිරොචයිං

අහං තෙන සමයෙන සුදසසනො නාම ඛතතියෝ
නිමනෙතවා මහාවීරං දානං දතවා මහාරහං
අනනපානෙන වතථෙන සසංඝං ජිනමපූජයිං

මහාදානං පවත්තෙත්වා රතනින්දිවමත්තන්දිනෝ
පබ්බජ්ජං ගුණසම්පන්නං පබ්බජිං ජිනසන්තිකෙ

ආචාරගුණ සම්පන්නෝ වත්තසීලසමාහිතෝ
සබ්බඤ්ඤුතං ගවෙසන්තෝ රමාමි ජිනසාසනෙ

සද්ධාපීතිමුපාගන්ත්වා පාදෙ වන්දාමි සත්ථරි
පීති උපජජතීමයහං බොධියා යෙව කාරණා

අනිවත්තී මානසං ඤත්වා සම්බුදෙධා එතදබ්‍රවී
එකතිංසෙ ඉතෝ කප්පෙ අයං බුදෙධා භවිසසති

අහූ කපිලවහයෙ රමෙම -පෙ-

තසසාහං වචනං සුත්වා භීයෝ චිත්තං පසාදයිං
උත්තරිං වත්තමධිට්ඨාසිං දසපාරමී පූරියානි

ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය අනුපම නම් විය. සුපපතික නම් කැත්රජ පියාණෝය. යසවතී නම් මෑණියෝය. සොණ උත්තර දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක උපසනක නම්. දාමා සමාලා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. බෝධිය සාල වෘක්ෂයයි. ශරීරය සැටරියන් උසය. ආයු අවුරුදු සැටදහසකි. උන්වහන්සේගේ භාර්යාව සුමිත්තා නම්. පුත්‍රයා සුප්පබුද්ධ නම්. රන්සිවිගෙයින් නික්මුණහ. එයින් කියන ලදි-

අනුපමං නාම නගරං සුපපතිතෝ නාම ඛත්තියෝ
මාතා යසවති නාම වෙසසභුසස මහෙසිනෝ

සොණොච උත්තරෝ චෙව අහෙසුං අග්ගසාවකා
උපසෙනෙත්‍රා නාමුපඩ්ඩාකෝ වෙසස භුසස මහෙසිනෝ

දාමා චෙව සමාලා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තසස භගවතෝ සාලෝ ඉති පවුච්චති

සොත්ථිකෝ චෙව රමෙමා ච අහෙසුං අග්ගුපට්ඨකා
කාලිගොතමී සිරිමා අහෙසුං අග්ගුපට්ඨිකා

සට්ඨිරතනමුබෙබධෝ හෙමයූපසමූපමෝ
කායා නිච්ඡරති රංසි රත්තීරව පබ්බතෙ සබ්බී

සටඨිවසස සහසසානි ආය තසස මහෙසිනො
තාවතා තිටඨමානො සො තාරෙසි ජනතං බහුං

ධමමං විතථාරිකං කතවා විභජිතවා මහාජනං
ධමමනාවං ඨපෙතවාන නිබබුතො සො සසාවකො

දසසනෙයයං සබබජනං විහාරඤචිරියාපථං
සබබං සමනතරහිතං නනු රිතතා සබබසංඛාරාති

එහි චකකං වතතිකං යනු; ධර්මචක්‍රය පවත්වන ලදී. **පණිතං ධමමං** යනු; උතතරිමනුෂ්‍යධර්ම. **පබබජජං ගුණසමපනනං** යනු; දැන පැවිදිවීම් යන අර්ථයි. **වතතසීල සමාහිතො** යනු; වත්හි ද සිල්හි ද පිහිටියේ. ඒ ඒ දන් පිරීමෙහි සමාහිත වූයේ යන අර්ථයි. **රමාමි** යනු; සිත් අලවමි. **සදධා පීතිං** යනු; ශ්‍රද්ධාවත් ප්‍රීතියත් ලබා. **වනදාමි** යනු; නමස්කාර කළෙමි. අතීතාර්ථයෙහි වර්තමාන පදයි දතයුතු. **සතථරි** යනු; ශාස්තෘන් වහන්සෙට **අනිවතතිමානසං** යනු; නොපසුබස්නා මනස. **හෙම යූපසමූපමො** යනු; රන්ටැඹක් වන් යන අර්ථයි. **නිචඡරති** යනු; ඔබිනොබ දුවයි. **රංසි** යනු; ස්වභාව රශ්මිය. **රතනිංව පබබතෙ සිඛී** යනුදු රාත්‍රි පර්වත මුදුනෙහි ගින්නක් මෙන් උන්වහන්සේගේ කයෙහි රශ්මි බැබළිණ යන අර්ථයි. **විභජිතවා** යනු; විභාග කොට. **උදඤචිතඤ** සෝවාන් ආදි වශයෙන් යන අර්ථයි. **ධමමනාමං** යනු; අටඟිමග සංඛ්‍යාත ධර්ම නෞකාව චතුරොඝතරණය පිණිස තබා යන අර්ථයි. **දසසනෙයයං** යනු; දසසනෙයෙයා යනුයි. **සබබජනං** යනු; සබබ ජිනො යනුයි. ශ්‍රාවක සංඝයා සහිත සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යන අර්ථයි. **විහාරං** යනු; විහාරෙ යනුයි. හැමතන්හි ප්‍රථමාර්ථයෙහි කර්ම පදයි දතයුතුය. වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ උසභවතී නුවර බෙම් මිගදායෙහි පිරිනිවි සේක. උන්වහන්සේගේ ධාතු විසිරියේය.

ජිනවසභ වූ වෙසසභූ භාග්‍යවතුන් වහන්සේ පුරයන්ට උතුම් උසභවතී පුරයෙහි මනරම් උපවන විහාරයෙහි නිරුපධිසේසයට පැමිණි සේක.

වෙසසභූ බුදධවංස වර්ණනාව නිමියේය.

එක්විසිවන බුදධවංසය සමාප්තයි.

ස්වයම්භූ වෙස්සභූ බුදුන් පිරිනිවි කල්හි ඒ කල්පය ද ඉකුත් කල එකුන්තිස් කපක් ජිනසූර්යයෝ නූපන්හ. මේ භද්‍රකල්පයෙහි සිවුබුදු කෙනෙක් උපන්හ. කවර සතර නමක්ද? කකුසඳ කෝනාගම කාශ්‍යප යන තුන්නම සහ අප බුදුරජාණෝය. මෛත්‍රය භාග්‍යවතුන් වහන්සේ මතු උපදනාහ. මෙසේ මේ කල්පය පස් බුදුකෙනකුගෙන් යුක්ත බැවින් මහා භද්‍රකල්පයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදි. එහි කකුසඳ නම් භාග්‍යවතුන් වහන්සේ පාරමී පුරා තුසිපුර ඉපිද ඉන් සැව බෙමවනී නුවර බෙමංකර නම් රජුගේ අර්ථධර්මානුශාසක අගඉදිතත නම් පුරෝහිතයාගේ අගබිසෝ විසාඛා නම් බැමිණිය කුස පිළිසිඳ ගත්හ. යම්කලෙක රජවරු බමුණන්ට සත්කාර ගරුකාර කරත් ද මානනය කරත් ද පූජා කරත් ද එකල බෝසත්වරු බමුණු කුලයෙහි උපදිති. යම්කලෙක බමුණෝ ක්ෂත්‍රියයන්ට සත්කාර ගරුකාර මානන පූජා කරත් ද එකල කැත්කුලෙහි උපදිති. එකල්හි වනාහි බමුණෝ ක්ෂත්‍රියයන් විසින් සත්කාර ගරුකාර මානන පූජ කරන ලද්දෝ වූහ. එහෙයින් සත්‍ය සන්ධ කකුසන්ධ බෝසත් මහසත්ත්ව විභවශ්‍රී සම්පතින් ආකුල නිරාකුල බ්‍රාහ්මණ කුලයෙහි දසසහස්‍රී ලෝකධාතුව නාද කරවමින් කම්පා කරවමින් පහළවූහ. යට කියන ලද ආකාර ප්‍රාතිහාර්ය ඇතිවිය. ඉක්බිති දස දසමස් ඇවෑමෙන් බෙම උයන්හි රන්වැලකින් ගිනිජාලාවක් මෙන් මවුකුසින් බිහිවූහ.

උන්වහන්සේ වසර හාරදහසක් ගිහිගෙයි විසූහ. උන්වහන්සේට සුචි අරුචි රතිවද්ධන නම් තුන්පහයක් විය. රෝහිණී බ්‍රාහ්මණිය ප්‍රමුඛ තිස්දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක රෝචනී බැමිණියට උත්තර කුමරු උපන් කල්හි මැනවින් සැදූ ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් නික්ම පැවිදි වූහ. සතලිස් දහසක් දෙන උන්වහන්සේ අනුව පැවිදි වූහ. ඔවුන් පිරිවැරූ උන්වහන්සේ අටමසක් ප්‍රධන් කොට වෙසක් පුන්පොහෝ දින සුචිරිඳ නිගමයෙහි චජිරිඤ්ඣ බ්‍රාහ්මණයාගේ දියණිය දුන් මීකිරිබත් වළඳා කිහිරි වෙනෙහි දිවාවිහාර කොට සවස සුභද්ද නම් යවපාලකයන් දුන් අටතණඹට ගෙන පාටලි බෝධියෙහි කියන ලද පමණ ඇති දිවසුවඳ හමන සිරීසබෝධිය වෙත පැමිණ තෙතිස් රියන් පුළුලැති තණඇතිරි අතුරා පර්යංකය වැළඳ සම්බෝධියට පත්ව උදන් අනා සත්සති ගෙවා තමන් වහන්සේ සමග පැවිදි වූ සතලිස් දහසක් භික්ෂූන්ගේ සත්‍ය ප්‍රතිවේධ සමර්ථතාව දැක එක් දවසින්ම මකිල නුවර ළඟ ඉසිපතන මිගදායට වැඩ උන්වහන්සේලා මැද දම්සක් පැවැත්වූහ.

එකල සතලිස් කෙළලක්ෂයක් දෙනාට ප්‍රථම ධර්මාවබෝධය විය. නැවත කාන්‍යකුබජ නගර ද්වාරයෙහි මහ සල්රුක් මුල යමක ප්‍රාතිහාර්යය කොට තිස්කෙළ දහසකට ධර්මචක්ෂුස ඉපිදවූහ. එය දෙවන අභිසමය විය. යම්කලෙක බ්‍රහ්මවතී නගරයට නුදුරු එක්තරා දේවායතනයක නරදේවානි මත නරදේව නම් යක්ෂයෙක් දෘශ්‍යමාන කයින් කාන්තාර මධ්‍යයෙහි පියුමුපිලින් සැදි පරම මිහිරි සිහිල්දිය පිරි සියලු ජනයන්ට ළංවිය නොහැකි විලක් ළඟ සිට පියුම් උපුල් මානෙල් ආදියෙන් සත්වයන් පොළඹවා මිනිසුන් කා දමයි. එම මඟ අවසන ජන හසර රහිත මහවනයට වැද එහි පැමිණි සතුන් කාදමයි. එය ලෝකප්‍රකට කාන්තාර මාර්ගයක් විය. දෙපස කාන්තාර දොරටුවල මහජනයා රැස්ව කාන්තාරය තරණය කිරීමට බලා සිටිති. එකල බවබැලුම් පහකළ කකුසඳ භාග්‍යවතුන් වහන්සේ දිනක් අලුයම මහකුළුණු සමවතින් නැගී ලොව බලන සේක් නැණදැලට හසුවූ ඒ මහේශාක්‍ය නරදේව යක්ෂයාත් ජනසමූහයාත් දුටහ. දැක අහසින් වැඩ ඒ ජනකාය බලා සිටියදීම භාග්‍යවතුන් වහන්සේ නොඑක් පෙළහර කරමින් නරදේව යක්ෂයාගේ භවනයට බැස ඔහුගේ මංගල පර්යංකයෙහි වැඩහුන් සේක. එවිට මිනී කන යක්ෂයා සවනක් රස් විහිදුවමින් දෙව්දුනු පිරිවැරූ සූර්යයා මෙන් බුද්ධ දිවාකරයන් අහසින් වඩිනු දක දසබලයන් වහන්සේ මට අනුකම්පාවෙන් මෙහි වඩින සේකැයි පහන් සිතින් සිය පිරිවර යකුන් සමග නානා මිගයණ යුත් හිමවතට ගොස් නන් වනගඳ දිය ගොඩ පරම මනරම් සුවඳ වත් මල් ගෙනවුත් සිය පලඟෙහි වැඩහුන් විගතරන්ධූ වූ කකුසඳ ලෝකනායකයන් මාලා ගඳ විලේපනාදියෙන් පුදා තූතිසංගීත පවත්වමින් හිසෙහි ඇදිලි බැඳ නමස්කාර කරමින් සිටියේය.

ඉක්බිති මනුෂ්‍යයෝ ඒ ආශ්චර්යය දැක පහන් සිතින් රැස්ව භාග්‍යවතුන් වහන්සේ පිරිවර නමස්කාර කරමින් සිටියහ. එවිට අප්‍රතිසන්ධි ඇති කකුසඳ බුදුහු අභිපූජිත නරදේව යක්ෂයාට කර්මඵල දැක්වීමෙන් තෙද ගන්වා නිරය කථාවෙන් තැතිගන්වන සිවුසස් දහම් දෙසූහ. එදින අප්‍රමාණ සත්වයන්ට ධර්මාවබෝධ විය. මෙය තෙවන අභිසමයයි. එයින් කියන ලදි-

වෙසසභුසස අපරෙන සමබුදෙධා දිපදුතතමෙං
කකුසනෙධා නාම නාමෙන අපපමෙයෙ‍්‍යා දුරාසදො

උගඝාටෙතවා සබබභවං චරියාය පාරමිං ගතො
සීහොව පඤජරං හෙතවා පතෙතා සමෙබාධිමුතතමං

ධම්මචක්කං පවත්තෙනෙත කකුසන්ධෝ ලොකනායකෙ
චත්තාළීසකොටිසහසසානං පඨමාභිසමයෝ අහූ

අනතළිකඛමහි ආකාසෙ යමකං කත්වා විකුබ්බණං
තිංසකොටිසහසසනාං බොධෙසි දෙවමානුසෙ

නරදෙවසස යකඛසස චතුසච්චපකාසනෙ
ධම්මාභිසමයෝ තසස ගණනාතෝ අසංඛ්‍යෙයාති

එහි උගඝාටෙත්වා යනු; සහමුලින් නසා. සබ්බභවං යනු; සියලු නවවිධ භව, භවෝත්පත්ති නිමිත්ත කර්මය යන අර්ථයි. චරියාය පාරමිං ගතෝ යනු; සියලු පාරමිතා පිරීම් වශයෙන් පරතෙරට ගියේ. සීහොව පඤ්ජරං භෙත්වා යනු; සිංහයා කූඩුව මෙන් මුනි ඇත් රජ සංසාර කූඩුව බිඳ යන අර්ථයි. නසන ලද බව බැඳුම් ඇති කකුසඳ භාග්‍යවතුන් වහන්සේට එකම ශ්‍රාවක සන්නිපාතයක් විය. කාන්‍යකුබ්ජ නගරයෙහි ඉසිපතන මිගදායෙහි තමන් වහන්සේ සමග පැවිදිවූ සතළිස් දහසක් රහතුන් පිරිවරන ලදුව නවම් පසළොස්වක් දින භාග්‍යවතුන් වහන්සේ පාමොක් දෙසූහ. එයින් කියන ලදි.

කකුසන්ධසස භගවතෝ එකෝ ආසි සමාගමෝ
ඛීණාසවානං විමලානං සනතචිත්තාන තාදිනං

චත්තාළිසසහසසානං තදා ආසි සමාගමෝ
දනතභූම්මනුපපත්තානං ආසවාරිගණකඛයාති

එකල බෝසත්හු ඛේම නම් රජව බුදුපාමොක් සඟනට පාසිවුරු සමග මහදන් දී අඳුන් ආදි සියලු බෙහෙත් පිදීය. වෙනත් පිරිකර ද පුදා උන්වහන්සේගේ බණ අසා පහන් සිතැතිව බුදුන් වෙත පැවිදි විය. ඒ ශාස්තෘන් වහන්සේ අනාගතයෙහි මෙකපම බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන ඛෙමෝ නාම ඛත්තියෝ
තථාගතෝ ජිනපුත්තෙත ච දානං දත්වා අනපපකං

පත්තඤ්ච චීවරං දත්වා අඤ්ජනං මධුලට්ඨිකං
ඉමෙතං පත්ථිතං සබ්බං පටියාදෙමීවරං වරං

සොපිමං මුනි ව්‍යාකාසි කකුසන්ධෝ ලොකනායකෝ
ඉමම්හි භද්දකපපම්හි අයං බුදෙධා භවිසසති
අහූ කපිලවහයෙ රමෙම -පෙ-

නගරං බෙමවතී නාම බෙමෝ නාමාසහං තදා
සබබඤඤුතං ගවෙසනෙතා පබබජිං තසස සනතිකෙති

එහි අඤජනං යනු; ප්‍රකටමය. මධුලට්ඨිකං යනු; වැල්මී. ඉමෙතං යනු; ඉමෙ එතං යනුයි. පත්ථිතං යනු කැමති දෙය පටියාදෙමි යනු; දෙමි. දුනිමි යන අර්ථයි. වරං වරං යනු; ශ්‍රේෂ්ඨ ශ්‍රේෂ්ඨ යන අර්ථයි. යදා තං පත්ථිතං කියා ද පාඨයි. උන්වහන්සේට යමක් කැමතිද ඒ සියල්ල දිනිමි යන අර්ථයි. මෙය වඩා සුන්දරය. ඒ මහාප්‍රාඥ කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ නගරය බෙම නම් විය. අගගිදතත නම් බ්‍රාහ්මණ පියාණෝය. විසාඛා නම් බ්‍රාහ්මණිය මෑණියෝය. විධුර සඤජීව දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක බුද්ධිජ නම්. සාමා චම්පා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. බෝධිය මහාසරිස වෘක්ෂයයි. ශරීරය සතළිස් රියන් උසය. හාත්පස දස යොදනෙක ශරීරාලෝකය පැතිරෙයි. ආයුස අවුරුදු සතළිස් දහසකි. උන්වහන්සේගේ භාර්යාව රෝචනී නම් බ්‍රාහ්මණියයි. උත්තර නම් පුත්‍රයාය. ආජඤඤ රථයෙන් අබිනික්මන් කළහ. එයින් කියන ලදි-

බ්‍රාහ්මණෝ අගගිදතෙතා ච ආසි බුදධසස සො පිතා
විසාඛා නාම ජනිතා කකුසන්ධසස මහෙසිනො

වසතිතත්ථ බෙමපුරෙ සම්බුදධසස මහාකුලං
නරානං පවරං සෙටඨං ජාතිමනතං මහායසං

විධුරෝ සඤජීව නාමොච අහෙසුං අගගසාවකා
බුදධිජෝ නාමුපටඨාකෝ කකුසන්ධසස සත්ථුනෝ

සාමා ච චම්පානාමා ච අහෙසුං අගගසාවිකා
බොධිතසස භගවතෝ සිරීසොති පවුචචති

චතතළීසරතනං අචචුගගතෝ මහාමුනි
කනකපපභා නිචඡරති සමනතා දසයොජනං

චතතාළීසවසසසහසසානි ආයු තසස මහෙසිනො
තාවතා තිටඨමානො සො තාරෙසි ජනතං බහුං

ධම්මාපණං පසාරිතවා නරනාරීනං සදෙවකෙ
නදිතවා සීහනාදඤඤව නිබබුතො සො සසාවකො

අටඨංගවචනසමපනෙනා අචඡිදානි නිරනතරං
සබබං සමනතරහිතං නනුරිතතා සබබසංබාරාති

එහි වසති තසථ බෙමපුරෙ යනු; මේ ගාථාව කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ උපන්නුවර දැක්වීම පිණිස දක්වන ලදුයි දතයුතුය. මහාකුලං යනු; අතිශයින් නැගිසිටි බුදුරදුන්ගේ පියකුලයයි. නරානං පවරං සෙටඨං යනු; ජාති වශයෙන් සියලු මිනිසුන්ට උතුම් ශ්‍රේෂ්ඨ යන අර්ථයි. ජාතිමනතං යනු; ශ්‍රේෂ්ඨ ජාතිමත්, උතතමාභිජාත. මහායසං යනු; මහපිරිවර ඇති. බුදුරදුන්ගේ ඒ මහාකුලය කුමක්ද? ඒ බෙම පුරයෙහි වසයි යන පදය හා සම්බන්ධය දතයුතුය. සමනතා දසයොජනං යනු; හාත්පසින් දසයොදුනක්. නිති සිරුරෙන් නික්ම රන්වන් ආලෝකය විහිදෙයි යන අර්ථයි. ධම්මාපණං යනු; ධර්ම සංඛ්‍යාත මහාපණය. පසාරෙතවා යනු; බඩු විකිණීම සඳහා නානා බඩුවලින් පිරි කඩපිළක් මෙන් ධම්මාපණය පුළුල්කොට යන අර්ථයි. නරනාරීනං යනු; හික්මවිය යුතු ස්ත්‍රී පුරුෂයන්ට ධ්‍යාන සමාපත්ති මාර්ගඵල රුවන් විශේෂ අධිගමය පිණිස. සීහනාදං ච යනු; සිංහනාදය මෙන් අභය නාද කොට. අටඨංගවචනසමපනෙනා යනු; අෂ්ටාංග සමන්නාගත ස්වර ඇති ශාස්තෘන් වහන්සේ. අචඡිදානි යනු; සිදුරු ආදිය රහිත සීල සිදුරු රහිත පුල්ලිසහිත කැළැල් රහිත නම් වෙයි. නැතහොත් සිදුරු රහිත විවර රහිත ශ්‍රාවක යුගලාදිය. නිරනතරං යනු; අනවරතයෙන්, හැමකල්හි. සබබං සමනතරහිතං යනු ශාස්තෘන් වහන්සේ ද ශ්‍රාවක යුගලය ද ඒ සියල්ල මුනිභාවගතව නොදක්නා බවට පැමිණියේය යන අර්ථයි.

පහකළ බන්ධන ඇති අදග්ධ ප්‍රඥා ඇති සියලු සිදුරු දුරුකළ තුන්ලොව ගැළපූ සත්‍යය ගැළපූ කකුසඳ බුදුහු බෙම මිගදායයෙහි විසූහ. සෙසු ගාථාවන්හි සියලු අර්ථ පැහැදිලිය.

කකුසන්ධ බුදුවංස වර්ණනාව නිමියේය.

දෙවිසිවන බුදුවංසය සමාප්තයි.

කකුසඳ භාග්‍යවතුන් වහන්සේගෙන් පසුකාලයෙහි උන්වහන්සේගේ සසුන අතුරුදන් වීමෙන් පසු සත්මසක් තිස්දහසක් ආයුවූ කල්හි පරහිත සඳහා නැමුණු කෝනාගමන නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ සේක. මෙහිලා ආයුෂය කෙමෙන් පිරිහුණු සේ දක්වන ලදි. එසේ පිරිහුණේ නොවෙයි. මෙසේ පිරිහී වැඩී පිරිහිණැයි දතයුතුය. කෙසේ ද? මෙම කල්පයෙහිම කකුසඳ නම් භාග්‍යවතුන් වහන්සේ සතළිස් දහස් වස් කාලයෙහි උපන්හ. එම ආයුෂය පිරිහෙනුයේ දසවස් කාලයට පැමිණ නැවත අසංඛ්‍යය වී නැවත අසංඛ්‍ය වී එයින් පිරිහෙනුයේ තිස්වස් දහස් කාලයෙහි පිහිටියේය. එකල්හි කෝනාගමන භාග්‍යවතුන් වහන්සේ උපන්හයි දතයුතුය. උන්වහන්සේ පැරැම් පුරා තුසිපුර ඉපිද ඉන් සැව සෝභවතී නුවර පඤ්ඤදත්ත බ්‍රාහ්මණයාගේ භාර්යාව වූ රූපාදි ගුණයෙන් අනුත්තර උත්තරා නම් බැමිණිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් සුභගවතී උයන්හි මවුකුසින් බිහිවූහ. උපදිද්දී මුළු දඹදිව වැස්ස රන් වරුසාවක් වැස්සේය. එයින් උන්වහන්සේට රත්වැසි ආ කරුණින් කනකාගමනයයි නම් කළහ. උන්වහන්සේගේ ඒ නම පරිණාම වනුයේ කෝනාගමනයයි විය. උන්වහන්සේ තුන්දහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. තුසිත සන්තුසිත සනතුටයි නම් තුන් පහයක් විය. රුචිගත්තා බ්‍රාහ්මණිය ප්‍රමුඛ සොළොස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක රුචිගත්තා බ්‍රාහ්මණියට සත්‌ථවාහ නම් පුතු උපන් කල්හි ඇත්යානයෙන් මහබිනික්මන් නික්ම පැවිදි වූහ. තිස්දහසක් පුරුෂයෝ උන්වහන්සේ අනුව පැවිදි වූහ. ඔවුන් පිරිවරන ලද උන්වහන්සේ සමසක් ප්‍රධන් වඩා වෙසක් පුන් පොහෝදින අගගිසොණ බ්‍රාහ්මණයාගේ දියණිය දුන් මීකිරිබත් වළඳා කිහිරි වෙනෙහි දිවාවිහාර කොට සවස් කල තින්දුක නම් යවපල්ලා දුන් අටතණමිට ගෙන පුණ්ඩරීක බෝධියෙහි කී පමණ ඵලවිහුතියෙන් යුත් උදුම්බර බෝධිය වෙත දකුණින් පැමිණ විසිරියන් පමණ තණ ඇතිරි අතුරා පලක් බැඳ මරබල නසා දසබල ඤාණ ලබා උදන් අනා සත්සති ගෙවා තමන් වහන්සේ සමග පැවිදි වූ තිස්දහසක් පමණ භික්ෂූන්ගේ හේතුසම්පත් දැක අහසින් වැඩ සුදස්සන නුවර ළඟ ඉසිපතනයෙහි බැස උන්වහන්සේලා මැද සිට දම්සක් පැවැත්වූහ. එකල්හි තිස්කෙළ දහසකට ප්‍රථම ධර්මාභිසමය විය. නැවත සුන්දර නුවර දොර මහසල් රුක මුල යමක ප්‍රාතිහාර්යය කොට විසිකෙළ දහසකට දහම් අමා පෙවූ සේක. එය දෙවන අභිසමය විය. සිය මෑණි උත්තරාවන් ප්‍රමුඛකොට දසදහසක් සක්වළ රැස්වූ දෙවියන්ට භාග්‍යවතුන් වහන්සේ විජම්පිටකය දෙසද්දී දසකෙළ දහසකට තෙවන ධර්මාභිසමය විය. එයින් කියන ලදි-

කකුසන්ධස්ස අපරේන සම්බුද්ධෝ දිපදුත්තමෝ
කොනාගමනෝ නාම ජිනෝ ලොකජෙට්ඨෝ නරාසභෝ

දසධම්මෙ පූරයිත්වා කනකාරං සමනිකකමී
පවාහිය මලං සබ්බං පත්තෝ සම්බෝධිමුත්තමං

ධම්මචක්කං පවත්තෙත්වේත කොනාගමනායකෝ
තිංසකොටිසහස්සානං පඨමාභිසමයෝ අහූ

පාටිහීරං කරොත්වේත ච පරවාදප්පමද්දනෙ
වීසතිකොටිසහස්සානං දුතියාභිසමයෝ අහූ

තතෝ විකුබ්බණං කත්වා ජිනෝ දෙවපුරං ගතෝ
වසති තත්ථ සම්බුද්ධෝ සිලාය පණ්ඩුකම්බලෙ

පකරෙණ සත්ත දෙසෙත්වේතා වසසං වසති සෝ මුනි
දසකොටිසහස්සානං තතියාභිසමයෝ අහූති

එහි දසධම්මෙ පූරයිත්වා යනු; දසපාරමී ධර්ම පුරා. කනකාරං සමනිකකමී යනු; ජාති කාන්තාරය ඉක්මවිය. පවාහිය යනු; පා කොට. මලං සබ්බං යනු; රාගාදි මලතුන. පාටිහීරං කරොත්වේත ච පරවාදප්පමද්දනෙ යනු; භාග්‍යවතුන් වහන්සේ පෙළහර කරද්දී යන අර්ථයි. විකුබ්බණං යනු; විකුර්වණ ඍද්ධිය. සුඳුර නුවර දොර යමාමහ පෙළහර කොට දෙව්පුරයට වැඩ එහි පඬුඇඟිල් සලසුනෙහි විසූහ. කෙසේ විසූහුද පකරෙණ සත්ත දෙසෙත්වේතා යනු; එහි දෙවියන්ට සප්ත ප්‍රකරණ සංඛ්‍යාත අභිධර්ම පිටකය දේශනා කරමින් විසූහ. මෙසේ එහි භාග්‍යවතුන් වහන්සේ අභිධර්මය දේශනා කරද්දී දසකෙළ දහසකට ධර්මාවබෝධය විය යන අර්ථයි. පිවිතුරු පැරුම් පුරා පැමිණි කෝනාගමන භාග්‍යවතුන් වහන්සේට ද එකම ශ්‍රාවක සන්නිපාතයක් විය. සුරිඳුවතී නුවර සුරිඳුවතී උයන්හි වසන සේක් තිස්දහසක් පිරිවර ඇති නියස රාජකුමාරයාට සහ උතුරු රාජ පුත්‍රයාට ද යන දෙදෙනාට දහම් දෙසා ඒ සියලු දෙන එහිහික්ෂු පැවිද්දෙන් පැවිදි කරවා උන් වහන්සේලා මැද නවම් පුන් පොහෝ දින පාමොක් දෙසූහ. එයින් කියන ලදි-

තසසාපි දෙවදෙවස්ස එකෝ ආසි සමාගමෝ
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං

තිංසහිකකු සහසසානං තදා ආසි සමාගමෝ
ඔසා නමනිකකනතානං භිජජිතා නඤඤව මවචුයාති

එහි ඔසානං යනු; කාමාදි සතර ඕඝයන්ට මෙය නාමයකි. යමෙකුට ඒවා ඇත්තේ ද ඔහු යමක ගිල්වත් ද බහාලත් ද ඒවා ඕඝ නම්. ඒ ඔඝයන්ගේ කර්මාර්ථයෙහි සම්බන්ධ වචනයි දතයුතුය. සතර වැදෑරුම් ඔඝයන් ඉක්මවූවන්ගේ යන අර්ථයි. භිජජිතානං යනු; මෙහි ද මෙය ක්‍රමයමැයි. මවචුයා යනු; මරනුගේ.

එකල අප බෝසත්හු මිථිලා නුවර පබබත නම් රජ වූහ. සරණාගත සියලු ප්‍රාණීන්ගේ ආගමන ඇති කෝනාගමන භාග්‍යවතුන් වහන්සේ මිථිල නුවරට වැඩි බව අසා පිරිවර සහිත රජ පෙරගමන් කොට දසබලයන් වහන්සේට ආරාධනා කොට දන් පුදා එහි භාග්‍යවතුන් වහන්සේට වස්විසීම පිණිස අයැද තෙමස බික්සඟන සහිත ශාස්තෘන් වහන්සේට උවටැන් කොට පත්තුණණ චීන පට කම්බල කොසෙය්‍ය දුහුල් කපු ආදි මාහැඟි සිනිඳු වස්ත්‍ර රන්මිරිවැඩි ද අනෙකුත් බොහෝ පිරිකර පිදූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ද එතුමාට මේ භද්‍රකල්පයෙහිම මොහු බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ විවරණ අසා ඒ මහපුරිස්හු මහාරාජ්‍යය පරිත්‍යාග කොට උන්වහන්සේ වෙතම පැවිදි වූහ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන පබබතෝ නාම ඛතතියෝ
මිතතාමචෙචහි සමපනෙනා බලවාහනමනපපකං

සමබුදධසසනං ගනත්වා සුත්වා ධමමමනුතතරං
නිමනෙනත්වා සජිනං සංඝං දානං දත්වා යදිවජතං

පතතුණණං චීනපටඤඤව කොසෙය්‍යං කමබලමපිච
සොවණණපාදුකඤඤවව අදාසිං සත්ථුසාවකෙ

සොපි මං මුනි ව්‍යාකාසි සංඝමජෙඣ නිසීදිය
ඉමමහි භද්දකෙ කපෙප අයං බුදධෝ භවිසසති

අහු කපිලවහයෙ රමෙම -පෙ-

තසසාහං වචනං සුත්වා භීයෝ චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමී පූරියා

සබ්බඤ්ඤුතං ගවෙසනෙතා දානං දත්වා නරුත්තමෙ
ඔහායාහං මහාරජ්ජං පබ්බජිං ජිනසන්තිතෙති

එහි බලවාහනමනපපකං යනු; බොහෝ අනන්ත වූ මාගේ බලය අශ්ව හස්ති ආදි වාහන ද යන අර්ථයි. සම්බුදධසසනං යනු; සම්බුද්ධ දර්ශනය පිණිස. යදිවඡක යනු; කැමති තාක්, බුදුපාමොක් සංඝයා සතර වැදෑරුම් අහරින් ඇති ඇති කියා පවරවා අතින් වස්වා යන අර්ථයි. සත්ථුසාවකෙ යනු; ශාස්තෘන් වහන්සේට මෙන්ම ශ්‍රාවකයන්ට ද දුනිමි. නරුත්තමෙ යනු; නරෝත්තමයන් හට. ඔහාය යනු; හැරදමා. ඒ කෝනාගමන භාග්‍යවතුන් වහන්සේගේ නගරය සෝභවති නම් විය. යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණ පියාණෝය. උත්තරා නම් බැමිණිය මෑණියෝය. භීයස උත්තර දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපසථායක සොත්ථිය නමි. සමුද්‍දා උත්තරා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. උදුම්බර වෘක්ෂය බෝධියයි. ශරීරය තිස්රියන් උසය. ආයුෂ අවුරුදු තිස්දහසකි. උන්වහන්සේගේ භාර්යාව රුචිගත්තා නම් බැමිණියයි. පුත්‍රයා සත්ථවාහ නමි. ඇත් යානයෙන් නික්මුණාහ. එයින් කියන ලදි-

නගරං සොභවතී නාම සොහො නාමාසි ඛත්තියො
වසතී තසස නගරෙ සම්බුදධසස මහාකුලං

බ්‍රාහමණො යඤ්ඤදතෙතා ච ආසි බුදධසසසො පිතා
උත්තරා නාම ජනිකා කොනාගමනසස සත්ථුනො

භීයසො උත්තරො නාම අහෙසුං අගගසාවකා
සොත්ථිජො නාමුපට්ඨාකො කොනාගමනසස සත්ථුනො

සමුද්දා ච උත්තරා චොති අහෙසුං අගගසාවිකා
බොධි තසස භගවතො උදුම්බරොති පවුච්චති

උච්චත්තනෙන සො බුදෙධා තිංසහත්ථ සමුග්ගතො
උකකාමුඛෙ යථා කම්බු එවං රංසීහි මණ්ඩිතො

තිංවසස සහසසානි ආයු විජජති තාවදෙ
තාවතා තිටඨමානො සො තාරෙසි ජනතං බහුං

ධමමචෙතිං සමුසෙසත්වා ධමමදුසසවිභූසිතං
ධමමපුපඵගුලං කත්වා නිබබුතො සො සසාවකො

මහාවිලාසො තසස ජනො සිරිධමමපපකාසනො
සබබං සමනතරහිතං නනුරිතතා සබබසංඛාරාති

එහි උත්තාමුබෙ යනු; කඹුරු උදුනොහි. යථාකමබු යනු; රත්නිකක් මෙන්. එවං රංසීහි මණ්ඩිකො යනු; මෙසේ රශින් ප්‍රතිමණ්ඩිත වූයේ, සමලංකෘත වූයේ. ධමමචෙතිං සමුසෙසත්වා යනු; සත්තිස් බෝධිපාක්ෂික ධර්මමය චෛත්‍යය පිහිටුවා. ධමමදුසස විභූසිතං යනු; චතුසසත්‍ය ධමම් පාතාකායෙන් විභූසිත. ධමමපුපඵගුළං කත්වා යනු ධර්මමය මල්මාලා ගුළිය කොට. මහජනයාට විදර්ශනා සෑ මිදුලෙහිම සිට නමස්කාර කිරීම පිණිස ධර්ම චෛත්‍යය පිහිටුවා ශ්‍රාවකසංඝයා සහිත වූ ශාස්තෘන් වහන්සේ පිරිනිවි සේක් යනුයි. මහාවිලාසො යනු; මහත් ඍද්ධි විලාසයට පත්වූයේ. තසස යනු; ඒ භාග්‍යවතුන් වහන්සේගෙ. ජනො යනු; ශ්‍රාවක ජනයා. සිරිධමමපපකාසනො යනු; ලොවුතුරා දහම් පවසන ඒ භාග්‍යවතුන් වහන්සේ ද සියල්ල අතුරුදහන් විය යන අර්ථයි.

මහර්ෂි වූ කාමාපෙක්ෂා රහිත ජනයින් පැමිණෙන්නා වූ විසුද්ධ බුද්ධවංසයෙන් පැමිණි ආසව රහිත වූ කෝනාගමන භාග්‍යවතුන් වහන්සේ සිරිනම් විවේක වනයෙන් සුවෙන් විසූ සේක. සෙසු ගාථාවන්හි සියලු අර්ථ පැහැදිලිය.

කෝනාගමන බුදධවංස වර්ණනාව නිමියේය.

තෙවිසිවන බුදධවංසය සමාප්තයි.

කෝනාගමන භාග්‍යවතුන් වහන්සේගෙන් පසුව උන්වහන්සේගේ ශාසනයද අතුරුදන් වීමෙන් පසු තිස්දහසක් අවුරුදු ආයු ඇති සත්වයෝ කෙමෙන් පිරිහී දසවස් ඇත්තෝව නැවත වැඩි අපමණ ආයුෂ ඇත්තෝ වූහ. යළි පිරිහී සත්වයන් විසිදහසක් වස් ඇත්තන් වූ කල්හි නොඑක් මනුෂ්‍යයන්ට සදහම් පෙන්වන්නා වූ **කස්සප** නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූහ. උන්වහන්සේ පැරැම් පුරා තුසීපුර ඉපිද එයින් චුතව බරණැස් නුවර බඹදත් නම් බමුණහුගේ මහා ගුණැති ධනවතී නම් බැමිණිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් ඉසිපතන මිගදායෙහි මවුකුසින් බිහිවූහ.

ගෝත්‍ර වශයෙන් උන්වහන්සේට කසසප කුමාරයි නම් කළහ. උන්වහන්සේ අවුරුදු දෙදහසක් ගිහිගෙයි විසූහ. හංසවා යසවා සිරිනන්දා යයි උන්වහන්සේට තුන්පහයක් විය. සුනන්දා නම් බැමිණිය ප්‍රමුඛ අටසාළිස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක සුනන්දා බැමිණියට විජිතසේන නම් පුතු උපන් කල්හි උපන් සංවේග ඇත්තාහු මහබිනික්මන් නික්මෙතියි සිතූහ. උන්වහන්සේ ගේ පරිවිතර්කයත් සමගම ප්‍රාසාදය කුඹල් සකක් මෙන් කැරකී අහස්කුසට නැග තරුගණ පිරිවැරූ සඳ මෙන් නොඑක් සියගණන් මිනිසුන් පිරිවරා අහස්තලය අලංකාර කරන්නාක් මෙන් පින් අනුහස් ප්‍රකාශ කරන්නාක් මෙන් ජනනුවන් ඇදගන්නාක් මෙන් රුක් අග් පොළඹින්නාක් මෙන් ගොස් නිග්‍රොධ බෝධිය මැදිකොට බිම පිහිටියේය. එවිට මහසත් බෝසත්හු පොළොවෙහි පිහිටා දෙවියන් දුන් අර්හත් ධජ ගෙන පැවිදි වූහ. උන්වහන්සේගේ නාටක ස්ත්‍රීහු පහයෙන් බැස අඩගව්වක් මඟ ගොස් පිරිවර සහිතව සමූහව සිටියහ. ඉක්බිති පිරිවර ස්ත්‍රීන් හැර සමඟ ආ සියල්ලෝ මහණ වූහ. ඔවුන් විසින් පිරිවරන ලද මහසත්හු ප්‍රධන්හි යෙදී වෙසක් පුන් පොහෝදා සුනන්දා බැමිණිය පිදූ මීකිරිබත් වළඳා කිහිරිවෙනෙහි දිවාවිහාර කොට සවස සොම නම් ගවපාලක දුන් අටතණමිට ගෙන නුග බෝධිය වෙත පැමිණ පසළොස්රියන් තණ ඇතිරි අතුරා එහි වැඩහිඳ අභිසම්බෝධියට පත්ව උදන් අනා සත්සති ගෙවා තමන් වහන්සේ සමග පැවිදි වූ කෝටියක් භික්ෂූන්ගේ හේතුසම්පත් දැන අහසින් වැඩ බරණැස ඉසිපතන මිගදායෙහි බැස එහි ඔවුන් පිරිවරන ලදුව දම්සක් පැවැත්වූහ. එකල විසිකෙළ දහසක් දෙනාට ධර්මාවබෝධය විය. එයින් කියන ලදි-

කෝනාගමනස්ස අපරෙන සම්බුදෙධා දිපදුත්තමෝ
කසසපෝ නාම නාමෙන ධම්මරාජා පභංකරෝ

සංජඩ්ඩිතං කුලමූලං බවහනනපානභොජනං
දත්වාන යාචකෙ දානං පරයිත්වාන මානසං

ධම්මචකකපවත්තෙතනෙත කසසපෙ ලොකනායකෙ
වීසතිකොටිසහසසානං පඨමාභිසමයො අහූති

එහි **සඤ්ජඩ්ඩිතං** යනු; දමන ලද ඉවත් කරන ලද හැරදමන ලද. **කුලමූලං** යනු; කුලගෙය. අප්‍රමාණ භොගරාශිය නේකළ දහස් ධන රාශිය ශක්‍රභවනය සමාන භවනය යන හැර දැමීමට අතිදුෂ්කර දේ කණපරවලනු සේ හැරදමන ලදි යන අර්ථයි. **යාචකෙ** යනු යදියනට දී. **අලකං** යනු; ගාල. යම්සේ ඍෂභයා ගාල බිඳගෙන සුවසේ කැමති තැනට යන්නේ ද මෙසේ මහපුරිස්හුද ගෘහබන්ධන කඩා අභිසම්බෝධියට පත්වූහ යන අර්ථයි. නැවත සාරමසක් චාරිකාවෙහි හැසිරෙන කල්හි දසකෙළ දහසකට දෙවන ධර්මාවබෝධ ද්‍ය. යම්කලෙක සුන්දරනුවර දොර පියාගසමුල යමක ප්‍රාතිහාර්ය කරනසේක් ධර්ම දේශනා කළානු ද එකල පස්කෙළ දහසකට තෙවන ධර්මාවබෝධය විය. නැවත යමාමහ පෙළහර කොට අසුරයන් විසින් නොමැඩිය හැකි තව්තිසා භවනයෙහි සුධම්මා නම් දේව සභාවක් ඇත. එහි වැඩහිඳ දෙවියන්ට අනුග්‍රහ පිණිස සප්ත ප්‍රකරණ ඇති ඒජම් පිටකය දෙසන ලේස්ක් තෙකෙළ දහසක් දෙවියන්ට දහම් අමා පෙවූහ. එයින් කියන ලදි-

චතුමාසං යදා බුදෙධා ලොකෙ චරති චාරිකං
දසකොටිසහසසානං දුතියාභිසමයො අහූ

යමකං විතුබබණං කත්වා ඤාණධාතුං පකාසයි
පඤ්චකොටිසහසසානං තතියාභිසමයො අහූ

සුධම්ම දෙවපුරෙ රමෙම තත්‍රධම්මං පකාසයි
තීනි කොටිසහසසානි දෙවානං බොධයී ජිනො

නරදෙවසස යකඛසස අපරෙ ධම්මදෙසනො
එතෙසානං අභිසමයා ගණනාතො අසංඛ්‍යාති

එහි **චතුමාසං** යනු; චතුමාසෙ යන්නයි. පාඨය මෙයම හෝ වෙයි. සිවුමසෙක්හි. **චරති** යනු; හැසුරුණෝය. **යමකං විතුබබණං කත්වා** යනු; යමක ප්‍රාතිහාර්ය කොට. **ඤාණධාතුං** යනු; සර්වඥතාඥාන ස්වභාවය.

සබබ ඤාණධාතු කියාත් කියති. **පකිත්තයී** යනු; මහජනයාට ප්‍රකාශ කළේය. **සුධම්මා** යනු; තව්තිසා භවනයෙහි සුධර්මා නම් සභාවක් ඇත. එහි වැඩහිඳ යන අර්ථයි. **ධම්මං** යනු; අභිධර්මයයි.

එකල අනුභසින් දිනන ලද නරදෙවියන් ඇති නරදේව නම් මහේශාක්‍ය යට කියන ලද නරදේව යක්‍ෂයා වැනි මහත් ඍද්ධි ඇති යක්‍ෂයෙක් විය. හෙතෙම දඹදිව එක්තරා නගරයක රජුට සමාන රූපය එබඳුම රූ සලකුණු හැසිරීම් ආකල්ප මවාගෙන ඒ රජු මරා කා ඇතොවුර සහිත රාජ්‍යය ලැබ අප්‍රමාණ මස් බුදින්නෙක් විය. යම්කලෙක ඔහු දක්‍ෂ කුසල ස්ත්‍රීහු මේ අපගේ රජ නොවේ යකෙකැයි දැනගනිත්ද එකල ඔහු ලජ්ජිතව ඒ සියල්ලන් කා දමා වෙනත් නගරයකට යයි. මෙසේ ඒ නරදේව යක්‍ෂයා මිනිසුන් කමින් යම්කලෙක සුනඳ නගරය බලාගියේද එකල ඔහු දක නුවරවැසි මිනිස්සු මරණ බයින් තැතිගත්තාහු සිය නුවරින් නික්ම ඒ ඒ අතින් පලාගියහ. එවිට පලායන ඒ මිනිසුන් දක කසසප දසබලයන් වහන්සේ ඒ නරදේව යක්‍ෂයා ඉදිරියෙන් සිටි සේක. නරදේව වැඩසිටි දේවදේවයන් වහන්සේ දක ගොරනද දී භාග්‍යවතුන් වහන්සේට බිය ඉපිදවීමට නොහැකිව සරණ ගොස් ප්‍රශ්න ඇසීය. ප්‍රශ්න විසඳා ඔහු දමනය කොට උන්වහන්සේ ධර්ම දේශනා කරන කල පැමිණි ගණන් සීමා ඉක්මවූ දෙවි මිනිසුන්ට ධර්මාවබෝධ විය. එහෙයින් නර දේවස්ස **යකඛස්ස** ආදිය කියන ලදි.

එහි **අපරෙ ධම්මදෙසනෝ** යනු; වෙනත් ධර්ම දේශනයෙක්හි. **එතෙසානං** යනු; එතෙසං යනුයි. මෙයම හෝ පාඨයි, මොවුන්ට. ඒ කස්සප භාග්‍යවතුන් වහන්සේට එකම ශ්‍රාවක සන්නිපාතයක් විය. බරණැස් නුවර තිස්ස නම් පුරෝහිත පුත්‍රයෙක් විය. ඔහු කස්සප බෝසතුන්ගේ ශරීරයෙහි ලක්‍ෂණ සම්පත් දක පියාගේ වදන් අසා නිසැකයෙන් මෙතුමා මහබිනික්මන් නික්ම බුදුවන්නේයයි මම මුන්වහන්සේ වෙත පැවිදිව සසර දුකින් මිදෙන්නෙමියි සිතා පිරිසිදු මුනිගණ ඇති හිමවතට ගොස් තවුස් පැවිද්දෙන් පැවිදි විය. උන්වහන්සේට පිරිවර වූ විසිදහසක් තාපසයෝ වූහ. උන්වහන්සේ පසුකලෙක කසසප කුමරා නික්ම අභිසම්බෝධියට පැමිණියේ යයි අසා පිරිවර සහිතව අවුත් කසසප භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහිභික්‍ඛු පැවිද්දෙන් පැවිදිව රහත් වූහ. කස්සප භාග්‍යවතුන් වහන්සේ නවම්පුන් පොහෝ දින ඒ සමාගමයෙහි පාමොක් දෙසූහ. එයින් කියන ලදි-

තසසාපි දෙවදෙවසස එකො ආසි සමාගමො
බීණාසවානං විමලානං සනත චිතතාන තාදිනං

වීසති භිකඛුසහසසානං තදා ආසි සමාගමො
අතිකකනතරාගවනතානං හිරිසීලෙන තාදිනෙති

එහි අතිකකනතරාගවනතානං යනු; පුහුදුන් බව ඉක්මවූ සෝතාපන්නාදීන්ගේ, සියලු කෙලෙස් ක්ෂයවයන්ගේ යන අර්ථයි. හිරිසීලෙනතාදිනං යනු; හිරියෙන් ද සීලයෙන් ද සහනයන්ගේ, එකල බෝසත්හු ජොතිපාල නම් ත්‍රිවේදයෙහි පාරගත අහස පොළොව ප්‍රකට තරුණයෙක්ව සටිකාර තුම්හකාරගේ යහළුවෙක් වූහ. හෙතෙම ඔහු සමග ශාස්තෘන් වහන්සේ කරා ගොස් උන්වහන්සේගේ දහම් කතා අසා මහණ විය. උන්වහන්සේ ආරබධවීර්යව තුන්පිටකය ඉගෙන වත්පිළිවෙතින් බුදුසසුන හෙබවූහ. උන්වහන්සේට ඒ ශාස්තෘන් වහන්සේ ද විවරණ දුන්හ. එයින් කියන ලදි-

අහං තෙන සමයෙන ජොතිපාලොති විසසුතො
අජඣායකො මනතධරො තිණණං වෙදානපාරගු

ලකඛණෙ ඉතිහාසෙ ච සධමෙම පාරමිං ගතො
භූමමනතලිකෙඛ කුසලො කතවිජෙජා අනාමයො

කසසපසෙස භගවතො සටිකාරො නාමුපටඨාකො
සගාරත්වා සපපතිසෙසා නිබබුතො තතියෙ එලෙ

ආදාය මං සටිකාරො උපගඤජි කසසපං ජිනං
තසස ධමමං සුණිත්වාන පබබජි තසස සන්තිකෙ

ආරදධවිරියො හුත්වාන චතතාවතෙතසු කොවිදො
න ඛවි පරිහායාමි පූරෙමි ජිනසාසනං

මම අවජඣායං දිසවා සොපි බුදෙධා විසාකරි
ඉමෙහි භදදකෙ කපෙප අයං බුදෙධා භවිසසති

අහූ කපිලවහයෙ රමෙම -පෙ-

තසසාහං වචනං සුත්වා හටෙඨා සංවිගගමානසො
උතතරිං වතමයිටඨාසිං දසපාරමී පූරියා

එවමහං සංසරිත්වා පරිවජෙජනෙතා අනාචාරං
දුකකටං ච කතං මයහං බොධියා එවකාරණාති

එහි භූමමනතළිකෙඛ කුසලො යනු; බිම් පරීක්ෂාවෙහි ද ජ්‍යොතිෂ චක්‍රාචාරයෙහි ජ්‍යොතිර් විද්‍යාවෙහි ද දක්ෂ වූයේ යන අර්ථයි. උපටඨාකො යනු; උපස්ථායක වූයේ. සපපතිසෙසා යනු; සපපතිසසයො යනුයි. ප්‍රධානියෙක්. නිබබුතො යනු; විනීත වූයේ හෝ ප්‍රකට වූයේ. තත්‍රවයෙ ඵලෙ යනු; නිමිත්ත සත්තමියයි. තුන්වන ඵලය අවබෝධ කිරීම හේතුවෙන් නිවුණේ යන අර්ථයි. ආදාය යනු; ගෙන. වතතාවකෙසු යනු; කුඩාවත් මහවත්හි. කොවිදො යනු; දක්ෂ වූයේ. ඒවා පිරීමෙහි දක්ෂ වූයේ. න ඤචි පරිහායාමි යනු; යම්කිසි සීලයන්හි හෝ සමාධි සමාපත්ති ආදියෙහි හෝ කිසිතැනෙක කොතැනින් හෝ නොපිරිහෙමි. සැමතන්හි මාගේ පිරිහීමක් නම් නැතැයි දක්වයි. න කොචි පරිහායාමි කියා ද පාඨයි. අර්ථය එයමැයි. යාචතා යනු; මෙය සීමාවාචක පදයකි. යම්තාක් යන අර්ථයි. බුදධභණිතං යනු බුදධවචනයයි. සොභයිං යනු; සොභාමත් කළෙමි. මම අචඡරියං යනු; මාගේ සම්‍යක් ප්‍රතිපදාව අන්‍යයන්ට වඩා අසාධාරණ ආශ්චර්ය අද්භූතය. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ(මා) දැක යන අර්ථයි. සංසරිත්වා යනු; සසර සැරිසරා. අනාධාරං යනු; අනාචාරය නොකළයුත්ත නොකටයුත්ත යන අර්ථයි. ඒ කසසප භාග්‍යවතුන් වහන්සේගේ උපන් නුවර බාරාණසී නම්විය. බ්‍රහ්මදත්ත බ්‍රාහ්මණ පියාණෝය. පරම ගුණවත් ධනවතී නම් බ්‍රාහ්මණිය මෑණියෝය. තිස්ස භාරද්වාජ දෙනම අග්‍රශ්‍රාවකයෝය. උපස්ථායක සබබමිතත නම්. අනුලා උරුවෙලා දෙනම අග්‍රශ්‍රාවිකාවෝය. නිග්‍රොධ රුක බෝධියයි. ශරීරය විසිරියන් උස්විය. ආයුෂ විසිවස් දහසකි. උන්වහන්සේගේ අගමෙහෙසි බිරිඳ නන්දා නම්. පුත්‍රයා විජිතසේන නම්. ප්‍රාසාද යානයෙන් අබිනික්මන් කළහ. එයින් කියන ලදි-

නගරං බාරාණසී නාම කිකීනාමාසි බතතියො
වසති තත්‍ථ නගරෙ සමබුදධසස මහාකුලං

බ්‍රාහමණො බ්‍රහමදතෙතා ච ආසි බුදධසස සො පිතා
මාතා ධනවතී නාම කසසපසස මහෙසිනො

තිසෙසා ච භාරද්වාජොව අහෙසුං අගගසාවකා
සබබමිතෙතා උපටඨාකො කසසපසස මහෙසිනො

අනුලා ච උරුවෙලා ච අහෙසුං අගගසාවිකා
බොධිනසස භගවතො නිග්‍රොධොති පවුචචති

උචචතතනෙන සො බුදෙධා වීසතිරතනමුගගතො
විජජුලටඨීව ආකාසෙ චනදොව ගහපූරිතො

වීසතිවසසසහසසානි ආයු තසස මහෙසිනො
තාවතා කිටඨමානො සො කාරෙසි ජනතං බහුං

ධමමතළාකං මාපෙතවා සීලං දතවා විලෙපනං
ධමමදුසසං නිවාසෙතවා ධමමමාලං විහජජිය

ධමමවිමලමාදාසං ඨපයිතවා මහාජනෙ
කෙචි නිබබාණං පතථෙනතා පසසනතු මෙ අලංකරං

සීලකඛනධකං දතවාන ඣානකවචවමමිතං
ධමමචමමං පාරුපිතවා දතවා සනනාහමුතතමං

සතිඵලකං දතවාන තිබිණං ඤාණකුනතිමං
ධමමඛගගවරං දතවා සීලං සංසගගමදදනං

තෙවිජජහුසණං දතවා ආවෙලං චතුරො ඵලෙ
ජළභිඤඤාභරණං දතවා ධමමපුපඵපිළාන්ධනං

සදධමම පණඩරවඡතතං දතවා පාපනිවාරණං
මාපයිතවාභයං පුපඵං නිබබුතො සො සසාවකො

එසො හි සමමා සමබුදෙධා අපපමෙයයා දුරාසදො
එසො හි ධමමරතනො සවාකඛාතො එහිපසසිකො

එසො හි සංඝරතනො සුපපටිපනෙනා අනුතතරෝ
සබබං සමනතරහිතං නනුරිනතා සබබසංඛාරාති

එහි විජජුලටඨීව යනු; මෙය භාවයෙන් සිටි විදුලියක් මෙන්. චනදොව ගහපූරිතො යනු; පිරිවර ග්‍රහයන් වටකරන ලද සඳ මෙන්. ධමමතළාකං

මාපෙත්වා යනු; පර්යාප්තිධර්ම තටාකය මවා. **සීලං දත්වා විලෙපනං** යනු; චතුපාරිශුද්ධිශීල සංඛ්‍යාත චිත්තසන්තතිය සැරසීම පිණිස වූ විලෙපනයදී. **ධම්මදුසඤ්ච නිවාසෙත්වා** යනු; හිරි ඔත්තප්ප සංඛ්‍යාත සළුයුගල හඳවා. **ධම්මමාලං විභජිත්ය** යනු; සත්තිස් බෝධිපාක්ෂිකධර්ම නම් කුසුම්මාලාව බෙදා. සරසා යන අර්ථයි. **ධම්මවිමලමාදාසං** යනු; නිර්මල වූ සෝවාන් මාර්ග සංඛ්‍යාත දර්පණතලය. සාවද්‍ය නිරවද්‍ය කුසල අකුසල ධර්ම සැලකීම පිණිස මහජනයාට ධර්මතටාක කෙරෙහි ධර්ම දර්පණය තබා යන අර්ථයි. **මහාජනෝ** යනු; මහජනයාට. **කෙචි නිබ්බා නං පත්ථෙනත්තා** යනු; නිර්මලවූ ද සෝවාන්මඟ සියලු අකුසල කිලිටි නසාදමන අමෘත සංඛ්‍යාත අසංඛත අනිත්‍යික පරමශාන්ත අචුතිරස නිර්වාණය පතන්නාහු හැසිරෙති. ඔවුහු උකතප්‍රකාර මා විසින් දක්වන ලද අලංකාරය දකිත්වා යන අර්ථයි. **නිබ්බානමභිපත්ථෙනෙතා පසියනතුඛ අලංකරං** යනු ද පාඨයි. අර්ථය එයමැයි. අලංකරං යයි හ්‍රස්ව කොට දක්වන ලදි. **සීලකඤ්චුකං** යනු; පන්සිල් දසසිල් සිවුපිරිසිදු සිල්මවූ සැටිටය. **ඣානකවචමමිතං** යනු; චතුෂ්ක පංචක ධ්‍යාන සන්නාහය බැඳ **ධම්මචම්මං පාරුජිත්වා** යනු; සතිසම්පජඤ්ඤ සංඛ්‍යාත සන්නාහය පෙරවා දත්වා සනනාහමුත්තමං යනු; උතුම් චතුරංග සමන්නාගත වීර්යය නමැති සන්නාහය දී කොට යන අර්ථයි. **සතිඵලකං දත්වාන** යනු; රාගාදි දොස් නමැති සතුරන් වැළැක්වීම පිණිස සතර සතිපටඨාන නමැති පලිහ දී. **තිබ්බිණං ඤාණකුනතිමං** යනු; ප්‍රතිවේධ සම්‍රර්තා ඇති තියුණු විදර්ශනාඥාන නමැති කුන්ත ඇති විදර්ශනාඥාන නමැති මුවහත් උතුම් කුන්තය යන අර්ථයි. කෙලෙස්බල නසන යෝගාවචරයා සිටුවා යන අර්ථයි. **ධම්මබගගවරං දත්වා** යනු; වීර්යය නමැති ගලගා සියුම් මුවහත් කළ මාර්ගප්‍රඥා නමැති උතුම් කඩුව දී. සීලං සංසඟගමදදනං යනු; ආර්ය ලෝකෝත්තර ශීලය, කෙලෙස් සංසර්ග මර්දනය පිණිස, කෙලෙස් නැසීම පිණිස යන අර්ථයි. **තෙවිජජා භූසණං දත්වා** යනු; ත්‍රිවිද්‍යාමය ආභරණ දී. **ආවෙලං චතුරෝ ඵලෙ** යනු; සතරඵල මුදුන්මල්කඩ කොට. **ඡළභිඤ්ඤාභරණං** යනු; ආභරණ පිණිස සැරසිලි කිරීම පිණිස ෂඩභිඥාවන් දී. **ධම්ම පුපඵපිළඤ්ඡකං** යනු; නවලෝකෝත්තර ධර්ම සංඛයාත කුසුම මාලා කොට. **සදධම්ම පණඩරවඡතතං දත්වා පාප නිවාරණං** යනු; සියලු අකුසල් නමැති අවිව වැළැක්වීම පිණිස විමුක්ති නමැති ඡේසත දී. **මාපධිත්වා භයං පුපඵං** යනු; අභය පුරගාමී අෂ්ටාංගික මාර්ග විකසිත කොට යන අර්ථයි.

කසසප භාග්‍යවතුන් වහන්සේ කසීරට සේතව්‍ය නුවර සේතව්‍ය උයන්හි පිරිනිවි සේක. උන්වහන්සේගේ ධාතු නොවිසුරුණේය. සියලු

දඹදිව් වැසි මිනිස්සු රැස්ව කෙළක් අගනා එක් එක් රන්ගඩොළුද පිටත සැරසිලි සඳහා රුවන් එබූ අඩකෙළක් අගනා එක් එක් ගඩොළු ද ඇතුළත පිරවීම සඳහා මනොසිලාමය මැටිකිසද උදක කෘත්‍යය සඳහා තෙල් ද ගෙන යොදුනක් උස ස්තූපයක් කළහ.

කළ කිස ඇති ලෝකානන්දකර කසුප් භාග්‍යවතුන් වහන්සේ සියලු සතුන්ට හිතවැඩම සලසමින් කාසිරාජ නගරයෙහි මිගදායෙහි විසූ සේක. සෙසු ගාථාවල සියලු අර්ථ ප්‍රකටය.

මෙසේ මධුරත්ථ විලාසිනී බුදුධවංස අටඨකථාවෙහි
කසසප බුදුධවංස වර්ණනාව නිමියේය.

මෙතෙකින් සූවිසි බුදුවරයන් වහන්සේලාගේ වර්ණනාව සියලු අයුරින් සමාප්තය.

දැන් අප බුදුරදුන්ගේ වංස වර්ණනාව ක්‍රමයෙන් පැමිණියේය. එහෙයින් මේ එහි වර්ණනාවයි. එහිලා අප බෝසතාණෝ දීපංකරාදි සූවිසි බුදුවරුන් හමුවෙහි ප්‍රාර්ථනා කරමින් සාරාසංඛ්‍ය කප් ලක්ෂයක් පැමිණියහ. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගෙන් පසුභාගයෙහි මේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ හැර වෙනත් බුදුකෙනෙක් නම් නැත්තාහ, මෙසේ දීපංකරාදි සූවිසි බුදුවරුන් ලබන ලද විවරණ ඇති බෝසතාණෝ යම් ඒ

මනුෂ්‍යත්වය ලිංගසම්පත්තිය හේතු ශාස්තෘන් වහන්සේ හමුව
පැවිද්ද ගුණ සම්පත්තිය ප්‍රාර්ථනාව යන අටදහම ගැළපීමෙන්
ප්‍රාර්ථනාව සපිරෙයි යන
මේ අටදහම ගළපා දිවතුරු පාමුල්හි කරන ලද ප්‍රාර්ථනයෙන්

ඒකාන්තයෙන් සැමතැන බුදුකාරක ධර්මයන් සොයමි.
සොයන්නෙම් පළමු දානපාරමිතාව දිටිමි යි

දානපාරමිතාදි බුදුකාරක ධර්මයන් දුටහ. ඒවා පුරන්නාහු වෙස්සන්තරාත්ම භාවය දක්වා පැමිණියහ. පැමිණෙන්නාහු කරන ලද යම් ඒ අභිනීහාරයන්හි ආනිසංස වර්ණනා කරන ලදි.

මෙසේ සකලාංග සම්පූර්ණ බුදුබවට නියත පුද්ගලයෝ කල්පකෝටි සියගණන් දිග සසර සැරිසරන්නාහු නමුදු අවීචියෙහි නූපදිති. එසේම ලෝකාන්තරිකවල ද නූපදිති. නිජඣාමතණ්හික ඛුප්පිපාස කාලකඤ්ඤක නොවෙති. දුගතියෙහි ඉපදුන ද ක්ෂුද්‍රප්‍රාණීහු නොවෙති. මිනිසුන් අතර උපදනා ඔවුහු ජාත්‍යන්ධයෝ නොවෙති. කර්ණ විකලතා නොවෙයි. ගොළු නොවෙති. ස්ත්‍රීත්වයට නොයති. උභතොබ්‍යඤ්ජක පණ්ඩක නොවෙති. බෝධියට නියත උතුමෝ පර්යාපන්න නොවෙති. ආනන්තරිකයන්ගෙන් වෙන්වූවාහු හැමතන්හි පිරිසිදු චර්යා ඇත්තෝ කර්මවාදී ක්‍රියාවාදී දර්ශන ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිය ඇසුරු නොකරති. ස්වර්ගයෙහි සිටියත් අසංඥ තලයෙහි නූපදිති. සුදවැසි දෙවියන් අතර ඉපදීමට හේතුවක් නොවෙයි. නෛෂ්ක්‍රම්‍යයට නැමුණු සත්පුරුෂයෝ සසර නොඇලී සියලු පාරමී පුරන්නාහු ලෝකාර්ථචර්යාවෙහි හැසිරෙති.

එම ආනිශංස ලබා පැමිණියහ. මෙසේ පැමිණෙන්නාහු වෙසතුරු අත්බැව්හි සිටියාහු.

අචේතන ව මේ පොළොව සුවදුක් නොදැන මාගේ දාන බලයෙන් සත්වරක් කම්පාවිය.

මෙසේ මහපොළොව කම්පා කරවන මහපින් කොට ආයු කෙළවර එතැනින් චුතව තුසිත භවනයෙහි උපන්හ. බෝසතුන් තුසිත භවනයෙහි වසද්දී බුද්ධකෝලාහල නම් කෝලාහලයක් ඇතිවිය. ලොව වනාහි තුන් කෝලාහලයක් උපදී. ඒ මෙසේයි. කල්ප කෝලාහලය බුද්ධ කෝලාහලය චක්‍රවර්ති කෝලාහලය කියායි. එහි වසර ලක්‍ෂයක් ඇවෑමෙන් කල්ප විනාශය වන්නේ යයි ලෝකබ්‍යූහ නම් කාමාවචර දෙවියෝ කෙස් මුදාගෙන කෙස් විසුරුවා ගෙන හැඬූ මුහුණින් අතින් කඳුළු පිසිමින් රතුපිළි හැඳ අතිශයින් විරූපවෙස් ඇතිව මිනිස් පියෙස්හි ගැවසෙමින් මෙසේ දැනුම් දෙති. නිදුක්වරුනි, නිදුක්වරුනි, මෙයින් වසර ලක්‍ෂයක් ඇවෑමෙන් කප නැගීම වෙයි. මේ ලෝකය වැනසෙයි. මහමුහුදත් වියලෙයි. මේ මහපොළවත් මහාමෙරු පර්වත රාජයාත් දවෙයි. වැනසෙයි. බ්‍රහ්මලොව දක්වා ලෝකවිනාශය වෙයි. නිදුක්වරුනි, මෙත් වඩව්. කරුණාව, මුදිතාව, උපේක්ෂාව වඩව්. මවට, පියාට උපස්ථාන කරව්. කුලදෙව් වන් පුදන්නෝ වව් කියායි. මෙය කල්ප කෝලාහලයයි.

වර්ෂ ලක්‍ෂයක් ඇවෑමෙන් සර්වඥ බුදුකෙනෙක් ලොව උපදනාහයි ලෝකපාල දේවතාවෝ නිදුක්වරුනි, මෙයින් වසර ලක්‍ෂයක් ගියකල බුදුකෙනෙක් ලොව උපදනාහයි උද්ඝෝෂණය කරමින් ඇවිදිති. මෙය බුද්ධ කෝලාහල නම්. වසර සියයක් ගෙවීමෙන් සක්විති රජෙක් උපදනේ යයි දේවතාවෝ නිදුක්වරුනි, මෙයින් වසර සියයක් ගෙවීමෙන් සක්විති රජෙක් උපදනේ යයි ඝෝෂා කරමින් ඇවිදිති. මෙය චක්‍රවර්ති කෝලාහලය නම්. එයින් බුද්ධ කෝලාහලය අසා සියලු දසදහසක් සක්වළ දේවතාවෝ එකට රැස්ව අසවල් නම් සත්වයා බුදුවන්නේ යයි දැන වෙත පැමිණ ආයාචනා කරති. ආයාචනා කරන්නාහු උන්වහන්සේගේ පෙරනිමිති උපන්කල්හි ආයාචනා කරති. එකල්හි වනාහි ඒ සියලුම එක් එක් සක්වළ චතුමමහාරාජ ශක්‍ර සුයාම සන්තුසිත වසවර්ති මහාබ්‍රහමයන් සමග එක් සක්වළෙක රැස්ව තුසිත භවනයෙහි උපන් චුතිනිමිති ඇති බෝසතුන් වෙත ගොස් නිදුකාණනි, ඔබවහන්සේ විසින් දසපැරුම් පුරන ලදි. පුරද්දී ශක්‍ර බ්‍රහ්ම ආදි සම්පතක් පතමින් නොපුරන දි. ලෝකයා එතෙර කරනු පිණිසම බුද්ධත්වය පතාගෙන සපුරන ලදි. බුදුබව පිණිස-

මහාවීරයාණනි, මේ ඔබට කාලයයි. මවුකුස උපදිනු මැනවි.
දෙවියන් සහිත ලෝකයා තරණය කරමින් අමාපදය
අවබෝධ කරනු මැනවි.

කියා ආයාචනා කළහ. මෙසේ දෙවියන් විසින් අයදිනු ලබන්නාහු දෙවියන්ට ප්‍රතිඥාවක් නොදීම කාල දීප දේස කුල මවගේ ආයු පරිච්ඡේදය වශයෙන් පස්මහබැලුම් බැලූහ. එහි වර්ෂ ලක්ෂයකින් වැඩි ආයු කාලය කාලනම් නොවෙයි. කුමක් නිසාද? එකල සත්වයන්ගේ ජාති ජරා මරණ ප්‍රකට නොවෙයි. බුදුවරුන්ගේ ධර්මදේශනා තිලකුණෙන් මිදුණේ නම් නොවෙයි. අනිච්චං දුක්ඛං අනත්තායි කියන ඔවුන්ට මේ කුමක් නම් කියන්නේදැයි ඇසිය යුත්තක් කොට ඇදහිය යුත්තක් කොට නොහඟිති. එසේ ඇතිකල සසුන අනෙර්යානික වෙයි. එබැවින් එය අකාලයයි. වසර සියයන් අඩු ආයු කාලය ද කාලය නොවෙයි. කුමක් නිසාද? එකල සත්වයෝ උත්සන්න කෙලෙස් ඇත්තෝ වෙති. උත්සන්න කෙලෙස් ඇත්තවුන්ට දුන් අවවාදය අවවාද ස්ථානයෙහි නොසිටී. දියෙහි ඇඳි රේඛාව මෙන් වහා මැකී යයි. එබැවින් එයද අකාලයයි. වර්ෂ ලක්ෂයෙහි පටන් යට වර්ෂා සියයෙහි පටන් උඩ ආයු කාලය කාල නම්. එකල වනාහි සියවස් ආයුකාලය විය. එවිට මහසත්හු ඉපදිය යුතු කාලයයි දුටහ. ඉක්බිති ද්වීපය බලන්නාහු පිරිවර සහිත සතර දිවයින් බලා තුන් දිවයිනක බුදුවරු නූපදිති. දඹදිවම උපදිතියි ද්වීපය දුටහ. ඉක්බිති දඹදිව නම් දසදහස් යොදුන් පමණ විශාලය. කවර නම් පෙදෙසක බුදුවරු උපදිත්දැයි අවකාශ බලන්නාහු මධ්‍යමදේශය දුටහ. කපිලවත්තු නගරයයි, මා එහි ඉපදිය යුතුයයි නිෂ්ටාවට පැමිණියහ. ඉක්බිති කුලය බලන්නාහු බුදුවරු නම් වෛශ්‍ය කුලයෙහි හෝ ශූද්‍ර කුලයෙහි හෝ නූපදිති. ලෝකසම්මත කැත් කුලයෙහි හෝ බමුණු කුලයෙහි උපදිති. මෙකල කැත් කුලය ලෝකසම්මතය. එහි උපදිමි. සුද්ධෝදන නම් රජ මාගේ පියා වෙතියි කියා කුලය දුටහ. අනතුරුව මෑණියන් බලන්නාහු බුද්ධමාතාව නම් ලොල් සුරාසොඬ නොවන්නිය. කප්ලක්ෂයක් පුරන ලද පාරමී ඇති උපතෙහි පටන් නොකඩ පන්සිල් ඇත්තී වෙයි. මේ මහාමායා දේවිය නම් එබඳුය. ඕ මාගේ මෑණියෝ වෙති. ඇගේ ආයු කොපමණදැයි බලන්නාහු දසමසින් මතු සත්දිනකැයි දුටහ.

මෙසේ මේ පස්මහ බැලුම් බලා නිදුක් වරුනි, මට බුදුබව සඳහා කාලයයි දෙවියන්ට ප්‍රතිඥා දී තෙපි යව් කියා ඒ දෙවිවරුන් පිටත්කොට තුසිත දෙවිවරුන් පිරිවරන ලද්දාහු තුසීපුර නන්දනවනයට පිවිසියහ. සියලු දිව්‍යලෝකවල නන්දනවනය ඇත්තේය. එහි උන්වහන්සේට දෙවිවරු මෙයින් චුතව සුගතියට යවයි කියා පෙර කළ කුශල කර්මයන් සිහි කරවමින් ඇවිදිති. මෙසේ කුසලකර්ම සිහි ගන්වන දෙවියන් පිරිවරන ලද උන්වහන්සේ එහි හැසිරෙන්නාහු එයින් චුතව උතුරුසල නැකතින්

මහාමායා දේවිය කුස පිළිසිඳ ගත්හ. මහසත්හු පිළිසිඳ ගත් සැණින් එකපැහැර දසසහස්‍රී ලෝකධාතුව කම්පා විය. දෙතිස් පෙරනිමිති පහළ විය. මෙසේ පිළිසිඳ ගත් බෝසතුන්ට ද බෝසත් මෑණියන්ට ද උවදුරු වළකනු පිණිස කඩු ගත් අත් ඇති දෙවිවරු සතර දෙන අරක් ගත්හ. බෝසතුන්ගේ මෑණියන්ට පුරුෂයන් කෙරෙහි රාග සිතක් නොවීය. ඕ ලාභයෙන් අගතැන්පත් ද වූවාය. සුවඇත්ති ක්ලාන්ත ශරීර ඇත්ති තුවූවාය. සිය කුස පත් බෝසතුන් ද පසන් මිණිරුවනක අවුනන ලද පඬුවන් සූත්‍රයක් මෙන් දක්නීය. යම් හෙයකින් බෝසතුන් විසූකුස සෑගැබක් මෙන් වන්නේ ද එහෙයින් අන් සත්වයන්ගේ වාසයට හෝ පරිභෝගයට නොහැකි වන්නේය. එබැවින් බෝසත් මාතාව බෝසතුන් උපන් සත්දිනකින් කළුරිය කොට තුසිතපුරයෙහි උපදී. යම්සේ වෙනත් ස්ත්‍රීහු දසමස නොපැමිණ ද ඉක්මවාද හිඳගෙන ද වැදහෙව ද වදත් ද බෝසත් මාතාව එසේ නොවෙයි. ඕතොමෝ බෝසතුන් දසමස් කුසින් දරා හිටගෙනම ප්‍රසූත කරයි. මෙය බෝධිසත්ව මාතෘධර්මතාවයි.

මහාමායා දේවිය දසමසක් බෝසතුන් කුසින් දරා පිරිපුන් ගැබ් ඇත්ති නෑ ගෙදරට යනු කැමතිව මහරජ, මම දෙව්දහ නුවරට යනු කැමැත්තෙමි යි සැලකළාය. රජ යහපතැයි පිළිගෙන කපිල පුරයෙහි පටන් දෙව්දහ නුවර දක්වා මඟ සමකොට කෙසෙල් පුන්කුඹු පතාකාදියෙන් සරසවා දේවිය රන්සිවිගෙයක හිඳුවා මහත් සැපතින් මහත් පිරිවරින් පිටත් කළේය. දෙනුවර අතර දෙනුවර වැස්සන්ගේ පරිභෝගයට සුදුසු ලුම්බිණිවන නම් මංගල සල්වනයක් ඇත. එය එකල මුලපටන් අග දක්වා මුළුමනින් පිපී ගියේය. ශාඛා අතර ද මල් අතර ද පරම සිත් ගන්නා මදමත් නදින් යුත් සතුන් ගැවසීමෙන් මීමැස්සියන්ගේ මධුර නාදයෙන් දෙවියන් තුටුකරවන නෑඳන වනය මෙන් ශෝභාසම්පන්න උයන දැක දේවියට සල්උයන්හි ක්‍රීඩා කිරීමට සිත් විය.

> බාල ජනයින් අතිශයින් කුල්මත් කරන්නා වූ වූ මලින් සරසන ලද සිරුරු ඇති වනිතාවක මෙන් හැමදා ජනයාගේ නුවන් බිඟුදුල් කළඹමින් ලුම්බිණි සල්වනය අතිශයින් බැබළුණේය.

ඇමතියෝ රජුට දන්වා දේවිය කැඳවා ගෙන ඒ ලුම්බිණි උයනට වන්හ. ඕතොමෝ මඟුල් සල්රුක මුලට ගොස් සමවට සෘජු කඳ ඇති ඒ සල්ගස්හි මල්පල් දලුයුත් යම් ශාඛාවක් යනු කැමති වූවා ද ජනහද ලොල්වඩන අචල එම ශාඛාව තමාම නැමී ඇගේ අත්ලට පැමිණියේය.

ඉක්බිති දේවිය ඒ සල්අත්ත තඹතුගුනියෙන් බබළන පියුම් දලුවක් සේ වට ඇඟිලිවලින් නවකනක වළල්ලෙන් ශෝභමාන පරමරනිකර කරතලයෙන් ගත්තාය. ඕතොමෝ ඒ ශාලශාඛාව අල්වාගෙන සිටින්නී නිල්මේඝුළු විවරගත නවසඳ රේඛාවක් මෙන්ද නොබෝ කල් පවත්නා ගිනිසිළු ආලෝකයක් මෙන්ද නදුනුයන් හි ජනිත දෙවඟනක මෙන් ද බැබළුණාය. එකෙණෙහි ම ඇයගේ කර්මජ වාතය සැලිණ. එවිට ඇයට වටතිරයක් අදවා කිරිමවුන් ඉදිරියෙහි සිටුවා මහජනයා නික්මුණාහ. සල්අත්ත අල්වාගෙන සිටින්නියගේම ගැබිනිගීම සිදුවිය. එකණෙහිම මහාබ්‍රහ්මයෝ සතරදෙනෙක් රන්දුලක් ගෙන ගොස් ඒ රන්දුලින් බෝසතුන් පිළිගෙන මව ඉදිරියෙහි තබා දේවිනී, සතුටුවුව මැනව. ඔබට මහේශාක්‍ය පුතෙක් උපන්නේ යයි කීහ. යම්සේ වනාහි වෙනත් සත්වයෝ මවුකුසින් නික්මෙන්නාහු පිළිකුල් අසුචියෙන් තැවරීගෙන නික්මෙත්ද බෝසත්හු එසේ නොවෙති. උන්වහන්සේ වනාහි දෙඅත්පා දිගහැර හිටිවනම මවුකුස හටගත් කිසිදු අසූචියකින් නොතැවරීම පිරිසිදුව පැහැදිලිව කසීවතක තැබූ මිණිරුවනක් මෙන් බබළමින් මවුකුසින් නික්මුණහ. එසේ වුවද බෝසතුන්ට සහ බෝසත් මෑණියන්ට සත්කාර පිණිස අහසින් දෙදිය දහරක් නික්ම බෝසතුන්ගේ සහ මෑණියන්ගේ සිරුරු සෘතු ගැන්වීය.

එවිට උන්වහන්සේ රන්දුලින් පිළිගෙන සිටි බඹුන්ගේ අතින් සිවුමහ රජවරු මංගල සම්මත සුවපහස් ඇති අඳුන් දිවිසම් ඇතිරියෙන් පිළිගත්හ. ඔවුන් අතින් මනුෂ්‍යයෝ දුහුල් සළුවකින් පිළිගත්හ. මිනිසුන් අතින් මිදී පොළොවෙහි පිහිටා නැගෙනහිර දිශාව බැලූහ. නොඑක් දහසක් සක්වල එකම මිදුලක් විය. එහි දෙවි මිනිස්සු ගඳමල්මාලාදියෙන් පුදන්නාහු මහාපුරුෂය, ඔබට සමානයෙක් මෙහි නැත. උත්තරිතරයෙක් කොයින්දැයි කීහ. මෙසේ දසදිසා බලා තමහට සමානයකු නොදැක උතුරුදිග බලා සත් පියවරින් ගියහ. යන්නාහු පොළවෙන්ම ගියාහ. අහසින් නොගියහ. සළුරහිතවම ගියහ. සළු සහිතව නොගියහ. ළපැටිවම ගියහ. සොළොස්වස් වූයේ නොගියහ. මහජනයාට වනාහි අහසින් යන්නාක් මෙන් ද අලංකාරයෙන් සැරසුණාක් මෙන් ද සොළොස්වස් ඇත්තකු මෙන් ද වූහ. ඉක්බිති සත්වන පියවරෙහි සිට ලොවට අග්‍රවෙමි ආදි උත්තම වදන් නිකුත් කරමින් සිංහනාද කළහ. බෝසතාණෝ තුන් ආත්මභාවයක මවුකුසින් නික්මුණු කෙණෙහිම වදන් පිටකළහ. මහෞෂධ අත්බැව්හි වෙසතුරු අත්බැව්හි සහ මෙම අත්බැව්හිය. මහෞෂධාත්ම භාවයෙහි මවුකුසින් නික්මුණු උන්වහන්සේ සක්දෙව්රජ අවුත් සඳුන් හරයක් අත තබා ගියේය. උන්වහන්සේ එය මිටෙහි තබාගෙනම බිහිවූහ. එවිට

මෑණියෝ උන්වහන්සේගෙන් දරුව, කුමක්ගෙන ආයෙහිදැයි විචාළහ. අම්මේ, ඔසුවකි. මෙසේ ඖෂධයක් ගෙන ආ බැවින් ඔසධ කුමාරයයි කියාම උන්වහන්සේට නම් කළහ. වෙස්සන්තරාත්ම භවයෙහි මවුකුසින් බිහිවත්ම දකුණත දිගුකොට අම්මේ, ගෙයි කිසිවක් තිබේද දන් දෙමියි කියමින් බිහිවූහ. එවිට මෑණියෝ දරුව, ධනවත් ගෙයක උපන්නෙහියයි පුතු අත සියතෙහි තබාගෙන දහසින් බැඳි පියල්ලක් තැබූහ. මේ අත්බැව්හි මේ සිංහනාදය කළහ. මෙසේ බෝසත්හු අත්බැව් තුනක මව්කුසින් බිහිවීමත් සමග බස් තෙපලූහ. උපන් මොහොතෙහි දෙතිස් පෙරනිමිති පහළ විය. යම්කලෙක අප බෝසතාණෝ ලුම්බිණි වනයෙහි උපන්නාහුද එසමයෙහි රාහුලමාතා දේවිය, ඡන්න කාළදායි ඇමති, ආජානීය ඇත්රජ, කන්ථක අස්රජ, මහබෝරුක, නිධන් සැළි සත ද උපන්හ. ඉන් එකක් ගවුවක් පමණය. එකක් අඩයොදුන් පමණය. එකක් තුන්ගවු පමණය. එකක් යොදුනක් පමණ ද විය. මේ සත සහජාත නම් වෙයි.

දෙනුවර වැස්සෝ මහාපුරුෂයන් ගෙන කිඹුල්වත් පුරයටම ගියහ. එදිනම සුදොවුන් රජුගේ පුත් බෝමුල හිඳ බුදුවන්නේයයි තව්තිසා භවනයෙහි තුටුපහටුවූ දෙව්සමූහයා පිළිසිසැරීම් ආදිය පවත්වමින් ක්‍රීඩා කළහ. එකල සුදොවුන් රජුගේ කුලූපග අෂ්ටසමාපත්තිලාභී කාලදෙවල නම් තාපස අහර වළඳා දිවාවිහාරය පිණිස තව්තිසා භවනයට ගොස් එහි දිවාවිහාරයෙන් හුන්නේ සතුටු සිතින් ක්‍රීඩා කරන ඒ දෙවියන් දැක කුමක් නිසා සතුටු සිතින් ප්‍රමුදිත හදින් කෙළනාහුද? මට ඒ කරුණ කියවයි කීය. ඒ දෙවියෝ නිදුකාණනි, සුදොවුන් රජුට පුතෙක් උපන්නේය. උන්වහන්සේ බෝමැඩ හිඳ බුදුවී දම්සක් පවත්වන්නාහ. උන්වහන්සේගේ අනන්තරූප බුද්ධලීලාව දක්නට ලබන්නෙමු. මේ නිසා සන්තෝෂ වෙමුයි කිහ.

එවිට තාපස ඔවුන්ගේ බස් අසා පරම දර්ශනීය රත්නාවලෝක ඇති දෙව්ලොවින් බැස රජමාලිගයට පිවිස පැනවූ අසුන්හි හිඳගත්තේය. අනතුරුව කරන ලද පිළිසඳර ඇති රජුට මහරජ, ඔබට පුතෙක් උපන්නේය. ඔහු දක්නට ලබමියි කීය. රජ මනාව සැරසූ පුතු ගෙන්වා තාපසයාට වැන්දවීමට යොමු කළේය. මහපුරුෂයන්ගේ පා කැරකී විදුලියක් මෙන් මෙකුළුතටයක් වන් තාපසජටාවෙහි පිහිටියේය. බෝසතුන් විසින් එම අත්බැව්හි වැඳිය යුතු අනිකෙක් නම් නොවෙති. ඉක්බිති තාපස අසුනින් නැගිට බෝසතුන්ට ඇඳිලි බැන්දේය. රජ ඒ අසිරිය දැක සියපුතු වැන්දේය. තාපස තෙම බෝසතුන්ගේ ලක්ෂණ සම්පත් දැක බුදුවන්නේද

නොවන්නේදැයි ආවර්ජනා කොට නිසැකයෙන් බුදුවන්නේ යයි අනාගත සඤ්ඤාණයෙන් දැන මේ ආශ්චර්ය පුරුෂයකැයි සිනාවිය. ඉක්බිති මම බුදුවූ මුන්වහන්සේ දක්නට ලබන්නෙමි දෝයි සලකන්නාහු නොලබන්නෙමි. අතුරතුරම කළුරිය කොට දහසක් බුදුවරුන් වැඩමකොටත් අවබෝධ නොකළ හැකි අරූප භවයෙහි උපදින්නෙමියි දක මෙබඳු ආශ්චර්ය පුරුෂයකු දක්නට නොලබන්නෙමි. මට මහත් හානියක් වන්නේ යයි නැවත හඬන්නට විය. මිනිස්සු ඒ දක අප ආර්යයෝ දැන්ම සිනාසී නැවත හඬන්නට පටන්ගත්හ. කිමෙක්ද ස්වාමීනි, අපගේ ආර්ය පුත්‍රයන්ට කිසි අනතුරක් වන්නේදැයි විචාළහ. උන්වහන්සේට අනතුරක් නැත. නිසැකවම බුදුවෙතියි තාපසයෝ කීහ. එසේ නම් ඔබවහන්සේ කුමකට හැඬුනු ද? මෙවැනි ආශ්චර්ය පුද්ගලයකු බුදුව දක්නට නොලබමි. ඒකාන්තයෙන් මට මහත් හානියක් වන්නේ යයි තමන් ගැන ශෝක වෙමින් හඬමියි කීහ.

ඉක්බිති පස්වන දින බෝසතුන් හිසෙහි නහවා සත්කාර කොට නම් ගන්වමුයි රජමාලිගය සිවුදෑගදින් පිරිබඩගන්නා ලදපස්මල් විසුරුවා නොකඩසහලින් කිරිබත් පිසවා ත්‍රිවේද පාරගත බමුණන්ට ආරාධනාකොට රජගෙයි හිඳුවා මීකිරිබත් වළඳවා සත්කාර කොට කවරෙක් වන්නාහුදයි ලකුණු පරීක්ෂා කරවූහ. ඔවුනතරින් රාම ආදි බමුණෝ අටදෙනෙක් පරීක්ෂා කරන්නෝ වූහ. ඔවුන්ගෙන් සත්දෙනෙක් ඇඟිලි දෙකක් ඔසවා මෙබඳු ලක්ෂණ යුක්තයෙක් ගිහිගෙයි වසන්නේ සක්විති රජ වෙයි. පැවිදි වන්නේ බුදුවෙයි කියා ප්‍රකාශ කළහ. ඔවුන්ගෙන් හැමට බාල කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණ බෝසතුන්ගේ වර ලකුණු සම්පත් බලා මුන්වහන්සේට ගිහිගෙයි විසීමට කරුණු නැත. ඒකාන්තයෙන් කෙලෙසුන් නසා බුදුවන්නානුයැ යි එකම ඇඟිල්ලක් ඔසවා කීය. එවිට උන්වහන්සේට නම් ගන්වන්නාහු සර්ව ලෝකාර්ථ සිද්ධිකාරක හෙයින් සිද්ධත්‍ථ යයි නම් කළහ. අනතුරුව ඒ බමුණෝ සිය ගෙවලට ගොස් තමන්ගේ පුතුන් අමතා මෙසේ කීහ. අප මහල්ලෝ වෙමු. සුදොවුන් මහරජුගේ පුතු බුදුබවට පැමිණිකල්හි අපි දක්නමෝ හෝ නොදක්නමෝ වෙම්වා. තෙපි මහණව උන්වහන්සේ බුදුවූ කල්හි උන්වහන්සේගේ සසුනෙහි පැවිදිවව් කියායි. ඉක්බිති සත්දෙනම ආයු පමණින් සිට කම්වූ පරිදි මියගියහ. කොණ්ඩඤ්ඤ මාණවක නිරෝගි විය.

එකල්හි ඒ රජ කුමක් දැක මාගේ පුත්‍රයා පැවිදි වන්නේදැයි ඔවුන්ගෙන් විමසීය. සතර පෙරනිමිත්ත දැකීමෙනැයි කීහ. කුමක් කුමක්ද? මහල්ලකු,

ගිලනකු, මළඑකකු, පැවිද්දකු යයි කීහ. රජ මෙවක් පටන් මෙබන්දන්ට මපුතු වෙත එළඹීමට නොදෙව් කියා කුමරාගේ ඇස්දුරට මහලු මිනිසුන් ආදීන්ගේ පැමිණීම වළකනු පිණිස සිවුදිග ගව්ව ගව්ව ආරක්ෂා තැබිය. එදින එතැන්හි රැස්වූ නෑකුල අසූදහසින් එක් එක්කෙනා එක එක පුතු පොරොන්දු වී මෙතෙම බුදු හෝ වේවා. රජ හෝ වේවා. අපි එක එක පුතු දෙන්නෙමු කියායි. ඉදින් බුදුවුවහොත් ශ්‍රමණ ශාක්‍යයන්ම පිරිවරා හැසිරෙයි. ඉදින් සක්විතිරජ වුවහොත් ශාක්‍යකුමරුන්ට පිරිවරා හැසිරෙයි කියායි. ඉක්බිති රජ මහාපුරුෂයාණන්ට පරමරූප සම්පන්න හැමදොස් රහිත කිරිමවුන් දුන්නේය. බෝසත්හු අනන්ත පිරිවරින් මහත් සිරිසැපතින් වැඩුණාහ.

අනතුරුව දිනක් රජුගේ වප්මඟුලක් විය. එදා රජ මහත් විභූතියෙන් මහපිරිවරින් වප්මඟුල් වප්කරන තැනට ගියේය. එහි රජ පරම මංගල රන්නඟුල ගනී. ඇමති ආදීහු රිදී නඟුල් ආදිය ගනිති. එදින නඟුල් දහසක් යොදති. බෝසතුන් පිරිවරා සිටි කිරිමවුවරු රජුගේ සම්පත් බලමුයි තිරය ඇතුළෙන් පිටතට නික්මුණහ. එවිට බෝසත්හු වටපිට බලන්නාහු කිසිවකු නොදැක වහා නැගිට පලක් බැඳ ආනාපානසති වඩා ප්‍රථමධ්‍යානය ඉපිදවූහ. කිරිමවුවරු කෑම් පීම් අතර ගැවසෙන්නාහු මඳක් පමාවූහ. සෙසු ගස්හි සෙවණැලි ආපසු හැරී ඒ දඹරුක්හි සෙවණ වටකොට එහිම පිහිටියේය. උන්වහන්සේගේ කිරිමවුවරු ආර්ය පුත්‍රයා තනිවමැයි වහා තිරපවුර ඔසවා බලන්නාහු සිරියහන්හි පලඟින් හුන්නහුද ඒ පෙළහර ද දැක ගොස් රජුට සැලකළහ. රජ වහා ගොස් පුත, මේ ඔබට දෙවන වැඳීම යයි පුතු වැන්දේය. බෝසත්හු අනුක්‍රමයෙන් සොළොස්විය පත්වූහ.

රජතුමා බෝසතුන්ට තුන් ඍතුවට සුදුසු රමම සුරම්ම සුභ නම් තුන්පහයක් කරවීය. එකක් නවමහල්ය. එකක් සත්මහල්ය. එකක් පස්මහල්ය. ප්‍රාසාද තුනම උසින් සමප්‍රමාණ විය. මහල්හි වනාහි නානාත්වය විය. ඉක්බිති රජ සිතීය. මාගේ පුත්‍රයා නිසිවයස් පත් ඔහුට සේසත් නඟා රජසිරි බලමි කියායි. හෙතෙම ශාක්‍යයන්ට ලියුම් යැවීමි. මාගේ පුත්‍රයා නිසිවයස් විය. ඔහු රාජ්‍යයෙහි පිහිටුවමි. සියල්ලෝ සිය ගෙවල වියපත් දරියන් මේ ගෘහයට එවත්වා කියයි. ඔවුහු රජුගේ හසුන් අසා කුමරා නුදෙක් රූපසම්පන්නය. කිසි ශිල්පයක් නොදනී. භාර්යා පෝෂණයක් නොකටහැකි වෙයි. අපි දියණියන් නොදෙමුයි කීහ. රජ එපවත් අසා පුතු ළඟට ගොස් ඒ බව කීය. බෝසතාණේ කවර ශිල්පයක් දක්විය යුතුදැයි කීහ. දරුව, දහසක් දෙන නගන දුන්න නැගිය යුතුයයි කීහ. එසේනම්

ගෙන්වනු මැනව. රජ ගෙන්වා දුන්නේය. ඒ දුන්නා පුරුෂයෝ දහසක් නගති. පුරුෂයෝ දහසක් බහාලති. මහපුරිස්හු එය සරාසනයට ගෙන්වාගෙන පර්යංකයෙහි හිඳගෙනම දුනුදිය පාඇඟිල්ලෙන් වෙළවා අදින්නාහු පාඇඟිල්ලෙන්ම දුන්න නගා වමතින් දණ්ඩ ගෙන දකුණතින් ඇද දුනුදිය නැංවූහ. මුළු නුවර ඉපිළෙන්නාක් මෙන් විය. මේ කිනම් ශබ්දයෙක්දැයි කිකල්හි මේඝගර්ජනා කරති කීහ. අනිකෙක් තෙපි නොදන්නාහුය. මේඝගර්ජනා නොවෙයි. දහසක් දෙන නගන දුන්න නගා දුනුදිය අපොළන දුනුදිය පහරෙහි ශබ්දයයි කීහ. ශාක්‍යයෝ ඒ අසා එපමණකින්ම සතුටුසිත් ඇත්තෝ වූහ.

එවිට මහපුරිස්හු කුමක් කළයුතුදැයි කීහ. අටඟුල් බොල ඇති යපට හීයෙන් විදිය යුතුයයි කීහ. එය විද තව කුමක් කටයුතුදැයි විමසූහ. සතරඟුල් සන ඊපලිහ විදිය යුතුයයි කීහ. එය විද වෙන කුමක් කළයුතුදැයි ඇසූහ. වියතක් සන උදුම්බර පුවරුව විදිය යුතුයයි කීහ. එයද විනිවිද අනික් කුමක්දැයි ඇසූහ. වැලිගැල ආදියයි කීහ. මහසත්හු වැලිගැල ද පිදුරුගැල ද විනිවිද ජලයෙහි එක් ඉස්බක් පමණ හිය යැවූහ. ගොඩ අට ඉස්බක් පමණ යැවූහ. ඉක්බිති උන්වහන්සේට එළබටුගෙඩියෙහි සලකුණින් අස්ලොම විදිය යුතුයයි කීහ. එසේනම් යොදුනක් ප්‍රමාණයෙහි බටුගෙඩිය බඳවවියයි කියා යොදුනක් ප්‍රමාණයෙහි එළබටු ගෙඩියෙහි සලකුණින් අස්ලොම බඳවා රාත්‍රිය අන්ධකාරය මේඝපටලයෙන් වැසුණු දිශාවෙහි ඊය විද්දහ. එය ගොස් යොදුනක් දුර වූ අස්ලොම පලා පොළොවෙහි කිමිදියේය. මෙපමණක් නොවේ. එදින මහපුරිස්හු ලොව පවත්නා සියලු ශිල්ප දක්වූහ. එවිට ශාක්‍යයෝ තමන්ගේ දූවරුන් සරසා පිටත් කළහ. සතළිස් දහසක් නළඟනෝ වූහ. රාහුලමාතා දේවිය අගමෙහෙසි වූවාය. මහපුරිස්හු සුරයුවතියන් පිරිවැරූ දෙව්කුමරකු මෙන් පිරිමින් රහිත තූර්යයෙන් පුද ලබන්නාහු මහසැප විඳිමින් සෘතුවෙන් සෘතුව ඒ තුන්පහයෙහි වසති. දිනක් බෝසතාණෝ උයනට යනු කැමතිව රියදුරු අමතා රථය සූදානම් කරව, උයන්බිම බලමි කීහ. හෙතෙම මැනවැයි අස්වා මහාර්ඝ උතුම් සොඳුරු තිර කුබර යුත් තිරසර නෙමි නාභි ඇති උතුම් රන් රිදී මිණි රුවනින් සරසන ලද එසාමුඛ ඇති නවරන් රිදී තාරකායෙන් සරසන ලද නෙමිපාර්ශ්ව යුත් දිගහරින ලද නන්සුවඳ කුසුම දාමයෙන් සශ්‍රීක වූ සූර්යරථය මෙන් දර්ශනීය වූ උතුම් රථය සරසා හඳ කුමුදු පැහැ ඇති අහස ගුරුළකුට බඳු පව් ඇති ආජානීය මංගල සෙන්ධවයන් සතර දෙනකු යොදා බෝසතුන්ට දන්වීය. බෝසත්හු දෙව්විමනක් බඳු ඒ රියට නැඟ උයන බලා ගියහ.

එවිට දේවතාවෝ සිදුහත් කුමරුට බුදුවන කාලය ආසන්නය. උන්වහන්සේට පෙරනිමිති දක්වමුයි ජරාවෙන් දුබුරු සිරුරැති කඩඉත් ඇති පැසුණු කෙස් ඇති නැමුණු සිරුරින් දඬුගත් අතින් වෙවුලමින් යන එක් දිවාපුත්‍රයකු දක්වූහ. ඔහු බෝසතාණෝත් රියැදුරාත් පමණක් දකිති. ඉක්බිති බෝසතාණෝ රියැදුරු, මේ මිනිසා කවරෙක්ද? ඔහුගේ කෙසුත් අන් අයගේ මෙන් නොවේ. මහාපනාද සූත්‍රයෙහි ආ නයින්ම විමසා ඔහුගේ වදන් අසා යම්තැනෙක්හි උපන්නහුගේ ජරාව පැනෙන්නම් හවත්නි, ඇත්තෙන්ම ඒ ජාතියට නින්දා වේවායි සංවේග පත් හදින් එතැනින් හැරී ප්‍රාසාදයටම ගියහ.

රජ කුමක් නිසා මපුත් ආපසු ආයේදැයි විචාළේය. දේවයිනි, මහලු මිනිසකු දැකයයි කීය. ඉක්බිති රජ කම්පාවන හදින් අඩයොදනෙක රැකවල් තැබීය. නැවත දිනක් බෝසත්හු උයනට යන්නාහු ඒ දෙවියන් විසින්ම මවන ලද ගිලන් මිනිසකු දැක පෙර පරිදිම විමසා කලකිරුණු හදින් ආපසු හැරී මාලිගයටම ගොඩවූහ. රජ ඒ අසා ඔහුගේ පැවිද්ද වනසැයි නළඟනන් යැවීය. රැකවල් වඩා තුන්ගවු පමණ ප්‍රදේශයෙහි රකවල් තැබීය. බෝසතාණෝ තවත් දිනක උයනට යන්නාහු මනාව හැඳ මනාව පෙරව ගත් පැවිද්දකු දැක යහළු රියදුර, මේ කවරෙක් දැයි රියදුරාගෙන් විමසීය. රියැදුරා ද බුද්ධොත්පාදයක් නොමැත්තෙන් පැවිද්දකු හෝ පැවිදිගුණ නොදනිතත් දේවතානුභාවයෙන් දේවයිනි, මේ පැවිද්දෙකැයි කියා උන්වහන්සේට පැවිදි ගුණ වර්ණනා කළේය.

එයින් බෝසතාණෝ පැවිද්දෙහි රුචි උපදවා එදින උයනට ගියේය. දීර්ඝායුෂ්ක බෝසත්හු අවුරුදු සියය සියය ගියකල මහල්ලකු ආදි එක එක දකිති. අප බෝසත්හු වනාහි අල්පායුෂ්ක කාලයෙහි උපන් බැවින් සිවුමසක් ගතව උයනට යන්නාහු කෙමෙන් එක එක දුටහ. සතර නිමිති එක දිනයෙහි දැක ගියහයි දීඝභාණකයෝ කියති. එහි දිවාභාගය ක්‍රීඩා කොට උයන්රස විඳ මඟුල් පොකුණකින් නහා ඉර අස්තංගතවූ පසු තමන් සරසවා ගනු කැමැත්තාහු මඟුල් ගල්තෙලෙහි වාඩිවූහ. එවිට උන්වහන්සේගේ සිත්හසර දත් සක්දෙවිඳු විසින් එවන ලද විසඝකම්ම නම් දෙව්පුත් පැමිණ උන්වහන්සේගේම කපුවෙස් ගෙන දිව්‍යමය අලංකාරයෙන් අලංකාර කළේය. සර්වාලංකාරයෙන් සරසන ලද උන්වහන්සේට සියලු කාලාවචරයන් තම තමන්ගේ ප්‍රතිභාණයන් දක්වද්දී බමුණන් විසින් ජයවේවා ආදි වචනයෙන් සුතමංගලිකාදි නන් වැදෑරුම් තුතිවදන් ගොස අස්වද්දී සකලාලංකාරයෙන් සරහන ලද උතුම් රියට

නැගුණහ. එවේලෙහි රාහුලමාතාව පුතකු වැදූයයි අසා සුදොවුන් රජ පුතුට සතුට පවසව් යි හසුන් යැවීය. බෝසත්හු එයසා රාහුලයෙක් උපන්නේය. බන්ධනයක් උපන්නේ යයි කීහ. රජ මපුත් කුමක් කීයේදැයි විමසා එවදන් අසා මෙවක් පටන් මාගේ මුනුපුරා රාහුල කුමාර නම් වන්නේ යයි කීය. බෝසතාණෝ ද ඒ උතුම් රියට නැගී මහපිරිවරින් අතිශය මනහර සිරි ශෝභාවෙන් නුවරට පිවිසියහ. එකල රූසිරියෙන් ද ගුණසම්පත්තියෙන් ද නුකුඩා කිසාගෝතමී නම් කැත් කුමරිය උතුම් මතුමහල් පායෙහි සිට නුවරට පිවිසෙන බෝසතුන්ගේ රූසිරු දැක හටගත් සතුටු සොම්නස් ඇතිව-

නියත වශයෙන්ම ඒ මව නිවුණාය. නියත වශයෙන්ම
ඒ පියා නිවුණේය. නියත වශයෙන්ම යම් ස්ත්‍රියකට මෙබඳු සැමියෙක්
ඇත්තේ ඕ නිවුණාය.

කියා මේ උදානය කීවාය. බෝසත්හු එය අසාම මෝතොමෝ මට මනා ඇස්වීමක් ඇස්වූවාය. මම නිවන සොයමින් හැසිරෙමි. අදම මා ගෘහවාසය හැර දමා නිර්වාණය සෙවිය යුතුයයි මෙය මැයට ආචාර්ය භාගය වේවා කියා ලක්ෂයක් අගනා පරම සිත්කළු මුතුහර ගෙළෙන් මුදා යැවූහ. ඇය සිදුහත් කුමරා මා කෙරෙහි බැඳුණු සිතැතිව පඬුරු එවීයයි සොම්නස් ඇත්තී වූවාය. බෝසතාණෝ ද මහත් සිරිසැපතින් පරම රමණීය පහයට නැගි සිරියහන්හි හොත්හ. එකෙණෙහිම පිරිපුන් සඳමඬල වන් සොඳුරු වුවනින් යුත් බිඹුපලවන් තොලින් යුත් සුදෝසුදු මනාව ගැළපුණු අවිචර දසන් ඇති නිල්නුවන් හා කෙස්පාස ඇති මනාව හටගත් සුනිල් කුටිල බැවින් යුත් මනාව වැඩුණු හංසයව අසංගත පියොවුරින් යුත් රිත නවරත් රිදියෙන් සරසන ලද මිණිමෙවුල් ගත විසල් ඝනජඝනකට ඇති ඇත් සොඬවන් දෙකළවා ඇති නැටුම් ගැයුම් වැයුම්හි කුසල සුරයුවතීන් බඳු රූපශෝභා ඇති වරයුවතිහු මිහිරි රැව් ඇති තූර්යයන් ගෙන මහපුරුෂයන් පිරිවරා සිත් අලවමින් නැටුම් ගැයුම් වැයුම් පැවැත්වූහ. බෝසත්හු කෙලෙසුන්හි නොඇලි සිත් ඇති බැවින් නෘත්‍ය ගීතාදියෙහි නොඇලුණාහු මොහොතක් නින්දට පැමිණියහ.

ඔවුහු උන්වහන්සේ දැක අපි යමෙකු සඳහා නැටුම් ආදිය පවත්වන්නමෝ නම් එතුමා නින්දට පැමිණියේය. දැන් කුමකට වෙහෙසෙමු දැයි ගත් තූර්යභාණ්ඩ ඉවතලා නිදාගත්හ. ගඳතෙල් පහන් දැල්වෙයි. බෝසතාණෝ පිබිද ඇඳ මත පලඟින් සිටියාහු තූර්ය භාණ්ඩ ඉවතලා

නිදන ඒ ස්ත්‍රීන් දුටහ. කෙළ වගුරුවමින් කිලිටි කොපුල් ගාත්‍ර ඇති දත්කන ඇතැමුන් ද දොඩවන සමහරුන් ද කටහයා ගත් සමහරුන් සළුමෙවුල් පහවූවන් පිළිකුල් සම්බන්ධ ස්ථාන දක්වන්නවුන් මුදා විසිරුණු කෙස් ඇත්තවුන් සොහොන් රෑ වැනි රෑ දරන්නවුන් මෙන් නිදා සිටියවුන් දුටහ. මහසත්ත්‍ව ඔවුන්ගේ විප්‍රකාර දැක බෙහෙවින්ම කාමයන්හි නොඇලුණු සිත් ඇතිවූහ. උන්වහන්සේට ශක්‍රභවනය සේ අලංකාරයෙන් සරසන ලද සොඳුරු ශෝභා ඇති උතුම් මාලිගය හැරදැමූ මළසිරුරු කුණප භරිත අමුසොහොනක් මෙන් පරම පිළිකුල් බව හැඟී ගියේය. තුන්භවය ගිනිගත් ගෙයක් සේ වැටහිණ. භවත්නි, ඒකාන්තයෙන් උපදැතය. ඒකාන්තයෙන් පීඩාකාරී යයි වචනත් පැවසූහ. සිත පැවිද්දට අතිශයින්ම නැමුණේය. අදම මා විසින් මහබිනික්මන් නික්මිය යුතුයයි සිරියහනින් නැගී දොර ළඟට ගොස් මෙහි කවුදුයි කීහ. පඩිකඳෙහි හිස තබා නිදා සිටි ඡන්න ආර්ය පුත්‍රයිනි, මම ඡන්න යෙමියි කීය. අද මම මහබිනික්මන් නික්මෙනු කැමැත්තෙමි. කාහටත් නොකියා වහා එක් අතිජව සෛන්ධවයෙක් සරසවයි කීහ. හෙතෙම මැනව දේවයිනියි අස්බඩු ගෙන අස්බලට ගොස් ගඳතෙල් පහන් දල්වද්දී සමන්පට වියන් යට පරම රමණීය බිම්කඩෙක සිටි අරිමඨනය කරන කන්ථක නම් වරතුරඟු දැක අද මවිසින් ආර්ය පුත්‍රයන්ට නික්මීම සඳහා මේ මඟුලසුම සැරසිය යුතුයයි කන්ථක සැරසීය.

සරසන්නා වූම ඔහු මේ සැරසීම ඉතා බරපතළය. වෙනදා උයන් කෙළියට යන කල සැරසීම මෙන් නොවේ. නිසැකයෙන් අද ආර්ය පුත්‍රයෝ මහබිනික්මන් නික්මෙතියි දැනගත්තේය. එයින් සතුටු සිත් ඇත්තේ මහ හේෂාරවයක් කළේය. ඔහුගේ නාදය සකල කපිලපුරය මහඬ ගන්වන්නේය. දෙවියෝ වනාහි වළකා කිසිවකුටත් ඇසෙන්නට නුදුන්හ. බෝසත්හු පළමුව පුතු බලමියි සිතා සිටිතැනින් රහල්මව වසන තැනට ගොස් ගැබ්දොර විවර කළහ. එකෙණෙහි ගැබතුල ගඳතෙල් පහන දැල්වෙයි. රහල්මව සමන්මල් ආදිය අමුණක් පමණ අතුරන ලද උතුම් යහනාවෙහි පුතු මත අත තබා නිදන්නීය. බෝසත්හු එළිපතෙහි පා තබා සිටිවනම බලා ඉඳින් මම දේවියගේ අත ඉවත්කොට මපුතු ගනිමි නම් දේවිය පිබිදෙන්නීය. එයින් මාගේ මහබිනික්මනට අනතුරු වන්නේය. බුදුවම අවුත් පුතු බලමියි සිතා පහතලින් බැස අසුළඟට ගොස් මෙසේ කීහ. දරුව කන්ථක, තෝ අද එක් රැයින් මා එතෙර කරව. මම තා නිසා බුදුව සදේවක ලෝකයා එතෙර කරවන්නෙමි කියායි. ඉක්බිති උඩපැන කන්ථක පිට නැගුණාහ. කන්ථක ග්‍රීවයෙහි පටන් දිගින් අටළොස් රියන් වෙයි. ඊට ගැළපෙන උසින් යුක්තය. රූපසම්පතින්

ජවබලසම්පතින් යුක්තය. සේදූ සකක් මෙන් පැහැපත්ය. ඉක්බිති වරතුරඟු පිට නැගී ගත් බෝසත්හු කන්ථක අසුමලග ගන්වා මධ්‍යම රාත්‍රියෙහි නුවර මහදොර වෙත පැමිණියහ.

එකල රජතුමා කල්තියාම බෝසතුන්ගේ ගමන වැළකීම පිණිස දොරපියන් දෙක්හි එක එක මිනිසුන් දහසක් විසින් විවර කළයුතු කොට එහි ආරක්ෂකයන් තැබුයේ විය. බෝසත්හු වනාහි මිනිස් ගණනින් කෙළලක්ෂයක් මිනිසුන්ගේ බල දරති. ඇත් ශක්තීන් ලක්ෂයක් ඇතුන්ගේ බල දරති. එහෙයින් උන්වහන්සේ ඉදින් දොර නොහැරියහොත් අද කන්ථක පිට සිටම ඡන්න වාලධිය ගන්වා ඔහු සමග කන්ථක කළවායෙහි සංඥා කොට අටළොස් රියන් උස පවුර උඩපැන ඉක්මවන්නෙමියි සිතූහ. ඡන්න කන්ථක ද එසේ සිතූහ. දොරෙහි අධිගෘහිත දේවතාවෝ දොර ඇරියහ. එකෙණෙහි පාපී මාරයා බෝසතුන් වළකන්නෙමියි අවුත් අහස සිට කීය-

මහාවීරය, නික්ම නොයනු මැනව. මෙයින් සත්වන දින ඔබවහන්සේට ඒකාන්තයෙන් දිවසක්රුවන පහළ වන්නේය. දෙදහසක් කොදෙව් පිරිවර ඇති සතර මහදිවයින්හි රාජ්‍යය කරනු මැනව. නිදුකාණනි, නවතිනු මැනව කියායි. තෝ කවරක්හිදැයි මහපුරිස්හු ඇසූහ. මම වසවර්ති වෙමියි කීය.

මහරජ, සක්රුවන පහළවන බව මම දනිමි. මට රාජ්‍යයෙන් පලක් නැත. මාරය, තෝ යව. මෙහි නොසිටුව. මම සියලු දසසහස්‍රී ලෝකධාතුව කම්පාකොට ලොව හික්මවන්නා වූ බුදු වන්නෙමි යි කීහ. ඔහු එහිම අතුරුදහන් විය. මහාසත්වයෝ එකුන්තිස් වියෙහි අතපත් සක්විති රාජ්‍යය කෙළපිඩක් මෙන් අනපේක්ෂිතව හැර දමා සක්විති සිරි නිවන බඳු රජගෙයින් නික්ම ඇසළ පුන්පොහෝදින උතුරුසල නැකත පවතිද්දී නුවරින් නික්ම නුවර බලනු රිසිවූහ. සිතූ සැණින් කුඹල්සකක් මෙන් ඒ බිම්පියස කැරකිණ. මහසත්හු සිටි ලෙසින්ම කපිලපුර බලා ඒ බිම පෙදෙසෙහි කන්ථක නිවතන චෙතිය ස්ථානය දක්වා යායුතු මඟට අභිමුඛව කන්ථක මෙහෙයවා ගියහ. මහත් සත්කාරයෙන් උදාර ශ්‍රී ශෝභාවෙන් බෝසතුන් යද්දී උන්වහන්සේ ඉදිරියෙන් දෙවියෝ සැට ලක්ෂයක් උල්කා දරූහ. පසුපසින් දකුණුපසින් උල්කා ලක්ෂයකි. වම්පසින්ද එසේය. වෙනත් දෙව්වරු සුවඳකුසුම් මල්දම් සඳුන්සුණු චාමර ධජ පතාකායෙන් සත්කාර කරන්නාහු පිරිවරා ගමන් කළහ. දිව්‍යමය සංගීත ද නන් තුරු වාදනය ද කළහ.

මෙම සිරිසෞභාග්‍යයෙන් යන බෝසතාණෝ එක් රැයින්ම තුන් රාජ්‍යය පසුකොට තුන්යොදුන් මග ගෙවා අනෝමා ගංතෙරට පැමිණියහ. ඉක්බිති බෝසත්හු ගංතෙර සිට මේ කිනම් නදියක් දැයි ඡන්නගෙන් ඇසූහ. දේවයිනි, අනෝමා නම්. අපගේ පැවිද්දත් අනෝම වන්නේ යයි විළඹෙන් අසු ගටන්නාහු අසුට සංඥා කළහ. අශ්වයා උඩපැන අට ඉස්බක් පුළුල් ගඟ එගොඩ සිටියේය. බෝසත්හු අසුපිටින් බැස මුතුරැසක් වන් වැලිතෙලෙහි සිට ඡන්න ඇමතූහ යහළු ඡන්න, ඔබ මාගේ ආභරණත් කන්ථකත් ගෙන යන්න. මම පැවිදි වන්නෙමියි කීහ. ඡන්න, දේවයිනි මමත් පැවිදිවෙමියි කීය. ඔබට මහණවිය නොහැකියි. ඔබ යන්නමයි තෙවරක් වළකා ආභරණත් අශ්වයාත් පවරා දී මෙසේ සිතූහ. මගේ මේ කෙස් ශ්‍රමණ සාරුප්‍ය නොවෙයි. ඒවා කඩුවෙන් කපමි කියා දකුණතින් නොතියුණු උතුම් කඩුව ගෙන වමතින් මෞළිය සහිත කොණ්ඩය ගෙන සින්දහ. කෙස් දැඟුල්ව දකුණට කැරකී හිසෙහි ඇලී ගියේය. දිවිහිමියෙන් ඒ කෙස්වල ප්‍රමාණය එයම වෙයි. රැවුල එයටම අනුරූප විය. නැවත කෙස්රැවුල් කැපීමක් නොවීය. බෝසත්හු මෞලිය සහිත කොණ්ඩය ගෙන ඉදින් මම බුදුවන්නෙමි නම් අහසෙහි රැඳේවා. නොඑසේ නම් බිම වැටේවායි අහසට දැමූහ. එවිට සක්දෙව්රජ දිවැසින් බලන්නේ යොදුනක් පමණ රන්කඩුවකින් එය පිළිගෙන තවුතිසා භවනයෙහි සිළුමිණි සෑයනම් සෑයක් පිහිටුවීය. කියේමය-

> අග්‍ර පුද්ගලයන් වහන්සේ උතුම් සුවඳ කැවූ මෞලිය සිද අහසට දැමූහ. වාසව නම් දහසක් නුවන් ඇත්තහු විසින් උතුම් රන්කරඬුවෙන් සිරසින් පිළිගන්නා ලදි.

නැවත බෝසතාණෝ සිතූහ. මේ කසී සළු මාගේ පැවිද්දට නොගැළපෙයි. එවිට උන්වහන්සේගේ කාශ්‍යප බුදුන් සමයෙහි පැරණි යහළු වූ සටිකාර මහාබ්‍රහ්ම තෙම එක් බුද්ධාන්තරයක් විනාශයට පත් මිත්‍රභාවයෙන් මෙසේ සිතීය. අද මාගේ මිත්‍රයා මහබිනික්මන් කළේය. එතුමාට ශ්‍රමණ පරිෂ්කාර ගෙන යමි කියායි.

> තුන්සිවුර ද පාත්‍රය ද කරය ද හිදිකටුව ද පෙරහන සහ කායබන්ධන ද යන මේ අට යෝගයෙහි යුක්ත භික්ෂුවගේ පිරිකරයි.

මේ ශ්‍රමණ පිරිකර අට ගෙනවුත් දුන්නේය. මහපුරිස්හු අර්හත් ධජය පෙරවා උතුම් පැවිදිවෙස් ගෙනම ඡන්නය, මාගේ වචනයෙන්

මවුපියන්ට නිරෝගබව කියවයි කියා පිටත් කළහ. ඉක්බිති ඡන්න බෝසතුන් වැඳ පැදකුණු කොට ගියේය. කන්ථක වනාහි ඡන්න සමග කතාකරන බෝසතුන්ගේ වදන් අසන්නේ දැන් ඉතින් මට සමීපයාගේ දැකීමක් මින්පසු නැතැයි පෙනෙන තෙක් මානයෙන් දුරුවීමත් සමගම වියෝදුක ඉවසනු නොහැකිව ළය පැළී මිය ගොස් සුරරිපුන් විසින් නොමැඩිය හැකි තවුතිසා භවනයෙහි කන්ථක නම් දිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ උපත විමලභා විලාසිනී නම් විමානවත්‍රූ අවුවාවෙන් ගත යුතුය. ඡන්නට පළමුවෙන් එකම ශෝකයක් විය. එය කන්ථකගේ මරණයෙන් දෙවන ශෝකයකින් පෙළෙන්නේ හඬමින් වැලපෙමින් දුකින් ගියේය. බෝසතාණෝ ද පැවිදිව ඒ පෙදෙසෙහිම අනුපියනම් අඹඋයනක් ඇත. එහි සතියක් පැවිදි සුවයෙන් කල්ගෙවා එයින් සඳ්‍යාප්‍රභායෙන් රැඳුණු වලාපිරිවැරූ සරාකල පුන්සඳ මෙන් උතුම් කසාවතින් සංවරවූයේ හුදකලාව ද නොඑක් දෙන පිරිවරන ලද මෙන් බබළන්නාහු. ඒ වනයෙහි මෘගපක්ෂීන්ට නයනාමෘතයක් කරන්නාහු මෙන් එකචාරි සිංහයකු මෙන් මත්මතඟ ගමනින් නරසිංහයාණෝ මිහිකත සනහන්නාක් මෙන් පා ගමනින් එක් දිනකින්ම තිස්යොදුන් මඟ ගෙවා උත්තුංග තරංග භංග යුත් ගල ගංගා නදිය තරණය කොට රක්නාලෝක සමූහයෙන් බබළන උතුම් සොඳුරු රජගහ නම් නුවරට පිවිසියහ.

පිවිස ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසුරුණාහ. ඒ මුළු නුවර බෝසතුන්ගේ රූප දර්ශනයෙන් ධනපාල ඇතු පිවිසි කල ඒ නගරය මෙන් අසුරිඳු පිවිසි කල දෙව්නුවර මෙන් කැළඹීමට පත්විය. මහපුරුෂයාණන් පිඬු පිණිස හැසිරෙද්දී නුවර වැසි මිනිස්සු මහසතුන්ගේ රූප දර්ශනයෙන් හටගත් ප්‍රීති සොම්නස් ඇතිව විස්මය පත්ව බෝසත් දර්ශනයෙන් ආවර්ජිත සිත් ඇත්තෝ වූහ. ඒ මිනිසුන්ගෙන් එකෙක් අනෙකාට මෙසේ කීය. කිමෙක්ද භවත, රාහුට බියෙන් සඟවා ගත් කිරණ ඇතිව මිනිස් ලොවට පැමිණි පුන්සඳ ද? ඔහුට තවකෙක් මෙසේ කීය. යහළුව, කුමක් කියන්නෙහිද? ඔබ කවදා නම් මිනිස් ලොවට පැමිණි පුන්සඳ පෙර දැක තිබේද? ඒකාන්තයෙන් මේ වෙනත් වෙසක් ගෙන අප මහරජුගේත් නුවරුන්ගේත් පරමලීලා සම්පත් දැක ක්‍රීඩා පිණිස පැමිණි කුසුම්සර කාමදේවයාය. අනිකෙක් ඔහුට සිනාසී භවත, ඇයි ඔබට පිස්සුද? ඇයි කාමයා ඊශ්වර ක්‍රෝධාග්නියෙන් දැවුණු සිරුරු ඇත්තෙකි. මේ සුරපුරය යන හැඟීමෙන් මෙහි පැමිණි ශකයාය කීය. අනිකෙක් ඔහුට සිනාසී භවත, මුල අග වරදා කුමක් කියන්නෙහිද? ඔහුගේ දහසක් නුවන් කොයින්ද? වජ්‍රය කොයින්ද? ඓරාවණයා කොයින්ද? ඒකාන්තයෙන්

බ්‍රාහ්මණ ජනයාගේ ප්‍රමාද දූක වෙද වේදාංගයන්හි යෙදවීමට පැමිණි බ්‍රහ්මයායි.

ඒ සියල්ලන්ම බැහැරකොට අනිකෙක් මෙසේ කීය. මේ පුන්සඳ නොවේ. කාමයා ද නොවෙයි. ශක්‍රයාත් නොවෙයි. බ්‍රහ්මයා ද නොවෙයි. මේ ආශ්චර්ය මනුෂ්‍යයා ලෝකනායක ශාස්තෘන් වහන්සේය. නුවර වැස්සෝ මෙසේ කතාකරද්දී රාජපුරුෂයෝ ගොස් බිම්බිසාර රජුට දන්වූහ. දේවයිනි, දෙවියෙක් හෝ ගන්ධර්වයෙක් හෝ නැත්නම් නාරජෙක් හෝ යකෙක් හෝ අපගේ නුවර පිණ්ඩපාතයෙහි හැසිරෙන්නේය කියායි. එයසා රජ ප්‍රාසාද තලයෙහි සිට මහාපුරුෂයන් දූක ආශ්චර්ය අද්භූතව රාජපුරුෂයන්ට දරුවෙනි, යව්. විමසව්. ඉඳින් අමනුෂ්‍යයෙක් නම් නුවරින් නික්ම අතුරුදහන් වෙයි. ඉඳින් දේවතාවෙක් නම් අහසින් යයි. නාරජෙක් නම් පොළොවෙහි කිමිද යයි. ඉඳින් මිනිසෙක් නම් ලත් භික්ෂාව වළඳයි කියා අණ කළේය. මහාපුරුෂයාණෝ ද ශාන්ත ඉන්‍ද්‍රියන් ඇතිව ශාන්ත මනසින් යුතුව රූප ශෝභාවෙන් මහජන නුවන් ඇදගන්නාක් මෙන් වියදඬු දුර බලන්නාහු යැපෙන පමණ මිශ්‍ර ආහාර ලබාගෙන පිවිසි දොරින් නුවරින් නික්ම පණ්ඩව පර්වත සෙවනෙහි පෙරදිග බලා හිඳ අහර ප්‍රත්‍යවෙක්ෂා කොට නිර්විතාරට වැළඳූහ. ඉක්බිති රාජපුරුෂයෝ ගොස් රජුට එපවත් දන්වූහ. දූත වචන අසා මගධාධිපතිරාජබාලයන් විසින් දුරනුසාර මෙරුමන්දාර වන් සාර සත්වසාර බිම්බිසාර රජ බෝසතුන්ගේ ගුණ ඇසීමෙන්ම හටගත් දැකුම් කුතුලින් වහා නුවරින් නික්ම පණ්ඩව පර්වතය බලාගොස් යානයෙන් බැස බෝසතුන් වෙත ගොස් උන්වහන්සේ විසින් කරන ලද අනුඥා ඇත්තේ ඥාතිජන සෙනෙහෙ සිසිල් සිසිල්ගල් තෙලෙහි හිඳ බෝසතුන්ගේ ඉරියව්වෙහි පැහැද බෝසතුන්ට සියලු ඉසුරු පැවරීය. බෝසත්හු මහරජ, මට වස්තුකාමයෙන් හෝ ක්ලේශකාමයන්ගෙන් පලක් නැත. මම වනාහි උතුම් බුදුබව පතා නික්මියෙමියි කීහ. රජ නන් අයුරින් අයැදත් උන්වහන්සේගේ සිත නොලැබ ඒකාන්තයෙන් බුදුවන්නාහයි බුදුව ඔබවහන්සේ පළමුව මාගේ රටට පැමිණිය යුතුයයි කියා නුවරට ගියේය.

> උතුම් රාජගෘහ වූ රාජගහ නම් නගරයට රජු ගියකල්හි ගිරිරාජයකු බඳු මුනිරාජයන් වහන්සේ මෘගරාජගමන් ඇති ශෝභන ගමනින් වැඩියහ.

ඉක්බිති බෝසතාණෝ පිළිවෙළින් චාරිකා කරන සේක් ආළාරකාලාම ද උද්දක රාමපුතත ද වෙත ගොස් සමවත් උපදවා බෝධියට මඟ නොවැතෙයි ඒ සමවත් භාවනා ප්‍රතික්ෂේප කොට වීර්යය වඩනු කැමතිව උරුවෙලාවට වැඩ මේ බිම්පියෙස රමණීයයි. එහිම වාසයට පැමිණ මහාප්‍රධන් වැඩූහ. ලක්ෂණ පාඨක බමුණන්ගේ පුත්තු සතර දෙනෙක් ද කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණ ද යන පස්පැවිද්දෝ ගම් නියම්ගම් රාජධානිවල පිණ්ඩපාතයෙහි යෙදෙන්නාහු එහි බෝසතුන් වෙත පැමිණියහ. එකල සවසක් ප්‍රධන් වඩන උන්වහන්සේ දැන් බුදුවෙති දැන් බුදුවෙතියි පිරිවෙන් හැම දීමාදි වත් පිළිවෙතින් උවටැන් කරන්නාහු උන්වහන්සේගේ සමීපාචරයෝ වූහ. බෝසතාණෝද දුෂ්කරක්‍රියාව කෙළ පමුණුවමියි එකල තල සහල් ඇටයෙන් කල්ගෙවති. සර්ව ප්‍රකාරයෙන් අහර ප්‍රතික්ෂේප කළහ. දෙවියෝ ලෝමකූපවලින් ඔජස් බහාලීම ද ප්‍රතික්ෂේප කළහ. ඉක්බිති ඒ නිරාහාරතාවෙන් උන්වහන්සේගේ පරම කෘශභාවයට පත් ශරීරයේ රන්වන් බව කළුවන් විය. දෙතිස් මහාපුරිස ලක්ෂණ සැඟව ගියේය. ඉක්බිති බෝසතාණෝ දුෂ්කර ක්‍රියාවෙහි අන්තයට ගොස් මේ බුදුබවට මග නොවෙතැයි ඔළාරික අහර ගැනීමට ගම්නියම්ගම්වල පිඬු පිණිස හැසිර අහර ගත්හ. එවිට දෙතිස්වර ලකුණු ප්‍රකෘතියෙන් විය. කය රන්වන් විය.

ඉක්බිති පස්වග භික්ෂූහු මෙතෙම සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කරන්නේ බුදුබව ලබන්නට නොහැකි විය. දැන් ගම්නියම්ගම් පිඬු පිණිස හැසිර ඔළාරික ආහාර ගන්නේ කෙසේ නම් සමත් වෙයිද? මෙතෙම බාහුලිකය. වෙර වැඩීමෙන් වෙන් විය. මොහුගෙන් අපට කම් කිමිදයි බෝසතුන් හැරදමා බරණැස ඉසිපතනයට ගියහ. ඉක්බිති බෝසතාණෝ වෙසක් පුන්පොහෝදින උරුවෙලාවෙහි සේනානිගමයෙහි සේනානී කෙළෙඹියාගේ ගෙයි උපන් සුජාතා නම් දැරියක් වූවාය. හටගත් පැහැදීමෙන් ඇය විසින් පිදූ දිවඔජාවත් ඕකිරිබත් වළඳා රන්පාත්‍රය ගෙන නෙරඤ්ජරා තීරයෙහි උඩුගං බලා යවා නිදිගත් කාලනාරජුට හැඟවූහ.

අනතුරුව බෝසත්හු නේරඤ්ජරා තෙර සුවඳ කුසුමින් සැරසුණු නිල්වන් මනරම් සල්වනයෙහි දිවාවිහාර කොට සවස දෙවියන් සරසන ලද කයින් බෝරුක බලා ගියහ. දේව නාග යක්ෂ සිද්ධාදීන් දිව්‍යමය මල්ගඳ විලවුනෙන් පිදූහ. එකල සොත්තීය නම් තෘණහාරක බ්‍රාහ්මණ තණ රැගෙන ඉදිරියෙන් එන්නේ මහාපුරුෂයන්ගේ ආකාරය දැන

අටතණමිටක් දුන්නේය. බෝසතාණෝ හිරුරැස් දැලින් ආවරණය වන නිල්අඳුන් පර්වතයක් වන් කරුණාවෙන් සිසිල් සිය හදවත් සිහිල් සෙවණැති සම්ප්‍රාප්ත විවිධ විහග සමූහයාගේ විරුතයෙන් හා මඳ සුළඟින් සැලෙන ශාඛායෙන් සැදුම්ලත් ප්‍රීතියෙන් නටන්නාක් වැනි තුරු සමූහයෝ අතර විරාජමාන ඇසතු බෝරුක වෙත පැමිණ ඇසතු දුම්රද තෙවරක් පැදකුණු කොට ඊසාන දිශාවෙහි සිට ඒ තණ අගින් ගෙන සැලූහ. එවිටම තුදුස් රියන් පර්යංකය විය. ඒ තෘණ ද සිත්තරකු විසින් රේඛාගත කළාක් වැනි විය. බෝසතාණන් වහන්සේ එහි තුදුස්රියන් පමණ තණ ඇතිරියෙහි වැඩහිඳිනු සමගම වැටෙන බෝඅංකුර රන්පටක පබළු මෙන් වැටී බැබළුණේය.

බෝධිසත්වයන් වහන්සේ එසේ වැඩහිඳීමත් සමග වසවත් මර දෙව්පුත් සිදුහත් කුමරා මාගේ විෂය ඉක්මවනු කැමැත්තේය. මම ඔහුට ඉක්මවීමට ඉඩ නොදෙමියි මාරබලයට ඒ බව දන්වා මාරබල ගෙන නික්මියේය. ඒ මාරසේනාව වනාහි මාරයාගේ ඉදිරියෙන් දොළොස් යොදුන් විය. දකුණින් ද වම්පසින් ද එසේය. පසුපසින් වනාහි සක්වළ අවසන දක්වා සිටියේය. උඩින් නවයොදුන් විය. දකුණින් ද වම්පසින්ද එසේය. පසුපසින් වනාහි සක්වළ අවසන දක්වා සිටියේය. උඩින් නවයොදුනක් උස්විය. සෝෂා කරන සේනාවේ ශබ්දය යොදුන් දහසේ සිට පොළොව ඉදිරි යන්නාක් මෙන් ඇසේ. එසඳ සක්දෙව්රජ විජයතුරාසක පිඹිමින් සිටියේය. ඒ සක රියන් දෙදහසක් විය. ගඳඹ දෙව්පුත් පන්සිළු තුන්ගවුදිය බෙළුව පණ්ඩුවිණාව ගෙන ව යමින් මඟුල්මුසු ගී ගයමින් සිටියේය. සුයාම දෙව්රජ තුන්ගවු දිග සරාකල සඳවන් සසරි දිවසෙමෙර ගෙන මඳ මඳව සලමින් සිටියේය. සහම්පති බ්‍රහ්ම තුන්යොදුන් පුළුලැති දෙවන පුන්සඳක් බඳු සේසත බුදුන් මුදුනට දරා සිටියේය. මහකෙළ නාරජද අසූදහසක් නළුවන් පිරිවරා සියගණන් තුති පවසමින් එහා සත්වයන්ට නමස්කාර කරමින් සිටියේය. දසදහසක් සක්වළ දෙවියෝ නන්වැදෑරුම් සුවඳ මල්දම් දුම්සුණු ආදියෙන් පුදන්නාහු සාධුකාර පවත්වන්නාහු සිටියෝය.

ඉක්බිති මර දෙව්පුත් එකසිය පනස් යොදුන් ගිරිසිඛරයක් බඳු පරම සොඳුරු දකුම් ඇති ගිරි මේඛලා නම් රුවනින් සැරසූ උතුම් සතුරු ඇතුන් මඩින වරඇතු අරා දහසක් අත් මවා ගෙන නොගත් ගැන්මෙන් නානායුධ ගන්වා ගත්තේය. මර පිරිසද කඩු පොරෝ හී සැත් ආදියෙන් බලවත්ව ඔසවා ගත් දුනු මොහොල් හලි සංකු කුන්ත තෝමර උපල

ලඟුල වලය කපපළකණය චක්‍ර කටක ධරව රුරුමෘග සිංහ කඟවේණ සරභමෘග ව්‍යාඝ්‍ර වානර උරග බළල් බකමුහුණු මුඛ ඇතිව ද මහිස පසඳ අශ්ව ඇත් මුහුණු ඇතිවද නන් බිහිසුණු පිළිකුල් ශරීර ඇතිව ද මනුෂ්‍ය යක්ෂ ප්‍රේතයන්ට සමසිරුරු ඇතිව ද බෝමුල වැඩහුන් බෝසත් මහසතුන් වටකරමින් ගොස් පිරිවරා මාරයාගේ පණිවුඩය අපේක්ෂාවෙන් සිටියහ. එවිට මරසෙනඟ බෝමුලට ළඟාවෙද්දීම ශක්‍රාදීන්ගෙන් එකෙකුටවත් සිටිය නොහැකි විය. හමුවූ හමුවූ තැනින්ම පලාගියහ. සක්දෙව්රජ ඒ විජයතුරා සකපිටෙහි ලාගෙන පලාගොස් සක්වළ මුවවිට සිටියේය. මහා බ්‍රහ්මතෙම සේසත සක්වළ කොණ තබා බඹලොවටම ගියේය. කාලනාරජ සියලු නළුවන් දමා පොළවෙහි කිමිද පස්යොදුන් මංජෙරික භවනයට ගොස් කට අතින් වසාගෙන වැදහොත්තේය. එකම දෙවියෙක් වත් එහි සිටීමට අසමත් විය. මහපුරිස්හු වනාහි ශූන්‍ය විමානයක මහබඹු මෙන් තනිවම වැඩහුන්හ. දැන් මාරයා එන්නේ යයි නානා රූපී අනිෂ්ට දුර්නිමිති පහළ විය.

මාරයුද්ධ අවස්ථාවෙහි තුන්ලෝ බැහැුන් වහන්සේ වැඩසිටියදී හාත්පසින උල්කා වැටුණේය. සියලු දිශා සෝරවූ දුමින් අඳුරින් වැසී ගියේය.

අචේතන වූව ද සචේතනව මෙන් සැමියකුගෙන් වියෝවූ කාමිනියක මෙන් ද වාතයෙන් පහරන ලද ලතාවක මෙන් ද සාගර සහිත නානා පර්වත සහිත මහපොළව කම්පා විය.

සාගර ජලය උඩ නැග්ගේය. ගංගා උඩුගං බලා ගලා ගියේය. ගිරිකුළු ගස්මුදුන් බිඳගෙන පොළවෙහි ඇද වැටුණේය.

හාත්පස චණ්ඩමාරුතය හැමීය. ගැටුම් හඬ අතිවිශාල විය. සොර රාව අන්ධකාර පැතිර ගියේය. කවන්ධරූප අහසෙහි විසිර ගියේය.

මෙවැනි අනන්ත අනිෂ්ට අහස්ගත පොළෝගත සෝර නොඑක් රූප දුර්නිමිති මාරාගමනයෙහි හාත්පස ඇතිවිය.

දේව දේවයාණන් නසනු කැමති මාරයා දැක දෙව් සමූහයා දෙවඟනන් සමග සානුකම්පිතව හා හා කියා කෑගැසූහ.

පක්‍ෂීන් මැද ගුරුළකු මෙන් මුවන් මැද උතුම් සිහරජකු මෙන් මහායශසේවීන් වහන්සේ මරසෙන් මැද විශාරදව විතභයව වැඩහුන්හ.

එවිට මාරයා සිද්ධාර්ථයන් බියගන්වා පලවා හරින්නෙමැයි වාත වර්ෂාවක් ආයුධ වර්ෂාවක් ගල වර්ෂාවක් නැවත අඟුරු හළු වැලි කලල් අන්ධකාර වැසි නවයකින් බෝසතුන් පලවා හැරීමට නොහැක්කේ ක්‍රෝධ මනසින් කොල්ලනි, කුමට බලා සිටින්නහුද? සිද්ධාර්ථ අසිදධාර්ථ කරව්. ගනිව්. සිඳිව්. බඳවු. එලවා දමව් යි මර පිරිසට අණ කොට තෙමේ ගිරිමෙවුල් මත හිඳ එක් අතකින් හීය කරකවමින් බෝසතුන් වෙත ගොස් භවත් සිද්ධාර්ථය, පර්යංකයෙන් නැගෙවයි කීය. මරපිරිසද මහසතුන්ට අතිශයින් පීඩා කළාහු. බෝසත්හුද මාරයා සහිත මර පිරිස ක්‍ෂාන්ති මෛත්‍රී වීර්ය ප්‍රඥාදි තමන්වහන්සේගේ පාරමිතානුභාවයෙන් නසා පළමු යම පෙරවිසීම් සිහිකොට මැදියම දිවැස පිරිසිදු කොට අලුයම සියලු බුදුවරුන්ට ආවේණික ප්‍රත්‍යයාකාරයෙහි ඤාණයට බැස ආනාපාන චතුර්ථ ධ්‍යානය උපදවා එයම පාදකකොට විදර්ශනා වඩන සේක් මගපිළිවෙලින් අවබෝධ කරන ලද සිවුවන මගින් සියලු කෙලෙසුන් ක්‍ෂය කොට සියලු බුදුගුණ පිළිවිද සියලු බුදුවරුන්ට ආවේණික අනෙකජාති සංසාරං -පෙ- තණහානං ඛයමජඣගා යන උදන් ඇතුහ. උදන් අනා වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිත් විය. මම සාරාසංඛ්‍ය කප් ලක්‍ෂයක් මේ පර්යංකය හේතුවෙන් සැරිසැරීමි. මාගේ මේ පර්යංකය වීරපර්යංකයි. මෙහි හුන් මට යම්තාක් මාගේ සංකල්ප නොපිරේද ඒතාක් මෙයින් නොනැගිටිමියි නොඑක් කෙළලක්‍ෂ ගණන් සමවතට සමවදිමින් සතියක් එහිම වැඩහුන් සේක.

යමක් සඳහා අථ බො භගවා සතතාහං එකපල්ලංකෙන නිසීදි විමුතතිසුඛපටිසංවෙදී යි කියන ලදද ඒ මේ සඳහායි. එවිට සමහර දේවතාවන්ට ඒකාන්තයෙන් අදත් සිද්ධාර්ථයන්ට කළයුතු කිස ඇත්තේය. සලගෙහි ඇල්ම අතනොරිති කියා සිතිණ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ දෙවියන්ගේ විතර්කය දැන ඔවුන්ගේ විතර්කය සංසිඳුවීම පිණිස අහසට නැග යමක ප්‍රාතිහාර්යය දැක්වූහ. මෙසේ මේ පෙළහරින් දෙවියන්ගේ විතර්කය සන්සිඳුවා පර්යංකයෙන් මදක් නැගෙනහිර නිශ්‍රිත උතුරුදිග සිට මම මේ පර්යංකයෙහි සර්වඥතාඥානය ප්‍රතිවේධ කළෙමි. සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් පුරා පිරූ පැරැම්හි ඵල අවබෝධ කළ තැනයයි පර්යංකය නිමේෂ රහිත ඇසින් බලන්නාහු සතියක් ගත කළහ. ඒ ස්ථානය අනිමිසචේතිය නම් විය. ඉක්බිති පර්යංකයටත් සිටි තැනටත් අතර

සක්මනක් මවා නැගෙනහිරින් බටහිරින් දික්වූ රුවන් සක්මනෙහි සක්මන් කරමින් සතියක් ගත කළහ. ඒ ස්ථානය රතනචේතිය නමි. සතරවන සතියෙහි බෝධියට වයඹ දෙස දෙවියෝ රුවන්ගෙය මැවූහ. එහි පලඟින් හිඳ විජම පිටකය විමසමින් හුන්හ. ඒ ස්ථානය රතනඝර චේතිය නම් විය. මෙසේ බෝධිය සමීපයෙහිම සතර සතියක් ගෙවා පස්වන සතියෙහි බෝරුක් මුලින් අජපල් නුගරුකමුලට පැමිණියහ. එහිද ධර්මය විමසමින් විමුක්ති සැප ද විඳිමින් වැඩහුන්හ. එහි සතියක් ගෙවා මුචලින්ද මූලයට වැඩියහ. එහි සතතාහවද්දලි කා නම් වැසි උපන් කල සීතාදිය වැළැක්වීමට මුවලිඳු නාරජු විසින් සත් දරන පටකින් වටකරන ලද්දේ සම්බාධ රහිතව ගඳකිළියෙහි වසන්නාක් මෙන් විමුක්තිසුව විඳිමින් එහි සතියක් ගතකොට රාජායතනයට වැඩියහ. එහි ද විමුත්තිසුව විඳිමින්ම සතියක් වැඩහුන්හ.

මෙපමණකින් සත්සතිය සපරිණ. මේ අතර භාග්‍යවතුන් වහන්සේට මුව දෙවීමක් නොවිය. සිරුරු පිළිදැගීමක් නොවිය. ස්නාන කෘත්‍යයක් නොවිය. එල සුවයෙන්ම කල්ගෙවූ සේක. ඉක්බිති ශාස්තෘන් වහන්සේ සත්සති අග එකුන්පනස්වන දින සක්දෙවිඳු විසින් එළවන ලද නාලිය දෑහැටිවලින් ද අනෝතත්තවිල ජලයෙන් ද මුවදොවා එම රාජායතන මුල්හිම වැඩහුන්හ. එකල තපස්සු භල්ලුක නම් වෙළඳුන් දෙදෙන සහලේ නෑ දෙවියන් විසින් ශාස්තෘන් වහන්සේට ආහාරදානයෙහි මෙහෙයවන ලද්දාහු අත්සුණු ද මීපිඩු ද ගෙන භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස මේ අහර පිළිගන්නා සේක්වායි ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ සිටියහ. භාග්‍යවතුන් වහන්සේ කිරිබත් පිළිගත් දවසෙහිම දෙවියන් දුන් පාත්‍රය අතුරුදන් වූ හෙයින් තථාගතයෝ අතින් නොපිළිගනිතියි මම කුමකින් මෙය පිළිගනිම්දැයි සිතූහ. එවිට භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැන සිවුදිගින් සතරවරම් රජවරු ඉඳුනිල්මිණිමුවා පාත්‍ර සතරක් එළවූහ. භාග්‍යවතුන් වහන්සේ ඒවා ප්‍රතික්ෂෙප කළහ. නැවත මුංපැහැති සෙල්මුවා පා සතරක් එළවූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සතරදෙනාට අනුකම්පා පිණිස පිළිගෙන එකක් බවට පමුණුවා ඒ අගනා සෙල්මුවා පයින් අහර පිළිගෙන වළඳා අනුමෝදනා කළසේක. ඒ දෙබෑ වෙළෙන්දෝ බුදුන් ද දහම් ද සරණ ගොස් ද්වේවාචික උපාසකයෝ වූහ.

ශාස්තෘන් වහන්සේ අජපාල නුගරුක කරා වැඩ නුගමුල වැඩහුන්හ. උන්වහන්සේට එහි වැඩහුන් කෙණෙහිම අවබෝධ කළ ධර්මයෙහි ගැඹුරු බව මෙනෙහි කරත්ම සියලු බුදුවරුන්ට ආවේර්ණ අධිගතො ඛොම්‍යායං

ධමෙමා ආදී වශයෙන් අනුන්ට ධර්මය නොදෙසනු කැමති ආකාරයට පත් පරිවිතර්කයක් ඇතිවිය. එවිට සහම්පති බ්‍රහ්මතෙම භවත්නි, ලොව ඒකාන්තයෙන් නස්නේ යයි දසදහසක් සක්වළ ශක්‍ර සුයාම සංතුසිත නිම්මානරති පරනිම්මිතවසවත්ති මහාබ්‍රහ්මයන් ගෙන ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වායි ආදි විසින් ධර්මදේශනාවට අයැදියේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුට ප්‍රතිඥා දී කාට නම් මම පළමුව දහම් දෙසන්නෙමිදයි සිතනසේක් ආළාර උද්දකයන් මළබව දැන පස්වග භික්ෂූනු මට බොහෝ උපකාරකයයි පංචවර්ගීයයන් කෙරෙහි මෙනෙහි කොට දැන් කොහි වසත්දැයි ආවර්ජනා කරන සේක් බරණැස මිගදායෙහිය යි දැන එහ ගොස් දම්සක් පවත්වමියි කිපදිනක් බෝමැඩ හාත්පසපස්හිම පිඬු පිණිස හැසිරෙමින් වැස ඇසළ පුන් පොහෝදින බරණැසට යන්නෙමියි පාසිවුරු ගෙන අටළොස් යොදුන් මඟට පිළිපන් සේක. අතරමඟ තුටුපහටු උපක නම් ආජීවක දැක ඔහුට තමන් වහන්සේගේ බුදුබව කියා එදිනම සවස් වේලෙහි ඉසිපතනයට වැඩියහ. පංචවග්ගීයයෝ වනාහි තථාගතයන් වහන්සේ දුරින්ම වඩිනු දැක ඇවැත්නි, මේ ශ්‍රමණ ගෞතමයෝ ප්‍රත්‍ය බහුලත්වයට පත්ව පිරිපුන් කය ඇතිව පිනා ගිය ඉඳුරන් ඇතිව රන්වන් වී එති. ඔහුට අභිවාදන නොකරමු. ආසනයක් පමණක් පනවමුයි කතිකා කළහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ සිත්හසර දැන නමනියමයක් නැතිව සියලු සත්වයන් විෂයෙහි පැතිරවීමට සමත් මෛත්‍රී සිත කැටිකොට නියමයක් ඇතිව පැතිරවූ සේක. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ විසින් පතුරුවන ලද මෛත්සිත් පහස ලැබුවාහු තථාගතයන් වහන්සේ ළංවත් ළංවත්ම සිය කතිකාවෙහි නොසිටිය හැක්කාහු අභිවාදනාදි සියලු කටයුතු කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බුදුබව ඔවුන්ට දන්වා පැනවූ උතුම් බුද්ධාසනයෙහි වැඩහිඳ උතුරුසල නකත පවතිද්දී අටළොස් කෙළක් බඹුන් පිරිවරන ලදුව පස්වග තෙරුන් අමතා ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්තය දේශනා කළ සේක. උන්වහන්සේලාගෙන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙර දේශනානුසාරයෙන් නුවණ මෙහෙයවා සූත්‍ර කෙළවර අටළොස් බඹුන් සමඟ සෝවාන් ඵලයන්හි පිහිටියේය. එයින් කියන ලදි-

අහමෙකරහි සම්බුදෙධා ගොතමෝ සක්‍යවඩ්ධනෝ
පධානං පදහිත්වාන පතෙතා සමෙබාධිමුත්තමං

බ්‍රහමුණා යාචිතෝ සනෙතා ධම්මචකකං පවතතයිං
අටඨාරසනනං කොටීනං පඨමාභිසමයෝ අහූති

එහි **අතතානං** යනු; තමන් වහන්සේ දක්වති. **එතරහි** යනු; මෙකල්. **සක්‍යවද්ධ නො** යනු; ශාක්‍යකුල වර්ධනය කරන්නේ. **සක්‍යපුංගවො** යනුද පාඨයි. **පධානං** යනු; වීර්යය කියනු ලැබේ. **පදහිත්වා** යනු; සථා, වෑයම්කොට. දුෂ්කරක්‍රියා කොට යන අර්ථයි. **අථයාරසනනං කොටිනං** යනු; බරණැස ඉසිපතන මිගදායෙහි ධම්මචකකපපවතතන සූත්‍රාන්ත කථාවෙහි අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් ප්‍රමුඛ අටළොස් කෙළක් බ්‍රහ්මයන්ට ප්‍රථම ධර්මාවබෝධය විය යන අර්ථයි. දැන් භාග්‍යවතුන් වහන්සේ අතීතය දක්වා අනාගත අභිසමය වදාරන සේක්-

තතො පරඤ්ච දෙසෙනෙත නරමරූනං සමාගමෙ
ගණනාය නවතතබෙබා දුතියාභිසමයො අහූති

ආදිය වදාළහ.

එහි **නරමරූනං සමාගමෙ** යනු; ඉන් මෑත කාලයෙහි මහාමංගල සමාගමයෙහි දසදහසක් සක්වළ දෙවි මිනිසුන් මැද මංගල සූත්‍ර දේශනාවසානයෙහි ගණන් සීමාව ඉක්මවූ දෙවිමිනිසුන්ට. **දුතියාභිසමයො අහූ** යනු; වන්නේය යන අර්ථයි. අනාගත පදය කිව යුතු තැන දහරට වැටීම නිසා අහූ යන අතීත වචනය කියන ලදි. කාල විපර්යාස වශයෙන් හෝය. මින් පසු මෙබඳු වචනවල මේ ක්‍රමයයි. නැවත රාහුලෝවාද සූත්‍රාන්තයෙහි දේශනාවෙහි ගණන සීමා ඉක්මවූ සත්වයන්ට ධර්මාවබෝධ අමාපැන් පෙවූහ. මෙය තෙවන අභිසමයයි. එයින් කියන ලදි-

ඉධෙවාහං එතරහි ඔවදිසසාමි අත්‍රජං
ගණනාය න චකකබෙබා තතියාභිසමයො අහූති

භාග්‍යවතුන් වහන්සේට වනාහි එකම ශ්‍රාවක සන්නිපාතයක් විය. උරුවෙල කාශ්‍යප ජටිලයන් දහසක් ද දෑගසව්වන්ගේ දෙසියපනහක් ද යන මේ එක්දහස් දෙසීය පනහකගේ සන්නිපාතය විය. එයින් කියන ලදි-

එකොව සනනිපාතො මෙ සාවකානං මහෙසිනං
අඩඪ තෙළසසතානං භික්ඛූනාභි සමාගමොති

එහි **එකොසි** යනු; එකක්ම විය. **අඩඪතෙළසසතානං** යනු; පනසක් අධික දොළොස් සියයක. **භික්ඛූනාසි** යනු; භික්ෂූන්ගේ සමාගමය විය.

උන්වහන්සේලා මැදට වැඩි භාග්‍යවතුන් වහන්සේ සිවුරඟ සතනිපාතයෙහි පාමොක් දෙසූහ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ පවත් දක්වන සේක්-

විරොචමානො විමලො භික්ඛුසංඝස්ස මජ්ඣගො
දදාමි පත්තිං සබ්බං මණිව සබ්බකාමදොති

ආදිය වදාළහ. එහි **විරොචමානො** යනු; බුදධශ්‍රීයෙන් බබළන්නාහු. විමලො යනු; පහවූ රාගාදි කෙලෙස්මල ඇත්තේ. **මණිව සබ්බකාමදො** යනු; සිතුමිණක් මෙන් සියලු කැමති දේ දෙන. මම ද කැමතිවන ලද පතන ලද සියලු ලොවී ලොවුතුරා සැප වෙසෙස් දෙවි යන අර්ථයි. දැන් පැතූ පැතුම දක්වන්නේ-

ඵලමාකංඛමානානං භවච්ඡන්ද ජහෙසිනං
චතුසච්චං පකාසෙමි අනුකම්පාය පාණිනන්ති

ආදිය කීහ. එහි **ඵලං** යනු; සෝවාන් ඵලය ආදි සතරවැදෑරුම් ඵලය. **භවච්ඡන්දජහොසිනං** යනු; භව තෘෂ්ණාව පහකරන්නවුන්ට, භව තෘෂ්ණාව පහකරනු කැමැත්තවුන්ට. **අනුකම්පාය** යනු; අනුද්දයාවෙන්. දැන් සිවුසස් ප්‍රකාශනයෙහි අභිසමය දක්වන්නාහු **දසවීසසහසසානං** යනාදිය කීහ-

එහි **දසවීස සහසසානං** යනු; දසදහසකට විසිදහසකට. **එකදිවනනං** යනු; ආදි ක්‍රමයෙන් යන අර්ථයි. නවවන දසවන ගාථාවල අර්ථය ප්‍රකටය. එකොළොස්වන දොළොස්වන ගාථාවල **ඉදානෙතරහි** යනු; දෙපදයම ඒකාර්ථයි. වෙනෙය්‍ය වශයෙන් පුරිසපුගලා යනු මෙන් කියන ලදි. නැතහොත් **ඉදානි** යනු; මා උපන්කල්හි. **එතරහි** යනු; දහම් දෙසන කල්හි. **අපපතතමාන සා** යනු; නොපත් රහත්ඵල ඇත්තාහ. **අරියඤ්ඣසං** යනු. අරි අටඟි මඟ. ඔමයනතා යනු; ප්‍රශංසා කරන්නාහු. **බුජඣිසසනත** යනු; අනාගතයෙහි චතුසසත්‍යය අවබෝධ කරන්නාහ. හැසිරෙති යන අර්ථයි. **සංසාර සරිතං** යනු; සසර සයුර. දැන් තමන් වහන්සේගේ උපන් නගරය ආදිය දක්වන සේක්-

නගරං කපිලවත්ථු මෙ රාජා සුදෙධාදනො පිතා
මයහං ජනෙතතිකා මාතා මායා දෙවීති වුච්චති

උනතිංසානි වසසානි අගාරමජෙඣ සො වසිං
රමමා සුරමෙමා සුභකො තයො පාසාදමුත්තමා

චත්තාළීස සහසසානි නාරියො සමලංකතා
යසොධරා නාම නාරී රාහුලො නාම අත්‍රජො

නිමිත්තෙත චතුරො දිසවා අසසයානෙන නිකඛමිං
ඡබබසසං පධානචාරං අචරිං දුකකරං අහං

බාරාණසියං ඉසිපතනෙ ජිනචකකං පවත්තිතං
අහං ගොතම සම්බුදෙධා සරණෙ සබබපාණිනං

කොලිතො උපතිසෙසා ච දෙව භික්ඛූ අගගසාවකා
ආනන්දො නාමුපට්ඨාකො සාතිකාවචරෝ මම

බෙමා උපපලවණණා ච භික්ඛුනී අගගසාවිකා
චිත්තෙතා ච හත්ථාළවකො අගගුපට්ඨාකුපාසකා

නන්දමාතා ච උත්තරා අගගුපට්ඨිකුපාසිකා
අහං අසසත්ථමූලමහි පත්තෙතා සමෙබාධිමුත්තමං

ව්‍යාමපපභා සදාමයහං සොළසහත්ථමුගගතං
අපපං වසසසතං ආයු ඉදානෙතරහි විජ්ජති

තාවතා කිට්ඨමානොහං තාරෙමි ජනතං බහුං
ඨපයිත්වාන ධම්මුක්කං පච්ඡිමං ජනබොධනං

අහමපි නවිරසෙසව සද්ධිං සාවකසංඝතො
ඉධෙව පරිනිබ්බිසසං අග්ගිවාහාර සංඛයාති

ආදිය වදාළහ. මට වනාහි රමම සුරමම සුභ නම් නවමහල් සත්මහල් පස්මහල් තුන් පහයක් විය. සතළිස් දහසක් නළඟනෝය. මාගේ අග මෙහෙසිය යසෝධරා නම්. ඒ මම නිමිති සතර දැක අශ්ව යානයෙන් මහබිනික්මන් නික්මයෙමි. ඉක්බිති සාවුරුද්දක් ප්‍රධන් වඩා වෙසක් පුන්පොහෝ දින උරුවෙලාවෙහි සේනානි ග්‍රාමයෙහි සේනානි

කෙළෙඹියාගේ දූවූ සම්ප්‍රසාද දනවන සුජාතාව දුන් මීකිරිබත් වළඳා සල් වනයෙහි දිවාවිහාර කොට සවස් සමයෙහි සොතථිය නම් තෘණ හාරකයන් දුන් අටතණමිට ගෙන ඇසතු බෝරුක්මුල වෙත පැමිණ එහි මාරබල නසා සම්බෝධියට පැමිණියෙමියි සියල්ල වදාළ සේක.

එහි **සදධිං සාවකසංඝතො** යනු; ශ්‍රාවක සංඝයා සමඟ. **පරිනිබ්බිසසං** යනු; පිරිනිවන්පාන්නෙමි. **අගගිවාහාරසංඛයා** යනු; ඉන්ධන ක්ෂයවීමෙන් යම්සේ ගින්න උපාදාන රහිතව නිවීයේද එසේ මම ද උපාදාන රහිත වූයෙම් පිරිනිවන් පාන්නෙමි යන අර්ථයි. **ගුණාධරවරදෙහො** යනු; ෂඩ් අසාධාරණ ඥානාදි ගුණධරවූ මේ දේහය. **තානි ච අතුලතෙජා** යනු; අග්‍රශ්‍රාවක යුගාදි ඒ අසම තේජස්. **ඉමානි ච දසබලානි** යනු; මේ ශාරීරික දසබලද **සමනතර හෙසනනි** යනු; කියන ලද උකතප්‍රකාර සියල්ල අතුරුදහන් වෙයි. නැසෙයි. **නනු රිතතා සබබසංඛාරා** යනු; මෙහි නන යනු; අනුමති අර්ථයෙහි නිපාතයි. **රිතතා** යනු; නිත්‍යසාර ඒකාන්තසාර රහිත බැවින් හිස්ය. තුච්ඡය. මේ සියලුම මේ සංඛතයන් ක්ෂයධර්මය ව්‍යය ධර්මය විරාග නිරොධ ධර්මව අභාව හෙයින් අනිත්‍යය. උත්පාද ආදී ප්‍රතිපීඩිත බැවින් දුක්ය. වසයෙහි නොපවත්නා හෙයින් අනාත්මයි. එහෙයින් සංස්කාරයන්හි ත්‍රිලක්ෂණය ආරෝපණය කොට විදර්ශනා වඩා අමත අසංඛත අචුතිරස නිර්වාණය අවබෝධ කරව්. මේ අපගේ අනුශාසනයයි. දැන් අපගේ ශාසනය අප්‍රමාදව සම්පාදනය කරව්.

දේශනා කෙළවර කෙළලක්ෂයක් දෙවියන්ගේ උපාදාන ආස්‍රවයන්ගෙන් මිදුණෝය. සෙසු මඟපලඟවල පිහිටියානු ගණන් සීමා ඉක්මවූහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ කල්ප නාම ජාති ආදි වශයෙන් බෙදන ලද සියලුම බුදධවංසය අහස රුවන්සක්මන් සක්මන් කරමින්ම දේශනා කොට ජනයා වන්දවා අහසින් බැස පනවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩහුන් සේක. ලෝකනාථ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් කල්හි ඤාතිසමාගමය මසතකප්‍රාප්ත විය. සියල්ලෝ එකඟසිත් ඇත්තෝව වාඩිවූහ. ඉක්බිති මහාමේඝය පොකුරුවැසි වැස්සේය. එකෙණෙහි ජලය යටට හඬනඟමින් යයි. තෙමෙනු කැමැත්තහුම තෙමෙයි. නොතෙමෙනු කැමැත්තහුගේ ශරීරයෙහි බිඳකුදු නොවැටෙයි. ඒ දක සියල්ලෝ ආශ්චර්ය අද්භූත වූවානු අහෝ අශ්චර්යයි. අද්භූතයි කථාව ඉපිදවූහ. ඒ අසා ශාස්තෘන් වහන්සේ මාගේ ඥාති සමාගමයෙහි පොකුරුවැසි වටුයේ දැන් මතු නොවෙයි. අනීතයෙහිද වැස්සේ යයි මේ අර්ධෝත්පත්තියෙන්

වෙස්සන්තර ජාතකය දෙසූ සේක. ඒ ධර්මදේශනය සාර්ථක විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අස්නෙන් නැගී විහාරයට වැඩියහ.

අපරිමෙය්‍යෙ ඉතො කපෙප චතුරො ආසුං විනායකා යන ආදි අටළොස් ගාථා සංගීතිකාරකයන් විසින් තබන ලද නිගමනගාථා යයි දතයුතුය. සෙසු ගාථාවල සියලු අර්ථ ප්‍රකටය.

මෙතෙකින් මධුරත්ථවිලාසිනී බුදධවංස
අර්ථකථාවෙහි ගෞතම බුදධවංසය නිමියේයි.

පස්විසිවන බුදධවංසය සමාප්තයි.

මේ මුළුමහත් බුදුවංශයෙහි දක්වන ලද පස්විසි බුදුවරුන් වහන්සේලාගේ වෙනස්කම් අටක් දතයුතුය. අට කුමක් ද? ආයු වෙනස, ප්‍රමාණ වෙනස, කුල වෙනස, ප්‍රධන් වෙනස, රශ්මී වෙනස, යානා වෙනස, බෝධිවෘක්ෂ වෙනස, පර්යංක වෙනස යනුයි. එහි ආයු වෙනස නම් සමහර බුදුවරු දීර්ඝායුෂ්ක වෙති. සමහරු අල්පායුෂ්ක වෙති. ඒ එසේමැයි. දීපංකර, කොණ්ඩඤ්ඤ, අනෝමදස්සී, පදුම, පදුමුත්තර, අත්‍රදස්සී, ධම්මදස්සී, සිද්ධත්‍ථ, තිස්ස යන මේ නව බුදුවරයන් වහන්සේලා වර්ෂ ලක්‍ෂයක් ආයු ඇත්තෝ වූහ. මංගල, සුමන, සෝභිත, නාරද, සුමේධ, සුජාත, පියදස්සී, ඵුස්ස මේ අටබුදුවරයන් වහන්සේලා අනූදහසක් අවුරුදු ආයු ඇත්තෝ වූහ. රේවත, වෙස්සභූ දෙනම හැටදහසක් අවුරුදු ආයු ඇත්තෝ වූහ. විපස්සී භාග්‍යවතුන් වහන්සේ අසූදහසක් අවුරුදු ආයු ඇතිවූ සේක. සිඛී, කකුසඳ, කෝනාගමන, කාශ්‍යප යන මේ සතර බුදුවරයන් වහන්සේලා ක්‍රමයෙන් සැත්තෑදහස් සතලිස්දහස් තිස්දහස් විසිදහස් අවුරුදු ආයු වූ සේක. අප භාග්‍යවතුන් වහන්සේගේ ආයු ප්‍රමාණය අවුරුදු සියයක් විය. රැස්කරන ලද පුණ්‍යසම්භාර ඇත්තා වූද දීර්ඝායු පැවතීමට හේතුකර්මයන් ඇත්තා වූද බුදුවරුන් වහන්සේලාට යුග වශයෙන් ආයු ප්‍රමාණය අප්‍රමාණ විය. මේ ආයු පිළිබඳ වෙනසයි.

ප්‍රමාණ වෙමතතතාව නම්- සමහර බුදුවරුන් වහන්සේලා උස්වෙති. සමහරු මිටි වෙති. ඒ එසේය. දීපංකර, රේවත, පියදස්සී, අත්‍රදස්සී, ධම්මදස්සී, විපස්සී බුදුවරුන්ගේ ශරීරප්‍රමාණය අසූරියන් විය. කොණ්ඩඤ්ඤ, මංගල, නාරද, සුමේධ බුදුවරුන්ගේ ශරීරය අටඅසූරියන් පමණ විය. සුමන බුදුරදුන්ගේ ශරීරය අනූරියන් උස්විය. සෝභිත, අනෝමදස්සී, පදුම, පදුමුත්තර, ඵුස්ස බුදුවරුන්ගේ ශරීරය අටපනස් රියන් උස්විය. සුජාත බුදුන්ගේ සිරුර පනස්රියන් උස්විය. සිද්ධත්‍ථ, තිස්ස, වෙස්සභූ බුදුවරුන්ගේ ශරීරය හැටරියන් විය. සිඛී බුදුන්ගේ සිරුර සැත්තෑරියන් උස්විය. කකුසඳ, කෝනාගමන, කාශ්‍යප බුදුවරුන්ගේ ශරීරය පිළිවෙලින් සතලිස් තිස් විසි රියන් උස්විය. අප භාග්‍යවතුන් වහන්සේ අටළොස් රියන් උස්වූහ. ප්‍රමාණ වෙනස මෙයයි.

කුල වෙමතතතාව නම්- සමහරු කැත් කුලයෙහි උපදිති. සමහරු බමුණු කුලයෙහි උපදිති. කකුසඳ, කෝනාගමන, කාශ්‍යප බුදුවරුන් වහන්සේලා බමුණු කුලයෙහි උපන්හ. සෙසු දෙවිසි බුදුවරුන් වහන්සේලාම කැත් කුලෙහි උපන්හ. මේ කුල වෙනස නම්. පධාන වෙමතතතාව නම්- දීපංකර, කොණ්ඩඤ්ඤ, සුමන, අනෝමදස්සී, සුජාත, සිද්ධත්‍ථ, කකුසන්ධ

බුදුවරුන් වහන්සේලාගේ වීර්යවැඩීම දසමසකි. මංගල, සුමේධ, තිස්ස, සිබී බුදුවරුන් වහන්සේලාගේ ප්‍රධන් චර්යාව අටමසකි. රේවත බුදුන්ගේ සත්මසකි. සෝභිත බුදුන්ගේ සිවුමසකි. පදුම, අත්‍රදස්සී, විපස්සී බුදුවරුන්ගේ අඩමසකි. නාරද, පදුමුත්තර, ධම්මදස්සී, කස්සප බුදුවරුන්ගේ සතියකි. පියදස්සී, ඵුස්ස, වෙස්සභූ, කෝනාගමන බුදුවරුන්ගේ සමසකි. අප බුදුන්ගේ ප්‍රධන් චර්යාව සවසක් විය. මෙය ප්‍රධන් චර්යාවේ වෙනසයි. රශ්මි වෙමතතතාව නම්- මංගල සම්මා සම්බුදුන්ගේ ශරීර රශ්මිය දසඳහසක් සක්වළ පැතිර සිටියේය. පදුමුත්තර බුදුන්ගේ දොළොස් යොදුන් ප්‍රමාණ විය. විපස්සී බුදුන්ගේ සත් යොදුනකි. සිබී බුදුන්ගේ තුන් යොදුන් පමණය. කකුසඳ බුදුන්ගේ දස යොදුන් පමණය. අප බුදුන්ගේ හාත්පස බඹයක් පමණය. සෙසු බුදුවරුන්ගේ නියමයක් නොමැත. මේ රශ්මි වෙනස නම්. අදහස අනුව බැඳුණේය. යමෙක් යම් පමණ කැමතිද උන්වහන්සේගේ ශරීරයෙන් එපමණ පැතිරෙයි. පිළිමිදි ගුණයෙහි කිසිදු වෙනසක් නැත්තේය. මේ රශ්මි වෙනස නම්.

යාන වෙමතතතාව නම්- කිසිවෙක්ඇත් යානයෙන් නික්මෙති. කිසිවෙක් අස් රථ පද පාසාද සිවිකාදි කිසිවකින් නික්මෙති. ඒ එසේමැයි. දීපංකර, සුමන, සුමේධ, ඵුස්ස, සිබී, කෝනාගමන බුදුවරු ඇත්යානයෙන් නික්මුණහ. කොණ්ඩඤ්ඤ, පදුම, රේවත, පියදස්සී, කකුසන්ධ බුදුවරු රථයානයෙනි. මංගල, සුජාත, අත්‍රදස්සී, තිස්ස, ගෝතම බුදුවරු අස් යානයෙනි. අනෝමදස්සී, සිද්ධත්‍ථ, වෙස්සභූ සිවිකාවෙනි. නාරද බුදුහු පාගමනිනි. සෝභිත, පදුමුත්තර, ධම්මදස්සී, කස්සප බුදුවරු ප්‍රාසාදයෙන්ම නික්මුණහ. මේ යානා වෙනස නම්. බෝරුක් වෙනස නම්- දීපංකර බුදුන්ගේ ගිවුළු රුක බෝධියයි. කොණ්ඩඤ්ඤ බුදුන්ගේ සල්කලණ ගසයි. මංගල, සුමන, රේවත, සෝභිත බුදුවරුන්ගේ නාරුක බෝධියයි. අනෝමදස්සී බුදුන්ගේ බෝධිය කුඹුක්ගසයි. පදුම, නාරද බුදුවරුන්ගේ බෝධිය මහාසොණ වෘක්ෂයයි. පියුමතුරා බුදුන්ගේ හොරගස බෝධියයි. සුමේධ බුදුන්ගේ බෝධිය කොළොම්ගසය. සුජාත බුදුන්ගේ බෝධිය හුණගසයි. පියදස්සී බුදුන්ගේ බෝධිය කුඹුක් ගසයි. අත්‍රදස්සී බුදුන්ගේ බෝධිය සපුගසයි. ධම්මදස්සී බුදුන්ගේ බෝධිය කුරවක වෘක්ෂයයි. සිද්ධාර්ථ බුදුන්ගේ බෝධිය කිණිහිරි රුකයි. තිස්ස බුදුන්ගේ පියාගසය. ඵුස්ස බුදුන්ගේ නෙල්ලිගසය. විපස්සී බුදුන්ගේ පළොල් රුකය. සිබී බුදුන්ගේ සුදුඅඹ ගසය. වෙස්සභූ බුදුන්ගේ සල්රුකය. කකුසඳ බුදුන්ගේ සරස රුකය. කෝනාගමන බුදුන්ගේ දිඹුල් රුකය. කස්සප බුදුන්ගේ නුගරුකය. ගෝතම බුදුන්ගේ ඇසතු රුකය. මේ බෝරුක් වෙනසයි.

පර්යංක වෙනස නම් දීපංකර, රේවත, පියදස්සී, අත්‍රදස්සී, ධම්මදස්සී, විපස්සී බුදුවරුන්ට තෙපනස් රියන් පර්යංක විය. කොණ්ඩඤ්ඤ, මංගල, නාරද, සුමේධ බුදුවරුන්ට සත්පනස් රියන් විය. සුමන බුදුන්ට සැටරියන් පර්යංකය විය. සෝභිත, අනෝමදස්සී, පදුම, පදුමුත්තර, ඵුස්ස බුදුවරුන්ට අටතිස්රියන් විය. සුජාත බුදුන්ට දෙතිස්රියන් විය. සිද්ධත්ථ, තිස්ස, වෙස්සභූ බුදුවරුන්ට සතළිස් රියන් විය. සිඛී බුදුන්ට දෙතිස්රියන් විය. කකුසඳ බුදුන්ට සවිසිරියන් විය. කෝනාගමන බුදුන්ට විසි රියන්ය. කසුප් බුදුන්ට පසළොස් රියන්ය. ගෞතම බුදුන්ට තුදුස්රියන් වූයේය. මේ පර්යංක වෙනස නම්. සියලු බුදුවරුන් වහන්සේලාටම අත් නොහරින තැන් සතරෙක් වෙයි. **සියලු බුදුවරුන්ට බෝධිපර්යංකය අතනොහැරම එකම ස්ථානයක වෙයි. ධම්සක් පැවැත්වීම, ඉසිපතන මිගදායෙහි නොවෙනස්වම වෙයි. දෙවොරෝහණ වෙලාවෙහි සකස්පුර දොර පළමුපාතබන තැන නොවෙනස්ව වෙයි. දෙව්රම ගඳකිළියෙහි ඇඳෙහි සතරපා තැන නොවෙනස්වම වෙයි. විහාරය වනාහි කුඩා හෝ ලොකු හෝ වෙයි.** නගරය වෙනස් නොවන්නේමය.

අප භාග්‍යවතුන් වහන්සේ පමණක් සහජාත පරිච්ඡේදයක් නක්ෂත්‍ර පරිච්ඡේදයක් දක්වූහ. අපගේ සර්වඥ බෝසතුන් සමග වනාහි රාහුලමාතාව, ඡන්න, කන්ථක, නිධන්සැළි, මහාබෝධිය, කාළුදායී යන මේ සත එක්ව උපන්නේය. මෙය සහජාත පරිච්ඡේද නම්. මහපුරිස්හු වනාහි උතුරුසළ නකතින් මවුකුස පිළිසිඳ ගත්හ. මහබිනික්මන් නික්මුණහ. ධම්සක් පැවැත්වූහ. යමාමහ පෙළහර කළහ. විසා නැකතින් උපන්හ. බුදුවූහ. පිරිනිවියහ. මාඝ නැකතින් උන්වහන්සේගේ ශ්‍රාවක සන්නිපාතයද ආයුසංස්කාර අතහැරීමද විය. අස්විද නැකතින් දෙවොරෝහණය විය. මෙය නක්ෂත්‍ර පරිච්ඡේදයයි. දැන් සියලු බුදුවරයන් වහන්සේලාගේ අසාධාරණ ධර්මතාව ප්‍රකාශ කරන්නෙමි. භාග්‍යවතුන් වහන්සේලාගේ ධර්මතාව සමතිස් වැදෑරුම් වෙයි. ඒ මෙසේයි.

පශ්චිමභවික බෝසතාණන් වහන්සේගේ මනා සිහිනුවණින් මවුකුස පිළිසිඳ ගැනීම, මවුකුස පර්යංකයෙන් පිටත බලා හිඳීම, බෝසත් මව හිටගෙනම ප්‍රසූත කිරීම, අරුණයෙහිම මවුකුසින් බිහිවීම, රන්පටෙහි පිහිටවූ පාදයෙන් උතුරුදිග බලා සත්පියවරින් ගොස් සිවුදිග බලා සිංහනාද කිරීම, සතර නිමිති දැක පුතුන් උපන් පසු මහාසත්වයන්ගේ මහබිනික්මන කිරීම, අරහත්ධජය පිළිගෙන පැවිදිව, යටත් පිරිසෙයින් සතියක් ප්‍රධන්

වැඩීම, බුදුබවට පත්වන දින කිරිපිඬු භෝජනය, තණ ඇතිරියෙහි වැඩහිඳ සර්වඥතාඥානය අවබෝධ කිරීම, ආනාපාන කර්මස්ථාන පරිකර්මය, මාරබල නැසීම, බෝපලඟෙහිම ත්‍රිවිද්‍යාව ආදිකොට අසාධාරණඥානාදි ගුණ ප්‍රතිලාභය, සත්සතිය බෝධිසමීපයෙහිම ගතකිරීම, ධර්ම දේශනාව පිණිස බ්‍රහ්මයාගේ ආයාචනය, ඉසිපතන මිගදායෙහි දම්සක් පැවැත්වීම, නවම් පුර පසළොස්වක සිවුවනක් පිරිස් රැස්වීමෙහි පාමොක් දෙසීම, ජේතවන ස්ථානයෙහි නිත්‍යවාසය, සැවැත්නුවර දොර යමාමහ පෙළහර දක්වීම, තව්තිසා භවනයෙහි විජම්බණ දෙසීම, සකස්පුර දොර දෙවිලොවින් බැසීම, නිරන්තර පලසමවතට සමවැදීම, දැහැන් දෙක්හි විනෙයජනයන් දෙස බැලීම, හේතුවක් උපන් කල ශික්ෂාපද පැනවීම, හේතුවක් ඇතිව ජාතක දේශනාව, ඤාතිසමාගමයෙහි බුද්ධවංසය දේශනා කිරීම, ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කිරීම, ආරාධිතයන්ට නොදන්වා වස් නිමවා නොවැඩීම, දවසක් පාසා පෙරබත පසුබත පෙරයම මැදියම අලුයම කටයුතු කිරීම, පිරිනිවන් දිනයෙහි මස්රස වැළඳීම, සූවිසි කෙළඳහසක් සමවත් සමවැද පිරිනිවීම යන මේ සමතිස් සියලු බුදුවරුන් වහන්සේලාගේ ධර්මතායි.

සියලු බුදුවරුන් වහන්සේලා උදෙසා එළවන ලද සිවුපසයට අන්තරාය කිරීම කිසිවෙකු විසිනුත් නොකළ හැකිය. කිසිවෙකු විසිනුත් ආයුෂයට අනතුරු කළ නොහැකිය. එහෙයින් අනුන්ගේ උපා ක්‍රමයෙන් තථාගතයන් වහන්සේගේ දිවි තොර කරන්නේය යන යමක් ඇත්ද මෙය නොවන්නකි. අවකාශ නැත්යයි කියන ලදි. බුදුවරුන්ගේ දෙතිස් මහපුරිස් ලකුණුවලට අසීති අනුව්‍යඤ්ජනවලට කිසිවකු විසිනුත් අන්තරාය කළ නොහැක්කේය. බුදුරැස්වලට අනතුරු කිරීම කිසිවකු විසිනුත් කළ නොහැක්කේය. මේ සතර අන්තරාය නොකළ හැකි ධර්ම නම් වෙයි.

මැනවින් වර්ණනා කරන ලද පදවින්‍යාසයෙන් විචිත්‍රනයින් හොබනා බුද්ධවංස වර්ණනය මෙපමණකින් සම්පූර්ණ විය.

මා විසින් පාළි අර්ථ ප්‍රකාශක පුරාණ අටුවා මඟ ගනිමින්ම බුද්ධවංස අටුවාව කරන ලදි.

ප්‍රපංච අර්ථය බැහැර කොට සර්වප්‍රකාරයෙන් මධුරාර්ථයම ප්‍රකාශ වන හෙයින් මධුරත්ථපකාසිනී නම් වෙයි.

කාවේරී නදී දිය වැටීමෙන් පිවිතුරු මිහිතෙළෙහි නානා නරනාරී සමූහයෙන් ගැවසීගත් රමණීය වූ කාවෙරි පටුනෙහි මුදුවදන් ඇති සත්පුරුෂ කණහදාස නමැත්තා විසින් කරවන ලද විවිධාකාර සුන්දර පවුරු දොරකොටු යුත් උල්පතින් වැහෙන ජල ඇති දර්ශනීය වූ මනරම් වූ දුර්ජන සම්බන්ධයෙන් තොර විවේකසුව යුත් ශාන්ත විහාරයෙහි පරම සිසිලැති නැගෙනහිර දෙස පිහිටි ප්‍රාසාදයෙහි වසන මා විසින් මේ බුද්ධවංස වර්ණනාව කරන ලදි.


යම් සේ මේ වර්ණනාව අන්තරාය රහිතව මැනවින් නිමාවට පත්වූයේ ද එමෙන් ධර්මයුක්ත ජනයාගේ විතර්ක අන්තරාය රහිතව මැනවින් සමෘද්ධියට පැමිණේවා.

මෙම බුද්ධවංශ සංවර්ණනය කරන මා විසින් යම් පුණ්‍යයක් ප්‍රාර්ථනා කරන ලදද, ඒ පින් බෙලෙන් ලෝකය ඒකාන්ත ශාන්ත නිවනට පැමිණේවා.

මෙතෙකින් මධුරත්ථවිලාසිනී නම් බුදධවංස අටුවා කථාව නිමියේය.

ගුරුන් විසින් තබන ලද බුදධදතත යන නමින් ප්‍රකට තෙරණුවෝ මධුරත්ථවිලාසිනී අටඨකථාව කොට පරපුරෙන් පරපුරට හිතලබා දෙන මේ පොත තබා අහෝ අනිත්‍යතා වශයෙන් අපවත් වූහ.

මෙසේ බණවර වශයෙන් සවිසි බණවරකි. ග්‍රහ විසින් ග්‍රහ සදහස් පන්සියයකි. අකුරු විසින් අකුරු දෙලක්ෂතුන් දහසකි.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්‍තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234
ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ISBN 978-955-1604-45-5